බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා: 6 (ii)

විනයපිටකයෙහි

05 වන ග්‍රන්ථය

# පරිවාරපාළි

(2 කාණ්ඩය)

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්

පොල්ගහවෙල විද්‍යෝදය පරිවෙණාධිපති

කෙසෙල්වතුගොඩ ශ්‍රී රතනජෝත්‍යභිධාන

නායකස්ථවිරපාදයන් වහන්සේ විසින් කරනලද

සිංහල පරිවර්තනය

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින්

පාඨශොධන පූර්වක වැ සංස්කරණය කරන ලදි

බු. ව. 2550

ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 6(ii)

The Fifth Book in the
**Vinaya-Pitaka**

**5**

# PARIVĀRA-PĀLI (II)

With the Sinhala translation by

**The Venerable**
**Keselvatugoda Ratanajoti Nāyaka Thero**

Revised and Edited by
**The Tripitaka Board**

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
## <u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
## <u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**“අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං”**

“කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී”

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිඳිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්වඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල ‘සද්ධා’ නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව (“සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං”) මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය

මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ

සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද

පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද

අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,

සමින්ද රණසිංහ.

2009.06.28

විනයපිටකෙ

# පරිවාරපාළි

දුතියො භාගො

විනයපිටකයෙහි

# පරිවාරපාළිය

විතීය භාගය

Free Distribution www.aathaapi.org

**“තථාගතප්පවෙදිතො භික්ඛවෙ, ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො”**

**“මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි, වැසුණේ නො මැ බබළයි”**

**(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත – භරණ්ඩුවර්ගය, 9 සූත්‍රය)**

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 12 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:12 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

## CONTENTS


| | පිටුව |
|---|---|
| සංස්කාරක නිවේදනය හා සංඥාපනය ... ... ... | ix |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | xi |
| පාළි හෝඩිය ... ... ... ... | xii |
| සංකේත නිරූපණය ... ... ... ... | xiii |
| විෂය සූචි ... ... ... ... | xv |
| පරිවාර, පෙළ හා පරිවර්තනය ... ... ... | 2–319 |
| ගාථාදිපාද සූචි ... ... ... ... | 323–327 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 328–341 |
| ශුද්ධි පත්‍රය ... ... ... ... | 342 |




Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය හා සංඥාපනය

විනයපිටකයෙහි පස්වැනි ග්‍රන්ථය වූ පරිවාරපාළි බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සවැනි ග්‍රන්ථය ලෙස සලකන ලද වෙයි. එහෙත් ග්‍රන්ථය හැදෑරීමෙහි පහසුව සලකා නියතස්ථානයෙහි ඡෙද වෙන් කරමින් සිංහල පරිවර්තනය සමග මුද්‍රණය කිරීමේ දී ග්‍රන්ථය සුවසේ පරිහරණ නොකළහෙනසේ මහත්ත්වයට පැමිණෙන බව පෙනුණු හෙයින් පරිවාරපාළියෙහි ''සමථභෙදය'' අවසන් කොට ඇති ග්‍රන්ථප්‍රදෙශය 1. කාණ්ඩය ලෙස ක්‍රි. ව. 1977 දී පළකරවන ලද්දේය.

ඛන්ධකපුච්ඡායෙහි පටන් නවසංගහවග්ගය අවසන් කොට ඇති ග්‍රන්ථශෙෂය පරිවාර-පාළියෙහි 2 කාණ්ඩය ලෙස පළ වෙයි. පරිවාරපාළිය ගෙන කියයුතු යම් දෑයෙක් වේ නම් එ හැම ප්‍රථම කාණ්ඩයෙහි ලියූ සංඥාපනයෙන් දතහෙන හෙයින් මෙහි ලා වෙන මැ සංඥාපනයක් නොලියම්හ. අර්ථීන් විසින් එ සංඥාපනය බලන්නේ මැනැවි.

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනය පරිදි පරිවාරපාළිය සිංහලභාෂායෙන් පරිවර්තන කළාහු පොල්ගහවෙල **විද්‍යාර්ථොදය** පරිවෙණාධිපති උපාධ්‍යායභූත කෙසෙල්වතුගොඩ **සිරිරතනජොත්‍යභිධාන** නායක මහාස්ථවිරපාදයන් වහන්සේ යැ. ධර්මවිනයධර බහුශ්‍රුත පඬිවරයාණකෙනකු වූ උන්වහන්සේ යථාකාලයෙහි නිමහම් කළ සිංහල පරිවර්තනය වර්තමාන ත්‍රිපිටකසම්පාදකමණ්ඩලයේ බහුශ්‍රුත මහතෙරවරුන් විසින් පාඨශොධන පූර්වක වැ සංස්කරණය කරන ලද්දේය. මෙහි රචනාශෛලිය හා අක්ෂරවින්‍යාසය ද පරිවර්තක නාහිමියන් විසින් අනුගමනය කළ සම්ප්‍රදය නොපිරිහෙනසේ යොද ඇත.

භික්ෂූන් වහන්සේගේ විනයඥානය සඳහා අතිශයින් එලවත් වූ පරිවාරපාළිය සුගම වූ සිංහලයෙන් පරිවර්තන කොට ප්‍රකාශයට පමුණුවාලන්නට ලැබීම ශාසනප්‍රීතිකාමී සකල සිංහල බෞද්ධජනතාවගේ ප්‍රමොදයට හෙතු වේ යයි සිතමි. මේ සත්ක්‍රියායෙහි පුරොගාමී වූ ලංකාබෞද්ධමණ්ඩලයෙහි පින්වත්හු ද සංස්කෘතික අධිකාරියෙහි නියුක්ත සියලු, සුධීහු ද ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ද ධර්මදානමය කුශලහෙතුයෙන් නිරාමය වෙත්වායි ආශංසනය කරම්හ.

**හැමසත්නට සෙත් වේවා!**

මේවගට, ශාසනොදයකාරි

**ලබුගම ලඞකානන්ද ස්ථවිර**

**ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.**

**1979 ජුනි මස 09 වැනි දින**

**මහානායකවාරිකාරාමය.**



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

මහරගම, වටයවත්ත පාර, ශ්‍රී චන්ද්‍රශෙඛරාරාමාධිපති අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහංගම, විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය, රාජකීයපණ්ඩිත කෝදගොඩ ශ්‍රී ඥානාලොක දක්ෂිණ ලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශවර, විමලකීර්ති ශ්‍රී රාජකීයපණ්ඩිත, ලබුගම ලඞ්කානන්ද ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, රද්දොල්ලේ සිරි පඤ්ඤාලොක ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුධර්මාරාමාධිපති ශාසත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීයපණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සී ශ්‍රීකල්‍යාණිසාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ-මාකඩවර විහාරාධිපති රාජකීයපණ්ඩිත, කරහම්පිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති රාජකීයපණ්ඩිත කරදන සිරි පඤ්ඤාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

**ලේඛක :**

කොළඹ, බෞද්ධාලොක මාවතෙහි බෞද්ධාලොක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල-කොළඹ පළාතේ ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

අa ආā ඉi ඊī උu ඌū එe ඔō

### CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | ඛkha | ගga | ඝgha | ඞṅa | | | |
| චca | ඡcha | ජja | ඣjha | ඤña | | | |
| ටṭa | ඨṭha | ඩḍa | ඪḍha | ණṇa | | | |
| තta | ථtha | දda | ධdha | නna | | | |
| පpa | ඵpha | බba | භbha | මma | | | |
| යya | රra | ලla | වva | සsa | හha | ළḷa | අංṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කka | කාkā | කිki | කීkī | කුku | කූkū | කෙkē | කොkō |
| ඛkha | ඛාkhā | ඛිkhi | ඛීkhī | ඛුkhu | ඛූkhū | ඛෙkhē | ඛොkhō |
| ගga | ගාgā | ගිgi | ගීgī | ගුgu | ගූgū | ගෙgē | ගොgō |

### Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| කකkka | ඤඤñña | ත්‍රtra | මඵmpha |
| කඛkkha | ණහṇha | දදdda | මබ, ඹmba |
| ක්‍යkya | ñca | දධddha | මභmbha |
| ක්‍රිkri | ඤඡñcha | ද්‍රdra | මමmma |
| ක්වkva | ඤජ, ඦñja | දව, ද්වdva | මහmha |
| ඛ්‍යkhya | ඤඣñjha | ධවdhva | ය්‍යyya |
| ඛවkhva | ටටṭṭa | නතnta | යහyha |
| ගගgga | ටඨ, ට්ඨṭṭha | නථntha | ලලlla |
| ගඝggha | ඩඩḍḍa | නදnda | ල්‍යlya |
| ඞකṅka | ඩඪḍḍha | නධndha | ලහlha |
| ග්‍රgra | ණණṇṇa | ននnna | වහwha |
| ඞඛṅkha | ණටṇṭa | නහnha | සසssa |
| ඞගṅga | ණඨṇṭha | පපppa | සමsma |
| ඞඝṅgha | ණඩ, ඬṇḍa | පඵppha | සවsva |
| චචcca | ණහṇha | බබbba | හමhma |
| චඡccha | තතtta | බභbbha | වහvha |
| ජජjja | තථttha | බ්‍රbra | ළහḷha |
| ජඣjjha | ත්වtva | මපmpa | |

ා ā ි i ී ī ු ු u ූ ූ ū ෙ e ො ō



Free Distribution www.aathaapi.org

# සඞ්කෙත නිරූපණය

## ABBREVIATIONS

සීමු. 1 — සීහළක්ඛරමුද්දිත (පුරාණ) පරිවාරපාළි.

සීමු. 2 — සීහළක්ඛරමුද්දිත (හේවාවිතාරණ) පරිවාරපාළි.

පැ — පැල්මඩුල්ල පුරාණවිහාර තාලපණ්ණ පොත්ථක.

මජසං — මරම්මඡට්ඨසඞ්ගීතිසංසෝධිත පරිවාරපාළි.

ස්‍යා — ස්‍යාම - තාය්‍යක්ඛරමුද්දිත පරිවාරපාළි.

PTS — PALI TEXT SOCIETY PARIVARAPALI.



Free Distribution www.aathaapi.org

# පරිවාරපාළි

# විසයසූචි


## ඛන්ධකපුච්ඡා 1 - 7

## එකුත්තරිකං 8 - 83

| | |
|---|---|
| එකකං | 8 - 11 |
| දුකං | 12 - 23 |
| තිකං | 22 - 35 |
| චතුක්කං | 36 - 47 |
| පඤ්චකං | 48 - 63 |
| ඡක්කං | 64 - 67 |
| සත්තකං | 68 - 73 |
| අට්ඨකං | 74 - 75 |
| නවකං | 76 - 77 |
| දසකං | 76 - 81 |
| එකාදසකං | 82 - 83 |

## උපොසථාදි පුච්ඡා-විස්සජ්ජනා 84 - 87

| | |
|---|---|
| පුච්ඡා | 84 - 85 |
| විස්සජ්ජනා | 84 - 87 |

## අත්ථවසපකරණං 88 - 91

## ගාථාසඞ්ගණිකං 92 - 105

| | |
|---|---|
| චතුවිපත්ති | 96 - 97 |
| ඡේදනකාදි | 98 - 99 |
| අසාධාරණාදි | 99 - 101 |
| පාරාජිකාදි ආපත්ති | 102 - 105 |

## අධිකරණභෙදො 106 - 129

| | |
|---|---|
| අධිකරණනිදානාදයො | 108 - 117 |
| අධිකරණාධිප්පායො | 116 - 119 |
| පුච්ඡාවිස්සජ්ජනවාරො | 120 - 121 |
| සංසට්ඨවාරො | 120 - 121 |
| සමථනිදානාදයො | 122 - 125 |
| සමථානානත්ථාදයො | 124 - 129 |
| අපරගාථා සඞ්ගණිකං | 130 - 133 |

## චොදනාකණ්ඩං 134 - 143

| | |
|---|---|
| අනුවිජ්ජකස්ස අනුයොගො | 134 - 137 |
| චොදකාදිපටිපත්ති | 138 - 139 |
| චොදකස්ස අත්තජ්ඣාපනං | 138 - 143 |




Free Distribution www.aathaapi.org

## චූළසඞ්ගාමො 144 – 149


අනුවිජ්ජකස්ස පටිපත්ති — 144 – 149


## මහාසඞ්ගාමො 150 – 169


අනුවිජ්ජක අනුයොගො — 162 – 167
පුච්ඡා විභාගො — — 166 – 169


## කඨිනභෙදෙ 170 – 189


පුච්ඡා විස්සජ්ජනං — — —172-179
සඞ්ගහවාරො — — —178-189


## උපාලිපඤ්චකං 190 – 265


1. අනිස්සිතවග්ගො — — —190-197
2. නප්පටිප්පස්සම්භනවග්ගො — —196-201
3. වොහාරවග්ගො — — —202-209
4. දිට්ඨාවිකම්මවග්ගො — — —208-215
5. අත්තාදානවග්ගො — — —216-225
6. ධුතඞ්ගවග්ගො — — —226-227
7. මුසාවාදවග්ගො — — —228-231
8. භික්ඛුනොවාදවග්ගො — — —232-237
9 උබ්බාහිකවග්ගො — — —238-245
10. අධිකරණවූපසමවග්ගො — —244-251
11. සඞ්ඝභෙදකවග්ගො — — —250-255
12. දුතිය සඞ්ඝභෙදකවග්ගො — —254-257
13. ආවාසිකවග්ගො — — —258-261
14 කඨිනත්ථාරවග්ගො — — —260-265


## සමුට්ඨානං 266 – 273


චත්තාරො පාරාජිකා — —266-267
තෙරස සඞ්ඝාදිසෙසා — —266-271
සෙඛියා — — —270-271


## දුතියගාථාසඞ්ගණිකං 274 – 289

## සෙදමොචනගාථා 290 – 299


1. කම්මවග්ගො — — —300 309
2. අත්ථවසවග්ගො — — —308-311
3. පඤ්ඤත්තවග්ගො — — —310-311
4. අපඤ්ඤත්තෙන පඤ්ඤත්තවග්ගො —310-313
5. නවසඞ්ගහවග්ගො — — —314-317
වග්ග පඤ්චකස්ස උද්දානං — —316-319





Free Distribution www.aathaapi.org

විනයපිටකෙ

# පරිවාරපාළි

දුතියො භාගො

විනය පිටකයෙහි

# පරිවාර පාළිය

ද්විතීය භාගය

3—ඒ 30906 (77/12)

Free Distribution www.aathaapi.org

## විනයපිටකෙ

# පරිවාරපාළි

## දුතියො භාගො

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

## ඛන්ධකපුච්ඡා

1. උපසම්පදං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: උපසම්පදං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං ද්වෙ ආපත්තියො.

2. උපොසථං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: උපොසථං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

3. වස්සූපනායිකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: වස්සූපනායිකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

4. පවාරණං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: පවාරණං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

5. චම්මසඤ්ඤුත්තං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: චම්මසඤ්ඤුත්තං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

6. භෙසජ්ජං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: භෙසජ්ජං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

7. කඨිනකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: කඨිනකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං නත්ථි තත්ථ ආපත්ති.

8. චීවරසඤ්ඤුත්තං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: චීවරසඤ්ඤුත්තං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

## විනය පිටකයෙහි

# පරිවාර පාළිය

## විතීය භාගය

**භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.**

## ඛන්ධකපුච්ඡා

1. නිදාන සහිත නිර්දේශ සහිත උපසම්පදඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ (ඇවැත් පැණ වූ පදයන්ගේ) ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත උපසම්පදඛන්ධකය විසඳමි, උත්කෘෂ්ටපදයන්ගේ (පචිති – දුකුළා) ඇවැත් දෙකෙකි.

2. නිදාන සහිත නිර්දේශ සහිත උපොසථක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන් ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත උපොසථක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි – පචිති – දුකුළා) ඇවැත් තුණෙකි.

3. නිදාන සහිත නිර්දේශ සහිත වස්සූපනායිකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත වස්සූපනායිකක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

4. නිදාන සහිත නිර්දේශ සහිත පවාරණක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත පවාරණක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි – පචිති – දුකුළා) ඇවැත් තුණෙකි.

5. නිදාන සහිත නිර්දේශ සහිත චම්මක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත චම්මක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි – පචිති – දුකුළා) ඇවැත් තුණෙකි.

6. නිදාන සහිත නිර්දේශ සහිත භෙසජ්ජඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත භෙසජ්ජඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි – පචිති – දුකුළා) ඇවැත් තුණෙකි.

7. නිදාන සහිත නිර්දේශ සහිත කඨිනක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත කඨිනක්ඛන්ධකය විසඳමි. එහි උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් නැති.

8. නිදාන සහිත නිර්දේශ සහිත චීවරක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත චීවරක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි – නිසඟි පචිති – දුකුළා) ඇවැත් තුණෙකි.



Free Distribution www.aathaapi.org

9. චම්පෙය්‍යකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: චම්පෙය්‍යකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

10. කොසම්බකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: කොසම්බකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

11. කම්මක්ඛන්ධකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: කම්මක්ඛන්ධකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

12. පාරිවාසිකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: පාරිවාසිකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

13. සමුච්චයං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සමුච්චයං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

14 සමථං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සමථං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං ද්වෙ ආපත්තියො.

15. ඛුද්දකවත්ථුකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: ඛුද්දකවත්ථුකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො.

16. සෙනාසනං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සෙනාසනං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං තිස්සො ආපත්තියො

17. සඞ්ඝභෙදං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සඞ්ඝභෙදං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං ද්වෙ ආපත්තියො.

18. සමාචාරං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සමාචාරං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

19. ඨපනං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: ඨපනං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං එකා ආපත්ති.

20. භික්ඛුනික්ඛන්ධකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: භික්ඛුනික්ඛන්ධකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං ද්වෙ ආපත්තියො.

9. නිදාන සහිත නිර්දේශ සහිත චම්පෙය්‍යක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන් ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත චම්පෙය්‍යක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

10. නිදාන සහිත නිර්දේශ සහිත කොසම්බකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත කොසම්බකක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

11. නිදාන සහිත නිර්දේශ සහිත කම්මක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත කම්මක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

12. නිදාන සහිත නිර්දේශ සහිත පාරිවාසිකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත පාරිවාසිකක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

13. නිදාන සහිත නිර්දේශ සහිත සමුච්චයක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත සමුච්චයක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

14. නිදාන සහිත නිර්දේශ සහිත සමථක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත සමථක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ට පදයන්ගේ (පචිති - දුකුළා) ඇවැත් දෙකෙකි.

15. නිදාන සහිත නිර්දේශ සහිත ඛුද්දකවත්ථුකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත ඛුද්දකවත්ථුකක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි - පචිති - දුකුළා) ඇවැත් තුණෙකි.

16. නිදාන සහිත නිර්දේශ සහිත සෙනාසනක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත සෙනාසනක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි - පචිති - දුකුළා) ඇවැත් තුණෙකි.

17. නිදාන සහිත නිර්දේශ සහිත සඞ්ඝභෙදකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත සඞ්ඝභෙදකක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (ථුලැසි - පචිති) ඇවැත් දෙකෙකි.

18. නිදාන සහිත නිර්දේශ සහිත වත්තක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත වත්තක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

19. නිදාන සහිත නිර්දේශ සහිත පාතිමොක්ඛඨපනක්ඛන්ධකය පුළුවුස්මි. උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත පාතිමොක්ඛ-ඨපනක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ එක් (දුකුළා) ඇවැතෙකි.

20. නිදාන සහිත නිර්දේශ සහිත භික්ඛුනීක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ටපදයන් ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත භික්ඛුනීක්ඛන්ධකය විසඳමි. උත්කෘෂ්ටපදයන්ගේ (පචිති - දුකුළා) ඇවැත් දෙකෙකි.

21. පඤ්චසතිකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: පඤ්චසතිකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං නත්ථි තත්ථ ආපත්ති.

22. සත්තසතිකං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං කති ආපත්තියො: සත්තසතිකං විස්සජ්ජිස්සං සනිදානං සනිද්දෙසං, සමුක්කට්ඨපදානං නත්ථි තත්ථ ආපත්තීති.

ඛන්ධකපුච්ඡා නිට්ඨිතා පඨමං.

---

තස්සුද්දානං:

1. උපසම්පදූපොසථා[1] - වස්සූපනායිකපවාරණා,[2]
චම්මභෙසජ්ජකඨිනා - චීවරං චම්පෙය්‍යකෙන ච.

2. කොසම්බකක්ඛන්ධකං කම්මං - පරිවාසිකසමුච්චයා,
සමථඛුද්දකා සෙනා - සඞ්ඝභෙදං සමාචාරො,[3]
ඨපනං භික්ඛුනීඛන්ධං - පඤ්චසත්තසතෙන චාති.

---

1. උපසම්පදූපොසථං - ස්‍යා.
2. වස්සූපනාපවාරණං - ස්‍යා.
3. සඞ්ඝභෙදසමාචරා - ස්‍යා.

21. නිදාන සහිත නිර්දේශ සහිත පඤ්චසතිකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත පඤ්චසතිකක්ඛන්ධකය විසඳමි. එහි උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් නැති.

22. නිදාන සහිත නිර්දේශ සහිත සත්තසතිකක්ඛන්ධකය පුළුවුස්මි, උත්කෘෂ්ට පදයන්ගේ ඇවැත් කෙතෙක යත් : නිදාන සහිත නිර්දේශ සහිත සත්තසතිකක්ඛන්ධකය විසඳමි. එහි උත්කෘෂ්ටපදයන්ගේ ඇවැත් නැති යි.

පළමුවන ඛන්ධකපුච්ඡා නිමි.

---

එහි නාමාවලිය :

උපසම්පද යැ උපොසථ යැ වස්සූපනායික යැ පවාරණ යැ චම්ම යැ භෙසජ්ජ යැ කඨින යැ චම්පෙය්‍යය සමග චීවර යැ.

කොසම්බක යැ කම්ම යැ පාරිවාසික යැ සමුච්චය යැ සමථ යැ ඛුද්දකවත්ථුක යැ සෙනාසන යැ සඞ්ඝභෙදක යැ වත්ත යැ පාතිමොක්ඛඨපන යැ භික්ඛුණී යැ පඤ්චසතික යැ සත්තසතිකයෙනැ යි ඛන්ධකපුච්ඡා යි.

# එකුත්තරිකං

## එකකං

1. ආපත්තිකරා ධම්මා ජානිතබ්බා, අනාපත්තිකරා ධම්මා ජානිතබ්බා.

ආපත්ති ජානිතබ්බා, අනාපත්ති ජානිතබ්බා.

ලහුකා ආපත්ති ජානිතබ්බා, ගරුකා ආපත්ති ජානිතබ්බා.

සාවසෙසා ආපත්ති ජානිතබ්බා, අනවසෙසා ආපත්ති ජානිතබ්බා.

දුට්ඨුල්ලා ආපත්ති ජානිතබ්බා, අදුට්ඨුල්ලා ආපත්ති ජානිතබ්බා.

සප්පටිකම්මා ආපත්ති ජානිතබ්බා, අප්පටිකම්මා ආපත්ති ජානිතබ්බා.

දෙසනාගාමිනී ආපත්ති ජානිතබ්බා, අදෙසනාගාමිනී ආපත්ති ජානිතබ්බා.

අන්තරායිකා ආපත්ති ජානිතබ්බා, අනන්තරායිකා ආපත්ති ජානිතබ්බා.

සාවජ්ජපඤ්ඤත්ති ආපත්ති ජානිතබ්බා, අනවජ්ජපඤ්ඤත්ති ආපත්ති ජානිතබ්බා.

කිරියතො සමුට්ඨිතා ආපත්ති ජානිතබ්බා, අකිරියතො සමුට්ඨිතා ආපත්ති ජානිතබ්බා, කිරියාකිරියතො සමුට්ඨිතා ආපත්ති ජානිතබ්බා.

පුබ්බාපත්ති ජානිතබ්බා, අපරාපත්ති ජානිතබ්බා.

පුබ්බාපත්තීනං අන්තරාපත්ති ජානිතබ්බා, අපරාපත්තීනං අන්තරාපත්ති ජානිතබ්බා.

දෙසිතා ගණනූපගා ආපත්ති ජානිතබ්බා, දෙසිතා න ගණනූපගා ආපත්ති ජානිතබ්බා.

පඤ්ඤත්ති ජානිතබ්බා, අනුපඤ්ඤත්ති ජානිතබ්බා. අනුප්පන්නපඤ්ඤත්ති ජානිතබ්බා.

සබ්බත්ථපඤ්ඤත්ති ජානිතබ්බා, පදෙසපඤ්ඤත්ති ජානිතබ්බා,

සාධාරණපඤ්ඤත්ති ජානිතබ්බා, අසාධාරණපඤ්ඤත්ති ජානිතබ්බා.

එකතො පඤ්ඤත්ති ජානිතබ්බා, උභතො පඤ්ඤත්ති ජානිතබ්බා.

ථුල්ලවජ්ජා ආපත්ති ජානිතබ්බා, අථුල්ලවජ්ජා ආපත්ති ජානිතබ්බා.

# එකොත්තරිකය

## එකකය

1. ආපත්තිකර ධර්මයෝ (ෂට් සමුත්ථානයෝ) දතයුත්තාහ. අනාපත්තිකර ධර්මයෝ (සප්ත ශමථයෝ) දතයුත්තාහ.

ආපත්තීහු දතයුත්තාහ, අනාපත්තීහු දතයුත්තාහ.

ලහුකාපත්තීහු දතයුත්තාහ, ගරුකාපත්තීහු දතයුත්තාහ.

සාවසෙසාපත්තීහු දතයුත්තාහ, අනවසෙසාපත්තීහු දතයුත්තාහ.

දුට්ඨුල්ලාපත්තීහු දතයුත්තාහ, අදුට්ඨුල්ලාපත්තීහු දතයුත්තාහ.

සප්‍රතිකර්මාපත්තීහු දතයුත්තාහ, අප්‍රතිකර්මාපත්තීහු දතයුත්තාහ.

දෙසනාගාමිනී ආපත්තීහු දතයුත්තාහ. අදෙසනාගාමිනී ආපත්තීහු දතයුත්තාහ.

අන්තරායකර ආපත්තීහු දතයුත්තාහ, අනන්තරායකර ආපත්තීහු දතයුත්තාහ.

ලොකවද්‍ය ආපත්තීහු දතයුත්තාහ, ප්‍රඥප්තිවද්‍ය ආපත්තීහු දතයුත්තාහ.

ක්‍රියායෙන් නගින (පරිජි වැනි) ඇවැත්හු දතයුත්තාහ. අක්‍රියායෙන් නගින ඇවැත්හු දතයුත්තාහ. ක්‍රියාක්‍රියායෙන් නගින ඇවැත්හු දතයුත්තාහ.

පළමු නගින ඇවැත්හු දතයුත්තාහ. (පිරිවෙස් ආදියෙන්) පසු වැ නගින ඇවැත්හු දතයුත්තාහ.

පූර්වාපත්තීන්ට අතර නගින (පිරිවෙස් මානත් පුරණ කල්හි පැමිණෙන සඟවෙසෙස්) ඇවැත්හු දතයුත්තාහ. පසු වැ නගින ඇවැතුන්ට අතර පැමිණෙන ඇවැත්හු දතයුත්තාහ.

දෙසන ලද ගිණීමට පැමිණි ඇවැත්හු දතයුත්තාහ, දෙසන ලද ගිණීමට නො පැමිණි ඇවැත්හු දතයුත්තාහ.

පඤ්ඤත්තිය දතයුතු යැ, අනුපඤ්ඤත්ති දතයුතු ය, අනුප්පන්න පඤ්ඤත්ති දතයුතු යැ.

සබ්බත්ථ පඤ්ඤත්ති දතයුතු යැ, පදෙස පඤ්ඤත්ති දතයුතු යැ.

සාධාරණ පඤ්ඤත්ති දතයුතු යැ, අසාධාරණ පඤ්ඤත්ති දතයුතු යැ.

එකතො පඤ්ඤත්ති දතයුතු යැ, උභතො පඤ්ඤත්ති දතයුතු යැ.

මහත් වරද ඇති ඇවැත්හු දතයුත්තාහ, නො මහත් වරද ඇති ඇවැත්හු දතයුත්තාහ.



Free Distribution www.aathaapi.org

ගිහිපටිසංයුත්තා ආපත්ති ජානිතබ්බා, න ගිහිපටිසංයුත්තා ආපත්ති ජානිතබ්බා.

නියතා ආපත්ති ජානිතබ්බා, අනියතා ආපත්ති ජානිතබ්බා.

ආදිකරො පුග්ගලො ජානිතබ්බො. අනාදිකරො පුග්ගලො ජානිතබ්බො.

අධිච්චාපත්තිකො පුග්ගලො ජානිතබ්බො, අභිණ්හාපත්තිකො පුග්ගලො ජානිතබ්බො.

චොදකො පුග්ගලො ජානිතබ්බො, චුදිතකො පුග්ගලො ජානිතබ්බො.

අධම්මචොදකො පුග්ගලො ජානිතබ්බො, අධම්මචුදිතකො පුග්ගලො ජානිතබ්බො.

ධම්මචොදකො පුග්ගලො ජානිතබ්බො, ධම්මචුදිතකො පුග්ගලො ජානිතබ්බො.

නියතො පුග්ගලො ජානිතබ්බො, අනියතො පුග්ගලො ජානිතබ්බො.

භබ්බාපත්තිකො පුග්ගලො ජානිතබ්බො, අභබ්බාපත්තිකො පුග්ගලො ජානිතබ්බො.

උක්ඛිත්තකො පුග්ගලො ජානිතබ්බො; අනුක්ඛිත්තකො පුග්ගලො ජානිතබ්බො.

නාසිතකො පුග්ගලො ජානිතබ්බො, අනාසිතකො පුග්ගලො ජානිතබ්බො.

සමානසංවාසකො පුග්ගලො ජානිතබ්බො, අසමානවාසකො පුග්ගලො ජානිතබ්බො.

ඨපනං ජානිතබ්බන්ති.

එකකං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. කරා ආපත්ති ලහුකා සාවසෙසා ච දුට්ඨුල්ලා,
පටිකම්මදෙසනා චෙව අන්තරාවජ්ජකිරියා[1]

2. කිරියාකිරියං පුබ්බා අන්තරා ගණනූපගා,
පඤ්ඤත්ති අනානුප්පන්න සබ්බත්‍ථ පදෙසසාධාරණා ච එකතො.[2]

3. ථුල්ලගිහිනියතා ච ආදි අධිච්ච චොදකා,
අධම්මධම්ම නියතො අභබ්බාක්ඛිත්ත නාසිතා,
සමානං ඨපනං චෙව උද්දානං එකකෙ ඉදන්ති.

1. පටිකම්ම දෙසනා ච අන්තරාවජ්ජකිරියං - ම.ඡ.සං.
2. සබ්බත්‍ථාධාරනා ච එකතො - ම.ඡ සං.
පඤ්ඤත්තානුප්පන්නා සබ්බා සාධාරණෙ ච එකතො - ස්‍යා.

ගෘහීප්‍රතිසංයුක්ත ඇවැත්හු දතයුත්තාහ, ගෘහීප්‍රතිසංයුක්ත නොවූ ඇවැත්හු දතයුත්තාහ.

නියතාපත්තීහු දතයුත්තාහ, අනියතාපත්තීහු දතයුත්තාහ.

(සුදින්නස්ථවිරාදි) ආදි කම්මික පුද්ගල දතයුතු යැ, (මක්කටී සමණාදී) අනුප්පඤ්ඤත්තිකාරක පුද්ගල දතයුතු යැ.

කිසිවිටෙක ඇවැතට පැමිණෙන අධිච්චාපත්තික පුද්ගල දතයුතු යැ, එක්වන් ඇවැතට පැමිණෙන අභිණ්හාපත්තික පුද්ගල දතයුතු යැ.

චොදක පුද්ගල දතයුතු යැ, චුදිතක පුද්ගල දතයුතු යැ.

(අභූත වස්තුවෙන් චොදනා කරණ) අධර්ම චොදක පුද්ගල දතයුතු යැ, අධර්ම චුදිතක පුද්ගල දතයුතු යැ.

ධර්මචොදක පුද්ගල දතයුතු යැ, ධර්මචුදිතක පුද්ගල දතයුතු යැ.

(මිච්ඡත්ත-සම්මත්ත විසින්) නියත පුද්ගල දතයුතු යැ, අනියත පුද්ගල දතයුතු යැ.

ඇවැත් අවදනට සුදුසු පුද්ගල දතයුතු යැ, ඇවැත් අවදනට නො නිසි පුද්ගල දතයුතු යැ.

උකෙඛිනීකම් කළ පුද්ගල දතයුතු යැ, (තජ්ජනීයාදී සෙසු සිවුවැදෑරුම් කම් කළ) උකෙඛිනීකම් නො කළ පුද්ගල දතයුතු යැ.

නාසිතක පුද්ගල දතයුතු යැ, අනාසිතක පුද්ගල දතයුතු යැ.

සමානසංවාසක පුද්ගල දතයුතු යැ, අසමානසංවාසක පුද්ගල දතයුතු යැ.

පාමොක් තැබීම දතයුතු යි.

එකකය නිමි

---

එහි නාමාවලිය :

1. ආපත්තිකර යැ අනාපත්තිකර යැ ආපත්ති යැ අනාපත්ති යැ ලහුක යැ ගරුක යැ සාවසෙස යැ අනවසෙස යැ දුට්ඨුල්ල යැ අදුට්ඨුල්ල යැ සප්පටිකම්ම යැ අප්පටිකම්ම යැ දෙසනාගාමිනී යැ අදෙසාගාමිනී යැ අන්තරායක යැ අනන්තරායක යැ සාවජ්ජ අනවජ්ජ පඤ්ඤත්ති යැ,

2. කිරියසමුට්ඨිත යැ අකිරියසමුට්ඨිත යැ කිරියාකිරිය සමුට්ඨිත යැ පුබ්බාපරාපත්ති යැ අන්තරාපත්ති යැ දෙසිතගණනුපග යැ දෙසිත න ගණනුපග යැ පඤ්ඤත්ති යැ අනුපඤ්ඤත්ති යැ අනුප්පන්න-සබ්බත්ථ-පදෙස-සාධාරණ-අසාධාරණ එකතො-උභතො පඤ්ඤත්ති යැ,

3. ථුල්ල අථුල්ල වජ්ජ යැ ගිහී-න ගිහී පටිසංයුත්ත යැ නියත යැ අනියත යැ ආදිකර-අනාදිකර යැ අධිච්චාපත්තිකර යැ අභිණ්හාපත්තිකර යැ චොදක යැ චුදිත යැ අධම්ම-ධම්මචොදක යැ අධම්ම-ධම්මචුදිතක යැ නියත-අනියත පුග්ගල යැ භබ්බාභබ්බාපත්තික යැ උක්ඛිත්ත යැ අනුක්ඛිත්ත යැ නාසිතක යැ අනාසිතක යැ සමාන-අසමාන සංවාසක යැ ඨපනක යැ යි එකකයෙහි තෙල උද්දන යි.

## දුකං

1. අත්ථාපත්ති සඤ්ඤාවිමොක්ඛා, අත්ථාපත්ති නො සඤ්ඤාවිමොක්ඛා.

අත්ථාපත්ති ලද්ධසමාපත්තිකස්ස, අත්ථාපත්ති න ලද්ධසමාපත්තිකස්ස.

අත්ථාපත්ති සද්ධම්මපටිසංයුත්තා, අත්ථාපත්ති අසද්ධම්මපටිසංයුත්තා.

අත්ථාපත්ති සපරික්ඛාරපටිසංයුත්තා, අත්ථාපත්ති පරපරික්ඛාර පටිසංයුත්තා.

අත්ථාපත්ති සපුග්ගලපටිසංයුත්තා, අත්ථාපත්ති පරපුග්ගලපටිසංයුත්තා.

අත්ථි සච්චං භණන්තො ගරුකං ආපත්තිං ආපජ්ජති, අත්ථි සච්චං භණන්තො ලහුකං ආපත්තිං ආපජ්ජති.

අත්ථි මුසා භණන්තො ගරුකං ආපත්තිං ආපජ්ජති, අත්ථි මුසා භණන්තො ලහුකං ආපත්තිං ආපජ්ජති.

අත්ථාපත්ති භූමිගතො ආපජ්ජති නො වෙහාසගතො, අත්ථාපත්ති වෙහාසගතො ආපජ්ජති නො භූමිගතො.

අත්ථාපත්ති නික්ඛමන්තො ආපජ්ජති නො පවිසන්තො, අත්ථාපත්ති පවිසන්තො ආපජ්ජති නො නික්ඛමන්තො.

අත්ථාපත්ති ආදියන්තො ආපජ්ජති, අත්ථාපත්ති අනාදියන්තො ආපජ්ජති.

අත්ථාපත්ති සමාදියන්තො ආපජ්ජති, අත්ථාපත්ති න සමාදියන්තො ආපජ්ජති.

අත්ථාපත්ති කරොන්තො ආපජ්ජති, අත්ථාපත්ති න කරොන්තො ආපජ්ජති.

අත්ථාපත්ති දෙන්තො ආපජ්ජති, අත්ථාපත්ති න දෙන්තො ආපජ්ජති.

අත්ථාපත්ති දෙසෙන්තො ආපජ්ජති, අත්ථාපත්ති න දෙසෙන්තො ආපජ්ජති.

අත්ථාපත්ති පටිග්ගණ්හන්තො ආපජ්ජති, අත්ථාපත්ති න පටිග්ගණ්හන්තො ආපජ්ජති.

අත්ථාපත්ති පරිභොගෙන ආපජ්ජති, අත්ථාපත්ති න පරිභොගෙන ආපජ්ජති.

අත්ථාපත්ති රත්තිං ආපජ්ජති නො දිවා, අත්ථාපත්ති දිවා ආපජ්ජති නො රත්තිං.

අත්ථාපත්ති අරුණුග්ගෙ ආපජ්ජති, අත්ථාපත්ති න අරුණුග්ගෙ ආපජ්ජති.

## දුකය

1. සංඥ විමොක්ෂ ඇවැත් ඇත, සංඥ විමොක්ෂ නොවූ ඇවැත් ඇති.

ලබ්ධසමාපත්තිකයාහට ආපත්තියෙක් ඇත, අලබ්ධසමාපත්තිකයාහට ආපත්ති-යෙක් ඇති.

සද්ධර්ම ප්‍රතිසංයුක්තාපත්තියෙක් ඇත, අසද්ධර්ම ප්‍රතිසංයුක්තාපත්තියෙක් ඇති.

ස්වපරිෂ්කාර ප්‍රතිසංයුක්තාපත්තියෙක් ඇත, පරපරිෂ්කාර ප්‍රතිසංයුක්තාපත්තියෙක් ඇති.

ස්වපුද්ගල ප්‍රතිසංයුක්තාපත්තියෙක් ඇත, පරපුද්ගල ප්‍රතිස්ංයුක්තාපත්තියෙක් ඇති.

සත්‍යය කියමින් ගරු ඇවැතට පැමිණීමෙක් ඇත, සත්‍යය කියමින් ලුහු ඇවැතට පැමිණීමෙක් ඇති.

මුසා බෙණෙමින් ගරු ඇවැතට පැමිණීමෙක් ඇත, මුසා බෙණෙමින් ලහු ඇවැතට පැමිණීමෙක් ඇති.

අහස්ගත නො වැ භූමිගත වැ ඇවැතට පැමිණීමෙක් ඇත, භූමිගත නො වැ අහස්-ගත වැ ඇවැතට පැමිණීමෙක් ඇති.

පිවිසෙමින් නො වැ නික්මෙමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නික්මෙමින් නො වැ පිවිසෙමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

ගණිමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො ගණිමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

සමාදන් වෙමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො සමාදන් වෙමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

කරමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො කරමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

දෙමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නොදෙමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

දෙසමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො දෙසමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

පිළිගණිමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො පිළිගණිමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

පරිභොගයෙන් ඇවැතට පැමිණීමෙක් ඇත, අපරිභොගයෙන් ඇවැතට පැමිණී-මෙක් ඇති.

දහවල් නො වැ රාත්‍රියෙහි ඇවැතට පැමිණීමෙක් ඇත, රාත්‍රියෙහි නො වැ දහවල්හි ඇවැතට පැමිණීමෙක් ඇති.

අරුණ නැඟීමෙහි ඇවැතට පැමිණීමෙක් ඇත, අරුණ නො නැඟීමෙහි ඇවැතට පැමිණීමෙක් ඇති.

අත්ථාපත්ති ඡින්දන්තො ආපජ්ජති, අත්ථාපත්ති න ඡින්දන්තො ආපජ්ජති.

අත්ථාපත්ති ඡාදෙන්තො ආපජ්ජති, අත්ථාපත්ති න ඡාදෙන්තො ආපජ්ජති.

අත්ථාපත්ති ධාරෙන්තො ආපජ්ජති, අත්ථාපත්ති න ධාරෙන්තො ආපජ්ජති.

2. ද්වෙ උපොසථා: චාතුද්දසිකො ච පණ්ණරසිකො ච.

ද්වෙ පවාරණා: චාතුද්දසිකා ච පණ්ණරසිකා ච.

ද්වෙ කම්මානි: අපලොකනකම්මං, ඤත්තිකම්මං. අපරානිපි ද්වෙ කම්මානි: ඤත්තිදුතියකම්මං, ඤත්තිචතුත්ථකම්මං.

ද්වෙ කම්මවත්ථූනි: අපලොකනකම්මස්ස වත්ථු, ඤත්තිකම්මස්ස වත්ථු. අපරානිපි ද්වෙ කම්මවත්ථූනි: ඤත්තිදුතියකම්මස්ස වත්ථු, ඤත්තිචතුත්ථකම්මස්ස වත්ථු.

ද්වෙ කම්මදොසා: අපලොකනකම්මස්ස දොසො, ඤත්තිකම්මස්ස දොසො. අපරෙපි ද්වෙ කම්මදොසා: ඤත්තිදුතියකම්මස්ස දොසො, ඤත්තිචතුත්ථකම්මස්ස දොසො.

ද්වෙ කම්මසම්පත්තියො: අපලොකනකම්මස්ස සම්පත්ති, ඤත්තිකම්මස්ස සම්පත්ති. අපරාපි ද්වෙ කම්මසම්පත්තියො: ඤත්තිදුතියකම්මස්ස සම්පත්ති, ඤත්තිචතුත්ථකම්මස්ස සම්පත්ති.

ද්වෙ නානාසංවාසකභූමියො: අත්තනාව අත්තානං නානාසංවාසකං කරොති, සමග්ගො වා නං සඞ්ඝො උක්ඛිපති අදස්සනෙ වා අප්පටිකම්මෙ වා අප්පටිනිස්සග්ගෙ වා.

ද්වෙ සමානසංවාසකභූමියො: අත්තනාව අත්තානං සමානසංවාසකං කරොති, සමග්ගො වා නං සඞ්ඝො උක්ඛිත්තං ඔසාරෙති දස්සනෙ වා පටිකම්මෙ වා පටිනිස්සග්ගෙ වා.

ද්වෙ පාරාජිකා: භික්ඛූනඤ්ච භික්ඛුනීනඤ්ච, ද්වෙ සඞ්ඝාදිසෙසා -පෙ- ද්වෙ ථුල්ලච්චයා -පෙ- ද්වෙ පාචිත්තියා -පෙ- ද්වෙ පාටිදෙසනීයා -පෙ- ද්වෙ දුක්කටා -පෙ- ද්වෙ දුබ්භාසිතා භික්ඛූනඤ්ච භික්ඛුනීනඤ්ච.

සත්ත ආපත්තියො, සත්ත ආපත්තික්ඛන්ධා.

ද්වීහාකාරෙහි සඞ්ඝො භිජ්ජති: කම්මෙන වා, සලාකග්ගාහෙන වා.

3. ද්වෙ පුග්ගලා න උපසම්පාදෙතබ්බා: අද්ධානහීනො අඞ්ගහීනො. අපරෙපි ද්වෙ පුග්ගලා න උපසම්පාදෙතබ්බා: වත්ථුවිපන්නො කරණදුක්කටකො. අපරෙපි ද්වෙ පුග්ගලා න උපසම්පාදෙතබ්බා: අපරිපූරො පරිපූරො නො ච යාචති.

ද්වින්නං පුග්ගලානං නිස්සාය න වත්ථබ්බං: අලජ්ජිස්ස ච බාලස්ස ච.

සිදිමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො සිදිමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

පිළිසන් කරමින් ඇවැතට පැමිණීමෙක් ඇත, පිළිසන් නො කරමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

දරමින් ඇවැතට පැමිණීමෙක් ඇත, නො දරමින් ඇවැතට පැමිණීමෙක් ඇති.

2. චාතුද්දසී යැ, පණ්ණරසී යැයි පොහෝ දෙකෙකි

චාතුද්දසී යැ පණ්ණරසී යැ යි පවාරණ දෙකෙකි.

අපලොකන කර්ම යැ ඤත්තිකර්ම යැ යි කර්ම දෙකෙකැ. ඤත්තිදුතිය කර්ම යැ ඤත්තිචතුත්ථ කර්ම යැ යි අන්‍යවූ ද කර්ම දෙකෙකි.

අපලොකන කර්මය පිළිබඳ වස්තු යැ, ඤත්ති කර්මය පිළිබඳ වස්තු යැ යි කර්ම වස්තු දෙකෙකැ. ඤත්ති දුතිය කර්මය පිළිබඳ වස්තු යැ, ඤත්තිචතුත්ථ කර්මය පිළිබඳ වස්තු යැයි අන්‍යවූ ද කර්ම වස්තු දෙකෙකි.

අපලොකන කර්මය පිළිබඳ දෝෂ යැ, ඤත්ති කර්මය පිළිබඳ දෝෂ යැ යි කර්ම දෝෂ දෙකෙකැ. ඤත්තිදුතිය කර්මය පිළිබඳ දෝෂ යැ, ඤත්තිචතුත්ථ කර්මය පිළිබඳ දෝෂ යැ යි අන්‍යවූ ද කර්ම දෝෂ දෙකෙකි.

අපලොකන කර්මය පිළිබඳ සම්පත්ති යැ, ඤත්ති කර්මය පිළිබඳ සම්පත්ති යැ යි කර්ම සම්පත්ති දෙකෙකැ. ඤත්තිදුතිය කර්මය පිළිබඳ සම්පත්ති යැ, ඤත්තිචතුත්ථ කර්මය පිළිබඳ සම්පත්ති යැයි අන්‍යවූ ද කර්ම සම්පත්ති දෙකෙකි.

තෙමේ හෝ තමා නානාසංවාසකයකු කෙරේ ද, සමග සඞ්ඝ තෙමේ හෝ ඔහුට (ඇවැත) නො දක්මෙහි හෝ (ඇවැතට) පිළියම් නොකිරීමෙහි හෝ (ලාමක දෘෂ්ටිය) බැහැර නො කිරීමෙහි හෝ උක්වෙනිකම් කෙරේදැයි නානාසංවාසක භූමිහු දෙදෙනෙකි.

තෙමේ හෝ තමා සමාන සංවාසකයකු කෙරේ ද, සමග සඞ්ඝ තෙමේ හෝ (ඇවැත) දක්මෙහි හෝ (ඇවැතට) පිළියම් කිරීමෙහි හෝ (ලාමක දෘෂ්ටිය) බැහැර ලීමෙහි හෝ උක්වෙනිකම් කළ ඔහු ඇතුළත්කර ගණී දැයි සමාන සංවාසක භූමිහු දෙදෙනෙකි.

භික්ෂූන් පිළිබඳ වූ ද භික්ෂුණීන් පිළිබඳ වූ දැයි පරිජි දෙකෙකි. . . . . සඟවෙසෙස් දෙකෙකි. . . . . . ථුල්ලැසි දෙකෙකි. . . . . . පචිති දෙකෙකි. . . . . . පිළිදෙස්නී දෙකෙකි. . . . . . දුකුළා දෙකෙකි. භික්ෂූන් පිළිබඳවූ ද භික්ෂුණීන් පිළිබඳවූ ද දුබැසි දෙකෙකි,

ඇවැත් සතෙකි. ඇවැත් කඳු සතෙකි.

කර්මයෙන් හෝ ලහ ගැන්මෙන් හෝ යන දෙඅයුරින් සඞ්ඝ තෙමේ බිඳේ.

3. අද්ධානහීන (උනුවිසිවස් ඇති) යැ, අඞ්ගහීන යැ යන පුහුල්හු දෙදෙන උපසපන් නො කටයුත්තාහ, වස්තුවිපන්න යැ, කරණ දුෂ්කෘතක යැයි අන්‍යවූ පුහුල් හු දෙදෙන ද උපසපන් නොකටයුත්තාහ, පිරිපුන් පා සිවුරු නැත්තේ ද, පිරිපුන් වැ (උපසපුව) නො යදනේ දැයි අන්‍ය වූ පුද්ගලයෝ දෙදෙන ද උපසපන් නො කටයුත්තාහ.

අලජ්ජියා, ද අඥනයා දැයි දෙ පුහුලන් ඇසුරු කොට නො විසිය යුතු යැ.

ද්වින්නං පුග්ගලානං නිස්සයො න දාතබ්බො: අලජ්ජිස්ස ච ලජ්ජිනො ච න යාචති.

ද්වින්නං පුග්ගලානං නිස්සයො දාතබ්බො: බාලස්ස ච ලජ්ජිස්ස ච යාචති.

ද්වෙ පුග්ගලා අභබ්බා ආපත්තිං ආපජ්ජිතුං: බුද්ධා ච. පච්චෙකබුද්ධා ච.

ද්වෙ පුග්ගලා භබ්බා ආපත්තිං ආපජ්ජිතුං: භික්ඛූ ච භික්ඛුනියො ච.

ද්වෙ පුග්ගලා අභබ්බා සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජිතුං: භික්ඛූ ච භික්ඛුනියො ච අරියපුග්ගලා.

ද්වෙ පුග්ගලා භබ්බා සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජිතුං: භික්ඛූ ච භික්ඛුනියො ච පුථුජ්ජනා.

ද්වෙ පුග්ගලා අභබ්බා සඤ්චිච්ච සාතිසාරං වත්ථුං අජ්ඣාචරිතුං: භික්ඛූ ච භික්ඛුනියො ච අරියපුග්ගලා.

ද්වෙ පුග්ගලා භබ්බා සඤ්චිච්ච සාතිසාරං වත්ථුං අජ්ඣාචරිතුං: භික්ඛූ ච භික්ඛුනියො ච පුථුජ්ජනා.

ද්වෙ පටික්කොසා: කායෙන වා පටික්කොසති, වාචාය වා පටික්කොසති.

ද්වෙ නිස්සාරණා: අත්ථි පුග්ගලො අප්පත්තො නිස්සාරණං තඤ්චෙ සඞ්ඝො නිස්සාරෙති, එකච්චො සුනිස්සාරිතො, එකච්චො දුන්නිස්සාරිතො.

ද්වෙ ඔසාරණා: අත්ථි පුග්ගලො අප්පත්තො ඔසාරණං තඤ්චෙ සඞ්ඝො ඔසාරෙති, එකච්චො සොසාරිතො, එකච්චො දොසාරිතො.

ද්වෙ පටිඤ්ඤා: කායෙන වා පටිජානාති, වාචාය වා පටිජානාති.

ද්වෙ පටිග්ගහා: කායෙන වා පටිග්ගණ්හාති, කායපටිබද්ධෙන වා පටිග්ගණ්හාති.

ද්වෙ පටික්ඛෙපා: කායෙන වා පටික්ඛිපති වාචාය වා පටික්ඛිපති.

ද්වෙ උපඝාතිකා: සික්ඛූපඝාතිකා ච භොගූපඝාතිකා ච.

ද්වෙ චොදනා: කායෙන වා චොදෙති, වාචාය වා චොදෙති.

4. ද්වෙ කඨිනස්ස පලිබොධා: ආවාසපලිබොධො ච චීවරපලිබොධො ච.

ද්වෙ කඨිනස්ස අපලිබොධා: ආවාස අපලිබොධො ච චීවරඅපලිබොධො ච.

ද්වෙ චීවරානි: ගහපතිකඤ්ච පංසුකූලිකඤ්ච.

ද්වෙ පත්තා: අයොපත්තො මත්තිකා පත්තො.

ද්වෙ මණ්ඩලානි: තිපුමයං සීසමයං.

Free Distribution www.aathaapi.org

අලජ්ජියාහට ද, ලජ්ජී නමුදු නො යදනහුට දූයි දෙදෙනාහට නිස නො දිය යුතු.

බාලයාහට ද, ඇයැදුම් ඇති ලජ්ජියාහට දූයි දෙදෙනාහට නිස දිය යුතු.

බුදුහු ද, පසේබුදුහු දූයි දෙපුඟුල්හු ඇවැත් අවදනට නො නිස්සහ.

භික්ෂුහු ද, භික්ෂුණීහු දූයි දෙපුඟුල්හු ඇවැත් අවදනට නිස්සහ.

ආයඝී පුද්ගල වූ භික්ෂුහු ද භික්ෂුණීහු දූයි දෙපුඟුල්හු දූන දූන ඇවැත් අවදනට නො නිස්සහ.

පුහුදුන් වූ භික්ෂුහු ද, භික්ෂුණීහු දූයි දෙපුඟුල්හු දූන දූන ඇවැත් අවදනට නිස්සහ.

ආයඝී පුද්ගල වූ භික්ෂුහු ද, භික්ෂුණීහු දූයි දෙපුඟුල්හු දූන දූන සදොස් කරුණක් කරන්නට නො නිස්සහ.

පුහුදුන් වූ භික්ෂුහු ද, භික්ෂුණීහු දූයි දෙ පුඟුල්හු දූන දූන සදෙස් කරුණක් කරන්නට නිස්සහ.

කයින් හෝ ප්‍රතික්‍රොෂණය කෙරෙයි, වචනයෙන් හෝ ප්‍රතික්‍රොෂණය කෙරේ යැයි ප්‍රතික්‍රොෂණ දෙකෙකි.

නිස්සාරණයට අප්‍රාප්ත පුද්ගලයෙක් ඇත. ඉදින් සඟහු ඔහු නිස්සාරණය (බැහැර කිරීම) කෙරෙත් නම් එකෙක් සුනිස්සාරිත යැ, එකෙක් දුන්නිස්සාරිත යැයි නිස්සාරණ දෙකෙකි.

ඔසාරණ කර්මයට අප්‍රාප්ත පුද්ගලයෙක් ඇත. ඉදින් සඟහු ඔහු ඔසාරණය (ඇතුළත් කරගැන්ම) කෙරෙත් නම් එකෙක් සොසාරිත යැ, එකෙක් දෙසාරිත යැයි ඔසාරණ දෙකෙකි.

කයින් හෝ ප්‍රතිඥා කෙරෙයි, වචනයෙන් හෝ ප්‍රතිඥා කෙරේ යැයි ප්‍රතිඥා දෙකෙකි.

කයින් හෝ පිළිගණියි, කයපිළිබැඳියකින් හෝ පිළිගණී යැයි පිළිගැණීම් දෙකෙකි.

කයින් හෝ පිළිකෙවු කෙරෙයි, වචනයෙන් හෝ පිළිකෙවු කෙරේ යැයි පිළිකෙවු කිරීම් දෙකෙකි.

ශික්ෂොපසාතික යැ භොගොපසාතික යැයි උපසාතිකයෝ දෙදෙනෙකි.

කයින් හෝ චොදනා කෙරෙයි, වචනයෙන් හෝ චොදනා කෙරේ යැයි චොදනා දෙකෙකි.

4. ආවාසපළිබොධ යැ, චීවරපළිබොධ යැ යි කඨිනය පිළිබඳ පළිබොධ දෙකෙකි.

ආවාසපළිබොධාභාවයැ, චීවරපළිබොධාභාව යැයි කඨිනය පිළිබඳ පළිබොධාභාව දෙකෙකි.

ගෘහපතික යැ, පාංශුකූලික යැයි සිවුරු දෙකෙකි.

අයඃපාත්‍ර යැ, මෘත්පාත්‍ර යැයි පාත්‍ර දෙකෙකි.

රීයම්මුවා යැ, කලුතුඹමුවා යැ යි පාමඬුලු (පාත්‍ර අඩි) දෙකෙකි.


Free Distribution www.aathaapi.org

ද්වෙ පත්තස්ස අධිට්ඨානා : කායෙන වා අධිට්ඨෙති, වාචාය වා අධිට්ඨෙති.

ද්වෙ චීවරස්ස අධිට්ඨානා : කායෙන වා අධිට්ඨෙති, වාචාය වා අධිට්ඨෙති.

ද්වෙ විකප්පනා : සම්මුඛාවිකප්පනා ච පරම්මුඛාවිකප්පනා ච.

5. ද්වෙ විනයා : භික්ඛූනඤ්ච භික්ඛුනීනඤ්ච.

ද්වෙ වෙනයිකා : පඤ්ඤත්තඤ්ච පඤ්ඤත්තානුලොමඤ්ච.

ද්වෙ විනයස්ස සල්ලෙඛා : අකප්පියෙ සෙතුඝාතො, කප්පියෙ මත්තකාරිතා.

ද්වීහාකාරෙහි ආපත්තිං ආපජ්ජති : කායෙන වා ආපජ්ජති, වාචාය වා ආපජ්ජති.

ද්වීහාකාරෙහි ආපත්තියා වුට්ඨාති : කායෙන වා වුට්ඨාති, වාචාය වා වුට්ඨාති.

ද්වෙ පරිවාසා : පටිච්ඡන්නපරිවාසො අප්පටිච්ඡන්නපරිවාසො, අපරෙපි ද්වෙ පරිවාසා : සුද්ධන්තපරිවාසො සමොධානපරිවාසො.

ද්වෙ මානත්තා : පටිච්ඡන්නමානත්තං අප්පටිච්ඡන්නමානත්තං. අපරෙපි ද්වෙ මානත්තා : පක්ඛමානත්තං සමොධානමානත්තං.

ද්වින්නං පුග්ගලානං රත්තිච්ඡෙදො : පාරිවාසිකස්ස ච මානත්තචාරිකස්ස ච.

ද්වෙ අනාදරියානි : පුග්ගලඅනාදරියඤ්ච ධම්මඅනාදරියඤ්ච.

6. ද්වෙ ලොණානි : ජාතිමඤ්ච ඛාරිමඤ්ච,[1] අපරානිපි ද්වෙ ලොණානි : සාමුද්දං කාළලොණං. අපරානිපි ද්වෙ ලොණානි : සින්ධවං උබ්භිදං. අපරානිපි ද්වෙ ලොණානි : රොමකං පක්කාලකං.

ද්වෙ පරිභොගා : අබ්භන්තරපරිභොගො ච බාහිරපරිභොගො ච.

ද්වෙ අක්කොසා : හීනො ච අක්කොසො උක්කට්ඨො ච අක්කොසො.

ද්වීහාකාරෙහි පෙසුඤ්ඤං හොති : පියකම්‍යස්ස වා භෙදාධිප්පායස්ස වා.

ද්වීහාකාරෙහි ගණභොජනං පසවති : නිමන්තනතො වා විඤ්ඤත්තිතො වා.

7. ද්වෙ වස්සූපනායිකා : පුරිමිකා ච පච්ඡිමිකා ච.

ද්වෙ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

ද්වෙ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

---

1. ජාතිමයඤ්ච ඛාරිමයඤ්ච - ස්‍යා.

කයින් හෝ ඉටයි, වචනයෙන් හෝ ඉටා යැයි පාත්‍රය පිළිබඳ ඉටීම් දෙකෙකි.

කයින් හෝ ඉටයි, වචනයෙන් හෝ ඉටා යැ යි සිවුර පිළිබඳ ඉටීම් දෙකෙකි.

හමුවෙහි විකැපීම යැ, නො හමුවෙහි විකැපීම යැ යි විකැපුම් දෙකෙකි.

5. භික්ෂූන් පිළිබඳවූ ද, භික්ෂුණීන් පිළිබඳවූ ද විනය දෙකෙකි.

ප්‍රඥප්ත යැ,ප්‍රඥප්තානුලොම යැ යි විනයෙහි සිද්ධ වූ අර්ථ දෙකෙකි.

අකැපයෙහි හෙතු නැසීම යැ, කැපයෙහි පමණ දන කිරීම යැ යි විනයසල්ලෙඛ දෙකෙකි.

කයින් හෝ පැමිණෙයි, වචනයෙන් හෝ පැමිණේ යැයි දෙ අයුරින් ඇවැතට පැමිණේ.

කයින් හෝ නැඟී සිටියි, වචනයෙන් හෝ නැඟී සිටී යැයි දෙ අයුරින් ඇවැතින් නැඟී සිටී.

ප්‍රතිච්ඡන්නපරිවාස යැ, අප්‍රතිච්ඡන්නපරිවාස යැයි පිරිවෙස් දෙකෙකැ. සුද්ධන්තපරිවාස යැ, සමොධානපරිවාස යැයි අනෙකුදු පිරිවෙස් දෙකෙකි.

ප්‍රතිච්ඡන්නමානත්ත යැ අප්‍රතිච්ඡන්නමානත්ත යැයි මානත් දෙකෙකැ. පක්ඛමානත්ත යැ, සමොධානමානත්ත යැයි අනෙකුදු මානත් දෙකෙකි.

පිරිවෙස් පුරන්නාගේ ද, මානතැ හැසිරෙන්නාගේ දැයි දෙ පුගුලන්ගේ රාත්‍රිච්ඡෙදය වෙයි.

පුගුලා කෙරෙහි අනදරබව ද දහම්හි අනදරබව දැයි අනදර බැව් දෙකෙකි.

6. ස්වයංජාත යැ, කෘත්‍රිම යැයි ලුණු දෙකෙකැ. මුහුදු ලුණු යැ, බළල්ලුණු යැයි අනෙකුදු ලුණු දෙකෙකැ. සිඳු ලුණු යැ, වැලිගැරු ලුණු යැයි අනෙකුදු ලුණු දෙකෙකැ. රෝම ලුණු යැ, යවකාර ලුණු යැයි අනෙකුදු ලුණු දෙකෙකි.

අභ්‍යන්තර පරිභොග යැ, බාහිර පරිභොග යැයි පරිභොග දෙකෙකි.

හීනාක්‍රොශ යැ, උත්කෘෂ්ටාක්‍රොශ යැයි ආක්‍රොශ දෙකෙකි.

ප්‍රිය බව කරණු කැමැතියාහට හෝ බිඳවීම් අදහස් ඇතියාහට හෝ යන දෙ අයුරින් කේලාම් කීම වෙයි.

නිමන්ත්‍රණයෙන් හෝ විඥප්තියෙන් හෝ යන දෙ අයුරින් ගණභොජනය දනවයි.

7. පෙරවස් එළැඹීම යැ, පසුවස් එළැඹීම යැයි වස් එළැඹීම් දෙකෙකි.

නො දැහැමි පාමොක් තැබීම් දෙකෙකැ.

දැහැමි පාමොක් තැබීම් දෙකෙකි,

8. ද්වෙ පුග්ගලා බාලා: යො ච අනාගතං භාරං වහති, යො ච ආගතං භාරං න වහති. ද්වෙ පුග්ගලා පණ්ඩිතා: යො ච අනාගතං භාරං න වහති, යො ච ආගතං භාරං වහති.

අපරෙපි ද්වෙ පුග්ගලා බාලා: යො ච අකප්පියෙ කප්පියසඤ්ඤී, යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී, ද්වෙ පුග්ගලා පණ්ඩිතා: යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී, යො ච කප්පියෙ කප්පිය සඤ්ඤී.

අපරෙපි ද්වෙ පුග්ගලා බාලා: යො ච අනාපත්තියා ආපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී. ද්වෙ පුග්ගලා පණ්ඩිතා: යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී, යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී.

අපරෙපි ද්වෙ පුග්ගලා බාලා: යො ච අධම්මෙ ධම්මසඤ්ඤී, යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ද්වෙ පුග්ගලා පණ්ඩිතා: යො ච අධම්මෙ අධම්මසඤ්ඤී, යො ච ධම්මෙ ධම්මසඤ්ඤී.

අපරෙපි ද්වෙ පුග්ගලා බාලා: යො ච අවිනයෙ විනයසඤ්ඤී, යො ච විනයෙ අවිනයසඤ්ඤී. ද්වෙ පුග්ගලා පණ්ඩිතා: යො ච අවිනයෙ අවිනයසඤ්ඤී, යො ච විනයෙ විනයසඤ්ඤී.

9. ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති, යො ච කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච න කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති යො ච කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති.

අපරෙසම්පි ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච අකප්පියෙ කප්පියසඤ්ඤී, යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී, යො ච කප්පියෙ කප්පියසඤ්ඤී.

අපරෙසම්පි ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච අනාපත්තියා ආපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී, යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී.

අපරෙසම්පි ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච අධම්මෙ ධම්මසඤ්ඤී, යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච අධම්මෙ අධම්මසඤ්ඤී, යො ච ධම්මෙ ධම්මසඤ්ඤී.

අපරෙසම්පි ද්වින්නං පුග්ගලානං ආසවා වඩ්ඪන්ති: යො ච අවිනයෙ විනයසඤ්ඤී, යො ච විනයෙ අවිනයසඤ්ඤී. ද්වින්නං පුග්ගලානං ආසවා න වඩ්ඪන්ති: යො ච අවිනයෙ අවිනයසඤ්ඤී, යො ච විනයෙ විනයසඤ්ඤී.

දුකං නිට්ඨිතං.

Free Distribution www.aathaapi.org

8. යමෙකුත් නො පැමිණි බර උසුලයි ද යමෙකුත් පැමිණි බර නො උසුලයි දැයි (මේ) පුද්ගලයෝ දෙදෙන බාලයෝ යි. යමෙකුත් නො පැමිණි බර නො උසුලයි ද යමෙකුත් පැමිණි බර උසුලයි ද (මේ) පුද්ගලයෝ දෙදෙන පණ්ඩිතයෝ යි.

යමෙකුත් නො කැපයෙහි කැපැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් කැපයෙහි අකැපැයි හැඟීම් ඇත්තේ ද යන අන්‍යවූ ද පුද්ගලයෝ දෙදෙනෙක් බාලයෝයි. යමෙකුත් නො කැපයෙහි අකැපැ යි හැඟීම් ඇත්තේ ද යමෙකුත් කැපයෙහි කැපැයි හැඟීම් ඇත්තේ ද යන පුද්ගලයෝ දෙදෙන පණ්ඩිතයෝ යි.

යමෙකුත් නො ඇවැතෙහි ඇවැතැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ඇවැතෙහි නො ඇවැතැයි හැඟීම් ඇත්තේ ද යන අන්‍යවූ ද පුද්ගලයෝ දෙදෙනෙක් බාලයෝ යි. යමෙකුත් ඇවැතෙහි ඇවැතැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් නො ඇවැතෙහි නො ඇවැතැයි හැඟීම් ඇත්තේ ද යන (මේ) පුද්ගලයෝ දෙදෙන පණ්ඩිතයෝ යි.

යමෙකුත් අධර්මයෙහි ධර්මයැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ධර්මයෙහි අධර්මයැයි හැඟීම් ඇත්තේ ද යන අන්‍යවූ ද පුද්ගලයෝ දෙදෙනෙක් බාලයෝ යි. යමෙකුත් අධර්ම යෙහි අධර්ම යැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ධර්මයෙහි ධර්ම යැයි හැඟීම් ඇත්තේ ද යන පුද්ගලයෝ දෙදෙන පණ්ඩිතයෝ යි.

යමෙකුත් අවිනයයෙහි විනයැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් විනයයෙහි අවිනයැයි හැඟීම් ඇත්තේ ද යන අන්‍ය වූ ද පුද්ගලයෝ දෙදෙනෙක් බාලයෝ යි. යමෙකුත් අවිනයයෙහි අවිනයැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් විනයයෙහි විනයැයි හැඟීම් ඇත්තේ ද (මේ) පුද්ගලයෝ දෙදෙන පණ්ඩිතයෝ යි.

9. යමෙකුත් කුකුස් නො කටයුත්තෙහි කුකුස් කෙරේ ද, යමෙකුත් කුකුස් කටයුත්තෙහි කුකුස් නො කෙරේ ද, මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ වැඩෙති. යමෙකුත් කුකුස් නො කටයුත්තෙහි කුකුස් නො කෙරේ ද, යමෙකුත් කුකුස්කටයුත්තෙහි කුකුස් කෙරේ ද, මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙති.

යමෙකුත් නො කැපයෙහි කැපැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් කැපයෙහි නො කැපැයි හැඟීම් ඇත්තේ ද මේ අනෙක් පුද්ගලයන් දෙදෙනකුන්ගේ ද ආශ්‍රවයෝ වැඩෙති. යමෙකුත් නො කැපයෙහි නො කැපැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් කැපයෙහි කැපැයි හැඟීම් ඇත්තේ ද මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙති.

යමෙකුත් නො ඇවැතෙහි ඇවැතැයි හැඟීම් ඇත්තේ ද, යමෙකුත් ඇවැතෙහි නො ඇවැතැයි හැඟීම් ඇත්තේ ද මේ අනෙක් පුද්ගලයන් දෙදෙනකුන්ගේ ද ආශ්‍රවයෝ වැඩෙති. යමෙකුත් නො ඇවැතෙහි නො ඇවැතැ යි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ඇවැතෙහි ඇවැතැයි හැඟීම් ඇත්තේ ද මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙති.

යමෙකුත් අධර්මයෙහි ධර්ම යැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ධර්මයෙහි අධර්ම යැයි හැඟීම් ඇත්තේ ද මේ අනෙක් පුද්ගලයන් දෙදෙනකුන්ගේ ද ආශ්‍රවයෝ වැඩෙති. යමෙකුත් අධර්මයෙහි අධර්ම යැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් ධර්මයෙහි ධර්ම යැයි හැඟීම් ඇත්තේ ද මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙති.

යමෙකුත් අවිනයයෙහි විනයැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් විනයයෙහි අවිනයැයි හැඟීම් ඇත්තේ ද මේ අනෙක් පුද්ගලයන් දෙදෙනකුන්ගේ ද ආශ්‍රවයෝ වැඩෙති. යමෙකුත් අවිනයයෙහි අවිනයැයි හැඟීම් ඇත්තේ ද යමෙකුත් විනයයෙහි විනයැයි හැඟීම් ඇත්තේ ද මේ පුද්ගලයන් දෙදෙනාගේ ආශ්‍රවයෝ නො වැඩෙත්.

**දුකයෝ නිමියහ.**

---

තස්සුද්දානං :

1. සඤ්ඤා ලද්ධා ච සද්ධම්මා පරික්ඛාරා ච පුග්ගලා,
සබ්බං භූමි නික්ඛමන්තා ආදියන්තා සමාදියං.

2. කරොන්තා දෙන්තා ගණ්හන්තා පරිභොගෙන රත්ති ච,
අරුණා ඡින්දං ඡාදෙන්තා ධාරෙන්තා ච උපොසථා.

3. පවාරණා කම්මා පරා වත්ථු අපරා දෙසා ච,
අපරා ද්වෙ ච සම්පත්ති නානා සමානමෙව ච.

4. පාරාජිකා සඞ්ඝා ථුල්ලච්ච[1] පාචිත්තියා පාටිදෙසනී,
දුක්කටා දුබ්භාසිතා චෙව[2] සත්තාපත්තික්ඛන්ධා ච.

5. භිජ්ජති උපසම්පදා තථෙව අපරෙ දුවෙ,
න වත්තබ්බං න දාතබ්බං අභබ්බාභබ්බමෙව ච.

6. සඤ්චිච්ච සාතිසාරා ච පටික්කොසා ච නිස්සාරණා,
ඔසාරණා පටිඤ්ඤා ච පටිග්ගහා පටික්ඛිපා.

7. උපඝාති චොදනා ච කඨිනා ච දුවෙ තථා,
චීවරා පත්තමණ්ඩලා අධිට්ඨානා තථෙව ද්වෙ.

8. විකප්පනා ච විනයා වෙනයිකා සල්ලෙඛා,
ආපජ්ජති ච වුට්ඨාති පරිවාසා අපරෙ දුවෙ.

9. ද්වෙ මානත්තා අපරෙ ච රත්තිච්ඡෙදා අනාදරි,
ද්වෙ ලොණා තයො අපරෙ පරිභොගකොසනා ච.

10 පෙසුඤ්ඤා ච ගණාවස්සට්ඨපනා භාරකප්පියා,
අනාපත්ති අධම්මධම්මා විනයෙ ආසවෙ තථා ති.

---

## තිකං

1. අත්ථාපත්ති තිට්ඨන්තෙ භගවති ආපජ්ජති නො පරිනිබ්බුතෙ, අත්ථාපත්ති පරිනිබ්බුතෙ භගවති ආපජ්ජති නො තිට්ඨන්තෙ, අත්ථාපත්ති තිට්ඨන්තෙපි භගවති ආපජ්ජති පරිනිබ්බුතෙපි.

අත්ථාපත්ති කාලෙ ආපජ්ජති නො විකාලෙ, අත්ථාපත්ති විකාලෙ ආපජ්ජති නො කාලෙ, අත්ථාපත්ති කාලෙ චෙව ආපජ්ජති විකාලෙ ච.

අත්ථාපත්ති රත්තිං ආපජ්ජති නො දිවා, අත්ථාපත්ති දිවා ආපජ්ජති නො රත්තිං, අත්ථාපත්ති රත්තිං චෙව ආපජ්ජති දිවා ච.

---

1. පාරාජි සඞ්ඝා ථුල්ලච්චං - ස්‍යා.
2. භාසිතාචෙව - ස්‍යා.

එහි නාමාවලිය :—

1. සඤ්ඤාවිමොක්ඛ දුක යැ ලද්ධසමාපත්ති දුක යැ සද්ධම්මපටිසඤ්ඤුත්ත දුක යැ පරික්ඛාර දුක යැ පුග්ගල දුක යැ සච්චං භණන්ත දුක යැ මුසාභණන්ත දුක යැ භූමිගත දුක යැ නික්ඛමන්ත දුක යැ ආදියන්ත දුක යැ සමාදියන්ත දුක යැ,

2. කරොන්ත දුක යැ දෙන්ත දුක යැ දෙසෙන්ත දුක යැ ගණ්හන්ත දුක යැ පරිභොග දුක ය සමග රත්ති - දිවා දුක යැ අරුණුග්ග දුක යැ ඡින්දන්ත දුක යැ ඡාදෙන්ත දුක යැ ධාරෙන්ත දුක යැ උපොසථ දුක යැ,

3. පවාරණ දුක යැ කම්ම දුක යැ හා අපර කම්ම දුක යැ වත්ථු - අපර වත්ථුදෙස දුක යැ සම්පත්ති හා අපර සම්පත්ති දුක යැ නානාසංවාස හා සමාන සංවාස දුක යැ,

4. පාරාජික - සඞ්ඝාදිසෙස - ථුල්ලච්චය - පාචිත්තිය - පාටිදෙසනීය - දුක්කට - දුබ්භාසිත යන සත යැ සත්තාපත්තික්ඛන්ධ යැ,

5. සඞ්ඝභෙද හා න උපසම්පාදෙතබ්බ දුක යැ එසේ ම අන්‍ය වූ න උපසම්පාදෙතබ්බ දුක දෙක යැ අපරිපූර - පරිපූර දුක යැ න වත්ථබ්බ - න දතබ්බ දුක දෙක යැ අභබ්බ - භබ්බ දුක යැ,

6. සඤ්චිච්ච දුක යැ සාතිසාර දුක යැ පටික්කොස - නිස්සාරණ - ඔසාරණ - පටිඤ්ඤ - පටිග්ගහ - පටික්ඛෙප යන දුකයෝ යැ,

7. උපසාති දුක යැ චොදනා දුක යැ එසේම කඨින දුක දෙක යැ එසේම චීවර - පත්තමණ්ඩල - අධිට්ඨාන යන දුකයෝ යැ,

8. විකප්පන දුක යැ විනය දුක යැ වෙනයික - සලෙලඛ දුක යැ ආපජ්ජති දුක යැ වුට්ඨාති දුක යැ අනෙකුදු පරිවාස දුක දෙක යැ,

9. අනෙකුදු මානත්ත දුක යැ රත්තිච්ඡෙද - අනාදර දුක යැ ලොණ දුක යැ අන්‍ය වූ ලොණ දුක තුණ යැ පරිභොග - අක්කොසන දුකයෝ යැ,

10. පෙසුඤ්ඤ - ගණභොජන - වස්සූපනායික දුක යැ පාතිමොක්ඛට්ඨපන - ආගතානාගතභාර - කප්පියා කප්පිය දුක යැ ආපත්ති - අනාපත්ති - ධම්මාධම්ම දුක යැ එසේ ම විනය සඤ්ඤී - ආසවවඩ්ඪන දුකයෝ යැයි මොහු වෙත්.

---

## තිකය

1. බුදුරදුන් පිරිනිවී කල්හි නො වැ දිවමනු කල්හි පැමිණෙන ඇවැතෙක් ඇත, බුදුරදුන් දිවමනු කල්හි නො වැ පිරිනිවි කල්හි පැමිණෙන ඇවැතෙක් ඇත, බුදුරදුන් දිවමනු කල්හි ද පිරිනිවි කල්හි ද පැමිණෙන ඇවැතෙක් ඇති.

විකාලයෙහි නො වැ කාලයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, කාලයෙහි නො වැ විකාලයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, කාලයෙහි ද විකාලයෙහි ද පැමිණෙන ඇවැතෙක් ඇති.

දහවල් නො වැ රාත්‍රියෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, රාත්‍රියෙහි නො වැ දහවල් පැමිණෙන ඇවැතෙක් ඇත, රාත්‍රියෙහි ද දහවල්හි ද පැමිණෙන ඇවැතෙක් ඇති.

අත්ථාපත්ති දසවස්සො ආපජ්ජති නො ඌනදසවස්සො, අත්ථාපත්ති ඌනදසවස්සො ආපජ්ජති නො දසවස්සො, අත්ථාපත්ති දසවස්සො චෙව ආපජ්ජති ඌනදසවස්සො ච.

අත්ථාපත්ති පඤ්චවස්සො ආපජ්ජති නො ඌනපඤ්චවස්සො, අත්ථාපත්ති ඌනපඤ්චවස්සො ආපජ්ජති නො පඤ්චවස්සො, අත්ථාපත්ති පඤ්චවස්සො චෙව ආපජ්ජති ඌනපඤ්චවස්සො ච.

අත්ථාපත්ති කුසලචිත්තො ආපජ්ජති, අත්ථාපත්ති අකුසලචිත්තො ආපජ්ජති, අත්ථාපත්ති අබ්‍යාකතචිත්තො ආපජ්ජති.

අත්ථාපත්ති සුඛවෙදනාසමඞ්ගී ආපජ්ජති, අත්ථාපත්ති දුක්ඛවෙදනාසමඞ්ගී ආපජ්ජති, අත්ථාපත්ති අදුක්ඛමසුඛවෙදනාසමඞ්ගී ආපජ්ජති.

2. තීණි චොදනාවත්ථූනි: දිට්ඨෙන සුතෙන පරිසඞ්කාය.

තයො සලාකගාහා: ගුළ්හකො විවටකො සකණ්ණජප්පකො.

තයො පටික්ඛෙපා: මහිච්ඡතා අසන්තුට්ඨිතා[1] අසල්ලෙඛතා.

තයො අනුඤ්ඤාතා: අප්පිච්ඡතා සන්තුට්ඨිතා සල්ලෙඛතා. අපරෙපි

තයො පටික්ඛෙපා: මහිච්ඡතා අසන්තුට්ඨිතා අමත්තඤ්ඤුතා.

තයො අනුඤ්ඤාතා: අප්පිච්ඡතා සන්තුට්ඨිතා මත්තඤ්ඤුතා.

තිස්සො පඤ්ඤත්තියො: පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති, අපරාපි තිස්සො පඤ්ඤත්තියො: සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති සාධාරණපඤ්ඤත්ති, අපරාපි තිස්සො පඤ්ඤත්තියො: අසාධාරණපඤ්ඤත්ති එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්ති.

3. අත්ථාපත්ති බාලො ආපජ්ජති නො පණ්ඩිතො, අත්ථාපත්ති පණ්ඩිතො ආපජ්ජති නො බාලො, අත්ථාපත්ති බාලො චෙව ආපජ්ජති පණ්ඩිතො ච.

අත්ථාපත්ති කාළෙ ආපජ්ජති නො ජුණ්හෙ, අත්ථාපත්ති ජුණ්හෙ ආපජ්ජති නො කාළෙ, අත්ථාපත්ති කාළෙ චෙව ආපජ්ජති ජුණ්හෙ ච.

අත්ථි කාළෙ කප්පති නො ජුණ්හෙ, අත්ථි ජුණ්හෙ කප්පති නො කාළෙ, අත්ථි කාළෙ චෙව කප්පති ජුණ්හෙ ච.

අත්ථාපත්ති හෙමන්තෙ ආපජ්ජති නො ගිම්හෙ නො වස්සෙ, අත්ථාපත්ති ගිම්හෙ ආපජ්ජති නො හෙමන්තෙ නො වස්සෙ, අත්ථාපත්ති වස්සෙ ආපජ්ජති නො ගිම්හෙ නො හෙමන්තෙ.

අත්ථාපත්ති සඞ්ඝො ආපජ්ජති න ගණො න පුග්ගලො, අත්ථාපත්ති ගණො ආපජ්ජති න සඞ්ඝො න පුග්ගලො, අත්ථාපත්ති පුග්ගලො ආපජ්ජති න සඞ්ඝො න ගණො.

---

1. අසන්තුට්ඨතා - ස්‍යා.

දසවස් ඇති වැ පැමිණෙන උනු දසවස් ඇති වැ නො පැමිණෙන ඇවැතෙක් ඇත, උනු දසවස් ඇති වැ පැමිණෙන දසවස් ඇති වැ නො පැමිණෙන ඇවැතෙක් ඇත, දසවස් ඇති වැ ද උනු දසවස් ඇති වැ ද පැමිණෙන ඇවැතෙක් ඇති.

පස්වස් ඇති වැ පැමිණෙන උනු පස්වස් ඇති වැ නො පැමිණෙන ඇවැතෙක් ඇත, උනු පස්වස් ඇති වැ පැමිණෙන පස්වස් ඇති වැ නොපැමිණෙන ඇවැතෙක් ඇත, පස්වස් ඇති වැ ද උනු පස්වස් ඇති වැ ද පැමිණෙන ඇවැතෙක් ඇති.

කුසල් සිත් ඇති වැ පැමිණෙන ඇවැතෙක් ඇත, අකුසල් සිත් ඇති වැ පැමිණෙන ඇවැතෙක් ඇත, අව්‍යාකෘත සිත් ඇති වැ පැමිණෙන ඇවැතෙක් ඇති.

සුඛ වෙදනායෙන් යුක්ත වැ පැමිණෙන ඇවැතෙක් ඇත, දුක් වෙදනායෙන් යුක්ත වැ පැමිණෙන ඇවැතෙක් ඇත, නො දුක් නො සුව වෙදනායෙන් යුක්ත වැ පැමිණෙන ඇවැතෙක් ඇති.

2. චොදනා වස්තු තුනෙකි : දැකීමෙන් ඇසීමෙන් සැකයෙනි.

ලහගැණීම් තුනෙකි : ගුළහක යැ විචටක යැ සකණ්ණජප්පක යැයි.

ප්‍රතික්ෂෙප තුනෙකි : මහිච්ඡතා යැ අසන්තුට්ඨිතා යැ අසල්ලෙඛතා යැයි.

අනුදැනීම් තුනෙකි : අප්පිච්ඡතා යැ සන්තුට්ඨිතා යැ සල්ලෙඛතා යැයි.

අනෙකුදු ප්‍රතික්ෂෙප තුනෙකි : මහිච්ඡතා යැ අසන්තුට්ඨිතා යැ අමත්තඤ්ඤුතා යැයි.

අනුදැනීම් තුනෙකි : අප්පිච්ඡතා යැ සන්තුට්ඨිතා යැ මත්තඤ්ඤුතා යැයි.

ප්‍රඥප්ති තුනෙකි : පඤ්ඤත්ති යැ අනුපඤ්ඤත්ති යැ අනුප්පන්නපඤ්ඤත්ති ය, අනෙකුදු ප්‍රඥප්ති තුනෙකි : සබ්බත්ථපඤ්ඤත්ති යැ පදෙසපඤ්ඤත්ති යැ සාධාරණ පඤ්ඤත්ති යැ, අනෙකුදු ප්‍රඥප්ති තුනෙකි : අසාධාරණ පඤ්ඤත්ති යැ එකතො පඤ්ඤත්ති යැ උභතො පඤ්ඤත්ති යැ යි.

3. පණ්ඩිතයා නො වැ බාලයා පැමිණෙන ඇවැතෙක් ඇත, බාලයා නො වැ පණ්ඩිතයා පැමිණෙන ඇවැතෙක් ඇත, බාලයාත් පණ්ඩිතයාත් පැමිණෙන ඇවැතෙක් ඇති.

ශුක්ල පක්ෂයෙහි නො වැ කෘෂ්ණ පක්ෂයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, කෘෂ්ණ පක්ෂයෙහි නො වැ ශුක්ල පක්ෂයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, කෘෂ්ණ පක්ෂයෙහි ද ශුක්ල පක්ෂයෙහි ද පැමිණෙන ඇවැතෙක් ඇති.

ශුක්ල පක්ෂයෙහි නො වැ කෘෂ්ණ පක්ෂයෙහි කැපයෙක් ඇත, කෘෂ්ණ පක්ෂයෙහි නො වැ ශුක්ල පක්ෂයෙහි කැපයෙක් ඇත, කෘෂ්ණ පක්ෂයෙහිත් ශුක්ල පක්ෂයෙහිත් කැපයෙක් ඇති.

ගිම්හානයෙහි ද වස්සානයෙහි ද නො වැ හෙමන්තයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, හෙමන්තයෙහි ද වස්සානයෙහි ද නො වැ ගිම්හානයෙහි පැමිණෙන ඇවැතෙක් ඇත, ගිම්හානයෙහි ද හේමන්තයෙහි ද නො වැ වස්සානයෙහි පැමිණෙන ඇවැතෙක් ඇති.

ගණයා ද පුද්ගලයා ද නො වැ සඞ්ඝයා පැමිණෙන ඇවැතෙක් ඇත, සඞ්ඝයා ද පුද්ගලයා ද නො වැ ගණයා පැමිණෙන ඇවැතෙක් ඇත, සඞ්ඝයා ද ගණයා ද නොවැ පුද්ගලයා පැමිණෙන ඇවැතෙක් ඇති.

අත්ථි සඞ්ඝස්ස කප්පති න ගණස්ස න පුග්ගලස්ස, අත්ථි ගණස්ස කප්පති න සඞ්ඝස්ස න පුග්ගලස්ස, අත්ථි පුග්ගලස්ස කප්පති න සඞ්ඝස්ස න ගණස්ස.

තිස්සො ඡාදනා : වත්ථුං ඡාදෙති නො ආපත්තිං, ආපත්තිං ඡාදෙති න වත්ථුං, වත්ථුඤ්චෙව ඡාදෙති ආපත්තිඤ්ච.

තිස්සො පටිච්ඡාදියො : ජන්තාඝරපටිච්ඡාදි, උදකපටිච්ඡාදි වත්ථ-පටිච්ඡාදි.

තීණි පටිච්ඡන්නානි වහන්ති නො විවටානි : මාතුගාමො පටිච්ඡන්නො වහති නො විවටො, බ්‍රාහ්මණානං මන්තා පටිච්ඡන්නා වහන්ති නො විවටා, මිච්ඡාදිට්ඨි පටිච්ඡන්නා වහති නො විවටා.

තීණි විවටානි විරොචන්ති නො පටිච්ඡන්නානි : චන්දමණ්ඩලං විවටං විරොචති නො පටිච්ඡන්නං, සුරියමණ්ඩලං විවටං විරොචති නො පටිච්ඡන්නං, තථාගතප්පවෙදිතො ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො.

තයො සෙනාසනගාහා : පුරිමකො පච්ඡිමකො අන්තරාමුත්තකො.

අත්ථාපත්ති ගිලානො ආපජ්ජති නො අගිලානො, අත්ථාපත්ති අගිලානො ආපජ්ජති නො ගිලානො, අත්ථාපත්ති ගිලානො චෙව ආපජ්ජති අගිලානො ච.

4. තීණි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. තීණි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

තයො පරිවාසා : පටිච්ඡන්නපරිවාසො, අප්පටිච්ඡන්න පරිවාසො, සුද්ධන්තපරිවාසො.

තයො මානත්තා : පටිච්ඡන්නමානත්තං, අප්පටිච්ඡන්නමානත්තං, පක්ඛමානත්තං.

තයො පාරිවාසිකස්ස භික්ඛුනො රත්තිච්ඡෙදා : සහවාසො, විප්පවාසො, අනාරොචනා.

අත්ථාපත්ති අන්තො ආපජ්ජති නො බහි, අත්ථාපත්ති බහි ආපජ්ජති නො අන්තො, අත්ථාපත්ති අන්තො චෙව ආපජ්ජති බහි ච.

අත්ථාපත්ති අන්තොසීමාය ආපජ්ජති නො බහිසීමාය, අත්ථාපත්ති බහිසීමාය ආපජ්ජති නො අන්තොසීමාය, අත්ථාපත්ති අන්තොසීමාය චෙව ආපජ්ජති බහිසීමාය ච.

තීහාකාරෙහි ආපත්තිං ආපජ්ජති : කායෙන ආපජ්ජති, වාචාය ආපජ්ජති, කායෙන වාචාය ආපජ්ජති. අපරෙහිපි තීහාකාරෙහි ආපත්තිං ආපජ්ජති : සඞ්ඝමජ්ඣෙ, ගණමජ්ඣෙ, පුග්ගලස්ස සන්තිකෙ.

තීහාකාරෙහි ආපත්තියා වුට්ඨාති : කායෙන වුට්ඨාති, වාචාය වුට්ඨාති, කායෙන වාචාය වුට්ඨාති. අපරෙහිපි තීහාකාරෙහි ආපත්තියා වුට්ඨාති : සඞ්ඝමජ්ඣෙ, ගණමජ්ඣෙ, පුග්ගලස්ස සන්තිකෙ.

ගණයාට ද පුද්ගලයාට ද නො වැ සඞ්ඝයාට කැපයෙක් ඇත, සඞ්ඝයාට ද පුද්ගලයාට ද නො වැ ගණයාට කැපයෙක් ඇත, සඞ්ඝයාට ද ගණයාට ද නො වැ පුද්ගලයාට කැපයෙක් ඇති.

ඡාදනා තුනෙකි : ආපත්තිය නො වැ වස්තුව වසයි, වස්තුව නො වැ ආපත්තිය වසයි, වස්තුව ද ආපත්තිය ද වසයි.

ප්‍රතිච්ඡාදීහු තිදෙනෙකි : ජන්තාඝර ප්‍රතිච්ඡාදි යැ උදක ප්‍රතිච්ඡාදි යැ වස්ත්‍ර ප්‍රතිච්ඡාදි යැයි.

විවෘත නො වැ ගරුත්වයට පැමිණෙන ප්‍රතිච්ඡන්න වස්තු තුනෙකි : මාගම විවෘත නො වැ ප්‍රතිච්ඡන්න වූවා ගරුත්වයට පැමිණෙයි, බ්‍රාහ්මණ මන්ත්‍රයෝ විවෘත නො වැ ප්‍රතිච්ඡන්න වූවාහු ගරුත්වයට පැමිණෙති, මිථ්‍යාදෘෂ්ටිය විවෘත නො වැ ප්‍රතිච්ඡන්න වූවා ගරුත්වයට පැමිණේ.

විවෘත වැ ප්‍රතිච්ඡන්න නො වැ බබළන වස්තු තුනෙකි : සඳ මඬල විවෘත වැ ප්‍රතිච්ඡන්න නො වූයේ බබළයි, හිරුමඬල විවෘත වැ ප්‍රතිච්ඡන්න නො වූයේ බබළයි, තථාගත ප්‍රවිදිත ධර්මවිනය විවෘත වැ ප්‍රතිච්ඡන්න නො වූයේ බබළයි.

සෙනසුන් ගැන්වීම් තුනෙකි : පුරිමක යැ පච්චිමක යැ අන්තරාමුක්තක යැ යි.

ගිලන් වැ පැමිණෙන නො ගිලන් වැ නො පැමිණෙන ඇවැතෙක් ඇත, නො ගිලන් වැ පැමිණෙන ගිලන් වැ නො පැමිණෙන ඇවැතෙක් ඇත, ගිලන් වැ ද නොගිලන් වැ ද පැමිණෙන ඇවැතෙක් ඇති.

4. නො දැහැමි පාමොක් තැබීම් තුනෙකි. දැහැමි පාමොක් තැබීම් තුනෙකි.

පටිච්ඡන්න පරිවාස යැ අපටිච්ඡන්න පරිවාස යැ සුද්ධන්ත පරිවාස යැ යි පරිවෙස් තුනෙකි.

පටිච්ඡන්න මානත්ත යැ අපටිච්ඡන්න මානත්ත යැ පක්ඛමානත්ත යැයි මානත් තුනෙකි.

සහවාස යැ විප්පවාස යැ අනාරොචනා යැයි පිරිවෙස් පුරණ භික්ෂුහට රාත්‍රිච්ඡෙදයෝ තිදෙනෙකි.

සෙනස්නෙන් පිටත නො වැ ඇතුළතැ පැමිණෙන ඇවැතෙක් ඇත, ඇතුළතැ නො වැ පිටතැ පැමිණෙන ඇවැතෙක් ඇත, ඇතුළත්හි ද පිටත්හි ද පැමිණෙන ඇවැතෙක් ඇති.

සීමාවෙන් පිටතැ නො වැ සීමාව තුළැ පැමිණෙන ඇවැතෙක් ඇත, සීමාව තුළැ නො වැ සීමාවෙන් පිටතැ පැමිණෙන ඇවැතෙක් ඇත, සීමාව තුළැ ද සීමාවෙන් පිටතැ ද පැමිණෙන ඇවැතෙක් ඇති.

තුන් අයුරකින් ඇවැතට අවදියි : කයින් අවදියි, වචනයෙන් අවදියි, කයින් හා වචනයෙන් අවදී. අනෙකුදු තුන් අයුරකින් ඇවැතට අවදියි: සඟ මැදහි ගණ මැදහි පුහුලක්හු අබියෙස්හි යැ.

තුන් අයුරකින් ඇවැතින් නැඟී සිටියි : කයින් නැඟී සිටියි, වචනයෙන් නැඟී සිටියි, කයින් හා වචනයෙන් නැඟී සිටී. අනෙකුදු තුන් අයුරෙකින් ඇවැතින් නැඟී සිටී : සඟ මැදහි ගණ මැදහි පුහුලක්හු අබියෙස්හි යැ.

තීණි අධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි: තීණි ධම්මිකානි අමූළ්හවිනයස්ස දානානි.

5. තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො තජ්ජනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො නියස්සකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති-පෙ-සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පබ්බාජනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති-පෙ-සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, කුලදූසකො හොති පාපසමාචාරො, දිස්සන්ති චෙව පාපකා සමාචාරා සුය්‍යන්ති ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පටිසාරණීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති -පෙ- සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහී අක්කොසති පරිභාසති.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො ආපත්තියා අදස්සනෙ උක්ඛෙපනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති-පෙ-සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පස්සිතුං.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො ආපත්තියා අප්පටිකම්මෙ උක්ඛෙපනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති-පෙ-සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ආපත්තිං ආපජ්ජිත්වා න ඉච්ඡති ආපත්තිං පටිකාතුං.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො පාපිකාය දිට්ඨියා අප්පටිනිස්සග්ගෙ උක්ඛෙපනීයකම්මං කරෙය්‍ය: භණ්ඩනකාරකො හොති-පෙ-සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, න ඉච්ඡති පාපිකං දිට්ඨිං පටිනිස්සජ්ජිතුං.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ආකඞ්ඛමානො සඞ්ඝො ආගාළ්හාය චෙතෙය්‍ය: භණ්ඩනකාරකො හොති කලහකාරකො විවාදකාරකො භස්සකාරකො සඞ්ඝෙ අධිකරණකාරකො, බාලො හොති අබ්‍යත්තො ආපත්තිබහුලො අනපදානො, ගිහිසංසට්ඨො විහරති අනනුලොමිකෙහි ගිහිසංසග්ගෙහි.

නො දැහැමි අමූළ්හවිනයදන තුනෙකැ. දැහැමි අමූළ්හවිනයදන තුනෙකි.

5. කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසිවෙත් නම් තජ්ජනීය කර්මය කරන්නාහු යැ : ඩබර කරන්නේ කලහ කරන්නේ විවාද කරන්නේ දෙඩමලුකම් කරන්නේ සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි, බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳ දැකීම් නැතියේ වෙයි, අනුලොම් නො වූ ගිහි සසඟින් ගිහියන් හා හැනී වෙසේ.

කරුණු තුනෙකින් යුක්තවූ මහණහට සඟහු රිසි වෙත් නම් නියස්සකර්මය කරන්නාහු යැ : ඩබර කරන්නේ... සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි, බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැතියේ වෙයි, අනුලොම් නොවූ ගිහි සසඟින් ගිහියන් හා හැනී වෙසේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් පබ්බාජනීය කර්මය කරන්නාහු යැ : ඩබර කරන්නේ... සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි. බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැතියේ වෙයි. ලාමක හැසිරීම් ඇතියේ කුලදූෂණය කරන්නෙක් වෙයි, ලාමක හැසිරීම් දක්නට ද ලැබෙයි, අසනු ද ලැබේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් පටිසාරණීය කර්මය කරක්නාහු යැ : ඩබර කරන්නේ... සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි. බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැතියේ වෙයි. ගිහීන්ට ආක්‍රොශ කෙරෙයි, පරිභව කෙරේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් ඇවැත් නොදැක්මෙහි උක්ඛෙපනීය කර්මය කරන්නාහු යැ : ඩබර කරන්නේ... සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි, බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැතියේ වෙයි, ඇවැතට පැමිණ ඇවැත දැකීමට නො කැමැති වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් ඇවැතට පිළියම් නො කිරීමෙහි උක්ඛෙපනීය කර්මය කරන්නාහු යැ: ඩබර කරන්නේ . . . සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි, බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇත්තේ ඇවැත් පිරිසිඳීම් නැත්තේ වෙයි, ඇවැතට පැමිණ ඇවැතට පිළියම් කිරීමට නො කැමැති වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් ලාමක දෘෂ්ටිය නො හැරීමෙහි උක්ඛෙපනීය කර්මය කරන්නාහු යැ : ඩබර කරන්නේ... සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි, බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැත්තේ වෙයි, ලාමකවූ දෘෂ්ටිය හරින්නට කැමැති නො වේ.

කරණු තුනෙකින් යුක්ත වූ මහණහට සඟහු රිසි වෙත් නම් දඬිබව පිණිස යත්න (උක්ඛෙපනීය කර්මය) කරන්නාහු යැ : ඩබර කරන්නේ කලහ කර්න්නේ විවාද කරන්නේ දෙඩමලුකම් කරන්නේ සඞ්ඝයා ඉදිරියෙහි අධිකරණ කරන්නේ වෙයි. බාල වූයේ අව්‍යක්ත වූයේ ඇවැත් බහුල කොට ඇතියේ ඇවැත් පිරිසිඳීම් නැතියේ වෙයි, අනුලොම් නො වූ ගිහිසසඟින් ගිහියන් හා හැනී වෙසේ.

6. තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : කායිකෙන දවෙන සමන්නාගතො හොති, වාචසිකෙන දවෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන දවෙන සමන්නාගතො හොති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : කායිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, වාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : කායිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති, වාචසිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : කායිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති, වාචසිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති, කායිකවාචයිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : ආපත්තිං ආපන්නො කම්මකතො උපසම්පාදෙති, නිස්සයං දෙති, සාමණෙරං උපට්ඨාපෙති.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : යාය ආපත්තියා සඞ්ඝෙන කම්මං කතං හොති, තං ආපත්තිං ආපජ්ජති, අඤ්ඤං වා තාදිසිකං, තතො වා පාපිට්ඨතරං.

අපරෙහිපි තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං : බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති.

7. තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාදං"ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො කාතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ පවාරණං ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාදං"ති ඔමද්දිත්වා[1] සඞ්ඝෙන පවාරෙතබ්බං : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

---

1. ඔවදිත්වා - සීමු 1, 2.

6. කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි. අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි. අධිශීලයෙහි නට සිල් ඇත්තේ වෙයි, උතුම් ආචාරයෙහි නට ආචාර ඇත්තේ වෙයි, සම්‍යග් දෘෂ්ටිය ඉක්මවා විපන්දිටු ඇත්තේ වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්තවූ මහණහට කර්ම කටයුතු යි : (දුකෙළිම් ආදි) කායද්වාරික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි, (කට බෙර ගැසීම් ආදි) වාග්ද්වාරික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි, (නැටුම් ගැයුම් ආදී) කායික-වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුත් මහණහට කර්ම කටයුතුයි : කායද්වාරික සිකපද ඉක්මවන්නේ වෙයි, වාග්ද්වාරික සිකපද ඉක්මවන්නේ වෙයි, කායවාග්ද්වාරික සිකපද ඉක්මවන්නේ වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතුයි : කායද්වාරයෙහි පැණවූ සිකපදයන්හි නො හික්මීමෙන් යුක්ත වූයේ වෙයි, වාග්ද්වාරයෙහි පැණවූ සිකපදයන්හි නො හික්මීමෙන් යුක්ත වූයේ වෙයි, කායවාග්ද්වාරයෙහි පැණවූ සිකපද-යන්හි නො හික්මීමෙන් යුක්ත වූයේ වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි : කය පිළිබඳ වැරදි ජීවිකායෙන් යුක්ත වූයේ වෙයි, වචනය පිළිබඳ වැරදි ජීවිකායෙන් යුක්ත වූයේ වෙයි, කය වචනය පිළිබඳ වැරදි ජීවිකායෙන් යුක්ත වූයේ වේ.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි. ඇවැතට පැමිණියේ (තජ්ජනීයාදි) කර්ම කරණු ලැබූයේ උපසපන් කෙරෙයි, නිස දෙයි, හෙරණකු ලවා උවැටන් කරවා ගණී.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි : යම් ඇවැතක් නිමිති කොට සඞ්ඝයා විසින් කර්මය කරන ලද්දේ වේ ද, ඒ ඇවැතට නැවත පැමිණෙයි. එබඳු අන් ඇවැතකට හෝ පැමිණෙයි, එයට වඩා ලාමක ඇවැතකට හෝ පැමිණෙයි.

අනෙකුදු කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි : බුදුන් පිළිබඳ අගුණ කියයි, ධර්මය පිළිබඳ අගුණ කියයි, සඞ්ඝයා පිළිබඳ අගුණ කියයි.

7. කරුණු තුනෙකින් යුක්ත වූ සහමැද පොහෝ තබන මහණහට "මහණ, නුසුදුසු යැ, ඩබර නො කර, කලහ නො කර, විරුද්ධ ග්‍රහණ නො කර, විරුද්ධ වාද නො කර "යි මැඩ පවත්වා සඞ්ඝයා විසින් පොහෝ කටයුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ සහමැද පවුරුණු තබන මහණහට "මහණ නුසුදුසු යැ, ඩබර නො කර, කලහ නො කර, විරුද්ධග්‍රහණ නො කර, විරුද්ධ වාද නො කර "යි මැඩ පවත්වා සඞ්ඝයා විසින් පවාරණය කටයුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

8. තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො න කාචි සඞ්ඝසම්මුති දාතබ්බා : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං[1] අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු න කිස්මිඤ්චි පච්චෙකට්ඨානෙ ඨපෙතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො නිස්සාය න වත්ථබ්බං : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො නිස්සයො න දාතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුං : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සවචනීයං නාදාතබ්බං[2] : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො න විනයො පුච්ඡිතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා විනයො න පුච්ඡිතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො න විනයො විස්සජ්ජිතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා විනයො න විස්සජ්ජිතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො න දාතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො න සාකච්ඡිතබ්බො[3] : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

තීහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බො, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො : අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච.

9. තයො උපොසථා : චාතුද්දසිකො, පණ්ණරසිකො, සාමග්ගිඋපොසථො. අපරෙපි තයො උපොසථා : සඞ්ඝෙ උපොසථො, ගණෙ උපොසථො පුග්ගලෙ උපොසථො අපරෙපි තයො උපොසථා : සුත්තුද්දෙසො උපොසථො, පාරිසුද්ධි උපොසථො, අධිට්ඨානුපොසථො.

---

1. සඞ්ඝො න වොහරිතබ්බො - ස්‍යා.
2. න දාතබ්බං - සීමු. 1, 2.
3. සාකච්ඡාතබ්බො මජසං, ස්‍යා.

8. කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට කිසි සඞ්ඝසම්මුතියෙක් නො දිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු විසින් සඟමැද කිසිවක් නො කිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණ කිසියම් දෙටු තැනෙක නො තැබිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු ඇසුරු කොට නො විසිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට නිස නො දිය යුතුයි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ අවසර ඉල්වන මහණහට අවසර දෙන්නට නො වටී : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහුගේ වචනය නො පිළිගතයුතු යි (නො ඇසිය යුතුයි) : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු පිළිබඳ විනය නො විචාළ යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වෙයි.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු විසින් විනය නො විචාළ යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු පිළිබඳ විනය නො විසඳිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු විසින් විනය නො විසඳිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහට විනය පිළිවිසුමට අවසර නො දිය යුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්ත වූ මහණහු සමඟ විනයප්‍රශ්න සාකච්ඡා නො කටයුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි. ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

කරුණු තුනෙකින් යුක්තවූ මහණහු විසින් උපසපන් නො කරවිය යුතු යි. නිස නො දිය යුතු යි, හෙරණකු ලවා උවටැන් කරවා නො ගතයුතු යි : අලජ්ජී වූයේත් වෙයි, බාල වූයේත් වෙයි, ආපත්ති අනාපත්ති නො දන්නේත් වේ.

තුදුස්වක යැ පසළොස්වක යැ සමගි පොහොය යැ යි පොහෝ තුනෙකි, සඟ පොහොයැ ගණපොහො යැ පුහුල් පොහො යැ යි අනෙකුදු පොහෝ තුනෙකි. සුත්තුද්දෙස උපොසථ යැ පාරිසුද්ධිඋපොසථ යැ අධිට්ඨානුපොසථයැ යී අනෙකුදු පොහෝ තුනෙකි.

තිස්සො පවාරණා : චාතුද්දසිකා, පඤ්චදසිකා, සාමග්ගීපවාරණා. අපරාපි තිස්සො පවාරණා : සඞ්ඝෙ පවාරණා, ගණෙ පවාරණා, පුග්ගලෙ පවාරණා. අපරාපි තිස්සො පවාරණා : තෙවාචිකා පවාරණා, ද්වෙවාචිකා පවාරණා, සමානවස්සිකා පවාරණා.

10. තයො ආපායිකා නෙරයිකා ඉදමප්පහාය : යො ච අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරීපටිඤ්ඤො, යො ච සුද්ධං බ්‍රහ්මචාරිං[1] පරිසුද්ධං[2] බ්‍රහ්මචරියං චරන්තං අමූලකෙන අබ්‍රහ්මචරියෙන[3] අනුද්ධංසෙති, යො චායං එවංවාදී එවංදිට්ඨි "නත්ථි කාමෙසු දොසො"ති සො කාමෙසු පාතබ්‍යතං ආපජ්ජති."

11. තීණි අකුසලමූලානි : ලොභො අකුසලමූලං, දොසො අකුසලමූලං, මොහො අකුසලමූලං. තීණි කුසලමූලානි : අලොභො කුසලමූලං, අදොසො කුසලමූලං, අමොහො කුසලමූලං.

තීණි දුච්චරිතානි : කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං. තීණි සුචරිතානි : කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං.

12. තයො අත්ථවසෙ පටිච්ච භගවතා කුලෙසු තිකභොජනං පඤ්ඤත්තං : දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, මා පාපිච්ඡා පක්ඛං නිස්සාය සඞ්ඝං භින්දෙය්‍යුං, කුලානුද්දයතාය ච.

තීහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො : පාපිච්ඡතා, පාපමිත්තතා, ඔරමත්තකෙන විසෙසාධිගමෙන අන්තරාවොසානං ආපාදි.

13. තිස්සො සම්මුතියො : දණ්ඩසම්මුති, සික්කාසම්මුති, දණ්ඩසික්කා සම්මුති.

තිස්සො පාදුකා ධුවට්ඨානියා[4] අසඞ්කමනීයා : වච්චපාදුකා, පස්සාවපාදුකා, ආචමනපාදුකා.

තිස්සො පාදඝංසනියො : සක්ඛරා, කථලා, සමුද්දඵෙණකොති.

තිකං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. නිට්ඨිතෙන කාලෙ රත්තිං ච දස පඤ්ච කුසලෙන,
   වෙදනා චොදනා වත්ථු සලාකා ද්වෙ පටික්ඛිපා.

2. පඤ්ඤත්ති අපරෙ ද්වෙ ච බාලො කාලෙ ච කප්පති,
   හෙමන්තෙ සඞ්ඝෙ සඞ්ඝස්ස ඡාදනා ච පටිච්ඡාදි

---

1. අසුද්ධ බ්‍රහ්මචාරි - සීමු 1.
2. සුද්ධං - ස්‍යා,
3. බ්‍රහ්මචරියෙන - සීමු 1.
4. ධුවට්ඨිතිකා - මජසං,

තුදුස්වක් පවුරුණු යැ පසළොස්වක් පවුරුණු යැ සමගිපවුරුණු යැ යි පවුරුණු තුනෙකි. සඞ්ඝ පවාරණ යැ ගණපවාරණ යැ පුග්ගල පවාරණ යැ යි අනෙකුදු පවුරුණු තුනෙකි. තෙවාචික පවාරණ යැ ද්වෙවාචික පවාරණ යැ සමාන වස්සික පවාරණ යැ යි අනෙකුදු පවුරුණු තුනෙකි.

10. යමෙකුත් බඹසර නැත්තේ බඹසර ඇතැයි පිළිණ කරන්නේ වේ ද, යමෙකුත් පිරිසිදු බඹසර හැසිරෙන රහත් මහණක්හට මුල් රහිත නො බඹසරින් චොදනා කෙරේ ද යම් මේ පුද්ගලයෙකුත් ''කාමසෙවනයන්හි දෙස් නැතැ''යි මෙසේ කියන්නේ මෙබඳු ලබ්ධි ඇත්තේ වේ ද, හෙතෙමේ කාමයන් සෙවුනාබවට පැමිණේ ද යන තිදෙන මේ ලබ්ධිය හෝ වරද නො හැර නිරිසතුන් වැ අපායයෙහි උපදින්නෝ වෙත්.

11. අකුශලමූලයෝ තිදෙනෙකි : ලොභය අකුශල මූලයෙකැ, ද්වෙෂය අකුශල මූලයෙකැ, මොහය අකුශල මූලයෙකි. කුශලමූලයෝ තිදෙනෙකි : අලොභය කුශල මූලයෙකැ, අද්වෙෂය කුශල මූලයෙකැ, අමොහය කුශල මූලයෙකි.

දුශ්චරිතයෝ තිදෙනෙකි : කාය දුශ්චරිත යැ වාග්දුශ්චරිත යැ මනොදුශ්චරිත යැ. සුචරිතයෝ තිදෙනෙකි : කායසුචරිත යැ වාක්සුචරිතයැ මනඃසුචරිත යැයි.

12. දුශ්ශීල පුද්ගලයන්ට නිග්‍රහ පිණිස ද ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස ද ලාමක අදහස් ඇත්තෝ පක්ෂය නිසා සඞ්ඝයා නො බිඳින්නාහු''යි කුලානුග්‍රහය පිණිස දැයි කරුණු තුනක් සලකා භාග්‍යවතුන් වහන්සේ විසින් කුලයන්හි තික භොජනය පනවන ලදී.

අසත්පුරුෂ ධර්ම තුනෙකින් මඩනාලද හාත්පසින් අල්වාගත් සිත් ඇති දෙවදත්ත නිරිසත් වැ කපක් ආයු ඇතිවැ පිළියම් නො කට හැකියෙක් වැ අපායෙහි උපන්නෙක් වේ. ලාමක අදහස් ඇති බැවින්, පාපමිත්‍රයන් ඇති බැවින්, ස්වල්පමාත්‍ර වූ විශෙෂාධිගමයෙන් අතරමග දී කෙළවරකට පැමිණියේ යි.

13. සම්මුති තුනෙකි : දණ්ඩසම්මුති යැ, සික්කාසම්මුති යැ, දණ්ඩසික්කා සම්මුති යැයි

ස්ථිර වූ ගෙන යා නො හැක්කා වූ පාදුකා තුනෙකි : වර්චස්පාදුකා යැ, මූත්‍රපාදුකා යැ, ආචමන පාදුකා යැයි.

පියගැටුම් තුනෙකි : ගල්කැට යැ, කැබිලිති යැ, හිරිගල් යැයි.

**තිකය නිමි.**

---

එහි නාමාවලිය :

1. තිට්ඨන්ත යැ කාල යැ රත්ති යැ දසවස්ස යැ පඤ්චවස්ස යැ කුසලාදි යැ වෙදනා යැ චොදනාවත්ථු යැ සලාකගාහ යැ පටික්ඛෙප යැ අනුඤ්ඤාත යැ.

2. පඤ්ඤත්ති යැ අපර දෙක යැ බාල යැ කාළු යැ කප්පති යැ හෙමන්ත යැ සඞ්ඝ යැ සඞ්ඝස්ස යැ ඡාදනා යැ පටිච්ඡාදි යැ.

3. පටිච්ඡන්නා විවටා ච සෙනාසනගිලායනා,
පාතිමොක්ඛං පරිවාසං මානත්තාපාරිවාසිකා.

4. අඤ්ඤතා අඤ්ඤතා ච සීමාය ආපජ්ජති පුනාපරෙ,
වුට්ඨාති අපරෙ චෙව අමූළ්හවිනයා දුවෙ.

5 තජ්ජනීයා නියස්සා ච පබ්බාජපටිසාරණී,
අදස්සනාපටිකම්මෙ අනිස්සග්ගෙ ච[1] දිට්ඨියා.

6. ආගාළ්හකම්මාධිසීලෙ දවානාචාරඝාතිකා,
ආජීවාපත්තාතාදිසිකා අවණ්ණුපොසථෙන ච

7. පවාරණා සම්මුති ච වොහාරපච්චෙකෙන ච
න වත්ථබ්බං න දාතබ්බං ඔකාසං න කරෙ තථා.

8. න කරෙ සවචනීයං න පුච්ඡිතබ්බකා දුවෙ,
න විස්සජ්ජෙ දුවෙ චෙව අනුයොගම්පි නො දදෙ.

9. සාකච්ඡා උපසම්පදා නිස්සයසාමණෙරා ච,
උපොසථා තිකා තීණි පවාරණා තිකා තයො.

10. ආපායිකා අකුසලා කුසලා චරිතා දුවෙ,
තිකභොජනසඞ්ඝමෙම සම්මුති පාදුකෙන ච.
පාදඝංසනිකා චෙව උද්දානං තිකතො ඉදන්ති.

---

## චතුක්කං

1. අත්ථාපත්ති සකවාචාය ආපජ්ජති, පරවාචාය වුට්ඨාති. අත්ථාපත්ති පරවාචාය ආපජ්ජති, සකවාචාය වුට්ඨාති. අත්ථාපත්ති සකවාචාය ආපජ්ජති, සකවාචාය වුට්ඨාති. අත්ථාපත්ති පරවාචාය ආපජ්ජති, පරවාචාය වුට්ඨාති.

අත්ථාපත්ති කායෙන ආපජ්ජති, වාචාය වුට්ඨාති. අත්ථාපත්ති වාචාය ආපජ්ජති, කායෙන වුට්ඨාති. අත්ථාපත්ති කායෙන ආපජ්ජති, කායෙන වුට්ඨාති. අත්ථාපත්ති වාචාය ආපජ්ජති, වාචාය වුට්ඨාති.

අත්ථාපත්ති පසුත්තො ආපජ්ජති, පටිබුද්ධො වුට්ඨාති. අත්ථාපත්ති පටිබුද්ධො ආපජ්ජති, පසුත්තො වුට්ඨාති. අත්ථාපත්ති පසුත්තො ආපජ්ජති, පසුත්තො වුට්ඨාති. අත්ථාපත්ති පටිබුද්ධො ආපජ්ජති, පටිබුද්ධො වුට්ඨාති.

අත්ථාපත්ති අචිත්තකො ආපජ්ජති, සචිත්තකො වුට්ඨාති. අත්ථාපත්ති සචිත්තකො ආපජ්ජති, අචිත්තකො වුට්ඨාති. අත්ථාපත්ති අචිත්තකො ආපජ්ජති, අචිත්තකො වුට්ඨාති. අත්ථාපත්ති සචිත්තකො ආපජ්ජති, සචිත්තකො වුට්ඨාති.

---

1. අනිස්සග්ගී ච - සීමු.

3. පටිච්ඡන්න යැ විවට යැ සෙනාසනගහ යැ ගිලාන යැ පාතිමොක්ඛඨපන යැ පරිවාස යැ මානත්ත යැ පාරිවාසික යැ

4. අන්තො යැ අන්තොසීමා යැ ආපජ්ජති යැ නැවැත අපර යැ වුට්ඨාති යැ අපර දෙක යැ අමූළ්හවිනය දෙක යැ,

5. තජ්ජනීය යැ නියස්ස යැ පබ්බාජනීය යැ පටිසාරණීය යැ අදස්සන යැ අප්පටිකම්ම යැ දිට්ඨි ය පිළිබඳ අනිස්සග්ගී යැ,

6. ආගාළ්හ යැ කම්ම යැ අධිශීල යැ දව යැ අනාචාර යැ උපඝාතික යැ ආජීව යැ ආපන්න යැ තාදිසකා යැ අවණ්ණ යැ උපොසථ යැ,

7. පවාරණ යැ සම්මුති යැ වොහරිතබ්බ යැ පච්චෙකට්ඨාන යැ න වත්ථබ්බ යැ න දතබ්බ යැ එසේ ම ඔකාසකම්ම අකරණ යැ,

8. සවචනීය අකරණ යැ න පුච්ඡිතබ්බ දෙක යැ න විස්සජ්ජිතබ්බ දෙක යැ අනුයොග අදන යැ,

9. සාකච්ඡා යැ උපසම්පද යැ නිස්සය යැ සාමණෙර යැ උපොසථත්තික යැ පවාරණත්තික යැ,

10. අපායික යැ අකුශල යැ කුශල යැ දුච්චරිත යැ සුචරිත යැ තිකභොජන යැ අසද්ධම්ම යැ පාදුකා යැ සම්මුති යැ පාදසංඝනිකා යැ යි තිකයෙහි මේ නාමාවලි යයි.

---

## චතුෂ්කය

1. ඇවැතෙක් ඇත සිය වදනින් අවදියි. පර වදනින් නැඟී සිටී. ඇවැතෙක් ඇත පර වදනින් අවදියි, සිය වදනින් නැඟී සිටී. ඇවැතෙක් ඇත සිය වදනින් අවදියි, සිය වදනින් නැඟී සිටී. ඇවැතෙක් ඇත පර වදනින් අවදියි, පර වදනින් නැඟී සිටී.

ඇවැතෙක් ඇත කායද්වාරයෙන් අවදියි වාග්ද්වාරයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත වාග්ද්වාරයෙන් අවදියි කායද්වාරයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත කායද්වාරයෙන් අවදියි, කායද්වාරයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත වාග් ද්වාරයෙන් අවදියි වාග් ද්වාරයෙන් නැඟී සිටී.

ඇවැතෙක් ඇත නිදිගත්තේ අවදියි පිබිදියේ නැඟී සිටී. ඇවැතෙක් ඇත පිබිදියේ අවදියි නිදිගත්තේ නැඟී සිටී. ඇවැතෙක් ඇත නිදිගත්තේ අවදියි, නිදිගත්තේ නැඟී සිටී. ඇවැතෙක් ඇත පිබිදියේ අවදියි පිබිදියේ නැඟී සිටී.

ඇවැතෙක් ඇත අචිත්තක වූයේ අවදීයි සචිත්තක වූයේ නැඟී සිටී. ඇවැතෙක් ඇත සචිත්තක වූයේ අවදියි අචිත්තක වූයේ නැඟී සිටී. ඇවැතෙක් ඇත අචිත්තක වූයේ අවදියි අචිත්තක වූයේ නැඟී සිටී. ඇවැතෙක් ඇත සචිත්තක වූයේ අවදියි සචිත්තක වූයේ නැඟී සිටී.

අත්ථාපත්ති ආපජ්ජන්තො දෙසෙති, දෙසෙන්තො ආපජ්ජති. අත්ථාපත්ති ආපජ්ජන්තො වුට්ඨාති, වුට්ඨහන්තො ආපජ්ජති.

අත්ථාපත්ති කම්මෙන අපජ්ජති, අකම්මෙන වුට්ඨාති. අත්ථාපත්ති අකම්මෙන ආපජ්ජති, කම්මෙන වුට්ඨාති. අත්ථාපත්ති කම්මෙන ආපජ්ජති, කම්මෙන වුට්ඨාති. අත්ථාපත්ති අකම්මෙන ආපජ්ජති, අකම්මෙන වුට්ඨාති.

2. චත්තාරො අනරියවොහාරා : අදිට්ඨෙ දිට්ඨවාදිතා, අසුතෙ සුතවාදිතා, අමුතෙ මුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා.

චත්තාරො අරියවොහාරා : අදිට්ඨෙ අදිට්ඨවාදිතා, අසුතෙ අසුතවාදිතා, අමුතෙ අමුතවාදිතා, අවිඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා.

අපරෙපි චත්තාරො අනරියවොහාරා : දිට්ඨෙ අදිට්ඨවාදිතා, සුතෙ අසුතවාදිතා, මුතෙ අමුතවාදිතා, විඤ්ඤාතෙ අවිඤ්ඤාතවාදිතා.

චත්තාරො අරියවොහාරා : දිට්ඨෙ දිට්ඨවාදිතා, සුතෙ සුතවාදිතා, මුතෙ මුතවාදිතා, විඤ්ඤාතෙ විඤ්ඤාතවාදිතා

3. චත්තාරො පාරාජිකා භික්ඛූනං භික්ඛුනීහි සාධාරණා, චත්තාරො පාරාජිකා භික්ඛුනීනං භික්ඛූහි අසාධාරණා.

චත්තාරො පරික්ඛාරා : අත්ථි පරික්ඛාරො රක්ඛිතබ්බො ගොපෙතබ්බො මමායිතබ්බො පරිභුඤ්ජිතබ්බො, අත්ථි පරික්ඛාරො රක්ඛිතබ්බො ගොපෙතබ්බො මමායිතබ්බො න පරිභුඤ්ජිතබ්බො, අත්ථි පරික්ඛාරො රක්ඛිතබ්බො ගොපෙතබ්බො න මමායිතබ්බො න පරිභුඤ්ජිතබ්බො, අත්ථි පරික්ඛාරො න රක්ඛිතබ්බො න ගොපෙතබ්බො න මමායිතබ්බො න පරිභුඤ්ජිතබ්බො.

අත්ථාපත්ති සම්මුඛා ආපජ්ජති, පරම්මුඛා වුට්ඨාති. අත්ථාපත්ති පරම්මුඛා ආපජ්ජති, සම්මුඛා වුට්ඨාති. අත්ථාපත්ති සම්මුඛා ආපජ්ජති සම්මුඛා වුට්ඨාති. අත්ථාපත්ති පරම්මුඛා ආපජ්ජති, පරම්මුඛා වුට්ඨාති.

අත්ථාපත්ති අජානන්තො ආපජ්ජති, ජානන්තො වුට්ඨාති අත්ථාපත්ති ජානන්තො ආපජ්ජති, අජානන්තො වුට්ඨාති. අත්ථාපත්ති අජානන්තො ආපජ්ජති, අජානන්තො වුට්ඨාති. අත්ථාපත්ති ජානන්තො ආපජ්ජති ජානන්තො වුට්ඨාති.

4. චතුහාකාරෙහි ආපත්තිං ආපජ්ජති : කායෙන ආපජ්ජති, වාචාය ආපජ්ජති, කායෙන වාචාය ආපජ්ජති, කම්මවාචාය ආපජ්ජති. අපරෙහිපි චතුහාකාරෙහි ආපත්තිං ආපජ්ජති : සඞ්ඝමජ්ඣෙ, ගණමජ්ඣෙ, පුග්ගලස්ස සන්තිකෙ, ලිඞ්ගපාතුභාවෙන.

චතුහාකාරෙහි ආපත්තියා වුට්ඨාති : කායෙන වුට්ඨාති, වාචාය වුට්ඨාති, කායෙන වාචාය වුට්ඨාති, කම්මවාචාය වුට්ඨාති.

ඇවැතෙක් ඇත අවදනේ දෙසයි දෙසනුයේ අවදී. ඇවැතෙක් ඇත අවදනේ නැඟී සිටියි, නැඟී සිටිනුයේ අවදී.

ඇවැතෙක් ඇත කර්මයෙන් අවදියි අකර්මයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත අකර්ම යෙන් අවදියි කර්මයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත කර්මයෙන් අවදියි කර්මයෙන් නැඟී සිටී. ඇවැතෙක් ඇත අකර්මයෙන් අවදියි අකර්මයෙන් නැඟී සිටී.

2. නො දුටුයෙහි දිටැයි කියන සුලු බව, නො ඇසුයෙහි ඇසිණැයි කියනසුලුබව, අමුතයෙහි මුතැයි කියනසුලුබව, නො දතුයෙහි දතැයි කියනසුලුබවැයි අනරිය බැවහර සතරෙකි.

නො දුටුයෙහි නො දිටැයි කියනසුලුබව, නො ඇසුයෙහි නො ඇසිණැයි කියන සුලුබව, අමුතයෙහි අමුතැයි කියනසුලුබව, නො දතුයෙහි නො දතැයි කියනසුලුබවැයි අරිය බැවහර සතරෙකි.

දුටුයෙහි නො දිටැයි කියනසුලුබව, ඇසුයෙහි නො ඇසිණැයි කියනසුලුබව, මුතයෙහි අමුතැයි කියනසුලුබව, දතුයෙහි නො දතැයි කියනසුලුබවැයි අනෙකුදු අනරිය බැවහර සතරෙකි.

දුටුයෙහි දිටැයි කියනසුලුබව, ඇසුයෙහි ඇසිණැයි කියනසුලුබව, මුතයෙහි මුතැයි කියනසුලුබව, දතුයෙහි දතැයි කියනසුලුබවැයි අරිය බැවහර සතරෙකි.

3. භික්ෂූන්ට භික්ෂුණීන් හා සාධාරණවූ පරිජි සතරෙකි. භික්ෂුණීන්ට භික්ෂූන් හා අසාධාරණවූ පරිජි සතරෙකි.

පිරිකර සතරෙකි : රැකියයුතු වූ ගොපනය කටයුතු වූ මමායනය කටයුතු වූ පරිභොග කටයුතු වූ පිරිකරෙක් ඇත, රැකියයුතු වූ ගොපනය කටයුතු වූ මමායනය කටයුතු වූ පරිභොග නොකටයුතු වූ පිරිකරෙක් ඇත, රැකියයුතු වූ ගොපනය කටයුතු වූ මමායනය නො කටයුතු වූ පරිභොග නො කටයුතු වූ පිරිකරෙක් ඇත, නො රැකියයුතු වූ ගොපනය නො කටයුතු වූ මමායනය නො කටයුතු වූ පරිභොග නො කටයුතු වූ පිරිකරෙක් ඇති.

ඇවැතෙක් ඇත හමුවෙහි අවදියි නො හමුවෙහි නැඟී සිටියි. ඇවැතෙක් ඇත නො හමුවෙහි අවදියි හමුවෙහි නැඟී සිටියි. ඇවැතෙක් ඇත හමුවෙහි අවදියි හමුවෙහි නැඟී සිටියි. ඇවැතෙක් ඇත නො හමුවෙහි අවදියි නො හමුවෙහි නැඟී සිටී.

ඇවැතෙක් ඇත නො දන්නේ අවදියි දන්නේ නැඟී සිටීසි, ඇවැතෙක් ඇත දන්නේ අවදියි නො දන්නේ නැඟී සිටියි, ඇවැතෙක් ඇත නො දන්නේ අවදියි නො දන්නේ නැඟී සිටියි, ඇවැතෙක් ඇත දන්නේ අවදියි දන්නේ නැඟී සිටී.

4. සිවු අයුරකින් ඇවැතට අවදීයි : කායද්වාරයෙන් අවදියි, වාග්ද්වාරයෙන් අවදියි, කායද්වාරයෙන් හා වාග්ද්වාරයෙන් අවදියි, කර්ම වාක්‍යයෙන් අවදි. සහමැදහි ගණමැදහි පුඟුලක්හු වෙතැ ලිඟුපිරිවැටුමෙනැයි අනෙකුදු සිවු අයුරකින් ඇවැතට අවදී.

කායද්වාරයෙන් නැඟී සිටියි, වාග්ද්වාරයෙන් නැඟී සිටියි, කායද්වාරයෙන් හා වාග් ද්වාරයෙන් නැඟී සිටියි, කර්ම වාක්‍යයෙන් නැඟී සිටීයි සිවු අයුරකින් ඇවැතින් නැඟී සිටී.

අපරෙහිපි චතුහාකාරෙහි ආපත්තියා වුට්ඨාති: සඞ්ඝමජ්ඣෙ, ගණමජ්ඣෙ, පුග්ගලස්ස සන්තිකෙ, ලිඞ්ගපාතුභාවෙන. සහපටිලාභෙන පුරිමං ජහාති, පච්ඡිමෙ පතිට්ඨාති, විඤ්ඤත්තියො පටිප්පස්සම්භන්ති, පඤ්ඤත්තියො[1] නිරුජ්ඣන්ති. සහපටිලාභෙන පච්ඡිමං ජහාති, පුරිමෙ පතිට්ඨාති, විඤ්ඤත්තියො පටිප්පස්සම්භන්ති, පඤ්ඤත්තියො නිරුජ්ඣන්ති.

5. චතස්සො චොදනා: සීලවිපත්තියා චොදෙති, ආචාරවිපත්තියා චොදෙති, දිට්ඨිවිපත්තියා චොදෙති, ආජීවවිපත්තියා චොදෙති.

චත්තාරො පරිවාසා: පටිච්ඡන්නපරිවාසො, අපටිච්ඡන්නපරිවාසො, සුද්ධන්තපරිවාසො, සමොධානපරිවාසො.

චත්තාරි මානත්තානි[2]: පටිච්ඡන්නමානත්තං, අපටිච්ඡන්නමානත්තං, පක්ඛමානත්තං, සමොධානමානත්තං.

චත්තාරො මානත්තචාරිකස්ස භික්ඛුනො රත්තිච්ඡෙදා: සහවාසො විප්පවාසො, අනාරොචනා, ඌනෙ ගණෙ චරති

චත්තාරො සාමුක්කංසා.

6. චත්තාරො පටිග්ගහිතපරිභොගා: යාවකාලිකං, යාමකාලිකං, සත්තාහකාලිකං, යාවජීවිකං.

චත්තාරි මහාවිකටානි: ගූථො, මුත්තං, ඡාරිකා, මත්තිකා

චත්තාරි කම්මානි: අපලොකනකම්මං, ඤත්තිකම්මං, ඤත්තිදුතියකම්මං, ඤත්තිචතුත්ථකම්මං.

අපරානිපි චත්තාරි කම්මානි: අධම්මෙන වග්ගකම්මං, අධම්මෙන සමග්ගකම්මං, ධම්මෙන වග්ගකම්මං ධම්මෙන සමග්ගකම්මං.

චතස්සො විපත්තියො: සීලවිපත්ති, ආචාරවිපත්ති, දිට්ඨිවිපත්ති, ආජීවවිපත්ති.

චත්තාරි අධිකරණානි: විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං.

චත්තාරො පරිසදූසනා: භික්ඛු දුස්සීලො පාපධම්මො පරිසදූසනො, භික්ඛුනී දුස්සීලා පාපධම්මා පරිසදූසනා, උපාසකො දුස්සීලො පාපධම්මො පරිසදූසනො, උපාසිකා දුස්සීලා පාපධම්මා පරිසදූසනා.

චත්තාරො පරිසසොභනා: භික්ඛු සීලවා කල්‍යාණධම්මො පරිසසොභනො, භික්ඛුනී සීලවතී කල්‍යාණධම්මා පරිසසොභනා, උපාසකො සීලවා කල්‍යාණධම්මො පරිසසොභනො, උපාසිකා සීලවතී කල්‍යාණධම්මා පරිසසොභනා.

1. පණ්ණත්තියො – මජසං.
2. චත්තාරො මානත්තා – සීමු 1. 2.

Free Distribution www.aathaapi.org

සඟමැදහි ගණමැදහි පුහුලක්හු වෙතැ ලිහු පිරිවැටුමෙනැයි අනෙකුදු සිවු අයුරෙකින් ඇවැතින් නැඟී සිටී. ස්ත්‍රී ලිඞ්ගය පිළිලැබීම සමග **පළමු** පුරුෂ ලිඞ්ගය හරියි, පශ්චිම ස්ත්‍රී ලිඞ්ගයෙහි පිහිටයි. විඥප්තීහු සන්සිඳෙත්, ප්‍රඥප්තීහු නිරුද්ධ වෙත්. පුරුෂ ලිඞ්ගය පිළිලැබීම සමග හීන වූ ස්ත්‍රී ලිඞ්ගය හරී. **පළමු** පුරුෂ ලිඞ්ගයෙහි පිහිටයි. විඥප්තීහු සන් සිඳෙති, ප්‍රඥප්තීහු නිරුද්ධ වෙත්.

5. චොදනා සතරෙකි ; සීලවිපත්තියෙන් චොදනා කෙරෙයි, ආචාර විපත්තියෙන් චොදනා කෙරෙයි, දිට්ඨිවිපත්තියෙන් චොදනා කෙරෙයි, ආජීවවිපත්තියෙන් චොදනා කෙරෙයි.

පරිවාස සතරෙකි : පටිච්ඡන්න පරිවාස යැ, අපටිච්ඡන්න පරිවාස යැ, සුද්ධන්ත පරිවාස යැ, සමොධාන පරිවාස යැයි.

මානත් සතරෙකි: පටිච්ඡන්න මානත්ත යැ, අපටිච්ඡන්න මානත්ත යැ, පක්ඛ-මානත්ත යැ, සමොධාන මානත්ත යැයි.

සහවාස යැ, විප්පවාස යැ, අනාරොචන යැ, ඌන ගණයෙහි හැසිරීම යැයි මානත හැසිරෙන මහණහු පිළිබඳ රාත්‍රිච්ඡෙද සතරෙකි.

සාමුක්කංස සතරෙකි.

6. පිළිගත් පිරිබෝ සතරෙකි : යාවකාලික යැ, යාමකාලික යැ, සත්තාහ-කාලික යැ යාවජීවක යැයි.

මහාවිකට සතරෙකි : ගූථ යැ, මූත්‍ර යැ, අළු යැ, මැටි යැයි.

කර්ම සතරෙකි : අපලොකනකර්ම යැ, ඤත්තිකර්මය යැ, ඤත්තිදුතියකර්ම යැ, ඤත්තිචතුත්ථකර්ම යැයි.

අධර්මයෙන් ව්‍යග්‍රකර්ම යැ, අධර්මයෙන් සමග්‍රකර්ම යැ, ධර්මයෙන් ව්‍යග්‍රකර්ම යැ ධර්මයෙන් සමග්‍ර කර්ම යැයි අනෙකුදු කර්ම සතරෙකි.

සීලවිපත්ති යැ, ආචාර විපත්ති යැ, දිට්ඨි විපත්ති යැ, ආජීව විපත්ති යැයි විපත් සතරෙකි.

විවාදධිකරණ යැ, අනුවාදධිකරණ යැ, ආපත්තාධිකරණ යැ, කිච්චාධිකරණ යැයි අධිකරණ සතරෙකි.

දුශ්ශීල වූ ලාමක ස්වභාව ඇති භික්ෂු තෙමේ පරිෂද්දූෂණ යැ. දුශ්ශීල වූ ලාමක ස්වභාවය ඇති භික්ෂුණී තොමෝ පරිෂ දූෂණා යැ, දුශ්ශීල වූ ලාමක ස්වභාවය ඇති උපාසක තෙමේ පරිෂද්දූෂණ යැ, දුශ්ශීල වූ ලාමක ස්වභාවය ඇති උපාසිකා තොමෝ පරිෂ දූෂණා යැයි පරිෂද්දූෂණයෝ සිවුදෙනෙකි.

සිල්වත් වූ කලණදම් ඇති මහණ තෙමේ පිරිස් හොබවන්නෙක, සිල් ඇත්තා වූ කලණදම් ඇත්තා වූ මෙහෙණ තොමෝ පිරිස් හොබවන්නියක, සිල්වත්වූ කලණදම් ඇත්තා වූ උවසු තෙමේ පිරිස් හොබවන්නෙක, සිල්වත් වූ කලණදම් ඇත්තා වූ උවැසි තොමෝ පිරිස් හොබවන්නිය කැයි පිරිස් හොබවන්නෝ සිවුදෙනෙකි.

7. අත්ථාපත්ති ආගන්තුකො ආපජ්ජති නො ආවාසිකො. අත්ථාපත්ති ආවාසිකො ආපජ්ජති නො ආගන්තුකො. අත්ථාපත්ති ආගන්තුකො චෙව ආපජ්ජති ආවාසිකො ච. අත්ථාපත්ති නෙව ආගන්තුකො ආපජ්ජති නො ආවාසිකො.

අත්ථාපත්ති ගමිකො ආපජ්ජති නො ආවාසිකො. අත්ථාපත්ති ආවාසිකො ආපජ්ජති නො ගමිකො. අත්ථාපත්ති ගමිකො චෙව ආපජ්ජති ආවාසිකො ච. අත්ථාපත්ති නෙව ගමිකො ආපජ්ජති නො ආවාසිකො.

අත්ථි වත්ථුනානත්තතා නො ආපත්තිනානත්තතා., අත්ථි ආපත්තිනානත්තතා නො වත්ථුනානත්තතා. අත්ථි වත්ථුනානත්තතා චෙව ආපත්තිනානත්තතා ච. අත්ථි නෙව වත්ථුනානත්තතා නො ආපත්තිනානත්තතා.

අත්ථි වත්ථුසභාගතා නො ආපත්තිසභාගතා, අත්ථි ආපත්තිසභාගතා නො වත්ථුසභාගතා, අත්ථි වත්ථුසභාගතා චෙව ආපත්තිසභාගතා ච. අත්ථි නෙව වත්ථුසභාගතා නො ආපත්තිසභාගතා.

අත්ථාපත්ති උපජ්ඣායො ආපජ්ජති නො සද්ධිවිහාරිකො. අත්ථාපත්ති සද්ධිවිහාරිකො ආපජ්ජති නො උපජ්ඣායො. අත්ථාපත්ති උපජ්ඣායො චෙව ආපජ්ජති සද්ධිවිහාරිකො ච. අත්ථාපත්ති නෙව උපජ්ඣායො ආපජ්ජති නො සද්ධිවිහාරිකො

අත්ථාපත්ති ආචරියො ආපජ්ජති නො අන්තෙවාසිකො. අත්ථාපත්ති අන්තෙවාසිකො ආපජ්ජති නො ආචරියො අත්ථාපත්ති ආචරියො චෙව ආපජ්ජති අන්තෙවාසිකො ච. අත්ථාපත්ති නෙව ආචරියො ආපජ්ජති නො අන්තෙවාසිකො.

8. චත්තාරො පච්චයා අනාපත්ති වස්සච්ඡෙදස්ස : සඞ්ඝො වා භින්නො හොති, සඞ්ඝං භින්දිතුකාමා වා හොන්ති, ජීවිතන්තරායො වා හොති, බ්‍රහ්මචරියන්තරායො වා.

චත්තාරි වචීදුච්චරිතානි : මුසාවාදො, පිසුණා වාචා, ඵරුසා වාචා, සම්ඵප්පලාපො.

චත්තාරි වචීසුචරිතානි : සච්චවාචා, අපිසුණා වාචා, සණ්හා වාචා, මන්තාභාසා.

අත්ථි ආදියන්තො ගරුකං ආපත්තිං ආපජ්ජති, පයොජෙන්තො ලහුකං. අත්ථි ආදියන්තො ලහුකං ආපත්තිං ආපජ්ජති, පයොජෙන්තො ගරුකං. අත්ථි ආදියන්තොපි පයොජෙන්තොපි ගරුකං ආපත්තිං ආපජ්ජති. අත්ථි ආදියන්තොපි පයොජෙන්තොපි ලහුකං ආපත්තිං ආපජ්ජති.

9. අත්ථි පුග්ගලො අභිවාදනාරහො නො පච්චුට්ඨානාරහො. අත්ථි පුග්ගලො පච්චුට්ඨානාරහො නො අභිවාදනාරහො. අත්ථි පුග්ගලො අභිවාදනාරහො චෙව පච්චුට්ඨානාරහො ච. අත්ථි පුග්ගලො නෙව අභිවාදනාරහො නො පච්චුට්ඨානාරහො.

Free Distribution www.aathaapi.org

7. ඇවැතෙක් ඇත ආගන්තුකයා අවදියි, ආවාසිකයා නො අවදී. ඇවැතෙක් ඇත ආවාසිකයා අවදියි, ආගන්තුකයා නො අවදී. ඇවැතෙක් ඇත ආගන්තුකයාත් අවදියි, ආවාසිකයාත් අවදී. ඇවැතෙක් ඇත ආගන්තුකයාත් නො අවදියි, ආවාසිකයාත් නො අවදී.

ඇවැතෙක් ඇත ගමිකයා අවදියි, ආවාසිකයා නො අවදී, ඇවැතෙක් ඇත ආවාසිකයා අවදියි, ගමිකයා නො අවදී, ඇවැතෙක් ඇත ගමිකයාත් අවදියි, ආවාසිකයාත් අවදී. ඇවැතෙක් ඇත ගමිකයාත් නො අවදියි, ආවාසිකයාත් නො අවදී.

වස්තු නානාත්වයෙක් ඇත ආපත්ති නානාත්වයෙක් නැත, ආපත්ති නානාත්වයෙක් ඇත වස්තු නානාත්වයෙක් නැත, වස්තු නානාත්වය ද ආපත්ති නානාත්වය ද ඇත, වස්තු නානාත්වය නැත් ම යැ ආපත්ති නානත්වය නැත් මැ යි.

වස්තු සභාගත්වයෙක් ඇත ආපත්ති සභාගත්වයෙක් නැත, ආපත්ති සභාගත්ව යෙක් ඇත වස්තු සභාගත්වයෙක් නැත, වස්තු සභාගත්වය ද ආපත්ති සභාගත්වය ද ඇත, වස්තු සභාගත්වය ද ආපත්ති සභාගත්වය ද නැත් මැ යි.

ඇවැතෙක් ඇත උපාධ්‍යාය තෙමේ අවදියි සද්ධිවිහාරික තෙමේ නො අවදී, ඇවැතෙක් ඇත සද්ධිවිහාරික තෙමේ අවදියි, උපාධ්‍යාය තෙමේ නො අවදී, ඇවැතෙක් ඇත උපාධ්‍යාය තෙමේත් සද්ධිවිහාරික තෙමේත් අවදී, ඇවැතෙක් ඇත උපාධ්‍යාය තෙමේ නො අවදියි සද්ධිවිහාරික තෙමේ නො අවදී.

ඇවැතෙක් ඇත ආචාර්‍ය්‍ය තෙමේ අවදියි ඇතැවැසි තෙමේ නො අවදී, ඇවැතෙක් ඇත ඇතැවැසි තෙමේ අවදියි ආචාර්‍ය්‍ය තෙමේ නො අවදී, ඇවැතෙක් ඇත ආචාර්‍ය්‍ය තෙමේත් අතැවැසි තෙමේත් අවදී, ඇවැතෙක් ඇත ආචාර්‍ය්‍ය තෙමේ නො ම අවදියි, අතැවැසි තෙමේ නොම අවදී.

8. වස්සච්ඡේදය පිළිබඳ ආනාපත්ති හෙතු සතරෙකි : සඞ්ඝයා බිඳුනේ හෝ වෙයි. සඞ්ඝයා බිඳුනු කැමැත්තෝ හෝ වෙති, ජීවිතාන්තරායයෙක් හෝ වෙයි, බ්‍රහ්මචර්‍ය්‍යයට අන්තරායයෙක් හෝ වෙයි.

මුසාවාද යැ පිසුණාවාචා යැ ඵරුසාවාචා යැ සම්ඵප්පලාප යැයි වාග් දුශ්චරිත සතරෙකි.

**සච්චවාචා** යැ අපිසුණාවාචා යැ සණ්හවාචා යැ මන්තාභාස යැයි වාක් සුචරිත සතරෙකි.

ගන්නේ ගරු ඇවැතට මෙහෙයන්නේ ලුහු ඇවැතට ඇවැදීම් ඇත. ගන්නේ ලුහු ඇවැතට මෙහෙයන්නේ ගරු ඇවැතට ඇවදීම් ඇත. ගන්නේ ද මෙහෙයන්නේ ද ගරු ඇවැතට ඇවැදීම් ඇත. ගන්නේ ද මෙහෙයන්නේ ද ලුහු ඇවැතට ඇවැදීම් ඇති.

9. වැඳීමට සුදුසු දක හුනස්නෙන් නැගිසිටීමට නුසුදුසු පුද්ගලයෙක් ඇත, දක හුනස්නෙන් නැගිටීමට සුදුසු වැඳීමට නුසුදුසු පුද්ගලයෙක් ඇත, වැඳීමට සුදුසුවූ ද දක හුනස්නෙන් නැඟී සිටීමට සුදුසුවූ ද පුද්ගලයෙක් ඇත, වැඳීමට නො ම සුදුසු වූ දක හුනස්නෙන් නැඟී සිටීමට නො ම සුදුසු වූ පුද්ගලයෙක් ඇති.

අත්ථි පුග්ගලො ආසනාරහො නො අභිවාදනාරහො අත්ථි පුග්ගලො අභිවාදනාරහො නො ආසනාරහො. අත්ථි පුග්ගලො ආසනාරහො චෙව අභිවාදනාරහො ච. අත්ථි පුග්ගලො නෙව ආසනාරහො, නො අභිවාදනාරහො.

10. අත්ථාපත්ති කාලෙ ආපජ්ජති නො විකාලෙ. අත්ථාපත්ති විකාලෙ ආපජ්ජති නො කාලෙ. අත්ථාපත්ති කාලෙ චෙව ආපජ්ජති විකාලෙ ච, අත්ථාපත්ති නෙව කාලෙ ආපජ්ජති නො විකාලෙ.

අත්ථි පටිග්ගහිතං කාලෙ කප්පති නො විකාලෙ අත්ථි පටිග්ගහිතං විකාලෙ කප්පති නො කාලෙ. අත්ථි පටිග්ගහිතං කාලෙ චෙව කප්පති විකාලෙ ච. අත්ථි පටිග්ගහිතං නෙව කාලෙ කප්පති නො විකාලෙ.

අත්ථාපත්ති පච්චන්තිමෙසු ජනපදෙසු ආපජ්ජති නො මජ්ඣිමෙසු ජනපදෙසු, අත්ථාපත්ති මජ්ඣිමෙසු ජනපදෙසු ආපජ්ජති නො පච්චන්තිමෙසු ජනපදෙසු, අත්ථාපත්ති පච්චන්තිමෙසු ජනපදෙසු චෙව ආපජ්ජති මජ්ඣිමෙසු ජනපදෙසු ච, අත්ථාපත්ති නෙව පච්චන්තිමෙසු ජනපදෙසු ආපජ්ජති නො මජ්ඣිමෙසු ජනපදෙසු.

අත්ථි පච්චන්තිමෙසු ජනපදෙසු කප්පති නො මජ්ඣිමෙසු ජනපදෙසු, අත්ථි මජ්ඣිමෙසු ජනපදෙසු කප්පති නො පච්චන්තිමෙසු ජනපදෙසු. අත්ථි පච්චන්තිමෙසු ජනපදෙසු චෙව කප්පති මජ්ඣිමෙසු ජනපදෙසු ච. අත්ථි නෙව පච්චන්තිමෙසු ජනපදෙසු කප්පති. නො මජ්ඣිමෙසු ජනපදෙසු.

අත්ථාපත්ති අන්තො ආපජ්ජති නො බහි, අත්ථාපත්ති බහි ආපජ්ජති නො අන්තො. අත්ථාපත්ති අන්තො චෙව ආපජ්ජති බහි ච. අත්ථාපත්ති නෙව අන්තො ආපජ්ජති නො බහි

අත්ථාපත්ති අන්තොසීමාය ආපජ්ජති නො බහිසීමාය. අත්ථාපත්ති බහිසීමාය ආපජ්ජති නො අන්තොසීමාය. අත්ථාපත්ති අන්තොසීමාය චෙව ආපජ්ජති බහිසීමාය ච. අත්ථාපත්ති නෙව අන්තොසීමාය ආපජ්ජති නො බහිසීමාය.

අත්ථාපත්ති ගාමෙ ආපජ්ජති නො අරඤ්ඤෙ. අත්ථාපත්ති අරඤ්ඤෙ ආපජ්ජති නො ගාමෙ. අත්ථාපත්ති ගාමෙ චෙව ආපජ්ජති අරඤ්ඤෙ ච අත්ථාපත්ති නෙව ගාමෙ ආපජ්ජති නො අරඤ්ඤෙ.

11. චතස්සො චොදනා : වත්ථුසන්දස්සනා ආපත්තිසන්දස්සනා, සංවාසපටික්ඛෙපො, සාමීචිපටික්ඛෙපො.

චත්තාරො පුබ්බකිච්චා. චත්තාරො පත්තකල්ලා. චත්තාරි අනඤ්ඤපාචිත්තියානි. චතස්සො භික්ඛුසම්මුතියො.

චත්තාරි අගතිගමනානි : ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

චත්තාරි නාගතිගමනානි : න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති.

අසුනක් දීමට සුදුසු වැඳීමට නුසුදුසු පුද්ගලයෙක් ඇත, වැඳීමට සුදුසු අසුනක් දීමට නුසුදුසු පුද්ගලයෙක් ඇත, අසුනක් දීමට සුදුසු වූ ද වැඳීමට සුදුසු වූ ද පුද්ගලයෙක් ඇත, අසුනක් දීමට නො ම සුදුසු වූ වැඳීමට නො ම සුදුසු වූ පුද්ගලයෙක් ඇති.

10. ඇවැතෙක් ඇත කාලයෙහි අවදියි, විකාලයෙහි නො අවදී. ඇවැතෙක් ඇත විකාලයෙහි අවදියි, කාලයෙහි නො අවදී. ඇවැතෙක් ඇත කාලයෙහි ද විකාලයෙහි ද අවදී. ඇවැතෙක් ඇත කාලයෙහි නො ම අවදියි, විකාලයෙහි නො අවදී.

කාලයෙහි කැප විකාලයෙහි නො කැප පිළිගන්නා ලද්දෙක් ඇත. විකාලයෙහි කැප කාලයෙහි නො කැප පිළිගන්නා ලද්දෙක් ඇත. කාලයෙහි ද විකාලයෙහි ද කැප පිළිගන්නා ලද්දෙක් ඇත. කාලයෙහි නො ම කැප වූ විකාලයෙහි නො ම කැප වූ පිළිගන්නා ලද්දෙක් ඇති.

ඇවැතෙක් ඇත පසල් දනවුහි අවදියි, මැදුම් දනවුහි නො අවදී. ඇවැතෙක් ඇත මැදුම් දනවුහි අවදියි, පසල් දනවුහි නො අවදී. ඇවැතෙක් ඇත පසල් දනවුහි ද මැදුම් දනවුහි ද අවදී. ඇවැතෙක් ඇත පසල් දනවුහි නො ම අවදියි, මැදුම් දනවුහි නොම අවදී.

පසල් දනවුහි කැප මැදුම් දනවුහි නො කැපයෙක් ඇත. මැදුම් දනවුහි කැප පසල් දනවුහි නො කැපයෙක් ඇත. පසල් දනවුහි ද මැදුම් දනවුහි ද කැපයෙක් ඇත, පසල් දනවුහි ද මැදුම් දනවුහි ද නො ම කැපයෙක් ඇති.

ඇවැතෙක් ඇත ඇතුළතැ අවදියි, පිටතැ නො අවදී, ඇවැතෙක් ඇත පිටතැ අවදියි, ඇතුළතැ නො අවදී. ඇවැතෙක් ඇත ඇතුළතත් පිටතත් අවදී, ඇවැතෙක් ඇත ඇතුළතැ නොම අවදියි පිටතැ නො ම අවදී.

ඇවැතෙක් ඇත සීමාව තුළැ අවදියි, සීමාවෙන් පිටතැ නො අවදී. ඇවැතෙක් ඇත සීමාවෙන් පිටතැ අවදියි, සීමාව තුළැ නො අවදී. ඇවැතෙක් ඇත සීමාව තුළැ ද සීමාවෙන් පිටතැ ද අවදී, ඇවැතෙක් ඇත සීමාව තුළැ නොම අවදියි, සීමාවෙන් පිටතැ නොම අවදී.

ඇවැතෙක් ඇත ගමෙහි අවදියි, අරණ්‍යයෙහි නො අවදී. ඇවැතෙක් ඇත අරණ්‍යයෙහි අවදියි, ගමෙහි නො අවදී. ඇවැතෙක් ඇත ගමෙහි ද අරණ්‍යයෙහි ද අවදී. ඇවැතෙක් ඇත ගමෙහි නො ම අවදියි, අරණ්‍යයෙහි නො අවදී.

11. චොදනා සතරෙකි : වත්ථුසංදස්සනා යැ ආපත්තිසංදස්සනා යැ සංවාස-පටික්ඛෙප යැ සාමීචිපටික්ඛෙප යැයි.

පූර්වකෘත්‍යයෝ සිවු දෙනෙකි. පත්තකාල කර්මයෝ සිවු දෙනෙකි. අනඤ්ඤ-පාචිත්තිය ශික්ෂාපදයෝ සිවුදෙනෙකි. භික්ඛුසම්මුතීහු සිවු දෙනෙකි.

අගතිගමනයෝ සිවු දෙනෙකි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

නාගතිගමනයෝ සිවු දෙනෙකි. ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි. භයෙන් අගතියට නො යෙයි.

12. චතූහඞ්ගෙහි සමන්නාගතො අලජ්ජී භික්ඛු සඞ්ඝං භින්දති. ඡන්දාගතිං ගච්ඡන්තො, දොසාගතිං ගච්ඡන්තො, මොහාගතිං ගච්ඡන්තො, භයාගතිං ගච්ඡන්තො.

චතූහඞ්ගෙහි සමන්නාගතො පෙසලො භික්ඛු භින්නං සඞ්ඝං සමග්ගං කරොති: න ඡන්දාගතිං ගච්ඡන්තො, න දොසාගතිං ගච්ඡන්තො, න මොහාගතිං ගච්ඡන්තො, න භයාගතිං ගච්ඡන්තො.

චතූහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො විනයො න පුච්ඡිතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

චතූහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා විනයො න පුච්ඡිතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

චතූහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො විනයො න විස්සජ්ජෙතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

චතූහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා විනයො න විස්සජ්ජෙතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

චතූහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො න දාතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති

චතූහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො න සාකච්ඡිතබ්බො: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති.

13. අත්ථාපත්ති ගිලානො ආපජ්ජති නො අගිලානො, අත්ථාපත්ති අගිලානො ආපජ්ජති නො ගිලානො, අත්ථාපත්ති ගිලානො චෙව ආපජ්ජති අගිලානො ච, අත්ථාපත්ති නෙව ගිලානො ආපජ්ජති නො අගිලානො.

14. චත්තාරි අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි. චත්තාරි ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානීති.

චතුක්කං නිට්ඨිතං.

---

තස්සුද්දානං:

1. සකවාචාය කායෙන පස්සන්තො ච අචිත්තකො
ආපජ්ජන්තො ච කම්මෙන වොහාරා චතුරො තථා

2. භික්ඛූනං භික්ඛුනීනඤ්ච පරික්ඛාරො ච සම්මුඛා
අජානකාලෙ[1] මජ්ඣෙ ච වුට්ඨාති දුවිධා තථා

---

1. ආජානකාලෙ - ම ඡ සං.

12. සිවු අඟින් යුක්ත වූ අලජ්ජි භික්ෂු තෙමේ සඞ්ඝභෙදය කෙරෙයි : ඡන්දයෙන් අගතියට යන්නේ ද්වේෂයෙන් අගතියට යන්නේ මොහයෙන් අගතියට යන්නේ භයෙන් අගතියට යන්නේ යි.

සිවු අඟින් යුක්ත වූ ප්‍රියශීලි භික්ෂු තෙමේ සඞ්ඝයා සමගි කෙරෙයි. ඡන්දයෙන් අගතියට නො යන්නේ ද්වේෂයෙන් අගතියට නො යන්නේ මොහයෙන් අගතියට නො යන්නේ භයෙන් අගතියට නො යන්නේ යි.

සිවු අඟින් යුක්තවූ මහණහු පිළිබඳ විනය නො විචාළ යුතුයි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

සිවු අඟින් යුත් මහණහු විසින් විනය නො විචාළ යුතුය : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

සිවු අඟින් යුත් මහණහු පිළිබඳ විනය නො විසඳිය යුතුයි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

සිවු අඟින් යුත් මහණහු විසින් විනය නො විසඳිය යුතුයි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

සිවු අඟින් යුත් මහණහට අනුයොගය නොදිය යුතුයි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

සිවු අඟින් යුත් මහණහු සමඟ විනය සාකච්ඡා නො කටයුතුයි : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, භයෙන් අගතියට යෙයි.

13. ඇවැතෙක් ඇත ගිලනා අවදියි, නො ගිලනා නො අවදී. ඇවතෙක් ඇත නො ගිලනා අවදියි, ගිලනා නො අවදී. ඇවතෙක් ඇත ගිලනාත් අවදියි, නො ගිලනාත් අවදී. ඇවතෙක් ඇත ගිලනාත් නො ගිලනාත් නො ම අවදී.

14. නො දැහැමි පාමොක් තැබීම් සතරෙකැ, දැහැමි පාමොක් තැබීම් සතරෙකි.

චතුෂ්කය නිමි.

---

එහි නාමාවලිය :

1. සකවාචා යැ කාය යැ පසුත්ත යැ අවිත්තක යැ එසේ ම ආපජ්ජන්ත යැ කම්ම යැ වොහාර සතර යැ,

2. භික්ෂු භික්ෂුණී සාධාරණ අසාධාරණ පරිජී යැ පරික්ඛාර යැ සම්මුඛා යැ අජානා යැ කාය යැ මජ්ඣයැ එසේ ම දෙවැදෑරුම් වුට්ඨාති යැ.

Free Distribution www.aathaapi.org

3. පටිලාභා[1] ච චොදනා පරිවාසා ච වුච්චති,
මානත්තචාරිකා චාපි සාමුක්කංසා පටිග්ගහා[2]

4. මහාවිකටකම්මානි පුන කම්මවිපත්තියො,[3]
අධිකරණා දුස්සීලා ච නොහනාගන්තුකෙන ච

5. ගමිකො වත්ථුනානත්තා සභාගුපජ්ඣායෙන ච,
ආචරියො පච්චයා ච දුච්චරිතං සුචරිතං

6. ආදියන්තො පුග්ගලො ච අරහා ආසනෙන ච,
කාලෙ ච කප්පති චෙව පච්චන්තිමෙසු කප්පති

7. අන්තො අන්තො ච සීමාය ගාමෙ ච චොදනාය ච,
පුබ්බකිච්චං පත්තකල්ලං අනඤ්ඤසම්මුතියො ච

8. අගති නාගති චෙව අලජ්ජී පෙසලෙන ච,
පුච්ඡිතබ්බා දුවෙ චෙව විස්සජ්ජෙය්‍යා තථා දුවෙ;
අනුයොගො ච සාකච්ඡා ගිලානො ඨපනෙන චා ති.

---

## පඤ්චකං

1. පඤ්ච ආපත්තියො. පඤ්ච ආපත්තික්ඛන්ධා. පඤ්ච විනීතවත්ථූනි. පඤ්ච කම්මානි ආනන්තරිකානි. පඤ්ච පුග්ගලා නියතා. පඤ්ච ඡෙදනකා ආපත්තියො. පඤ්චහාකාරෙහී ආපත්තිං ආපජ්ජති. පඤ්ච ආපත්තියො මුසාවාදපච්චයා.

2. පඤ්චහාකාරෙහි කම්මං න උපෙති: සයං වා කම්මං න කරොති, පරං වා නාජ්ඣෙසති, ඡන්දං වා පාරිසුද්ධිං වා න දෙති, කයිරමානෙ කම්මෙ පටික්කොසති, කතෙ වා පන කම්මෙ අධම්මදිට්ඨි හොති.

පඤ්චහාකාරෙහි කම්මං උපෙති: සයං වා කම්මං කරොති, පරං වා අජ්ඣෙසති, ඡන්දං වා පාරිසුද්ධිං වා දෙති, කයිරමානෙ කම්මෙ න පටික්කොසති, කතෙ වා පන කම්මෙ ධම්මදිට්ඨි හොති.

3. පඤ්ච පිණ්ඩපාතිකස්ස භික්ඛුනො කප්පන්ති: අනාමන්තචාරො, ගණභොජනං, පරම්පරභොජනං, අනධිට්ඨානං, අවිකප්පනා.

4. පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උස්සඞ්කිතපරිසඞ්කිතො හොති පාපභික්ඛුපි අකුප්පධම්මොපි: වෙසියගොචරො[4] වා හොති, විධවාගොචරො වා හොති, ථුල්ලකුමාරීගොචරො[5] වා හොති, පණ්ඩකගොචරො වා හොති, භික්ඛුනීගොචරො වා හොති.

---

1. පටිලාභෙන - මජසං.
2. පටිග්ගාහි - මජසං.
3. පුන කම්මෙ - මජසං.
4. වෙසියාගොචරො - සීමු2.
5. ථුල්ලකුමාරිගොචරො - මජසං.

3. පටිලාභය සමඟ චොදනා යැ පරිවාස යැයි චතුෂ්ක කියනු ලැබේ. මානත්තචාරිකා යැ සාමුක්කංසා යැ පටිග්ගාහ යැ.

4. මහාවිකට යැ කම්ම යැ යළි කම්මවිපත්ති යැ අධිකරණ යැ දුස්සීල යැ ආගන්තුක චතුෂ්කය සමඟ සොභනා යැ.

5. ගමික යැ වත්ථුනානත්ත යැ උපජ්ඣාය චතුෂ්කය සමඟ සභාග යැ ආචරිය යැ පච්චය යැ දුච්චරිත යැ සුචරිත යැ.

6. ආදියන්ත යැ පුග්ගල යැ ආසනාරහ සමඟ අභිවාදනාරහ යැ කාල යැ කප්පති යැ පච්චන්තිම යැ කප්පති යැ.

7. අන්තො යැ අන්තො සීමා යැ චොදනා චතුෂ්කය සමඟ ගාම යැ පුබ්බකිච්ච යැ පත්තකල්ල යැ අනඤ්ඤ යැ සම්මුති යැ.

8. අගති යැ නාගති යැ පෙසල චතුෂ්කය සමඟ අලජ්ජී යැ පුච්ඡිතබ්බ දෙක යැ එසේම විස්සජ්ජෙය්‍ය දෙක යැ අනුයොග යැ සාකච්ඡා යැ ඨපනා දෙක සමඟ ගිලාන යැයි මෙහි චතුෂ්ක නාමාවලි යයි.

## පඤ්චකය

1. ආපත්ති පසෙකැ. ආපත්තිස්කන්ධ පසෙකැ. විනීතවස්තු පසෙකැ. ආනන්තරික කර්ම පසෙකැ. නියත පුද්ගලයෝ පස් දෙනෙකැ. ඡේදනක ආපත්ති පසෙකැ. පස් අයුරෙකින් ඇවැතට පැමිණෙයි, මුසාබිණීම හෙතු කොට ගෙණ ඇවැත් පසෙකි.

2. පස් අයුරෙකින් විනය කර්මයට නො පැමිණේ: තෙමේ හෝ විනය කර්මය නො කෙරෙයි. මෙරමා හෝ ආරාධනය නො කෙරෙයි. ඡන්දය හෝ පාරිසුද්ධිය හෝ නො දෙයි. කර්මය කරණු ලබන කල්හි පිළිකෙව් කෙරෙයි. යළි කර්මය කළ කල්හි අධර්මදෘෂ්ටි ඇත්තේ හෝ වෙයි.

පස් අයුරෙකින් විනය කර්මයට පැමිණේ. තෙමේ හෝ විනය කර්මය කෙරෙයි. මෙරමා හෝ ආරාධනය කෙරෙයි. ඡන්දය හෝ පාරිසුද්ධිය හෝ දෙයි. කර්මය කරණු ලබන කල්හි පිළිකෙව් නො කෙරෙයි. යළි කර්මය කළ කල්හි ධර්මදෘෂ්ටි ඇත්තේ හෝ වෙයි.

3. පිණ්ඩපාතික මහණහට කැප දෑ පසෙක: අනාමන්තචාර යැ ගණභොජන යැ පරම්පරභොජන යැ අනධිෂ්ඨාන යැ අවිකල්පන යි.

4. පසඟින් යුත් මහණ පවිටු වුව ද ක්ෂීණාස්‍රව වුව ද සැක කරණ ලද්දෙක් නැවැත නැවැත සැක කරණ ලද්දෙක් වෙයි: වෙසඟනන් ඇසුරු කරන්නේ හෝ යැ. වැන්දඹුවන් ඇසුරු කරන්නේ හෝ යැ. යොවුන් බවට පත් අවිවාහක ස්ත්‍රීන් ඇසුරු කරන්නේ හෝ යැ. පණ්ඩකයන් ඇසුරු කරන්නේ හෝ යැ. භික්ෂුණීන් ඇසුරු කරන්නේ හෝ යි.


Free Distribution www.aathaapi.org

5. පඤ්ච තෙලානි : තිලතෙලං, සාසපතෙලං, මධුකතෙලං, එරණ්ඩතෙලං, වසාතෙලං.

පඤ්ච වසානි : අච්ඡවසං, මච්ඡවසං, සුසුකාවසං, සූකරවසං, ගද්‍රභවසං.

6. පඤ්ච බ්‍යසනානි : ඤාතිබ්‍යසනං, භොගබ්‍යසනං, රොගබ්‍යසනං, සීලබ්‍යසනං, දිට්ඨිබ්‍යසනං.

පඤ්ච සම්පදා : ඤාතිසම්පදා, භොගසම්පදා, අරොගසම්පදා, සීලසම්පදා, දිට්ඨිසම්පදා.

7. පඤ්ච නිස්සග්ගපටිප්පස්සද්ධියො උපජ්ඣායම්හා : උපජ්ඣායො පක්කන්තො වා හොති, විබ්භන්තො වා, කාලකතො වා, පක්ඛසඞ්කන්තො වා, ආණත්තියෙව පඤ්චමී.

පඤ්ච පුග්ගලා න උපසම්පාදෙතබ්බා : අද්ධානහීනො, අඞ්ගහීනො, වත්ථුවිපන්නො, කරණදුක්කටකො, අපරිපූරො.

8. පඤ්ච පංසුකූලානි : සොසානිකං, පාපණිකං උන්දූරඛායිතං, උපචිකා ඛායිතං, අග්ගිදඩ්ඪං.

අපරානිපි පඤ්ච පංසුකූලානි : ගොඛායිතං, අජඛායිතං, ථූපචීවරං, ආභිසෙකිකං, ගතපටියාගතං.

9. පඤ්ච අවහාරා : ථෙය්‍යාවහාරො, පසය්හාවහාරො, පරිකප්පාවහාරො, පටිච්ඡන්නාවහාරො, කුසාවහාරො.

10. පඤ්ච මහාචොරා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

පඤ්ච අවිස්සජ්ජියානි.

පඤ්ච අවෙභඞ්ගියානි.

පඤ්චාපත්තියො කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො.

පඤ්චාපත්තියො කායතො ච වාචතො ච සමුට්ඨහන්ති න චිත්තතො.

පඤ්චාපත්තියො දෙසනාගාමිනියො.

පඤ්ච සඞ්ඝා.

පඤ්ච පාතිමොක්ඛුද්දෙසා.

සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු විනයධරපඤ්චමෙන ගණෙන උපසම්පාදෙතබ්බං.

පඤ්ච ආනිසංසා කඨිනත්ථාරෙ.

පඤ්ච කම්මානි.

යාවතතියකෙ පඤ්චාපත්තියො.

5. තෙල් පසෙක : තල තෙලැ අබ තෙලැ මී තෙලැ එරඬු තෙලැ වුරුණු තෙලි.

වුරුණු තෙල් පසෙක : වලස් තෙලැ මස් තෙලැ කිඹුල් තෙලැ හූරු තෙලැ කොටළු තෙලි.

6. ව්‍යසන පසෙක : ඥාතිව්‍යසන යැ භොග ව්‍යසන යැ රොග ව්‍යසන යැ ශීල ව්‍යසන යැ දෘෂ්ටි ව්‍යසන යි.

සම්පත්ති පසෙක : ඥාතිසම්පත්ති යැ භොගසම්පත්ති යැ ආරොග්‍යසම්පත්ති යැ සීලසම්පත්ති යැ දිට්ඨිසම්පත්ති යි.

7. උපාධ්‍යායයා කෙරෙන් නිස මිදීම් පසෙක : උපාධ්‍යාය තෙමේ බැහැර ගියේ හෝ වෙයි, උපැවිදි වූයේ හෝ වෙයි, කලුරිය කෙළේ හෝ වෙයි, අන්තොටුබවට ගියේ හෝ වෙයි, ඇණවීම මැ පස් වැනි වේ.

පුද්ගලයෝ පස් දෙනෙක් උපසපන් නො කටයුතු වෙති : ඌනු විසි වයස් ඇත්තේ යැ, විකල වූ අවයව ඇත්තේ යැ, වස්තු විපන්න යැ, ථෙය්‍යසංවාසාදි දුෂ්කෘත කර්ම ඇත්තේ යැ පිරිපුන් පා සිවුරු නැත්තේ යි.

8. පාංශුකූල පසෙක : සොහොන් පිළි යැ අවන් පිළි යැ මීයන් කෑ පිළි යැ වෙයන් කෑ පිළි යැ ගින්නෙන් දැවුණු පිළි යි.

අනෙකුදු පාංශුකූල පසෙක : ගෙරින් කෑ පිළි යැ එළුවන් කෑ පිළි යැ තුඹස් සිසාළ පිළි යැ බිසෙවුමඩු පිළි යැ මිනී ඔතා ගෙණා පිළි යි.

9. අවහාර පසෙක : සොරසිතින් ගැන්ම යැ සැහැසිකමින් ගැන්ම යැ පිරිකපා ගැන්ම යැ පිළිසන් කොට ගැන්ම යැ කුසපත් පෙරළි කොට ගැන්ම යි.

10. මහ සොරු පස් දෙනෙක් ලොව්හි විද්‍යාමාන වෙති.

නො විසඳිය යුතු භාණ්ඩ පසෙකි.

නො බෙදිය යුතු භාණ්ඩ පසෙකි.

පස් ඇවැතෙක් කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී.

පස් ඇවැතෙක් කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී.

පස් ඇවැතෙක් **දෙශනාගාමිනී** යැ

සඞ්ඝ වර්ග පසෙකි.

පාමොක් උදෙසීම් පසෙකි.

සියලු පසල් දනවුහි විනයධරයකු පස්වැනි කොට ඇති ගණයා විසින් උපසම්පද කර්ම කළ යුතු යි.

කඨිනය ඇතිරීමෙහි අනුසස් පසෙකි.

විනය කර්ම පසෙකි.

තුන් යළ තෙක් කීමෙහි ඇවැත් පසෙකි.

පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති පාරාජිකස්ස.

පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස.

පඤ්චහාකාරෙහි අදින්නං ආදියන්තස්ස ආපත්ති දුක්කටස්ස.

11. පඤ්ච අකප්පියානි න පරිභුඤ්ජිතබ්බානි: අදින්නඤ්ච හොති, අවිදිතඤ්ච හොති, අකප්පියඤ්ච හොති, අපටිග්ගහිතඤ්ච හොති, අකතාතිරිත්තඤ්ච හොති.

පඤ්චකප්පියානි පරිභුඤ්ජිතබ්බානි: දින්නඤ්චෙව හොති, විදිතඤ්ච හොති, කප්පියඤ්ච හොති, පටිග්ගහිතඤ්ච හොති, කතාතිරිත්තඤ්ච හොති.

පඤ්ච දානානි අපුඤ්ඤානි පුඤ්ඤසම්මතානි ලොකස්ස[1]: මජ්ජදානං, සමජ්ජදානං, ඉත්ථිදානං, උසභදානං, චිත්තකම්මදානං.

පඤ්ච උප්පන්නා දුප්පටිවිනොදයා[2]: උප්පන්නො රාගො දුප්පටිවිනොදයො, උප්පන්නො දොසො දුප්පටිවිනොදයො, උප්පන්නො මොහො දුප්පටිවිනොදයො, උප්පන්නං පටිභානං දුප්පටිවිනොදයං, උප්පන්නං ගමියචිත්තං දුප්පටිවිනොදයං.

පඤ්චානිසංසා සම්මජ්ජනියා: සකචිත්තං පසීදති, පරචිත්තං පසීදති, දෙවතා අත්තමනා හොන්ති, පාසාදිකසංවත්තනිකං[3] කම්මං උපචිනාති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

අපරෙපි පඤ්චානිසංසා සම්මජ්ජනියා: සකචිත්තං පසීදති, පරචිත්තං පසීදති, දෙවතා අත්තමනා හොන්ති සත්ථුසාසනං කතං හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති.

12. පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: අත්තනො භාසපරියන්තං න උග්ගණ්හාති, පරස්ස භාසපරියන්තං න උග්ගණ්හාති, අත්තනො භාසපරියන්තං අනුග්ගහෙත්වා[4] පරස්ස භාසපරියන්තං අනුග්ගහෙත්වා අධම්මෙන කාරෙති අපටිඤ්ඤාය.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: අත්තනො භාසපරියන්තං උග්ගණ්හාති, පරස්ස භාසපරියන්තං උග්ගණ්හාති, අත්තනො භාසපරියන්තං උග්ගහෙත්වා පරස්ස භාසපරියන්තං උග්ගහෙත්වා ධම්මෙන කාරෙති පටිඤ්ඤාය.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තිං න ජානාති, ආපත්තියා මූලං න ජානාති, ආපත්තිසමුදයං න ජානාති, ආපත්තිනිරොධං න ජානාති, ආපත්තිනිරොධගාමිනිං පටිපදං[5] න ජානාති.

---

1. ලොකස්මිං—සීමු 1, 2. මජසං.
2. දුප්පටිවිනොදියා—සයා.
3. පාසාදික සංවත්තියං—සීමු. 1, 2.
   පාසාදික සංවත්තියං—සයා.
   පාසාදික සංවත්තිකකම්මං—මජසං.
4. න උග්ගහෙත්වා—මජසං.
5. ආපත්තිනිරොධගාමිණිපටිපදං—සීමු, 1.

පස් අයුරෙකින් නොදුන් දෙය පැහැර ගන්නහුට පරිජි ඇවැත් වේ.

පස් අයුරෙකින් නොදුන් දෙය පැහැර ගන්නහුට ථුල්ලැසි ඇවැත් වේ.

පස් අයුරෙකින් නොදුන දෙය පැහැර ගන්නහුට දුකුළා ඇවැත් වේ.

11. නොවැළඳිය යුතු අකැප බොජුන් පසෙක : නොදෙන ලද්දේත් වෙයි, (පිළිගණිමියි) නො දන්නා ලද්දේත් වෙයි, අකැපත් වෙයි, නො පිළිගන්නා ලද්දේත් වෙයි, පවරා අයිරිත් නො කරණ ලදුයේ ද වේ.

වැළඳිය යුතු කැප බොජුන් පසෙක : දෙන ලද්දේත් වෙයි, (පිළිගණිමියි) දන්නා ලද්දේත් වෙයි, කැපත් වෙයි, පිළිගන්නා ලද්දේත් වෙයි, පවරා අයිරිත් කරණ ලදුයේ ද වේ.

ලෝකයා විසින් පිණැයි සම්මත නො පින් වූ දන් පසෙක : මද්‍යදන යැ නෘත්‍යදන යැ ස්ත්‍රීදන යැ වෘෂභදන යැ (අසභ්‍ය) චිත්‍රකර්මදන යි.

දුරලීමට දුෂ්කර වූ උපන් කරුණු පසෙක : උපන් රාගය දුරලීමට දුෂ්කර යැ, උපන් ද්වේෂය දුරලීමට දුෂ්කර යැ, උපන් මොහය දුරලීමට දුෂ්කර යැ, උපන් ප්‍රතිභානය දුරලීමට දුෂ්කර යැ, උපන් ගමිකචිත්තය දුරලීමට දුෂ්කර යි.

හැමදීම පිළිබඳ අනුසස් පසෙක : සිය සිත පහදියි, මෙරමා සිත පහදියි, දෙවියෝ සතුටු සිත් ඇත්තාහු වෙති, ප්‍රසාදය පිණිස පවත්නා කර්මයක් රැස් කෙරෙයි, කාබුන් මරණින් මතු ශොභනගති ඇති දෙව්ලොවට පැමිණේ.

හැමදීම පිළිබඳ අනෙකුදු අනුසස් පසෙක : සිය සිත පහදියි, මෙරමා සිත පහදියි, දෙවියෝ සතුටු සිත් ඇති වෙති. ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරණ ලද්දේ වෙයි. පශ්චිම ජනතාව දිට්ඨානුගතියට පැමිණේ.

12. පසඟෙකින් යුත් විනයධර බාලයෙකැයි මැ ගිණිමට යෙයි : සිය වදන් පිරියත නො ම උගණියි, මෙරමා වදන් පිරියත නො ම උගණියි, සිය වදන් පිරියත නො ඉගෙණ මෙරමා වදන් පිරියත නො ඉගෙණ අධර්මයෙන් අප්‍රතිඥයෙන් කරවයි.

පසඟෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැයි මැ ගිණිමට යෙයි : සිය වදන් පිරියත උගණියි, මෙරමා වදන් පිරියත උගණියි, සියවදන් පිරියත ඉගෙණ මෙරමා වදන් පිරියත ඉගෙණ ධර්මයෙන් ප්‍රතිඥයෙන් කරවයි.

අනෙකුදු පසඟෙකින් යුත් විනයධර බාලයෙකැයි මැ ගිණිමට යෙයි : ආපත්තිය නො දනියි, ආපත්තිමූලය නො දනියි, ආපත්තිසමුදය නො දනියි, ආපත්තිනිරොධය නො දනියි, ආපත්තිනිරොධ ගාමිනී ප්‍රතිපත් නො දනී.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තිං ජානාති, ආපත්තියා මූලං ජානාති, ආපත්තිසමුදයං ජානාති, ආපත්තිනිරොධං ජානාති, ආපත්තිනිරොධගාමිනිං පටිපදං ජානාති.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: අධිකරණං න ජානාති, අධිකරණස්ස මූලං න ජානාති, අධිකරණසමුදයං න ජානාති, අධිකරණනිරොධං න ජානාති, අධිකරණනිරොධගාමිනිං පටිපදං න ජානාති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: අධිකරණං ජානාති, අධිකරණස්ස මූලං ජානාති, අධිකරණසමුදයං ජානාති, අධිකරණනිරොධං ජානාති, අධිකරණනිරොධගාමිනිං පටිපදං ජානාති.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, අනුපඤ්ඤත්තිං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, අනුපඤ්ඤත්තිං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ඤත්තිං න ජානාති, ඤත්තියා කරණං න ජානාති, න පුබ්බකුසලො හොති, න අපරකුසලො හොති, අකාලඤ්ඤූ ච හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ඤත්තිං ජානාති, ඤත්තියා කරණං ජානාති, පුබ්බකුසලො හොති, අපරකුසලො හොති, කාලඤ්ඤූ ච හොති.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, ආචරියපරම්පරා ඛො පනස්ස න සුග්ගහිතා හොති න සුමනසිකතා න සූපධාරිතා.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, ආචරියපරම්පරා ඛො පනස්ස සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතා.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි න විත්ථාරෙන ස්වාගතානි හොන්ති න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො.

පසහෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : ආපත්තිය දනියි ආපත්තිමූලය දනියි, ආපත්තිසමුදය දනියි, ආපත්තිනිරොධය දනියි, ආපත්තිනිරොධ-ගාමිනී ප්‍රතිපත් දනී.

අනෙකුදු පසහෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි : අධිකරණය නො දනියි, අධිකරණමූලය නො දනියි, අධිකරණ සමුදය නො දනියි, අධිකරණනිරොධය නො දනියි, අධිකරණ නිරොධගාමිනී ප්‍රතිපත් නො දනී.

පසහෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : අධිකරණය දනියි, අධිකරණමූලය දනියි, අධිකරණසමුදය දනියි, අධිකරණනිරොධය දනියි, අධිකරණ නිරොධගාමිනී ප්‍රතිපත් දනී.

අනෙකුදු පසහෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි : වස්තුව නො දනියි, නිදානය නො දනියි, ප්‍රඥප්තිය නො දනියි, අනුප්‍රඥප්තිය නො දනියි, අනුසන්ධි-කථාමාර්ගය නො දනී.

පසහෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : වස්තුව දනියි, නිදානය දනියි, ප්‍රඥප්තිය දනියි, අනුප්‍රඥප්තිය දනියි, අනුසන්ධිකථාමාර්ගය දනී.

අනෙකුදු පසහෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි : ඥත්තිය නො දනියි, ඥත්තිකරණය නො දනියි, පළමු කියයුත්තෙහි දක්ෂ නො වෙයි, පසුව කියයුත්තෙහි දක්ෂ නො වෙයි, කල් නො දන්නේත් වේ.

පසහෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : ඥත්තිය දනියි, ඥත්තිකරණය දනියි, පළමු කියයුත්තෙහි දක්ෂ වෙයි, පසුව කියයුත්තෙහි දක්ෂ වෙයි කල් දන්නේත් වේ.

අනෙකුදු පසහෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි : ආපත්තිය ද අනාපත්තිය ද නො දනියි, ලහුකාපත්තිය ද ගරුකාපත්තිය ද නො දනියි, සාවසෙසා පත්තිය ද අනවසෙසාපත්තිය ද නො දනියි, දුට්ඨුල්ලාපත්තිය ද අදුට්ඨුල්ලාපත්තිය ද නො දනියි, ඔහු විසින් ආචාර්ය පරම්පරාව මැනැවින් නො උගන්නා ලද වෙයි මැනැවින් මෙනෙහි නො කරණ ලද වෙයි මැනැවින් නො දරාගන්නා ලද වේ.

පසහෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : ආපත්තිය ද අනාපත්තිය ද දනියි ලහුකාපත්තිය ද ගරුකාපත්තිය ද දනියි සාවසෙසාපත්තිය ද අනව-සෙසාපත්තිය ද දනියි දුට්ඨුල්ලාපත්තිය ද අදුට්ඨුල්ලාපත්තිය ද දනියි ඔහු විසින් ආචාර්ය පරම්පරාව මැනැවින් උගන්නා ලද වෙයි මැනැවින් මෙනෙහි කරණ ලද වෙයි මැනැවින් දරාගන්නා ලද වේ.

අනෙකුදු පසහෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි : ආපත්ති අනාපත්ති නො දනියි, ලහුකාපත්ති ගරුකාපත්ති නො දනියි, සාවසෙසාපත්ති අනවසෙසා පත්ති නො දනියි, දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති නො දනියි, ඔහු විසින් උභය ප්‍රාති-මොක්ෂය විස්තර වශයෙන් මැනැවින් ප්‍රගුණ නො කරණ ලද වෙයි. මැනවින් නො බෙදනලද වෙයි, මැනැවින් (දූරීම්වශයෙන්) නො පවත්වන ලද වෙයි, පෙළ වශයෙන් ද අර්ථකථා වශයෙන් ද මැනැවින් විනිශ්චය නො කරණ ලද වේ.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, අධිකරණෙ ච න විනිච්ඡයකුසලො හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, අධිකරණෙ ච විනිච්ඡයකුසලො හොති.

13. පඤ්ච ආරඤ්ඤකා[1]: මන්දත්තා මොමූහත්තා ආරඤ්ඤකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොති, උම්මාද චිත්තක්ඛෙපා ආරඤ්ඤකො හොති, වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති ආරඤ්ඤකො හොති, අපි ච අප්පිච්ඡඤ්ඤෙව නිස්සාය සන්තුට්ඨිඤ්ඤෙව නිස්සාය සල්ලෙඛඤ්ඤෙව නිස්සාය පවිවෙකඤ්ඤෙව නිස්සාය ඉදමත්ථිතඤ්ඤෙව[2] නිස්සාය ආරඤ්ඤකො හොති.

පඤ්ච පිණ්ඩපාතිකා -පෙ- පඤ්ච පංසුකූලිකා -පෙ- පඤ්ච රුක්ඛමූලිකා -පෙ- පඤ්ච සොසානිකා -පෙ- පඤ්ච අබ්භොකාසිකා -පෙ- පඤ්ච තෙචීවරිකා -පෙ- පඤ්ච සපදානචාරිකා -පෙ- පඤ්ච නෙසජ්ජිකා -පෙ- පඤ්ච යථාසන්ථතිකා -පෙ- පඤ්ච එකාසනිකා -පෙ- පඤ්ච ඛලුපච්ඡාභත්තිකා -පෙ- පඤ්ච පත්තපිණ්ඩිකා: මන්දත්තා මොමූහත්තා පත්තපිණ්ඩිකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො පත්තපිණ්ඩිකො හොති, උම්මාද චිත්තක්ඛෙපා පත්තපිණ්ඩිකො හොති, වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති පත්තපිණ්ඩිකො හොති, අපි ච අප්පිච්ඡඤ්ඤෙව නිස්සාය සන්තුට්ඨිඤ්ඤෙව නිස්සාය සල්ලෙඛඤ්ඤෙව නිස්සාය පවිවෙකඤ්ඤෙව නිස්සාය ඉදමත්ථිතඤ්ඤෙව නිස්සාය පත්තපිණ්ඩිකො හොති.

14. පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානිස්සිතෙන වත්ථබ්බං: උපොසථං න ජානාති, උපොසථකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සො හොති,

පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: උපොසථං ජානාති, උපොසථකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා.

---

1. ආරඤ්ඤිකා—සීමු.[1]
2. ඉදමට්ඨිතඤ්ඤෙව—සීමු[1]

පසයෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි : ආපත්ති අනාපත්ති දනියි, ලහුකාපත්ති ගරුකාපත්ති දනියි, සාවසෙසාපත්ති අනවසෙසාපත්ති දනියි, දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති දනී, ඔහු විසින් උභය ප්‍රාතිමොක්ෂය විස්තර වශයෙන් මැනැවින් ප්‍රගුණ කරණලද වෙයි මැනැවින් බෙදන ලද වෙයි මැනැවින් (දැරීම් වශයෙන්) පවත්වන ලද වෙයි පෙළ වශයෙන් ද අර්ථකථා වශයෙන් ද මැනැවින් විනිශ්චය කරණ ලද වේ.

අනෙකුදු පසයෙකින් යුත් විනයධර බාලයෙකැ යි මැ ගිණීමට යෙයි ; ආපත්ති අනාපත්ති නො දනියි, ලහුකාපත්ති ගරුකාපත්ති නො දනියි, සාවසෙසාපත්ති අනවසෙසාපත්ති නො දනියි, දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති නො දනියි, අධිකරණයෙහි විනිශ්චය කුශල වූයේ ද නො වේ.

පසයෙකින් යුත් විනයධර පණ්ඩිතයෙකැ යි මැ ගිණීමට යෙයි, ආපත්ති අනාපත්ති දනියි, ලහුකාපත්ති ගරුකාපත්ති දනියි, සාවසෙසාපත්ති අනවසෙසාපත්ති දනියි, දුට්ඨුල්ලාපත්ති අදුට්ඨුල්ලාපත්ති දනියි, අධිකරණයෙහි විනිශ්චය කුශල වූයේ ද වේ.

13. ආරණ්‍යකයෝ පස් දෙනෙක : නුවණ මඳ බැවින් මුළා බැවින් ආරණ්‍යක වෙයි, ලාමක අදහස් ඇතියේ ලාමක අදහසින් මඩනා ලදුයේ ආරණ්‍යක වෙයි, උමතු වෙන් චිත්ත වික්ෂෙපයෙන් ආරණ්‍යක වෙයි, බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් වර්ණිත යැයි ආරණ්‍යක වෙයි. තව ද අපිස් බව මැ නිසා සතොස් බව මැ නිසා කෙලෙස් ලියනු මැ නිසා විවෙකය මැ නිසා මෙයින් අර්ථයක් ඇති බව මැ නිසා ආරණ්‍යක වේ.

පිණ්ඩපාතිකයෝ පස් දෙනෙක .... පංසුකූලිකයෝ පස් දෙනෙක .... රුක්ඛමූලිකයෝ පස් දෙනෙක .... සොසානිකයෝ පස් දෙනෙක .... අබ්භොකාසිකයෝ පස් දෙනෙක .... තෙචීවරිකයෝ පස් දෙනෙක .... සපදානචාරිකයෝ පස් දෙනෙක .... නෙසජ්ජිකයෝ පස් දෙනෙක .... යථාසන්ථතිකයෝ පස් දෙනෙක .... ඵකාසනිකයෝ පස් දෙනෙක .... ඛලුපච්ඡාභත්තිකයෝ පස් දෙනෙක .... පත්තපිණ්ඩිකයෝ පස් දෙනෙක : නුවණ මඳ බැවින් මුළා බැවින් පත්තපිණ්ඩික වෙයි, ලාමක අදහස් ඇතියේ ලාමක අදහසින් මඩනාලදුයේ පත්තපිණ්ඩික වෙයි, උමතුවෙන් චිත්ත වික්ෂෙපයෙන් පත්තපිණ්ඩික වෙයි, බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් වර්ණිත යැයි පත්තපිණ්ඩික වෙයි. තව ද අපිස්බව මැ නිසා සතොස්බව මැ නිසා කෙලෙස් ලියනු මැ නිසා විවෙකය මැ නිසා මෙයින් අර්ථයක් ඇති බව මැ නිසා පත්තපිණ්ඩික වේ.

14. පසයෙකින් යුත් මහණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : පොහොය නො දනියි, පොහෝකම් නො දනියි, පාමොක් නො දනියි, පාමොක් උදෙසුම් නො දනියි, ඌනපස්වස් ඇත්තේ වේ.

පසයෙකින් යුත් මහණ අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය : පොහොය දනියි, පොහෝකම් දනියි, පාමොක් දනියි, පාමොක් උදෙසුම් දනියි, පස්වස් ඇත්තේ හෝ අයිරා පස්වස් ඇති හෝ වේ.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානිස්සිතෙන වත්ථබ්බං: පවාරණං න ජානාති, පවාරණකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සො හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: පවාරණං ජානාති, පවාරණකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානිස්සිතෙන වත්ථබ්බං: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, ඌනපඤ්චවස්සො හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනිස්සිතෙන වත්ථබ්බං: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා.

15. පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා නානිස්සිතාය වත්ථබ්බං: උපොසථං න ජානාති, උපොසථකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සා හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා අනිස්සිතාය වත්ථබ්බං; උපොසථං ජානාති, උපොසථකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති, පඤ්චවස්සා වා හොති අතිරෙකපඤ්චවස්සා වා.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා නානිස්සිතාය වත්ථබ්බං: පවාරණං න ජානාති, පවාරණකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සා හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා අනිස්සිතාය වත්ථබ්බං: පවාරණං ජානාති, පවාරණකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති, පඤ්චවස්සා වා හොති අතිරෙකපඤ්චවස්සා වා.

අපරෙහිපි පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා නානිස්සිතාය වත්ථබ්බං: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, ඌනපඤ්චවස්සා හොති.

පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා අනිස්සිතාය වත්ථබ්බං: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, පඤ්චවස්සා වා හොති, අතිරෙකපඤ්චවස්සා වා.

අනෙකුදු පසහෙකින් යුත් මහණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : පවාරණය නො දනියි, පවාරණ කර්මය නො දනියි, පාමොක් නො දනියි, පාමොක් උදෙසුම් නො දනියි, උනුපස්වස් ඇති වේ.

පසහෙකින් යුත් මහණ අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය : පවාරණය දනියි, පවාරණකර්මය දනියි, පාමොක් දනියි, පාමොක් උදෙසුම් දනියි, පස්වස් ඇත්තේ හෝ අයිරාපස්වස් ඇත්තේ හෝ වේ.

අනෙකුදු පසහෙකින් යුත් මහණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහු ගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත් නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත් නො දනියි, උනුපස්වස් ඇති වේ.

පසහෙකින් යුත් මහණහු අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය : ඇවැත් නො ඇවැත් දනියි, ලුහු ගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ඇවැත් දනියි, තුළුල් නො තුළුල් ඇවැත් දනියි, පස්වස් ඇත්තේ හෝ අයිරා පස්වස් ඇත්තේ හෝ වේ.

15. පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : පොහොය නො දනියි, පොහෝකම් නො දනියි, පාමොක් නො දනියි, පාමොක් උදෙසුම් නො දනියි, උනුපස් වස් ඇති වේ.

පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය : පොහොය දනියි, පොහෝකම් දනියි, පාමොක් දනියි, පාමොක් උදෙසුම් දනියි, පස්වස් ඇත්තී හෝ අයිරා පස්වස් ඇත්තී හෝ වේ.

අනෙකුදු පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : පවාරණය නො දනියි, පවාරණකර්මය නො දනියි, පාමොක් නො දනියි, පාමොක් උදෙසුම් නො දනියි, උනුපස්වස් ඇත්තී වේ.

පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය. පවාරණය දනියි, පවාරණ කර්මය දනියි, පාමොක් දනියි, පාමොක් උදෙසුම් දනියි, පස්වස් ඇත්තී හෝ අයිරා පස්වස් ඇත්තී හෝ වේ.

අනෙකුදු පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ නො විසිය යුතු ය : ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහු ගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත් නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත් නො දනියි, උනුපස්වස් ඇත්තී වේ.

පසහෙකින් යුත් මෙහෙණ අනිශ්ශ්‍රිත වැ විසිය යුතු ය : ඇවැත් නො ඇවැත් දනියි, ලුහු ගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ඇවැත් දනියි, තුළුල් නො තුළුල් ඇවැත් දනියි, පස්වස් ඇත්තී හෝ අයිරා පස්වස් ඇත්තී හෝ වේ.

16. පඤ්ච ආදීනවා අපාසාදිකෙ: අත්තාපි අත්තානං උපවදති, අනුවිච්ච[1] විඤ්ඤූ ගරහන්ති, පාපකො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, සම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

පඤ්චානිසංසා පාසාදිකෙ: අත්තාපි අත්තානං න උපවදති, අනුවිච්ච විඤ්ඤූ පසංසන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.

අපරෙපි පඤ්ච ආදීනවා අපාසාදිකෙ: අප්පසන්නා නප්පසීදන්ති, පසන්නානං එකච්චානං අඤ්ඤථත්තං හොති, සත්ථුසාසනං අකතං හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං නාපජ්ජති, චිත්තමස්ස නප්පසීදති.

පඤ්චානිසංසා පාසාදිකෙ: අප්පසන්නා පසීදන්ති, පසන්නානං භිය්‍යොභාවාය හොති, සත්ථුසාසනං කතං හොති, පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති, චිත්තමස්ස පසීදති.

17 පඤ්ච ආදීනවා කුලූපගෙ[3]: අනාමන්තචාරෙ[2] ආපජ්ජති, රහො නිසජ්ජාය ආපජ්ජති, පටිච්ඡන්නෙ ආසනෙ ආපජ්ජති, මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙන්තො ආපජ්ජති, කාමසඞ්කප්පබහුලො ච විහරති

පඤ්ච ආදීනවා කුලූපගස්ස[4] භික්ඛුනො අතිවෙලං කුලෙසු සංසට්ඨස්ස විහරතො: මාතුගාමස්ස අභිණ්හදස්සනං, දස්සනෙ සති සංසග්ගො, සංසග්ගෙ සති විස්සාසො, විස්සාසෙ සති ඔතාරො, ඔතිණ්ණචිත්තස්සෙතං භික්ඛුනො පාටිකඞ්ඛං: අනභිරතො වා බ්‍රහ්මචරියං චරිස්සති, අඤ්ඤතරං වා සඞ්කිලිට්ඨං ආපත්තිං ආපජ්ජිස්සති, සික්ඛං වා පච්චක්ඛාය හීනායාවත්තිස්සතීති.

18. පඤ්ච බීජානි: මූලබීජං, ඛන්ධබීජං, ඵළුබීජං, අග්ගබීජං, බීජබීජඤ්ඤෙව පඤ්චමං.

පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතබ්බං: අග්ගිපරිචිතං, සත්ථපරිචිතං, නඛපරිචිතං, අබීජං, නිබ්බට්ටබීජඤ්ඤෙව[5] පඤ්චමං.

19. පඤ්ච විසුද්ධියො: නිදානං උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං අයං පඨමා විසුද්ධි, නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං අයං දුතියා විසුද්ධි, නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං අයං තතියා විසුද්ධි, නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා ද්වෙ අනියතෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං අයං චතුත්ථා විසුද්ධි, විත්ථාරෙනෙව පඤ්චමී.

---

1. අනුවිච්චපි—මජ්ඣං
2. අනාමන්තචාරෙ—මජ්ඣං
3. කුලූපකෙ - සීමු.
4. කුලූපකස්ස - සීමු.
5. නිබ්බත්ත බීජඤ්ඤෙව—මජ්ඣං.
නිබ්බට බීජඤ්ඤෙව—ස්‍යා.

Free Distribution www.aathaapi.org

16. අකුශල කර්ම ඇත්තහු කෙරෙහි ආදීනව පසෙක : තෙමේත් තමහට දෙෂාරොපණය කෙරෙයි, නුවණැත්තෝ (කරුණු) විමසා දැන ගරහති, ලාමක වූ කීර්ති ඝොෂය උස් වැ පැන නඟියි, මුළා වැ කලුරිය කෙරෙයි, කාබුන් මරණින් මතු සැපයෙන් පහ වූ නපුරු ගති ඇති විවස වැ පතිත වන නිරයට පැමිණේ.

කුශලකර්ම ඇත්තහු කෙරෙහි අනුසස් පසෙක : තෙමේත් තමහට දෙෂාරොපණය නො කෙරෙයි, නුවණැත්තෝ කරුණු විමසා දැන පසසති, යහපත් වූ කීර්තිඝොෂය උස් වැ පැන නඟියි, නො මුළා වැ කලුරිය කෙරෙයි, කාබුන් මරණින් මතු යහපත් ගති ඇති දෙව්ලොවට පැමිණේ.

අකුශල කර්ම ඇත්තහු කෙරෙහි අනෙකුදු ආදීනව පසෙක : නො පහන් වූවෝ නො පහදිති, පහන් වූ ඇතැමුන්ගේ වෙනස් බව වෙයි, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනාව නො කරණ ලද වෙයි, පශ්චිම ජනතාව දිට්ඨානුගතියට නො පැමිණෙයි, ඔහුගේ සිත නො පහදී.

කුශලකර්ම ඇත්තහු කෙරෙහි අනුසස් පසෙක : නො පහන් වූවෝ පහදිති, පහන් වූවන්ගේ බොහෝ බව පිණිස වෙයි, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරණ ලද වෙයි, පශ්චිම ජනතාව දිට්ඨානුගතියට පැමිණෙයි, ඔහුගේ සිත පහදී.

17. කුලූපග මහණ කෙරෙහි ආදීනව පසෙක : අනාමන්තචාරය ඇතියේ ඇවැතට පැමිණෙයි, රහොනිසජ්ජායෙන් ඇවැතට පැමිණෙයි, පිළිසන් අස්නෙකැ හිඳීමෙන් වන ඇවැතට පැමිණෙයි, මාගමකට සපස් වදනින් මත්තෙහි දහම් දෙසනුයේ ඇවැතට පැමිණෙයි, කාමවිතර්ක බහුල වැ ද වාස කෙරේ.

වේලා ඉක්මවා කුලයෙහි ගිහියන් හා හැනී වසන කුලූපග මහණ පිළිබඳ ආදීනව පසෙක ; මාගම නිතර දැක්ම යැ, දැක්ම ඇති කල්හි එක්වීම යැ, එක්වීම ඇති කල්හි විශ්වාස යැ, විශ්වාසය ඇති කල්හි රාගයට බැසීම යැ, රාගයට බැසගත් සිත් ඇති මහණහු විසින් තෙල කැමැති විය යුතුය : සසුන්හි ඇලුම් නැති වැ හෝ බඹසර කරයි, එක්තරා සකිලිට්ඨි ඇවැතකට හෝ පැමිණෙයි, ශික්ෂා හැරපියා ගිහිබවට හෝ පෙරළේ.

18. බීජ පසෙක : මූල බීජ යැ ස්කන්ධ බීජ යැ පර්ව බීජ යැ අග්‍ර බීජ යැ පස්වැනි වූ බීජ බීජ යි.

පඤ්ච ශ්‍රමණ ව්‍යවහාරයෙන් කැප කළ ඵලය පරිභොග කටයුතු ය : ගින්නෙන් කැප කරණලද යැ ආවුධයෙන් කැප කරණලද යැ නියෙන් කැප කරණලද යැ මුහුකළ බිජුවට නැතියෙ යැ පස්වැනි වූ බැහැර කළ බිජුවට ඇතියෙ යි.

19. විශුද්ධි පසෙක : නිදානය උදෙසා සෙස්ස ශ්‍රැතයෙන් ඇස්විය යුතු යි, මේ පළමුවන විශුද්ධි යැ. නිදානය උදෙසා සිවුපරිජි උදෙසා සෙස්ස ශ්‍රැතයෙන් ඇස්විය යුතු යි, මේ දෙවන විශුද්ධි යැ, නිදානය උදෙසා සිවුපරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා සෙස්ස ශ්‍රැතයෙන් ඇස්විය යුතු යි, මේ තුන්වන විශුද්ධි යැ. නිදානය උදෙසා සිවු පරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා දෙ අනියතය උදෙසා සෙස්ස ශ්‍රැතයෙන් ඇස්විය යුතු යි, මේ සිවුවන විශුද්ධි යැ. විත්ථාරුද්දෙසයෙන් මැ පස්වැනි විශුද්ධි යි.

අපරාපි පඤ්ච විසුද්ධියො: සුත්තුද්දෙසො, පාරිසුද්ධිඋපොසථො, අධිට්ඨානුපොසථො, පවාරණා, සාමග්ගිඋපොසථොයෙව පඤ්චමො.

20. පඤ්චානිසංසා විනයධරෙ: අත්තනො සීලක්ඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො, කුක්කුච්චපකතානං පටිසරණං හොති, විසාරදො සඞ්ඝමජ්ඣෙ වොහරති, පච්චත්ථිකෙ සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හාති, සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති.

21. පඤ්ච අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

පඤ්ච ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානීති.

පඤ්චකං නිට්ඨිතං

---

තස්සුද්දානං:

1. ආපත්ති ආපත්තික්ඛන්ධා විනීතානන්තරෙන ච,
පුග්ගලච්ඡෙදනා චෙව ආපජ්ජති ච පච්චයා.

2. න උපෙති උපෙති ච කප්පන්තුසඞ්ඛිතෙලං ච,
වසං බ්‍යඤ්ජනසම්පදා පස්සද්ධි පුග්ගලෙන ච.

3. සොසානිකං බාහිතඤ්ච ථෙය්‍යං චොරෙ පවුච්චති,[1]
අවිස්සජ්ජි අවෙභඞ්ගි කායතො කායවාචතො.

4. දෙසනා සඞ්ඝඋද්දෙසා පච්චන්ති සාහීනෙන ච,
කම්මානි යාව තතියං පාරාජිකා ථුල්ලදුක්කටං.

5. අකප්පියං කප්පියඤ්ච අපුඤ්ඤඤ්ඤ දුවිනොදයා,
සම්මජ්ජනී අපරෙ ච භාසං ආපත්ති මෙව ච.

6. අධිකරණං වත්ථු ඤත්ති ආපත්තා උභයානි ච,
ලහුකට්ඨමකා එතෙ කණ්හසුක්කා විජානථ.

7. අරඤ්ඤං පිණ්ඩපාතඤ්ච පංසුරුක්ඛසුසානිකා,
අබ්භොකාසො චීවරඤ්ච සපදාන නිසජ්ජිකා[2]

8. සන්ථති ඛලුපච්ඡාපි පත්තපිණ්ඩිකමෙව ච,
උපොසථං පවාරණං ආපත්තානාපත්තිපි ච,
කණ්හසුක්කපදා එතෙ භික්ඛුනීනම්පි තෙ තථා.

9. අපාසාදිකපාසාදි තථෙව අපරෙ දුවෙ,
කුලූපකෙ අතිවෙලං බීජං සමණකප්පා ච.

10. විසුද්ධි අපරෙ චෙව විනයා ධම්මිකෙන ච,
ධම්මිකා ච තථා වුත්තා නිට්ඨිතා සුද්ධිපඤ්චකාති.

---

1. වුච්චති - ම ඡ සං.
2. සපදානො නිසජ්ජිකො - මඡසං

අනෙකුදු විශුද්ධි පසෙක : සුත්තුද්දෙසඋපොසථ යැ පාරිසුද්ධිඋපොසථ යැ අධිට්ඨානුපොසථ යැ පවාරණ යැ සාමග්ගිඋපොසථය මැ පස්වැනි යි.

20. විනයධරයා කෙරෙහි වූ අනුසස් පසෙක : තමාගේ ශීලස්කන්ධය මොනොවට ගොපනය කරණ ලද්දේ මොනොවට රක්නා ලද්දේ වෙයි, කුකුස් බැවින් මඩනා ලද්දවුනට පිළිසරණ වෙයි, සඟමැද විශාරද වැ කථා කෙරෙයි, කරුණු සහිත ව මොනවට නිගැන්මෙන් පසමිතුරනට නිග්‍රහ කෙරෙයි, ශාසනයාගේ චිරස්ථිතිය පිණිස පිළිපන්නේ වේ.

21. නො දැහැමි පාමොක් තැබීම් පසෙකි.

දැහැමි පාමොක් තැබීම් පසෙකි.

පඤ්චකය නිමි.

---

එහි නාමාවලිය :

1. ආපත්ති යැ, ආපත්තිස්කන්ධ යැ, ආනන්තර්යකර්ම සමග විනීතවස්තු යැ, පුද්ගල යැ, ඡෙදන යැ, ආපජ්ජති යැ, ප්‍රත්‍යය යැ,

2. න උපෙති යැ, උපෙති යැ, කප්පන්ති යැ, උස්සඞ්කිත යැ, තෙල යැ, වසා යැ, ව්‍යසන යැ, සම්පද ව සමග පස්සද්ධි යැ,

3. සොසානික යැ, ගොචායිත යැ, ථෙය්‍යාවහාර යැ, මහාචොර යැ යි පඤ්චක කියනු ලැබේ. අවිස්සජ්ජනීය යැ අවෙභඞ්ගිය යැ කායතො යැ කායවාචතො යැ,

4. දෙසනාගාමිනී යැ, සඞ්ඝ යැ, පාතිමොක්ඛුද්දෙස යැ, කඨිනත්ථාරය සමග සබ්බපච්චන්තිම යැ, කම්ම යැ, යාවතතියක යැ, පාරාජික යැ ථුල්ලච්චය යැ, දුක්කට යැ,

5. අකප්පිය යැ, කප්පිය යැ, අපුඤ්ඤ යැ, දුප්පටිවිනොද යැ, සමමජ්ජනී යැ, අන්‍ය වූ සම්මජ්ජනී යැ, භාසපරියන්ත යැ, ආපත්ති යැ,

6. අධිකරණ යැ, වස්තු යැ, ඤත්ති යැ, ආපත්තානාපත්ති දෙක යැ, ලහුකය අට වැනි කොට ඇති මොහු කෘෂ්ණ ශුක්ලයහ යි දනිවු.

7. ආරඤ්ඤක යැ, පිණ්ඩපාතික යැ, පංසුකූලික ය, රුක්ඛමූලික යැ, සොසානික යැ, අබ්භොකාසික යැ, තෙචීවරික යැ,සපදනචාරික යැ, නෙසජ්ජික යැ

8. යථාසන්ථතික යැ, ඛලුපච්ඡාභත්තික යැ, පත්තපිණ්ඩික යැ,උපොසථ යැ, පවාරණ යැ, ආපත්තානාපත්ති යැ, මොහු කෘෂ්ණ ශුක්ලපදයෝ වෙති. ඔහු භික්ෂුණීන් පිළිබඳ ව ද එසේ යි.

9. අපාසාදික යැ පාසාදික යැ එසේම අපර දෙක යැ, කුලූපග යැ, අතිවෙල යැ බීජ යැ, සමණකප්ප යැ,

10. විසුද්ධි යැ, අපරවිසුද්ධි යැ, විනයධර යැ, අධම්මික යැ, සමග ධම්මික යැ යි එසේම කියනලදහ. (මෙසේ) ශුද්ධි පඤ්චකයෝ නිමියහ.

## ඡක්කං

1. ඡ අගාරවා, ඡ ගාරවා, ඡ විනීතවත්ථූනි, ඡ සාමීචියො, ඡ ආපත්තිසමුට්ඨානා, ඡ ඡෙදනකා ආපත්තියො, ඡහාකාරෙහි ආපත්තිං ආපජ්ජති, ඡ ආනිසංසා විනයධරෙ, ඡ පරමානි, ඡාරත්තං තිචීවරෙන විප්පවසිතබ්බං, ඡ චීවරානි, ඡ රජනානි, ඡ ආපත්තියො කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො, ඡ ආපත්තියො වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න කායතො, ඡ ආපත්තියො කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, ඡ කම්මානි, ඡ විවාදමූලානි, ඡ අනුවාදමූලානි, ඡ සාරාණීයධම්මා, දීඝසො ඡ විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡ විදත්ථියො, ඡ නිස්සයපටිප්පස්සද්ධියො ආචරියම්හා, ඡ නහානෙ අනුපඤ්ඤත්තියො, විප්පකතචීවරං ආදාය පක්කමති. විප්පකතචීවරං සමාදාය පක්කමති

2. ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: අත්තනා අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති පරං අසෙක්ඛෙ සීලක්ඛන්ධෙ සමාදපෙතා, අත්තනා අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති පරං අසෙක්ඛෙ සමාධික්ඛන්ධෙ සමාදපෙතා, අත්තනා අසෙක්ඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති පරං අසෙක්ඛෙ පඤ්ඤාක්ඛන්ධෙ සමාදපෙතා, අත්තනා අසෙක්ඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති පරං අසෙක්ඛෙ විමුත්තික්ඛන්ධෙ සමාදපෙතා, අත්තනා අසෙක්ඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති පරං අසෙක්ඛෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ සමාදපෙතා, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතස්සති හොති, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: න අධිසීලෙ සීලවිපන්නො හොති, න අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, න අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, බහුස්සුතො හොති, පඤ්ඤවා හොති, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා

## ෂට්කය

1. අගාරව සයෙකැ, ගාරව සයෙකැ, විනීතවස්තු සයෙකැ, සාමීචිධර්ම සයෙකැ, ආපත්තිසමුට්ඨාන සයෙකැ, ඡේදනක ආපත්ති සයෙකැ, ෂඩාකාරයෙකින් ඇවැතට පැමිණෙයි, විනයධරයා කෙරෙහි අනුසස් සයෙකැ, පරම සයෙකැ, තුන් සිවුරෙන් වෙන් වැ විසිය යුතු ස රයෙකැ, සිවුරු සයෙකැ, රජන සයෙකැ, ඇවැත්හු සදෙනෙක් කයින් ද සිතින් ද නගිති වචනයෙන් නො නගිත්, ඇවැත්හු සදෙනෙක් වචනයෙන් ද සිතින් ද නගිති කයින් නො නගිත්, ඇවැත්හු සදෙනෙක් කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්, කර්ම සයෙකැ, විවාදමූල සයෙකැ, අනුවාදමූල සයෙකැ, සාරාණීය ධර්ම සයෙකැ, දිගින් සුගත්-වියතින් සවියතෙකැ පුළුලින් සවියතෙකැ, ආචාරීන් කෙරෙන් නිසම්දීම් සයෙකැ. නැහැ-මෙහි අනුප්‍රඥප්ති සයෙකැ. විප්පකතචීවරය ආදනය කොට නික්මෙයි යන ෂට්කයෙකැ. විප්පකතචීවරය සමාදනය කොට නික්මෙයි යන ෂට්කයෙකි.

2. අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළයුතු යැ, නිස දිය යුතු යැ, හෙරණකු ලවා උවටැන් කරවිය යුතුයි : අශෛක්ෂ ශීලස්කන්ධයෙන් යුක්ත වෙයි, අශෛක්ෂසමාධිස්කන්ධයෙන් යුක්ත වෙයි, අශෛක්ෂප්‍රඥස්කන්ධයෙන් යුක්ත වෙයි, අශෛක්ෂවිමුක්තිස්කන්ධයෙන් යුක්ත වෙයි, අශෛක්ෂවිමුක්තිඥනදර්ශනස්කන්ධයෙත් යුක්ත වෙයි, දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළ යුතු ය. නිස දිය-යුතු ය. හෙරණකු ලවා උවැටන් කරවිය යුතු ය : තෙමේ අශෛක්ෂශීලස්කන්ධයෙන් යුක්ත වූයේ මෙරමා අශෛක්ෂශීලස්කන්ධයෙහි සමාදන් කරවනුයේ වෙයි. තෙමේ අශෛක්ෂසමාධිස්කන්ධයෙන් යුක්ත වූයේ මෙරමා අශෛක්ෂසමාධිස්කන්ධයෙහි සමාදන් කරවනුයේ වෙයි. තෙමේ අශෛක්ෂප්‍රඥස්කන්ධයෙන් යුක්ත වූයේ මෙරමා අශෛක්ෂප්‍රඥස්කන්ධයෙහි සමාදන් කරවනුයේ වෙයි. තෙමේ අශෛක්ෂවිමුක්ති-ස්කන්ධයෙන් යුක්ත වූයේ මෙරමා අශෛක්ෂවිමුක්තිස්කන්ධයෙහි සමාදන් කරවනුයේ වෙයි. තෙමේ අශෛක්ෂවිමුක්තිඥනදර්ශනස්කන්ධයෙන් යුක්ත වූයේ මෙරමා අශෛක්ෂවිමුක්තිඥනදර්ශනස්කන්ධයෙහි සමාදන් කරවනුයේ වෙයි. දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්මකළ යුතු යැ. නිස දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි : සැදැහැ ඇතියේ වෙයි, පාපයෙහි ලජ්ජා ඇතියේ වෙයි. පාපයෙහි බිය ඇතියේ වෙයි. රුකුළු වැර ඇතියේ වෙයි. එළඹ සිටි සිහි ඇතියේ වෙයි. දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළ යුතු යැ නිස දිය යුතු යැ හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි : අධිශීලයෙහි ශීලවිපන්න නො වෙයි. අද්ධ්‍යාචාරයෙහි ආචාරවිපන්න නො වෙයි. සම්‍යක් දෘෂ්ටියෙහි දෘෂ්ටි-විපන්න නො වෙයි. බහුශ්‍රැත වෙයි. ප්‍රඥ ඇතියේ වෙයි. දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, අනභිරතං[1] වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනොදෙතුං[2], ආපත්තිං ජානාති, ආපත්තිවුට්ඨානං ජානාති, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

අපරෙහිපි ඡහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො දසවස්සො වා හොති අතිරෙකදසවස්සො වා.

3. ඡ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි.

ඡ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානීති.

ඡක්කං නිට්ඨිතං.

---

තස්සුද්දානං:

1. අගාරවා ගාරවා ච විනීතා සාමීචිපි ච,
සමුට්ඨානා ඡෙදනා චෙව ආකාරානිසංසෙන ච.

2. පරමානි ඡ ඡාරත්තං චීවරං රජනානි ච,
කායතො චිත්තතො වාපි වාචතො චිත්තතොපි ච.

3. කායවාචා චිත්තතො ච කම්මවිවාදමෙව ච;
අනුවාද දීඝසො ච තිරියං නිස්සයෙන ච

4. අනුපඤ්ඤත්ති ආදාය සමාදාය තථෙව ච,
අසෙක්ඛ සමාදපෙතා සද්ධො අධිසීලෙන ච,
ගිලානාභිසමාචාරී ආපත්තාධම්මධම්මිකාති.

---

1. අනභිරතිං - සිමු.
2. විනොදෙතුං වා විනොදාපෙතුං වා - ස්‍යා.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළයුතු යැ නිස දියයුතු යැ හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි : ගිලන් වූ අතැවැසියකුට සද්ධිවිහාරිකයකුට උවැටන් කරන්නට හෝ උවැටන් කරවන්නට හෝ ප්‍රතිබල වෙයි, උකටලී වූවකු එයින් මුදවාලන්නට හෝ මුදවාලවන්නට හෝ ප්‍රතිබල වෙයි. උපන් කුකුස් දැහැමින් දුරලන්නට හෝ ප්‍රතිබල වෙයි. ඇවැත දනියි, ඇවැතින් නැගීම දනියි, දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළ යුතු යැ නිස දිය යුතු යැ හෙරණකු ලවා උවැටන් කරවිය යුතුයි : අතැවැසියකු හෝ සද්ධිවිහාරිකයකු හෝ ආභිසමාචාරික ශික්ෂායෙහි හික්මවන්නට ප්‍රතිබල වෙයි, ආදිබ්‍රහ්මචරියක ශික්ෂායෙහි විනයන කරන්නට ප්‍රතිබල වෙයි, අභිධර්මයෙහි විනයන කරන්නට ප්‍රතිබල වෙයි, අභිවිනයෙහි විනයන කරන්නට ප්‍රතිබල වෙයි, උපන් මිථ්‍යා දෘෂ්ටිය දැහැමින් බැහැර කරන්නට ප්‍රතිබල වෙයි, දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

අනෙකුදු අඞ්ග සයෙකින් යුත් මහණ විසින් උපසම්පද කර්ම කළ යුතු යැ නිස දිය යුතු යැ හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි : ඇවැත් දනියි, නො ඇවැත් දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, සූත්‍ර වශයෙනුදු අනුව්‍යඤ්ජන වශයෙනුදු උභය ප්‍රාතිමොක්ෂ විස්තර වශයෙන් මොනොවට පුහුණු කරණ ලදුයේ මොනොවට විභාග කොට ගන්නා ලදුයේ මොනොවට දැරීම් විසින් පවත්වා ගන්නා ලදුයේ මොනොවට විනිශ්වය කොට දැන ගන්නා ලදුයේ වෙයි. දසවස් ඇතියේ හෝ අයිරා දසවස් ඇතියේ හෝ වේ.

3. නො දැහැමි පාමොක් තැබීම් සයෙකි.

දැහැමි පාමොක් තැබීම් සයෙකි.

ෂට්කය නිමි.

---

එහි නාමාවලිය :

1. අගාරව යැ, ගාරව යැ, විනීතවස්තු යැ, සාමීචි යැ, සමුට්ඨාන යැ, ඡේදන යැ, ආනිසංසය සමග ආකාර යැ.

2. පරම සය යැ, ඡාරත්ත යැ, චීවර යැ, රජන යැ, කායතො චිත්තතො යැ, වාචතො චිත්තතො යැ.

3. කායවාචාචිත්තතො යැ, කම්ම යැ, විවාදමූල යැ, අනුවාදමූල යැ, දීඝසො යැ, නිස්සය පටිප්පස්සද්ධි සමග තිරියං යැ.

4. නහානෙ අනුපඤ්ඤත්ති යැ, එසේම ආදාය සමාදාය දෙක යැ, අසෙක්ඛ යැ, සමාදපෙතු යැ, අධිශීලය සමග සද්ධ යැ, ගිලාන යැ, ආභිසමාචාරික යැ, ආපත්ති යැ, අධම්මික යැ, ධම්මික යැ යි ෂට්කයෝ වෙත්,

## සත්තකං

1. සත්ත ආපත්තියො, සත්ත ආපත්තික්ඛන්ධා, සත්ත විනීතවත්ථූනි, සත්ත සාමීචියො, සත්ත අධම්මිකා පටිඤ්ඤාතකරණා, සත්ත ධම්මිකා පටිඤ්ඤාතකරණා, සත්තන්නං අනාපත්ති[1] සත්තාහකරණීයෙන ගන්තුං, සත්තානිසංසා විනයධරෙ, සත්ත පරමානි, සත්තමෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති, සත්ත සමථා, සත්ත කම්මානි, සත්ත ආමකධඤ්ඤානි, තිරියං සත්තන්තරා, ගණභොජනෙ සත්ත අනුපඤ්ඤත්තියො, භෙසජ්ජානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි, කතචීවරං ආදාය පක්කමති, කතචීවරං සමාදාය පක්කමති, භික්ඛුස්ස න හොති ආපත්ති දට්ඨබ්බා, භික්ඛුස්ස හොති ආපත්ති දට්ඨබ්බා, භික්ඛුස්ස හොති ආපත්ති පටිකාතබ්බා, සත්ත අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි, සත්ත ධම්මිකානි පතිමොක්ඛට්ඨපනානි.

2. සත්තහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු විනයධරො හොති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

3. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො හොති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා[2] සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[3] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

4. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු විනයධරෙ හොති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

---

1. සත්තන්නං ආපත්ති. සිමු. පොත්ථකෙසු අධිකං.
2. සාත්ථං - සිමු 2.
3. ධාතා - මජසං.

## සත්තකය

1. ආපත්ති සතෙකැ, ආපත්තිස්කන්ධ සතෙකැ, විනීතවස්තු සතෙකැ, සාමීචි සතෙකැ, නො දැහැමි පටිඤ්ඤාතකරණ සතෙකැ, දැහැමි පටිඤ්ඤාතකරණ සතෙකැ, සත් දෙනකුන් සඳහා සත්තාහකරණීයයෙන් යාමෙහි ඇවැත් නො වෙයි, විනයධරයා කෙරෙහි අනුසස් සතෙකැ, පරම සතෙකැ සත්වන අරුණ නැගීමෙහි නිසගි වෙයි. සමථ සතෙකැ, කර්ම සතෙකැ, අමූධාන්‍ය සතෙකැ, සරස ඇතුළත සත් වියතෙකැ, ගණභොජනයෙහි අනුප්‍රඥප්ති සතෙකැ, බෙහෙත් පිළිගෙන සත් දිනක් පරම කොට තබා වැළඳිය යුතුය, කළ සිවුර ගෙණ නික්මෙයි යන සතෙකැ, කළ සිවුර මොනවට ගෙණ නික්මෙයි යන සතෙකැ, මහණහට දක්කයුතු ඇවැතෙක් නො වෙයි යන සතෙකැ, මහණහට දක්කයුතු ඇවැතෙක් වෙයි යන සතෙකැ, මහණහට පිළියම් කළයුතු ඇවැතෙක් වෙයි යන සතෙකැ, නො දැහැමි පාමොක් තැබීම් සතෙකැ, දැහැමි පාමොක් තැබීම් සතෙකි.

2. අඞ්ග සතෙකින් යුක්ත මහණ විනයධර වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවෘත වැ ආචාරගොචර සම්පන්න වූයේ අනුමාත්‍ර වද්‍යයෙහි භය දක්නා සුලු වැ වාස කෙරෙයි, ශික්ෂාපදයන් සමාදන් වැ ගෙන වාස කෙරෙයි, අභිචිත්තයෙහි උපන් ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැතිසේ රිසිසේ නිදුකින් ලබන සුලු වෙයි, ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ අර්හත් ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥ වද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ යයි.

3. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත මහණ විනයධර වෙයි : ඇවැත් දනියි, නො ඇවැත් දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, බොහෝ ඇසූ තැන් ඇතියේ ඇසූ දේ දරණුයේ ඇසූ දේ රැස්කරන්නේ වෙයි, යම් ධර්ම කෙනෙක් ආදිකල්‍යාණ මජ්ඣෙකල්‍යාණ පරියොසානකල්‍යාණ වෙත් ද සාර්ත්ථ සව්‍යඤ්ජන කෙවල පරිපූර්ණ වූවාහු වෙත් ද පරිශුද්ධ වූ මාර්ගබ්‍රහ්මචර්යය ප්‍රකාශ කෙරෙත් ද, එබඳු ඒ ධර්මයෝ ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු දරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් සලකා බලන ලද්දහු දෘෂ්ටියෙන් මොනොවට පිළිවිදින ලද්දහු වෙත්. උතුම් සිත ඇසුරු කළ ඉහාත්මයෙහි සැපවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැති සේ ලැබීම් ඇත්තේ සුවසේ ලැබීම් ඇත්තේ මහත්සේ ලැබීම් ඇත්තේ වෙයි. ආශ්‍රවයන්ගේ ද ක්ෂය විමෙන් ආශ්‍රව රහිත වූ අර්හත්ඵල සමාධිය ද අර්හත්ඵල ප්‍රඥව ද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වෙසේ.

4. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත මහණ විනයධර වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනී. සූත්‍ර වශයෙන් ද අනු ව්‍යඤ්ජන වශයෙන් ද විස්තර වශයෙන් ඔහු විසින් උභය ප්‍රාතිමොක්ෂය මොනොවට පුහුණු කරන ලද, මොනොවට බෙදන ලද, මොනොවට පවත්වන ලද, මොනොවට විනිශ්චය කරන ලද වෙයි. උතුම් සිත ඇසුරු කළ ඉහාත්මයෙහි සුඛවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැති සේ රිසි සේ නිදුකින් ලබන සුලු වෙයි, ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ අර්හත්ඵල සමාධිය ද අර්හත්ඵල ප්‍රඥව ද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ යයි.

5. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො හොති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සෙය්‍යථීදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතියො දසපි ජාතියො වීසම්පි ජාතියො තිංසම්පි ජාතියො චත්තාලීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ට-කප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවංනාමො එවංගොත්තො එවංවණ්ණො එවමාහාරො එවංසුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තො සො තතො චුතො ඉධූපපන්නොති" ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති.

දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති "ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා, ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්මසමාදානා තෙ කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපන්නාති" ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති

ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

6. සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො සොභති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, සීලවා හොති-පෙ-සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවි-මුත්තිං පඤ්ඤාමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

7. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො සොභති: ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, බහුස්සුතො හොති-පෙ-දිට්ඨියා සුප්පටිවිද්ධා: චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතො-විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

5. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත වූ මහණ විනයධර වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, නන් වැදෑරුම් වූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කෙරෙයි : ඒ මෙසේ යැ : එක් ජාතියක් ද ජාති දෙකක් ද ජාති තුණක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දශයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතලිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසක් ද ජාති ලක්ෂයක් ද නොයෙක් නැසෙන කල්ප යන් ද නොයෙක් වැඩෙන කල්පයන් ද නොයෙක් නැසෙන වැඩෙන කල්පයන් ද සිහි කෙරෙයි, '' අසෝ තැන මෙබඳු නම් ඇත්තෙම් වීමි, මෙබඳු ගොත් ඇත්තෙම් වීමි, මෙබඳු පැහැ ඇත්තෙම් වීමි, මෙබඳු අහර ඇත්තෙම් වීමි, මෙබඳු සුවදුක් විඳියෙම් වීමි, මෙබඳු ආයු කෙළවර කොට ඇතියෙම් වීමි, ඒ මම එයින් චුත වූයෙම් මෙහි උපන්නෙම් වෙමි, '' යි මෙසේ ආකාර සහිත වූ විස්තර සහිත වූ නන් වැදෑරුම් පෙරවුසූ කඳපිළිවෙළ සිහි කෙරේ.

පිරිසිදු වූ මිනිසැස ඉක්ම වූ දිවැසින්, චුත වන්නා වූ ද උපදනා වූ ද ලාමක වූද උතුම් වූ ද මනා පැහැ ඇත්තා වූ ද නොමනා පැහැ ඇත්තා වූ ද සුගතියට පැමිණියා වූ ද දුගතියට පැමිණියා වූ ද සත්ත්වයන් දකියි, කම් වූ පරිද්දෙන් මියගියා වූ සත්ත්වයන් දනියි : '' ඒකාන්තයෙන් මේ භවත් සත්ත්වයෝ කායදුශ්චරිතයෙන් යුක්ත වූවාහු වාග්දුශ්චරිත යෙන් යුක්ත වූවාහු මනො දුශ්චරිතයෙන් යුක්ත වූවාහු ආර්යොපවාද කළාහු මිසදිටු ඇත්තාහු මිසදිටුකම් සමාදන් වූවාහු කාබුන් මරණින් මතු සැපයෙන් පහවූ නපුරුගති ඇති විවස වැ පතිත වන නරකයට පැමිණියාහු යැ යි ද '' මේ භවත් සත්ත්වයෝ වනාහි කාය සුචරිතයෙන් යුක්ත වූවාහු වාක්සුචරිතයෙන් යුක්ත වූවාහු මනඃසුචරිතයෙන් යුක්ත වූවාහු ආර්යොපවාද නො කළාහු සම්දිටු ඇත්තාහු සම්දිටුකම් සමාදන් වූවාහු කාබුන් මරණින් මතු යහපත් ගති ඇති සගලොවට පැමිණියාහු යැයි ද මෙසේ පිරිසිදු වූ මිනිසැස ඉක්ම වූ දිවැසින්, චුතවන්නා වූ ද උපදින්නා වූ ද ලාමක වූ ද උතුම් වූ ද මනා පැහැ ඇත්තා වූ ද නො මනා පැහැ ඇත්තා වූ ද සුගතියට පැමිණියා වූ ද දුගතියට පැමිණියා වූ ද සත්ත්වයන් දකී, කම්වූ පරිද්දෙන් මියගියා වූ ද සත්ත්වයන් දනී.

ආස්‍රවයන් ක්ෂය වීමෙන් අනාස්‍රව වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ යයි.

6. අඞ්ග සතෙකින් යුක්ත වූ විනයධර තෙමේ හොබනේ වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, සිල්වත් වූයේ . . . . වාස කෙරෙයි. ශික්ෂාපදයන්හි සමාදන් වැ හික්මෙයි. උතුම් සිත ඇසුරු කළා වූ ඉහාත්මයෙහි සැප විහරණ ආත්තා වූ සතර ධ්‍යානයන් කැමැති සේ ලැබීම් ඇත්තේ සුවසේ ලැබීම් ඇත්තේ මහත්සේ ලැබීම් ඇත්තේ වෙයි. ආස්‍රවයන්ගේ ද ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ අර්හත් ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ.

7. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත වූ විනයධර තෙමේ හොබනේ වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, බොහෝ ඇසූ තැන් ඇත්තේ වෙයි . . . දෘෂ්ටියෙන් මොනොවට අවබොධ කරණ ලද්දහු වෙත්. උතුම් සිත ඇසුරු කළ ඉහාත්මයෙහි සැපවිහරණ ඇති සතර ධ්‍යානයන් කැමැති සේ ලැබීම් ඇතියේ සුවසේ ලැබීම් ඇතියේ මහත්සේ ලැබීම් ඇතියේ වෙයි. ආස්‍රවයන්ගේ ද ක්ෂය වීමෙන් ආස්‍රව රහිත වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි මැ තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ.

8. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො සොභති : ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, චතුන්නං ඣානානං ආභිචෙතසිකානං දිට්ඨධම්මසුඛවිහාරානං නිකාමලාභී හොති අකිච්ඡලාභී අකසිරලාභී, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

9. අපරෙහිපි සත්තහඞ්ගෙහි සමන්නාගතො විනයධරො සොභති : ආපත්තිං ජානාති, අනාපත්තිං ජානාති, ලහුකං ආපත්තිං ජානාති, ගරුකං ආපත්තිං ජානාති, අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං : එකම්පි ජාතිං ද්වෙපි ජාතියො-පෙ-ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති - පෙ - දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති, ආසවානඤ්ච ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙවධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති.

10. සත්ත අසද්ධම්මා : අස්සද්ධො හොති, අහිරිකො හොති, අනොත්තප්පී හොති, අප්පස්සුතො හොති, කුසීතො හොති, මුට්ඨස්සති හොති, දුප්පඤ්ඤො හොති.

11. සත්ත සද්ධම්මා : සද්ධො හොති, හිරිමා හොති, ඔත්තප්පී හොති, බහුස්සුතො හොති, ආරද්ධවිරියො හොති, උපට්ඨිතසති[1] හොති, පඤ්ඤවා හොතීති.

සත්තකං නිට්ඨිතං

---

තස්සුද්දානං :

1. ආපත්ති ආපත්තික්ඛන්ධා විනීතා සාමීචිපි ච,
අධම්මිකා ධම්මිකා ච අනාපත්ති ච සත්තාහං

2. ආනිසංසපරමානි අරුණා සමථෙන ච,
කම්මා ආමකධඤ්ඤා ච තිරියං ගණභොජනෙ.

3. සත්තාහපරමං ආදාය සමාදාය තථෙව ච,
න හොති හොති හොති ච අධම්මධම්මිකානි ච.

4. චත්තාරො[2] විනයධරා චතු භික්ඛු ච සොභනෙ,
සත්ත චෙව අසද්ධම්මා සත්ත සද්ධම්මදෙසිතාති.

---

1. උපට්ඨිතස්සති—මජසං, ස්‍යා
2. චතුරො-මජසං,

8. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත වූ විනයධර තෙමේ හොබනේ වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, පෙළ විසින් ද අනුව්‍යඤ්ජන විසින් ද ඔහු විසින් උභය ප්‍රාතිමොක්ෂය විස්තර වශයෙන් මොනවට පුහුණු කරණ ලද්දේ මොනවට බෙදන ලද්දේ මොනවට පවත්වන ලද්දේ මොනවට විනිශ්චය කරණ ලද්දේ වෙයි, උතුම් සිත ඇසුරු කළ ඉහාත්මයෙහි සැපවිහරණ ඇත්තා වූ සතර ධ්‍යානයන් කැමැති සේ ලැබීම් ඇත්තේ සුවසේ ලැබීම් ඇත්තේ මහත් සේ ලැබීම් ඇත්තේ වෙයි. ආශ්‍රවයන් ගේ ද ක්ෂය වීමෙන් ආශ්‍රව රහිත වූ අර්හත්ඵලසමාධිය ද අර්හත්ඵලප්‍රඥාව ද ඉහාත්ම යෙහි ම තෙමේ නුවණින් දැන පසක් කොට (එයට) පැමිණ වාස කෙරේ.

9. අනෙකුදු අඞ්ග සතෙකින් යුක්ත වූ විනයධර තෙමේ හොබනේ වෙයි : ආපත්ති දනියි, අනාපත්ති දනියි, ලුහු ඇවැත් දනියි, ගරු ඇවැත් දනියි, නන්වැදෑරුම් වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි, ඒ මෙසේ යැ : එක් ජාතියක් ද ජාති දෙකක් ද . . . . මෙසේ ආකාර සහිත වූ විස්තර සහිත වූ නන්වැදෑරුම් වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කෙරෙයි. චුතවන උපදනා ලාමක උතුම් මනා පැහැ ඇති නොමනා පැහැ ඇති සුගතිගත වූ දුගතිගත වූ සත්ත්වයන් පිරිසිදු මිනිසැස ඉක්මැ සිටි දිවැසින් දකියි, කම් වූ පරිදි මියගියා වූ සත්ත්ව යන් දනියි, ආශ්‍රවයන්ගේ ද ක්ෂය වීමෙන් ආශ්‍රවරහිත වූ අර්හත්ඵලසමාධිය ද අර්හත් ඵලප්‍රඥාව ද ඉහාත්මයෙහි ම තෙමේ නුවණින් දැන පසක් කොට එයට පැමිණ වාස කෙරේ.

10. අසද්ධර්ම සතෙකි : සැදැහැ නැත්තේ වෙයි, (පවට) ලජ්ජා නැත්තේ වෙයි, (පවට) බිය නැත්තේ වෙයි, අල්පශ්‍රැත වෙයි, කුසීත වෙයි, මුළා සිහි ඇත්තේ වෙයි, ප්‍රඥා නැත්තේ වේ.

11. සද්ධර්ම සතෙකි : සැදැහැ ඇත්තේ වෙයි, (පවට) ලජ්ජා ඇත්තේ වෙයි, (පවට) බිය ඇත්තේ වෙයි, බහුශ්‍රැත වෙයි, රුකුළු වැර ඇත්තේ වෙයි, එළඹ සිටි සිහි ඇත්තේ වෙයි, පැණැත්තේ වේ.

**සප්තකය නිමි.**

---

එහි නාමාවලිය :

1. ආපත්ති යැ ආපත්තිස්කන්ධ යැ විනීතවස්තු යැ සාමීචි යැ අධම්මික යැ ධම්මික යැ අනාපත්ති යැ සත්තාහකරණීය යැ.

2. ආනිසංස යැ පරමයැ සමථ ය සමග අරුණුග්ගමන යැ කම්ම යැ ආමකධඤ්ඤ යැ තිරියං සත්තන්තර යැ, ගණභොජනයෙහි සත්ත අනුපඤ්ඤත්ති යැ,

3. සත්තාහ පරම සන්නිධි යැ කතචීවර ආදය යැ කතචීවර සමාදය යැ එසේ ම නහොති - හොති - හොති යැ අධම්මික පාතිමොක්ඛඨපන යැ ධම්මික පාතිමොක්ඛඨ-පන යැ,

4. සතර විනයධරයෝ යැ භික්ඛුසොභන සතර යැ සත්ත අසද්ධම්ම යැ සත්ත සද්ධම්ම යැයි යන මොහු දෙසන ලදහු යි.

---

## අට්ඨකං

1. අට්ඨානිසංසෙ සම්පස්සමානෙන න සො භික්ඛු ආපත්තියා අදස්සනෙ උක්ඛිපිතබ්බො, අට්ඨානිසංසෙ සම්පස්සමානෙන පරෙසම්පි සද්ධාය සා ආපත්ති දෙසෙතබ්බා, අට්ඨ යාවතතියකා, අට්ඨහාකාරෙහි කුලානි දූසෙති, අට්ඨ මාතිකා චීවරස්ස උප්පාදාය, අට්ඨ මාතිකා කඨිනස්ස උබ්භාරාය, අට්ඨ පානානි, අට්ඨහි අසද්ධම්මෙහි අභිභූතො පරියාදින්නචිත්තො දෙවදත්තො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො, අට්ඨ ලොකධම්මා, අට්ඨ ගරුධම්මා, අට්ඨ පාටිදෙසනීයා, අට්ඨඞ්ගිකො මුසාවාදො, අට්ඨ උපොසථඞ්ගානි, අට්ඨ දූතෙය්‍යඞ්ගානි, අට්ඨ තිත්ථියවත්තානි, අට්ඨ අච්ඡරියබ්භුතා ධම්මා මහාසමුද්දෙ, අට්ඨ අච්ඡරියා අබ්භුතා ධම්මා ඉමස්මිං ධම්මවිනයෙ, අට්ඨ අනතිරිත්තා, අට්ඨ අතිරිත්තා, අට්ඨමෙ අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති, අට්ඨ පාරාජිකා, අට්ඨමං වත්ථුං පරිපූරෙන්ති නාසෙතබ්බා, අට්ඨමං වත්ථුං පරිපූරෙන්තියා දෙසිතාපි අදෙසිතා හොති, අට්ඨවාචිකා උපසම්පදා, අට්ඨන්නං පච්චුට්ඨාතබ්බං, අට්ඨන්නං ආසනං දාතබ්බං, උපාසිකා අට්ඨ වරානි යාචති, අට්ඨහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු භික්ඛුනොවාදකො සම්මන්නිතබ්බො, අට්ඨානිසංසා විනයධරෙ, අට්ඨ පරමානි, තස්සපාපිය්‍යසිකා කම්මකතෙන භික්ඛුනා අට්ඨසු ධම්මෙසු සම්මා වත්තිතබ්බං. අට්ඨ අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි, අට්ඨ ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානීති.

අට්ඨකං නිට්ඨිතං

---

තස්සුද්දානං :

1. න සො භික්ඛු පරෙසම්පි යාවතතියං දූසනා,
මාතිකා කඨිනුබ්භාරා පානා අභිභූතෙන ච.

2. ලොකධම්මා ගරුධම්මා පාටිදෙසනීයා මුසා,
උපොසථා ච දූතඞ්ගා තිත්ථිකා සමුද්දෙපි ච.

3. අබ්භුතා අනතිරිත්තං අතිරිත්තං නිස්සග්ගියං,
පාරාජිකට්ඨමං වත්ථු අදෙසිතුපසම්පදා.

4. පච්චුට්ඨානාසනඤ්චෙව වරං ඔවාදකෙන ච,
ආනිසංසපරමානි අට්ඨ ධම්මෙසු වත්තනා,
අධම්මිකා ධම්මිකා ච අට්ඨකා සුප්පකාසිතා ති.

---

## අෂ්ටකය

1. අනුසස් අටක් මැනැවින් දක්නහු විසින් ඒ මහණ ඇවැත් නො දැක්මෙහි උබෙවුනීකම් නො කටයුතු යැ. අනුසස් අටක් දක්නහු විසින් මෙරමා පිළිබඳ සැදැහැයෙනුදු ඒ ඇවැත දෙසිය යුතු යැ, යාවතතියක ආපත්ති අටෙ කැ. අට අයුරෙකින් කුලදූෂණය කෙරෙයි, සිවුරු ඉපදවීම පිණිස මාතිකා අටෙකැ, කඨිනය ඉදිරීම පිණිස මාතිකා අටෙකැ, පානීය වර්ග අටෙකැ, නො දැහැමි කරුණු අටෙකින් මඩනා ලද හාත්පසින් මඩනාලද සිත් ඇති දෙව්දත් අපායෙහි උපදනේ වෙයි, නිරිසත් වෙයි, කල්පස්ථායී වෙයි, පිළියම් නො කළ හැකියේ ද වේ, ලෝකධර්ම අටෙකැ, ගරුධර්ම අටෙකැ, පිළිදෙස්නී ඇවැත් අටෙකැ, මුසාවාදය අඞ්ග අටෙකින් සමන්වාගත යැ, උපොස්ථඞ්ග අටෙකැ, දූතෙයාඞ්ග අටෙකැ. තීර්ථකවත් අටෙකැ, මහමුහුදෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම අටෙකැ, මේ සස්නෙහි ආශ්චර්‍ය්‍ය අද්භූතධර්ම අටෙකැ, නො අයිරිත් අටෙකැ. අයිරිත් අටෙකැ, අටවැනි අරුණ නැඟීමෙහිලා නිසඟි වෙයි, පරිජි අටෙකැ. අටවැනි කරුණ සපුරණ මෙහෙණ (ලිඞ්ගනාසනායෙන්) නැසිය යුත්තී යැ. අටවැනි කරුණ සපුරණ මෙහෙණ විසින් (ඇවැත්) දෙසන ලද නමුදු නො දෙසන ලද වෙයි, (මෙහෙණන්ගේ) උපසපුව අට්ඨවාචිකා නමු, (බොජුන්හලැ මෙහෙණන්) අටදෙනකුන් පිළිබඳ වැ හුනස්නෙන් නැඟී සිටිය යුතුයි, අටදෙනෙකුන්හට අසුන් දිය යුතුයි, (විසාඛා) උවැසි වර අටක් යදියි, අටඟින් යුත් මහණ භික්ඛුනොවාදක යැයි සම්මත කටයුතුයි, විනයධරයා කෙරෙහි අනුසස් අටෙකැ. පරම අටෙකැ. තස්සපාපියාසිකා කර්මය කරණ ලද මහණහු විසින් දහම් අටෙක්හි මැනැවින් පැවැතිය යුතුය, නො දැහැමි පාමොක් තැබීම් අටෙකැ, දැහැමි පාමොක් තැබීම් අටෙකි.

**අෂ්ටකය නිමි.**

---

එහි නාමාවලිය :

1. ''න සො භික්ඛු'' යනාදියෙහි දැක්වෙන අනුසස් යැ '' පරෙසම්පි '' යනාදියෙහි දැක්වෙන අනුසස් යැ යාවතතියක යැ කුලදූෂණ යැ (චීවරොත්පාදනයෙහි) මාතිකා යැ කඨිනොද්ධාරයෙහි මාතිකා යැ පානීය යැ '' අභිභූත '' පදය ඇතුළත් කරුණු යැ,

2. ලොකධර්ම යැ ගරුධර්ම යැ පිළිදෙස්නී යැ මුසාවාදඞ්ග යැ උපොසථාඞ්ග යැ දූතාඞ්ග යැ තීර්ථකවත් යැ සස්නෙහි අද්භූතධර්ම අට යැ මුහුදෙහිදු අද්භූත ධර්ම අට යැ,

3. අතිරිත්ත යැ අනතිරිත්ත යැ නිසඟි යැ පරිජි යැ අටවැනි වස්තු යැ අදෙසිතාපත්ති යැ අට්ඨවාචිකා උපසම්පද යැ,

4. පච්චුට්ඨාන යැ අස්න යැ භික්ඛුනොවාද කය සමග වර යැ (විනයධර) අනුසස් යැ පරම යැ අට කරුණෙහි සම්මාවත්තනා යැ නො දැහැමි පාමොක් තැබීම් යැ දැහැමි පාමොක් තැබීම් යැයි අෂ්ටකයෝ මැනැවින් වදරණ ලදහු යි.

---

## නවකං

1. නව ආඝාතවත්ථූනි, නව ආඝාතපටිවිනයා, නව විනීතවත්ථූනි, නව පඨමාපත්තිකා, නවහි සඞ්ඝො භිජ්ජති, නව පණීතභොජනානි, නවමංසෙහි දුක්කටං, නව පාතිමොක්ඛුද්දෙසා, නව පරමානි, නව තණ්හාමූලකා ධම්මා, නවවිධමානා, නව චීවරානි අධිට්ඨාතබ්බානි, නව චීවරානි න විකප්පෙතබ්බානි, දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා, නව අධම්මිකානි දානානි, නව අධම්මිකා පටිග්ගහා, නව අධම්මිකා පරිභොගා, තීණි ධම්මිකානි දානානි, තයො ධම්මිකා පටිග්ගහා, තයො ධම්මිකා පරිභොගා, නව අධම්මිකා සඤ්ඤත්තියො[1], නව ධම්මිකා සඤ්ඤත්තියො[1], අධම්මකම්මෙ ද්වෙ නවකානි, ධම්මකම්මෙ ද්වෙ නවකානි, නව අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි, නව ධම්මකානි පාතිමොක්ඛට්ඨපනානීති.

නවකං නිට්ඨිතං

---

තස්සුද්දානං :

1. ආඝාතවත්ථු විනයා විනීතා පඨමෙන ච,
   භිජ්ජති ච පණීතඤ්ච මංසුද්දෙසපරමානි ච.
2. තණ්හා මානා අධිට්ඨානා විකප්පෙ ච විදත්ථියො,
   දානා පටිග්ගහා භොගා තිවිධා පුන ධම්මිකා.
3. අධම්ම ධම්ම සඤ්ඤත්ති[2] දුවෙ ද්වෙ නවකානි ච,
   පාතිමොක්ඛඨපනානි අධම්මධම්මිකානි චාති.

---

## දසකං

1 දස ආඝාතවත්ථූනි, දස ආඝාත පටිවිනයා,[3] දස විනීතවත්ථූනි, දසවත්ථුකා මිච්ඡාදිට්ඨි, දසවත්ථුකා සම්මාදිට්ඨි, දස අන්තග්ගාහිකා දිට්ඨි, දස මිච්ඡත්තා, දස සම්මත්තා, දස අකුසලකම්මපථා, දස කුසලකම්මපථා, දස අධම්මිකා සලාකගාහා, දස ධම්මිකා සලාකගාහා, සාමණෙරානං දස සික්ඛාපදානි, දසහඞ්ගෙහි සමන්නාගතො සාමණෙරො නාසෙතබ්බො.

2. දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: අත්තනො භාසපරියන්තං න උග්ගණ්හාති, පරස්ස භාසපරියන්තං න උග්ගණ්හාති, අත්තනො භාසපරියන්තං අනුග්ගහෙත්වා පරස්ස භාසපරියන්තං අනුග්ගහෙත්වා අධම්මෙන කාරෙති. අප්පටිඤ්ඤාය, ආපත්තිං න ජානාති, ආපත්තියා මූලං න ජානාති, ආපත්ති සමුදයං න ජානාති, ආපත්ති නිරොධං න ජානාති, ආපත්ති නිරොධගාමිනී පටිපදං න ජානාති.

---

1. පඤ්ඤත්තියො—සීමු. 1, 2,
2. පඤ්ඤත්ති—සීමු 1 2,
3. දස ආඝාතවත්ථුපටිවිනයා—සීමු. 2

## නවකය

1. ආඝාතවස්තු නවයෙකැ, ආඝාතපටිවිනය නවයෙකැ. විනීතවස්තු නවයෙකැ, පඨමාපත්තිකාපත්ති නවයෙකැ, නවදෙනකුන් කරණ කොට සඞ්ඝයා බිඳෙයි, ප්‍රණීත භොජන නවයෙකැ, නවවිධ මාංසයන් කරණ කොට ගෙණ දුකුළා වෙයි, පාමොක් උදෙසීම් නවයෙකැ, පරම නවයෙකැ, තෘෂ්ණාමූලක ධර්ම නවයෙකැ, මානයෝ නවවැදෑරුම් වෙති, ඉටියයුතු චීවර නවයෙකැ, නො විකපිය යුතු සිවුරු නවයෙකැ, සුගත් වියතින් දිගින් නව වියතෙකැ, නො දැහැමි දන් නවයෙකැ, නො දැහැමි පිළිගැණුම් නවයෙකැ, නො දැහැමි පරිභොග නවයෙකැ, දැහැමි දන් තුණෙකැ, දැහැමි පිළිගැණුම් තුණෙකැ, දැහැමි පරිභොග තුණෙකැ, නො දැහැමි හැඟවීම් නවයෙකැ, දැහැමි හැඟවීම් නවයෙකැ, නො දැහැමි කම්හි නවක දෙකෙකැ, දැහැමි කම්හි නවක දෙකෙකැ, නො දැහැමි පාමොක් තැබීම් නවයෙකැ, දැහැමි පාමොක් තැබීම් නවයෙකි.

නවකය නිමි.

---

එහි නාමාවලිය :

1. ආඝාත වස්තු යැ ආඝාත පටිවිනය යැ විනීතවස්තු යැ පඨමාපත්තිකය සමග සඞ්ඝභෙද යැ පණීතභොජන යැ මංස යැ පාතිමොක්ඛුද්දෙස යැ පරම යැ.

2. තෘෂ්ණාමූලකධර්ම යැ මාන යැ චීවර අධිට්ඨාන යැ විකල්පන යැ නව වියත යැ දන යැ පටිග්ගහ යැ පරිභොග යැ ත්‍රිවිධදන යැ.

3. අධම්මසඤ්ඤත්ති යැ ධම්මසඤ්ඤත්ති යැ අධර්මකර්ම යැ ධර්මකර්ම යැ නො දැහැමි පාමොක් තැබීම් යැ දැහැමි පාමොක් තැබීම් යැයි නවකයෝ වෙත්.

---

## දශකය

1. ආඝාතවස්තු දශයෙකැ, ආඝාත ප්‍රතිවිනය දශයෙකැ, විනීත වස්තු දශයෙකැ, දශවස්තුක මිථ්‍යාදෘෂ්ටීහු යැ, දශවස්තුක සම්‍යග්දෘෂ්ටීහු යැ, දශ අන්තග්‍රාහික දෘෂ්ටීහු යැ, මිච්ඡත්ත දශයෙකැ, සම්මත්ත දශයෙකැ, අකුශලකර්මපථ දශයෙකැ, කුශල කර්මපථ දශයෙකැ, නො දැහැමි ලහගැන්වීම් දශයෙකැ, දැහැමි ලහගැන්වීම් දශයෙකැ. හෙරණුන් පිළිබඳ සිකපද දශයෙකැ, අඞ්ග දසයෙකින් යුත් හෙරණ නැසිය යුතු වේ.

2. අඞ්ග දශයෙකින් යුක්තවූ විනයධර තෙමේ බාලයෙකැයි මැ ගණනට යෙයි : තමා පිළිබඳ කථාවසානය නො උගණියි, පරා පිළිබඳ කථාවසානය නො උගණියි, තමාගේ කථාවසානයෙහි ගතයුතු තෙපුල නො ඉගෙණ, පරාගේ කථාවසානයෙහි ගතයුතු තෙපුල නො ඉගෙණ, නො දැහැමින් විනිශ්චය කරවයි, ප්‍රතිඥා නො කිරීමෙන් විනිශ්චය කරවයි, ඇවැත නො දනියි, ආපත්තිමූලය නො දනියි, ආපත්තිසමුදය නො දනියි, ආපත්ති නිරොධය නො දනියි, ආපත්තිනිරොධගාමිනී පටිපදව නො දනී.

දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: අත්තනො භාසපරියන්තං උග්ගණ්හාති, පරස්ස භාසපරියන්තං උග්ගණ්හාති, අත්තනො භාසපරියන්තං උග්ගහෙත්වා පරස්ස භාස-පරියන්තං උග්ගහෙත්වා ධම්මෙන කාරෙති පටිඤ්ඤාය, ආපත්තිං ජානාති, ආපත්තියා මූලං ජානාති, ආපත්තිසමුදයං ජානාති, ආපත්ති නිරොධං ජානාති, ආපත්තිනිරොධගාමිනීපටිපදං ජානාති.

3. අපරෙහිපි දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: අධිකරණං න ජානාති, අධිකරණස්ස මූලං න ජානාති, අධිකරණසමුදයං න ජානාති, අධිකරණනිරොධං න ජානාති, අධිකරණ-නිරොධගාමිනීපටිපදං න ජානාති, වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජනාති, අනුපඤ්ඤත්තිං න ජානාති, අනුසන්ධි-වචනපථං න ජානාති.

දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: අධිකරණං ජානාති, අධිකරණස්ස මූලං ජානාති, අධිකරණ සමුදයං ජානාති, අධිකරණනිරොධං ජානාති, අධිකරණනිරොධ ගාමිනී පටිපදං ජානාති, වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, අනුපඤ්ඤත්තිං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති.

4. අපරෙහිපි දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ඤත්තිං න ජානාති, ඤත්තියා කරණං න ජානාති, න පුබ්බකුසලො හොති, න අපරකුසලො හොති, අකාලඤ්ඤූ ච හොති, ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, ආචරියපරම්පරා ඛො පනස්ස න සුග්ගහිතා හොති න සුමනසිකතා න සූපධාරිතා.

දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ඤත්තිං ජානාති, ඤත්තියා කරණං ජානාති, පුබ්බකුසලො හොති, අපරකුසලො හොති, කාලඤ්ඤූ ච හොති, ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, ආචරියපරම්පරා ඛො පනස්ස සුග්ගහිතා හොති සුමනසිකතා සූපධාරිතා.

5. අපරෙහිපි දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලා-දුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන න ස්වාගතානි හොන්ති න සුවිභත්තානි න සුප්පවත්තීනි න සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, අධිකරණෙ ච න විනිච්ඡයකුසලො හොති.

දසහඞ්ගෙහි සමන්නාගතො විනයධරො පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි

අඞ්ග දශයෙකින් යුක්ත වූ විනයධර තෙමේ පණ්ඩිතයෙකැයි මැ ගණනට යෙයි : තමා පිළිබඳ කථාවසානය උගණියි, පරා පිළිබඳ කථාවසානය උගණියි, තමාගේ කථාවසානය ඉගෙණ පරාගේ කථාවසානය ඉගෙණ දැහැමින් විනිශ්චය කරවයි, ප්‍රතිඥ වෙන් යුතුව විනිශ්චය කරවයි, ඇවැත දනියි, ආපත්තිමූලය දනියි, ආපත්තිසමුදය දනියි, ආපත්තිනිරෝධය දනියි, ආපත්තිනිරෝධගාමිනීපටිපදව දනී.

3. අනෙකුදු අඞ්ග දශයෙකින් යුක්ත වූ විනයධර තෙමේ බාලයෙකැයි මැ ගණනට යෙයි : අධිකරණය නො දනියි, අධිකරණ මූලය නො දනියි, අධිකරණ සමුදය නො දනියි, අධිකරණ නිරොධය නො දනියි, අධිකරණ නිරොධගාමිනීපටිපදව නො දනියි, වස්තුව නො දනියි, නිදනය නො දනියි, ප්‍රඥප්තිය නො දනියි, අනුප්‍රඥප්තිය නො දනියි, කථාමාර්ගය නො දනී.

අඞ්ග දශයෙකින් යුක්ත වූ විනයධර තෙමේ පණ්ඩිතයෙකැයි මැ ගණනට යෙයි : අධිකරණය දනියි, අධිකරණ මූලය දනියි, අධිකරණ සමුදය දනියි, අධිකරණ නිරොධය දනියි, අධිකරණ නිරොධ ගාමිනී පටිපදව දනියි, වස්තුව දනියි, නිදනය දනියි, ප්‍රඥප්තිය දනියි, අනුප්‍රඥප්තිය දනියි, කථාමාර්ගය දනී.

4. අනෙකුදු අඞ්ග දශයෙකින් යුක්ත වූ විනයධරතෙමේ බාලයෙකැයි මැ ගණනට යෙයි : ඤත්තිය නො දනියි, ඤත්තිකරණය නො දනියි, පළමු වැ කියයුත්තෙහි දක්ෂ නො වෙයි, පසු වැ කියයුත්තෙහි දක්ෂ නො වෙයි, සුදුසු කල් නො දන්නේත් වෙයි, ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහු ගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත් නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත් නො දනියි, ඔහු විසින් ආචාර්‍ය්‍ය පරම්පරාව මොනවට නො ඉගෙණගන්නා ලද මොනවට නො මෙනෙහි කරණලද මොනවට නො විමසන ලද වේ.

අඞ්ග දශයෙකින් යුක්තවූ විනයධරතෙමේ පණ්ඩිතයෙකැයි මැ ගණනට යෙයි : ඤත්තිය දනියි, ඤත්තිකරණය දනියි, පළමු වැ කිය යුත්තෙහි දක්ෂ වෙයි, පසු වැ කිය යුත්තෙහි දක්ෂ වෙයි, සුදුසු කල් දන්නේත් වෙයි, ඇවැත් නො ඇවැත් දනියි, ලුහුගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ඇවැත් දනියි, තුළුල් නොතුළුල් ඇවැත් දනියි, ඔහු විසින් ආචාර්‍ය්‍ය පරම්පරාව මොනවට ඉගෙණගන්නාලද මොනවට මෙනෙහි කරණලද මොනවට විමසනලද වේ.

5. අනෙකුදු අඞ්ග දශයෙකින් යුක්ත වූ විනයධරතෙමේ බාලයෙකැයි මැ ගණනට යෙයි : ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහුගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත් නො දනියි, තුළුල් නොතුළුල් ඇවැත් නො දනියි, පෙළ විසිනුදු අනුව්‍යඤ්ජන විසිනුදු ඔහු විසින් විස්තර වශයෙන් උභය ප්‍රාතිමොක්ෂය මොනවට පුහුණු නො කරණලද මොනවට නො බෙදන ලද මොනවට නො පවත්වන ලද මොනවට විනිශ්චය නො කරණ ලද වෙයි, ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහුගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනව සෙස ඇවැත් නො දනියි, තුළුල් නොතුළුල් ඇවැත් නො දනියි, අධිරකණයෙහිදු විනිශ්චය කුශල වූයේ නො වේ.

අඞ්ග දශයෙකින් යුක්තවූ විනයධර තෙමේ පණ්ඩිතයෙකැයි මැ ගණනට යෙයි : ඇවැත් නො ඇවැත් දනියි, ලුහුගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ඇවැත් දනියි, තුළුල් නො තුළුල් ඇවැත් දනියි, පෙළ විසිනුදු අනුව්‍යඤ්ජන විසිනුදු ඔහු විසින් විස්තර

හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, අධිකරණෙ ච විනිච්ඡයකුසලො හොති.

6. දසහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො, දස අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං, දස ආදීනවා රාජන්තෙපුරප්පවෙසනෙ, දස දානවත්ථූනි, දස රතනානි, දසවග්ගො භික්ඛුසඞ්ඝො, දසවග්ගෙන ගණෙන උපසම්පාදෙතබ්බං, දස පංසුකූලානි, දස චීවරධාරණා, දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතබ්බං, දස සුක්කානි, දස ඉත්ථියො, දස භරියායො, වෙසාලියං දස වත්ථූනි දීපෙන්ති.

දස පුග්ගලා අවන්දියා, දස අක්කොසවත්ථූනි, දසහාකාරෙහි පෙසුඤ්ඤං උපසංහරති, දස සෙනාසනානි, දස වරානි යාචිංසු, දස අධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි, දස ධම්මිකානි පාතිමොක්ඛට්ඨපනානි, දසානිසංසා යාගුයා, දස මංසා අකප්පියා, දස පරමානි, දසවස්සෙන භික්ඛුනා බ්‍යත්තෙන පටිබලෙන පබ්බාජෙතබ්බං උපසම්පාදෙතබ්බං නිස්සයො දාතබ්බො සාමණෙරො උපට්ඨාපෙතබ්බො, දසවස්සාය භික්ඛුනියා බ්‍යත්තාය පටිබලාය පබ්බාජෙතබ්බා උපසම්පාදෙතබ්බා නිස්සයො දාතබ්බො සාමණෙරී උපට්ඨාපෙතබ්බා, දසවස්සාය භික්ඛුනියා බ්‍යත්තාය පටිබලාය උට්ඨාපනසම්මුති සාදිතබ්බා, දසවස්සාය ගිහිගතාය සික්ඛා දාතබ්බාති.

දසකං නිට්ඨිතං

---

තස්සුද්දානං :

1. ආඝාතවිනයා[1] වත්ථු මිච්ඡා සම්මා ච අන්තගා,
මිච්ඡත්තා චෙව සම්මත්තා අකුසලා කුසලාපි ච.

2. සලාකා අධම්මා ධම්මා ච සාමණෙරා ච නාසනා,
භාසාධිකරණා[2] චෙව පඤ්ඤත්ති ලහුකමෙව ච.

3 ලහුකා ගරුකා එතෙ කණ්හසුක්කා විජානථ,
උබ්බාහිකා ච සික්ඛා ච අන්තෙපුරෙ ච වත්ථූනි.

4. රතනං දසවග්ගො ච තථෙව උපසම්පදා,
පංසුකූලධාරණා ච දසාහසුක්කඉත්ථියො.

5. භරියා දස වත්ථූනි අවන්දියක්කොසෙන ච,
පෙසුඤ්ඤ චෙව සෙනානි වරානි ච අධම්මිකා.

6. ධම්මිකා යාගුමංසා ච පරමා භික්ඛු භික්ඛුනී,
වුට්ඨාපනා ගිහිගතා දසකා සුප්පකාසිතාති.

---

1. ආඝාතවිනයං—මජසං.
2. භාසාධිකරණඤ්චෙව—මජසං.

වශයෙන් උභය ප්‍රාතිමොක්ෂය මොනවට පුහුණු කරණ ලද මොනවට බෙදනලද මොනවට පවත්වන ලද මොනවට විනිශ්චය කරණලද වෙයි, ඇවැත් නො ඇවැත් දනියි, ලුහුගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ඇවැත් දනියි, තුළුල් නො තුළුල් ඇවැත් දනියි, අධිකරණයෙහිදු විනිශ්චය කුශලවූයේ වේ.

6. අඞ්ග දශයෙකින් යුත් මහණතෙමේ උබ්බාහිකාවට සම්මත කළ යුත්තේ යි, කරුණු දශයක් පිණිස භාග්‍යවතුන් විසින් සව්වනට සිකපද පණවන ලදි, රජහුගේ ඇතොඃවුරට පිවිසීමෙහි ආදීනව දශයෙකැ, දනවස්තු දශයෙකැ, රත්න දශයෙකැ, දශවර්ගික භික්ෂුසඞ්ඝයා යැ, දශවර්ගික ගණයා විසින් උපසපන් කළයුතුයැ, පාංශුකූල දශයෙකැ, සිවුරු ධැරීම් දශයෙකැ, අතිරෙක චීවරයක් දසදිනක් පරම කොට ඇති කාලයක් දැරිය යුතුයි, සුකුරු දශයෙකැ, ස්ත්‍රිහු දශදෙනෙකැ, භාර්‍ය්‍යාවෝ දශ දෙනෙකැ, විසල් පුරයෙහි දශවස්තුවක් දක්වත්.

නො වැන්දයුතු පුද්ගලයෝ දශදෙනෙකි, ආක්‍රොශ වස්තු දශයකි. දශ ආකාරයකින් පෙහෙසුන් එලවයි, සෙනසුන් දශයෙකැ, වරදශයක් ඉල්ලූහ, නො දැහැමි පාමොක් තැබීම් දශයෙකැ, දැහැමි පාමොක් තැබීම් දශයෙකැ, හුළුකැන් පිළිබඳ අනුසස් දශයෙකැ අකැපමස් දශයෙකැ, පරම දශයෙකැ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ දසවස් ඇති මහණහු විසින් පැවිදි කළ යුතුයැ, උපසපන් කළ යුතුයැ, නිස දියයුතුයැ, හෙරණකු ලවා උවටැන් කරවිය යුතුය. ව්‍යක්තවූ ප්‍රතිබල වූ දසවස් ඇති මෙහෙණ විසින් පැවිදි කළ යුතුය, උපසපන් කළ යුතුයැ, නිසදියයුතුයැ, හෙරණියක ලවා උවැටන් කරවිය යුතුයි. ව්‍යක්ත වූ ප්‍රතිබල වූ දසවස් ඇති මෙහෙණ විසින් උපසපන් කිරීමේ සම්මුතිය ඉවසිය යුතුයැ, පිරිමින් අතරට ගියාවූ දසවස් ඇත්තියට සික්ඛා සමුම්තිය දියයුතුයි.

දශකය නිමි.

---

එහි නාමාවලිය :

1. ආඝාතයැ ආඝාතපටිවිනය යැ විනීතවස්තු යැ මිච්ඡාදිට්ඨි යැ සම්මාදිට්ඨි යැ අන්තග්ගාහික දිට්ඨි යැ මිච්ඡත්ත යැ සම්මත්ත යැ අකුසල යැ කුසල යැ,

2. අධම්මිකසලාකගාහ යැ ධම්මිකසලාකගාහ යැ හෙරණසික යැ නාසනා යැ භාසපරියන්ත යැ අධිකරණ යැ ඤත්ති යැ ලහුක යැ,

3. ලහුගරු ඇවැත් යන මොවුන් ද අකුසලය ද කුසලය ද දනිවු. උබ්බාහිකා යැ සික්ඛාපද පඤ්ඤත්ති යැ රාජන්තෙපුර යැ ආදීනව යැ දනවස්තුහු යැ,

4. රත්න යැ දසවග්ග යැ එසේම උපසම්පද යැ පංසුකූල යැ චීවරධාරණ යැ දසාහපරම යැ සුක්ක යැ ස්ත්‍රිහු යැ,

5. භරියා යැ දශවස්තු යැ අවන්දිය හා ආක්‍රොශ යැ පෙහෙසුන් එළවීම යැ සෙනාසන යැ වර යැ නො දැහැමි පාමොක් තැබීම් යැ,

6. දැහැමි පාමොක් තැබීම් යැ යාගු යැ අකැප මාංස යැ පරම යැ දසවස් ඇති භික්ෂු යැ භික්ෂුණී යැ වුට්ඨාපන යැ ගිහිගත යැ යන මේ දශකයෝ ද මැනැවින් පවසන ලදහ.

---

8—ඒ 30906 (77/12)

## එකාදසකං

1. එකාදස පුග්ගලා අනුපසම්පන්නා න උපසම්පාදෙතබ්බා උපසම්පන්නා නාසෙතබ්බා, එකාදස පාදුකා අකප්පියා, එකාදස පත්තා අකප්පියා, එකාදස චීවරානි අකප්පියානි, එකාදස යාවතතියකා භික්ඛුනීනං, එකාදස අන්තරායිකා ධම්මා පුච්ඡිතබ්බා, එකාදස චීවරානි අධිට්ඨාතබ්බානි, එකාදස චීවරානි න විකප්පෙතබ්බානි, එකාදස අරුණුග්ගමනෙ නිස්සග්ගියං හොති, එකාදස ගණ්ඨිකා කප්පියා, එකාදස වීඨා[1] කප්පියා, එකාදස පථවියො අකප්පියා. එකාදස පථවියො කප්පියා, එකාදස නිස්සයපටිප්පස්සද්ධියො, එකාදස පුග්ගලා අවන්දියා, එකාදස පරමානි, එකාදස වරානි යාචිංසු, එකාදස සීමාදොසා, අක්කොසකපරිභාසකෙ පුග්ගලෙ එකාදස ආදීනවා පාටිකඞ්ඛා.

2. මෙත්තාය චෙතො විමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකඞ්ඛා: සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති, උත්තරිං අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති. මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය ඉමෙ එකාදසානිසංසා පාටිකඞ්ඛාති.

එකාදසකං නිට්ඨිතං

---

තස්සුද්දානං :

1. නාසෙතබ්බා[2] පාදුකා ච පත්තා ච චීවරානි ච,
තතියා පුච්ඡිතබ්බා ච අධිට්ඨාන විකප්පනා.

2. අරුණා ගණ්ඨිකා වීඨා[1] අකප්පියා ච කප්පියා,
නිස්සයා වන්දියා චෙව පරමානි වරානි ච;
සීමාදොසා ච අක්කොසා මෙත්තායෙකාදසා කතාති.

එකුත්තරිකං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. එකකා ච දුකා චෙව තිකා ච චතු පඤ්චකා,
ඡ සත්තට්ඨ නවකා ච දස එකාදසානි ච.

2. හිතාය සබ්බසත්තානං ඤාතධම්මෙන තාදිනා
එකුත්තරිකා විමලා මහාවීරෙන දෙසිතාති.

---

1. විධා - මජ්ඣං, වීටා - ස්‍යා.
2. නාසෙතබ්බා - සීමු 2.

## ඒකාදශකය

1. අනුපසපන් වූ එකොළොස් පුද්ගලයෝ උපසපන් නො කටයුත්තාහ, උපසපන් වූවාහු (ලිඞ්ගනාසනායෙන්) නැසිය යුත්තාහ, අකැප පාදුකා එකොළොසෙකැ, අකැප පාත්‍ර එකොළොසෙකැ, අකැප සිවුරු එකොළොසෙකැ, භික්ෂුණීන් පිළිබඳ යාවතතියක එකොළොසෙකැ, විචාළ යුතු අන්තරායකරධර්ම එකොළොසෙකැ, ඉටිය යුතු සිවුරු එකොළොසෙකැ, විකපුන් නො කටයුතු සිවුරු එකොළොසෙකැ, එකොළොස්වන අරුණු නැගීමෙහි නිසගි වෙයි, කප්පිය ගණ්ඨිහු එකොළොසෙකැ, කැප වීය එකොළොසෙකැ. අකැප පොළෝ එකොළොසෙකැ, කැප පොළෝ එකොළොසෙකැ, නිස සන්හිඳුවීම් එකොළොසෙකැ, නො වැන්දයුතු පුද්ගලයෝ එකොළොස් දෙනෙකැ, පරම එකොළොසෙකැ, වර එකොළොසක් ඉල්වූහ. සීමාදෝෂ එකොළොසෙකැ, ආක්‍රොශ පරිභව කරණ පුද්ගලයා කෙරෙහි එකොළොස් ආදීනව කෙනෙක් කැමැති විය යුත්තාහ.

2. සෙවුනා ලද වඩනා ලද බහුල වශයෙන් කරණ ලද යානයක් මෙන් කරණ ලද පිහිටක් මෙන් කරණ ලද නැවැත නැවැතත් උපදවන ලද හැම ලෙසින් පුහුණු කරණ ලද මොනවට පටන් ගන්නා ලද මෛත්‍රීචෙතොවිමුක්තිය පිළිබඳ අනුසස් එකොළොසෙක් කැමැති විය යුතු යැ : සුවසේ නිදයි සුවසේ පුබුදියි, නපුරු සිහින නොදකියි, මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි, දෙවියෝ රකිති, ඔහුගේ සිරුරට ගිනි හෝ විෂ හෝ සැත් හෝ නොවදියි, සිත වහා එකඟ වෙයි, මුවපැහැය වෙසෙසින් පහන් වෙයි, නු මුළා වැ කලුරිය කෙරෙයි, මත්තෙහි රහත්වන්නට නොහැකි වූ යේ බඹලොව උපදියි, සෙවුනා ලද වඩනාලද බහුල වශයෙන් කරණ ලද යානයක් මෙන් කරණ ලද පිහිටක් මෙන් කරණ ලද නැවැත නැවැත උපදවන ලද හැම ලෙසින් පුහුණු කරණ ලද මොනවට පටන් ගන්නා ලද මෛත්‍රීචෙතොවිමුක්තිය පිළිබඳ මේ අනුසස් එකොළොස කැමැති විය යුතුයි.

**ඒකාදශකය නිමි.**

---

එහි නාමාවලිය :

1. නාසෙතබ්බ යැ පාදුකා යැ පාත්‍ර යැ, චීවර යැ යාවතතියක යැ පුච්ඡිතබ්බ යැ අධිට්ඨාන යැ විකප්පන යැ.

2. අරුණුග්ගමන යැ ගණ්ඨිකා යැ වීය යැ අකප්පිය කප්පිය පඨවි යැ නිස්සය ය අවන්දිය යැ පරම යැ වර යැ සීමාදොස යැ අක්කොසක යැ මෙත්තාචෙතොවිමුක්ති එකාදසානිසංස යැ යි (මොහු) නම් කරණ ලදහ.

**ඒකුත්තරිකය නිමි.**

---

එහි නාමාවලිය :

1. එකක යැ දුක යැ තික යැ චතුක්ක යැ පඤ්චක යැ ඡක්ක යැ සත්තක යැ අට්ඨක යැ නවක යැ දසක යැ එකාදසක යැයි,

2. අවබොධ කළ දහම් ඇති තාදී ගුණයෙන් යුත් මහාවීර සර්වඥයන් වහන්සේ විසින් හැම සත්නට හිත පිණිස නිර්මල ඒකුත්තරිකය දෙසන ලදි.

---

# උපොසථාදි පුච්ඡා විස්සජ්ජනා

## පුච්ඡා

1. උපොසථකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං. පවාරණස්ස කම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං. තජ්ජනීයකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං, නියස්සකම්මස්ස -පෙ- පබ්බාජනීයකම්මස්ස -පෙ- පටිසාරණීයකම්මස්ස -පෙ- උක්ඛෙපනීයකම්මස්ස -පෙ- පරිවාසදානස්ස -පෙ- මූලාය පටිකස්සනාය -පෙ- මානත්තදානස්ස -පෙ- අබ්භානස්ස -පෙ- උපසම්පදකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං.

2. තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං, නියස්සකම්මස්ස පටිප්පස්සද්ධියා -පෙ- පබ්බාජනීයකම්මස්ස පටිප්පස්සද්ධියා -පෙ- පටිසාරණීයකම්මස්ස පටිප්පස්සද්ධියා -පෙ- උක්ඛෙපනීයකම්මස්ස පටිප්පස්සද්ධියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං.

3. සතිවිනයස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං. අමූළ්හවිනයස්ස -පෙ- තස්සපාපියසිකාය -පෙ- තිණවත්ථාරකස්ස -පෙ- භික්ඛුනොවාදකසම්මුතියා -පෙ- තිචීවරෙන අවිප්පවාසසම්මුතියා -පෙ- සන්ථතසම්මුතියා -පෙ- රූපියඡඩ්ඩකසම්මුතියා -පෙ- සාටියගාහාපකසම්මුතියා -පෙ- පත්තගාහාපකසම්මුතියා -පෙ- දණ්ඩසම්මුතියා -පෙ- සික්කාසම්මුතියා -පෙ- දණ්ඩසික්කාසම්මුතියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං.

පුච්ඡා නිට්ඨිතා

---

## විස්සජ්ජනා

1. උපොසථකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: උපොසථකම්මස්ස සාමග්ගී ආදි, කිරියා මජ්ඣෙ, නිට්ඨානං පරියොසානං.

2. පවාරණාකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: පවාරණාකම්මස්ස සාමග්ගී ආදි, කිරියා මජ්ඣෙ, නිට්ඨානං පරියොසානං.

3. තජ්ජනීයකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: තජ්ජනීයකම්මස්ස වත්ථු ච පුග්ගලො ච ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

4. නියස්සකම්මස්ස -පෙ- පබ්බාජනීයකම්මස්ස -පෙ- පටිසාරණීයකම්මස්ස -පෙ- උක්ඛෙපනීයකම්මස්ස -පෙ- පරිවාසදානස්ස -පෙ- මූලාය පටිකස්සනාය -පෙ- මානත්තදානස්ස -පෙ- අබ්භානස්ස -සෙ-.



Free Distribution www.aathaapi.org

# උපොසථාදි පුච්ඡා විසජ්ජනය

## පුච්ඡා

1. උපොසථ කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, පවාරණ කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, තජ්ජනීය කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, නියස්ස කර්ම යෙහි . . . . පබ්බාජනීය කර්මයෙහි . . . . පටිසාරණීය කර්මයෙහි . . . . උක්ඛෙපනීය කර්මයෙහි . . . . පරිවාසදනයෙහි . . . . මූලායපටිකස්සන කර්මයෙහි . . . . මානත්ත දනයෙහි . . . . අබ්භාන කර්මයෙහි . . . . උපසම්පද කර්මයෙහි ආදිය කවරෙ යැ. මධ්‍යය කවරෙ යැ, අවසානය කවරේ යැ යත් :

2. තජ්ජනීය කර්මයාගේ සන්හිඳුම්හි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, නියස්ස කර්මයාගේ සන්හිඳුම්හි . . . . පබ්බාජනීය කර්මයාගේ සන්හිඳුම්හි . . . . පටිසාරණීය කර්මයාගේ සන්හිඳුම්හි . . . . උක්ඛෙපනීය කර්මයාගේ සන්හිඳුම්හි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් :

3. සතිවිනයයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, අමූළ්හවිනයෙහි . . . . තස්සපාපියාසිකායෙහි . . . . තිණවත්ථාරකයෙහි . . . . භික්ඛුනොවාදකසම්මුතියෙහි . . . . තිචීවරඅවිප්පවාස සම්මුතියෙහි . . . . සන්ථතසම්මුතියෙහි . . . . රූපියඡඩ්ඩකසම්මුතියෙහි . . . . සාටියගාහාපකසම්මුතියෙහි . . . . පත්තගාහාපකසම්මුති යෙහි . . . . දණ්ඩසම්මුතියෙහි . . . . සික්කාසම්මුතියෙහි . . . . දණ්ඩසික්කාසම්මුතියෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් :

**පුච්ඡා නිමි.**

---

## විසජ්ජනය

1. උපොසථ කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, යත් : සාමග්ගිය උපොසථ කර්මයෙහි ආදිය වෙයි, (පාමොක් දෙසීම්) ක්‍රියාව මධ්‍යය වෙයි, (පාමොක්) නිමාව අවසානය වේ.

2. පවාරණ කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යත් : සාමග්ගිය පවාරණ කර්මයෙහි ආදිය වෙයි, (පවාරණ ඤත්ති පවාරණ කථා සංඛ්‍යාත) ක්‍රියාව මධ්‍යය වෙයි, (සඞ්ඝ නවකයා ගේ '' පස්සන්තො පටිකරිස්සාමි '' යන වචන සංඛ්‍යාත) නිමාව අවසානය වේ.

3. තජ්ජනීය කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, යත් : වස්තුව ද පුද්ගලයා ද තජ්ජනීය කර්මයෙහි ආදිය වෙයි, ඤත්තිය මධ්‍යය වෙයි, කර්මවාක්‍යය අවසානය වේ.

4. නියස්ස කර්මයෙහි . . . . පබ්බාජනීය කර්මයෙහි . . . . පටිසාරණීය කර්ම යෙහි . . . . උක්ඛෙපනීය කර්මයෙහි . . . . පරිවාසදනයෙහි . . . . මූලායපටිකස්සන යෙහි . . . . මානත්තදනයෙහි . . . . අබ්භාන කර්මයෙහි . . . .



Free Distribution www.aathaapi.org

5. උපසම්පදකම්මස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: උපසම්පදකම්මස්ස පුග්ගලො ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

6. තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: තජ්ජනීයකම්මස්ස පටිප්පස්සද්ධියා සම්මාවත්තනා ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

7. නියස්සකම්මස්ස -පෙ- පබ්බාජනීයකම්මස්ස -පෙ- පටිසාරණීය-කම්මස්ස -පෙ- උක්ඛෙපනීයකම්මස්ස පටිප්පස්සද්ධියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: උක්ඛෙපනීයකම්මස්ස පටිප්පස්සද්ධියා සම්මා වත්තනා ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

8. සතිවිනයස්ස කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: සතිවිනයස්ස වත්ථු ච පුග්ගලො ච ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

9. අමූළ්හවිනයස්ස -පෙ- තස්ස පාපිය්‍යසිකාය -පෙ- තිණවත්ථාර-කස්ස -පෙ- භික්ඛුනොවාදකසම්මුතියා -පෙ- තිචීවරෙන අවිප්පවාස-සම්මුතියා -පෙ- සන්ථතසම්මුතියා -පෙ- රූපියඡඩ්ඩකසම්මුතියා -පෙ-සාටියගාහාපකසම්මුතියා -පෙ- පත්තගාහාපකසම්මුතියා -පෙ- දණ්ඩ-සම්මුතියා -පෙ- සික්කාසම්මුතියා -පෙ- දණ්ඩසික්කාසම්මුතියා කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානන්ති: දණ්ඩසික්කාසම්මුතියා වත්ථු ච පුග්ගලො ච ආදි, ඤත්ති මජ්ඣෙ, කම්මවාචා පරියොසානං.

විස්සජ්ජනා නිට්ඨිතා

උපොසථාදි පුච්ඡාවිස්සජ්ජනා නිට්ඨිතා.

Free Distribution www.aathaapi.org

5. උපසම්පද කර්මයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ, යත් : පුද්ගලයා උපසම්පද කර්මයෙහි ආදිය වෙයි, ඤත්තිය මධ්‍යය වෙයි, කර්මවාක්‍යය අවසානය වේ.

6. තජ්ජනීය කර්මයාගේ සන්හිඳීමෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් : මනා පැවැත්ම තජ්ජනීය කර්මයාගේ සන්හිඳීමෙහි ආදිය වෙයි, ඤත්තිය මධ්‍යය වෙයි, කර්ම වාක්‍යය අවසානය වේ.

7. නියස්ස කර්මයාගේ .... පබ්බාජනීය කර්මයාගේ .... පටිසාරණීය කර්මයාගේ .... උක්ඛෙපනීය කර්මයාගේ සන්හිඳීමෙහි ආදිය කවරෙ යැ මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් : මනා පැවැත්ම උක්ඛෙපනීය කර්මයාගේ සන්හිඳීමෙහි ආදිය වෙයි, ඤත්තිය මධ්‍යය වෙයි, කර්ම වාක්‍යය අවසානය වේ.

8. සතිවිනයෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් : වස්තුව ද පුද්ගලයා ද සතිවිනයෙහි ආදිය වෙයි, ඤත්තිය මධ්‍යය වෙයි, කර්ම වාක්‍යය අවසානය වේ.

9. අමූළ්හවිනයෙහි .... තස්සපාපියාසිකාවෙහි .... තිණවත්ථාරකයෙහි .... භික්ඛුනොවාදකසම්මුතියෙහි .... තිචීවරඅවිප්පවාසසම්මුතියෙහි .... සන්ථත සම්මුතියෙහි .... රූපියඡඩ්ඩකසම්මුතියෙහි .... සාටියගාහාපකසම්මුතියෙහි .... පත්තගාහාපකසම්මුතියෙහි .... දණ්ඩසම්මුතියෙහි .... සික්කාසම්මුතියෙහි .... දණ්ඩසික්කාසම්මුතියෙහි ආදිය කවරෙ යැ, මධ්‍යය කවරෙ යැ, අවසානය කවරෙ යැ යත් : වස්තුව ද පුද්ගලයා ද දණ්ඩසික්කාසම්මුතියෙහි ආදිය වෙයි. ඤත්තිය මධ්‍යය වෙයි, කර්මවාක්‍යය අවසානය වේ.

**විස්සජ්ජනය නිමි.**

**උපොසථාදිපුච්ඡාවිස්සජ්ජනා නිමි.**

---

# අත්ථවසප්පකරණං

1. දස අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය.

2. යං සඞ්ඝසුට්ඨු, තං සඞ්ඝඵාසු. යං සඞ්ඝඵාසු, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය. යං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, තං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. යං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, තං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය. යං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, තං සම්පරායිකානං ආසවානං පටිඝාතාය. යං සම්පරායිකානං ආසවානං පටිඝාතාය, තං අප්පසන්නානං පසාදාය. යං අප්පසන්නානං පසාදාය, තං පසන්නානං භිය්‍යොභාවාය. යං පසන්නානං භිය්‍යොභාවාය, තං සද්ධම්මට්ඨිතියා. යං සද්ධම්මට්ඨිතියා, තං විනයානුග්ගහාය.

3. යං සඞ්ඝසුට්ඨු, තං සඞ්ඝඵාසු. යං සඞ්ඝසුට්ඨු, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය. යං සඞ්ඝසුට්ඨු, තං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. යං සඞ්ඝසුට්ඨු, තං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය. යං සඞ්ඝසුට්ඨු, තං සම්පරායිකානං ආසවානං පටිඝාතාය. යං සඞ්ඝසුට්ඨු, තං අප්පසන්නානං පසාදාය. යං සඞ්ඝසුට්ඨු, තං පසන්නානං භිය්‍යොභාවාය. යං සඞ්ඝසුට්ඨු, තං සද්ධම්මට්ඨිතියා. යං සඞ්ඝසුට්ඨු, තං විනයානුග්ගහාය.

4. යං සඞ්ඝඵාසු, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය. යං සඞ්ඝඵාසු, තං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. යං සඞ්ඝඵාසු, තං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, යං සඞ්ඝඵාසු, තං සම්පරායිකානං ආසවානං පටිඝාතාය. යං සඞ්ඝඵාසු, තං අප්පසන්නානං පසාදාය. යං සඞ්ඝඵාසු, තං පසන්නානං භිය්‍යොභාවාය. යං සඞ්ඝඵාසු, තං සද්ධම්මට්ඨිතියා. යං සඞ්ඝඵාසු, තං විනයානුග්ගහාය. යං සඞ්ඝඵාසු, තං සඞ්ඝසුට්ඨු.

5. යං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය -පෙ- යං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය-පෙ-යං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය -පෙ-යං සම්පරායිකානං ආසවානං පටිඝාතාය -පෙ- යං අප්පසන්නානං පසාදාය -පෙ- යං පසන්නානං භිය්‍යොභාවාය -පෙ- යං සද්ධම්මට්ඨිතියා- පෙ-



Free Distribution www.aathaapi.org

# අත්ථවසප්පකරණය

1. කරුණු දසයක් පිණිස තථාගතයන් වහන්සේ විසින් ශ්‍රාවකයනට ශික්ෂාපද පණවන ලදි : සඞ්ඝයාගේ මනාබව පිණිස යැ, සඞ්ඝයාගේ පහසු බව පිණිස යැ, දුසිල් පුහුලන් නිගැන්ම පිණිස යැ, ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස යැ, දිටුදැමියෙහි විඳිය යුතු දුක්ගැහැට වැළක්ම පිණිස යැ, පරලෙව්හි විඳිය යුතු දුක්ගැහැට නැසීම පිණිස යැ, නො පහන්වූවන් හෝ පහදනා පිණිස යැ, පහන්වූවන් හෝ වැඩියක් පහදනා පිණිස යැ, තුන් සසුනේ පැවැත්ම පිණිස යැ, විනයට රුකුල් පිණිස යි.

2. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය සඞ්ඝයාගේ පහසුව පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය දුසිල් පුහුලන්ගේ නිගැන්ම පිණිස වෙයි. යමක් දුසිල් පුහුලන් නිගැන්ම පිණිස වේ ද, එය ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස වෙයි. යමක් ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස වේ ද, එය දිටු දැමියෙහි වින්ද යුතු දුක් ගැහැට වැළක්ම පිණිස වෙයි. යමක් දිටු දැමියෙහි වින්ද යුතු දුක් ගැහැට වැළක්ම පිණිස වේ ද, එය පරලෙව්හි වින්ද යුතු දුක් ගැහැට නැසීම පිණිස වෙයි. යමක් පරලෙව්හි වින්ද යුතු දුක් ගැහැට නැසීම පිණිස වේ ද, එය නො පහන්වූවන් පහදනා පිණිස වෙයි. යමක් නො පහන්වූවන් පහදනා පිණිස වේ ද, එය පහන්වූවන් වැඩියක් පහදනා පිණිස වෙයි. යමක් පහන්වූවන් වැඩියක් පහදනා පිණිස වේ ද, එය තුන් සසුන් පැවැත්ම පිණිස වෙයි. යමක් තුන් සසුන් පැවැත්ම පිණිස වේ ද, එය විනයට රුකුල් පිණිස වේ.

3. යමක් සඞ්ඝයාගේ මනාබව වේ ද, එය සඞ්ඝයාගේ පහසුව පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය දුසිල් පුහුලන් නිගැන්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය දිටු දැමියෙහි වින්ද යුතු දුක් ගැහැට වැළක්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය පරලෙව්හි වින්ද යුතු දුක් ගැහැට නැසීම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය නො පහන්වූවන් පහදනා පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය පහන්වූවන් වැඩියක් පහදනා පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනා බව පිණිස වේ ද, එය තුන් සසුන් පැවැත්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ මනාබව පිණිස වේ ද, එය විනයට රුකුල් පිණිස වේ.

4. යමක් සඞ්ඝාගේ පහසුව පිණිස වේ ද, එය දුසිල් පුඟලන් නිගැන්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය ප්‍රියශීල භික්ෂූන්ගේ පහසුව පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය දිටු දැමියෙහි වින්ද යුතු දුක් ගැහැට වැළක්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය පරලෙව්හි වින්ද යුතු දුක් ගැහැට නැසීම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය නො පහන්වූවන් පහදනා පිණිස වෙයි. යමක් සඞ්ඝාගේ පහසුව පිණිස වේ ද, එය පහන් වූවන් වැඩියක් පහදනා පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය තුන් සසුන් පැවැත්ම පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව වේ ද, එය විනයට රුකුල් පිණිස වෙයි. යමක් සඞ්ඝයාගේ පහසුව පිණිස වේ ද, එය සඞ්ඝයාගේ මනා බව පිණිස වේ.

5. යමක් දුසිල් පුහුලන් නිගැන්ම පිණිස වේ ද . . . . . යමක් ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස වේ ද . . . . යමක් දිටු දැමියෙහි වින්ද යුතු දුක් ගැහැට වැළැක්ම පිණිස වේ ද . . . . යමක් පරලෙව්හි වින්ද යුතු දුක් ගැහැට නැසීම පිණිස වේ ද . . . . යමක් නො පහන්වූවන් පැහැදීම පිණිස වේ ද . . . . යමක් පහන්වූවන් වැඩියක් පහදනා පිණිස වේ ද . . . . යමක් තුන් සසුන් පැවැත්ම පිණිස වේ ද . . . .

6. යං විනයානුග්ගහාය, තං සඞ්ඝසුට්ඨු. යං විනයානුග්ගහාය, තං සඞ්ඝඵාසු. යං විනයානුග්ගහාය, තං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය. යං විනයානුග්ගහාය, තං පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. යං විනයානුග්ගහාය, තං දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය. යං විනයානුග්ගහාය, තං සම්පරායිකානං ආසවානං පටිඝාතාය. යං විනයානුග්ගහාය, තං අප්පසන්නානං පසාදාය. යං විනයානුග්ගහාය, තං පසන්නානං භිය්‍යොභාවාය. යං විනයානුග්ගහාය තං සද්ධම්මට්ඨිතියාති.

අත්ථසතං ධම්මසතං ද්වෙ නිරුත්තිසතානි ච,
චත්තාරි ඤාණසතානි අත්ථවසෙ පකරණෙති.

අත්ථවසප්පකරණං නිට්ඨිතං

---

මහාවග්ගො නිට්ඨිතො

---

තස්සුද්දානං :

1. පඨමං අට්ඨ පුච්ඡාය පච්චයෙසු පුනට්ඨ ච,
භික්ඛූනං සොළස එතෙ භික්ඛුනීනම්පි සොළස.

2. පෙය්‍යාල අන්තරා භෙදා එකුත්තරිකමෙව ච,
පවාරණත්ථවසිකා මහාවග්ගස්ස සඞ්ගහාති.

---

6. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය සඞ්ඝයාගේ මනාබව පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය සඞ්ඝයාගේ පහසුව පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය දුසිල් පුඟුලන් නිගැන්ම පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය දිටු දැමියෙහි වින්ද යුතු දුක්ගැහැට වැළක්ම පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය පරලෙව්හි වින්ද යුතු දුක්ගැහැට නැසීම පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය නො පහන්වූවන් පහදනා පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය පහන් වූවන් වැඩියක් පහදනා පිණිස වෙයි. යමක් විනයට රුකුල් පිණිස වේ ද, එය තුන් සසුන් පැවැත්ම පිණිස වේ.

අර්ථවශප්‍රකරණයෙහි (සඞ්ඝසුට්ඨු යනාදි දශයෙහි දසවර බැගින්) අර්ථශතයෙක් ද, ධර්මශතයෙක් ද නිරුක්තීන්ගේ වශයෙන් ද්විශතයෙක් දැයි සතර ඥාන ශතයෙක් වේ.

**අත්ථවස ප්‍රකරණය නිමි.**

---

## මහාවර්ගය නිමියේ යි.

---

එහි නාමාවලිය :

1. භික්ෂු විභඞ්ගයෙහි පළමු වැ පුච්ඡාවාර අට යැ නැවත පච්චයවාර අට යැයි භික්ෂූන් පිළිබඳ සොළොස ද භික්ෂුණීවිභඞ්ගයෙහි සොළොස දැයි මොහු වෙත්.

2. අන්තරපෙයාාල යැ (සමථ) භෙද යැ එකුත්තරික නය යැ පවාරණ යැ අත්ථවස යැයි මහාවර්ගයාගේ සඞ්ග්‍රහය වේ.

---

# ගාථාසඞ්ගණිකං

1. එකංසං චීවරං කත්වා පග්ගහෙත්වාන[1] අඤ්ජලිං,
ආසිංසමානරූපො ව[2] කිස්ස ත්වං ඉධ මාගතො.

2. ද්වීසු විනයෙසු පඤ්ඤත්තා යෙ උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු,
කති තෙ සික්ඛාපදානි හොන්ති කතිසු නගරෙසු පඤ්ඤත්තා.

3. භද්දකො තෙ උම්මග්ගො[3] යොනිසො පරිපුච්ඡසි,
තග්ඝ තෙ අහමක්ඛිස්සං යථාපි කුසලො තථා.

4. ද්වීසු විනයෙසු පඤ්ඤත්තා යෙ උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු,
අඩ්ඪුඩ්ඪසතානි තෙ හොන්ති සත්තසු නගරෙසු පඤ්ඤත්තා.

5. කතමෙසු සත්තසු නගරෙසු පඤ්ඤත්තා ඉඞ්ඝ මෙ ත්වං බ්‍යාකර[4],
තං වචනපථං[5] නිසාමයිත්වා පටිපජ්ජෙම හිතාය නො සියාති.

6. වෙසාලියං රාජගහෙ සාවත්ථියං ච ආළවියං,
කොසම්බියං ච සක්කෙසු භග්ගෙසු චෙව පඤ්ඤත්තා.

7. කති වෙසාලියං පඤ්ඤත්තා කති රාජගහෙ කතා,
සාවත්ථියං කති හොන්ති කති ආළවියං කතා.

8. කති කොසම්බියං පඤ්ඤත්තා, කති සක්කෙසු වුච්චන්ති,
කති භග්ගෙසු පඤ්ඤත්තා තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

9. දස වෙසාලියං පඤ්ඤත්තා එකවීස රාජගහෙ කතා,
ඡ ඌන තීනි සතානි සබ්බෙ සාවත්ථියං කතා.

10. ඡ ආළවියං පඤ්ඤත්තා අට්ඨ කොසම්බියං කතා,
අට්ඨ සක්කෙසු වුච්චන්ති තයො භග්ගෙසු පඤ්ඤත්තා.

11 යෙ වෙසාලියං පඤ්ඤත්තා තෙ සුණොහි යථා තථං,[6]
මෙථුන විග්ගහුත්තරි අතිරෙකඤ්ච කාළකං.

12. භූතං පරම්පරභත්තං දන්තපොනෙන අචෙලකො,
භික්ඛුනීසු ච අක්කොසො දසෙතෙ වෙසාලියං කතා.

---

1. පග්ගණ්හිත්වාන – මජසං.
2. ආසීසමාන රූපොව – මජසං.
3. උම්මඞ්ගො – මජසං. ස්‍යා. සීමු.
4. ඉඞ්ඝ මෙ ත්වං බ්‍යාකරතා – මජසං.
5. තව වචනපථං – ස්‍යා.
6. යථාතථං – සීමු. 2, මජසං.



Free Distribution www.aathaapi.org

# ගාථාසඞ්ගණිකය

1. සිවුර එකස් කොට පෙරැ වැ ඇඳිලි බැඳ ගෙණ කිසිවක් පතන්නකු සේ තෙපි කුමට මෙහි අවු ද ?

2. (භික්ෂු-භික්ෂුණී) උභය විනයයෙහි පණවන ලද යම් සිකපද කෙනෙක් පෙහෙවස් දිනයන්හි උදෙසීමට එත් ද, ඒ සිකපදයෝ කෙතෙක-කෙතෙක් නගරයන්හි පණවන ලදහු වෙත් ද ?

3. තොපගේ උන්මාර්ගය (ප්‍රඥව) අවිද්‍යාන්ධකාරයෙන් ඉල්පී සිටි බැවින් සුන්දර යැ. නුවණින් විචාරහු, එහෙයින් මම තොපට දක්ෂයකු සෙයින් පවසන්නෙමි.

4. යම් සිකපද කෙනෙක් උභය විනයයෙහි පණවන ලද්දහු පෙහෙවස් දිනයන්හි උදෙසීමට පැමිණෙත් ද, ඔහු තුන් සිය පණසෙක් වෙති. නගර සතෙකැ පණවන ලද්දහ.

5. කවර නගර සතෙක දී පණවන ලදහු දැයි ඔබ මට විසඳා පවසනු මැනවි, ඒ වදන් මග අසා පිළිපදිමු. එය අපට හිත පිණිස වන්නේ යැ.

6. විසල් පුරයෙහි දී ද රජගහ නුවර දී ද සැවැත් නුවර දී ද අලවි පුරයෙහි දී ද කොසඹැ නුවර දී ද ශාක්‍ය දනවුහි ද භග්‍ග දනවුහි ද පණවන ලදහු.

7. විසල් පුරයෙහි දී කෙතෙක් සිකපදයෝ පණවන ලදහු ද ? රජගහ නුවරදී කෙතෙක් පණවන ලදහු ද ? සැවැත් නුවර දී පණවන ලද ශික්ෂාවෝ කෙතෙක් වෙද්ද, අළවි පුරයෙහි දී කෙතෙක් පණවන ලදහු ද ?

8. කොසඹැ නුවර දී කෙතෙක් පණවන ලදහු ද ? ශාක්‍ය දනවුහි කෙතෙකැ යි කියනු ලැබෙත් ද ? භග්‍ග දනවුහි කෙතෙක් පණවන ලදහු ද ? මා විසින් විචාරණ ලද ඔබ එය මට වදළ මැනැව.

9. විසල් පුරයෙහි දී සිකපද දසයෙක් පණවන ලදි. රජගහ නුවර දී එක්විස්සෙක් පණවන ලදි. සයකින් අඩු තුන්සියක් හැම ශික්ෂාවෝ සැවැත් නුවර දී පණවන ලදහ.

10. අලවි පුරයෙහි දී සයෙක් පණවන ලදි. කොසඹැ නුවර දී අටෙක් පණවන ලදි. ශාක්‍ය දනවුහි අටෙකැ යි කියනු ලැබෙයි, භග්‍ග දනවුහි තුනෙක් පණවන ලදි.

11. විසල් පුරයෙහි දී යම් සිකපද කෙනෙක් පණවන ලදහු ද, ඔවුන් මෙසේ අසව: මෛථුන යැ මනුෂ්‍යවිග්‍රහ යැ උත්තරිමනුෂ්‍යධර්ම යැ අතිරෙකපාත්‍ර යැ ශුද්ධකාළක යැ.

12. භූතාරොචන යැ පරම්පරභොජන යැ දන්තපොන ය සමග අවෙළක යැ භික්ෂුණීන් කෙරෙහි ආක්‍රොශය දැයි යන මේ දස සිඛය විසල්පුර දී පණවන ලදි.

13. යෙ රාජගහෙ පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,[1]
අදින්නාදානං රාජගහෙ ද්වෙ අනුද්ධංසනාපි ච.

14 ද්වෙ පිච භෙද අනන්තරවාසකං රූපියං සුත්තං උජ්ඣාපනෙන ච
පාචිතපිණ්ඩං ගණභොජනං විකාලෙ ච චරිත්තං නහානං
ඌනවීසති.

15. චීවරං දත්වා වොසාසන්ති එතෙ රාජගහෙ කතා,
ගිරග්ගචරියා තත්ථෙව ඡන්දදානෙන එකවීසති.

16. යෙ සාවත්ථියං පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,
පාරාජිකානි චත්තාරි සඞ්ඝාදිසෙසා භවන්ති සොළස.

17. අනියතා ච ද්වෙ හොන්ති නිස්සග්ගියා චතුතිංසති,[2]
ඡ පඤ්ඤාසසතඤ්චෙව ඛුද්දකානි පවුච්චන්ති.

18. දසයෙව ච ගාරය්හා ද්වෙ සත්තති ච සෙඛියා,
ඡ ඌන තීණි සතානි සබ්බෙ සාවත්ථියං කතා.

19. යෙ ආළවියා පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,
කුටි කොසිය සෙය්‍යා ච ඛනනෙ ගච්ඡ දෙවතෙ;
සප්පාණකඤ්ච සිඤ්චන්ති ඡ එතෙ ආළවියං කතා.

20. යෙ කොසම්බියං පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,[1]
මහාවිහාරො දොවචස්සං අඤ්ඤං ද්වාරං සුරාය ච,
අනාදරියං සහධම්මො, පයො පානෙන අට්ඨමං.

21. යෙ ච සක්කෙසු පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,[1]
එළකලොමානි පත්තො ච ඔවාදො චෙව භෙසජ්ජං.

22. සූචි ආරඤ්ඤකො චෙව ඡ එතෙ[3] කාපිලවත්ථවෙ,
උදකසුද්ධියා ඔවාදො භික්ඛුනීසු පවුච්චන්ති.

23. යෙ ච භග්ගෙසු පඤ්ඤත්තා තෙ සුණොහි යථා කථං,[1]
සමාදහිත්වා විසිබ්බෙන්ති සාමිසෙන සසිත්ථකං.

24. පාරාජිකානි චත්තාරි සඞ්ඝාදිසෙසානි භවන්ති,
සත්ත නිස්සග්ගියා අට්ඨ ද්වත්තිංසති ච ඛුද්දකා.

25. ද්වෙ ගාරය්හා තයො සෙඛා[4] ඡ පඤ්ඤාස සික්ඛාපදා,
ඡසු නගරෙසු පඤ්ඤත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා

26. ඡ ඌන තීණි සතානි සබ්බෙ සාවත්ථියං කතා,
කාරුණිකෙන බුද්ධෙන ගොතමෙන යසස්සිනා.

---

1. යථාතථං - සීමු. 2. මජසං.
2. චතුවීසති - සීමු, මජසං, සයා.
3. අට්ඨෙතෙ - මජසං.
4. සික්ඛා - මජසං.

13. රජගහ නුවර දී යම් සිකපද කෙනෙක් පණවන ලදහු ද, ඔවුන් අසව, කෙසේ යැ යත් : රජගහ නුවර දී අදින්නාදන යැ අනුද්ධංසනා දෙක යැ.

14. සඞ්ඝභෙදකභෙදානුවත්තක දෙක යැ අන්තරවාසක යැ රූපියසංවොහාර යැ (සාමං) සුත්ත යැ උජ්ඣාපනකය සමග (භික්ඛුණී) පරිපාචිත පිණ්ඩ යැ ගණභොජන යැ විකාලභොජන යැ ගාමචාරිත්ත යැ නහාන යැ ඌනවීසතිවස්ස යැ.

15. චීවර දත්වා යැ වොසාසනක යැ එහි ම ගිරග්ග යැ චාරිකා යැ අපක්කමන යැ ඡන්දදනය සමඟ එක් විස්සක් වූ මේ සිකපදයෝ රජගහ නුවර දී පණවන ලදහ.

16. යම් සිකපද කෙනෙක් සැවැත් නුවර දී පණවන ලදහු ද, ඔවුන් අසව. කෙසේ යැ යත් : මෙහෙණන් පිළිබඳ වූ සිවු පරිජි ද සොළොස් සඟවෙසෙස්හු ද වෙති.

17. අනියත දෙක ද නිසගි සූතිසෙක් ද වෙයි, එක් සිය සපණස් පචිතීහු ද කියනු ලැබෙත්.

18. දස ගාරයහ (පාටිදෙසනීය) සිඛ ද, දෙ සැත්තෑ සෙඛියා දූයි සැවැතෙහි දී පණවන ලද සියලු සිකපද සයෙකින් අඩු තුන්සියයෙකි.

19. යම් සිකපද කෙනෙක් අළව්පුර දී පණවන ලදහු ද, ඔවුන් අසව. කෙසේ යැ යත් : සඤ්ඤාචිතකුටි යැ, කොසිය යැ සහසෙය්‍යා යැ, පඨවිඛණන යැ, භූතගාම යැ, සප්පාණකසිඤ්චන යැයි තෙල ස සිඛයෝ අළව් පුර දී පණවන ලදහ.

20. යම් සිකපද කෙනෙක් කොසඹෑ නුවර දී පණවන ලදහු ද, ඔවුන් අසව. කෙසේ යැ යත් : මහල්ලකවිහාර යැ, දොවචස්ස යැ, අඤ්ඤවාදක යැ, යාවද්වාරකොස යැ, සුරාපාන යැ, අනාදරිය යැ, සහධම්මික යැ, සුරුසුරුකාරකයෙන් අටවැනි වූ සිකපද යි.

21. යම් සිකපද කෙනෙක් ශාක්‍ය ජනපදයෙහි දී පණවන ලදහු ද, ඔවුන් අසව. කෙසේ යැ යත් : එළකලොම ධොවන යැ, ඌනපංචබන්ධන යැ, භික්ඛුනොවාද යැ, භෙසජ්ජ විඤ්ඤපන යැ.

22. සුවිසර යැ, ආරඤ්ඤක යැ, මෙහෙණන් කෙරෙහි වූ උදකශුද්ධිකය සමඟ ඔවාද යැ යි යන තෙල අට සිඛය කිඹුල්වත් නුවර දී පණවන ලදූයි කියනු ලැබෙ.

23. යම් සිකපද කෙනෙක් භගුදනාවුහි දී පණවන ලදහු ද, ඔවුන් අසව. කෙසේ යැ යත් : ජොතිසමාදහන යැ, සාමිසය සමග සසිත්ථකසිඛ යැයි (යන තුන් සිඛය භගුදනාවුහි දී පනවන ලදී.)

24. පරිජි සතරෙක් ද සඟවෙසෙස් සතෙක් ද නිසඟි අටෙක් ද පචිතී දෙතිසෙක් ද.

25. ගාරය්හ දෙකෙක් ද සෙඛිය තුණෙක් දූයි සපණස් සිකපද කෙනෙක් සුයඞ්බන්ධු වූ බුදුන් විසින් නගර සයෙක දී පණවන ලදහ.

26. කාරුණික වූ යශස්වී වූ ගෞතම ගොත්‍ර ඇති බුදුරජුන් විසින් සයකින් අඩු සෙසු සියලු තෙසිය සිකපදයෝ සැවැතෙහි දී පණවන ලදහු යි.

---

## චතුවිපත්ති

1. යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො,
තං තං බ්‍යාකතං අනඤ්ඤථා;
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රූහි.

2. ගරුකලහුකඤ්චාපි සාවසෙසං නාවසෙසං.
දුට්ඨුල්ලඤ්ච අදුට්ඨුල්ලං යෙ ච යාවතතියකා.

3. සාධාරණාසාධාරණං විපත්තියො[1] යෙහි සමථෙහි සම්මන්ති,
සබ්බානිපෙතානි වියාකරොහි හන්ද වාක්‍යං සුණොම තෙ.

4 එකතිංසා යෙ ගරුකා අට්ඨෙත්ථ අනවසෙසා,
යෙ ගරුකා තෙ දුට්ඨුල්ලා යෙ දුට්ඨුල්ලා සා සීලවිපත්ති.

5. පාරාජිකං සඞ්ඝාදිසෙසො සීලවිපත්තීති වුච්චති,
ථුල්ලච්චයං පාචිත්තියං පාටිදෙසනීයං තථා.

6. දුක්කටං දුබ්භාසිතං යො චායං අක්කොසති,
හස්සාධිප්පායො අයං සා ආචාරවිපත්ති සම්මතා.

7. විපරීතදිට්ඨිං ගණ්හන්ති අසද්ධම්මෙහි පුරක්ඛතා,
අබ්භාචික්ඛන්ති සම්බුද්ධං දුප්පඤ්ඤා මොහපාරුතා
අයං සා දිට්ඨිවිපත්තිසම්මතා.

8. ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආජීවහෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති, ආජීවහෙතු ආජීවකාරණා 'යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහා'ති භණති, ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති, ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති. අයං සා ආජීවවිපත්ති සම්මතා.

9. එකාදස යාවතතියකා තෙ සුණොහි යථා කථං,
උක්ඛිත්තානුවත්තකා අට්ඨ යාවතතියකා;
අරිට්ඨො චණ්ඩකාළී ච ඉමෙ තෙ යාවතතියකා.

---

1. විභත්තියො - මජසං.

## චතු විපත්තිහු

1. යම් ඒ (ශික්ෂාපද භෙදයක්) විචාළෙමු ද, ඒ භෙදය අපට වදාළ සේක. ඒ ඒ සිඛ නො වෙනස් ව පවසන ලදී. ඔබගෙන් අනෙකක් පුළුවුස්මි. එබැවින් එය වදාළ මැනැවැ.

2. ගරුලහු ඇවැත් ද සාවසෙස අනවසෙස ඇවැත් ද තුළුල් නොතුළුල් ඇවැත් ද යාවතතියක ඇවැත් ද,

3. සාධාරණ අසාධාරණ ඇවැත් ද විපත්ති භෙදය ද ශමථ භෙදය ද මේ සියල්ල වදාළ මැනැවි. දැන් ඔබගේ වචනය අසමු.

4. (මහණ මෙහෙණන් පිළිබඳ පැණ වූ) යම් ගරු ඇවැත් එක්තිසෙක් වේ ද ඔවුනතුරෙහි අටදෙනෙක් සාවසෙස වෙති, යම් ඇවැත් කෙනෙක් ගරුක වෙත් ද ඔහු දුට්ඨුල්ල නම් වෙති, යම් ඇවැත් කෙනෙක් දුට්ඨුල්ල වෙත් ද ඒ සීලවිපත්ති නමු.

5. පරිජි සඟවෙසෙස් සීලවිපත්ති යයි කියනු ලැබෙ. ථුලැසි යැ පචිති යැ එසේ ම පිළිදෙස්නි යැ.

6. දුකුළා යැ කෙළි සිනා අදහස් ඇති වැ යම් මේ පුද්ගලයෙක් ගටා බෙණේ ද මේ දුබැසිය දැයි යන මේ ඇවැත් ආචාරවිපත්ති යි සම්මත යි.

7. අසද්ධර්මයන් විසින් පෙරටු කරණ ලද නුවණ නැත්තා වූ මොහයෙන් වැසී සිටියෝ මිසදිටුව ගණිත් ද, බුදුරජුන්ට නැතිදොස් පහළ කෙරෙත් ද, මේ දිට්ඨිවිපත්ති යි සම්මත යි.

8. ආජීව හෙතුයෙන් ආජීව කාරණයෙන් ලාමක අදහස් ඇත්තේ ලාමක අදහසින් මඩනා ලදුයේ තමා කෙරෙහි නැති තමා කෙරෙහි නොවූ උතුරුමිනිස්දම් පවසා ද, ආජීව හෙතුයෙන් ආජීව කාරණයෙන් සඤ්චරිත්තයට පැමිණේ ද, ආජීව හෙතුයෙන් ආජීව කාරණයෙන් ''තොපගේ වෙහෙර යමෙක් වෙසේ ද ඒ මහණ රහත්'' යි කියා ද, ආජීව හෙතුයෙන් ආජීවකාරණයෙන් මහණ තමා පිණිස පිණීබොජුන් විනවා ගෙණ වළඳා ද, ආජීව හෙතුයෙන් ආජීව කාරණයෙන් මහණෙක් සූප හෝ ඔදන හෝ නොගිලන් වැ තමා පිණිස විනවා ගෙණ වළඳා ද, මේ ආජීවවිපත්ති යි සම්මත යි.

9. යාවතතියක සිඛ එකොළොසෙකැ, ඒ කිසේ යැයි අසව : උක්ඛිත්තානුවත්ත යැ, යාවතතියක අට යැ, අරිට්ඨ යැ, චණ්ඩකාළියැ යන මොහු යාවතතියක සිඛයෝ යි.

---

## ඡේදනකාදි

1. කති ඡේදනකානි කති භේදනකානි,
කති උද්ධලනකානි කති අනඤ්ඤපාචිත්තියානි.

2. කති භික්ඛුසම්මුතියො කති සාමීචියො කති පරමානි,
කති ජානන්ති පඤ්ඤත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

3. ඡ ඡේදනකානි එකං භේදනකං,
එකං උද්ධලනකං චත්තාරි අනඤ්ඤපාචිත්තියානි.

4. චතස්සො භික්ඛුසම්මුතියො සත්ත සාමීචියො චුද්දස පරමානි,
සොළස[1] ජානන්ති පඤ්ඤත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

---

## අසාධාරණකාදි

1. වීසං ද්වෙ සතානි භික්ඛූනං සික්ඛාපදානි,
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු.

2. තීණි සතානි චත්තාරි භික්ඛුනීනං සික්ඛාපදානි,
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු.

3. ඡ චත්තාලීසා භික්ඛූනං භික්ඛුනීහි අසාධාරණා,
සතං තිංසා ච භික්ඛුනීනං භික්ඛූහි අසාධාරණා.

4. සතං සත්තති ඡච්චෙව උභින්නං අසාධාරණා,
සතං සත්තති චත්තාරි උභින්නං සමසික්ඛතා.

5. වීසං ද්වෙ සතානි භික්ඛූනං සික්ඛාපදානි,
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු තෙ සුණොහි යථා කථං.

6. පාරාජිකානි චත්තාරි සඞ්ඝාදිසෙසානි භවන්ති තෙරස,
අනියතා ද්වෙ හොන්ති නිස්සග්ගියානි තිංසෙව;
ද්වෙ නවුති ච බුද්ධකා චත්තාරො පාටිදෙසනීයා,
පඤ්ච සත්තති සෙඛියා.

7. වීසං ද්වෙ සතානි ඉමෙ[2] හොන්ති භික්ඛූනං,
සික්ඛාපදානි උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු.

8 තීණි සතානි චත්තාරි භික්ඛුනීනං සික්ඛාපදානි,
උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු තෙ සුණොහි යථා කථං

9. පාරාජිකානි අට්ඨ සඞ්ඝාදිසෙසානි භවන්ති සත්තරස,
නිස්සග්ගියානි තිංසෙව සතං සට්ඨි ඡච්චෙව බුද්ධකානි පවුච්චන්ති.

---

1. සොදස - මජසං.
2. ද්වෙසතානිපිමෙ - සීමු.

## ඡේදනකාදීහු

1. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් පණවන ලද ඡේදනක සිඛ කෙතෙක් ද, භේදනක සිඛ කෙතෙක් ද, උද්දලනක සිඛ කෙතෙක් ද, අනඤ්ඤපචිත්තිසිඛ කෙතෙක් ද,

2. භික්ඛු සම්මුතිසිඛ කෙතෙක් ද, සාමීචිසිඛ කෙතෙක් ද, පරමසිඛ කෙතෙක් ද, ජානන්තිසිඛ කෙතෙක් ද යත් :

3. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් පණවනලද ඡේදනකසිඛ සදෙනෙකැ, එක් භේදනක සිඛයෙකැ, එක් උද්දලනක සිඛයෙකැ, අනඤ්ඤපචිත්තිසිඛ සතරෙකැ.

4. භික්ඛුසම්මුතිසිඛ සතරෙකැ, සාමීචිසිඛ සතෙකැ, පරමසිඛ තුදුසෙකැ, ජානන්තිසිඛ සොළසෙකි.

---

## අසාධාරණකාදීහු

1. මහණුන් පිළිබඳ දෙසිය විස්සෙක් සිකපදයෝ පෙහෙවස්හි උදෙසීමට පැමිණෙති.

2. මෙහෙණුන් පිළිබඳ තුන්සිය සතරෙක් සිකපදයෝ පෙහෙවස්හි උදෙසීමට පැමිණෙත්.

3. මහණුන් පිළිබඳ සසාළිස් සිකපද කෙනෙක් මෙහෙණුන් හා අසාධාරණ වෙති. මෙහෙණුන් පිළිබඳ එක්සියතිස් සිකපද කෙනෙක් මහණුන් හා අසාධාරණ වෙත්.

4. එක්සිය සසැත්තෑ සිකපද කෙනෙක් දෙපසට අසාධාරණ වෙති. එක්සිය සූසැත්තෑ සිකපද කෙනෙක් දෙපසට සම සිඛයෝ වෙත්.

5. මහණුන් පිළිබඳ දෙසිය විස්සෙක් සිකපදයෝ පෙහෙවස්හි උදෙසීමට පැමිණෙත්. ඔවුන් අසව, කිසේ යැ යත් :

6. සිවු පරිජි ද තෙළෙස් සඟවෙසෙස් ද දෙ අනියත ද තිස් නිසඟි ද, දෙ අනූ පචිති ද, සිවු පිළිදෙස්නීහු ද පන්සැත්තෑ සිඛ කරණීහු ද වෙත්.

7. මහණුන් පිළිබඳ මේ දෙසිය විස්සක් වූ සිකපදයෝ පෙහෙවස්හි උදෙසීමට පැමිණෙත්.

8. මෙහෙණුන් පිළිබඳ තුන්සිය සතරක් සිකපදයෝ පෙහෙවස්හි උදෙසීමට පැමිණෙත්. ඔවුන් අසව, කිසේ යැ යත් :

9. අට පරිජි ද සතළොස් සඟවෙසෙස්හු ද වෙති. නිසඟි තිසෙක් මැ යි. පචිතිහු එක්සිය සසැටෙකැයි කියනු ලැබෙත්,

10. අට්ඨ පාටිදෙසනීයා පඤ්ච සත්තති සෙඛියා,
තීණි සතානි චත්තාරිමෙ හොන්ති භික්ඛුනීනං;
සික්ඛාපදානි උද්දෙසං ආගච්ඡන්ති උපොසථෙසු.

11. ඡ චත්තාලීස භික්ඛූනං භික්ඛුනීහි අසාධාරණා,
තෙ සුණොහි යථා කථං.

12. ඡ සඞ්ඝාදිසෙසා ද්වීහි අනියතෙහි[1] අට්ඨ,
නිස්සග්ගියානි ද්වාදස තෙ තෙහි හොන්ති වීසති.

13. ද්වාවීසති ඛුද්දකා චත්තාරො පාටිදෙසනීයා,
ඡ චත්තාලීසාපිමෙ හොන්ති භික්ඛූනං භික්ඛුනීහි අසාධාරණා.

14. සතං තිංසා ච භික්ඛුනීනං භික්ඛූහි අසාධාරණා,
තෙ සුණොහි යථා කථං.[2]

15. පාරාජිකානි චත්තාරි සඞ්ඝම්හා දස නිස්සරෙ,
නිස්සග්ගියා ද්වාදස ඡන්නවුති ච ඛුද්දකා අට්ඨ පාටිදෙසනීයා;
සතං තිංසාපිමෙ හොන්ති භික්ඛුනීනං භික්ඛූහි අසාධාරණා.

16. සතං සත්තති ඡච්චෙව උභින්නං අසාධාරණා,
තෙ සුණොහි යථා කථං.[2]

17. පාරාජිකානි චත්තාරි සඞ්ඝාදිසෙසානි භවන්ති සොළස,
අනියතානි ච ද්වෙ හොන්ති නිස්සග්ගියානි චතුවීසති.

18. සතං අට්ඨාරස චෙව ඛුද්දකානි පවුච්චන්ති ද්වාදස පාටිදෙසනීයා
සතං සත්තති ඡ චෙවපිමෙ හොන්ති උභින්නං අසාධාරණා.

19. සතං සත්තති චත්තාරි උභින්නං සමසික්ඛතා,
තෙ සුණොහි යථා කථං.

20. පාරාජිකානි චත්තාරි සඞ්ඝාදිසෙසානි භවන්ති සත්ත,
නිස්සග්ගියානි අට්ඨාරස සමසත්තති ඛුද්දකා පඤ්ච සත්තති සෙඛියා;
සතං සත්තති චත්තාරිපිමෙ හොන්ති උභින්නං සමසික්ඛතා.

21. අට්ඨෙව පාරාජිකා යෙ දුරාසදා තාලවත්ථුසමූපමා,
පණ්ඩුපලාසො පුථුසිලා සීසච්ඡින්නොව සො නරො.
තාලොව මත්ථකා ඡින්නා අවිරූළ්හී භවන්ති තෙ,

22. තෙවීසති සඞ්ඝාදිසෙසා ද්වෙ අනියතා ද්වෙ චත්තාලීස නිස්සග්ගියා
අට්ඨාසීති සතං පාචිත්තියා ද්වාදස පාටිදෙසනීයා,

23. පඤ්ච සත්තති සෙඛියා තීහි සමථෙහි සම්මන්ති.
සම්මුඛා ච පටිඤ්ඤාය තිණවත්ථාරකෙන ච.

24. ද්වෙ උපොසථා ද්වෙ පවාරණා චත්තාරි කම්මානි ජිනෙන දෙසිතා
පඤ්චෙව උද්දෙසා චත්තාරො භවන්ති අනඤ්ඤථා,
ආපත්තික්ඛන්ධා ච භවන්ති සත්ත.

25. අධිකරණානි චත්තාරි සත්තහි සමථෙහි සම්මන්ති,
ද්වීහි චතූහි තීහි කිච්චං එකෙන සම්මති.

---

1. ද්වෙ අනියතෙහි—මජ්ඣං.
2. යථා තථං—සීමු 2, මජ්ඣං.

10. අට පිළිදෙස්නීහු ද පන්සැත්තෑ සිඛකරණීහු දැයි මෙහෙණන් පිළිබඳ මේ තුන්සිය සතරක් වූ සිකපදයෝ වෙති. ඔහු පෙහෙවස්හි උදෙසීමට පැමිණෙත්.

11. මහණුන් පිළිබඳ සසාළිස් සිකපද කෙනෙක් මෙහෙණන් හා අසාධාරණ වෙති. ඔවුන් අසව, කිසේ යැ යත් :

12. සඟවෙසෙස් සදෙන දෙ අනියතය සමග අටෙකි. නිසඟි දොළොස යැ, ඔහු යථොක්තයන් හා විස්සක් වෙති.

13. පචිති දෙවිස්සෙකි. පිළිදෙස්නී සතරෙකි. මහණුන් පිළිබඳ මේ සසාළිස් සිඛයෝ මෙහෙණන් හා අසාධාරණ වෙත්.

14. මෙහෙණන් පිළිබඳ එක්සියතිසක් සිකපදයෝ මහණුන් හා අසාධාරණ වෙති. ඔවුන් අසව කිසේ යැ යත් :

15. සතර පරිජි ද සඞසයා කෙරෙන් බැහැර කටයුතු නිස්සාරණීය නම් වූ දස සඟවෙසෙස් ද දොළොස් නිසඟීහු ද සයානූ සුද්ධ පචිති ද අට පිළිදෙස්නීහු දැයි මෙහෙණන් පිළිබඳ මහණුන් හා අසාධාරණ වූ මොහු එක්සියතිස් සිඛයෝ වෙත්.

16. මහණ මෙහෙණ දෙපසට අසාධාරණ වූ සිඛ එක්සිය සසැත්තෑවෙක් මැ යි ඔවුන් අසව, කිසේ යැ යත් :

17. පරිජි සතරෙක් ද සඟවෙසෙස් සොළසෙක් ද වෙයි. දෙ අනියත ද සූවිසි නිසඟි ද වෙයි.

18. එක්සිය අටළොස් පචිතිහු ද දොළොස් පිළිදෙස්නීහු ද කියනු ලැබෙත්.

(මහණ-මෙහෙණ) දෙපසට අසාධාරණ වූ මේ එක්සිය සසැත්තෑ ශික්ෂාවෝ වෙති.

19. මහණ-මෙහෙණ උභය සාධාරණ ශික්ෂාවෝ එක්සියසිවුසැත්තෑ කෙනෙකි. ඔවුන් මෙසේ අසව : කිසේ යැ යත් :

20. සතර පරිජි ද සත් සඟවෙසෙස් ද අටළොස් නිසඟිපචිති ද සම සැත්තෑ සුද්ධ පචිති ද පන්සැත්තෑ සිඛකරණීහු ද යන මේ එක්සිය සිවු සැත්තෑ ශික්ෂාවෝ. මහණ මෙහෙණ දෙපසට සම වෙත්.

21. (සප්‍රතිභය හෙයින්) දුරාසද වූ (මූලොච්ඡින්න) තාලවාස්තුවක් වැනි වූ පාරාජිකාපත්තීහු අට දෙනෙක් මැ වෙති. පරිජි අවන් පුඟුල් තෙම පඬුවන්පතක් සේ බිඳුණු ගලක් සේ හිස්සුන් එකක්හු සේ මුදුන් සුන් තලක් සේ වටාලා පියවිබවට නො එයි. එසෙයින් මැ ඒ පාරාජිකාපත්තීහු වටාලා ප්‍රකෘති භාවයට නො එත්.

22. 23. තෙවිසි සඟවෙසෙස් ද අනියත දෙක ද දෙසාළිස් නිසඟි ද. එක්සිය අසූඅටක් පචිති ද දොළොස් පිළිදෙස්නීහු ද, පන්සැත්තෑ සිඛකරණීහු ද යන මොහු සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

24. ජිනරාජයන් වහන්සේ විසින් දෙසන ලද (භික්ෂු--භික්ෂුණී) උපොසථ දෙක ද පවුරුණු දෙක ද (අධර්මවර්ගාදී) කර්ම සතර ද පාමොක් උදෙසීම් පස ද (භික්ෂුණීන්ගේ වශයෙන්) සතර ද ඇවත් කඳු සතදැයි මොහු අන් පරිද්දකින් නො වෙත්.

25. සතර අධිකරණයෝ සප්ත ශමථයෙන් සන්හිඳෙත්. දෙශමථයෙන් ද සිවු ශමථයෙන් ද තුන් ශමථයෙන් ද සන්හිඳෙත්. කිච්චාධිකරණය එක් ශමථයකින් සන් හිඳෙයි.

## පාරාජිකාදි ආපත්ති

1. පාරාජිකන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
චුතො පරද්ධො භට්ඨො ච සද්ධම්මා හි නිරංකතො[1]
සංවාසොපි තහිං නත්ථි තෙනෙතං ඉති වුච්චති.

2. සඞ්ඝාදිසෙසොති යං වුත්තං තං සුණොහි යථා කථං[2],
සඞ්ඝොව දෙති පරිවාසං මූලාය පටිකස්සති;
මානත්තං දෙති අබ්භෙති තෙනෙතං ඉති වුච්චති.

3. අනියතොති යං වුත්තං තං සුණොහි යථා කථං,[2]
අනියතො න නියතො අනෙකංසිකතං පදං;
තිණ්ණමඤ්ඤතරං ඨානං අනියතොති පවුච්චති.

4. ථුල්ලච්චයන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
එකස්ස මූලෙ යො දෙසෙති යො ච තං පතිගණ්හති;
අච්චයො තෙන සමො නත්ථි තෙනෙතං ඉති වුච්චති.

5. නිස්සග්ගියන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,[2]
සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ එකකස්සෙව එකතො;
නිස්සජ්ජිත්වාන දෙසෙති තෙනෙතං ඉති වුච්චති.

6. පාචිත්තියන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,[2]
පාතෙති කුසලං ධම්මං අරියමග්ගමපරජ්ඣති;
චිත්තසම්මොහනට්ඨානං තෙනෙතං ඉති වුච්චති.

7. පාටිදෙසනීයන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
භික්ඛු අඤ්ඤාතකො සන්තො කිච්ඡා ලද්ධාය භොජනං.
සාමං ගහෙත්වා භුඤ්ජෙය්‍ය ගාරය්හන්ති පවුච්චති.

8. නිමන්තනාසු භුඤ්ජන්තං[3] ඡන්දාය වොසාසති තත්ථ භික්ඛුනී,[4]
අනිවාරෙත්වා තහිං භුඤ්ජෙ ගාරය්හන්ති පවුච්චති.

9. සද්ධාචිත්තං කුලං ගන්ත්වා අප්පභොගං අනාළ්හියං,[5]
අගිලානො තහිං භුඤ්ජෙ ගාරය්හන්ති පවුච්චති.

10. යො චෙ අරඤ්ඤෙ විහරන්තො සාසඞ්කෙ සභයානකෙ,
අවිදිතං තහිං භුඤ්ජෙ ගාරය්හන්ති පවුච්චති.

11. භික්ඛුනී අඤ්ඤාතිකා සන්තා යං පරෙසං මමායිතං,
සප්පි තෙලං මධු ඵාණිතං මච්ඡමංසං අථොපි ඛීරං;
දධිඤ්ච යං විඤ්ඤාපෙය්‍ය භික්ඛුනී ගාරය්හපත්තා
සුගතස්ස සාසනෙ.

---

1. නිරාකතො - සීමු 2.
2. යථාතථං - සීමු 2, මජසං.
3. භුඤ්ජන්තා - මජසං.
4. භික්ඛුනිං - මජසං.
5. අනාළියං - මජසං.

## පාරාජිකාදි ආපත්ති

1. පාරාජික යැ යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත්: ශාසනයෙන් ච්‍යුත වී ද පැරදුනෝ ද, ගිලිහුණේ ද, දුරුකරණ ලද්දේ ද, ඔහු කෙරෙහි (උපොසථ පවාරණාදී විසින්) සමග විසීමෙක් ද නැති. එහෙයින් මෙය පරිජි යැ යි කියනු ලැබේ.

2. සඞ්ඝාදිසෙස යැ යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත් : සඞ්ඝයා ම පිරිවෙස් දෙයි. මූලායපටිකස්සන කර්මය කෙරෙයි. මානත දෙයි. අබ්භාන කර්මය කෙරේ. (සඞ්ඝයා මුල මැද අග යන තුන් තැන ම කැමති විය යුතු ය යන) ඒ අර්ථයෙන් තෙල ඇවැත සඞ්ඝාදිසෙස යැ යි කියනු ලැබේ.

3. අනියත යැ යි යමක් කියනලද ද, එය අසව. කිසේ යැ යත් : නියත නැත්තේ අනියත නම්. නියම නො කරණ ලද සිකපද යයි. (පරිජි-සඟවෙසෙස්-පචිති යන) තුන් ඇවතින් එක්තරා ඇවැතකට පැමිණේ ද, (එහෙයින්) අනියත යැ යි කියනු ලැබේ.

4. ථුල්ලච්චය යැ යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත් : යමෙක් එකක්හුගේ සමීපයෙහි ඇවැත් දෙසයි ද, යමෙකුත් එය පිළිගණී ද එය හා සම වූ (අන් දෙසනාගාමිනී) ඇවැතෙක් නැත් ද, එහෙයින් තෙල ථුල්ලච්චය යි කියනු ලැබේ.

5. නිස්සග්ගිය යැ යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත් : සඟමැද හෝ ගණමැද හෝ එකක්හු වෙතැ හෝ එක් වැ නිසද ඇවැත් දෙසා ද, එබැවින් තෙල නිස්සග්ගියැ යි කියනු ලැබේ.

6. පාචිත්තිය යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත් : කුසලචිත්තය හෙළා ද ආර්‍යමාර්ගය වරදවා ද සිත මුළාකිරීමට කරුණු වේ ද, එබැවින් තෙල පාචිත්තිය යි කියනු ලැබේ.

7. පාටිදෙසනීය යැ යි යමක් කියන ලද ද, එය අසව. කිසේ යැ යත් : භික්ෂු තෙම නොනෑ වූයේ දුකසේ ලද තැනැත්තියගේ බොජුනක් තෙමේ ගෙණ වළඳනේ ද ඒ ගර්හා කටයුතු යැ යි කියනු ලැබේ.

8. නිමන්ත්‍රණයන්හි වළඳන්නහු එහි දී මෙහෙණක් තොමෝ රුචියෙන් ('' ඉධ ඔදනං දෙථ '' යනාදීන්) විධාන කෙරේ නම් එහි දී ('' අපසක්ක තාව භගිනී '' යනාදීන්) නො වළකා වළඳන්නේ වේ ද ඒ ගර්හා කටයුතු යයි කියනු ලැබේ.

9. ස්වල්ප සම්පත් ඇති නැළියකට වඩා වී නැති දිළිඳු වූ සැදැහැසිත් ඇති සෙඛ කුලයකට ගොස් නො ගිලන් වැ එහි වළඳා නම් ගර්හා කටයුතු යයි කියනු ලැබේ.

10. යම් මහණෙක් සැකසහිත වූ බියසහිත වූ වනයෙහි ඉදින් වසන්නේ එහි දී පෙර නො දන්වන ලද භොජනය අනුභව කෙරේ නම් ගර්හා කටයුතු යයි කියනු ලැබේ.

11. මෙහෙණක් තොමෝ නොනෑ වූවා අනුන් විසින් මමත්වය කරණලද ගිතෙල් තෙල් මී පැණි දියමස් ගොඩමස් කිරි දිහි තොමෝ විනවා පරිභොග කෙරේ නම් බුදුසසුන්හි ගැරහියයුතු බවට පැමිණියා වෙයි.

12. දුක්කටන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
අපරද්ධං විරද්ධඤ්ච ඛලිතං යඤ්ච දුක්කටං.

13. යං මනුස්සො කරෙ පාපං ආවි වා යදි වා රහො,
දුක්කටන්ති පවෙදෙන්ති තෙනෙතං ඉති වුච්චති.

14. දුබ්භාසිතන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
දුබ්භාසිතං දුරාභට්ඨං සඞ්කිලිට්ඨඤ්ච යං පදං;
යඤ්ච විඤ්ඤූ ගරහන්ති තෙනෙතං ඉති වුච්චති.

15 සෙඛියන්ති යං වුත්තං තං සුණොහි යථා කථං,
සෙඛස්ස සික්ඛමානස්ස උජුමග්ගානුසාරිනො.

16 ආදිපෙතං චරණඤ්ච මුඛං සංයමසංවරො,
සික්ඛා එතාදිසී නත්ථි තෙනෙතං ඉති වුච්චති.

17. ඡන්නමතිවස්සති විවටං නාතිවස්සති,
තස්මා ඡන්නං විවරෙථ එවං තං නාතිවස්සති.

18. ගති මිගානං පවනං ආකාසො පක්ඛිනං ගති,
විභවො ගති ධම්මානං නිබ්බානං අරහතො ගති.

ගාථාසඞ්ගණිකං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. සත්ත නගරෙසු පඤ්ඤත්තං විපත්ති චතුරොපි ච,
භික්ඛූනං භික්ඛුනීනඤ්ච සාධාරණා අසාධාරණා;
සාසනානුග්ගහාය ගාථාසඞ්ගණිකං ඉදන්ති.

---

12. දුක්කට යැ යි යමක් වදරණ ලද ද, එය අසව කිසේ යැ යත් : නපුරු කොට කරණලද්දෙක් වරදවා කරණලද්දෙක් පමාදෙසෙක් යම් (එබඳුවූ) දුෂ්කෘතයෙක් වේ ද,

13. මිනිස් තෙම එළියෙහි හෝ රහස්හි හෝ යම් පවක් කරන්නේ (එය) දුක්කට යැ යි (නුවණැත්තෝ) පවසත් ද, එහෙයින් මෙය දුක්කට යැ යි කියනු ලැබේ.

14. දුබ්භාසිත යැ යි යමක් කියන ලද ද, එය අසව, කිසේ යැ යත් : යම් හෙයකින් නපුරු කොට කියනලද සකිළිටු වූ යම්බඳු වචනයකට දුබ්භාසිත යැ යි නුවණැත්තෝ ගරහත් ද, එහෙයින් මෙයද දුබ්භාසිත යැ යි කියනු ලැබේ.

15. සෙඛියා යැ යි යමක් කියනලද ද, එය අසව, කිසේ යැ යත් : ඍජුමාර්ගය අනුව හැසිරෙණසුලු වූ (උපරිගුණාධිගමය සඳහා) හික්මෙන්නා වූ ශෛක්ෂ පුද්ගලයාහට.

16. තෙල සෙඛියාව මුල් වෙයි, යළි පාදය ද වෙයි, ප්‍රමුඛද්වාරය වෙයි, සන්හිඳීම වෙයි, සංවරය වේ. එහෙයින් ම මේ හා සමාන වූ සිඛයෙක් නැති. මෙකරුණෙන් මෙය සෙඛියා යි කියනු ලැබේ.

17. ඇවැත් (සඞ්ඛ්‍යාත ගෙය) සොයන ලදුයේ අතිශයින් කෙලෙස් වැසි වසියි, විවෘත වූයේ කෙලෙස් වැසි නො වසියි, එහෙයින් පිළිසන් ඇවැත විවෘත කරන්නේ යැ. එසේ ඇති කල්හි කෙලෙස් වැසි නො වසී.

18. මෘගයනට වනලැහැබ පිළිසරණ වෙයි, පක්ෂීනට අහස පිළිසරණ වෙයි, සියලු සඞ්ඛත ධර්මයනට (ඔවුනතර) නොවීම පිළිසරණ (අස්වැසීම) වෙයි, රහත්හට (අනුපාදිශෙෂ) නිර්වාණධාතුව එකැතින් පිළිසරණ වේ.

ගාථාසඞ්ගණිකය නිමි.

---

එහි නාමාවලිය :

සප්ත නගරයෙහි පැණවූ සිකපද ද විපත්ති සතර ද භික්ෂු - භික්ෂුණීන් පිළිබඳ වූ සාධාරණ අසාධාරණ සිකපද ද ඇතුළත් මේ ගාථා සඞ්ගණිකය ශාසනානුග්‍රහය පිණිස වේ.

---

# අධිකරණභෙදෙ

1. චත්තාරි අධිකරණානි: විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං. ඉමානි චත්තාරි අධිකරණානි.

ඉමෙසං චතුන්නං අධිකරණානං කති උක්කොටා: ඉමෙසං චතුන්නං අධිකරණානං දස උක්කොටා: විවාදාධිකරණස්ස ද්වෙ උක්කොටා, අනුවාදාධිකරණස්ස චත්තාරො උක්කොටා, ආපත්තාධිකරණස්ස තයො උක්කොටා, කිච්චාධිකරණස්ස එකො උක්කොටො, ඉමෙසං චතුන්නං අධිකරණානං ඉමෙ දස උක්කොටා.

2. විවාදාධිකරණං උක්කොටෙන්තො කති සමථෙ උක්කොටෙති, අනුවාදාධිකරණං උක්කොටෙන්තො කති සමථෙ උක්කොටෙති, ආපත්තාධිකරණං උක්කොටෙන්තො කති සමථෙ උක්කොටෙති, කිච්චාධිකරණං උක්කොටෙන්තො කති සමථෙ උක්කොටෙති:

විවාදාධිකරණං උක්කොටෙන්තො ද්වෙ සමථෙ උක්කොටෙති. අනුවාදාධිකරණං උක්කොටෙන්තො චත්තාරො සමථෙ උක්කොටෙති. ආපත්තාධිකරණං උක්කොටෙන්තො තයො සමථෙ උක්කොටෙති. කිච්චාධිකරණං උක්කොටෙන්තො එකං සමථං උක්කොටෙති.

3. කති උක්කොටා, කතිහාකාරෙහි උක්කොටනං පසවති, කතිහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අධිකරණං උක්කොටෙති, කති පුග්ගලා අධිකරණං උක්කොටෙන්තා ආපත්තිං ආපජ්ජන්ති.

ද්වාදස උක්කොටා, දසහාකාරෙහි උක්කොටනං පසවති. චතූහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අධිකරණං උක්කොටෙති, චත්තාරො පුග්ගලා අධිකරණං උක්කොටෙන්තා ආපත්තිං ආපජ්ජන්ති.

4. කතමෙ ද්වාදස උක්කොටා: අකතං කම්මං, දුක්කතං කම්මං, පුන කාතබ්බං කම්මං, අනිහතං, දුන්නිහතං, පුන නිහනිතබ්බං, අවිනිච්ඡිතං, දුවිනිච්ඡිතං, පුන විනිච්ඡිතබ්බං, අවූපසන්තං, දුවූපසන්තං, පුන උපසමෙතබ්බන්ති ඉමෙ ද්වාදස උක්කොටා.

5. කතමෙහි දසහාකාරෙහි උක්කොටනං පසවති: තත්ථ ජාතකං අධිකරණං උක්කොටෙති, තත්ථ ජාතකං වූපසන්තං අධිකරණං උක්කොටෙති, අන්තරාමග්ගෙ අධිකරණං උක්කොටෙති, අන්තරාමග්ගෙ වූපසන්තං අධිකරණං උක්කොටෙති, තත්ථ ගතං අධිකරණං උක්කොටෙති, තත්ථ ගතං වූපසන්තං අධිකරණං උක්කොටෙති, සතිවිනයං උක්කොටෙති, අමූළ්හවිනයං උක්කොටෙති, තස්සපාපියසිකං උක්කොටෙති, තිණවත්ථාරකං උක්කොටෙති. ඉමෙහි දසහාකාරෙහි උක්කොටනං පසවති.

# අධිකරණ භේද

1. අධිකරණ සතරෙකි : විවාදධිකරණ යැ අනුවාදධිකරණ යැ ආපත්තාධිකරණ යැ කිච්චාධිකරණ යි. මේ අධිකරණ සතර යැ.

මේ සතර අධිකරණයන්ගේ උක්කොටන (යළි විසඳුම් පිණිස ඉදිරියට ඇදීම්) කෙතෙක් ද යත් : මේ සතර අධිකරණයන්ගේ උක්කොටන දශයෙකි : විවාදධිකරණය පිළිබඳ උක්කොටන දෙකෙකැ, අනුවාදධිකරණය පිළිබඳ උක්කොටන සතරෙකැ, ආපත්තාධිකරණය පිළිබඳ උක්කොටන තුණෙකැ, කිච්චාධිකරණය පිළිබඳ උක්කොටන එකෙකි. මේ සතර අධිකරණයන්ගේ මේ දස උක්කොටන යි.

2. විවාදධිකරණය උක්කොටනය කරන්නේ කෙතෙක් ශමථයන් උක්කොටනය කෙරේ ද, අනුවාදධිකරණය උක්කොටනය කරන්නේ කෙතෙක් ශමථයන් උක්කොටනය කෙරේද, ආපත්තාධිකරණය උක්කොටනය කරන්නේ කෙතෙක් ශමථයන් උක්කොටනය කෙරේ ද, කිච්චාධිකරණය උක්කොටනය කරන්නේ කෙතෙක් ශමථයන් උක්කොටනය කෙරේ ද යත් :

විවාදධිකරණය උක්කොටනය කරන්නේ ශමථ දෙකක් උක්කොටනය කෙරෙයි, අනුවාදධිකරණය උක්කොටනය කරන්නේ ශමථ සතරක් උක්කොටනය කෙරෙයි, ආපත්තාධිකරණය උක්කොටනය කරන්නේ ශමථ තුණක් උක්කොටනය කෙරෙයි, කිච්චාධිකරණය උක්කොටනය කරන්නේ එක් ශමථයක් උක්කොටනය කෙරේ.

3. උක්කොටනයෝ කෙතෙක් ද, කෙතෙක් අයුරෙකින් උක්කොටනය දනවයි ද, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත පුද්ගල තෙමේ අධිකරණය උක්කොටනය කෙරේ ද, කෙතෙක් පුද්ගලයෝ අධිකරණය උක්කොටනය කරන්නාහු ඇවැත් අවදිත් ද යත් :

උක්කොටන දෙළොසෙකි, දශ අයුරෙකින් උක්කොටනය දනවයි, සිවු අඟෙකින් යුත් පුද්ගල තෙමේ අධිකරණය උක්කොටනය කෙරෙයි, පුහුලෝ සතරදෙනෙක් අධිකරණය උක්කොටනය කරන්නාහු ඇවැත් අවදිත්.

4. දෙළොස් උක්කොටනයෝ කවරහු ද යත් : නොකරණලද කර්ම යැ, වරදවා කරණ ලද කර්ම යැ, නැවැත කටයුතු කර්ම යැ, නො සන්හිඳුවන ලද්ද යැ, වරදවා සන්හිඳු වන ලද්ද යැ, නැවැත සන්හිඳවියයුත්ත යැ, නො විසඳනලද්ද යැ, වරදවා විසඳනලද්ද යැ, නැවැත විසඳියයුත්ත යැ, ව්‍යුපශමනය නො කරණ ලද්ද යැ, වරදවා ව්‍යුපශමනය කරණ ලද්ද යැ, නැවත ව්‍යුපශමනය කටයුත්ත යැ යි. මේ දෙළොස් උක්කොටනයෝ යි.

5. කවර දශ අයුරෙකින් උක්කොටනය දනවා ද යත් : ඒ විහාරයෙහි හටගත් අධිකරණය උක්කොටනය කෙරෙයි, එහි හටගත් සන්හිඳුවන ලද අධිකරණ උක්කොටනය කෙරෙයි, අතරමඟැ අධිකරණය උක්කොටනය කෙරෙයි, අතරමඟ සන්හිඳුවනලද අධිකරණය උක්කොටනය කෙරෙයි, එහි ගියහු එහි ම හිඳුවා විනිශ්චය කළ අධිකරණය උක්කොටනය කෙරෙයි, එහි ගියහු එහි ම හිඳුවා සන්හිඳුවනලද අධිකරණය උක්කොටනය කෙරෙයි, සතිවිනය උක්කොටනය කෙරෙයි, අමූළ්හවිනය උක්කොටනය කෙරෙයි, තස්සපාපියාසිකාව උක්කොටනය කෙරෙයි, තිණවත්ථාරකය උක්කොටනය කෙරේ. මේ දශ අයුරින් උක්කොටනය දනවයි.

6. කතමෙහි චතුහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අධිකරණං උක්කොටෙති: ඡන්දාගතිං ගච්ඡන්තො අධිකරණං උක්කොටෙති, දොසාගතිං -පෙ- මොහාගතිං -පෙ- භයාගතිං ගච්ඡන්තො අධිකරණං උක්කොටෙති. ඉමෙහි චතුහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අධිකරණං උක්කොටෙති

7. කතමෙ චත්තාරො පුග්ගලා අධිකරණං උක්කොටෙන්තා ආපත්තිං ආපජ්ජන්ති: තදහුපසම්පන්නො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං, ආගන්තුකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං, කාරකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං, ඡන්දදායකො උක්කොටෙති උක්කොටනකං පාචිත්තියං. ඉමෙ චත්තාරො පුග්ගලා අධිකරණං උක්කොටෙන්තා ආපත්තිං ආපජ්ජන්ති.

---

## අධිකරණනිදානාදයො

1. විවාදාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං: අනුවාදාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං: ආපත්තාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං: කිච්චාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං:

විවාදාධිකරණං විවාදනිදානං, විවාදසමුදයං, විවාදජාතිකං, විවාදප්පභවං, විවාදසම්භාරං, විවාදසමුට්ඨානං. අනුවාදාධිකරණං අනුවාදනිදානං, අනුවාදසමුදයං, අනුවාදජාතිකං, අනුවාදප්පභවං, අනුවාදසම්භාරං, අනුවාදසමුට්ඨානං. ආපත්තාධිකරණං ආපත්තිනිදානං, අපත්තිසමුදයං, ආපත්තිජාතිකං, ආපත්තිප්පභවං, ආපත්තිසම්භාරං, ආපත්තිසමුට්ඨානං. කිච්චාධිකරණං කිච්චනිදානං, කිච්චසමුදයං, කිච්චජාතිකං, කිච්චප්පභවං, කිච්චසම්භාරං, කිච්චසමුට්ඨානං.

2. විවාදාධිකරණං කිංනිදානං කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං: අනුවාදාධිකරණං -පෙ- ආපත්තාධිකරණං -පෙ- කිච්චාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං:

6. කවර සිවු අඟෙකින් යුත් පුද්ගල තෙමේ අධිකරණය උක්කොටනය කෙරේද යත් : ඡන්දයෙන් අගතියට යන්නේ අධිකරණය උක්කොටනය කෙරෙයි, ද්වෙෂයෙන් අගතියට යන්නේ . . . . මොහයෙන් අගතියට යන්නේ . . . . බියෙන් අගතියට යන්නේ අධිකරණය උක්කොටනය කෙරේ. මේ සිවුඅඟින් යුත් පුද්ගල තෙමේ අධිකරණය උක්කොටනය කෙරේ.

7. කවර පුද්ගලයෝ සතර දෙනෙක් අධිකරණය උක්කොටනය කරන්නාහු ඇවැත් අවදිත් ද යත් : එදවස උපසපන් වූයේ උක්කොටනය කෙරේ නම් උක්කොටනක පචිතිය වෙයි, ආගන්තුක තෙමේ උක්කොටනය කෙරේ නම් උක්කොටනක පචිතිය වෙයි, කාරක තෙමේ උක්කොටනය කෙරේ නම් උක්කොටනක පචිතිය වෙයි, ඡන්දදායක තෙමේ උක්කොටනය කෙරේ නම් උක්කොටනක පචිතිය වේ. මේ පුද්ගලයෝ සතර දෙන අධිකරණය උක්කොටනය කරන්නාහු ඇවැත් අවදිත්.

---

## අධිකරණනිදනාදිය

1. විවාදධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර (රැස්) කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් : අනුවාදධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් : ආපත්තාධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් : කිච්චාධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් :

විවාදධිකරණය (අටළොස් භෙදකර වස්තු සඞ්ඛ්‍යාත) විවාදය නිදන කොට ඇත්තේ යැ, විවාදය සමුදය කොට ඇත්තේ යැ, විවාදය ජාති කොට ඇත්තේ යැ, විවාදය ප්‍රභවය කොට ඇත්තේ යැ, විවාදය සම්භාර කොට ඇත්තේ යැ, විවාදය සමුට්ඨාන කොට ඇත්තේ යි. අනුවාදධිකරණය චොදනාව නිදන කොට ඇත්තේ යැ, චොදනාව සමුදය කොට ඇත්තේ යැ, චොදනාව ජාති කොට ඇත්තේ යැ, චොදනාව ප්‍රභව කොට ඇත්තේ යැ, චොදනාව සම්භාර කොට ඇත්තේ යැ, චොදනාව සමුට්ඨාන කොට ඇත්තේ යි. ආපත්තාධිකරණය ආපත්ති නිදන කොට ඇත්තේ යැ, ආපත්ති සමුදය කොට ඇත්තේ යැ, ආපත්ති ජාති කොට ඇත්තේ යැ, ආපත්ති ප්‍රභව කොට ඇත්තේ යැ, ආපත්ති සම්භාර කොට ඇත්තේ යැ, ආපත්ති සමුට්ඨාන කොට ඇත්තේ යි. කිච්චාධිකරණය (සිවුවැදෑරුම්) සඞ්ඝකර්ම නිදන කොට ඇත්තේ යැ, සඞ්ඝකර්ම සමුදය කොට ඇත්තේ යැ, සඞ්ඝකර්ම ජාති කොට ඇත්තේ යැ, සඞ්ඝකර්ම ප්‍රභව කොට ඇත්තේ යැ, සඞ්ඝකර්ම සම්භාර කොට ඇත්තේ යැ, සඞ්ඝකර්ම සමුට්ඨාන කොට ඇත්තේ යි.

2. විවාදධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් : අනුවාදධිකරණය . . . ආපත්තාධි-කරණය . . . . කිච්චාධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් :

විවාදාධිකරණං හෙතුනිදානං, හෙතුසමුදයං, හෙතුජාතිකං, හෙතුපපභවං, හෙතුසම්භාරං, හෙතුසමුට්ඨානං, අනුවාදාධිකරණං -පෙ- ආපත්තාධිකරණං -පෙ- කිච්චාධිකරණං හෙතුනිදානං, හෙතුසමුදයං, හෙතුජාතිකං, හෙතුපපභවං, හෙතුසම්භාරං, හෙතුසමුට්ඨානං.

3 විවාදාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං : අනුවාදාධිකරණං -පෙ- ආපත්තාධිකරණං -පෙ- කිච්චාධිකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං :

විවාදාධිකරණං, පච්චයනිදානං, පච්චයසමුදයං, පච්චයජාතිකං, පච්චයපපභවං, පච්චයසම්භාරං, පච්චයසමුට්ඨානං. අනුවාදාධිකරණං -පෙ- ආපත්තාධිකරණං -පෙ- කිච්චාධිකරණං පච්චයනිදානං, පච්චයසමුදයං, පච්චයජාතිකං, පච්චයපපභවං, පච්චයසම්භාරං, පච්චයසමුට්ඨානං.

---

## අධිකරණමූලාදයො

1. චතුන්නං අධිකරණානං කති මූලානි, කති සමුට්ඨානා :

චතුන්නං අධිකරණානං තෙත්තිංස මූලානි, තෙත්තිංස සමුට්ඨානා.

2. චතුන්නං අධිකරණානං කතමානි තෙත්තිංස මූලානි :

විවාදාධිකරණස්ස ද්වාදස මූලානි, අනුවාදාධිකරණස්ස චුද්දස මූලානි, ආපත්තාධිකරණස්ස ඡ මූලානි, කිච්චාධිකරණස්ස එකං මූලං සඞ්ඝො. චතුන්නං අධිකරණානං ඉමානි තෙත්තිංස මූලානි.

3. චතුන්නං අධිකරණානං කතමෙ තෙත්තිංස සමුට්ඨානා :

විවාදාධිකරණස්ස අට්ඨාරස භෙදකරවත්ථූනි සමුට්ඨානා, අනුවාදාධිකරණස්ස චතස්සො විපත්තියො සමුට්ඨානා, ආපත්තාධිකරණස්ස සත්ත ආපත්තික්ඛන්ධා[1] සමුට්ඨානා, කිච්චාධිකරණස්ස චත්තාරි කම්මානි සමුට්ඨානා. චතුන්නං අධිකරණානං ඉමෙ තෙත්තිංස සමුට්ඨානා.

---

## අධිකරණපච්චයාපත්ති

1. විවාදාධිකරණං ආපත්තානාපත්තීති : විවාදාධිකරණං න ආපත්ති.

කිං පන විවාදාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍යාති : ආම, විවාදාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍ය.

---

1. සත්තාපත්තික්ඛන්ධා - ම ඡ සං.

විවාදධිකරණය (කුසලාකුසල අව්‍යාකත) හෙතු නිදන කොට ඇත්තේ යැ, හෙතු සමුදය කොට ඇත්තේ යැ, හෙතු ජාති කොට ඇත්තේ යැ, හෙතු ප්‍රභව කොට ඇත්තේ යැ, හෙතු සම්භාර කොට ඇත්තේ යැ, හෙතු සමුට්ඨාන කොට ඇත්තේ යි. අනුවාදධි-කරණය.... ආපත්තාධිකරණය .... කිච්චාධිකරණය හෙතු නිදන කොට ඇත්තේ යැ, හෙතු සමුදය කොට ඇත්තේ යැ, හෙතු ජාති කොට ඇත්තේ යැ, හෙතු ප්‍රභව කොට ඇත්තේ යැ, හෙතු සම්භාර කොට ඇත්තේ යැ, හෙතු සමුට්ඨාන කොට ඇත්තේ යි.

3. විවාදධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් : අනුවාදධිකරණය .... ආපත්තාධි-කරණය .... කිච්චාධිකරණය කුමක් නිදන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද, කුමක් සම්භාර කොට ඇත්තේ ද, කුමක් සමුට්ඨාන කොට ඇත්තේ ද යත් :

විවාදධිකරණය ප්‍රත්‍යය නිදන කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය සමුදය කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය ජාති කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය සම්භාර කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇත්තේ යි. අනුවාදධිකරණය .... ආපත්තාධි කරණය .... කිච්චාධිකරණය ප්‍රත්‍යය නිදන කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය සමුදය කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය ජාති කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය, සම්භාර කොට ඇත්තේ යැ, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇත්තේ යි.

---

## අධිකරණමූලාදිය

1. සතර අධිකරණයන්ගේ මුල් කෙතෙක් ද, සමුට්ඨාන කෙතෙක් ද යත් :

සතර අධිකරණයන්ගේ මුල් තෙතිසෙක, සමුට්ඨාන තෙතිසෙකි.

2. සතර අධිකරණයන්ගේ මුල් තෙතිස කවර යත් :

විවාදධිකරණයාගේ මුල් දෙළොසෙකැ, අනුවාදධිකරණයාගේ මුල් තුදුසෙකැ, ආපත්තාධිකරණයාගේ මුල් සයෙකැ, කිච්චාධිකරණයාගේ මුල් එකෙකි, සඞ්ඝ තෙමේ යි. සතර අධිකරණයන්ගේ මේ මුල් තෙතිස යි.

3. සතර අධිකරණයන්ගේ සමුට්ඨාන තෙතිස කවර යත් :

විවාදධිකරණයට අටළොස් භෙදකර වස්තු සමුට්ඨානයෝ යැ, අනුවාදධිකරණයට සතර විපත්තිහු සමුට්ඨානයෝ යැ, ආපත්තාධිකරණයට සත්තාපත්තිස්කන්ධයෝ සමුට්ඨානයෝ යැ, කිච්චාධිකරණයට සතර කර්මයෝ සමුට්ඨානයෝ යි. මේ තෙතිස සතර අධිකරණයන්ගේ සමුට්ඨාන යි.

---

## අධිකරණප්‍රත්‍යයාපත්ති

1. විවාදධිකරණය ආපත්ති ද අනාපත්ති ද යත් : විවාදධිකරණය ආපත්ති නො වේ.

කිම, විවාදධිකරණ හෙතුයෙන් ඇවැත් අවදනේ ද යත් : එසේ යැ, විවාදධිකරණ හෙතුයෙන් ඇවැත් අවදනේ යි.

විවාදාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: විවාදාධිකරණපච්චයා ද්වෙ ආපත්තියො ආපජ්ජති: උපසම්පන්නං ඔමසති ආපත්ති පාචිත්තියස්ස, අනුපසම්පන්නං ඔමසති ආපත්ති දුක්කටස්ස. විවාදාධිකරණපච්චයා ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

2. තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, කතීහි අධිකරණෙහි කතීසු ඨානෙසු කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජන්ති: ආචාරවිපත්තිං. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ද්වීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති. එකෙන අධිකරණෙන කිච්චාධිකරණෙන. තීසු ඨානෙසු: සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ පුග්ගලස්ස සන්තිකෙ. තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

3. අනුවාදාධිකරණං ආපත්තානාපත්තීති: අනුවාදාධිකරණං න ආපත්ති.

කිම්පන අනුවාදාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍යාති: ආම, අනුවාදාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍ය.

අනුවාදාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අනුවාදාධිකරණපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙති ආපත්ති පාචිත්තියස්ස, අමූලිකාය ආචාරවිපත්තියා අනුද්ධංසෙති ආපත්ති දුක්කටස්ස. අනුවාදාධිකරණපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

4. තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, කතීහි අධිකරණෙහි කතීසු ඨානෙසු කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං තීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති. යා තා ආපත්තියො ගරුකා තා ආපත්තියො එකෙන අධිකරණෙන, කිච්චාධිකරණෙන.

Free Distribution www.aathaapi.org

විවාදධිකරණ හෙතුයෙන් කෙතෙක් ඇවැත් අවදනේ ද යත්: විවාදධිකරණ හෙතුයෙන් දෙඇවැත් අවදනේ යැ : උපසපනක්හට (ජාත්‍යාදියෙන්) ගටා බෙණේ නම් පචිති ඇවැත් වෙයි, අනුපසපනක්හට (ජාත්‍යාදියෙන්) ගටා බෙණේ නම් දුකුළා ඇවැත් වේ. විවාදධිකරණ හෙතුයෙහ මේ දෙඇවැත් අවදනේ යි.

2. ඒ ඇවැත්හු සතර විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද යත් : සතර අධිකරණ අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, කෙතෙක් අධිකරණයෙන් කෙතෙක් තන්හි කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සතර විපත් අතුරෙන් එක් ම ආචාරවිපත්තිය බෙජෙත්. සතර අධිකරණ අතුරෙන් ආපත්තාධිකරණ යි. සත් වැදෑරුම් ආපත්ති ස්කන්ධ අතුරෙන් කිසි විටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි දෙආපත්ති-ස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් තුන් සමුට්ඨානයෙකින් නගිත්. කිච්චාධිකරණය වූ එක් අධිකරණයෙන් සන්හිඳෙත්. සඟ මැද යැ ගණමැද යැ පුහුලක්හු වෙතැ යි තුන් තන්හි යැ. කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

3. අනුවාදධිකරණය ආපත්ති ද අනාපත්ති ද යත් : අනුවාදධිකරණය ආපත්ති නො වේ.

කිම, අනුවාදධිකරණ හෙතුයෙන් ඇවැත් අවදනේ ද යත් : එසේ යැ, අනුවාදධිකරණ හෙතුයෙන් ඇවැත් අවදනේ යැ.

අනුවාදධිකරණ හෙතුයෙන් කෙතෙක් ඇවැත් අවදනේ ද යත් : අනුවාදධිකරණ හෙතුයෙන් තුන් ඇවැත් අවදනේ යි : මහණක්හට අමූලක පාරාජිකාපත්තියෙන් චොදනා කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, අමූලකසඞ්ඝාදිසෙසාපත්තියෙන් චොදනා කෙරේ නම් පචිති ඇවැත් වෙයි, අමූලක ආචාරවිපත්තියෙන් චොදනා කෙරේ නම් දුකුළා ඇවැත් වේ. අනුවාදධිකරණ හෙතුයෙන් මේ තුන් ඇවැත් අවදනේ යි.

4. ඒ ඇවැත්හු සතර විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, සතර අධිකරණ අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, කෙතෙක් අධිකරණයෙන් කෙතෙක් තන්හි කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සතර විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාර විපත්තිය ද යි විපත් දෙකක් බෙජෙත්. සතර අධිකරණ අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් ද යි තුන් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහ. සවැදෑරුම් ආපත්ති සමුට්ඨාන අතුරෙන් තුන් සමුට්ඨානයෙකින් නගිත්. යම් ඒ ගරු ඇවැත්හු වෙත් ද, ඒ ඇවැත්හු කිච්චාධිකරණ නම් වූ එක් මැ අධිකරණයෙන් සඟමැද යැ යන එක් තැනෙක්හි

එකම්හි ඨානෙ සඞ්ඝමජ්ඣෙ. ද්වීහි සමථෙහි සම්මන්ති: සම්මුඛාවිනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච. යා තා ආපත්තියො ලහුකා, තා ආපත්තියො එකෙන අධිකරණෙන කිච්චාධිකරණෙන. තීසු ඨානෙසු: සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ පුග්ගලස්ස සන්තිකෙ. තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

5. ආපත්තාධිකරණං ආපත්තානාපත්තීති: ආපත්තාධිකරණං ආපත්ති.

කිම්පන ආපත්තාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍යාති: ආම, ආපත්තාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍ය.

ආපත්තාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: ආපත්තාධිකරණපච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං[1] පටිච්ඡාදෙති ආපත්ති පාරාජිකස්ස, වෙමතිකා පටිච්ඡාදෙති ආපත්ති ථුල්ලච්චයස්ස, භික්ඛු සඞ්ඝාදිසෙසං පටිච්ඡාදෙති ආපත්ති පාචිත්තියස්ස, ආචාරවිපත්තිං පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස ආපත්තාධිකරණපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

6. තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, කතීහි අධිකරණෙහි කතීසු ඨානෙසු කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. යා සා ආපත්ති අනවසෙසා, සා ආපත්ති න කතමෙන අධිකරණෙන න කතමම්හි ඨානෙ න කතමෙන සමථෙන සම්මති, යා තා ආපත්තියො ලහුකා තා ආපත්තියො එකෙන අධිකරණෙන කිච්චාධිකරණෙන තීසු ඨානෙසු සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ පුග්ගලස්ස සන්තිකෙ. තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

7. කිච්චාධිකරණං ආපත්තානාපත්තීති: කිච්චාධිකරණං නාපත්ති.

කිම්පන කිච්චාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍යාති: ආම, කිච්චාධිකරණපච්චයා ආපත්තිං ආපජ්ජෙය්‍ය.

---

1. පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං - ස්‍යා.

සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් දැ යි දෙ ශමථයෙන් සන්හිඳෙති. යම් ඒ ලුහු ඇවැත්හු වෙත් ද, ඒ ඇවැත්හු කිච්චාධිකරණ නම් වූ එක් අධිකරණයෙකින්, සඟමැද යැ ගණමැද යැ පුඟුලක්හු වෙතැ යි යන තුන් තන්හි කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි යන තුන් ශමථයෙන් සන්හිඳෙත්.

5. ආපත්තාධිකරණය ආපත්ති ද අනාපත්ති ද යත්: ආපත්තාධිකරණය ආපත්ති වේ.

කිම ආපත්තාධිකරණ හේතුයෙන් ඇවැත් අවදනේ ද යත්: එසේ යැ, ආපත්තාධිකරණ හේතුයෙන් ඇවැත් අවදනේ යි.

ආපත්තාධිකරණ හේතුයෙන් කෙතෙක් ඇවැත් අවදනේ ද යත්: ආපත්තාධිකරණ හේතුයෙන් සතර ඇවැත් අවදනේ යැ: මෙහෙණක් තොමෝ දැන දැන පරිජි ඇවැත සඟවා නම් පරිජි ඇවැත් වෙයි, විමති ඇත්තී සඟවා නම් ථුලැසි ඇවැත් වෙයි, මහණෙක් තෙමේ සඟවෙසෙස් ඇවැත සඟවා නම් පචිති ඇවැත් වෙයි, ආචාරවිපත්තිය සඟවා නම් දුකුළා ඇවැත් වේ. ආපත්තාධිකරණ හේතුයෙන් මේ සතර ඇවැත් අවදනේ යි.

6. ඒ ඇවැත්හු සිවු වැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, සිවු වැදෑරුම් අධිකරණ අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, කෙතෙක් අධිකරණයෙන් කෙතෙක් තන්හි කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත්:

ඒ ඇවැත්හු සතර විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැ යි විපත් දෙකක් බෙජෙත්. සතර අධිකරණ අතුරෙන් ආපත්තාධිකරණ යි. සත් වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැ යි සතර ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහකරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් කයින් ද වචනයෙන් ද සිතින් දැයි එක් සමුට්ඨානයෙකින් නගිත්. යම් ඒ පරිජි ඇවැතෙක් වේ ද, ඒ ඇවැත කවර අධිකරණයෙනුදු නො සන්හිඳෙයි, කවර තැනෙක්හිදු නො සන්හිඳෙයි කවර ශමථයෙකිනුදු නො සන්හිඳේ. යම් ඒ ලුහු ඇවැත්හු වෙත් ද, ඒ ඇවැත්හු කිච්චාධිකරණ නම් වූ එක් මැ අධිකරණයෙකින් සඟමැද ගණමැද පුඟුලක්හු වෙතැයන තුන් තන්හි කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැ යි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

7. කිච්චාධිකරණය ආපත්ති ද අනාපත්ති ද යත්: කිච්චාධිකරණය ආපත්ති නො වේ.

කිම, කිච්චාධිකරණ හේතුයෙන් ඇවැත් අවදනේ ද යත්: එසේ යැ, කිච්චාධිකරණ හේතුයෙන් ඇවැත් අවදනේ යැ.

කිච්චාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: කිච්චාධිකරණපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති පාරාජිකස්ස භෙදකානුවත්තකා භික්ඛූ යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්ති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, පාපිකාය දිට්ඨියා යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. කිච්චාධිකරණපච්චයා ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

8. තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, කතීහි අධිකරණෙහි කතිසු ඨානෙසු කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. යා සා ආපත්ති අනවසෙසා, සා ආපත්ති න කතමෙන අධිකරණෙන න කතමම්හි ඨානෙ න කතමෙන සමථෙන සම්මති. යා සා ආපත්ති ගරුකා, සා ආපත්ති එකෙන අධිකරණෙන කිච්චාධිකරණෙන. එකම්හි ඨානෙ සඞ්ඝමජ්ඣෙ. ද්වීහි සමථෙහි සම්මති: සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. යා තා ආපත්තියො ලහුකා, තා ආපත්තියො එකෙන අධිකරණෙන කිච්චාධිකරණෙන. තීසු ඨානෙසු සඞ්ඝමජ්ඣෙ ගණමජ්ඣෙ පුග්ගලස්ස සන්තිකෙ. තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

---

## අධිකරණාධිප්පායො

1. විවාදාධිකරණං හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං:

විවාදාධිකරණං න හොති අනුවාදාධිකරණං, න හොති ආපත්තාධිකරණං, න හොති කිච්චාධිකරණං. අපිච විවාදාධිකරණපච්චයා හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං. යථා කථං විය: ඉධ භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලාපත්තීති වා, අදුට්ඨුල්ලාපත්තීති වා, යං තත්ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදො නානාවාදො අඤ්ඤථාවාදො විපච්චයතාය වොහාරො මෙධගං ඉදං වුච්චති විවාදාධිකරණං, විවාදාධිකරණෙ සඞ්ඝො විවදති

කිච්චාධිකරණ හෙතුයෙන් කෙතෙක් ඇවැත් අවදනේ ද යත් : කිච්චාධිකරණ හෙතුයෙන් පස් ඇවැත් අවදනේ යැ : උබ්බෙච්චනීකම් අනුව වැටෙන මෙහෙණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි එය නො හරී නම් ඤත්තියෙහි දුකුළා වෙයි, දෙකම්වදනින් ථුලසිහු වෙති, කම්වදන් පිරියතැ පරිජි ඇවැත් වේ. හෙදනුවර්තක භික්ෂූහු තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි එය නො හරිත් නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, ලාමකදෘෂ්ටියෙහි තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි එය නො හරිත් නම් පචිති ඇවැත් වේ. කිච්චාධිකරණ හෙතුයෙන් මේ පස් ඇවැත් අවදනේ යි.

8. ඒ ඇවැත් සතර විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, සතර අධිකරණ අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ආපත්තිස්ක්න්ධ අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, කෙතෙක් අධිකරණයෙන් කෙතෙක් තන්හි කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සතර විපත්ති අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැ යි විපත් දෙකක් බෙජෙත්. සතර අධිකරණ අතුරෙන් ආපත්තා-ධිකරණ යි. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධ අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්ති-ස්කන්ධයෙන් ද, කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැ යි පස් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිත් : කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. යම් ඒ පරිජි ඇවැතෙක් වේ ද, ඒ ඇවැත කවර අධිකරණයෙනුදු නො සන්හිඳෙයි, කවර තැනෙක්හිදු නො සන්හිඳෙයි, කවර ශමථයෙනුදු නො සන්හිඳේ. යම් ඒ ගරු ඇවැතෙක් වේ ද, ඒ ඇවැත කිච්චාධිකරණ නම් වූ එක් මැ අධිකරණයෙන් ද සඟමැද නම් වූ එක් තැනෙක්හි ද සම්මුඛාවිනයෙන් හා පටිඤ්ඤාතකරණයෙන් දැ යි දෙ ශමථයෙන් ද සන්හිඳෙයි. යම් ඒ ලුහු ඇවැත්හු වෙත් ද, ඒ ඇවැත්හු කිච්චාධිකරණ නම් වූ එක් ම අධිකරණ-යෙන් ද සඟමැද ගණමැද පුඟුලක්හු වෙතැ යන තුන් තන්හි ද කිසිවිටෙක සම්මුඛා-විනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථා-රකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

---

## අධිකරණාභිප්‍රාය

1. විවාදධිකරණය අනුවාදධිකරණය වේ ද, ආපත්තාධිකරණය වේ ද, කිච්චාධි-කරණය වේ ද යත් :

විවාදධිකරණය අනුවාදධිකරණය නො වෙයි, ආපත්තාධිකරණය නො වෙයි, කිච්චාධිකරණය නො වේ. එහෙත් විවාදධිකරණ හෙතුයෙන් අනුවාදධිකරණය වෙයි, ආපත්තාධිකරණය වෙයි, කිච්චාධිකරණය වේ. කෙබඳු යැ යත් : මේ ශාසනයෙහි භික්ෂූහු ධර්මය කියා හෝ අධර්මය කියා හෝ . . . . තුළුල් ඇවැත් කියා හෝ නො තුළුල් ඇවැත් කියා හෝ විවාද කරත් නම් එහි යම් අරගලයෙක් කලහයෙක් විරුද්ධග්‍රහණයෙක් විරුද්ධවාදයෙක් නානාවාදයෙක් අන්‍යථාවාදයෙක් සිතෙහි දුක් ඇති කිරීම පිණිස වූ පරුෂ වචනයෙක් ඩබරයෙක් වේ ද, මෙය විවාදධිකරණ යයි කියනු ලැබේ. විවාදධිකරණයෙහි සඞ්ඝ තෙමේ විවාද කෙරේ නම් විවාදධිකරණය යි. විවාද

විවාදාධිකරණං, විවදමානො අනුවදති අනුවාදාධිකරණං, අනුවදමානො ආපත්තිං ආපජ්ජති ආපත්තාධිකරණං, තාය ආපත්තියා සඞ්ඝො කම්මං කරොති කිච්චාධිකරණං. එවං විවාදාධිකරණපච්චයා හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං.

2. අනුවාදාධිකරණං හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං.

අනුවාදාධිකරණං න හොති ආපත්තාධිකරණං, න හොති කිච්චාධිකරණං, න හොති විවාදාධිකරණං. අපි ච අනුවාදාධිකරණපච්චයා හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං, යථා කථං විය: ඉධ භික්ඛූ භික්ඛුං අනුවදන්ති සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා, යො තත්ථ අනුවාදො අනුවදනා අනුල්ලපනා අනුභණනා අනුසම්පවඞ්කතා අබ්භුස්සහනතා අනුබලප්පදානං, ඉදං වුච්චති අනුවාදාධිකරණං, අනුවාදාධිකරණෙ සඞ්ඝො විවදති විවාදාධිකරණං, විවදමානො අනුවදති අනුවාදාධිකරණං, අනුවදමානො ආපත්තිං ආපජ්ජති ආපත්තාධිකරණං, තාය ආපත්තියා සඞ්ඝො කම්මං කරොති කිච්චාධිකරණං. එවං අනුවාදාධිකරණපච්චයා හොති ආපත්තාධිකරණං, හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං.

3. ආපත්තාධිකරණං හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං.

ආපත්තාධිකරණං න හොති කිච්චාධිකරණං, න හොති විවාදාධිකරණං, න හොති අනුවාදාධිකරණං. අපි ච ආපත්තාධිකරණපච්චයා හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං. යථා කථං විය: පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, ඉදං වුච්චති ආපත්තාධිකරණං, ආපත්තාධිකරණෙ සඞ්ඝො විවදති විවාදාධිකරණං, විවදමානො අනුවදති අනුවාදාධිකරණං, අනුවදමානො ආපත්තිං ආපජ්ජති ආපත්තාධිකරණං, තාය ආපත්තියා සඞ්ඝො කම්මං කරොති කිච්චාධිකරණං. එවං ආපත්තාධිකරණපච්චයා හොති කිච්චාධිකරණං, හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං.

4. කිච්චාධිකරණං හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං:

කිච්චාධිකරණං න හොති විවාදාධිකරණං, න හොති අනුවාදාධිකරණං, න හොති ආපත්තාධිකරණං. අපි ච කිච්චාධිකරණපච්චයා හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං, යථා කථං විය: යා සඞ්ඝස්ස කිච්චයතා කරණීයතා අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං. ඉදං වුච්චති කිච්චාධිකරණං. කිච්චාධිකරණෙ සඞ්ඝො විවදති විවාදාධිකරණං. විවදමානො අනුවදති අනුවාදාධිකරණං, අනුවදමානො ආපත්තිං ආපජ්ජති ආපත්තාධිකරණං. තාය ආපත්තියා සඞ්ඝො කම්මං කරොති කිච්චාධිකරණං. එවං කිච්චාධිකරණපච්චයා හොති විවාදාධිකරණං, හොති අනුවාදාධිකරණං, හොති ආපත්තාධිකරණං.

කරමින් චොදනා කෙරේ නම් අනුවාදධිකරණ යි. චොදනා කරමින් ඇවැතට පැමිණේ නම් ආපත්තාධිකරණය යි. ඒ ඇවැතින් සඞ්ඝ තෙමේ කර්ම කෙරේ නම් කිච්චාධිකරණ යි. මෙසේ විවාදධිකරණ හෙතුයෙන් අනුවාදධිකරණය වෙයි, ආපත්තාධිකරණය වෙයි, කිච්චාධිකරණය වේ.

2. අනුවාදධිකරණය ආපත්තාධිකරණය වේ ද, කිච්චාධිකරණය වේ ද, විවාදධිකරණය වේ ද යත් :

අනුවාදධිකරණය ආපත්තාධිකරණය නො වෙයි, කිච්චාධිකරණය නො වෙයි, විවාදධිකරණය නො වේ. එහෙත් අනුවාදධිකරණ හෙතුයෙන් ආපත්තාධිකරණය වෙයි, කිච්චාධිකරණය වෙයි, විවාදධිකරණය වේ. කෙබඳු යැ යත් : මේ ශාසනයෙහි භික්ෂූහු ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටි විපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් හෝ මහණක්හට චොදනා කරත් නම් එහි යම් චොදනා කිරීමෙක් පුනපුනා කීමෙක් පුනපුනා තෙපලීමෙක් පුනපුනා බිණුමෙක් පුනපුනා තිදෙරින් අවනතවීමෙක් දැඩි නැඟී සිටීමෙක් අනුබල දීමෙක් වේ ද, මෙය අනුවාදධිකරණය යි කියනු ලැබේ. අනුවාදධිකරණයෙහි සඞ්ඝ තෙමේ විවාද කෙරේ නම් විවාදධිකරණ යි, විවාද කරමින් චොදනා කෙරේ නම් අනුවාදධිකරණ යි, චොදනා කරමින් ඇවැතට පැමිණේ නම් ආපත්තාධිකරණ යි, ඒ ඇවැතින් සඞ්ඝ තෙමේ කර්ම කෙරේ නම් කිච්චාධිකරණ යි. මෙසේ අනුවාදධිකරණ හෙතුයෙන් ආපත්තාධිකරණය වෙයි, කිච්චාධිකරණය වෙයි, විවාදධිකරණය වේ.

3. ආපත්තාධිකරණය කිච්චාධිකරණය වේ ද, විවාදධිකරණය වේ ද, අනුවාදධිකරණය වේ ද යත් :

ආපත්තාධිකරණය කිච්චාධිකරණය නො වෙයි, විවාදධිකරණය නො වෙයි, අනුවාදධිකරණය නො වේ. එහෙත් ආපත්තාධිකරණ හෙතුයෙන් කිච්චාධිකරණය වෙයි, විවාදධිකරණය වෙයි, අනුවාදධිකරණය වේ. කෙබඳු යැ යත් : ඇවැත්කඳු පස ම ආපත්තාධිකරණ යි, ඇවැත් කඳු සත ම ආපත්තාධිකරණ යි, මෙය ආපත්තාධිකරණ යි කියනු ලැබේ. ආපත්තාධිකරණයෙහි සඞ්ඝ තෙමේ විවාද කෙරේ නම් විවාදධිකරණ යි, විවාද කරමින් චොදනා කෙරේ නම් අනුවාදධිකරණ යි, චොදනා කරමින් ඇවැතට පැමිණේ නම් ආපත්තාධිකරණ යි, ඒ ඇවැතින් සඞ්ඝ තෙමේ කර්ම කෙරේ නම් කිච්චාධිකරණ යි. මෙසේ ආපත්තාධිකරණ හෙතුයෙන් කිච්චාධිකරණය වෙයි, විවාදධිකරණය වෙයි, අනුවාදධිකරණය වේ.

4. කිච්චාධිකරණය විවාදධිකරණය වේ ද, අනුවාදධිකරණය වේ ද, ආපත්තාධිකරණය වේ ද යත් :

කිච්චාධිකරණය විවාදධිකරණය නො වෙයි, අනුවාදධිකරණය නො වෙයි, ආපත්තාධිකරණය නො වේ. එහෙත් කිච්චාධිකරණ හෙතුයෙන් විවාදධිකරණය වෙයි, අනුවාදධිකරණය වෙයි, ආපත්තාධිකරණය වේ. කෙබඳු යැ යත් : සඞ්ඝයාගේ අපලොකන කර්ම යැ ඤත්ති කර්ම යැ ඤත්තිදුතිය කර්ම යැ ඤත්තිචතුත්ථ කර්ම යැ යි යම් කෘත්‍යභාවයක් කටයුතු බවෙක් වේ ද, මෙය කිච්චාධිකරණ යැ යි කියනු ලැබේ. කිච්චාධිකරණයෙහි සඞ්ඝ තෙමේ විවාද කෙරේ නම් විවාදධිකරණ යි, විවාද කරමින් චොදනා කෙරේ නම් අනුවාදධිකරණ යි, චොදනා කරමින් ඇවැතට පැමිණේ නම් ආපත්තාධිකරණ යි, ඒ ඇවතින් සඞ්ඝ තෙමේ කර්ම කෙරේ නම් කිච්චාධිකරණ යි. මෙසේ කිච්චාධිකරණ හෙතුයෙන් විවාදධිකරණ වෙයි, අනුවාදධිකරණ වෙයි, ආපත්තාධිකරණ වේ.

## පුච්ඡාවිසසජ්ජනවාරො

1. යත්ථ සතිවිනයො තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ සතිවිනයො, යත්ථ අමූළ්හවිනයො තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ අමූළ්හවිනයො, යත්ථ පටිඤ්ඤාතකරණං තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ පටිඤ්ඤාතකරණං, යත්ථ යෙභුය්‍යසිකා තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ යෙභුය්‍යසිකා, යත්ථ තස්සපාපිය්‍යසිකා තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ තස්සපාපිය්‍යසිකා, යත්ථ තිණවත්ථාරකො තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ තිණවත්ථාරකො.

2. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ සතිවිනයො තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ සතිවිනයො. න තත්ථ, අමූළ්හවිනයො, න තත්ථ පටිඤ්ඤාතකරණං, න තත්ථ යෙභුය්‍යසිකා, න තත්ථ තස්සපාපිය්‍යසිකා, න තත්ථ තිණවත්ථාරකො.

3 යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච අමූළ්හවිනයෙන ච -පෙ- සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච -පෙ- සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච -පෙ- සම්මුඛාවිනයෙන ච තස්සපාපිය්‍යසිකාය ච -පෙ- සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ තිණවත්ථාරකො තත්ථ සම්මුඛාවිනයො, යත්ථ සම්මුඛාවිනයො තත්ථ තිණවත්ථාරකො. න තත්ථ සතිවිනයො, න තත්ථ අමූළ්හවිනයො, න තත්ථ පටිඤ්ඤාතකරණං, න තත්ථ යෙභුය්‍යසිකා, න තත්ථ තස්සපාපිය්‍යසිකා.

---

## සංසට්ඨවාරො

1. සම්මුඛාවිනයොති වා සතිවිනයොති වා ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා: ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං; සම්මුඛාවිනයොති වා අමූළ්හවිනයොති වා -පෙ- සම්මුඛාවිනයොති වා පටිඤ්ඤාතකරණන්ති වා -පෙ- සම්මුඛාවිනයොති වා යෙභුය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තස්සපාපිය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තිණවත්ථාරකොති වා ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා, ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං:

2. සම්මුඛාවිනයොති වා සතිවිනයොති වා ඉමෙ ධම්මා, සංසට්ඨා, නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං සම්මුඛාවිනයොති වා -පෙ- අමූළ්හවිනයොති වා -පෙ- සම්මුඛාවිනයොති වා පටිඤ්ඤාතකරණන්ති වා -පෙ- සම්මුඛාවිනයොති වා යෙභුය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තස්ස පාපිය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තිණවත්ථාරකොති වා ඉමෙ ධම්මා සංසට්ඨා, නො විසංසට්ඨා. න ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං.

## පාචජා විසර්ජනවාරය

1. යම් තැනෙක්හි සතිවිනය වේ නම් එහි සම්මුඛාවිනය වේ ද, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි සතිවිනය වේ ද, යම් තැනෙක්හි අමූළ්හවිනය වේ නම් එහි සම්මුඛාවිනය වේ ද, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි අමූළ්හවිනය වේ ද, යම් තැනෙක්හි පටිඤ්ඤාතකරණය වේ නම් එහි සම්මුඛාවිනය වේ ද, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි පටිඤ්ඤාතකරණය වේ ද, යම් තැනෙක්හි යෙභුය්‍යසිකාව වේ නම් එහි සම්මුඛාවිනය වේ ද යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි යෙභුය්‍යසිකාව වේ ද යම් තැනෙක්හි තස්සපාපියාසිකාව වේ නම් එහි සම්මුඛාවිනය වේ ද, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි තස්සපාපියාසිකාව වේ ද, යම් තැනෙක්හි තිණවත්ථාරකය වේ නම් එහි සම්මුඛාවිනය වේ ද, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි තිණවත්ථාරකය වේ ද යත් :

2. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද සතිවිනයෙන් ද අධිකරණය සන්හිඳේ ද, යම් තැනෙක්හි සතිවිනය වේ නම් එහි සම්මුඛාවිනය වෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි සතිවිනය වෙයි. එහි අමූළ්හවිනය නො වෙයි, එහි පටිඤ්ඤාතකරණය නො වෙයි, එහි යෙභුය්‍යසිකාව නො වෙයි, එහි තස්සපාපියාසිකාව නො වෙයි, එහි තිණවත්ථාරකය නො වේ.

3. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද අමූළ්හවිනයෙන් ද . . . . සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද . . . . සම්මුඛාවිනයෙන් ද යෙභුය්‍යසිකාවෙන් ද . . . . සම්මුඛාවිනයෙන් ද තස්සපාපියාසිකාවෙන් ද . . . . සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් ද අධිකරණය සන්හිඳේ ද, යම් තැනෙක්හි තිණවත්ථාරකය වේ නම් එහි සම්මුඛාවිනය වෙයි, යම් තැනෙක්හි සම්මුඛාවිනය වේ නම් එහි තිණවත්ථාරකය වෙයි, එහි සතිවිනය නො වෙයි, එහි අමූළ්හවිනය නො වෙයි, එහි පටිඤ්ඤාතකරණය නො වෙයි, එහි යෙභුය්‍යසිකාව නො වෙයි, එහි තස්සපාපියාසිකාව නො වේ.

---

## සංසෘෂ්ටවාරය

1. සම්මුඛාවිනයැ යි හෝ සතිවිනයැ යි හෝ මේ ධර්මයෝ මිශ්‍රයෝ ද නැතහොත් අමිශ්‍රයෝ ද, මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට ලැබේ ද යත් : සම්මුඛාවිනයැ යි හෝ අමූළ්හවිනයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ පටිඤ්ඤාතකරණයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ යෙභුය්‍යසිකායැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තස්සපාපියාසිකා යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තිණවත්ථාරක යැ යි හෝ මේ ධර්මයෝ මිශ්‍රයෝ ද නැතහොත් අමිශ්‍රයෝ ද, මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට ලැබේ ද යත් :

2. සම්මුඛාවිනයැ යි හෝ සතිවිනයැ යි හෝ මේ ධර්මයෝ මිශ්‍රයහ, අමිශ්‍රයෝ නො වෙත්. මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට නො ලැබිය හැක්කැ. සම්මුඛාවිනයැ යි හෝ අමූළ්හවිනයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ පටිඤ්ඤාතකරණයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ හෝ යෙභුය්‍යසිකායැ යි හෝ . . . . සම්මුඛාවින යැ යි හෝ තස්සපාපියාසිකායැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තිණවත්ථාරකයැ යි හෝ මේ ධර්මයෝ මිශ්‍රයහ, අමිශ්‍රයෝ නො වෙත්. මේ ධර්මයන් වෙන් වෙන් කොට වෙනස දක්වන්නට නො ලැබිය හැකියි.

Free Distribution www.aathaapi.org

## සමථනිදානාදයො

1. සම්මුඛාවිනයො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො: සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං -පෙ- යෙභුය්‍යසිකා -පෙ- තස්සපාපියසිකා -පෙ- තිණවත්ථාරකො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො:

සම්මුඛාවිනයො නිදානනිදානො, නිදානසමුදයො, නිදානජාතිකො, නිදානපභවො, නිදානසම්භාරො, නිදානසමුට්ඨානො. සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං නිදානනිදානං, නිදානසමුදයං, නිදානජාතිකං, නිදානපභවං, නිදානසම්භාරං, නිදානසමුට්ඨානං. යෙභුය්‍යසිකා නිදානනිදානා, නිදානසමුදයා, නිදානජාතිකා, නිදානපභවා, නිදානසම්භාරා, නිදානසමුට්ඨානා. තස්සපාපියසිකා -පෙ- තිණවත්ථාරකො නිදානනිදානො, නිදානසමුදයො, නිදානජාතිකො, නිදානපභවො, නිදානසම්භාරො, නිදානසමුට්ඨානො.

2. සම්මුඛාවිනයො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො: සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං -පෙ- යෙභුය්‍යසිකා -පෙ- තස්සපාපියසිකා -පෙ- තිණවත්ථාරකො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො:

සම්මුඛාවිනයො හෙතුනිදානො, හෙතුසමුදයො, හෙතුජාතිකො, හෙතුපභවො, හෙතුසම්භාරො, හෙතුසමුට්ඨානො. සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං හෙතුනිදානං, හෙතුසමුදයං, හෙතුජාතිකං, හෙතුපභවං, හෙතුසම්භාරං, හෙතුසමුට්ඨානං, යෙභුය්‍යසිකා හෙතුනිදානා, හෙතුසමුදයා, හෙතුජාතිකා, හෙතුපභවා, හෙතුසම්භාරා, හෙතුසමුට්ඨානා. තස්සපාපියසිකා -පෙ- තිණවත්ථාරකො හෙතුනිදානො, හෙතුසමුදයො, හෙතුජාතිකො, හෙතුපභවො, හෙතුසම්භාරො, හෙතුසමුට්ඨානො.

3. සම්මුඛාවිනයො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො: සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං -පෙ- යෙභුය්‍යසිකා -පෙ- තස්සපාපියසිකා -පෙ තිණවත්ථාරකො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො:

## සමථනිදානාදිය

1\. සම්මුඛාවිනය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්: සතිවිනය . . . . අමූළ්හවිනය . . . . පටිඤ්ඤාතකරණය . . . . යෙභුය්‍යසිකාව . . . . තස්සපාපියාසිකාව . . . . තිණවත්ථාරකය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්:

සම්මුඛාවිනය නිදනනිදන කොට ඇත, නිදනසමුදය කොට ඇත, නිදනජාති කොට ඇත, නිදනප්‍රභව කොට ඇත, නිදනසම්භාර කොට ඇත, නිදනසමුට්ඨාන කොට කොට ඇති. සතිවිනය අමූළ්හවිනය . පටිඤ්ඤාතකරණය නිදනනි කොට ඇත, නිදනසමුදය කොට ඇත, නිදන ජාති කොට ඇත, නිදන ප්‍රභව කොට ඇත, නිදනසම්භාර කොට ඇත, නිදනසමුට්ඨාන කොට ඇති. යෙභුය්‍යසිකාව නිදන නිදන කොට ඇත, නිදන සමුදය කොට ඇත, නිදන ජාති කොට ඇත, නිදන ප්‍රභව කොට ඇත. නිදන සම්භාර කොට ඇත, නිදන සමුට්ඨාන කොට ඇති. තස්සපාපියාසිකාව . . . . තිණවත්ථාරකය නිදන නිදන කොට ඇත, නිදන සමුදය කොට ඇත, නිදන ජාති කොට ඇත, නිදන ප්‍රභව කොට ඇත, නිදන සම්භාර කොට ඇත, නිදන සමුට්ඨාන කොට ඇති.

2\. සම්මුඛාවිනය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්: සතිවිනය . . . . අමූළ්හවිනය . . . . පටිඤ්ඤාතකරණය . . . . යෙභුය්‍යසිකාව . . . . තස්සපාපියාසිකාව . . . . තිණවත්ථාරකය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්:

සම්මුඛාවිනය හෙතු නිදන කොට ඇත, හෙතු සමුදය කොට ඇත, හෙතු ජාති කොට ඇත, හෙතු ප්‍රභව කොට ඇත, හෙතු සම්භාර කොට ඇත, හෙතු සමුට්ඨාන කොට ඇති. සතිවිනය . . . . අමූළ්හවිනය . . . . පටිඤ්ඤාතකරණය හෙතු නිදන කොට ඇත, හෙතු සමුදය කොට ඇත, හෙතු ජාති කොට ඇත, හෙතු ප්‍රභව කොට ඇත, හෙතු සම්භාර කොට ඇත, හෙතු සමුට්ඨාන කොට ඇති. යෙභුය්‍යසිකාව හෙතු නිදන කොට ඇත, හෙතු සමුදය කොට ඇත, හෙතු ජාති කොට ඇත, හෙතු ප්‍රභව කොට ඇත, හෙතු සම්භාර කොට ඇත, හෙතු සමුට්ඨාන කොට ඇති. තස්සපාපියාසිකාව . . . . තිණවත්ථාරකය හෙතු නිදන කොට ඇත, හෙතු සමුදය කොට ඇත, හෙතු ජාති කොට ඇත, හෙතු ප්‍රභව කොට ඇත, හෙතු සම්භාර කොට ඇත, හෙතු සමුට්ඨාන කොට ඇති.

3\. සම්මුඛාවිනය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්: සතිවිනය . . . . අමූළ්හවිනය . . . . පටිඤ්ඤාතකරණය . . . . යෙභුය්‍යසිකාව . . . . තස්සපාපියාසිකාව . . . . තිණවත්ථාරකය කුමක් නිදන කොට ඇද්ද, කුමක් සමුදය කොට ඇද්ද, කුමක් ජාති කොට ඇද්ද, කුමක් ප්‍රභව කොට ඇද්ද, කුමක් සම්භාර කොට ඇද්ද, කුමක් සමුට්ඨාන කොට ඇද්ද යත්:

සම්මුඛාවිනයො පච්චයනිදානො, පච්චයසමුදයො, පච්චයජාතිකො, පච්චයපභවො, පච්චයසම්භාරො, පච්චයසමුට්ඨානො. සතිවිනයො -පෙ- අමූළ්හවිනයො -පෙ- පටිඤ්ඤාතකරණං පච්චයනිදානං, පච්චයසමුදයං, පච්චයජාතිකං, පච්චයපභවං, පච්චයසම්භාරං, පච්චයසමුට්ඨානං. යෙභුය්‍යසිකා පච්චයනිදානා, පච්චයසමුදයා, පච්චයජාතිකා, පච්චයපභවා, පච්චයසම්භාරා, පච්චයසමුට්ඨානා, තස්සපාපියසිකා -පෙ- තිණවත්ථාරකො පච්චයනිදානො, පච්චයසමුදයො, පච්චයජාතිකො, පච්චයපභවො, පච්චයසම්භාරො, පච්චයසමුට්ඨානො.

4. සත්තන්නං සමථානං කති මූලානි, කති සමුට්ඨානා: සත්තන්නං සමථානං ඡබ්බීස මූලානි, ඡත්තිංස සමුට්ඨානා.

සත්තන්නං සමථානං කතමානි ඡබ්බීස මූලානි; සම්මුඛාවිනයස්ස චත්තාරි මූලානි: සඞ්ඝසම්මුඛතා, ධම්මසම්මුඛතා, විනයසම්මුඛතා, පුග්ගලසම්මුඛතා. සතිවිනයස්ස චත්තාරි මූලානි -පෙ- අමූළ්හවිනයස්ස චත්තාරි මූලානි -පෙ- පටිඤ්ඤාතකරණස්ස ද්වෙ මූලානි: යො ච දෙසෙති, යස්ස ච දෙසෙති. යෙභුය්‍යසිකාය චත්තාරි මූලානි -පෙ- තස්සපාපියසිකාය චත්තාරි මූලානි -පෙ- තිණවත්ථාරකස්ස චත්තාරි මූලානි: සඞ්ඝසම්මුඛතා, ධම්මසම්මුඛතා, විනයසම්මුඛතා, පුග්ගලසම්මුඛතා. සත්තන්නං සමථානං ඉමානි ඡබ්බීස මූලානි.

සත්තන්නං සමථානං කතමෙ ඡත්තිංස සමුට්ඨානා: සතිවිනයස්ස කම්මස්ස කිරියා, කරණං, උපගමනං, අජ්ඣුපගමනං, අධිවාසනා, අප්පටික්කොසනා. අමූළ්හවිනයස්ස කම්මස්ස -පෙ- පටිඤ්ඤාතකරණස්ස කම්මස්ස -පෙ- යෙභුය්‍යසිකාය කම්මස්ස -පෙ- තස්ස පාපියසිකාය කම්මස්ස -පෙ- තිණවත්ථාරකස්ස කම්මස්ස කිරියා, කරණං, උපගමනං, අජ්ඣුපගමනං, අධිවාසනා, අප්පටික්කොසනා. සත්තන්නං සමථානං ඉමෙ ඡත්තිංස සමුට්ඨානා.

---

## සමථ නානත්ථාදයො

1. සම්මුඛාවිනයොති වා සතිවිනයොති වා ඉමෙ ධම්මා නානත්ථා නානාබ්‍යඤ්ජනා, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං: සම්මුඛාවිනයොති වා අමූළ්හවිනයොති වා -පෙ- සම්මුඛාවිනයොති වා, පටිඤ්ඤාතකරණන්ති වා -පෙ- සම්මුඛාවිනයොති වා යෙභුය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තස්සපාපියසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තිණවත්ථාරකොති වා ඉමෙ ධම්මා නානත්ථා නානාබ්‍යඤ්ජනා, උදාහු එකත්ථා බ්‍යඤ්ජනමෙව නානං:

සම්මුඛාවිනයොති වා සතිවිනයොති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච. සම්මුඛාවිනයොති වා අමූළ්හවිනයොති වා -පෙ- සම්මුඛාවිනයොති වා පටිඤ්ඤාතකරණන්ති වා -පෙ- සම්මුඛාවිනයොති වා යෙභුය්‍යසිකාති වා -පෙ- සම්මුඛාවිනයොති වා තස්සපාපියසිකාති වා, -පෙ- සම්මුඛාවිනයොති වා තිණවත්ථාරකොති වා ඉමෙ ධම්මා නානත්ථා චෙව නානාබ්‍යඤ්ජනා ච.

සම්මුඛාවිනය ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇති,සතිවිනය . . . . අමූළ්හවිනය . . . . පටිඤ්ඤාතකරණය ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇති. යෙභුය්‍යසිකාව ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇති. තස්සපාපිය්‍යසිකාව . . . . තිණවත්ථාරකය ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇති.

4. සප්ත ශමථයන් පිළිබඳ මුල් කෙතෙක් ද, සමුට්ඨාන කෙතෙක් ද යත් : සප්ත ශමථයන් පිළිබඳ මුල් සවිස්සෙකැ. සමුට්ඨාන සතිසෙකි.

සප්ත ශමථයන් පිළිබඳ මුල් සවිස්ස කවරේ ද යත් : සඞ්ඝසම්මුඛතා යැ, ධම්මසම්මුඛතා යැ, විනයසම්මුඛතා යැ, පුග්ගලසම්මුඛතා යි සම්මුඛාවිනය පිළිබඳ මුල් සතරෙකි. සතිවිනය පිළිබඳ මුල් සතරෙකි . . . . අමූළ්හවිනය පිළිබඳ මුල් සතරෙකි . . . . යමෙක් තෙමේත් දෙසා ද යමකුහටත් දෙසා ද යන පටිඤ්ඤාතකරණය පිළිබඳ මුල් දෙකෙකි. යෙභුය්‍යසිකාව පිළිබඳ මුල් සතරෙකි . . . . තස්සපාපිය්‍යසිකාව පිළිබඳ මුල් සතරෙකි . . . . සඞ්ඝසම්මුඛතා යැ, ධම්මසම්මුඛතා යැ, විනයසම්මුඛතා යැ, පුග්ගලසම්මුඛතා යි තිණවත්ථාරකය පිළිබඳ මුල් සතරෙකැ යි මේ සප්ත ශමථයන් පිළිබඳ මුල් සවිස්ස යි.

සප්තශමථයන් පිළිබඳ සතිස් සමුට්ඨානයෝ කවරහු ද යත් : සතිවිනය කර්මය පිළිබඳ ක්‍රියා යැ, කරණ යැ, උපගමන යැ, අද්ධ්‍යුපගමන යැ, අධිවාසනා යැ, අප්‍රතික්‍රොශ පිළිබඳ ක්‍රියා යැ, කරණ යැ, උපගමන යැ, අද්ධ්‍යුපගමන යැ, අධිවාසනා යැ, අප්‍රති-ක්‍රොශන යයි. අමූළ්හවිනය කර්මය පිළිබඳ . . . . පටිඤ්ඤාතකරණ කර්මය පිළිබඳ . . . . යෙභුය්‍යසිකා කර්මය පිළිබඳ . . . . තස්සපාපිය්‍යසිකා කර්මය පිළිබඳ . . . . තිණවත්ථාරක කර්මය පිළිබඳ ක්‍රියා යැ, කරණ යැ, උපගමන යැ, අද්ධ්‍යුපගමන යැ, අධිවාසනා යැ, අප්‍රතික්‍රොශන යැ යි මොහු සප්ත ශමථයන් පිළිබඳ සතිස් සමුට්ඨානයෝ වෙත්.

---

## ශමථ නානාර්ථාදිය

1. සම්මුඛාවිනයැ යි හෝ සතිවිනයැ යි හෝ මේ ධර්මයෝ නානාත්ර්ථයෝ ද, නානාබ්‍යඤ්ජනයෝ ද, නොහොත් එකාර්ථතා ඇත්තෝ ද, බ්‍යඤ්ජන මතුයෙක් වෙනස් වූවාහු ද යත් : සම්මුඛාවිනයැ යි හෝ අමූළ්හවිනයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ පටිඤ්ඤාතකරණ යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ යෙභුය්‍යසිකා යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තස්සපාපිය්‍යසිකා යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තිණවත්ථාරක යැ යි හෝ මේ ධර්මයෝ නානාත්ර්ථයෝ ද, නානාබ්‍යඤ්ජනයෝ ද, නොහොත් එකාත්ර්ථයෝ ද, බ්‍යඤ්ජන මතුයෙක් වෙනස් ද යත් :

සම්මුඛාවිනයැ යි හෝ සතිවිනයැ යි හෝ මේ ධර්මයෝ නානාත්ර්ථ ද නානාබ්‍යඤ්ජන ද වෙති. සම්මුඛාවිනයැ යි හෝ අමූළ්හවිනයැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ පටිඤ්ඤාතකරණ යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ යෙභුය්‍යසිකා යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තස්සපාපිය්‍යසිකා යැ යි හෝ . . . . සම්මුඛාවිනයැ යි හෝ තිණවත්ථාරක යැ යි හෝ මේ ධර්මයෝ නානාත්ර්ථ ද නානාබ්‍යඤ්ජන ද වෙත්.

2. විවාදෙ විවාදාධිකරණං, විවාදෙ නො අධිකරණං, අධිකරණං නො විවාදෙ, අධිකරණංචෙව විවාදෙ ච.

සියා විවාදෙ විවාදාධිකරණං, සියා විවාදෙ නො අධිකරණං, සියා අධිකරණං නො විවාදෙ, සියා අධිකරණංචෙව විවාදෙ ච.

තත්‍ථ කතමො විවාදෙ විවාදාධිකරණං: ඉධ භික්ඛූ විවදන්ති ධම්මොති වා අධම්මොති වා -පෙ- දුට්ඨුල්ලාපත්තීති වා අදුට්ඨුල්ලාපත්තීති වා, යං තත්‍ථ භණ්ඩනං කලහො විග්ගහො විවාදෙ නානාවාදෙ අඤ්ඤථාවාදෙ විපච්චයතා වොහාරො මෙධගං, අයං විවාදෙ විවාදාධිකරණං.

තත්‍ථ කතමො විවාදෙ නො අධිකරණං: මාතාපි පුත්තෙන විවදති, පුත්තොපි මාතරා විවදති, පිතාපි පුත්තෙන විවදති, පුත්තොපි පිතරා විවදති, භාතාපි භාතරා විවදති, භාතාපි භගිනියා විවදති, භගිනීපි භාතරා විවදති, සහායොපි සහායෙන විවදති, අයං විවාදෙ නො අධිකරණං.

තත්‍ථ කතමං අධිකරණං නො විවාදෙ: අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං, ඉදං අධිකරණං නො විවාදෙ.

තත්‍ථ කතමං අධිකරණං චෙව විවාදෙ ච: විවාදාධිකරණං අධිකරණඤ්චෙව විවාදෙ ච.

3. අනුවාදෙ අනුවාදාධිකරණං, අනුවාදෙ නො අධිකරණං, අධිකරණං නො අනුවාදෙ, අධිකරණඤ්චෙව අනුවාදෙ ච.

සියා අනුවාදෙ අනුවාදාධිකරණං, සියා අනුවාදෙ නො අධිකරණං, සියා අධිකරණං නො අනුවාදෙ, සියා අධිකරණඤ්චෙව අනුවාදෙ ච.

තත්‍ථ කතමො අනුවාදෙ අනුවාදාධිකරණං: ඉධ භික්ඛූ භික්ඛුං අනුවදන්ති සීලවිපත්තියා වා ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා ආජීවවිපත්තියා වා, යො තත්‍ථ අනුවාදෙ අනුවදනා අනුල්ලපනා අනුභණනා අනුසම්පවඞ්කතා අබ්භුස්සහනතා අනුබලප්පදානං, අයං අනුවාදෙ අනුවාදාධිකරණං.

තත්‍ථ කතමො අනුවාදෙ නො අධිකරණං: මාතාපි පුත්තං අනුවදති, පුත්තොපි මාතරං අනුවදති, පිතාපි පුත්තං අනුවදති, පුත්තොපි පිතරං අනුවදති, භාතාපි භාතරං අනුවදති, භාතාපි භගිනිං අනුවදති, භගිනිපි භාතරං අනුවදති, සහායොපි සහායං අනුවදති, අයං අනුවාදෙ නො අධිකරණං.

තත්‍ථ කතමං අධිකරණං නො අනුවාදෙ: ආපත්තාධිකරණං කිච්චාධිකරණං විවාදාධිකරණං, ඉදං අධිකරණං නො අනුවාදෙ.

තත්‍ථ කතමං අධිකරණඤ්චෙව අනුවාදෙ ච: අනුවාදාධිකරණං අධිකරණඤ්චෙව අනුවාදෙ ච.

4. ආපත්ති ආපත්තාධිකරණං. ආපත්ති නො අධිකරණං. අධිකරණං නො ආපත්ති අධිකරණඤ්චෙව ආපත්ති ච.

2. විවාදය විවාදධිකරණ වේ ද, විවාදය අධිකරණ නො වේ ද, අධිකරණය විවාද නො වේ ද, අධිකරණ වූයේ ම විවාද වේ ද යත් :

විවාදය විවාදධිකරණ විය හෙයි, විවාදය අධිකරණ නො විය හෙයි, අධිකරණය විවාද නො විය හෙයි, අධිකරණ ද වූයේ ම විවාදත් විය හෙයි.

එහි කවර විවාදයෙක් විවාදධිකරණ වේ ද යත් : මෙ සස්නෙහි මහණහු ධර්ම යැ යි හෝ අධර්ම යැ යි හෝ විවාද කෙරෙත් ද . . . . තුළුල් ඇවැතැයි හෝ නො තුළුල් ඇවැතැයි හෝ විවාද කෙරෙත් ද, එහි යම් අරගලයෙක් කලහයෙක් විරුද්ධග්‍රහණයෙක් විරුද්ධ-වාදයෙක් නානාවාදයෙක් අන්‍යථාවාදයෙක් සිතෙහි දුක් ඇති කිරීම පිණිස වූ පරුෂ වචනයෙක් හිංසායෙක් වේ ද, මේ විවාදය විවාදධිකරණ වේ.

එහි කවර විවාදයෙක් අධිකරණ නො වේ ද යත් : පුතු හා මවු ද විවාද කෙරෙයි, මව හා පුත් ද විවාද කෙරෙයි, පුතු හා පියා ද විවාද කෙරෙයි, පියා හා පුත් ද විවාද කෙරෙයි, බෑයා හා බෑයා ද විවාද කෙරෙයි, බුහුන හා බෑයා ද විවාද කෙරෙයි. බෑයා හා බුහුන ද විවාද කෙරෙයි. යහළු හා යහළුවා විවාද කෙරේ. මේ විවාද යි අධිකරණ නො වේ.

එහි විවාද නොවූ අධිකරණ කවර යැ යත් : අනුවාදධිකරණ යැ ආපත්තාධිකරණ යැ කිච්චාධිකරණ යැ යන මේ විවාද නො වූ අධිකරණ යි.

එහි කුමක් අධිකරණ වූයේ ම විවාදත් වෙයි යත් : විවාදධිකරණය අධිකරණ වූයේ ම විවාද ද වේ.

3. අනුවාදය අනුවාදධිකරණ වේ ද, අනුවාදය අධිකරණ නො වේ ද, අධිකරණය අනුවාද නො වේ ද, අධිකරණ වූයේ ම අනුවාදත් වේ ද යත් :

අනුවාදය අනුවාදධිකරණ විය හෙයි, අනුවාදය අධිකරණ නො විය හෙයි, අධිකරණය අනුවාද නො විය හෙයි. අධිකරණ වූයේ ම අනුවාදත් විය හෙයි.

එහි කවර අනුවාදයෙක් අනුවාදධිකරණ වේ යැ යත් : මෙ සස්නෙහි මහණහු මහණක්හට ශීලවිපත්තියෙන් හෝ ආචාරවිපත්තියෙන් හෝ දෘෂ්ටිවිපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් හෝ චොදනා කෙරෙති. එහි යම් චොදනා කිරීමෙක් පුනපුනා කීමෙක් පුනපුනා තෙපලීමෙක් පුනපුනා බිණීමෙක් පුනපුනා තිදොරින් අවනත වීමෙක් දඬි වැ නැඟී සිටීමෙක් අනුබල දීමෙක් වේ ද, මේ අනුවාදය අනුවාදධිකරණ වේ.

එහි කවර අනුවාදයෙක් අධිකරණ නො වේ ය යත් : මව ද පුතුට චොදනා කෙරෙයි, පුත් ද මවට චොදනා කෙරෙයි, පියා ද පුතුට චොදනා කෙරෙයි, පුත් ද පියාට චොදනා කෙරෙයි, බෑයා ද බෑයාට චොදනා කෙරෙයි, බෑයා ද බුහුනට චොදනා කෙරෙයි, බුහුන ද බෑයාට චොදනා කෙරෙයි, යහළුවා ද යහළුවාට චොදනා කෙරේ. මේ අනුවාද යි, අධිකරණ නො වේ.

එහි කවර අධිකරණයෙක් අනුවාද නො වේ යැ යත් : ආපත්තාධිකරණ යැ කිච්චාධිකරණ යැ විවාදධිකරණ යැ යන මේ අධිකරණ වෙයි, අනුවාද නො වේ.

එහි කවරෙක් අධිකරණ වූයේ ම අනුවාදත් වේ යැ යත් : අනුවාදධිකරණය අධිකරණ වූයේ ම අනුවාදත් වේ.

4. ආපත්තිය ආපත්තාධිකරණ වේ ද, ආපත්තිය අධිකරණ නො වේ ද, අධිකරණය ආපත්ති නො වේ ද, අධිකරණ වූයේ ම ආපත්තිත් වේ ද යත් :

සියා ආපත්ති ආපත්තාධිකරණං, සියා ආපත්ති නො අධිකරණං, සියා අධිකරණං නො ආපත්ති, සියා අධිකරණඤ්චෙව ආපත්ති ච.

තත්ථ කතමා ආපත්ති ආපත්තාධිකරණං: පඤ්චපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං, සත්තපි ආපත්තික්ඛන්ධා ආපත්තාධිකරණං. අයං ආපත්ති ආපත්තාධිකරණං.

තත්ථ කතමා ආපත්ති නො අධිකරණං: සොතාපත්ති සමාපත්ති, අයං ආපත්ති නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො ආපත්ති: කිච්චාධිකරණං, විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ඉදං අධිකරණං නො ආපත්ති.

තත්ථ කතමං අධිකරණඤ්චෙව ආපත්ති ච: ආපත්තාධිකරණං අධිකරණඤ්චෙව ආපත්ති ච.

5. කිච්චං කිච්චාධිකරණං, කිච්චං නො අධිකරණං, අධිකරණං නො කිච්චං, අධිකරණඤ්චෙව කිච්චඤ්ච:

සියා කිච්චං කිච්චාධිකරණං, සියා කිච්චං නො අධිකරණං, සියා අධිකරණං නො කිච්චං, සියා අධිකරණඤ්චෙව කිච්චඤ්ච.

තත්ථ කතමං කිච්චං කිච්චාධිකරණං: යං සඞ්ඝස්ස කිච්චයතා කරණීයතා අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතියකම්මං ඤත්තිචතුත්ථකම්මං, ඉදං කිච්චං කිච්චාධිකරණං.

තත්ථ කතමං කිච්චං නො අධිකරණං: ආචරියකිච්චං උපජ්ඣායකිච්චං[1] සමානුපජ්ඣායකිච්චං සමානාචරියකිච්චං, ඉදං කිච්චං නො අධිකරණං.

තත්ථ කතමං අධිකරණං නො කිච්චං: විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං, ඉදං අධිකරණං නො කිච්චං.

තත්ථ කතමං අධිකරණඤ්චෙව කිච්චඤ්ච: කිච්චාධිකරණං අධිකරණඤ්චෙව කිච්චඤ්චාති.

අධිකරණභෙදො නිට්ඨිතො.

---

තස්සුද්දානං:

1. අධිකරණං උක්කොටා ආකාරා පුග්ගලෙන ච,
නිදාන හෙතු පච්චයා මූලං සමුට්ඨානෙන ච.
ආපත්ති හොති යත්ථ ච සංසට්ඨා නිදානප්පභවා,[2]

2. හෙතුපච්චයමූලානි සමුට්ඨානෙන බ්‍යඤ්ජනං;
විවාදෙ අධිකරණන්ති භෙදාධිකරණෙ ඉදන්ති.

---

1. උපජ්ඣායකිච්චං සකිච්චං - සීමු. 1, 2.
2. සංසට්ඨනිදානෙන ච - මජසං.

Free Distribution www.aathaapi.org

ආපත්තිය ආපත්තාධිකරණ විය හෙයි, ආපත්තිය අධිකරණ නො විය හෙයි, අධිකරණය ආපත්ති නො විය හෙයි, අධිකරණ වූයේ ම ආපත්ති ද විය හෙයි.

එහි කවර ආපත්තියෙක් ආපත්තාධිකරණ වේ යැ යත් : පඤ්චාපත්තිස්කන්ධයෝ ද ආපත්තාධිකරණ යැ, සප්තාපත්තිස්කන්ධයෝ ද ආපත්තාධිකරණ යි, මේ ආපත්ති ආපත්තාධිකරණ වේ.

එහි කවර ආපත්තියෙක් අධිකරණය නො වේ යැ යත් : සොතාපත්ති යැ සමාපත්ති යැ යන මේ ආපත්ති යැ, අධිකරණ නො වේ.

එහි කවර අධිකරණයෙක් ආපත්ති නො වේ යැ යත් : කිච්චාධිකරණ යැ විවාදධිකරණ යැ අනුවාදධිකරණ යැ යන මේ, අධිකරණ වෙයි, ආපත්ති නො වේ.

එහි කවරෙක් අධිකරණ වූයේ ම ආපත්ති ද වේ යැ යත් : ආපත්තාධිකරණය අධිකරණ වූයේ ම ආපත්ති ද වේ.

5. කෘත්‍යය කිච්චාධිකරණ වේ ද, කෘත්‍යය අධිකරණ නො වේ ද, අධිකරණය කෘත්‍ය නො වේ ද, අධිකරණ වූයේ ම කෘත්‍යයත් වේ ද යත් :

කෘත්‍යය කිච්චාධිකරණ විය හෙයි, කෘත්‍යය අධිකරණ නො විය හෙයි, අධිකරණය කෘත්‍ය නො විය හෙයි, අධිකරණ වූයේ ම කෘත්‍යයත් විය හෙයි.

එහි කවර කෘත්‍යයෙක් කිච්චාධිකරණ වේ යැ යත් : සඞ්ඝයාගේ අපලොකන කර්ම යැ, ඤත්තිකර්ම යැ, ඤත්තිදුතියකර්ම යැ, ඤත්තිචතුත්ථකර්මයැ, යම් කෘත්‍යභාවයෙක් කටයුතු බවෙක් වේ ද, මේ කෘත්‍යය කිච්චාධිකරණ වේ.

එහි කවර කෘත්‍යයෙක් අධිකරණ නො වේ යැ යත් : ආචාර්‍ය්‍ය කෘත්‍යයෙක් උපාධ්‍යාය කෘත්‍යයෙක් සමානොපාධ්‍යාය කෘත්‍යයෙක් සමානාචාර්‍ය්‍ය කෘත්‍යයෙක් වේ ද, මේ කෘත්‍ය වෙයි. අධිකරණ නො වේ.

එහි කවර අධිකරණයෙක් කෘත්‍ය නො වේ යැ යත් : විවාදාධිකරණයෙක් අනුවාදාධිකරණයෙක් ආපත්තාධිකරණයෙක් වේ ද, මේ අධිකරණ වෙයි. කෘත්‍ය නො වේ.

එහි කුමක් අධිකරණ වූයේ ම කෘත්‍යයත් වේ යැ යත් : කිච්චාධිකරණය අධිකරණ වූයේ ම කෘත්‍යයත් වේ.

අධිකරණභෙද නිමි.

---

එහි නාමාවලිය :

අධිකරණ භෙද යැ උක්කොට යැ උක්කොටනාකාර යැ පුද්ගල භෙදය සමඟ අධිකරණ නිදාන යැ හෙතු යැ පච්ච යැ සමුට්ඨානය සමඟ මූල යැ ආපත්තිහොති යැ යත්ථ යැ සංසට්ඨ යැ නිදන යැ පභව යැ,

හෙතු යැ පච්ච යැ මූල යැ සමුට්ඨානය සමඟ බ්‍යඤ්ජන යැ විවාද යැ අධිකරණ යැ යන මෙය අධිකරණ භෙදයෙහි උද්දනය වේ.

---

11—ඒ 30906 (77/12)
Free Distribution www.aathaapi.org

# අපරගාථාසඞ්ගණිකං

1. චොදනා කිමත්ථාය සාරණා කිස්ස කාරණා,
සඞ්ඝො කිමත්ථාය මතිකම්මං පන කිස්ස කාරණා:

2. චොදනා සාරණත්ථාය නිග්ගහත්ථාය සාරණා,
සඞ්ඝො පරිග්ගහත්ථාය මතිකම්මං පන පාටියෙක්කං.

3. මා ඛො තුරිතො අභණි මා ඛො චණ්ඩික්කතො භණි,
මා ඛො පටිඝං ජනයි සචෙ අනුවිජ්ජකො තුවං.

4. මා ඛො සහසා අභණි කථං විග්ගාහිකං අනත්ථසංහිතං,
සුත්තෙ විනයෙ අනුලොමෙ පඤ්ඤත්තෙ අනුලොමිකෙ.

5. අනුයොගවත්තං නිසාමය කුසලෙන බුද්ධිමතා කතං,
සුවුත්තං සික්ඛාපදානුලොමිකං ගතිං න නාසෙන්තො සම්පරායිකං.

6. හිතෙසී අනුයුඤ්ජස්සු කාලෙනත්ථූපසංහිතං,
චුදිතස්ස ච චොදකස්ස ච සහසා වොහාරං මා පධාරෙහි[1]

7. චොදකො ආහ ආපන්නොතී චුදිතකො ආහ අනාපන්නොති
උභො අනුක්ඛිපන්තො පටිඤ්ඤානුසන්ධිතෙන කාරයෙ.

8. පටිඤ්ඤා ලජ්ජීසු කතා අලජ්ජීසු එවං න විජ්ජති,
බහුම්පි අලජ්ජී භාසෙය්‍ය වත්තානුසන්ධිතෙන[2] කාරයෙ.

9 අලජ්ජී කීදිසො හොති පටිඤ්ඤා යස්ස න රූහති,
එවඤ්ච[3] තාහං පුච්ඡාමි කීදිසො වුච්චති අලජ්ජී පුග්ගලො:

10. සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති ආපත්තිං පරිගූහති,
අගතිගමනඤ්ච ගච්ඡති එදිසො වුච්චති අලජ්ජිපුග්ගලො.

11. සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති අලජ්ජිපුග්ගලො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි කීදිසො වුච්චති ලජ්ජිපුග්ගලො:

12. සඤ්චිච්ච ආපත්තිං නාපජ්ජති ආපත්තිං න පරිගූහති,
අගතිගමනං න ගච්ඡති එදිසො වුච්චති ලජ්ජිපුග්ගලො.

13. සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති ලජ්ජිපුග්ගලො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි කීදිසො වුච්චති අධම්මචොදකො:

---

1. පධාරෙසි - මජ්ඣං.
2. වුත්තානුසන්ධිතෙන - සිමු.
3. එතඤ්ච - මජ්ඣං.



Free Distribution www.aathaapi.org

# අපරගාථාසඞ්ගණිකය

1. චොදනාව කුමක් පිණිස යැ, වරද සිහිකරවීම කුමක් සඳහා යැ, සඞ්ඝ සන්නිපාතය කුමක් පිණිස යැ, යළි මතිකර්මය (විනයධරයන්ගේ විනය නය සංසන්දනය) කුමක් පිණිස යැ යත් :

2. චොදනාව කළ වරද සිහිපත් කරවනු පිණිස යැ, කළ වරද සිහිපත් කරවීම නිග්‍රහ පිණිස යැ, සඞ්ඝසන්නිපාතය (විනිශ්චයෙහි දැහැමි නො දැහැමි බව) දැනගන්නා පිණිස යැ, යළි මතිකර්මය වනාහි වෙන් වෙන් වැ විනිශ්චය මොනවට නිමවීම පිණිස යි.

3. ඉදින් තෙපි අනුවිජ්ජක වවු නම් යුහු වැ බස් නො කියව, සැඩ වැ බස් නො කියව, කෝපය නුපදව.

4. (පිරිස් කැළඹීම් ආදී) අවැඩින් යුත් කලහ උපදවන කථාවක් වහා නො කියව, උභතො විභඞ්ගයෙහි ද ඛන්ධකයෙහි ද පරිවාරයෙහි ද සියලු විනය පිටකයෙහි ද සතර මහාපදෙසයෙහි ද,

5. දක්ෂ වූ බුදුරජුන් විසින් එළවා තබන ලද මොනවට පනවන ලද සියලු සිකපදයන්ට අනුලොම් වූ අනුයොගවත පරලොව ඉපැත්ම (පිහිට) නො නසමින් සලකා බලව.

6. චුදිතකයාහට ද චොදකයාහට ද මෙත් සිත් පෙරදැරි වැ සුදුසු කාලයෙහි අර්ථසංහිත කොට විනිශ්චය කරව. ඔවුන් ලාහෙලා කියන ලද වචනය නො ගණුව.

7. චොදක ඇවැතට අවන්නෝ යයි කියා නම් චුදිතක නො අවන්මියි කියා නම් (එකල්හි) දෙපක්ෂයෙහි තෙපුල් බැහැර නො කරමින් කථානුසන්ධිය හා ප්‍රතිඥාව සලකා විනිශ්චය කරන්නේ යැ.

8. ප්‍රතිඥාව ලජ්ජී භික්ෂූන් කෙරෙහි කරන ලද්දී යැ. අලජ්ජීන් කෙරෙහි මේ පිළින විද්‍යමාන නො වෙයි. අලජ්ජී තෙමේ බොහෝ කොටත් කියන්නේ යැ. (එබැවින්) ඔහුගේ වත සමග යම් පිළිනෙක් ගැළපේ ද ඒ පිළිනෙන් විනිශ්චය කරන්නේ යැ.

9. අලජ්ජී පුද්ගල කෙබඳු වේ ද, යමක්හුගේ පිළින නො නගී ද, කෙබඳු වූයේ 'අලජ්ජී පුද්ගල'යී කියනු ලැබේ දැයි මෙසේත් මම ඔබ විචාරමි.

10. දැන දැන ඇවැතට පැමිණෙ යි, ඇවැත සඟවයි, (ඡන්දදීන් අගතියට ද යෙයි, මෙබඳු වූයේ ' අලජ්ජී පුද්ගල ' යි කියනු ලැබේ.

11. සැබැවැ, මම ද එය දනිමි. එබඳු වූයේ ' අලජ්ජී පුද්ගල 'යි කියනු ලැබේ. මම අනෙකක් ද ඔබ විචාරමි. කෙබඳු වූයේ ' ලජ්ජී පුද්ගල 'යි කියනු ලැබේ ද ?

12. දැන දැන ඇවැතට නො පැමිණෙයි, ඇවැත නො සඟවයි, අගතියට නො යෙයි, මෙබඳු වූයේ ' ලජ්ජී පුද්ගල 'යි කියනු ලැබේ.

13. සැබැවැ, මම ද එය දනිමි. එබඳු වූයේ ' ලජ්ජී පුද්ගල 'යි කියනු ලැබේ. මම අනෙකක් ද ඔබ විචාරමි. ' අධර්මචොදක ' කෙබඳු යැ යි කියනු ලැබේ ද ?



Free Distribution www.aathaapi.org

14. අකාලෙන චොදෙති අභූතෙන ඵරුසෙන අනත්ථසංහිතෙන,
දොසන්තරො චොදෙති නො මෙත්තචිත්තො[1] එදිසො වුච්චති
අධම්මචොදකො

15. සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති අධම්මචොදකො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි කීදිසො වුච්චති ධම්මචොදකො:

16. කාලෙන චොදෙති භූතෙන සණ්හෙන අත්ථසංහිතෙන,
මෙත්තචිත්තො චොදෙති නො දොසන්තරො එදිසො වුච්චති
ධම්මචොදකො

17. සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති ධම්මචොදකො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි කීදිසො වුච්චති බාලචොදකො:

18. පුබ්බාපරං න ජානාති පුබ්බාපරස්ස අකොවිදො,
අනුසන්ධිවචනපථං න ජානාති අනුසන්ධිවචනපථස්ස අකොවිදො
එදිසො වුච්චති බාලචොදකො.

19 සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති බාලචොදකො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි කීදිසො වුච්චති පණ්ඩිතචොදකො:

20. පුබ්බාපරං විජානාති[2] පුබ්බාපරස්ස කොවිදො,
අනුසන්ධිවචනපථං ජානාති අනුසන්ධිවචනපථස්ස කොවිදො;
එදිසො වුච්චති පණ්ඩිතචොදකො.

21. සච්චං අහම්පි ජානාමි එදිසො වුච්චති පණ්ඩිතචොදකො,
අඤ්ඤඤ්ච තාහං පුච්ඡාමි චොදනා කින්ති වුච්චති:

22. සීලවිපත්තියා චොදෙති අථො ආචාරදිට්ඨියා,
ආජීවෙනපි චොදෙති චොදනා තෙන වුච්චති.

අපරගාථාසඞ්ගණිකං නිට්ඨිතං

---

1. මෙත්තාචිත්තො - මජසං.
2. පුබ්බාපරම්පිජානාති - මජසං.

14. නො කල්හි චෝදනා කෙරෙයි, අභූතයෙන්, පරුෂවචනයෙන් අනර්ථ සංහිතයෙන් චෝදනා කෙරෙයි, ඇතුළත හටගත් ද්වේෂ ඇති වැ මෛත්සිත් නැති වැ චෝදනා කෙරෙයි. මෙබඳු පුද්ගල ' අධර්මචෝදක 'යි කියනු ලැබේ.

15. සැබැවැ, මම ද එය දනිමි. මෙබඳු පුද්ගල ' අධර්මචෝදක 'යි කියනු ලැබේ. මම අනෙකකුදු ඔබ විචාරමි. කෙබඳු පුද්ගල ' ධර්මචෝදක 'යි කියනු ලැබේ ද ?

16. නිසි කල්හි චෝදනා කෙරෙයි, භූතයෙන් සිලිටි බසින් අර්ථ සංහිතයෙන් චෝදනා කෙරෙයි. මෛත්සිත් ඇති වැ ඇතුළත හටගත් ද්වේෂ නැති වැ චෝදනා කෙරෙයි. මෙබඳු පුද්ගල ' ධර්මචෝදක 'යි කියනු ලැබේ.

17. සැබැවැ, මම ද එය දනිමි. මෙබඳු පුද්ගල ' ධර්මචෝදක 'යි කියනු ලැබේ. මම අනෙකකුදු ඔබ විචාරමි. කෙබඳු පුද්ගල ' බාලචෝදක 'යි කියනු ලැබේ ද ?

18. පෙර පසු කථාව නො දනියි, පෙර පසු කථාවෙහි අදක්ෂ වෙයි, අනුසන්ධි වචන මාර්ගය නො දනියි, අනුසන්ධි වචන මාර්ගයෙහි අදක්ෂ වෙයි, මෙබඳු පුද්ගල ' බාලචෝදක 'යි කියනු ලැබේ.

19. සැබැවැ, මම ද එය දනිමි. මෙබඳු පුද්ගල ' බාලචෝදක 'යි කියනු ලැබේ. මම අනෙකකුදු ඔබ විචාරමි. කෙබඳු පුද්ගල ' පණ්ඩිත චෝදක 'යි කියනු ලැබේ ද ?

20. පෙර පසු කථාව වෙසෙසින් දනියි, පෙර පසු කථාවෙහි දක්ෂ වෙයි, අනුසන්ධි වචන මාර්ගය දනියි, අනුසන්ධි වචන මාර්ගයෙහි දක්ෂ වෙයි, මෙබඳු පුද්ගල ' පණ්ඩිත චෝදක 'යි කියනු ලැබේ.

21. සැබැවැ, මම ද එය දනිමි. එබඳු පුද්ගල ' පණ්ඩිත චෝදක ' යි කියනු ලැබේ. මම අනෙකකුදු ඔබ විචාරමි. චෝදනා කිමැ යි කියනු ලැබේ ද ?

22. ශීල විපත්තියෙන් චෝදනා කෙරෙයි, යළි ආචාර විපත්තියෙන් හා දෘෂ්ටි විපත්තියෙන් චෝදනා කෙරෙයි, ආජීව විපත්තියෙනුදු චෝදනා කෙරෙයි, එයින් ' චෝදනා 'යි කියනු ලැබේ.

**අපරගාථාසඞ්ගණිකය නිමි.**

---

# චොදනාකණ්ඩො

## අනුවිජ්ජකස්ස අනුයොගො

1. අනුවිජ්ජකෙන චොදකො පුච්ඡිතබ්බො "යං ඛො ත්වං ආවුසො ඉමං භික්ඛුං චොදෙසි, කිම්හි නං චොදෙසි, සීලවිපත්තියා චොදෙසි, ආචාරවිපත්තියා චොදෙසි, දිට්ඨිවිපත්තියා චොදෙසී"ති.

2. සො චෙ එවං වදෙය්‍ය: "සීලවිපත්තියා වා චොදෙමි. ආචාරවිපත්තියා වා චොදෙමි. දිට්ඨිවිපත්තියා වා චොදෙමී"ති සො එවමස්ස වචනීයො: "ජානාසි පනායස්මා සීලවිපත්තිං, ජානාසි ආචාරවිපත්තිං, ජානාසි දිට්ඨිවිපත්ති"න්ති.

3. සො චෙ එවං වදෙය්‍ය: "ජානාමි ඛො අහං ආවුසො සීලවිපත්තිං, ජානාමි ආචාරවිපත්තිං. ජානාමි දිට්ඨිවිපත්ති"න්ති. සො එවමස්ස වචනීයො: "කතමා පනාවුසො සීලවිපත්ති, කතමා ආචාරවිපත්ති, කතමා දිට්ඨිවිපත්තී"ති.

4. සො චෙ එවං වදෙය්‍ය: "චත්තාරි පාරාජිකානි තෙරස සඞ්ඝාදිසෙසා, අයං සීලවිපත්ති. ථුල්ලච්චයං පාචිත්තියං පාටිදෙසනීයං දුක්කටං දුබ්භාසිතං, අයං ආචාරවිපත්ති. මිච්ඡාදිට්ඨි අන්තග්ගාහිකා දිට්ඨි, අයං දිට්ඨිවිපත්තී"ති. සො එවමස්ස වචනීයො: "යං ඛො ත්වං ආවුසො ඉමං භික්ඛුං චොදෙසි, දිට්ඨෙන චොදෙසි, සුතෙන චොදෙසි, පරිසඞ්කාය චොදෙසී"ති.

5. සො චෙ එවං වදෙය්‍ය: "දිට්ඨෙන වා චොදෙමි, සුතෙන වා චොදෙමි, පරිසඞ්කාය වා චොදෙමී"ති. සො එවමස්ස වචනීයො: "යං ඛො ත්වං ආවුසො ඉමං භික්ඛුං දිට්ඨෙන චොදෙසි, කින්තෙ දිට්ඨං, කින්ති තෙ දිට්ඨං, කදා තෙ දිට්ඨං, කත්ථ තෙ දිට්ඨං, පාරාජිකං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො, සඞ්ඝාදිසෙසං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො, ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො. කත්ථ ච ත්වං අහොසි, කත්ථ චායං භික්ඛු අහොසි, කිඤ්ච ත්වං කරොසි, කිඤ්චායං භික්ඛු කරොතී"ති.

6. සො චෙ එවං වදෙය්‍ය: "න ඛො අහං ආවුසො ඉමං භික්ඛුං දිට්ඨෙන චොදෙමි, අපි ච සුතෙන චොදෙමී"ති. සො එවමස්ස වචනීයො: "යං ඛො ත්වං ආවුසො ඉමං භික්ඛුං සුතෙන චොදෙසි, කින්තෙ සුතං, කින්ති තෙ සුතං, කදා තෙ සුතං, කත්ථ තෙ සුතං, පාරාජිකං අජ්ඣාපන්නොති සුතං, සඞ්ඝාදිසෙසං -පෙ- ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නොති සුතං, භික්ඛුස්ස සුතං, භික්ඛුනියා සුතං, සික්ඛමානාය සුතං, සාමණෙරස්ස සුතං, සාමණෙරියා සුතං, උපාසකස්ස සුතං, උපාසිකාය සුතං; රාජූනං සුතං, රාජමහාමත්තානං සුතං, තිත්ථියානං සුතං, තිත්ථියසාවකානං සුත"න්ති.



Free Distribution www.aathaapi.org

# චෝදනා කාණ්ඩය

## අනුවිජ්ජකානුයොගය

1. අනුවිජ්ජක විසින් ඇවැත්නි, තෙපි යම්හෙයකින් මේ මහණහට චෝදනා කරහු ද, කවර ඇවැතක් නිමිතිකොට ඔහුට චොදනා කරහු ද, ශීල විපත්තියෙන් චෙදනා කරහු ද, ආචාර විපත්තියෙන් චෙදනා කරහු ද, දෘෂ්ටි විපත්තියෙන් චෙදනා කරහුදැයි චොදකයා විචාළ යුතු යි.

2. ඉදින් හේ '' ශීල විපත්තියෙන් හෝ චොදනා කරමි, ආචාර විපත්තියෙන් හෝ චොදනා කරමි, දෘෂ්ටි විපත්තියෙන් හෝ චොදනා කරමි ''යි මෙසේ කියන්නේ නම් '' ආයුෂ්මත්නි, තෙපි ශීලවිපත්තිය දන්නහු ද, ආචාර විපත්තිය දන්නහු ද, දෘෂ්ටි විපත්තිය දන්නහු දැයි '' ඔහුට මෙසේ කිය යුතු යැ.

3. ඉදින් හේ '' ඇවැත්නි මම ශීලවිපත්තිය දනිමි, ආචාරවිපත්තිය දනිමි, දෘෂ්ටි විපත්තිය දනිමි '' යි මෙසේ කියන්නේ නම් '' ඇවැත්නි ශීල විපත්තිය කවර ද, ආචාර විපත්තිය කවර ද, දෘෂ්ටි විපත්තිය කවර දැයි ඔහුට මෙසේ කිය යුතු යැ.

4. ඉදින් හෙතෙම සතර පරිජි යැ තෙළෙස් සඟවෙසෙස් දැයි මෙය ශීල විපත්ති යි ද ථුලැසි යැ පචිති යැ පිළිදෙස්නී යැ දුකුළා යැ දුබැසි යැ යි මෙය ආචාර විපත් ති යි ද අන්ත ග්‍රාහික මිථ්‍යාදෘෂ්ටි දෘෂ්ටි විපත්ති යි ද මෙසේ කියන්නේ නම් '' ඇවැත්නි, යම් හෙයෙකින් තෙපි මෙ මහණ හට චොදනා කරහු ද, දක්නා ලද්දෙන් චොදනා කරහු ද, අසන ලද්දෙන් චොදනා කරහු ද, සැකයෙන් චොදනා කරහු දැ ''යි ඔහුට මෙසේ කිය යුතු යැ.

5. ඉදින් හේ '' දක්නා ලද්දෙන් හෝ චොදනා කෙරෙමි, අසන ලද්දෙන් හෝ චොදනා කෙරෙමි, සැකයෙන් හෝ චොදනා කෙරෙමි '' යි මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කිය යුතුය : ඇවැත්නි තෙපි යම්හෙයෙකින් මේ මහණහට දක්නා ලද්දෙන් චොදනා කරහු නම් තොප විසින් කුමක් දක්නා ලද ද, තොප විසින් කුමකැයි දක්නා ලද ද, තොප විසින් කවර කලෙකැ දක්නා ලද ද, තොප විසින් කොතැන්හි දක්නා ලද ද, පරිජියට අවදනේ දක්නා ලද ද, සඟවෙසෙසට අවදනේ දක්නා ලද ද, ථුලැසියට . . . . පචිතියට . . . පිළිදෙස්නියට . . . . දුකුළාවට . . . . දුබැසියට අවදනේ දක්නා ලද ද, තෙපි කොහි වූවහු ද, මේ මහණ කොහි වී ද, තෙපි කුමක් නම් කළහු ද, මේ මහණ කුමක් නම් කෙළේ දැයි කියා යි.

6. ඉදින් හේ '' ඇවැත්නි, මම මේ මහණහට දක්නා ලද්දෙන් නො ම චොදනා කරමි, එහෙත් අසන ලද්දෙන් චොදනා කරමි '' යි මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කිය යුතු ය : '' ඇවැත්නි, තෙපි යම් හෙයෙකින් මේ මහණහට අසන ලද්දෙන් චොදනා කරහු නම් තොප විසින් කුමක් අසන ලද ද, තොප විසින් කුමකැ යි අසන ලද ද, තොප විසින් කවර කලෙකැ අසන ලද ද, තොප විසින් කොතැන්හි අසන ලද ද, පරිජියට අවනැයි අසන ලද ද, සඟවෙසෙසට . . . . ථුලැසියට . . . . පචිතියට . . . . පිළිදෙස්නියට . . . . දුකුළාවට . . . . දුබැසියට අවනැයි අසන ලද ද, මහණක්හු ගෙන් අසන ලද ද, මෙහෙණක ගෙන් අසන ලද ද, සික්මනුවකගෙන් අසන ලද ද, හෙරණකුගෙන් අසන ලද ද, හෙරණක ගෙන් අසන ලද ද, උවසුවකුගෙන් අසන ලද ද, උවැසියකගෙන් අසන ලද ද, රජුන්ගෙන් අසන ලද ද, රජමහ ඇමතියන්ගෙන් අසන ලද ද, තොටුවන්ගෙන් අසන ලද ද, තොටු සව්වන්ගෙන් අසනලද දැ '' යි කියා යි.



Free Distribution www.aathaapi.org

7. සො චෙ එවං වදෙය්‍ය: "න ඛො අහං ආවුසො ඉමං භික්ඛුං සුතෙන චොදෙමි, අපි ච පරිසඞ්කාය චොදෙමී"ති සො එවමස්ස වචනීයො: යං ඛො ත්වං ආවුසො ඉමං භික්ඛුං පරිසඞ්කාය චොදෙසි, කිං පරිසඞ්කසි, කින්ති පරිසඞ්කසි, කදා පරිසඞ්කසි, කත්ථ පරිසඞ්කසි, පාරාජිකං අජ්ඣාපන්නොති පරිසඞ්කසි, සඞ්ඝාදිසෙසං -පෙ- ථුල්ලච්චයං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නොති පරිසඞ්කසි, භික්ඛුස්ස සුත්වා පරිසඞ්කසි, භික්ඛුනියා -පෙ- සික්ඛමානාය -පෙ- සාමණෙරස්ස -පෙ- සාමණෙරියා -පෙ- උපාසකස්ස -පෙ- උපාසිකාය -පෙ- රාජූනං -පෙ- රාජමහාමත්තානං -පෙ- තිත්ථියානං පෙ- තිත්ථියසාවකානං සුත්වා පරිසඞ්කසී"ති.

8. දිට්ඨං දිට්ඨෙන සමෙති දිට්ඨෙන සංසන්දතෙ දිට්ඨං,
දිට්ඨං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාරෙතබ්බො තෙනුපොසථො.

9. සුතං සුතෙන සමෙති සුතෙන සංසන්දතෙ සුතං,
සුතං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාරෙතබ්බො තෙනුපොසථො.

10. මුතං මුතෙන සමෙති මුතෙන සංසන්දතෙ මුතං,
මුතං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාරෙතබ්බො තෙනුපොසථොති.

11. චොදනාය කො ආදි, කිං මජ්ඣෙ, කිං පරියොසානං: චොදනාය ඔකාසකම්මං ආදි, කිරියා මජ්ඣෙ, සමථො පරියොසානං.

12. චොදනාය කති මූලානි, කති වත්ථූනි, කති භූමියො කතිහාකාරෙහි චොදෙති: චොදනාය ද්වෙ මූලානි, තීණි වත්ථූනි, පඤ්ච භූමියො, ද්වීහාකාරෙහි චොදෙති.

13. චොදනාය කතමානි ද්වෙ මූලානි: සමූලිකා වා අමූලිකා වා, චොදනාය ඉමානි ද්වෙ මූලානි.

14. චොදනාය කතමානි තීණි වත්ථූනි: දිට්ඨෙන සුතෙන පරිසඞ්කාය, චොදනාය ඉමානි තීණි වත්ථූනි.

15. චොදනාය කතමා පඤ්ච භූමියො: කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරොති, චොදනාය ඉමා පඤ්ච භූමියො.

16. කතමෙහි ද්වීහාකාරෙහි චොදෙති: කායෙන වා චොදෙති, වාචාය වා චොදෙති. ඉමෙහි ද්වීහාකාරෙහි චොදෙති.

Free Distribution www.aathaapi.org

7. ඉදින් හේ " ඇවැත්නි, මම මේ මහණහට අසන ලද්දෙන් නො ම චෝදනා කරමි, එහෙත් සැකයෙන් චෝදනා කරමි " යි මෙසේ කියන්නේ නම් ඔහුට මෙසේ කිය යුතු ය : ඇවැත්නි, තෙපි යම්හෙයෙකින් මේ මහණහට සැකයෙන් චෝදනා කරහු නම් කුමක් සැක කරහු ද, කුමකැයි සැක කරහු ද, කවර කලෙක සැක කරහු ද, කොතැන්හි සැක කරහු ද, පරිජියට අවනැයි සැක කරහු ද, සඟවෙසෙසට .... ථුලැසියට .... පචිතියට .... පිළිදෙස්නියට .... දුකුළාවට .... දුබැසියට අවනැයි සැක කරහු ද මහණක්හුගෙන් අසා සැක කරහු ද, මෙහෙණකගෙන් .... සික්මනුවකගෙන් .... හෙරණකුගෙන් .... හෙරණකගෙන් .... උවසුවකුගෙන් .... උවැසියකගෙන් .... රජුන්ගෙන් .... රජමහ ඇමතියන්ගෙන් .... තොටුවන්ගෙන් .... තොටුසච්වන් ගෙන් අසා සැක කරහු " දැයි කියා යි.

8. දක්නා ලද්ද දක්නා ලද්ද හා සම් වේද, දක්නා ලද්ද දක්නා ලද්ද හා සැසඳේ ද, දැකීම මැ නිසා පරිජිය පිළින නො කෙරේ ද, එබැවින් ඒ පුද්ගල තෙමේ අමූලක වැ අශුද්ධ යැ යි සැක කරණ ලද්දේ වෙයි. " මම ශුද්ධයෙමි " යි ඔහුගේ ප්‍රතිඥයෙන් ඔහු හා පොහෝ කටයුතු යැ.

9. අසන ලද්ද අසන ලද්ද හා සම වේ ද, අසන ලද්ද අසන ලද්ද හා සැසඳේ ද, ඇසීම මැ නිසා පරිජිය පිළින නො කෙරේ ද, එබැවින් ඒ පුද්ගල අමූලක වැ අශුද්ධ යැයි සැක කරණ ලද්දේ වෙයි. " මම ශුද්ධයෙමි " යි ඔහුගේ ප්‍රතිඥයෙන් ඔහු හා පොහෝ කටයුතු යැ.

10. (ගන්ධ - රස - ස්පර්ශ) මුතය මුතය හා සම වේ ද, මුතය මුතය හා සැසඳේ ද, මුතය මැ නිසා පරිජිය පිළින නො කෙරේ ද, එබැවින් ඒ පුද්ගල අමූලක වැ අශුද්ධ යැයි සැක කරණ ලද්දේ වෙයි. " මම ශුද්ධයෙමි " යි ඔහුගේ ප්‍රතිඥයෙන් ඔහු හා පොහෝ කටයුතු යි.

11. චෝදනාව පිළිබඳ ආදිය කවරේ ද, මද්ධ්‍යය කවරේ ද, අවසානය කවරේ ද යත් : අවසර ගැන්ම චෝදනාව පිළිබඳ ආදිය යි, චෝදනා කිරීම මද්ධ්‍යය යි, ශමථය අවසානයයි.

12. චෝදනාව පිළිබඳ මුල් කෙතෙක් ද, වස්තු කෙතෙක් ද, භූමි කෙතෙක් ද, කෙතෙක් අයුරෙකින් චෝදනා කෙරේ ද යත් : චෝදනාව පිළිබඳ මුල් දෙකෙකැ. වස්තු තුණෙකැ. භූමි පසෙකැ. දෙ අයුරෙකින් චෝදනා කෙරේ.

13. චෝදනාව පිළිබඳ මුල් දෙක කවරේ ද යත් : සමූලික යැ, අමූලික යැ යි චෝදනාවගේ මේ මුල් දෙක යි.

14. චෝදනාව පිළිබඳ වස්තු තුණ කවරේ ද යත් : දක්නා ලද්දෙන් යැ අසන ලද්දෙන් යැ සැකයෙන් යැයි චෝදනාව පිළිබඳ මේ වස්තු තුණයි.

15. චෝදනාව පිළිබඳ භූමි පස කවරේ ද යත් : සුදුසු කල්හි කියන්නෙමි නො සුදුසු කල්හි නො කියන්නෙමි, සත්‍යයෙන් කියන්නෙමි, අසත්‍යයෙන් නො කියන්නෙමි, මොළොක් බසින් කියන්නෙමි රළු බසින් නො කියන්නෙමි, අර්ථසංහිතයෙන් කියන්නෙමි, අනර්ථසංහිතයෙන් නො කියන්නෙමි, මෙත් සිත් ඇති වැ කියන්නෙමි, දූෂිත සිත් ඇති වැ නො කියන්නෙමි යි චෝදනාව පිළිබඳ මේ භූමි පස යි.

16. කවර දෙඅයුරෙකින් චෝදනා කෙරේ ද යත් : කයින් චෝදනා කෙරෙයි, වචනයෙන් චෝදනා කෙරෙයි, මේ දෙඅයුරෙන් චෝදනා කෙරේ.

## චොදකාදිපටිපත්ති

1. චොදකෙන කථං පටිපජ්ජිතබ්බං, චුදිතකෙන කථං පටිපජ්ජිතබ්බං, සඞ්ඝෙන කථං පටිපජ්ජිතබ්බං, අනුවිජ්ජකෙන කථං පටිපජ්ජිතබ්බං :

චොදකෙන කථං පටිපජ්ජිතබ්බන්ති, චොදකෙන පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය පරො චොදෙතබ්බො: කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි, නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරොති. චොදකෙන එවං පටිපජ්ජිතබ්බං.

චුදිතකෙන කථං පටිපජ්ජිතබ්බන්ති චුදිතකෙන ද්වීසු ධම්මෙසු පටිපජ්ජිතබ්බං: සච්චෙ ච, අකුප්පෙ ච. චුදිතකෙන එවං පටිපජ්ජිතබ්බං.

සඞ්ඝෙන කථං පටිපජ්ජිතබ්බන්ති සඞ්ඝෙන ඔතිණ්ණානොතිණ්ණං ජානිතබ්බං සඞ්ඝෙන එවං පටිපජ්ජිතබ්බං.

අනුවිජ්ජකෙන කථං පටිපජ්ජිතබ්බන්ති අනුවිජ්ජකෙන යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, තථා තං අධිකරණං වූපසමෙතබ්බං. අනුවිජ්ජකෙන එවං පටිපජ්ජිතබ්බං.

2 උපොසථො කිමත්ථාය පවාරණා කිස්ස කාරණා,
පරිවාසො කිමත්ථාය මූලායපටිකස්සනා කිස්ස කාරණා;
මානත්තං කිමත්ථාය අබ්භානං කිස්ස කාරණා.

3 උපොසථො සාමග්ගත්ථාය විසුද්ධත්ථාය පවාරණා,
පරිවාසො මානත්තත්ථාය මූලායපටිකස්සනා නිග්ගහත්ථාය;
මානත්තං අබ්භානත්ථාය විසුද්ධත්ථාය අබ්භානං.

4. ඡන්දා දොසා භයා මොහා ථෙරෙ ච පරිභාසති,
කායස්ස භෙදා දුප්පඤ්ඤො ඛතො උපහතින්ද්‍රියො;
නිරයං ගච්ඡති දුම්මෙධො න ච සික්ඛාය ගාරවො.

5. න චාමිසං හි නිස්සාය න ච නිස්සාය පුග්ගලං,
උභො එතෙ විවජ්ජෙත්වා යථා ධම්මො තථා කරෙ,

---

## චොදකස්ස අත්තජ්ඣාපනං

1. කොධනො උපනාහී ච,
චණ්ඩො ච පරිභාසකො,
අනාපත්තියා ආපත්තීති රොපෙති;
තාදිසො චොදකො ඣාපෙති අත්තානං.

## චෝදකාදිප්‍රතිපත්ති

1. චෝදකයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද, චුදිතකයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද, සඞ්ඝයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද, අනුවිජ්ජක විසින් කෙසේ පිළිපැදිය යුතු ද?

චෝදකයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද යත් : චෝදකයා විසින් සුදුසු කල්හි කියන්නෙමි නො සුදුසු කල්හි නො කියන්නෙමි, සත්‍යයෙන් කියන්නෙමි, අසත්‍යයෙන් නො කියන්නෙමි, මොළොක් බසින් කියන්නෙමි, රළු බසින් නො කියන්නෙමි, අර්ථ සංහිතයෙන් කියන්නෙමි, අනර්ථසංහිතයෙන් නො කියන්නෙමි, මෛත් සිත් ඇති වැ කියන්නෙමි, දූෂිත සිත් ඇති වැ නො කියන්නෙමි යි කරුණු පසෙහි පිහිටා මෙරමා චෝදනා කටයුතු වෙයි, චෝදකයා විසින් මෙසේ පිළිපැදිය යුතු වේ.

චුදිතකයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද යත් : චුදිතකයා විසින් සත්‍යයෙහි ද නො කිපෙන සුලු බවෙහි දැයි දෙ දහම්හි පිහිටිය යුතු යි. චුදිතකයා විසින් මෙසේ පිළිපැදිය යුතු වේ.

සඞ්ඝයා විසින් කෙසේ පිළිපැදිය යුතු ද යත් : සඞ්ඝයා විසින් (චෝදක චුදිතකයන්) බැස ගත් නො බැස ගත් පෙර පසු වචනය දතයුතු වෙයි. සඞ්ඝයා විසින් මෙසේ පිළිපැදිය යුතු වේ.

අනුවිජ්ජක විසින් කෙසේ පිළිපැදිය යුතු ද යත් : අනුවිජ්ජක විසින් යම් ධර්මයෙකින් යම් විනයෙකින් යම් ශාස්තෘශාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳේ නම් එසේ ඒ අධිකරණය සන්හිඳවිය යුතු යි. අනුවිජ්ජක විසින් මෙසේ පිළිපැදිය යුතු වේ.

2. උපොසථය කුමක් පිණිස ද, පවාරණය කුමක් පිණිස ද, පරිවාසය කුමක් පිණිස ද, මූලායපටිකස්සනය කුමක් පිණිස ද, මානත කුමක් පිණිස ද, අබ්භානය කුමක් පිණිස ද යත් :

3. උපොසථය සමගබව පිණිස යැ, පවාරණය පිරිසිදුබව පිණිස යැ, පරිවාසය මානත්තය පිණිස යැ, මූලායපටිකස්සනය නිග්‍රහය පිණිස යැ, මානත අබ්භානය පිණිස යැ, අබ්භානය පාරිශුද්ධිය පිණිස යි.

4. ඡන්දයෙන් ද ද්වේෂයෙන් ද බියෙන් ද මොහයෙන් ද ස්ථවිර භික්ෂූන්ට පරිභව බෙණේ නම් දුෂ්ප්‍රාඥ වූ කණන ලද කුසල් මුල් ඇති නසන ලද ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇති ශික්ෂායෙහි ගෞරව නැති නුවණ නැත්තේ කාබුන් මරණින් මතු නරකයට යෙයි.

5. (චීවරාදි) ආමිෂය නිසා ද නො වැ, (ආචාර්‍ය්‍ය උපාධ්‍යායාදි) පුද්ගලයා නිසා ද නො වැ, මේ ආමිෂ පුද්ගල දෙපස ම නො තකා ධර්මය වූ පරිද්දෙන් විනිශ්චය කරන්නේ යි.

---

## චෝදකාත්මදහනය

1. ක්‍රොධ ඇති වැ බද්ධ වෛර ඇති වැ සැඩ වැ පරිභාසික වැ නො ඇවැතෙහි ඇවැතැ යි නඟා ද, එබඳු වූ චෝදක තෙමේ තමා දවයි.

2. උපකණ්ණකං ජප්පති ජිම්හං පෙක්ඛති
වීතිහරති කුම්මග්ගං පටිසෙවති,
අනාපත්තියා ආපත්තීති රොපෙති,
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

3. අකාලෙන චොදෙති අභූතෙන
ඵරුසෙන අනත්ථසංහිතෙන,
දොසන්තරො චොදෙති නො මෙත්තචිත්තො
අනාපත්තියා ආපත්තීති රොපෙති,
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

4. ධම්මාධම්මං න ජානාති
ධම්මාධම්මස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති ;
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

5. විනයාවිනයං න ජානාති
විනයාවිනයස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති ;
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

6. භාසිතාභාසිතං න ජානාති
භාසිතාභාසිතස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති ;
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

7. ආචිණ්ණානාචිණ්ණං න ජානාති
ආචිණ්ණානාචිණ්ණස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

8. පඤ්ඤත්තාපඤ්ඤත්තං න ජානාති
පඤ්ඤත්තාපඤ්ඤත්තස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

9. ආපත්තානාපත්තිං න ජානාති
ආපත්තානාපත්තියා අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං

10. ලහුකගරුකං න ජානාති
ලහුකගරුකස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

11. සාවසෙසානවසෙසං න ජානාති
සාවසෙසානවසෙසස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

2. (මෙසේ කියව මෙසේ නො කියව යි) කණ්මුල කොඳුරා ද, වරද ම සොයා ද, විනිශ්චය පිරිහෙළා ද, (නො මග සෙවී ද) ඇවැත් දක්වා ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

3. නො සුදුසු කල්හි අසත්‍ය වූ රළු වූ අනර්ථසංහිතයෙන් චෝදනා කෙරේ ද, මෙත් සිත් නැති වැ දූෂිත සිත් ඇත්තේ චෝදනා කෙරේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

4. දහම් නො දහම් නො දනී ද, දහම් නො දහම්හි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

5. විනය අවිනය නො දනී ද, විනය අවිනයයෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැයි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

6. වදළ නො වදළ දැය නො දනී ද, වදළ නො වදළ දැයෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

7. (බුද්ධාදීන් විසින්) පුරුදු කළ නො පුරුදු කළ දැය නො දනී ද, පුරුදු කළ නො පුරුදු කළ දැයෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

8. පණවන ලද නො පණවන ලද දැය නො දනී ද, පණවන ලද නො පණවන ලද දැයෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

9. ඇවැත නො ඇවැත නො දනී ද, ඇවැතෙහි නො ඇවැතෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

10. ලුහුගුරු ඇවැත් නො දනී ද, ලුහුගුරු ඇවැතෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

11. සාවසෙස අනවසෙස ආපත්ති නො දනී ද, සාවසෙස අනවසෙස ආපත්තියෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චෝදක තෙමේ තමා දවයි.

12. දුට්ඨුල්ලාදුට්ඨුල්ලං න ජානාති
දුට්ඨුල්ලාදුට්ඨුල්ලස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

13. පුබ්බාපරං න ජානාති
පුබ්බාපරස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති;
තාදිසො චොදකො ඛාපෙති අත්තානං.

14. අනුසන්ධිවචනපථං න ජානාති
අනුසන්ධිවචනපථස්ස අකොවිදො,
අනාපත්තියා ආපත්තීති රොපෙති
තාදිසො චොදකො ඛාපෙති අත්තානන්ති.

චොදනාකණ්ඩං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. චොදනා අනුවිජ්ජා ච ආදිමූලෙනුපොසථො,
ගති චොදනාකණ්ඩම්හි සාසනස්ස පතිට්ඨායනන්ති[1]

---

1. පතිට්ඨාපයන්ති - මජ්ඣං.

12. තුළුල් නො තුළුල් ඇවැත් නො දනී ද, තුළුල් නො තුළුල් ඇවැත්හි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චොදක තෙමේ තමා දවයි.

13. පෙර පසු කථාව නො දනී ද, පෙර පසු කථාවෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චොදක තෙමේ තමා දවයි.

14. අනුසන්ධිවචනමාර්ගය නො දනී ද, අනුසන්ධිවචනමාර්ගයෙහි අදක්ෂ වේ ද, නො ඇවැතෙහි ඇවැතැ යි නගා ද, එබඳු චොදක තෙමේ තමා දවයි.

චොදනාකාණ්ඩය නිමි.

---

එහි නාමාවලිය :

ශාසනයාගේ ප්‍රතිෂ්ඨායෙහි ලා චොදනා යැ අනුවිජ්ජක යැ (චොදනාවගේ) මූලය සමග ආදිය යැ උපොසථ යැ අගති යැ (යන කරුණු) චොදනා කාණ්ඩයෙහි වේ.

---

# චූළසඞ්ගාමො

## අනුවිජ්ජකස්ස පටිපත්ති

1. සඞ්ගාමාවචරෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමන්තෙන නීචචිත්තෙන සඞ්ඝො උපසඞ්කමිතබ්බො රජොහරණසමෙන චිත්තෙන, ආසනකුසලෙන භවිතබ්බං, නිසජ්ජාකුසලෙන ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජන්තෙන නවෙ භික්ඛූ ආසනෙන අප්පටිබාහන්තෙන, යථාපතිරූපෙ ආසනෙ නිසීදිතබ්බං, අනානාකථිකෙන භවිතබ්බං අතිරච්ඡානකථිකෙන, සාමං වා ධම්මො භාසිතබ්බො පරො වා අජ්ඣෙසිතබ්බො, අරියො වා තුණ්හීභාවො නාතිමඤ්ඤිතබ්බො.

2. සඞ්ඝෙන අනුමතෙන පුග්ගලෙන අනුවිජ්ජකෙන අනුවිජ්ජිතුකාමෙන න උපජ්ඣායො පුච්ඡිතබ්බො, න ආචරියො පුච්ඡිතබ්බො, න සද්ධිවිහාරිකො පුච්ඡිතබ්බො, න අන්තෙවාසිකො පුච්ඡිතබ්බො, න සමානුපජ්ඣායකො පුච්ඡිතබ්බො, න සමානාචරියකො පුච්ඡිතබ්බො, න ජාති පුච්ඡිතබ්බා, න නාමං පුච්ඡිතබ්බං, න ගොත්තං පුච්ඡිතබ්බං, න ආගමො පුච්ඡිතබ්බො, න කුලපදෙසො පුච්ඡිතබ්බො, න ජාතිභූමි පුච්ඡිතබ්බා. තං කිං කාරණා: අත්‍රස්ස පෙමං වා දොසො වා. පෙමෙ වා සති දොසෙ වා ඡන්දාපි ගච්ඡෙය්‍ය, දොසාපි ගච්ඡෙය්‍ය, මොහාපි ගච්ඡෙය්‍ය, භයාපි ගච්ඡෙය්‍ය.

3. සඞ්ඝෙන අනුමතෙන පුග්ගලෙන අනුවිජ්ජකෙන අනුවිජ්ජිතුකාමෙන සඞ්ඝගරුකෙන භවිතබ්බං නො පුග්ගලගරුකෙන, සද්ධම්මගරුකෙන භවිතබ්බං නො ආමිසගරුකෙන, අත්ථවසිකෙන භවිතබ්බං නො පරිසකප්පියෙන,[1] කාලෙන අනුවිජ්ජිතබ්බං නො අකාලෙන, භූතෙන අනුවිජ්ජිතබ්බං නො අභූතෙන, සණ්හෙන අනුවිජ්ජිතබ්බං නො ඵරුසෙන, අත්ථසංහිතෙන අනුවිජ්ජිතබ්බං නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තෙන අනුවිජ්ජිතබ්බං නො දොසන්තරෙන, න උපකණ්ණකජප්පිනා භවිතබ්බං, න ජිම්හං[2] පෙක්ඛිතබ්බං, න අක්ඛී නිඛණිතබ්බා, න භමුකා උක්ඛිපිතබ්බා, න සීසං උක්ඛිපිතබ්බං, න හත්ථවිකාරො කාතබ්බො, න හත්ථමුද්දා දස්සෙතබ්බා.

4. ආසනකුසලෙන භවිතබ්බං නිසජ්ජාකුසලෙන, යුගමත්තං පෙක්ඛන්තෙන අත්ථං අනුවිධියන්තෙන සකෙ ආසනෙ නිසීදිතබ්බං, න ච ආසනා වුට්ඨාතබ්බං, න වීතිහාතබ්බං, න කුම්මග්ගො සෙවිතබ්බො න බාහා වික්ඛෙපකං භණිතබ්බං අතුරිතෙන භවිතබ්බං අසාහසිකෙන, අචණ්ඩික්කෙන භවිතබ්බං වචනක්ඛමෙන, මෙත්තචිත්තෙන භවිතබ්බං

---

1 { පරිසඞ්කප්පිකෙන - සිමු 1, 2.
{ පරිසකප්පිකෙන - මජසං,

2. ජිව්හං - සිමු 1, 2,

# චූලසඞ්ග්‍රාමය

## අනුවිජ්ජකප්‍රතිපත්ති

1. සඞ්ග්‍රාමාවචර (සඟමැ ද අධිකරණ විනිශ්චය කරණ) මහණහු විසින් යටත් සිතින් පාපිස්නක් සෙයින් මන් නැති වැ සඞ්ඝයා වෙත එළඹිය යුතු යැ. තමහට සුදුසු අස්නක් තෝරා ගැන්මෙහි දක්ෂ විය යුතු යැ. හිඳීම පිළිබඳ දැනීමෙහි දක්ෂවූවහු විසින් ස්ථවිර භික්ෂූන් නො ගටා නවක භික්ෂූන් අස්නෙන් නො නෙරපා තමහට සුදුසු අස්නෙහි හින්ද යුතු යැ, රාජකථාදි තිරශ්චීනකථා නැති වැ නන්වැදෑරුම් අවැඩ කථාවෙන් තොර විය යුතු යැ, තමා විසින් හෝ දහම් දෙසිය යුතු යැ. අනෙකකුට හෝ ආරාධනා කටයුතු යැ, කමටහන් මෙනෙහි කිරීම් සඞ්ඛ්‍යාත ආර්ය තුෂ්ණීම්භාවය හෝ අවඥා නො කට යුතු යි.

2. සඞ්ඝයා විසින් අනුමත කරණ ලද විනිශ්චය කරණු නැමැති අනුවිජ්ජක පුද්ගල විසින් උපාද්ධ්‍යාය (කවරෙ දැයි) නො විචාළ යුතු යැ, ආචාර්ය නො විචාළ යුතු යැ. සද්ධිවිහාරික නො විචාළ යුතු යැ, අන්තෙවාසික නො විචාළ යුතු යැ, සමානොපාද්ධ්‍යායක නො විචාළ යුතු යැ, සමානාචාර්යක නො විචාළ යුතු යැ, ජාතිය නො විචාළ යුතු යැ. නාමය නො විචාළ යුතු යැ, ගොත්‍රය නො විචාළ යුතු යැ, (දීඝභාණකාදි) ආගමය නො විචාළ යුතු යැ, කුල ප්‍රදෙශය නො විචාළ යුතු යැ, ජාතභූමිය නො විචාළ යුතු යි. එ කවර හෙයිනැ යත් : මෙහිලා ඔහුට ප්‍රෙමය හෝ ද්වෙෂය හෝ වන්නේ යැ, ප්‍රෙමය හෝ ද්වෙෂය හෝ ඇති කල්හි ඡන්දයෙනුදු අගතියට යන්නේ යැ, ද්වෙෂයෙනුදු අගතියට යන්නේ යැ, මොහයෙනුදු අගතියට යන්නේ යැ, බියෙනුදු අගතියට යන්නේ යි.

3. සඞ්ඝයා විසින් අනුමත කරණ ලද විනිශ්චය කරණු කැමැති අනුවිජ්ජක පුද්ගල විසින් පුද්ගලගරුක නො වැ සඞ්ඝගරුක විය යුතු යැ, ආමිසගරුක නො වැ සද්ධර්මගරුක විය යුතු යැ, පරිස සඞ්කප්පික නො වැ (පිරිස් අනුව කියන්නහු) අත්ථවසික විය යුතු යැ, නො කල්හි නො වැ නිසි කල්හි විනිශ්චය කළ යුතු යැ, අසත්‍යයෙන් නො වැ සත්‍යයෙන් විනිශ්චය කළ යුතු යැ, රළු බසින් නො වැ සිලිටි බසින් විනිශ්චය කළ යුතු යැ, අනර්ථ සංහිතයෙන් නො වැ අර්ථසංහිතයෙන් විනිශ්චය කළ යුතු යැ, දූෂිත සිතින් නො වැ මෙත් සිතින් විනිශ්චය කළ යුතු යැ, කණට කොඳුරා කියන්නකු නො විය යුතු යැ, වරද නො බැලිය යුතු යැ, ඇස නො කැණිය යුතු යැ. බැම නො නැඟිය යුතු යැ, හිස නො එසවිය යුතු යැ, හස්තවිකාර නො කට යුතු යැ, හස්ත මුද්‍රා නො දක්විය යුතු යි.

4. තමහට පත් අසුන නො ඉක්මැ අසුන් ගැන්මෙහි සමත් වූවහු හිඳීමෙහි නිපුණ වූවහු විය යුතු යැ, වියදඬු පමණ බලන්නහු විනිශ්චය පිළිවිදුනහු විසින් සිය අසුන්හි හිඳගත යුතු යැ, අසුනෙන් නො ද නැගී සිටිය යුතු යැ. විනිශ්චය නො පිරිහෙළිය යුතු යැ. ඇවැත නො දක්විය යුතු යැ, බාහාවික්ෂෙප කොට නො බිණිය යුතු යැ, ත්වරිත වැ ලාහෙළා නො බිණිය යුතු යැ, සැඩ නො වූවහු පරොස් බස් ඉවසන සුල්ලහු විය යුතු යැ, මෙත් සිත්



12—ඒ 30906 (77/12)

Free Distribution www.aathaapi.org

හිතානුකම්පිනා, කාරුණිකෙන භවිතබ්බං හිතපරිසක්කිනා[1], "අසම්ඵප්පලාපිනා භවිතබ්බං පරියන්තභාණිනා, අවෙරවසිකෙන භවිතබ්බං අනසුරුත්තෙන, අත්තා පරිග්ගහෙතබ්බො, පරො පරිග්ගහෙතබ්බො, චොදකො පරිග්ගහෙතබ්බො, චුදිතකො පරිග්ගහෙතබ්බො, අධම්මචොදකො පරිග්ගහෙතබ්බො, අධම්මචුදිතකො පරිග්ගහෙතබ්බො, ධම්මචොදකො පරිග්ගහෙතබ්බො, ධම්මචුදිතකො පරිග්ගහෙතබ්බො, වුත්තං අහාපෙන්තෙන අවුත්තං අප්පකාසෙන්තෙන ඔතිණ්ණානි පදබ්‍යඤ්ජනානි සාධුකං පරිග්ගහෙත්වා[2] පරො පටිපුච්ඡිත්වා යථා පටිඤ්ඤාය කාරෙතබ්බො මන්දො පහාසෙතබ්බො,[3] භීරු අස්සාසෙතබ්බො, චණ්ඩො නිසෙධෙතබ්බො, අසුචි විභාවෙතබ්බො උජුමද්දවෙන, න ඡන්දාගති ගන්තබ්බා,[4] න දොසාගති ගන්තබ්බා, න මොහාගති ගන්තබ්බා, න භයාගති ගන්තබ්බා මජ්ඣත්තෙන භවිතබ්බං ධම්මෙසු ච පුග්ගලෙසු ච. එවඤ්ච පන අනුවිජ්ජකො අනුවිජ්ජමානො සත්ථු චෙව සාසනකරො හොති, විඤ්ඤූනං සබ්‍රහ්මචාරීනං පියො ච හොති මනාපො ච ගරු ච භාවනීයො ච.

5. සුත්තං සංසන්දනත්ථාය, ඔපම්මං නිදස්සනත්ථාය, අත්ථො විඤ්ඤාපනත්ථාය, පටිපුච්ඡා ඨපනත්ථාය, ඔකාසකම්මං චොදනත්ථාය, චොදනා සාරණත්ථාය, සාරණා සවචනීයත්ථාය, සවචනීයං පලිබොධත්ථාය, පලිබොධො විනිච්ඡයත්ථාය, විනිච්ඡයො සන්තීරණත්ථාය, සන්තීරණං ඨානාඨානගමනත්ථාය, ඨානාඨානාගමනං දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහත්ථාය පෙසලානං භික්ඛූනං සම්පග්ගහත්ථාය, සඞ්ඝො සම්පරිග්ගහත්ථාය, සම්පරිග්ගහො සම්පටිච්ඡනත්ථාය, සම්පටිච්ඡනං අතිබද්ධත්ථාය, සඞ්ඝෙන අනුමතා පුග්ගලා පච්චෙකට්ඨායිනො අවිසංවාදකට්ඨායිනො.

6. විනයො සංවරත්ථාය, සංවරො අවිප්පටිසාරත්ථාය, අවිප්පටිසාරො පාමොජ්ජත්ථාය, පාමොජ්ජං පීතත්ථාය, පීති පස්සද්ධත්ථාය, පස්සද්ධි සුඛත්ථාය, සුඛං සමාධත්ථාය, සමාධි යථාභූතඤාණදස්සනත්ථාය, යථාභූතඤාණදස්සනං නිබ්බිදත්ථාය, නිබ්බිදා විරාගත්ථාය, විරාගො විමුත්තත්ථාය, විමුත්ති විමුත්තිඤාණදස්සනත්ථාය, විමුත්තිඤාණදස්සනං අනුපාදා පරිනිබ්බානත්ථාය. එතදත්ථා කථා එතදත්ථා මන්තනා එතදත්ථා උපනිසා එතදත්ථං සොතාවධානං යදිදං අනුපාදා චිත්තස්ස විමොක්ඛොති.

1. අනුයොගවත්තං නිසාමය කුසලෙන බුද්ධිමතා කතං,
සුවුත්තං සික්ඛාපදානුලොමිකං ගතිං න නාසෙන්තො සම්පරායිකං.

2. වත්ථුං විපත්තිං ආපත්තිං නිදානං ආකාරඅකොවිදො,
පුබ්බාපරං න ජානාති කතාකතං සමෙන ච.

---

1. හිතපරිසඞ්කිනා - සීමු 1, 2.
2. උග්ගහෙත්වා - ස්‍යා.
3. වෙපොපහාසෙතබ්බො - ස්‍යා.
4. ඡන්ද ගතිං ගන්තබ්බං - මජසං, සීමු.

ඇත්තහු හිතෛෂී වූවහු විය යුතු යැ, හිතවැඩ සොයන කාරුණිකයකු වීය යුතු යැ, හිස් තෙපුල් නො කියන්නකු කෙළවර දැන බණන්නකු විය යුතු යැ, ක්‍රොධ වසඟ නො වූවකු නො මනා තෙපුල් ඇතියකු වියයුතු යැ, තමා (විනිශ්චයට පොහොසත් නො පොහොසත් බව) පරීක්ෂා කොට දත යුතු යැ, මෙරමා පරීක්ෂා කොට දත යුතු යැ, චොදකයා පරීක්ෂා කොට දතයුතු යැ, චූදිතකයා පරීක්ෂා කොට දතයුතු යැ, අධර්මචොදකයාගේ ප්‍රමාණය දත යුතු යැ, අධර්ම චූදිතයාගේ ප්‍රමාණය දත යුතු යැ, ධර්මචොදකයාගේ ප්‍රමාණය දත යුතු යැ, ධර්මචූදිතකයාගේ ප්‍රමාණය දත යුතු යැ, (චොදක චූදිතකයන් විසින්) කියන ලද වචන නො පිරිහෙළමින් ඉදිරිපත් නො කළ කරුණු පහළ නො කරමින් බැසගත් පදව්‍යඤ්ජන මනා වැ සිත තබාගෙණ මෙරමා පිළිවිස පිළිණ පරිද්දෙන් කරවිය යුතු යැ, මුළා වූයේ තෙද ගැන්විය යුතු යැ, බියසුලු වූයේ අස්වැසිය යුතු යැ, සැඩ වූයේ (තර්ජනයෙන්) වළකාලිය යුතු යැ, අලජ්ජී මහණ ප්‍රකාශ කළ යුතු යැ (ඇවැත් දෙසිය යුතු යැ), ඍජු මහණ මොළොකින් විචාළ යුතු යැ, ඡන්දයෙන් අගතියට නො යා යුතු යැ, ද්වෙෂයෙන් අගතියට නො යා යුතු යැ, මොහයෙන් අගතියට නො යා යුතු යැ, බියෙන් අගතියට නො යා යුතු යැ, (ධර්මගරුක වැ) දහම්හි ද පුහුලන් කෙරෙහි ද මධ්‍යස්ථ විය යුත්තේ යි. තව ද මෙසේ අනුවිජ්ජක තෙමේ විනිශ්චය කරන්නේ ශාස්තෘන් වහන්සේගේ අනුශාසනය කරන්නේ ද වෙයි. නුවණැති සබ්‍රම්සරුන්ට ප්‍රිය ද මනාප ද ගරුක ද සම්භාවනීය ද වන්නේ යි.

5. (අනුවිජ්ජක විසින් එළවන ලද) සූත්‍රය (ආපත්ති – අනාපත්ති) සංසන්දනය පිණිස යැ, උපමාව අරුත් දැක්වීම පිණිස යැ, අර්ථය දැන්වීම පිණිස යැ, පිළිවිසීම (පුද්ගලයා) තැබීම පිණිස යැ, ඔකාස කර්මය චොදනාව පිණිස යැ, චොදනාව (දොෂා දොෂ) සිහි කරවීම පිණිස යැ, සිහි කරවීම කියයුතු බව පිණිස යැ, කියයුතු බව පළිබොධය පිණිස යැ, පළිබොධය විනිශ්චයට පමුණුවාලීම පිණිස යැ, විනිශ්චය (දොෂාදොෂ) තීරණය කිරීම පිණිස යැ, සන්තීරණය ඨානාඨානගමන (ගරුකලහුකඇවැත් දන්නා) පිණිස යැ, ඨානාඨාන ගමන අලජ්ජීන්ට නිග්‍රහ පිණිස යැ, ප්‍රියශීල භික්ෂූන්ට රුකුල් පිණිස යැ, සඞ්ඝයා මොනවට විනිශ්චය ගන්නා පිණිස යැ, විනිශ්චය ගැන්ම සුවිනිශ්චිත දුර්විනිශ්චිත බව දන්නා පිණිස යැ, දැන ගැන්ම නො කළකිරීම පිණිස යැ, සඞ්ඝයා විසින් අනුමත පුද්ගලයෝ ඉසුරුබැව් දෙවුතැන් ඇත්තාහු ද, අවිසංවාදක ව සිටියාහු ද වෙත්.

6. විනය (කායවාක්) සංවරය පිණිස යැ, සංවරය වීපිළිසර නො වීම පිණිස යැ, විපිළිසර නො වීම ප්‍රමොදය පිණිස යැ, ප්‍රමොදය ප්‍රීතිය පිණිස යැ, ප්‍රීතිය දරථ සන්හිඳීම පිණිස යැ, ප්‍රශ්‍රබ්ධිය සුඛය පිණිස යැ, සුඛය සමාධිය පිණිස යැ, සමාධිය යථාභූතඥාන දර්ශනය පිණිස යැ, යථාභූතඥානදර්ශනය නිර්වෙදය පිණිස යැ, නිර්වෙදය විරාගය පිණිස යැ, විරාගය විමුක්තිය පිණිස යැ, විමුක්තිය විමුක්තිඥානදර්ශනය පිණිස යැ, විමුක්තිඥානදර්ශනය අනුපාදපරිනිර්වාණය පිණිස යැ, විනය කථාව යම් චිත්තයාගේ අනුපාදවිමොක්ෂයෙක් ඇත් ද, තෙල සඳහා යැ. විනයමන්ත්‍රණය තෙල සඳහා යැ. (විනයො සංවරත්ථාය යනාදි) පරම්පරප්‍රත්‍යය බව තෙල සඳහා යැ. සොතාවධානය තෙල සඳහා යි.

1. දක්ෂ වූ අග්‍රබුද්ධිමත් බුදුරජුන් විසින් (දෙශනා) කරණ ලද මොනවට ප්‍රකාශ කරණලද සිකපදයන්ට අනුලොම් වූ අනුයොගවත පරලොව සුගතිගමන නො නසමින් අසව.

2. කරුණු නො කරුණෙහි අදක්ෂ වූයේ (පරිජි ආදි) වස්තුව ද, (චතුර්විධ) විපත්තිය ද, සප්තාපත්තිස්කන්ධය ද, (සිකපදයන්ගේ) නිදනය ද, පෙරපසු වචනය ද, එවැනි නො දැනීමෙන් කළ නො කළ දැය ද නො දනී,

3. කම්මං ච අධිකරණං ච[1] සමථෙ චාපි අකොවිදො,
රත්තො දුට්ඨො ච මූළ්හො ච භයා මොහා ච ගච්ඡති.

4. න ච සඤ්ඤත්තිකුසලො නිජ්ඣත්තියා ච අකොවිදො,
ලද්ධපක්ඛො අහිරිකො කණ්හකම්මො අනාදරො;
ස වෙ තාදිසකො භික්ඛු අප්පටික්ඛොති වුච්චති.

5. වත්ථුං විපත්තිං ආපත්තිං නිදානං ආකාරකොවිදො,
පුබ්බාපරං පජානාති කතාකතං සමෙන ච.

6. කම්මං ච අධිකරණං ච[1] සමථෙ චාපි කොවිදො,
අරත්තො අදුට්ඨො අමූළ්හො භයා මොහා න ගච්ඡති.

7. සඤ්ඤත්තියා ච කුසලො නිජ්ඣත්තියා ච කොවිදො,
ලද්ධපක්ඛො හිරිමනො සුක්කකම්මො සගාරවො;
ස වෙ තාදිසකො භික්ඛු සප්පටික්ඛොති වුච්චතීති.

චූළසඞ්ගාමො නිට්ඨිතො

---

තස්සුද්දානං :

1. නීචචිත්තෙන පුච්ඡෙය්‍ය ගරුසඞ්ඝෙන පුග්ගලො,
සුත්තං සංසන්දනත්ථාය විනයානුග්ගහෙන ච;
උද්දානං චූළසඞ්ගාමෙ එකුද්දෙසං ඉදං කතන්ති.

---

1. කම්මෙ ච අධිකරණෙ ච - සීමු. 1, 2.

3. කර්මය ද අධිකරණය ද (නො දනී). ශමථයෙහි අදක්ෂ වූයේ රාගයෙන් රත් වූයේ ද්වේෂයෙන් දුෂ්ට වූයේ මොහයෙන් මූඪ වූයේ බියෙන් ද මොහයෙන් ද අගතියට යෙයි.

4. (මෙරමා) දන්වීමෙහි දක්ෂයෙක් නො වේ ද, (කාරණාකාරණ) දක්මෙහි අසමර්ථ වේ ද, ලැබූ පක්ෂ ඇත්තේ ලජ්ජාවෙන් තොර වූයේ පව්කම් ඇත්තේ ද, ධර්මාදර පුද්ගලාදර නැත්තේ ද, එබඳු වූ ඒ මහණ ඒකාන්තයෙන් දෙවු තන්හි නො තැබිය යුතු යැ යි කියනු ලැබේ.

5. කරුණු නො කරුණෙහි දක්ෂ වූයේ (පාරාජිකාදි) වස්තුව ද, (චතුර්විධ) විපත්තිය ද, ආපත්තිය ද, නිදනය ද, පෙරපසු වචනය ද, එවැනි ම නො දනීමෙන් කළ නො කළ දෙය ද දනී.

6. කර්මය ද අධිකරණය ද (දනී.) ශමථයෙහි ද දක්ෂ වූයේ රාගයෙන් රත් නො වූයේ ද්වේෂයෙන් දුෂ්ට නො වූයේ මොහයෙන් මූඪ නො වූයේ බියෙන් ද මොහයෙන් ද අගතියට නො යේ.

7. (මෙරමා) දන්වීමෙහි දක්ෂ වේ ද, තෙමේ (කාරණාකාරණයන්) දක්මෙහි දක්ෂ වේ ද, ලැබූ පක්ෂබල ඇත්තේ ලජ්ජා ඇත්තේ කුසල කර්ම ඇත්තේ ධර්මගෞරව පුද්ගලගෞරව සහිත වූයේ වේ ද, එබඳු වූ ඒ මහණ එකාන්තයෙන් දෙවු තන්හි තැබිය යුතු යැ යි කියනු ලැබේ.

චූලසංග්‍රාමය නිමි.

---

එහි නාමාවලිය :

චූලසඞ්ග්‍රාමයෙහි උද්දනයට " නීච චිත්තෙන පුච්ඡෙය්‍ය, ගරුසඞ්ඝ න පුග්ගලෙ සුත්තං සංසන්දනත්ථාය " යන මේ පදයෝ ඇතුළත් වෙති. මේ එකුද්දෙසය විනයානුග්‍රහයෙන් කරණ ලදි.

---

# මහාසඞ්ගාමො

1. සඞ්ගාමාවචරෙන භික්ඛුනා සඞ්ඝං වොහරන්තෙන වත්ථු ජානිතබ්බං, විපත්ති ජානිතබ්බා, ආපත්ති ජානිතබ්බා, නිදානං ජානිතබ්බං, ආකාරො ජානිතබ්බො, පුබ්බාපරං ජානිතබ්බං, කතාකතං ජානිතබ්බං, කම්මං ජානිතබ්බං, අධිකරණං ජානිතබ්බං, සමථො ජානිතබ්බො, න ඡන්දාගති ගන්තබ්බා, න දොසාගති ගන්තබ්බා, න මොහාගති ගන්තබ්බා, න භයාගති ගන්තබ්බා, සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙතබ්බං, නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙතබ්බං, පෙක්ඛනීයෙ ඨානෙ පෙක්ඛිතබ්බං, පසාදනීයෙ ඨානෙ පසාදෙතබ්බං, "ලද්ධපක්ඛොම්හී"ති පරපක්ඛො නාවජානිතබ්බො, "බහුස්සුතොම්හී"ති අප්පස්සුතො නාවජානිතබ්බො, "ථෙරතරොම්හී"ති නවකතරො නාවජානිතබ්බො, අසම්පත්තං න ව්‍යාහරිතබ්බං, සම්පත්තං ධම්මතො විනයතො න පරිහාපෙතබ්බං, යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, තථා තං අධිකරණං වූපසමෙතබ්බං.

2. වත්ථු ජානිතබ්බන්ති: අට්ඨපාරාජිකානං[1] වත්ථු ජානිතබ්බං, තෙවීසති සඞ්ඝාදිසෙසානං වත්ථු ජානිතබ්බං, ද්වෙ අනියතානං වත්ථු ජානිතබ්බං, ද්වෙ චත්තාලීසනිස්සග්ගියානං වත්ථු ජානිතබ්බං, අට්ඨාසීති සතපාචිත්තියානං වත්ථු ජානිතබ්බං, ද්වාදසපාටිදෙසනීයානං වත්ථු ජානිතබ්බං, දුක්කටානං වත්ථු ජානිතබ්බං, දුබ්භාසිතානං වත්ථු ජානිතබ්බං.

3. විපත්ති ජානිතබ්බාති: සීලවිපත්ති ජානිතබ්බා, ආචාරවිපත්ති ජානිතබ්බා, දිට්ඨිවිපත්ති ජානිතබ්බා, ආජීවවිපත්ති ජානිතබ්බා.

4. ආපත්ති ජානිතබ්බාති: පාරාජිකාපත්ති ජානිතබ්බා, සඞ්ඝාදිසෙසාපත්ති ජානිතබ්බා, ථුල්ලච්චයාපත්ති ජානිතබ්බා, පාචිත්තියාපත්ති ජානිතබ්බා, පාටිදෙසනීයාපත්ති ජානිතබ්බා දුක්කටාපත්ති ජානිතබ්බා, දුබ්භාසිතාපත්ති ජානිතබ්බා.

5 නිදානං ජානිතබ්බන්ති: අට්ඨපාරාජිකානං නිදානං ජානිතබ්බං, තෙවීසතිසඞ්ඝාදිසෙසානං නිදානං ජානිතබ්බං, ද්වෙඅනියතානං නිදානං ජානිතබ්බං, ද්වෙචත්තාලීසනිස්සග්ගියානං නිදානං ජානිතබ්බං, අට්ඨාසීතිසතපාචිත්තියානං නිදානං ජානිතබ්බං, ද්වාදස පාටිදෙසනීයානං නිදානං ජානිතබ්බං, දුක්කටානං නිදානං ජානිතබ්බං, දුබ්භාසිතානං නිදානං ජානිතබ්බං.

6. ආකාරො ජානිතබ්බොති: සඞ්ඝො ආකාරතො ජානිතබ්බො, ගණො ආකාරතො ජානිතබ්බො, පුග්ගලො ආකාරතො ජානිතබ්බො, චොදකො ආකාරතො ජානිතබ්බො, චුදිතකො ආකාරතො ජානිතබ්බො.

---

1. අට්ඨන්නං පාරාජිකානං - මජ්ඣසං.



Free Distribution www.aathaapi.org

# මහාසඞ්ග්‍රාමය

1. සඞ්ගාමාවචර (අධිකරණ පිණිස සභමැදට පැමිණි) සභමැද විනිශ්චය කරණ විනයධර මහණුහු විසින් වස්තුව දතයුතු යැ. විපත්තිය දතයුතු යැ. ආපත්තිය දතයුතු යැ. නිදනය දතයුතු යැ. ආකාරය දතයුතු යැ. පූර්වාපර වචනය දතයුතු යැ. (මේ කරණ ලද යැ මේ නො කරණ ලදැයි) කතා කතය දතයුතු යැ. කර්මය දතයුතු යැ. අධිකරණය දතයුතු යැ. ශමථය දතයුතු යැ. ඡන්දයෙන් අගතියට නොයා යුතු යැ. ද්වෙෂයෙන් අගතියට නො යා යුතු ය,. මොහයෙන් අගතියට නො යා යුතු යැ. බියෙන් අගතියට නො යා යුතු යැ. හැඳින්විය යුතු තැන්හි හැඳින්විය යුතු යැ. මෙනෙහි කරවිය යුතු තැන්හි මෙනෙහි කරවිය යුතු යැ. බැලිය යුතු තැන්හි බලවාලියැ යුතු යැ. පැහැදිය යුතු තැන්හි පැහැදවිය යුතුය. පක්ෂ ලදිමී පරපක්ෂය අවමන් නො කටයුතු යැ. බහු ශ්‍රැතයෙමී අල්පශ්‍රැත යා අවමන් නො කටයුතු යැ. තෙමේ මහාස්ථවිරයෙමී නවකතරයා අවමන් නො කටයුතු යැ. නො පැමිණිදූය නො කියයුතු යැ. පැමිණිදූය ධර්මයෙන් විනයයෙන් නො පිරිහෙළිය යුතු යැ. යම් ධර්මයෙකින් යම් විනයයෙකින් යම් ශාස්තෘ ශාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳේ නම් එසේ ඒ අධිකරණය සන්හිඳුවිය යුතු යි.

2. වත්ථු ජානිතබ්බං යනු : අට පරිජි පිළිබඳ වස්තු දතයුතු යැ. තෙවිසි සඟවෙසෙස් පිළිබඳ වස්තු දතයුතු යැ. දෙ අනියත පිළිබඳ වස්තු දතයුතු යැ. දෙසාළිස් නිසගි පිළිබඳ වස්තු දතයුතු යැ. එක්සිය අටඅසූ පචිති පිළිබඳ වස්තු දතයුතු යැ. දොළොස් පිළිදෙස්නී පිළිබඳ වස්තු දතයුතු යැ. දුකුළා පිළිබඳ වස්තු දතයුතු යැ. දුබැසි පිළිබඳ වස්තු දතයුතු යි.

3. විපත්ති **ජනිතබ්බා** යනු : ශීලවිපත්ති දතයුතු යැ. ආචාරවිපත්ති දතයුතු යැ. දෘෂ්ටිවිපත්ති දතයුතු යැ. ආජීවවිපත්ති දතයුතු යි.

4. ආපත්ති **ජනිතබ්බා** යනු : පාරාජිකාපත්ති දතයුතු යැ. සඞ්ඝාදිසෙසාපත්ති දත යුතු යැ. ථුල්ලච්චයාපත්ති දතයුතු යැ. පාචිත්තියාපත්ති දතයුතු යැ. පාටිදෙසනීයාපත්ති දතයුතු යැ. දුක්කටාපත්ති දතයුතු යැ. දුබ්භාසිතාපත්ති දතයුතු යි.

5. නිදනං ජානිතබ්බං යනු : අට පරිජි පිළිබඳ නිදන දතයුතු යැ. තෙවිසි සඟවෙසෙස් පිළිබඳ නිදන දතයුතු යැ. දෙඅනියතය පිළිබඳ නිදන දතයුතු යැ. දෙසාළිස් නිසගි පිළිබඳ නිදන දතයුතු යැ. එක්සිය අට අසූ පචිති පිළිබඳ නිදන දතයුතු යැ. දෙළොස් පිළිදෙස්නී පිළිබඳ නිදන දතයුතු යැ. දුකුළා පිළිබඳ නිදන දතයුතු යැ. දුබැසි පිළිබඳ නිදන දතයුතු යි.

6. ආකාරො ජානිතබ්බො යනු : සඞ්ඝයා ආකාර විසින් දතයුතු යැ. ගණයා ආකාර විසින් දතයුතු යැ. පුද්ගල ආකාර විසින් දතයුතු යැ. චොදක ආකාර විසින් දතයුතු යැ. චුදිතක ආකාර විසින් දතයුතු යි.



Free Distribution www.aathaapi.org

සඞ්ඝො ආකාරතො ජානිතබ්බොති: පටිබලො නු ඛො අයං සඞ්ඝො ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන උදාහු නොති එවං සඞ්ඝො ආකාරතො ජානිතබ්බො.

ගණො ආකාරතො ජානිතබ්බොති: පටිබලො නු ඛො අයං ගණො ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන උදාහු නොති. එවං ගණො ආකාරතො ජානිතබ්බො.

පුග්ගලො ආකාරතො ජානිතබ්බොති: පටිබලො නු ඛො අයං පුග්ගලො ඉමං අධිකරණං වූපසමෙතුං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන උදාහු නොති. එවං පුග්ගලො ආකාරතො ජානිතබ්බො.

චොදකො ආකාරතො ජානිතබ්බොති: කච්චි නු ඛො අයමායස්මා පඤ්චසු ධම්මෙසු පතිට්ඨාය පරං චොදෙති උදාහු නොති. එවං චොදකො ආකාරතො ජානිතබ්බො.

චුදිතකො ආකාරතො ජානිතබ්බොති: කච්චි නු ඛො අයමායස්මා ද්වීසු ධම්මෙසු පතිට්ඨිතො සච්චෙ ච අකුප්පෙ ච උදාහු නොති. එවං චුදිතකො ආකාරතො ජානිතබ්බො

7. පුබ්බාපරං ජානිතබ්බන්ති කච්චි නු ඛො අයමායස්මා වත්ථුතො වා වත්ථුං සඞ්කමති, විපත්තිතො වා විපත්තිං සඞ්කමති, ආපත්තිතො වා ආපත්තිං සඞ්කමති, අවජානිත්වා වා පටිජානාති, පටිජානිත්වා වා අවජානාති, අඤ්ඤෙන වා අඤ්ඤං පටිචරති, උදාහු නො'ති එවං පුබ්බාපරං ජානිතබ්බං.

8. කතාකතං ජානිතබ්බන්ති: මෙථුනධම්මො ජානිතබ්බො, මෙථුනධම්මස්ස අනුලොමං ජානිතබ්බං, මෙථුනධම්මස්ස පුබ්බභාගො ජානි-තබ්බො.

මෙථුනධම්මො ජානිතබ්බොති ද්වයංද්වයසමාපත්ති ජානිතබ්බා.

මෙථුනධම්මස්ස අනුලොමං ජානිතබ්බන්ති: භික්ඛු අත්තනො මුඛෙන පරස්ස අඞ්ගජාතං ගණ්හාති.

මෙථුනධම්මස්ස පුබ්බභාගො ජානිතබ්බොති: වණ්ණාවණ්ණං කාය-සංසග්ගො දුට්ඨුල්ලා වාචා අත්තකාමපාරිචරියා වචනමනුප්පදානං.

9. කම්මං ජානිතබ්බන්ති: සොළස කම්මානි ජානිතබ්බානි: චත්තාරි අපලොකනකම්මානි ජානිතබ්බානි, චත්තාරි ඤත්තිකම්මානි ජානිතබ්බානි, චත්තාරි ඤත්තිදුතියකම්මානි ජානිතබ්බානි, චත්තාරි ඤත්තිචතුත්ථකම්මානි ජානිතබ්බානි.

10. අධිකරණං ජානිතබ්බන්ති: චත්තාරි අධිකරණානි ජානිතබ්බානි, විවාදාධිකරණං ජානිතබ්බං, අනුවාදාධිකරණං ජානිතබ්බං, ආපත්තාධිකරණං ජානිතබ්බං, කිච්චාධිකරණං ජානිතබ්බං.

" සඞ්ඝො ආකාරතො ජානිතබ්බො " යනු : මේ සඞ්ඝයා මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් සන්හිඳුවන්නට සමත් හෝ වේ ද, නොහොත් නො වේ දැයි මෙසේ සඞ්ඝයා ආකාර විසින් දතයුතු යි.

" ගණො ආකාරතො ජානිතබ්බො " යනු : මේ ගණයා මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් සන්හිඳුවන්නට සමත් හෝ වේ ද, නොහොත් නො වේ දැයි මෙසේ ගණයා ආකාරයෙන් දතයුතු යි.

" පුග්ගලො ආකාරතො ජානිතබ්බො " යනු : මේ පුද්ගල මේ අධිකරණය ධර්මයෙන් විනයයෙන් ශාස්තෘ ශාසනයෙන් සන්හිඳුවන්නට සමත් හෝ වේ ද, නොහොත් නො වේ දැයි මෙසේ පුද්ගල ආකාර විසින් දතයුතු යි.

" චොදකො ආකාරතො ජානිතබ්බො " යනු : " කිම, මේ ආයුෂ්මත් පස්වැදෑරුම් දහම්හි පිහිටා අන්හට චොදනා කෙරේ ද, නොහොත් නො කෙරේදැ " යි මෙසේ චොදක ආකාර විසින් දතයුතු යි.

" චුදිතකො ආකාරතො ජානිතබ්බො " යනු : " කිම, මේ ආයුෂ්මත් සත්‍යයෙහි ද අකොප්‍යයෙහි දැයි දෙවැදෑරුම් දහම්හි පිහිටියේ ද, නොහොත් නො පිහිටියේ දැ " යි මෙසේ චුදිතක ආකාර විසින් දතයුතු යි.

7. පුබ්බාපරං ජානිතබ්බං යනු : කිම, මේ ආයුෂ්මත් වස්තුවෙන් වස්තුවට හෝ (එක් වස්තුයෙකින් අන් වස්තුවකට) සඞ්ක්‍රමණය කෙරේ ද, විපත්තියෙන් විපත්තියට හෝ සඞ්ක්‍රමණය කෙරේ ද, ආපත්තියෙන් ආපත්තියට හෝ සඞ්ක්‍රමණය කෙරේ ද, පළමු වළහා පසුව පිළින හෝ කෙරේ ද, පිළින කොට හෝ වළහා ද, අනෙකෙකින් හෝ අනෙකක් වසා ද, නොහොත් නො වසා දැයි මෙසේ පූර්වාපරවචනය දතයුතු යි.

8. කතාකතං ජානිතබ්බං යනු : මෛථුනධර්මය දතයුතු යැ. මෛථුනධර්මය පිළිබඳ අනුලොමය දතයුතු යැ. මෛථුනධර්මය පිළිබඳ පූර්වභාගය දතයුතු යි.

" මෙථුනධම්මො ජානිතබ්බො " යනු : ද්වයං ද්වය සමාපත්ති දතුයුතු යි.

" මෙථුනධම්මස්ස අනුලොමං ජානිතබ්බං " යනු මහණ සිය මුවෙන් මෙරමා රහසඟ ගණී.

" මෙථුනධම්මස්ස පුබ්බභාගො ජානිතබ්බො " යනු නීලාදි වර්ණාවර්ණ යැ. කායසංසර්ග යැ දුට්ඨුල්ල වචන යැ අත්තකාමපාරිචරියා යැ ඔවුනොවුන්ගේ බස් දීම යැ යන මේ යැ.

9. කම්මං ජානිතබ්බං යනු : ෂොඩශ කර්ම දතයුතු යි : චතුර්විධ අපලොකනකර්ම දතයුතු යැ. චතුර්විධ ඤත්තිකර්ම දතයුතු යැ. චතුර්විධ ඤත්තිදුතියකර්ම දතයුතු යැ. චතුර්විධ ඤත්තිචතුත්ථ කර්ම දතයුතු යි.

10. අධිකරණං ජානිතබ්බං යනු : චතුර්විධ අධිකරණ දතයුතු යි ; විවාදධිකරණ දතයුතු යැ. අනුවාදධිකරණ දතයුතු යැ. ආපත්තාධිකරණ දතයුතු යැ. කිච්චාධිකරණ දතයුතු යි.

11. සමථො ජානිතබ්බොති: සත්ත සමථා ජානිතබ්බා: සම්මුඛාවිනයො ජානිතබ්බො, සතිවිනයො ජානිතබ්බො, අමූළ්හවිනයො ජානිතබ්බො, පටිඤ්ඤාතකරණං ජානිතබ්බං, යෙභුය්‍යසිකා ජානිතබ්බා, තස්ස පාපියසිකා ජානිතබ්බා, තිණවත්ථාරකො ජානිතබ්බො.

12. න ඡන්දාගති ගන්තබ්බාති[1] ඡන්දාගතිං ගච්ඡන්තො කථං ඡන්දාගතිං ගච්ඡති: ඉධෙකච්චො "අයං මෙ උපජ්ඣායො වා ආචරියො වා සද්ධිවිහාරිකො වා අන්තෙවාසිකො වා සමානුපජ්ඣායකො වා සමානාචරියකො වා සන්දිට්ඨො වා සම්භත්තො වා ඤාතිසාලොහිතො වා" ති තස්සානුකම්පනාය තස්සානුරක්ඛාය අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති. අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, අනාපත්තිං ආපත්තීති දීපෙති ආපත්තිං අනාපත්තීති දීපෙති, ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙති, ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙති, සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙති, අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙති, දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති. ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි ඡන්දාගතිං ගච්ඡන්තො බහුජනඅහිතාය පටිපන්නො හොති බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි ඡන්දාගතිං ගච්ඡන්තො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො ච විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. ඡන්දාගතිං ගච්ඡන්තො එවං ඡන්දාගතිං ගච්ඡති.

13. න දොසාගති ගන්තබ්බාති: දොසාගතිං ගච්ඡන්තො කථං දොසාගතිං ගච්ඡති: ඉධෙකච්චො අනත්ථං මෙ අචරීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරතීති ආඝාතං බන්ධති, අනත්ථං මෙ චරිස්සතීති ආඝාතං බන්ධති, පියස්ස මෙ මනාපස්ස අනත්ථං අචරි, අනත්ථං චරති, අනත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති, අප්පියස්ස මෙ අමනාපස්ස අත්ථං අචරි, අත්ථං චරති, අත්ථං චරිස්සතීති ආඝාතං බන්ධති. ඉමෙහි නවහි ආඝාතවත්ථූහි ආඝාතිතො පටිඝාතිතො[2] කුද්ධො කොධාභිභූතො අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති. ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි දොසාගතිං ගච්ඡන්තො බහුජනඅහිතාය පටිපන්නො හොති බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි දොසාගතිං ගච්ඡන්තො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති සානුවජ්ජො ච විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති, දොසාගතිං ගච්ඡන්තො එවං දොසාගතිං ගච්ඡති.

1. ගන්තබ්බන්ති - සීමු2.
2. ආඝාතො/පටිඝාතො - සීමු. මජසං., සයා.

Free Distribution www.aathaapi.org

11. සමථො ජානිතබ්බො යනු : සප්තශමථයෝ දතයුතු වෙති : සම්මුඛාවිනය දතයුතු යැ. සතිවිනය දතයුතු යැ. අමූළ්හවිනය දතයුතුය. පටිඤ්ඤාතකරණ දතයුතු යැ. යෙභුය්‍යසිකා දතයුතු යැ. තස්සපාපියාසිකා දතයුතු යැ. තිණවත්ථාරකය දතයුතු යි.

12. "න ඡන්දාගති ගන්තබ්බා" යනු ඡන්දයෙන් අගතියට යන්නේ කෙසේ ඡන්දයෙන් අගතියට යේ ද යත් : මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් "මේ තෙමේ මාගේ උපාධ්‍යාය යි හෝ ආචාර්‍ය්‍ය යි හෝ සද්ධිවිහාරික යැ යි හෝ අන්තෙවාසික යැ යි හෝ සමානොපාධ්‍යායැ යි හෝ සමානාචාර්‍ය්‍ය යැ යි හෝ සන්දෘෂ්ට මිත්‍ර යැ යි හෝ සම්භක්ත මිත්‍ර යැ යි හෝ ඤාතිසාලොහිතයැ යි හෝ ඔහුට අනුකම්පා පිණිස ඔහු රැක්ම පිණිස අධර්මය ධර්මයැ යි දක්වා ද, ධර්මය අධර්මයැ යි දක්වා ද, අවිනය විනයැ යි දක්වා ද, විනය අවිනයැ යි දක්වා ද, තථාගතයන් විසින් නො වදරණ ලද්ද ප්‍රකාශ නො කරණ ලද්ද තථාගතයන් විසින් වදරණ ලද යි ප්‍රකාශ කරණ ලද යි දක්වා ද,තථාගතයන් විසින් වදරණ ලද්ද ප්‍රකාශ කරණ ලද්ද තථාගතයන් විසින් නො වදරණ ලද යි ප්‍රකාශ නො කරණ ලද යි දක්වා ද, තථාගතයන් විසින් නො පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු කරණ ලද යි දක්වා ද, තථාගතයන් විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් නො පුරුදු කරණ ලද යි දක්වා ද, තථාගතයන් විසින් නො පණවන ලද්ද තථාගතයන් විසින් පණවන ලද යි දක්වා ද, තථාගතයන් විසින් පණවන ලද්ද තථාගතයන් විසින් නො පණවන ලද යි දක්වා ද, අනාපත්තිය ආපත්තියැ යි දක්වා ද, ආපත්තිය අනාපත්තියැ යි දක්වා ද, ලහුකාපත්තිය ගරුකාපත්තියැ යි දක්වා ද, ගරුකාපත්තිය ලහුකාපත්තියැ යි දක්වා ද, සාවසෙසාපත්තිය අනවසෙසාපත්තියැ යි දක්වා ද, අනවසෙසාපත්තිය සාවසෙසාපත්ති යැ යි දක්වා ද, දුට්ඨුල්ලාපත්තිය අදුට්ඨුල්ලාපත්ති යැ යි දක්වා ද, අදුට්ඨුල්ලාපත්තිය දුට්ඨුල්ලාපත්තියැ යි දක්වා ද, මේ අටළොස් වැදෑරුම් කරුණින් ඡන්දයෙන් අගතියට යන්නේ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවි මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. මේ අටළොස් කරුණින් ඡන්දයෙන් අගතියට යන්නේ සාරාදමූ කුසල් මුල් ඇති වැ නසන ලද තමා පරිහරණය කෙරෙයි. (හේ) වරද සහිත වූයේ ද වෙයි. නුවණැත්තන් විසින් චොදනා කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. ඡන්දයෙන් අගතියට යන්නේ මෙසේ ඡන්දයෙන් අගතියට යේ.

13. "න දොසාගති ගන්තබ්බා" යනු : ද්වේෂයෙන් අගතියට යන්නේ කෙසේ ද්වේෂයෙන් අගතියට යේ ද යත් : මේ ශාසනයෙහි ඇතැම් මහණෙක් මට (පෙර) අවැඩ කෙළේ යැයි වෛර බඳී ද, මට (දැන්) අවැඩ කෙරේ යැ යි වෛර බඳී ද, මට (මතු) අවැඩ කරන්නේ යැ යි වෛර බඳී ද, මාගේ ප්‍රිය මනාපයාහට අවැඩ කෙළේ යැ අවැඩ කෙරෙයි අවැඩ කරන්නේ යැ යි වෛර බඳී ද, මාගේ අප්‍රිය අමනාපයාහට වැඩකෙළේ යැ වැඩ කරයි වැඩ කරන්නේ යැයි වෛර බඳී ද, මේ නව ආඝාත වස්තූන් ගෙන් පහරණ ලද්දේ පුන පුනා පහරණ ලද්දේ කිපියේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ අධර්මය ධර්ම යැ යි දක්වා ද ධර්මය අධර්ම යැ යි දක්වා ද . . . . තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වා ද නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වා ද, මේ අටළොස් කරුණෙන් ද්වෙෂයෙන් අගතියට යන්නේ බොහෝ දෙනාට අහිත පිණිස බෙහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවි මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. මේ අටළොස් කරුණෙන් ද්වෙෂයෙන් අගතියට යන්නේ සාරාදමූ කුසල් මුල් ඇති වැ නසන ලද තමා පරිහරණය කෙරෙයි. (හේ) වරද සහිත වූයේ ද වෙයි. නුවණැත්තන් විසින් චොදනා කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. ද්වේෂයෙන් අගතියට යන්නේ මෙසේ ද්වේෂයෙන් අගතියට යේ.

14. න මොහාගති ගන්තබ්බාති : මොහාගතිං ගච්ඡන්තො කථං මොහාගතිං ගච්ඡති : රත්තො රාගවසෙන ගච්ඡති, දුට්ඨො දොසවසෙන ගච්ඡති, මූළ්හො මොහවසෙන ගච්ඡති, පරාමට්ඨො දිට්ඨිවසෙන ගච්ඡති, මූළ්හො සම්මූළ්හො මොහාභිභූතො අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, - පෙ - දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති. ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි මොහාගතිං ගච්ඡන්තො බහුජනඅහිතාය පටිපන්නො හොති බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙව-මනුස්සානං, ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි මොහාගතිං ගච්ඡන්තො ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජො ච හොති, සානුවජ්ජො ච විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. මොහාගතිං ගච්ඡන්තො එවං මොහාගතිං ගච්ඡති

15. න භයාගති ගන්තබ්බාති : භයාගතිං ගච්ඡන්තො කථං භයාගතිං ගච්ඡති : ඉධෙකච්චො "අයං විසමනිස්සිතො වා ගහන-නිස්සිතො වා බලවනිස්සිතො වා කක්ඛළො ඵරුසො ජීවිතන්තරායං වා බ්‍රහ්මචරියන්තරායං වා කරිස්සතී"ති තස්ස භයා භීතො අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, අනාපත්තිං ආපත්තීති දීපෙති, ආපත්තිං අනාපත්තීති දීපෙති, ලහුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙති, ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙති, සාවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙති, අනවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙති, දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි භයාගතිං ගච්ඡන්තො බහුජන අහිතාය පටිපන්නො හොති බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, ඉමෙහි අට්ඨාරසහි වත්ථූහි භයාගතිං ගච්ඡන්තො ඛතං උපහතං අත්තානං පරිහරති සාවජ්ජො ච හොති සානුවජ්ජො ච විඤ්ඤූනං. බහුඤ්ච අපුඤ්ඤං පසවති. භයාගතිං ගච්ඡන්තො එවං භයාගතිං ගච්ඡති.

16. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං අතිවත්තති,
නිහීයති තස්ස යසො කාළපක්ඛෙව චන්දිමාති.

17. කථං න ඡන්දාගතිං ගච්ඡති : අධම්මං අධම්මොති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, ධම්මං ධම්මොති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අවිනයං අවිනයොති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, විනයං විනයොති දීපෙන්තොති න ඡන්දාගතිං ගච්ඡති, අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං

14. " න මොහාගති ගන්තබ්බා " යනු : මොහයෙන් අගතියට යන්නේ කෙසේ මොහයෙන් අගතියට යේ ද යත් : සංරක්ත වූයේ රාගවශයෙන් මොහාගතියට යෙයි. දුෂ්ට වූයේ ද්වේෂවශයෙන් මොහාගතියට යෙයි. මුළා වූයේ මොහවශයෙන් මොහාගතියට යෙයි. පරාමෘෂ්ට වූයේ දෘෂ්ටිවශයෙන් මොහාගතියට යෙයි. මුළා වූයේ අතිශයින් මුළා වූයේ මොහයෙන් මඩනාලද්දේ අධර්මය ධර්ම යැ යි දක්වා ද, ධර්මය අධර්ම යැ යි දක්වා ද, . . . තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වා ද, නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වා ද, මේ අටළොස් කරුණෙන් මොහයෙන් අගතියට යන්නේ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවිමිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. මේ අටළොස් කරුණෙන් මොහයෙන් අගතියට යන්නේ සාරාදුමූ කුසල්මුල් ඇති නසන ලද තමා පරිහරණය කෙරෙයි. (හේ) වරද සහිත වූයේ ද වෙයි. නුවණැත්තන් විසින් චොදනා කටයුතු වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. මොහයෙන් අගතියට යන්නේ මෙසේ මොහයෙන් අගතියට යේ.

15. " න භයාගති ගන්තබ්බා " යනු : බියෙන් අගතියට යන්නේ කෙසේ බියෙන් අගතියට යේ ද යත් : මෙ සස්නෙහි ඇතැම් මහණෙක් මේ තෙමේ විෂම වූ කාය කර්මාදියෙන් යුක්ත යැ යි හෝ (අන්තග්‍රාහික මිථ්‍යා දෘෂ්ටි සඞ්ඛ්‍යාත) ගහණයන් ඇසුරු කරණ ලදැ යි හෝ බලවතුන් ඇසුරු කරණ ලදැ යි හෝ කර්කශ රළු වූයේ ජීවිතයට උවදුරක් හෝ බඹසරට උවදුරක් හෝ කරන්නේ යැ යි හෝ ඔහු කෙරෙන් බියපත් වූයේ අධර්මය ධර්ම යැ යි දක්වා ද, ධර්මය අධර්ම යැ යි දක්වා ද, අවිනය විනයැ යි දක්වා ද, විනය අවිනයැ යි දක්වා ද, තථාගතයන් විසින් නො වදරණ ලද්ද ප්‍රකාශ නො කරණ ලද්ද තථාගතයන් විසින් වදරණ ලදැ යි ප්‍රකාශ කරණ ලදැ යි දක්වා ද, තථාගතයන් විසින් වදරණ ලද්ද ප්‍රකාශ කරණ ලද්ද තථාගතයන් විසින් නො වදරණ ලදැ යි ප්‍රකාශ නො කරණ ලදැ යි දක්වා ද, තථාගතයන් විසින් පුරුදු නො කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු කරණ ලදැ යි දක්වාද, තථාගතයන් විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු නො කරණ ලදැ යි දක්වා ද,තථාගතයන් විසින් නො පණවන ලද්ද තථාගතයන් විසින් පණවන ලදැ යි දක්වා ද, තථාගතයන් විසින් පණවන ලද්ද තථාගතයන් විසින් නො පණවන ලදැ යි දක්වා ද, නො ඇවැත ඇවැතැයි දක්වා ද, ඇවැත නොඇවැතැ යි දක්වා ද, ලුහු ඇවැත ගරු ඇවැතැ යි දක්වා ද, ගරු ඇවැත ලුහු ඇවැතැ යි දක්වා ද, සාවසෙස ඇවැත අනවසෙස ඇවැතැ යි දක්වා ද, අනවසෙස ඇවැත සාවසෙස ඇවැතැ යි දක්වා ද, තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වා ද, නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වා ද, මේ අටළොස් කරුණෙන් බියෙන් අගතියට යන්නේ බොහෝ දෙනාට අහිත පිණිස බොහෝ දෙනාට නො සුව පිණිස බොහෝ දෙනාට අනර්ථ පිණිස දෙවිමිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස පිළිපන්නේ වෙයි. මේ අටළොස් කරුණෙන් බියෙන් අගතියට යන්නේ සාරා දුමූ කුසල්මුල් ඇති වැ නසන ලද තමා පරිහරණය කෙරෙයි. වරද සහිත වූයේ ද වෙයි. නුවණැත්තන් විසින් චොදනා කටයුතු ද වෙයි. බොහෝ අකුසල් ද රැස් කෙරෙයි. බියෙන් අගතියට යන්නේ මෙසේ බියෙන් අගතියට යේ.

16. යමෙක් ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් හෝ බියෙන් හෝ මොහයෙන් හෝ ධර්මය ඉක්මවා ද, ඔහුගේ කීර්තිය කෘෂ්ණපක්ෂයෙහි චන්ද්‍රයා මෙන් වෙසෙසින් පිරිහේ.

17. කෙසේ නම් ඡන්දයෙන් අගතියට නො යේ ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. අවිනය අවිනය යැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. විනය විනය යැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් නො වදරණ ලද්ද ප්‍රකාශ නො කරණලද්ද තථාගතයන් විසින් නො වදරණ ලදැ යි ප්‍රකාශ නො කරණලදැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් වදරණලද්ද ප්‍රකාශ කරණලද්ද තථාගතයන් විසින් වදරණලදැ යි ප්‍රකාශ කරණලදැ යි

තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අනාපත්තිං අනාපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, ආපත්තිං ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, ලහුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, ගරුකං ආපත්තිං ගරුකා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, සාවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අනවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න ඡන්දාගතිං ගච්ඡති, එවං න ඡන්දාගතිං ගච්ඡති.

18. කථං න දොසාගතිං ගච්ඡති: අධම්මං අධම්මොති දීපෙන්තො න දොසාගතිං ගච්ඡති, ධම්මං ධම්මොති දීපෙන්තො න දොසාගතිං ගච්ඡති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න දොසාගතිං ගච්ඡති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න දොසාගතිං ගච්ඡති, එවං න දොසාගතිං ගච්ඡති.

19. කථං න මොහාගතිං ගච්ඡති: අධම්මං අධම්මොති දීපෙන්තො න මොහාගතිං ගච්ඡති, ධම්මං ධම්මොති දීපෙන්තො න මොහාගතිං ගච්ඡති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න මොහාගතිං ගච්ඡති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න මොහාගතිං ගච්ඡති, එවං න මොහාගතිං ගච්ඡති.

20. කථං න භයාගතිං ගච්ඡති: අධම්මං අධම්මොති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, ධම්මං ධම්මොති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අවිනයං අවිනයොති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, විනයං විනයොති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අභාසිතං අලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, භාසිතං ලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අනාචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, ආචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අපඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, පඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙන්තො න භයාගතිං ගච්ඡති අනාපත්තිං අනාපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡතිං ආපත්තිං ආපත්තිති දීපෙන්තො න භයාගතිං ගච්ඡති ලහුකං ආපත්තිං ලහුකා ආපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡති ගරුකං ආපත්තිං ගරුකා ආපත්තීති

Free Distribution www.aathaapi.org

දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් නො පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් නො පුරුදු කරණලද යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් පුරුදු කරණලද්ද තථාගතයන්විසින්පුරුදු කරණලදයි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් නො පණවන ලද්ද තථාගතයන් විසින් නො පණවන ලද යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් පණවනලද්ද තථාගතයන් විසින් පණවනලද යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. අනාපත්තිය අනාපත්ති යැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නොයෙයි. ඇවැත ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. ලුහු ඇවැත ලුහු ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. ගරු ඇවැත ගරු ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. සාවසෙස ඇවැත සාවසෙස ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. අනවසෙස ඇවැත අනවසෙස ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ ඡන්දයෙන් අගතියට නො යෙයි. මෙසේ ඡන්දයෙන් අගතියට නො යේ.

18. කෙසේ නම් ද්වේෂයෙන් අගතියට නො යේ ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ ද්වේෂයෙන් අගතියට නො යෙයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ ද්වේෂයෙන් අගතියට නො යෙයි. . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ ද්වේෂයෙන් අගතියට නො යෙයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ ද්වේෂයෙන් අගතියට නො යෙයි. මෙසේ ද්වේෂයෙන් අගතියට නො යේ.

19. කෙසේ නම් මොහයෙන් අගතියට නො යේ ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ මොහයෙන් අගතියට නො යෙයි. ධර්මය ධර්ම ය යි දක්වන්නේ මොහයෙන් අගතියට නො යෙයි. . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ මොහයෙන් අගතියට නො යෙයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ මොහයෙන් අගතියට නො යෙයි. මෙසේ මොහයෙන් අගතියට නො යේ.

20. කෙසේ නම් බියෙන් අගතියට නො යේ ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. අවිනය අවිනයැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. විනය විනයැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් නො වදරණ ලද්ද ප්‍රකාශ නො කරණ ලද්ද තථාගතයන් විසින් නො වදරණ ලද යි ප්‍රකාශ නො කරණ ලද යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් වදරණ ලද්ද ප්‍රකාශ කරණ ලද්ද තථාගතයන් විසින් වදරණ ලද යි ප්‍රකාශ කරණ ලද යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් නො පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් නො පුරුදු කරණ ලද යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු කරණ ලදයි දක්වන්නේ බියෙන් අගතියට නොයෙයි. තථාගතයන් විසින් නො පණවන ලද්ද තථාගතයන් විසින් නො පණවන ලද යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තථාගතයන් විසින් පණවන ලද්ද තථාගතයන් විසින් පණවන ලද යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. අනාපත්තිය අනාපත්ති යැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. ඇවැත ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. ලුහු ඇවැත ලුහු ඇවැතැයි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. ගුරු ඇවැත ගුරු ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. සාවසෙස ඇවැත

දීපෙන්තො න භයාගතිං ගච්ඡති, සාවසෙසං ආපත්තිං සාවසෙසා ආපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අනවසෙසං ආපත්තිං අනවසෙසා ආපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො න භයාගතිං ගච්ඡති, එවං න භයාගතිං ගච්ඡති

21. ඡන්දා දොසා භයා මොහා යො ධම්මං නාතිවත්තති,
ආපූරති තස්ස යසො සුක්කපක්ඛෙව චන්දිමාති.

22. කථං සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති: අධම්මං අධම්මොති දීපෙන්තො සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති, ධම්මං ධම්මොති දීපෙන්තො සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති, එවං සඤ්ඤාපනීයෙ ඨානෙ සඤ්ඤාපෙති.

23. කථං නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති: අධම්මං අධම්මොති දීපෙන්තො නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති, ධම්මං ධම්මොති දීපෙන්තො නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති, -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති, එවං නිජ්ඣාපනීයෙ ඨානෙ නිජ්ඣාපෙති.

24. කථං පෙක්ඛනීයෙ ඨානෙ පෙක්ඛති: අධම්මං අධම්මොති දීපෙන්තො පෙක්ඛනීයෙ ඨානෙ පෙක්ඛති, ධම්මං ධම්මොති දීපෙන්තො, -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො -පෙ- අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙන්තො -පෙ- එවං පෙක්ඛනීයෙ ඨානෙ පෙක්ඛති.

25. කථං පසාදනීයෙ ඨානෙ පසාදෙති: අධම්මං අධම්මොති දීපෙන්තො පසාදනීයෙ ඨානෙ පසාදෙති, ධම්මං ධම්මොති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති -පෙ- අදුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති -පෙ- එවං පසාදනීයෙ ඨානෙ පසාදෙති.

26. කථං ලද්ධපක්ඛොම්හීති පරපක්ඛං අවජානාති: ඉධෙකච්චො, ලද්ධපක්ඛො හොති ලද්ධපරිවාරො පක්ඛවා ඤාතිමා, 'අයං අලද්ධපක්ඛො අලද්ධපරිවාරො න පක්ඛවා න ඤාතිමා'ති තස්ස අවජානන්තො අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, එවං ලද්ධපක්ඛොම්හීති පරපක්ඛං අවජානාති.

27. කථං බහුස්සුතොම්හීති අප්පස්සුතං අවජානාති: ඉධෙකච්චො, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, අයං අප්පස්සුතො අප්පාගමො අප්පධරොති තස්ස අවජානන්තො අධම්මං ධම්මොති

සාවසෙස ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. අනවසෙස ඇවැත අනවසෙස ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ බියෙන් අගතියට නො යෙයි. මෙසේ බියෙන් අගතියට නො යේ.

21. යමෙක් තෙමේ ඡන්දයෙන් හෝ ද්වේෂයෙන් හෝ බියෙන් හෝ මොහයෙන් හෝ යුක්තිධර්මය නො ඉක්මවා ද, ඔහුගේ කීර්තිය ශුක්ලපක්ෂයෙහි චන්ද්‍රයා මෙන් ක්‍රමයෙන් පිරෙන්නේ යි.

22. කිසෙයින් හැඳින්වියයුතු තන්හි හඳුන්වා ද යත්: අධර්මය අධර්ම යැ යි දක්වන්නේ හැඳින්විය යුතු තන්හි හඳුන්වයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ හැඳින්විය යුතු තන්හි හඳුන්වයි. . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ හැඳින්විය යුතු තන්හි හඳුන්වයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ හැඳින්විය යුතු තන්හි හඳුන්වයි. මෙසෙයින් හැඳින්විය යුතු තන්හි හඳුන්වයි.

23. කීසෙයින් මෙනෙහිකරවියයුතු තන්හි මෙනෙහි කරවා ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ මෙනෙහි කරවියයුතු තන්හි මෙනෙහි කරවයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ මෙනෙහි කරවියයුතු තන්හි මෙනෙහි කරවයි. . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ මෙනෙහි කරවියයුතු තන්හි මෙනෙහි කරවයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ මෙනෙහි කරවියයුතු තන්හි මෙනෙහි කරවයි. මෙසෙයින් මෙනෙහි කරවියයුතු තන්හි මෙනෙහි කරවයි.

24. කීසෙයින් දැක්විය යුතු තන්හි දක්වා ද යත් : අධර්මය අධර්ම යැ යි දක්වන්නේ දැක්වියයුතු තන්හි දක්වයි. ධර්මය ධර්ම යැ යි දක්වන්නේ දැක්වියයුතු තන්හි දක්වයි. . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ දැක්විය යුතුතන්හි දක්වයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ දැක්වියයුතු තන්හි දක්වයි. මෙසෙයින් දැක්විය යුතුතන්හි දක්වයි.

25. කීසෙයින් පැහැදවිය යුතු තන්හි පහදවා ද යත්: අධර්මය අධර්ම යැ යි දක්වන්නේ පැහැදවිය යුතු තන්හි පහදවයි. ධර්මය ධර්ම යැ යි . . . . තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වන්නේ පැහැදවිය යුතු තන්හි පහදවයි. නො තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වන්නේ පැහැදවිය යුතු තන්හි පහදවයි. මෙසෙයින් පැහැදවිය යුතු තන්හි පහදවයි.

26. '' කීසෙයින් ලැබූ පක්ෂ ඇත්තෙමි '' යි පරපක්ෂයට අවමන් කෙරේ ද යත් : මෙ සස්නෙහි ඇතැම් මහණෙක් ලැබූ පක්ෂ ඇත්තේ ලැබූ පිරිවර ඇත්තේ පක්ෂ ඇත්තේ නැයන් ඇත්තේ වෙයි. (හේ) මේ පුද්ගල නො ලද පක්ෂ ඇත්තෙක, නො ලද පිරිවර ඇත්තෙක, දක්ෂ නැත්තෙක නැයන් නැත්තෙක, '' යි ඔහුට අවමන් කරන්නේ අධර්මය ධර්ම යැ යි දක්වයි. ධර්මය අධර්ම යැ යි දක්වයි. . . . . තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වයි. නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වයි. '' මෙසෙයින් ලැබූ පක්ෂ ඇත්තෙමි '' යි පරපක්ෂයට අවමන් කෙරේ.

27. '' කීසෙයින් බහුශ්‍රුතයෙමි '' යි අල්පශ්‍රුතයාහට අවමන් කෙරේ ද යත් : මෙ සස්නෙහි ඇතැම් මහණෙක් බහුශ්‍රුත වෙයි, ශ්‍රුතධර වෙයි, ශ්‍රුත සන්නිචය (ඇසූ පිරූ දෑ රැස්කොට තබන්නේ) වෙයි, හේ පුද්ගල අල්පශ්‍රුතයෙක, නො පුහුණු වූ ආගම ඇත්තෙක, බණදහම් නො දරන්නෙකැ '' යි ඔහුට අවමන් කරන්නේ අධර්මය ධර්ම යැ යි


Free Distribution www.aathaapi.org

දීපෙති, ධම්මං අධම්මොති දීපෙති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තී'ති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, එවං බහුස්සුතොම්හීති අප්පස්සුතං අවජානාති.

28. කථං ථෙරතරොම්හීති නවකතරං අවජානාති: ඉධෙකච්චො ථෙරො හොති රත්තඤ්ඤූ චිරපබ්බජිතො, 'අයං නවකො අපඤ්ඤාතො[1] අප්පස්සුතො අප්පකතඤ්ඤූ, ඉමස්ස වචනං අකතං භවිස්සතී'ති තස්ස අවජානන්තො අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති -පෙ- දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්තීති දීපෙති, එවං ථෙරතරොම්හීති නවකතරං අවජානාති.

29. අසම්පත්තං න ව්‍යාහරිතබ්බන්ති: අනොතිණ්ණං භාරං න ඔතාරෙතබ්බං.

30. සම්පත්තං ධම්මතො විනයතො න පරිහාපෙතබ්බන්ති: යමත්ථාය සඞ්ඝො සන්නිපතිතො හොති, තමත්ථං ධම්මතො විනයතො න පරිහාපෙතබ්බං.

31 යෙන ධම්මෙනාති: භූතෙන වත්ථුනා.

යෙන විනයෙනාති: චොදෙත්වා සාරෙත්වා.

යෙන සත්ථුසාසනෙනාති: ඤත්තිසම්පදාය අනුසාවනසම්පදාය. යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසම්මති, තථා තං අධිකරණං වූපසමෙතබ්බන්ති.

---

## අනුවිජ්ජක අනුයොගො

අනුවිජ්ජකෙන චොදකො පුච්ඡිතබ්බොති: යං ඛො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො පවාරණං ඨපෙසි, කිම්හි නං ඨපෙසි: සීලවිපත්තියා ඨපෙසි, ආචාරවිපත්තියා ඨපෙසි, දිට්ඨිවිපත්තියා ඨපෙසීති.

සො චෙ එවං වදෙය්‍ය: "සීලවිපත්තියා වා ඨපෙමි, ආචාර-විපත්තියා වා ඨපෙමි, දිට්ඨිවිපත්තියා වා ඨපෙමී"ති.

සො එවමස්ස වචනීයො: 'ජානාති පනායස්මා සීලවිපත්තිං, ජානාති ආචාරවිපත්තිං, ජානාති දිට්ඨිවිපත්තින්ති.

සො චෙ එවං වදෙය්‍ය: "ජානාමි ඛො අහං ආවුසො සීලවිපත්තිං, ජානාමි ආචාරවිපත්තිං, ජානාමි දිට්ඨිවිපත්ති"න්ති.

සො එවමස්ස වචනීයො: "කතමා පනාවුසො සීලවිපත්ති, කතමා ආචාරවිපත්ති, කතමා දිට්ඨිවිපත්තී"ති.

---

1. අප්පඤ්ඤාතො - සීමු, මජසං

Free Distribution www.aathaapi.org

දක්වයි. ධර්මය අධර්මය යි දක්වයි. .... තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැයි දක්වයි. නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැයි දක්වයි. " මෙසෙයින් බහුශ්‍රැතයෙමි " යි අල්ප-ශ්‍රැතයාහට අවමන් කෙරේ.

28. " කිසෙයින් ස්ථවිරතරයෙමි " යි නවකතරයාහට අවමන් කෙරේ ද යත් : මේ සස්නෙහි ඇතැම් මහණෙක් රාත්‍රඥ වූයේ පැවිද්දෙන් බොහෝ කල් ඇත්තේ ස්ථවිර වෙයි. හේ මෙ පුද්ගල නවක යැ අප්‍රකට යැ විනයඥ නො වෙයි, තතු නො දනී, මොහුගේ වචනය නො කළයුතු වන්නේ යැ යි " ඔහුට අවමන් කරන්නේ අධර්මය ධර්ම යැ යි දක්වයි. ධර්මය අධර්ම යැ යි දක්වයි. .... තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැ යි දක්වයි. නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැ යි දක්වයි. " මෙසෙයින් ස්ථවිරතරයෙමි " යි නවකතරයාහට අවමන් කෙරේ.

29. අසම්පත්තං න ව්‍යාහරිතබ්බං යනු : අනවතීර්ණභාරය අවතරණය නොකට යුතු යි.

30. සම්පත්තං ධම්මතො විනයතො න පරිහාපෙතබ්බං යනු : සඞ්ඝයා යම් කරුණක් සඳහා රැස් වූයේ වේ ද, එ කරුණ ධර්මයෙන් විනයයෙන් නො පිරිහෙළිය යුතු යි.

31. යෙන ධම්මෙන යනු : විද්‍යමානවස්තුයෙනි.

යෙන විනයෙන යනු : චොදනා කොට (ඇවැත) සිහි කරවා.

යෙහ සත්ථු සාසනෙන යනු : ඤත්තිසම්පත්තියෙන් අනුසාවනසම්පත්තියෙන්, යම් ධර්මයෙකින් යම් විනයයෙකින් යම් ශාස්තෘශාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳේ නම් එසෙයින් ඒ අධිකරණය සන්හිඳවිය යුතු.

---

## අනුවිජ්ජකානුයොගය

" අනුවිජ්ජකෙන චොදකො පුච්ඡිතබ්බො " යනු : ඇවැත්නි, තෙපි යම්හෙයෙකින් මේ මහණහුගේ පවාරණය තබවු නම් එය කවර විපත්තියෙක ලා තබවු ද : " ශීලවිපත්ති යෙහි ලා තබවු ද, ආචාරවිපත්තියෙහි ලා තබවු ද, දෘෂ්ටිවිපත්තියෙහි ලා තබවු ද ' යි.

ඉදින් ඒ චොදක මහණ මෙසේ කියා නම් : " ශීලවිපත්තියෙන් හෝ තබමි, ආචාර-විපත්තියෙන් හෝ තබමි, දෘෂ්ටිවිපත්තියෙන් හෝ තබමි " යි.

ඒ චොදක මහණ මෙසේ කියැයුතු වන්නේ යැ : " ආයුෂ්මත් තෙම ශීලවිපත්ති දනී ද, ආචාරවිපත්ති දනී ද, දෘෂ්ටිවිපත්ති දනී ද " යි.

ඉදින් හෙ මෙසේ කියා නම් : " ඇවැත්නි, මම ශීලවිපත් දනිමි, ආචාරවිපත් දනිමි, දෘෂ්ටිවිපත් දනිමි " යි.

හෙ මෙසේ කියැයුතු වන්නේ යැ : " ඇවැත්නි, ශීලවිපත් නම් කවර, ආචාරවිපත් කවර, දෘෂ්ටිවිපත් කවර " යි.

සො චෙ එවං වදෙය්‍ය: "චත්තාරි පාරාජිකානි තෙරස සඞ්ඝාදිසෙසා, අයං සීලවිපත්ති, ථුල්ලච්චයං පාචිත්තියං පාටිදෙසනීයං දුක්කටං දුබ්භාසිතං, අයං ආචාරවිපත්ති. මිච්ඡාදිට්ඨි අන්තග්ගාහිකා දිට්ඨි, අයං දිට්ඨිවිපත්ති"ති.

සො එවමස්ස වචනීයො "යං බො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො පවාරණං ඨපෙසි, දිට්ඨෙන ඨපෙසි, සුතෙන ඨපෙසි, පරිසඞ්කාය ඨපෙසී"ති.

සො චෙ එවං වදෙය්‍ය: "දිට්ඨෙන වා ඨපෙමි, සුතෙන වා ඨපෙමි, පරිසඞ්කාය වා ඨපෙමී"ති.

සො එවමස්ස වචනීයො; "යං බො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො දිට්ඨෙන පවාරණං ඨපෙසි, කිං තෙ දිට්ඨං, කින්ති තෙ දිට්ඨං, කදා තෙ දිට්ඨං, කත්ථ තෙ දිට්ඨං, පාරාජිකං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො, සඞ්ඝාදිසෙසං-ථුල්ලච්චයං-පාචිත්තියං-පාටිදෙසනීයං-දුක්කටං-දුබ්භාසිතං අජ්ඣාපජ්ජන්තො දිට්ඨො, කත්ථ ච ත්වං අහොසි, කත්ථ චායං භික්ඛු අහොසි, කිඤ්ච ත්වං කරොසි, කිඤ්චායං භික්ඛු කරොතී"ති.

සො චෙ එවං වදෙය්‍ය: න බො අහං ආවුසො ඉමස්ස භික්ඛුනො දිට්ඨෙන පවාරණං ඨපෙමි. අපි ච සුතෙන පවාරණං ඨපෙමී"ති.

සො එවමස්ස වචනීයො: යං බො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො සුතෙන පවාරණං ඨපෙසි, කිං තෙ සුතං, කින්ති තෙ සුතං, කදා තෙ සුතං, කත්ථ තෙ සුතං, පාරාජිකං අජ්ඣාපන්නොති සුතං, සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති සුතං, ථුල්ලච්චයං-පාචිත්තියං-පාටිදෙසනීයං-දුක්කටං-දුබ්භාසිතං අජ්ඣාපන්නොති සුතං, භික්ඛුස්ස සුතං, භික්ඛුනියා සුතං, සික්ඛමානාය සුතං, සාමණෙරස්ස සුතං. සාමණෙරියා සුතං, උපාසකස්ස සුතං, උපාසිකාය සුතං, රාජූනං සුතං, රාජමහාමත්තානං සුතං, තිත්ථියානං සුතං, තිත්ථියසාවකානං සුත"න්ති.

සො චෙ එවං වදෙය්‍ය: න බො අහං ආවුසො ඉමස්ස භික්ඛුනො සුතෙන පවාරණං ඨපෙමි, අපි ච පරිසඞ්කාය පවාරණං ඨපෙමීති.

සො එවමස්ස වචනීයො "යං බො ත්වං ආවුසො ඉමස්ස භික්ඛුනො පරිසඞ්කාය පවාරණං ඨපෙසි, කිං පරිසඞ්කසි, කින්ති පරිසඞ්කසි, කදා පරිසඞ්කසි, කත්ථ පරිසඞ්කසි,[1] පාරාජිකං අජ්ඣාපන්නොති පරිසඞ්කසි, සඞ්ඝාදිසෙසං-ථුල්ලච්චයං-පාචිත්තියං-පාටිදෙසනීයං-දුක්කටං-දුබ්භාසිතං අජ්ඣාපන්නොති පරිසඞ්කසි, භික්ඛුස්ස සුත්වා පරිසඞ්කසි, භික්ඛුනියා සුත්වා පරිසඞ්කසි, සික්ඛමානාය සුත්වා පරිසඞ්කසි, සාමණෙරස්ස සුත්වා පරිසඞ්කසි, සාමණෙරියා සුත්වා පරිසඞ්කසි, උපාසකස්ස සුත්වා පරිසඞ්කසි, උපාසිකාය සුත්වා පරිසඞ්කසි, රාජූනං සුත්වා පරිසඞ්කසි, රාජමහාමත්තානං සුත්වා පරිසඞ්කසි, තිත්ථියානං සුත්වා පරිසඞ්කසි, තිත්ථියසාවකානං සුත්වා පරිසඞ්කසී'ති.

---

1 කිං තෙ පරිසඞ්කසි, කින්ති තෙ පරිසඞ්කසි, කදා තෙ පරිසඞ්කසි, කත්ථ තෙ පරිසඞ්කසි - සීමු. 1, 2.

ඉදින් හෙ මෙසේ කියා නම් : '' සතර පරිජි යැ තෙළෙස් සඟවෙසෙස් යැ යන මේ ශීලවිපත්ති යැ. ථුලැසි යැ පචිති යැ පිළිදෙස්නී යැ දුකුළා යැ දුබැසි යැ යන මේ ආචාරවිපත්ති යැ, මිථ්‍යාදෘෂ්ටි යැ අන්තග්‍රාහිකදෘෂ්ටි යැ යන මේ දෘෂ්ටිවිපත්ති '' යි.

ඒ චොදක මහණ මෙසේ කියැයුතු වන්නේ යැ : '' ඇවැත්නි තෙපි යම්හෙයෙකින් මෙ මහණහට පවාරණාට්ඨපන කරන්නහු දෘෂ්ටයෙන් තබවු ද, ශ්‍රැතයෙන් තබවු ද, පරිශඞ්කායෙන් තබවු දූ '' යි.

ඉදින් හෙ මෙසේ කියා නම් : '' දෘෂ්ටයෙන් හෝ තබමි, ශ්‍රැතයෙන් හෝ තබමි, පරිශඞ්කායෙන් හෝ තබමි '' යි.

හේ මෙසේ කියැයුතු වන්නේ යැ : '' ඇවැත්නි, යම්හෙයෙකින් තෙපි මේ මහණහට දෘෂ්ටයෙන් පවාරණාට්ඨපන කරන්නහු නම් තොප විසින් කුමක් දක්නාලද ද, තොප විසින් කෙසේ දක්නාලද ද, තොප විසින් කවරද දක්නාලද ද, තොප විසින් කොහි දී දක්නාලද ද, පරිජිඇවැත් අවදනේ දක්නාලද ද, සඟවෙසෙස් — ථුලැසි — පචිති — පිළිදෙස්නී — දුකුළා — දුබැසි ඇවැත් අවදනේ දක්නාලද ද, තෙපි කොහි වූවහු ද, යළි මෙ මහණ කොහි වී ද, තෙපි කුමක් කරවු ද, මෙ මහණ කුමක් කෙරේ දූ '' යි.

ඉදින් හේ මෙසේ කියා නම් : '' ඇවැත්නි මම් මේ මහණහට දෘෂ්ටයෙන් පවාරණාට්ඨපන නො කෙරෙමි මැ යැ. එතෙකුදුවත් ශ්‍රැතයෙන් පවාරණාට්ඨපන කෙරෙමි '' යි.

හෙ මෙසේ කියැයුතු වන්නේ යැ : '' ඇවැත්නි, තෙපි යම්හෙයෙකින් මේ මහණහට ශ්‍රැතයෙන් පවාරණාට්ඨපන කරවු නම් තොප විසින් කුමක් අසනලද ද, තොප විසින් කෙසේ අසනලද ද, තොප විසින් කවර කලෙක අසනලද ද, තොප විසින් කොතන්හි අසනලද ද, පරිජිඇවැත් අවනැයි අසනලද ද, සඟවෙසෙස් ඇවැත් අවනැයි අසනලද ද, ථුලැසි — පචිති — පිළිදෙස්නී — දුකුළා — දුබැසි ඇවැත් අවනැයි අසනලද ද, මහණක්හු කියන්නා අසනලද ද, මෙහෙණක කියන්නා අසනලද ද, සික්ඛමානාවක කියන්නා අසනලද ද, හෙරණක්හු කියන්නා අසනලද ද, හෙරණක කියන්නා අසනලද ද, උවසුවක්හු කියන්නා අසනලද ද, උවැසියක කියන්නා අසනලද ද, රජුන් කියන්නා අසනලද ද, රජමහඇමැතියන් කියන්නා අසනලද ද, තීර්ථකයන් කියන්නා අසනලද ද, තීර්ථකශ්‍රාවකයන් කියන්නා අසනලද දූ '' යි.

ඉදින් හේ මෙසේ කියා නම් : '' ඇවැත්නි, මම් මේ මහණහට ශ්‍රැතයෙන් පවාරණාට්ඨපන නො කෙරෙමි මැ යැ. එතෙකුදුවත් පරිශඞ්කායෙන් පවාරණාට්ඨපන කෙරෙමි '' යි.

හෙ මෙසේ කියැයුතු වන්නේ යැ : '' යම්හෙයෙකින් ඇවැත්නි, තෙපි මේ මහණහට සැකයෙන් පවාරණාට්ඨපන කරවු නම්, කුමක් සැක කරවු ද, කෙසේ සැක කරවු ද, කවර කලෙක සැක කරවු ද, කොතන්හි සැක කරවු ද, පරිජි ඇවැත් අවනැයි සැක කරවු ද, සඟවෙසෙස් — ථුලැසි — පචිති — පාටිදෙසනීය — දුකුළා — දුබැසි ඇවැත් අවනැයි සැක කරවු ද, මහණක්හු කියන්නා අසා සැක කරවු ද, මෙහෙණක කියන්නා අසා සැක කරවු ද, සික්ඛමානාවක කියන්නා අසා සැක කරවු ද, හෙරණක්හු කියන්නා අසා සැක කරවු ද, හෙරණක කියන්නා අසා සැක කරවු ද, උවසුවක්හු කියන්නා අසා සැක කරවු ද, උවැසියක කියන්නා අසා සැක කරවු ද, රජුන් කියන්නා අසා සැක කරවු ද, රජමහඇමැති-යන් කියන්නා අසා සැක කරවු ද අන්තොටුවන් කියන්නා අසා සැක කරවු ද, අන්තොටු-සව්වන් කියන්නා අසා සැක කරවු දූ '' යි.

1. දිට්ඨං දිට්ඨෙන සමෙති දිට්ඨෙන සංසන්දතෙ දිට්ඨං,
දිට්ඨං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාතබ්බො තෙන පවාරණා.

2. සුතං සුතෙන සමෙති සුතෙන සංසන්දතෙ සුතං,
සුතං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාතබ්බො තෙන පවාරණා.

3. මුතං මුතෙන සමෙති මුතෙන සංසන්දතෙ මුතං,
මුතං පටිච්ච න උපෙති අසුද්ධපරිසඞ්කිතො;
සො පුග්ගලො පටිඤ්ඤාය කාතබ්බො තෙන පවාරණාති.

---

## පුච්ඡාවිභාගො

1. කිං තෙ දිට්ඨන්ති කතමා පුච්ඡා, කින්ති තෙ දිට්ඨන්ති කතමා පුච්ඡා, කදා තෙ දිට්ඨන්ති කතමා පුච්ඡා, කත්ථ තෙ දිට්ඨන්ති කතමා පුච්ඡා:

2. කිං තෙ දිට්ඨන්ති වත්ථුපුච්ඡා. විපත්තිපුච්ඡා. ආපත්තිපුච්ඡා අජ්ඣාචාරපුච්ඡා.

වත්ථුපුච්ඡාති: අට්ඨන්නං පාරාජිකානං වත්ථුපුච්ඡා. තෙරසන්නං සඞ්ඝාදිසෙසානං වත්ථුපුච්ඡා, ද්වින්නං අනියතානං වත්ථුපුච්ඡා, ද්වෙචත්තාළීසනිස්සග්ගියානං වත්ථුපුච්ඡා, අට්ඨාසීතිසතපාචිත්තියානං වත්ථුපුච්ඡා, ද්වාදසපාටිදෙසනීයානං වත්ථුපුච්ඡා, දුක්කටානං වත්ථුපුච්ඡා, දුබ්භාසිතානං වත්ථුපුච්ඡා.

විපත්තිපුච්ඡාති: සීලවිපත්ති පුච්ඡා, ආචාරවිපත්තිපුච්ඡා, දිට්ඨිවිපත්ති පුච්ඡා, ආජීවවිපත්තිපුච්ඡා.

ආපත්ති පුච්ඡාති: පාරාජිකාපත්තිපුච්ඡා, සඞ්ඝාදිසෙසාපත්තිපුච්ඡා, ථුල්ලච්චයාපත්තිපුච්ඡා, පාචිත්තියාපත්තිපුච්ඡා, පාටිදෙසනීයාපත්තිපුච්ඡා, දුක්කටාපත්තිපුච්ඡා, දුබ්භාසිතාපත්තිපුච්ඡා.

අජ්ඣාචාරපුච්ඡාති: ද්වයංද්වයසමාපත්තිපුච්ඡා.

3. කින්ති තෙ දිට්ඨන්ති: ලිඞ්ගපුච්ඡා, ඉරියාපථපුච්ඡා, ආකාරපුච්ඡා, විප්පකාරපුච්ඡා.

ලිඞ්ගපුච්ඡාති: දීඝං වා රස්සං වා කණ්හං වා ඔදාතං වා.

ඉරියාපථපුච්ඡාති: ගච්ඡන්තං වා ඨිතං වා නිසින්නං වා නිපන්නං වා.

ආකාරපුච්ඡාති: ගිහිලිඞ්ගෙ වා තිත්ථියලිඞ්ගෙ වා පබ්බජිතලිඞ්ගෙ වා.

විප්පකාරපුච්ඡාති: ගච්ඡන්තං වා ඨිතං වා නිසින්නං වා නිපන්නං වා.

Free Distribution www.aathaapi.org

1. දක්නාලද්ද දක්නාලද්ද හා සම වෙයි. දක්නාලද්ද දක්නාලද්ද හා සැසැඳෙයි. දක්නාලද්ද නිසා ඇවැතට නො පැමිණෙයි. ඒ පුද්ගල අශුද්ධ ' යයි සැක කරණලද්දේ වෙයි. (ඔහුගේ) ප්‍රතිඥයෙන් ඒ පුද්ගලයා හා සමග පවාරණ කටයුතු.

2. අසනලද්ද, අසනලද්ද හා සම වෙයි. අසනලද්ද අසනලද්ද හා සැසැඳෙයි. අසනලද්ද නිසා ඇවැතට නො පැමිණෙයි. ඒ පුද්ගල '' අශුද්ධ '' යයි සැක කරණලද්දේ වෙයි. (ඔහුගේ) ප්‍රතිඥයෙන් ඔහු හා සමග පවාරණ කටයුතු.

3. (ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය සඞ්ඛ්‍යාත) මුතය මුතය හා සම වෙයි. මුතය මුතය හා සැසැඳෙයි. මුතය නිසා ඇවැතට නො පැමිණෙයි. ඒ පුද්ගල '' අශුද්ධ '' යයි සැක කරණලද්දේ වෙයි. (ඔහුගේ) ප්‍රතිඥයෙන්, ඔහු හා සමග පවාරණ කටයුතු.

---

## පුච්ඡාවිභාගය

1. '' තොප විසින් කුමක් දක්නාලද ද '' යනු කවර පිළිවිසීමෙක් ද, '' තොප විසින් කෙසේ, දක්නා ලද ද '' යනු කවර පිළිවිසීමෙක් ද, '' තොප විසින් කවර ද දක්නා ලද ද '' යනු කවර පිළිවිසීමෙක් ද '' තොප විසින් කො තන්හි දක්නා ලද ද '' යනු කවර පිළිවිසීමෙක් ද යත් :

2. '' තොප විසින් කුමක් දක්නාලද ද '' යනු : වස්තුපෘච්ඡා යැ විපත්තිපෘච්ඡා යැ ආපත්තිපෘච්ඡා යැ අජ්ඣාචාරපෘච්ඡා යි.

වස්තුපෘච්ඡා නම් ; අට පරීජි පිළිබඳ (වරදට හෙතු වූ) වස්තුපෘච්ඡා යැ, තෙවිසි සඟ වෙසෙසුන් පිළිබඳ වස්තුපෘච්ඡා යැ, දෙ අනියත පිළිබඳ වස්තුපෘච්ඡා යැ, දෙසාළිස් නිසඟි පිළිබඳ වස්තුපෘච්ඡා යැ, එක්සිය අටාසූවක් පචිති පිළිබඳ වස්තුපෘච්ඡා යැ, දෙළොස් පිළිදෙස්නීන් පිළිබඳ වස්තුපෘච්ඡා යැ, දුකුළා පිළිබඳ වස්තුපෘච්ඡා යැ, දුබැසි පිළිබඳ වස්තුපෘච්ඡා යි.

විපත්තිපෘච්ඡා නම් : ශීලවිපත්තිපෘච්ඡා යැ, ආචාරවිපත්තිපෘච්ඡා යැ, දෘෂ්ටිවිපත්ති පෘච්ඡා යැ, ආජීවවිපත්තිපෘච්ඡා යි.

ආපත්තිපෘච්ඡා නම් පාරාජිකාපත්තිපෘච්ඡා යැ, සඞ්ඝාදිසෙසාපත්තිපෘච්ඡා යැ, ථුල්ලච්චයාපත්තිපෘච්ඡා යැ, පාචිත්තියාපත්තිපෘච්ඡා යැ, පාටිදෙසනීයාපත්තිපෘච්ඡා යැ, දුක්කටාපත්තිපෘච්ඡා යැ, දුබ්භාසිතාපත්තිපෘච්ඡා යි.

අජ්ඣාචාරපෘච්ඡා නම් (මෙවුන්දම් සෙවීම පිණිස) ද්වයංද්වයසමාපත්තිපෘච්ඡා යි.

3. '' තොප විසින් කෙසේ දක්නාලද ද '' යනු : ලිඞ්ගපෘච්ඡා යැ, ඊර්යාපථපෘච්ඡා යැ, ආකාරපෘච්ඡා යැ, විප්‍රකාරපෘච්ඡා යි.

ලිඞ්ගපෘච්ඡා නම් : දිගුබව හෝ ලුහුඬුබව හෝ කළුබව හෝ එළලුබව හෝ යැ.

ඊර්යාපථපෘච්ඡා නම් : යන්නහු හෝ සිටියහු හෝ හුන්නහු හෝ හොත්තහු හෝ යැ.

ආකාරපෘච්ඡා නම් : ගිහිලිඞ්ගයෙහි හෝ තිත්ථියලිඞ්ගයෙහි හෝ පබ්බජිත ලිඞ්ගයෙහි හෝ යැ.

විප්‍රකාරපෘච්ඡා නම් : යන්නහු හෝ සිටියහු හෝ හුන්නහු හෝ හොත්තහු හෝ යි.

4. කතී තෙ දිවඩ්ඪනී : කාලපුච්ඡා, සමයපුච්ඡා, දිවසපුච්ඡා, උතුපුච්ඡා.

කාලපුච්ඡාති : පුබ්බණ්හකාලෙ වා මජ්ඣන්තිකකාලෙ වා සායන්හකාලෙ වා.

සමයපුච්ඡාති : පුබ්බණ්හසමයෙ වා මජ්ඣන්තිකසමයෙ වා සායන්හසමයෙ වා.

දිවසපුච්ඡාති : පුරෙභත්තං වා පච්ඡාභත්තං වා රත්තිං වා දිවා වා කාළෙ වා ජුණ්හෙ වා.

උතුපුච්ඡාති : හෙමන්තෙ වා ගිම්හෙ වා වස්සානෙ වා[1].

5. කතී තෙ දිවඩ්ඪනී : ඨානපුච්ඡා, භූමිපුච්ඡා, ඔකාසපුච්ඡා, පදෙසපුච්ඡා.

ඨානපුච්ඡාති : භූමියා වා පථවියා වා ධරණියා වා ජගතියා වා.

භූමිපුච්ඡාති : භූමියා වා පථවියා වා පබ්බතෙ වා පාසාණෙ වා පාසාදෙ වා.

ඔකාසපුච්ඡාති : පුරත්ථිමෙ වා ඔකාසෙ පච්ඡිමෙ වා ඔකාසෙ උත්තරෙ වා ඔකාසෙ දක්ඛිණෙ වා ඔකාසෙ.

පදෙසපුච්ඡාති : පුරත්ථිමෙ වා පදෙසෙ පච්ඡිමෙ වා පදෙසෙ උත්තරෙ වා පදෙසෙ දක්ඛිණෙ වා පදෙසෙ'ති.

මහාසඞ්ගාමො නිට්ඨිතො.

---

තස්සුද්දානං :

1. වත්ථු නිදානං ආකාරො පුබ්බාපරං කතාකතං,
කම්මාධිකරණඤ්චෙව සමථො ඡන්දගාමි ච.

2. දොසා මොහා භයා චෙව සඞ්ඝදුතිඣාපනෙන ච,
පෙක්ඛා පසාදෙ පක්කාමති සුත ථෙරතරෙන ච.

3. අසම්පත්තඤ්ච සම්පත්තං ධම්මෙන විනයෙන ච
සත්ථුස්ස සාසනෙනාපි මහාසඞ්ගාමඤාපනාති.

---

1. වස්සෙ - ම.ඡ.සං.

4. " තොප විසින් කවරද දක්නා ලද ද " යනු : කාලපෘච්ඡා යැ, සමයපෘච්ඡා යැ, දිවසපෘච්ඡා යැ, ඍතුපෘච්ඡා යි.

කාලපෘච්ඡා නම් : පූර්වාහ්ණකාලයෙහි හෝ මද්ධ්‍යාහ්නකාලයෙහි හෝ සායාහ්න-කාලයෙහි හෝ යැ.

සමයපෘච්ඡා නම් පූර්වාහ්ණසමයෙහි හෝ මද්ධ්‍යාහ්නසමයෙහි හෝ සායාහ්න-සමයෙහි හෝ යැ.

දිවසපෘච්ඡා නම් : පෙරබතැ හෝ පසුබතැ හෝ රාත්‍රිය හෝ දවල හෝ අවපස හෝ පූරපස හෝ යැ.

ඍතුපෘච්ඡා නම් : හෙමන්තයෙහි හෝ ගිම්හානයෙහි හෝ වස්සානයෙහි හෝ යි.

5. " තොප විසින් කොතන්හි දක්නාලද ද " යනු : ස්ථානපෘච්ඡා යැ, භූමිපෘච්ඡා යැ, අවකාශපෘච්ඡා යැ, ප්‍රදෙශපෘච්ඡා යි.

ස්ථානපෘච්ඡා නම් බිමැ හෝ පොළොවෙහි හෝ දෙරණෙහි හෝ මීහිපිට හෝ යැ.

භූමිපෘච්ඡා නම් : බිමැ හෝ පොළොවෙහි හෝ පව්වෙහි හෝ පහණෙහි හෝ පහයෙහි හෝ යැ.

අවකාශපෘච්ඡා නම් : පූර්වදිග අවකාශයෙහි හෝ පශ්චිමදිග අවකාශයෙහි හෝ උත්තරදිග අවකාශයෙහි හෝ දක්ෂිණදිග අවකාශයෙහි හෝ යැ.

ප්‍රදෙශපෘච්ඡා නම් : පෙරදිග පෙදෙසැ හෝ පැසුළුදිග පෙදෙසැ හෝ උතුරුදිග පෙදෙසැ හෝ දකුණුදිග පෙදෙසැ හෝ යි.

**මහාසංග්‍රාමය නිමි.**

---

එහි නමාවලිය :

1. වස්තු යැ නිදාන යැ ආකාර යැ පුබ්බාපර යැ කතාකත යැ කම්ම යැ අධිකරණ යැ සමථ යැ ඡන්දගාමී යැ

2. දෙසගාමී යැ මොහගාමී යැ භයගාමී යැ සඤ්ඤාපනීය යැ නිජ්ඣාපනීය යැ පෙක්ඛනීය යැ පසාදනීය යැ ලද්ධපක්ඛ යැ බහුස්සුත යැ ථෙරතර යැ.

3. අසම්පත්ත යැ සම්පත්ත යැ ධම්ම - විනය සත්ථුසාසන යැ යන මෙයින් ද මහාසඞ්ග්‍රාමය හැඳින් වේ.

---

# කඨිනභෙදො

කස්ස කඨිනං[1] අනත්ථතං, කස්ස කඨිනං අත්ථතං, කින්ති කඨිනං අනත්ථතං, කින්ති කඨිනං අත්ථතං:

කස්ස කඨිනං අනත්ථතන්ති: ද්වින්නං පුග්ගලානං අනත්ථතං හොති කඨිනං: අනත්ථාරකස්ස ච, අනනුමොදකස්ස ච. ඉමෙසං ද්වින්නං පුග්ගලානං අනත්ථතං හොති කඨිනං.

කස්ස කඨිනං අත්ථතන්ති: ද්වින්නං පුග්ගලානං අත්ථතං හොති කඨිනං: අත්ථාරකස්ස ච අනුමොදකස්ස ච. ඉමෙසං ද්වින්නං පුග්ගලානං අත්ථතං හොති කඨිනං.

කින්ති කඨිනං අනත්ථතන්ති: චතුවීසතියා ආකාරෙහි අනත්ථතං හොති කඨිනං: න උල්ලිඛිතමත්තෙන අත්ථතං හොති කඨිනං, න ධොවනමත්තෙන අත්ථතං හොති කඨිනං, න චීවරවිචාරණමත්තෙන අත්ථතං හොති කඨිනං. න ඡෙදනමත්තෙන අත්ථතං හොති කඨිනං. න බන්ධනමත්තෙන අත්ථතං හොති කඨිනං න ඔවට්ටිකරණමත්තෙන[2] අත්ථතං හොති කඨිනං. න කණ්ඩුසකරණමත්තෙන[3] අත්ථතං හොති කඨිනං. න දළ්හීකරණමත්තෙන අත්ථතං හොති කඨිනං. න අනුවාතකරණමත්තෙන අත්ථතං හොති කඨිනං. න පරිභණ්ඩකරණමත්තෙන අත්ථතං හොති කඨිනං. න ඔවද්ධෙය්‍යකරණමත්තෙන අත්ථතං හොති කඨිනං. න කම්බලමද්දනමත්තෙන අත්ථතං හොති කඨිනං. න නිමිත්තකතෙන අත්ථතං හොති කඨිනං. න පරිකථාකතෙන අත්ථතං හොති කඨිනං. න කුක්කුකතෙන අත්ථතං හොති කඨිනං. න සන්නිධිකතෙන අත්ථතං හොති කඨිනං න නිස්සග්ගියෙන අත්ථතං හොති කඨිනං. න අකප්පකතෙන අත්ථතං හොති කඨිනං. න අඤ්ඤත්‍ර සඞ්ඝාටියා අත්ථතං හොති කඨිනං. න අඤ්ඤත්‍ර උත්තරාසඞ්ගෙන අත්ථතං හොති කඨිනං න අඤ්ඤත්‍ර අන්තරවාසකෙන අත්ථතං හොති කඨිනං. න අඤ්ඤත්‍ර පඤ්චකෙන වා අතිරෙකපඤ්චකෙන වා තදහෙව සඤ්ඡින්නෙන සමණ්ඩලීකතෙන අත්ථතං හොති කඨිනං. න අඤ්ඤත්‍ර පුග්ගලස්ස අත්ථාරා අත්ථතං හොති කඨිනං. සම්මා චෙව අත්ථතං හොති කඨිනං, තඤ්චෙ නිස්සීමට්ඨො අනුමොදති, එවම්පි අනත්ථතං හොති කඨිනං.

නිමිත්තකම්මං නාම: නිමිත්තං කරොති "ඉමිනා දුස්සෙන කඨිනං අත්ථරිස්සාමී" ති.

පරිකථා නාම: පරිකථං කරොති "ඉමාය පරිකථාය කඨිනදුස්සං නිබ්බත්තෙස්සාමී" ති.

---

1. කථිනං - ම.ඡ.සං, සබ්බත්ථ.
2. ඔවට්ටියකරණමත්තෙන - ම.ඡ සං.
3. ගණ්ඩුසකරණමත්තෙන - ම.ඡ.සං.

# කඨිනභේදය

කවරක්හු විසින් කඨිනය නො අතුරණ ලද ද, කවරක්හු විසින් කඨිනය අතුරණ ලද ද කඨිනය කෙසේ නො අතුරණලද ද, කඨිනය කෙසේ අතුරණලද ද ?

කවරක්හු විසින් කඨිනය නො අතුරණලද ද යත් : නො අතුරන්නා යැ නො අනුමෝදන්වන්නා යැ යි පුද්ගලයන් දෙදෙනා විසින් කඨිනය නො අතුරණ ලද වෙයි. මේ පුද්ගලයන් දෙදෙනා විසින් කඨිනය නො අතුරණලද වේ.

කවරක්හු විසින් කඨිනය අතුරණලද ද යත් : අතුරන්නා යැ අනුමෝදන්වන්නා යැ යි පුද්ගලයන් දෙදෙනා විසින් කඨිනය අතුරණලද වෙයි. මේ පුද්ගලයන් දෙදෙනා විසින් කඨිනය අතුරණලද වේ.

කඨිනය කෙසේ නො අතුරණලද ද යත් : සුවිසි අයුරෙකින් කඨිනය නො අතුරණ ලද වෙයි : (පමණ ගැන්මට) ලකුණු කළ පමණින් කඨිනය නො අතුරණ ලද වෙයි. දෙවාලූ පමණින් කඨිනය නො අතුරණ ලද වෙයි. කඩ නියම කිරීම් පමණින් කඨිනය නො අතුරණලද වෙයි. කඩ කැපීම් පමණින් කඨිනය නො අතුරණ ලද වෙයි. බැඳීම් (හිස් නූල් ඇදීම්) පමණින් කඨිනය නො අතුරණ ලද වෙයි. දික් මැහීම් කළ පමණින් කඨිනය නො අතුරණලද වෙයි. අතුබැඳීම් පමණින් කඨිනය නො අතුරණලද වෙයි, (දෘඪවීම පිණිස) දෙපට එකට මැසීම් පමණින් කඨිනය නො අතුරණ ලද වෙයි. පිටනුවා ඇල්ලූ පමණින් කඨිනය නො අතුරණලද වෙයි. ඇතුල්නුවා ඇල්ලූ පමණින් කඨිනය නො අතුරණලද වෙයි. අමුතු රෙදිපටක් ඇල්ලූ පමණින් කඨිනය නො අතුරණලද වෙයි. වරක් පඬුපෙවූ පමණින් කඨිනය නො අතුරණලද වෙයි. නිමිති කොට ලත් වස්ත්‍රයෙන් කඨිනය නො අතුරණලද වෙයි. පරිකථාවෙන් ලත් වස්ත්‍රයෙන් කඨිනය නො අතුරණලද වෙයි. තාවකාලික වස්ත්‍රයෙන් කඨිනය නො අතුරණලද වෙයි. තැන්පත් කොට තැබූ වස්ත්‍රයෙන් කඨිනය නො අතුරණලද වෙයි. නිසඟි වූ වස්ත්‍රයෙන් කඨිනය නො අතුරණ ලද වෙයි. කප්බිඳු නො තැබූ සිවුරෙන් කඨිනය නො අතුරණලද වෙයි. සඟළසිවුර හැර අනෙකෙකින් කඨිනය නො අතුරණලද වෙයි. උතුරුසඟ සිවුර හැර අනෙකෙකින් කඨිනය නො අතුරණලද වෙයි. අඳනය හැර අනෙකෙකින් කඨිනය නො අතුරණලද වෙයි. එදවස ම කඩකපනලද මහමඩුලු අඩමඩුලු ඇතිව කරණලද කඩපසකින් හෝ අයිරාකඩපසකින් හෝ තොරවූවෙකින් කඨිනය නො අතුරණලද වෙයි. පුද්ගලයාගේ ඇතිරීමෙන් තොර ව කඨිනය නො අතුරණ ලද වෙයි. ඉදින් මනා වැ කඨිනය අතුරණලද වේ නම් ඉදින් එය උපචාරසීමාවෙන් බැහැර සිටියෙක් අනුමෝදන් වේ නම් මෙසේ ද කඨිනය නො අතුරණලද වේ.

නිමිත්තකර්මය නම් : '' මේ වස්ත්‍රයෙන් කඨිනයක් අතුරන්නෙමි ''යි නිමිති කෙරෙ යි.

පරිකථා නම් : '' මේ පරිකථාවෙන් කඨින වස්ත්‍රයක් උපදවා ගන්නෙමි '' යි පරිකථා කෙරෙ යි.

කුකකුකතං නාම : අනාදිය දානං වුච්චති.

සන්නිධි නාම : ද්වෙ සන්නිධියො : කරණසන්නිධි ච, නිචයසන්නිධි ච.

නිස්සග්ගියං නාම : කරියමානෙ අරුණං උද්ද්‍රියති,[1] ඉමෙහි චතු-වීසතියා ආකාරෙහි අනත්ථතං හොති කඨිනං.

කිනති කඨිනං අත්ථතනති : සත්තරසහි ආකාරෙහි අත්ථතං හොති කඨිනං : අහතෙන අත්ථතං හොති කඨිනං. අහතකප්පෙන අත්ථතං හොති කඨිනං. පිලොතිකාය අත්ථතං හොති කඨිනං. පංසුකූලෙන අත්ථතං හොති කඨිනං. පාපණිකෙන අත්ථතං හොති කඨිනං. අනිමිත්තකතෙන අත්ථතං හොති කඨිනං. අපරිකථාකතෙන අත්ථතං හොති කඨිනං. අකුකකුකතෙන අත්ථතං හොති කඨිනං. අසන්නිධි-කතෙන අත්ථතං හොති කඨිනං. අනිස්සග්ගියෙන අත්ථතං හොති කඨිනං. කප්පකතෙන අත්ථතං හොති කඨිනං. සඞ්ඝාටියා අත්ථතං හොති කඨිනං. උත්තරාසඞ්ගෙන අත්ථතං හොති කඨිනං. අන්තර-වාසකෙන අත්ථතං හොති කඨිනං. පඤ්චකෙන වා අතිරෙකපඤ්චකෙන වා තදහෙව සඤ්ඡින්නෙන සමණ්ඩලීකතෙන අත්ථතං හොති කඨිනං. පුග්ගලස්ස අත්ථාරා අත්ථතං හොති කඨිනං. සම්මා චෙව අත්ථතං හොති කඨිනං. තඤ්චෙ සීමට්ඨො අනුමොදති එවම්පි අත්ථතං හොති කඨිනං. ඉමෙහි සත්තරසහි ආකාරෙහි අත්ථතං හොති කඨිනං.

සහ කඨිනස්ස අත්ථාරා කති ධම්මා ජායනති : සහ කඨිනස්ස අත්ථාරා පණ්ණරස ධම්මා ජායනති, අට්ඨ මාතිකා ද්වෙ ච පළිබොධා, පඤ්ච ආනිසංසා. සහ කඨිනස්ස අත්ථාරා ඉමෙ පණ්ණරස ධම්මා ජායනති.

---

## පුබ්බාවිස්සජ්ජනං

පයොගස්ස කතමෙ ධම්මා අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තරපච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සය පච්චයෙන පච්චයො, පුරෙජාතපච්චයෙන පච්චයො, පච්ඡාජාත පච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො, පුබ්බකරණස්ස කතමෙ ධම්මා අනන්තරපච්චයෙන පච්චයො -පෙ- පච්චුද්ධාරස්ස කතමෙ ධම්මා -පෙ- අධිට්ඨානස්ස කතමෙ ධම්මා -පෙ- අත්ථාරස්ස කතමෙ ධම්මා -පෙ- මාතිකානඤ්ච පළිබොධානඤ්ච කතමෙ ධම්මා -පෙ- වත්ථුස්ස කතමෙ ධම්මා අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තර පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සයපච්චයෙන පච්චයො, පුරෙජාතපච්චයෙන පච්චයො, පච්ඡාජාතපච්චයෙන පච්චයො, සහජාතපච්චයෙන පච්චයො :

---

1. උට්ඨහති - සී.මු. 2, ම.ඡ.සං.

කුක්කුකත නම් : තව්කැලි දීමැ යි කියනු ලැබේ.

සන්නිධි නම් : (එදින ම නො කොට තබා කිරීම වූ) කරණ සන්නිධි යැ (ලැබූ දින හැර පසු දින පමුණුවා ලීම වූ) නිචය සන්නිධි යැ යන සන්නිධි දෙක යැ.

නිස්සග්ගිය නම් : (කඨිනයෙහි) පරිකර්ම කරත් ම අරුණ නගී. මේ සූවිසි අයුරෙන් කඨිනය නො අතුරණ ලද වේ.

කඨිනය කෙසේ අතුරණ ලද ද යත් : සතළොස් අයුරෙකින් කඨිනය අතුරණ ලද වෙයි. අළුත් වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. අළුත් වස්ත්‍රයට සමාන වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. රෙදි කැබලියෙන් කළ වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. පංසුකූල වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. සල්පිල් දෙරටුවෙහි හැර දමූ වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. නිමිත්ත කර්මයෙන් නො ලද වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. පරිකථා නො කොට උපන් වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. තව්කැලි නො වූ වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. (කරණ නිචය) සන්නිධියෙන් තොර වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. නිසගි නො වූ සිවුරෙන් කඨිනය අතුරණ ලද වෙයි. කප්බිඳු තැබූ වස්ත්‍රයෙන් කඨිනය අතුරණ ලද වෙයි. සඟළ සිවුරෙන් කඨිනය අතුරණ ලද වෙයි. උතුරුසඟසිවුරෙන් කඨිනය අතුරණ ලද වෙයි. අඳන සිවුරෙන් කඨිනය අතුරණ ලද වෙයි. එදවස ම කැපූ කඩ ඇති මැඩිලි සහිත වූ කඩ පසකින් හෝ අයිරා කඩ පසකින් හෝ යුත් සිවුරෙන් කඨිනය අතුරණ ලද වෙයි. පුද්ගලයාගේ ඇතිරීමෙන් කඨිනය අතුරණ ලද වෙයි. ඉදින් මනා වැ කඨිනය අතුරණ ලද නම් ඉදින් උපචාර සීමාව තුළ සිටියේ අනුමෝදන් වේ නම් මෙසේ ද කඨිනය අතුරණ ලද වෙයි. මේ සතළොස් අයුරෙන් කඨිනය අතුරණ ලද වේ.

කඨිනය ඇතිරීම සමඟ කෙතෙක් ධර්මයෝ උපදිත් ද යත් : කඨිනය ඇතිරීම සමඟ මාතෘකා අටක් ද පළිබෝධ දෙකක් ද අනුසස් පසක් ද යි පසළොස් ධර්ම කෙනෙක් උපදිත්. කඨිනය ඇතිරීම සමඟ මේ පසළොස් ධර්මයෝ උපදිත්.

---

## ප්‍රශ්නවිසර්ජනය

(සත් වැදැරුම් පූර්ව කරණය පිණිස පැන් එළවීම් ආදි) ප්‍රයෝගයට කවර ධර්මයෝ අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, නිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, පූර්ව කරණයට කවර ධර්ම කෙනෙක් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද. . . . ප්‍රත්‍යුද්ධාරයට (අධිෂ්ඨානය ඉවත් කිරීමට) කවර ධර්ම කෙනෙක් . . . . අධිෂ්ඨානයට කවර ධර්ම කෙනෙක් . . . . අත්ථාරයට (ඇතිරීමට) කවර ධර්ම කෙනෙක් . . . . මාතෘකාවන්ට හා පළිබොධයන්ට කවර ධර්ම කෙනෙක් . . . . කඨින වස්තුවට කවර ධර්ම කෙනෙක් අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, නිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, පුරෙජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද, සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙද්ද යත් :

පුබ්බකරණං[1] පයොගස්ස අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තර-පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සයපච්චයෙන පච්චයො. පයොගො පුබ්බකරණස්ස පුරෙජාතපච්චයෙන පච්චයො. පුබ්බකරණං පයොගස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො. පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

පච්චුද්ධාරො පුබ්බකරණස්ස අනන්තරපච්චයෙන පච්චයො, සම-නන්තරපච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සය පච්චයෙන පච්චයො. පුබ්බකරණං පච්චුද්ධාරස්ස පුරෙජාතපච්චයෙන පච්චයො. පච්චුද්ධාරො පුබ්බකරණස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

අධිට්ඨානං පච්චුද්ධාරස්ස අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තර-පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සයපච්චයෙන පච්චයො. පච්චුද්ධාරො අධිට්ඨානස්ස පුරෙජාතපච්චයෙන පච්චයො. අධිට්ඨානං පච්චුද්ධාරස්ස පච්ඡාජාත පච්චයෙන පච්චයො. පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

අත්ථාරො අධිට්ඨානස්ස අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තර පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සයපච්චයෙන පච්චයො. අධිට්ඨානං අත්ථාරස්ස පුරෙජාතපච්චයෙන පච්චයො. අත්ථාරො අධිට්ඨානස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො. පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

මාතිකා ච පලිබොධා ච අත්ථාරස්ස අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තරපච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සය-පච්චයෙන පච්චයො. අත්ථාරො මාතිකානඤ්ච පලිබොධානඤ්ච පුරෙජාතපච්චයෙන පච්චයො. මාතිකා ච පලිබොධා ච අත්ථාරස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො. පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

ආසා ච අනාසා ච වත්ථුස්ස අනන්තරපච්චයෙන පච්චයො, සමනන්තරපච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, උපනිස්සයපච්චයෙන පච්චයො. වත්ථු ආසානඤ්ච අනාසානඤ්ච පුරෙජාතපච්චයෙන පච්චයො. ආසා ච අනාසා ච වත්ථුස්ස පච්ඡාජාත-පච්චයෙන පච්චයො. පණ්ණරස ධම්මා සහජාතපච්චයෙන පච්චයො.

පුබ්බකරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං. පච්චුද්ධාරො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො අධිට්ඨානං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවං, කිංසම්භාරං, කිංසමුට්ඨානං. අත්ථාරො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො,

1. පුබ්බකරණස්ස - සීමු. 2.

පූර්ව කරණය ප්‍රයොගයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රයොගය පූර්ව කරණයට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව කරණය ප්‍රයොගයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙයි. පඤ්චදශ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

ප්‍රත්‍යුද්ධාරය පූර්ව කරණයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. පූර්වකරණය ප්‍රත්‍යුද්ධාරයට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යුද්ධාරය පූර්වකරණයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි. පඤ්චදශ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

අධිෂ්ඨානය ප්‍රත්‍යුද්ධාරයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යුද්ධාරය අධිෂ්ඨානයට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, අධිෂ්ඨානය ප්‍රත්‍යුද්ධාරයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, පඤ්චදශ ධර්මයෝ සහාජත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

අත්ථාරය අධිෂ්ඨානයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. අධිෂ්ඨානය අත්ථාරයට පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, අත්ථාරය අධිෂ්ඨානයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, පඤ්චදශ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

මාතෘකාවෝ ද පළිබොධයෝ ද අත්ථාරයට අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති. අත්ථාරය මාතෘකාවන්ට ද පළිබොධයන්ට ද පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි. මාතෘකාවෝ ද පළිබොධයෝ ද අත්ථාරයට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙති. පඤ්චදශ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

ලාභාසාව ද අනාසාව ද වස්තුවට (කඨිනයට) අනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, සමනන්තර ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, නිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි, උපනිඃශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ. (කඨින) වස්තුව ආසාවන්ට ද අනාසාවන්ට ද පුරෙජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි. ආසාව ද අනාසාව ද (කඨින) වස්තුවට පශ්චාජ්ජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වේ නුයි පඤ්චදශ ධර්මයෝ සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙත්.

පූර්වකරණය කුමක් නිදාන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, පච්චුද්ධාරය කුමක් නිදාන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, අධිෂ්ඨානය කුමක් නිදාන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, අත්ථාරය කුමක් නිදාන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට

කිංසම්භාරො, කිංසමුට්ඨානො. මාතිකා ච පළිබොධා ච කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා, කිංසම්භාරා, කිංසමුට්ඨානා. ආසා ච අනාසා ච කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා, කිංසම්භාරා, කිං සමුට්ඨානා :

පුබ්බකරණං පයොගනිදානං, පයොගසමුදයං, පයොගජාතිකං පයොගපභවං, පයොගසම්භාරං, පයොගසමුට්ඨානං.

පච්චුද්ධාරො පුබ්බකරණනිදානො, පුබ්බකරණසමුදයො, පුබ්බකරණජාතිකො, පුබ්බකරණපභවො, පුබ්බකරණසම්භාරො, පුබ්බකරණසමුට්ඨානො.

අධිට්ඨානං පච්චුද්ධාරනිදානං, පච්චුද්ධාරසමුදයං, පච්චුද්ධාරජාතිකං, පච්චුද්ධාරපභවං, පච්චුද්ධාරසම්භාරං, පච්චුද්ධාරසමුට්ඨානං.

අත්ථාරො අධිට්ඨානනිදානො, අධිට්ඨානසමුදයො, අධිට්ඨානජාතිකො, අධිට්ඨානපභවො, අධිට්ඨානසම්භාරො අධිට්ඨානසමුට්ඨානො.

මාතිකා ච පළිබොධා ච අත්ථාරනිදානා, අත්ථාරසමුදයා, අත්ථාරජාතිකා, අත්ථාරපභවා, අත්ථාරසම්භාරා, අත්ථාරසමුට්ඨානා.

ආසා ච අනාසා ච වත්ථුනිදානා, වත්ථුසමුදයා, වත්ථුජාතිකා, වත්ථුපභවා, වත්ථුසම්භාරා, වත්ථුසමුට්ඨානා.

පයොගො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො. පුබ්බකරණං -පෙ- පච්චුද්ධාරො-අධිට්ඨානං-අත්ථාරො-මාතිකා ච පළිබොධා ච-වත්ථු-ආසා ච අනාසා ච කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා, කිංසම්භාරා, කිංසමුට්ඨානා :

පයොගො හෙතුනිදානො, හෙතුසමුදයො, හෙතුජාතිකො, හෙතුපභවො, හෙතු සම්භාරො, හෙතු සමුට්ඨානො. පුබ්බකරණං -පෙ- පච්චුද්ධාරො-අධිට්ඨානං-අත්ථාරො-මාතිකා ච පළිබොධා ච-වත්ථු-ආසා ච අනාසා ච හෙතු නිදානා, හෙතුසමුදයා, හෙතුජාතිකා, හෙතුපභවා, හෙතුසම්භාරා, හෙතුසමුට්ඨානා.

පයොගො කිංනිදානො, කිංසමුදයො, කිංජාතිකො, කිංපභවො, කිංසම්භාරො, කිංසමුට්ඨානො. පුබ්බකරණං -පෙ- පච්චුද්ධාරො-අධිට්ඨානං -අත්ථාරො- මාතිකා ච පළිබොධා ච-වත්ථු-ආසා ච අනාසා ච කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා, කිංසම්භාරා, කිංසමුට්ඨානා.

ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, මාතෘකාවෝ ද පළිබොධයෝ ද කුමක් නිදන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, ආසාව ද අනාසාව ද කුමක් නිදන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද යත් :

පූර්වකරණය ප්‍රයොගය නිදන කොට ඇත, ප්‍රයොගය සමුදය කොට ඇත, ප්‍රයොගය ජාති කොට ඇත, ප්‍රයොගය ප්‍රභව කොට ඇත, ප්‍රයොගය සම්භාර කොට ඇත, ප්‍රයොගය සමුට්ඨාන කොට ඇති.

පච්චුද්ධාරය පූර්වකරණය නිදනකොට ඇත, පූර්වකරණය සමුදය කොට ඇත, පූර්වකරණය ජාති කොට ඇත, පූර්වකරණය ප්‍රභව කොට ඇත, පූර්වකරණය සම්භාර කොට ඇත, පූර්වකරණය සමුට්ඨාන කොට ඇති.

අධිට්ඨානය පච්චුද්ධාරය නිදන කොට ඇත, පච්චුද්ධාරය සමුදය කොට ඇත, පච්චුද්ධාරය ජාති කොට ඇත, පච්චුද්ධාරය ප්‍රභව කොට ඇත, පච්චුද්ධාරය සම්භාර කොට ඇත, පච්චුද්ධාරය සමුට්ඨාන කොට ඇති.

අත්ථාරය අධිට්ඨානය නිදන කොට ඇත, අධිට්ඨානය සමුදය කොට ඇත, අධිට්ඨානය ජාති කොට ඇත, අධිට්ඨානය ප්‍රභව කොට ඇත, අධිට්ඨානය සම්භාර කොට ඇත, අධිට්ඨානය සමුට්ඨාන කොට ඇති.

මාතෘකාවෝ ද පළිබොධයෝ ද අත්ථාරය නිදන කොට ඇත්තාහ. අත්ථාරය සමුදය කොට ඇත්තාහ. අත්ථාරය ජාති කොට ඇත්තාහ. අත්ථාරය ප්‍රභව කොට ඇත්තාහ. අත්ථාරය සම්භාර කොට ඇත්තාහ. අත්ථාරය සමුට්ඨාන කොට ඇත්තාහු යි.

ආසාව ද අනාසාව ද (කඨින) වස්තුව නිදන කොට ඇත, (කඨින) වස්තුව සමුදය කොට ඇත, (කඨින) වස්තුව ජාති කොට ඇත, (කඨින) වස්තුව ප්‍රභව කොට ඇත, (කඨින) වස්තුව සම්භාර කොට ඇත, (කඨින) වස්තුව සමුට්ඨාන කොට ඇති.

ප්‍රයොගය කුමක් නිදන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද, පූර්වකරණය .... පච්චුද්ධාරය .... අධිට්ඨානය .... අත්ථාරය .... මාතෘකාවෝ ද පළිබොධයෝ ද .... (කඨින) වස්තුව .... ආසාව ද අනාසාව ද කුමක් නිදන කොට ඇත්ද, කුමක් සමුදය කොට ඇත්ද, කුමක් ජාති කොට ඇත්ද, කුමක් ප්‍රභව කොට ඇත්ද, කුමක් සම්භාර කොට ඇත්ද, කුමක් සමුට්ඨාන කොට ඇත්ද යත් :

ප්‍රයොගය හෙතුව නිදන කොට ඇත, හෙතුව සමුදය කොට ඇත, හෙතුව ජාති කොට ඇත, හෙතුව ප්‍රභව කොට ඇත, හෙතුව සම්භාර කොට ඇත, හෙතුව සමුට්ඨාන කොට ඇත. පූර්වකරණය .... පච්චුද්ධාරය .... අධිට්ඨානය .... අත්ථාරය .... මාතෘකාවෝ ද පළිබොධයෝ ද .... (කඨින) වස්තුව ද .... ආසාව ද අනාසාව ද හෙතුව නිදන කොට ඇත, හෙතුව සමුදය කොට ඇත, හෙතුව ජාති කොට ඇත, හෙතුව ප්‍රභව කොට ඇත, හෙතුව සම්භාර කොට ඇත, හෙතුව සමුට්ඨාන කොට ඇති.

ප්‍රයොගය කුමක් නිදන කොට ඇත් ද, කුමක් සමුදය කොට ඇත් ද, කුමක් ජාති කොට ඇත් ද, කුමක් ප්‍රභව කොට ඇත් ද, කුමක් සම්භාර කොට ඇත් ද, කුමක් සමුට්ඨාන කොට ඇත් ද, පූර්ව කරණය .... පච්චුද්ධාරය .... අධිට්ඨානය .... අත්ථාරය .... මාතෘකාවෝ ද පළිබොධයෝ ද .... (කඨින) වස්තුව ..... ආසාව ද, අනාසාව ද කුමක් නිදන කොට ඇත් ද, කුමක් සමුදය කොට ඇත් ද, කුමක් ජාති කොට ඇත් ද, කුමක් ප්‍රභව කොට ඇත් ද, කුමක් සම්භාර කොට ඇත් ද, කුමක් සමුට්ඨාන කොට ඇත් ද, යත් :


Free Distribution www.aathaapi.org

පයොගො පච්චයනිදානො, පච්චයසමුදයො, පච්චයජාතිකො, පච්චයපභවො, පච්චයසම්භාරො, පච්චයසමුට්ඨානො. පුබ්බකරණං -පෙ- පච්චුද්ධාරො-අධිට්ඨානං-අත්ථාරො-මාතිකා ච පළිබොධා ච-වත්ථු-ආකාරා ච අනාකාරා ච පච්චයනිදානා, පච්චයසමුදයා, පච්චයජාතිකා, පච්චයපභවා, පච්චයසම්භාරා, පච්චයසමුට්ඨානා.

---

## සඞ්ගහවාරො

පුබ්බකරණං කතිහි ධම්මෙහි සඞ්ගහිතං: පුබ්බකරණං සත්තහි ධම්මෙහි සඞ්ගහිතං: ධොවනෙන විචාරණෙන ඡෙදනෙන බන්ධනෙන සිබ්බනෙන රජනෙන කප්පකරණෙන පුබ්බකරණං ඉමෙහි සත්තහි ධම්මෙහි සඞ්ගහිතං.

පච්චුද්ධාරො කතිහි ධම්මෙහි සඞ්ගහිතො, පච්චුද්ධාරො තීහි ධම්මෙහි සඞ්ගහිතො: සඞ්ඝාටියා උත්තරාසඞ්ගෙන අන්තරවාසකෙන.

අධිට්ඨානං කතිහි ධම්මෙහි සඞ්ගහිතං: අධිට්ඨානං තීහි ධම්මෙහි සඞ්ගහිතං: සඞ්ඝාටියා උත්තරාසඞ්ගෙන අන්තරවාසකෙන.

අත්ථාරො කතිහි ධම්මෙහි සඞ්ගහිතො: අත්ථාරො එකෙන ධම්මෙන සඞ්ගහිතො: වචීභෙදෙන.

කඨිනස්ස කති මූලානි, කති වත්ථූනි, කති භූමියො: කඨිනස්ස එකං මූලං: සඞ්ඝො. තීණි වත්ථූනි: සඞ්ඝාටි, උත්තරාසඞ්ගො, අන්තරවාසකො. ඡ භූමියො: ඛොමං, කප්පාසිකං, කොසෙය්‍යං, කම්බලං, සාණං, භඞ්ගං.

කඨිනස්ස කො ආදි, කිං මජ්ඣං, කිං පරියොසානං: කඨිනස්ස පුබ්බකරණං ආදි, කිරියා මජ්ඣං, අත්ථාරො පරියොසානං.

කතිහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අභබ්බො කඨිනං අත්ථරිතුං, කතිහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං: අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අභබ්බො කඨිනං අත්ථරිතුං, අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං.

කතමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අභබ්බො කඨිනං අත්ථරිතුං: පුබ්බකරණං න ජානාති, පච්චුද්ධාරං න ජානාති, අධිට්ඨානං න ජානාති, අත්ථාරං න ජානාති, මාතිකං න ජානාති, පළිබොධං න ජානාති, උද්ධාරං න ජානාති, ආනිසංසං න ජානාති. ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො අභබ්බො කඨිනං අත්ථරිතුං.

ප්‍රයොගය ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත, ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇත. පූර්ව කරණය .... පච්චුද්ධාරය .... අධිට්ඨානය .... අත්ථාරය .... මාතෘකාවෝ ද පළිබොධයෝ ද .... (කඨින) වස්තුව .... ආසාව ද අනාසාව ද ප්‍රත්‍යය නිදන කොට ඇත, ප්‍රත්‍යය සමුදය කොට ඇත, ප්‍රත්‍යය ජාති කොට ඇත. ප්‍රත්‍යය ප්‍රභව කොට ඇත, ප්‍රත්‍යය සම්භාර කොට ඇත, ප්‍රත්‍යය සමුට්ඨාන කොට ඇති.

---

## සංග්‍රහවාරය

පූර්වකරණය කෙතෙක් කරුණින් සඞ්ග්‍රහ කරණ ලද ද යත්: පූර්වකරණය ධර්ම සතෙකින් සඞ්ග්‍රහ කරණ ලද යැ: සේදීමෙන, කඩ නියම කිරීමෙන, කැපීමෙන, හිස්නූල් තැබීමෙන, මැසීමෙන, පඬු පෙවීමෙන, කප්බිඳු තැබීමෙනැ යි. පූර්ව කරණය මේ සත් කරුණින් සඞ්ග්‍රහ කරණ ලදී.

පච්චුද්ධාරය කෙතෙක් කරුණින් සඞ්ග්‍රහ කරණ ලද ද යත්: පච්චුද්ධාරය තුන් කරුණෙකින් සඞ්ග්‍රහ කරණ ලද යැ: සඟළ සිවුරෙන, උතුරුසඟ සිවුරෙන, අඳනා සිවුරෙනැ යි.

අධිෂ්ඨානය කෙතෙක් කරුණින් සඞ්ග්‍රහ කරණ ලද ද යත්: අධිෂ්ඨානය, තුන් කරුණෙකින් සඞ්ග්‍රහ කරණ ලද යැ: සඟළ සිවුරෙන, උතුරුසඟ සිවුරෙන, අඳනා සිවුරෙනැ යි.

අත්ථාරය කෙතෙක් කරුණින් සඞ්ග්‍රහ කරණ ලද ද යත්: අත්ථාරය එක් කරුණෙකින් සඞ්ග්‍රහ කරණ ලද යැ: වාග්භෙදයෙනි.

කඨිනයට මූලයෝ කෙතෙකැ, වස්තූහු කෙතෙකැ, භූමීහු කෙතෙකැ යත්: කඨිනයට එක් මූලෙකි: සඞ්ඝයා යි. වස්තු තුණෙකි: සඞ්ඝාටි යැ, උත්තරා සඞ්ගයැ, අන්තරවාසක යැ යි. භූමීහු සදෙනෙකි: කොමු පිළි යැ, කපු පිළි යැ, තිහිරි පිළි යැ, කම්බල යැ. හණවැහැරි යැ, මුසු පිළි යැ යි.

කඨිනයට ආදිය කවරේ ද, මධ්‍යය කවරේ ද, අවසානය කවරේ ද යත්: කඨිනයට පූර්ව කරණය ආදි යැ. (පච්චුද්ධාර—අධිට්ඨාන) ක්‍රියා මධ්‍ය යැ, අත්ථාරය අවසාන යි.

කෙතෙක් අඞ්ගයන්ගෙන් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු නො වේ ද, කෙතෙක් අඞ්ගයන්ගෙන් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු වේ ද යත්: අඞ්ග අටකින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු නො වෙයි, අඞ්ග අටකින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු වේ.

කවර අඞ්ග අටකින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු නො වේ ද යත්: පුබ්බකරණය නො දනියි, පච්චුද්ධාරය නො දනියි, අධිට්ඨානය නො දනියි, අත්ථාරය නො දනියි, (අෂ්ට) මාතෘකාව නො දනියි, (උභය) පළිබොධය නො දනියි, උද්ධාරය නො දනියි, ආනිසංසය නො දනී. මේ අඞ්ග අටින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු නො වේ.

කතමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං: පුබ්බකරණං ජානාති, පච්චුද්ධාරං ජානාති, අධිට්ඨානං ජානාති, අත්ථාරං ජානාති, මාතිකං ජානාති, පලිබොධං ජානාති, උබ්භාරං ජානාති, ආනිසංසං ජානාති. ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතො පුග්ගලො භබ්බො කඨිනං අත්ථරිතුං.

කතින්නං[1] පුග්ගලානං කඨිනත්ථාරා න රූහන්ති, කතින්නං පුග්ගලානං කඨිනත්ථාරා රූහන්ති: තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා න රූහන්ති. තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා රූහන්ති.

කතමෙසං තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා න රූහන්ති: නිස්සීමට්ඨො අනුමොදති, අනුමොදන්තො න වාචං භින්දති, වාචං භින්දන්තො න පරං විඤ්ඤාපෙති. ඉමෙසං තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා න රූහන්ති.

කතමෙසං තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා රූහන්ති: සීමට්ඨො අනුමොදති, අනුමොදන්තො වාචං භින්දති, වාචං භින්දන්තො පරං විඤ්ඤාපෙති. ඉමෙසං තිණ්ණන්නං පුග්ගලානං කඨිනත්ථාරා රූහන්ති.

කති කඨිනත්ථාරා න රූහන්ති, කති කඨිනත්ථාරා රූහන්ති: තයො කඨිනත්ථාරා න රූහන්ති, තයො කඨිනත්ථාරා රූහන්ති.

කතමෙ තයො කඨිනත්ථාරා න රූහන්ති: වත්ථුවිපන්නඤ්චෙව හොති, කාලවිපන්නඤ්ච, කරණවිපන්නඤ්ච. ඉමෙ තයො කඨිනත්ථාරා න රූහන්ති.

කතමෙ තයො කඨිනත්ථාරා රූහන්ති: වත්ථුසම්පන්නඤ්චෙව හොති, කාලසම්පන්නඤ්ච, කරණසම්පන්නඤ්ච. ඉමෙ තයො කඨිනත්ථාරා රූහන්ති.

1. කඨිනං ජානිතබ්බං, කඨිනත්ථාරො ජානිතබ්බො, කඨිනස්ස අත්ථාරමාසො ජානිතබ්බො, කඨිනස්ස අත්ථාරවිපත්ති ජානිතබ්බා, කඨිනස්ස අත්ථාරසම්පත්ති ජානිතබ්බා, නිමිත්තකම්මං ජානිතබ්බං, පරිකථා ජානිතබ්බා, කුක්කුකතං ජානිතබ්බං. සන්නිධි ජානිතබ්බා, නිස්සග්ගියං ජානිතබ්බං.

2. කඨිනං ජානිතබ්බන්ති: තෙසඤ්ඤෙව ධම්මානං සඞ්ගහො, සමවායො, නාමං, නාමකම්මං, නාමධෙය්‍යං, නිරුත්ති, බ්‍යඤ්ජනං, අභිලාපො, යදිදං කඨිනන්ති.

3. කඨිනස්ස අත්ථාරමාසො ජානිතබ්බොති: වස්සානස්ස පච්ඡිමො මාසො ජානිතබ්බො.

4 කඨිනස්ස අත්ථාරවිපත්ති ජානිතබ්බාති: චතුවීසතියා ආකාරෙහි කඨිනස්ස අත්ථාරවිපත්ති ජානිතබ්බා.

5. කඨිනස්ස අත්ථාරසම්පත්ති ජානිතබ්බාති: සත්තරසහි ආකාරෙහි කඨිනස්ස අත්ථාරසම්පත්ති ජානිතබ්බා.

---

1. කතිනං - සීමු. මජසං, ස්‍යා.

කවර අඞ්ග අටකින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු වේ ද යත්: පුබ්බකරණය දනියි, පච්චුද්ධාරය දනියි, අධිට්ඨානය දනියි, අත්ථාරය දනියි, (අෂ්ට) මාතෘකාව දනියි (උභය) පළිබොධය දනියි, උද්ධාරය දනියි, ආනිසංසය දනී. මේ අඞ්ග අටින් යුත් පුද්ගල කඨිනය අතුරන්නට සුදුසු වේ.

කෙතෙක් පුද්ගල කෙනකුන්ගේ කඨිනත්ථාරයෝ (පිරිපුන් බවට) නො නැඟෙත් ද, කෙතෙක් පුද්ගල කෙනකුන්ගේ කඨිනත්ථාරයෝ (පිරිපුන් බවට) නැඟෙත් ද යත්: පුද්ගලයන් තිදෙනකුන්ගේ කඨිනත්ථාරයෝ නො නැඟෙති, පුද්ගලයන් තිදෙනකුන්ගේ කඨිනත්ථාරයෝ නැඟෙත්.

කවර පුද්ගලයන් තිදෙනකුන්ගේ කඨිනත්ථාරයෝ නො නැඟෙත් ද යත්: උපචාර සීමාවෙන් බැහැර සිටියේ අනුමෝදත් වේ ද, අනුමෝදත් වන්නේ වාග්භෙද නො කෙරේ ද, වාග්භෙද කරන්නේ මෙරමා නො දන්වා දැයි මේ පුද්ගලයන් තිදෙනාගේ කඨිනත්ථාරයෝ නො නැඟෙත්.

කවර පුද්ගලයන් තිදෙනකුන්ගේ කඨිනත්ථාරයෝ නැඟෙත් ද යත්: සීමාවෙහි සිටියේ අනුමෝදත් වේ ද, අනුමෝදත් වන්නේ වාග්භෙද කෙරේ ද, වාග්භෙද කරන්නේ මෙරමා දන්වා දැයි මේ පුද්ගලයන් තිදෙනාගේ කඨිනත්ථාරයෝ නැඟෙත්.

කෙතෙක් කඨිනත්ථාරයෝ නො නැඟෙත් ද, කෙතෙක් **කඨිනත්ථාරයෝ** නැගෙත් ද යත්: කඨිනත්ථාරයෝ තිදෙනෙක් නො නැගෙති, කඨිනත්ථාරයෝ තිදෙනෙක් නැගෙත්.

කවර කඨිනත්ථාරයෝ තිදෙන නො නැගෙත් ද යත්: වස්තු විපන්නත් වේ ද, කාල විපන්නත් වේ ද, කරණ විපන්නත් වේ දැයි මේ කඨිනත්ථාරයෝ තිදෙන නො නැගෙත්.

කවර කඨිනත්ථාරයෝ තිදෙන නැගෙත් ද යත්: වස්තුසම්පන්නත් වේ ද, කාලසම්පන්නත් වේ ද කරණසම්පන්නත් වේ දැ යි මේ කඨිනත්ථාරයෝ තිදෙන නැගෙත්.

1. කඨිනය දතයුතු යැ, කඨිනත්ථාරය දතයුතු යැ, කඨිනත්ථාර මාසය දතයුතු යැ, කඨිනත්ථාර විපත්තිය දතයුතු යැ, කඨිනත්ථාර සම්පත්තිය දතයුතු යැ, නිමිත්තකර්මය දතයුතු යැ, පරිකථාව දතයුතු යැ, තාවකාලිකය දතයුතු යැ, සන්නිධිය දතයුතු යැ, නිස්සග්ගිය දතයුතු.

2. කඨිනං ජානිතබ්බං යනු: මේ 'කඨින' යයි (යම් රූපාදි ධර්ම කෙනකුන් ඇති කල්හි) ඒ රූප ධර්මයන්ගේ ම සඞ්ග්‍රහයෙක් සමවායයෙක් නාමයෙක් නාම කර්මයෙක් නාමධෙයයෙක් නිරුක්තියෙක් ව්‍යඤ්ජනයෙක් අභිලාපයෙක් වේ ද එය යි.

3. කඨිනස්ස අත්ථාරමාසො ජානිතබ්බො යනු: වස්සාන සෘතුව පිළිබඳ පශ්චිම මාසය දතයුතු යි.

4. කඨිනස්ස අත්ථාරවිපත්ති ජානිතබ්බා යනු: සූවිසි අයුරෙකින් කඨිනත්ථාරවිපත්තිය දතයුතු යි.

5. කඨිනස්ස අත්ථාර සම්පත්ති ජානිතබ්බා යනු: සතළොස් අයුරෙකින් කඨිනත්ථාර සම්පත්තිය දතයුතු යි.

6. නිමිත්තකම්මං ජානිතබ්බන්ති: නිමිත්තකම්මං කරොති ‘ඉමිනා දුස්සෙන කඨිනං අත්ථරිස්සාමී’ති.

7. පරිකථා ජානිතබ්බාති: පරිකථං කරොති ‘ඉමාය පරිකථාය කඨිනදුස්සං නිබ්බත්තෙස්සාමී’ති.

8. කුක්කුකතං ජානිතබ්බන්ති: අනාදියදානං ජානිතබ්බං.

9. සන්නිධි ජානිතබ්බාති: ද්වෙ සන්නිධියො ජානිතබ්බා: කරණසන්නිධි ච නිචයසන්නිධි ච.

10. නිස්සග්ගියං ජානිතබ්බන්ති: කරීයමානෙ අරුණං උද්ධීයති.[1]

11 කඨිනත්ථාරෙ ජානිතබ්බොති: සචෙ සඞ්ඝස්ස කඨිනදුස්සං උප්පන්නං හොති; සඞ්ඝෙන කථං පටිපජ්ජිතබ්බං, අත්ථාරකෙන කථං පටිපජ්ජිතබ්බං, අනුමොදකෙන කථං පටිපජ්ජිතබ්බං:

12. සඞ්ඝෙන ඤත්තිදුතියකම්මෙන කඨිනත්ථාරකස්ස භික්ඛුනො දාතබ්බං. තෙන කඨිනත්ථාරකෙන භික්ඛුනා තදහෙව ධොවිත්වා විමජ්ජිත්වා විචාරෙත්වා ඡින්දිත්වා සිබ්බෙත්වා රජිත්වා කප්පං කත්වා කඨිනං අත්ථරිතබ්බං. සචෙ සඞ්ඝාටියා කඨිනං අත්ථරිතුකාමො හොති, පොරාණිකා සඞ්ඝාටි පච්චුද්ධරිතබ්බා, නවා සඞ්ඝාටි අධිට්ඨාතබ්බා. “ඉමාය සඞ්ඝාටියා කඨිනං අත්ථරාමී”ති වාචා භින්දිතබ්බා. සචෙ උත්තරාසඞ්ගෙන කඨිනං අත්ථරිතුකාමො හොති, පොරාණකො උත්තරාසඞ්ගො පච්චුද්ධරිතබ්බො, නවො උත්තරාසඞ්ගො අධිට්ඨාතබ්බො, “ඉමිනා උත්තරාසඞ්ගෙන කඨිනං අත්ථරාමී”ති වාචා භින්දිතබ්බා. සචෙ අන්තරවාසකෙන කඨිනං අත්ථරිතුකාමො හොති, පොරාණකො අන්තරවාසකො පච්චුද්ධරිතබ්බො, නවො අන්තරවාසකො අධිට්ඨාතබ්බො, “ඉමිනා අන්තරවාසකෙන කඨිනං අත්ථරාමී”ති වාචා භින්දිතබ්බා.

13. තෙන කඨිනත්ථාරකෙන භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අත්ථතං භන්තෙ සඞ්ඝස්ස කඨිනං ධම්මිකො කඨිනත්ථාරො, අනුමොදථා”ති. තෙහි අනුමොදකෙහි භික්ඛූහි එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අත්ථතං ආවුසො සඞ්ඝස්ස කඨිනං, ධම්මිකො කඨිනත්ථාරො, අනුමොදාමා”ති

14. තෙන කඨිනත්ථාරකෙන භික්ඛුනා සම්බහුලෙ භික්ඛූ උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අත්ථතං භන්තෙ සඞ්ඝස්ස කඨිනං. ධම්මිකො කඨිනත්ථාරො, අනුමොදථා”ති. තෙහි අනුමොදකෙහි භික්ඛූහි එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: “අත්ථතං ආවුසො සඞ්ඝස්ස කඨිනං, ධම්මිකො කඨිනත්ථාරො, අනුමොදාමා”ති.

1. උට්ඨහති - මජසං.

6. නිමිත්ත කම්මං ජානිතබ්බං යනු: 'මේ වස්ත්‍රයෙන් කඨිනය අතුරන්නෙමි'යි නිමිති කෙරෙයි.

7. පරිකථා ජානිතබ්බා යනු: 'මේ පරිකථාවෙන් කඨින වස්ත්‍රයක් උපදවා ගන්නෙමි'යි පරිකථාව කෙරෙයි.

8. කුක්කුකතං ජානිතබ්බං යනු: තමාට ගැන්මට නො දුන් බව දතයුතු යි.

9. සන්නිධි ජානිතබ්බා යනු: (එදින ම පරිකර්ම නිම නො කොට තබා නැවැත කිරීම නම් වූ) කරණ සන්නිධි යැ (කඨින වස්ත්‍රය ලැබූ දින හැර පසු ද පමුණුවාලීම නම් වූ) නිචය සන්නිධි යැ යි දෙවැදෑරුම් සන්නිධිය දතයුතු යි.

10. නිස්සග්ගියං ජානිතබ්බං යනු: පරිකර්ම කරණු ලබන කල්හි අරුණ නැගීම වෙයි.

11. කඨිනත්ථාරො ජානිතබ්බො යනු: ඉදින් සඞ්ඝයාට කඨින වස්ත්‍රයෙක් උපන්නේ නම් (එකල්හි) සඞ්ඝයා විසින් කෙසේ පිළිපැදියයුතු ද, අතුරන්නහු විසින් කෙසේ පිළිපැදියයුතු ද, අනුමෝදන් වන්නහු විසින් කෙසේ පිළිපැදියයුතු ද යත්:

12. සඞ්ඝයා විසින් ඤත්තිදුතිය කර්මයෙන් කඨිනත්ථාරක මහණහට දියයුතු යැ' ඒ කඨිනත්ථාරක මහණහු විසින් එ දවස ම දෙවා පිරිමැද (රැළි හැර) කඩ අතු බෙද සිඳ, මසා පඩු පොවා කප්බිඳු තබා කඨිනය ඇතිරිය යුතු යි. ඉදින් සඟළ සිවුරෙන් කඨිනය අතුරණු කැමැත්තේ නම් (එකල්හි) පුරාණ සඞ්ඝාටිය පච්චුද්ධරණය කටයුතු යැ. නව සඞ්ඝාටිය අධිෂ්ඨාන කටයුතු යැ. "මේ සඞ්ඝාටියෙන් කඨිනය අතුරමි"යි වාග්භෙද කටයුතු යි. ඉදින් උත්තරාසඞ්ගයෙන් කඨිනය අතුරණු කැමැත්තේ නම් (එකල්හි) පුරාණ උත්තරාසඞ්ගය පච්චුද්ධරණය කටයුතු යැ, නව උත්තරාසඞ්ගය අධිෂ්ඨාන කටයුතු යැ. "මේ උත්තරාසඞ්ගයෙන් කඨිනය අතුරමි"යි වාග්භෙද කටයුතු යි. ඉදින් අන්තරවාසකයෙන් කඨිනය අතුරණු කැමැත්තේ නම් (එකල්හි) පුරාණ අන්තරවාසකය පච්චුද්ධරණය කටයුතු යි. නව අන්තරවාසකය අධිෂ්ඨාන කටයුතු යැ, "මේ අන්තරවාසකයෙන් කඨිනය අතුරමි"යි වාග්භෙද කටයුතු වේ.

13. ඒ කඨිනත්ථාරක මහණහු විසින් සඞ්ඝයා වෙත එළඹ උත්තරාසඞ්ගය එකස් කොට ඇදිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ, "වහන්ස, සඞ්ඝයාගේ කඨිනය (මවිසින්) අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි, (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වුව මැනවැ"යි. ඒ කඨිනානිසංසය අනුමෝදන් වන භික්ෂූන් විසින් උත්තරාසඞ්ගය එකස් කොට ඇදිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ, "ඇවැත්නි, සඞ්ඝයාගේ කඨිනය තොප විසින් අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි, (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වමු"යි.

14. ඒ කඨිනත්ථාරක මහණහු විසින් බොහෝ භික්ෂූන් වෙත එළඹ උත්තරාසඞ්ගය එකස් කොට ඇදිලි බැඳ මෙසේ කියයුතු යැ. "වහන්ස, සඞ්ඝයාගේ කඨිනය (මවිසින්) අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි, (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වුව මැනවැ යි. ඒ කඨිනානිසංසය අනුමෝදන් වන භික්ෂූන් විසින් උත්තරාසඞ්ගය එකස් කොට ඇදිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ. "ඇවැත්නි, සඞ්ඝයාගේ කඨිනය තොප විසින් අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වමු"යි.

15. තෙන කඨිනත්ථාරකෙන භික්ඛුනා එකං භික්ඛුං උපසඞ්කමිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අත්ථතං ආවුසො සඞ්ඝස්ස කඨිනං, ධම්මිකො කඨිනත්ථාරො, අනුමොදාහී"ති. තෙන අනුමොදකෙන භික්ඛුනා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිං පග්ගහෙත්වා එවමස්ස වචනීයො: "අත්ථතං ආවුසො සඞ්ඝස්ස කඨිනං, ධම්මිකො කඨිනත්ථාරො අනුමොදාමී"ති.

සඞ්ඝො කඨිනං අත්ථරති, ගණො කඨිනං අත්ථරති, පුග්ගලො කඨිනං අත්ථරතීති: න සඞ්ඝො කඨිනං අත්ථරති, න ගණො කඨිනං අත්ථරති, පුග්ගලො කඨිනං අත්ථරති. හඤ්චි න සඞ්ඝො කඨිනං අත්ථරති, න ගණො කඨිනං අත්ථරති, පුග්ගලො කඨිනං අත්ථරති: සඞ්ඝස්ස අනත්ථතං හොති කඨිනං, ගණස්ස අනත්ථතං හොති කඨිනං, පුග්ගලස්ස අත්ථතං හොති කඨිනං.

සඞ්ඝො පාතිමොක්ඛං උද්දිසති, ගණො පතිමොක්ඛං උද්දිසති, පුග්ගලො පාතිමොක්ඛං උද්දිසතීති; න සඞ්ඝො පාතිමොක්ඛං උද්දිසති න ගණො පාතිමොක්ඛං උද්දිසති, පුග්ගලො පාතිමොක්ඛං උද්දිසති: හඤ්චි න සඞ්ඝො පාතිමොක්ඛං උද්දිසති, න ගණො පාතිමොක්ඛං උද්දිසති, පුග්ගලො පාතිමොක්ඛං උද්දිසති: සඞ්ඝස්ස අනුද්දිට්ඨං හොති පාතිමොක්ඛං, ගණස්ස අනුද්දිට්ඨං හොති පාතිමොක්ඛං, පුග්ගලස්ස උද්දිට්ඨං හොති පාතිමොක්ඛං, සඞ්ඝස්ස සාමග්ගියා ගණස්ස සාමග්ගියා පුග්ගලස්ස උද්දෙසා සඞ්ඝස්ස උද්දිට්ඨං හොති පාතිමොක්ඛං, ගණස්ස උද්දිට්ඨං හොති පාතිමොක්ඛං, පුග්ගලස්ස උද්දිට්ඨං හොති පාතිමොක්ඛං.

එවමෙව න සඞ්ඝො කඨිනං අත්ථරති, න ගණො කඨිනං අත්ථරති, පුග්ගලො කඨිනං අත්ථරති, සඞ්ඝස්ස අනුමොදනාය ගණස්ස අනුමොදනාය පුග්ගලස්ස අත්ථාරා සඞ්ඝස්ස අත්ථතං හොති කඨිනං, ගණස්ස අත්ථතං හොති කඨිනං, පුග්ගලස්ස අත්ථතං හොති කඨිනන්ති.

1. පක්කමනන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා.
එතඤ්ච තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති:

2. පක්කමනන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතඤ්ච තාහං විස්සජ්ජිස්සං චීවරපලිබොධො පඨමං ඡිජ්ජති;
තස්ස සහ බහිසීමගමනා ආවාසපලිබොධො ඡිජ්ජති.

3. නිට්ඨානන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතඤ්ච තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති;

4. නිට්ඨානන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතඤ්ච තාහං විස්සජ්ජිස්සං ආවාසපලිබොධො පඨමං ඡිජ්ජති;
චීවරෙ නිට්ඨිතෙ චීවරපලිබොධො ඡිජ්ජති.

5. සන්නිට්ඨානන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතඤ්ච තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති:

15. ඒ කඨිනත්ථාරක මහණහු විසින් එක් මහණක්හු වෙත එළඹ උත්තරාසඞ්ගය එකස් කොට ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ. "ඇවැත්නි, සඞ්ඝයාගේ කඨිනය (ම විසින්) අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි, (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වුව මැනැවැ "යි. ඒ අනුමෝදන් වන මහණහු විසින් උත්තරාසඞ්ගය එකස් කොට ඇඳිලි බැඳ මෙසේ කියයුතු වන්නේ යැ. "ඇවැත්නි, සඞ්ඝයාගේ කඨිනය තොප විසින් අතුරණ ලද යැ, කඨිනත්ථාරය ධාර්මික වෙයි, (ඒ කඨිනානිසංසය) අනුමෝදන් වෙමි "යි.

සඞ්ඝයා කඨිනය අතුරා ද, ගණයා කඨිනය අතුරා ද, පුද්ගල කඨිනය අතුරා ද යත් : සඞ්ඝයා කඨිනය නො අතුරයි, ගණයා කඨිනය නො අතුරයි, පුද්ගල කඨිනය අතුරයි. ඉදින් සඞ්ඝයා කඨිනය නො අතුරා නම්, ගණයා කඨිනය නො අතුරා නම් පුද්ගල කඨිනය අතුරා නම් සඞ්ඝයා විසින් කඨිනය නො අතුරණ ලද වෙයි, ගණයා විසින් කඨිනය නො අතුරණ ලද වෙයි, පුද්ගලයා විසින් කඨිනය අතුරණ ලද වේ.

සඞ්ඝයා පාමොක් උදෙසා ද, ගණයා පාමොක් උදෙසා ද, පුද්ගල පාමොක් උදෙසා ද යත් : සඞ්ඝයා පාමොක් නො උදෙසයි, ගණයා පාමොක් නො උදෙසයි, පුද්ගල පාමොක් උදෙසයි. ඉදින් සඞ්ඝයා පාමොක් නො උදෙසා නම් ගණයා පාමොක් නො උදෙසා නම් පුද්ගල පාමොක් උදෙසා නම් සඞ්ඝයා විසින් පාමොක් නො උදෙසන ලද වෙයි, ගණයා විසින් පාමොක් නො උදෙසන ලද වෙයි, පුද්ගලයා විසින් පාමොක් උදෙසන ලද වේ. සඞ්ඝයාගේ සමගියෙන් ගණයාගේ සමගියෙන් පුද්ගලයාගේ (පාමොක්) උදෙසීමෙන් සඞ්ඝයා විසින් පාමොක් උදෙසන ලද වෙයි, ගණයා විසින් පාමොක් උදෙසන ලද වෙයි, පුද්ගලයා විසින් පාමොක් උදෙසන ලද වේ.

එසෙයින් ම සඞ්ඝයා කඨිනය නො අතුරයි, ගණයා කඨිනය නො අතුරයි, පුද්ගල කඨිනය අතුරයි. සඞ්ඝයාගේ අනුමොදනයෙන් ගණයාගේ අනුමොදනයෙන් පුද්ගලයාගේ ඇතිරීමෙන් සඞ්ඝයා විසින් කඨිනය අතුරණ ලද වෙයි, ගණයා විසින් කඨිනය අතුරණ ලද වෙයි, පුද්ගලයා විසින් කඨිනය අතුරණ ලද වේ.

1. අනපේක්ෂිත වැ ආවාසයෙන් නික්ම යැම කෙළවර කොට සිටින පක්කමනන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි තෙල කරුණ ද මම ඔබ විචාරමි.

2. පක්කමනන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. මම තෙල කරුණ තොපට විසඳා කියමි. (එහි) චීවර පළිබොධය පළමු වැ සිඳෙයි, ඔහු සීමාවෙන් බැහැර යන්නා හා මැ ආවාස පළිබොධය සිඳේ.

3. (සිවුර කොට නිමවීම කෙළවර කොට සිටි) නිට්ඨානන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍ය බන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

4. නිට්ඨානන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) මම තෙල කරුණ තොපට විසඳා කියමි. (එහි) ආවාස පළිබොධය පළමු වැ සිඳෙයි, සිවුර කොට නිමි කල්හි චීවර පළිබොධය සිඳේ.

5. (සිවුරත් නො කරමි ආවාසයටත් නො යමි'යි සනිටුහන් කිරීම කෙළවර කොට සිටි) සන්නිට්ඨානන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

6. සන්නිට්ඨානන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං ද්වෙ පලිබොධා අපුබ්බං
අචරිමං ඡිජ්ජන්ති.

7. නාසනන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති :

8. නාසනන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං ආවාසපලිබොධො පඨමං ඡිජ්ජති ;
චීවරෙ නට්ඨෙ චීවරපලිබොධො ඡිජ්ජති.

9. සවණන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති.

10. සවණන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං චීවරපලිබොධො පඨමං ඡිජ්ජති :
තස්ස සහ සවණෙන ආවාසපලිබොධො ඡිජ්ජති.

11. ආසාවච්ඡෙදිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති :

12. ආසාවච්ඡෙදිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං ආවාසපලිබොධො පඨමං ඡිජ්ජති,
චීවරාසාය උපච්ඡින්නාය චීවරපලිබොධො ඡිජ්ජති.

13. සීමාතික්කන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති :

14. සීමාතික්කන්තිකො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං චීවරපලිබොධො පඨමං ඡිජ්ජති :
තස්ස බහිසීමගතස්ස ආවාසපලිබොධො ඡිජ්ජති.

15. සහුබ්භාරො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං පුච්ඡාමි කතමො පලිබොධො පඨමං ඡිජ්ජති :

16. සහුබ්භාරො කඨිනුබ්භාරො වුත්තො ආදිච්චබන්ධුනා,
එතං තාහං විස්සජ්ජිස්සං ද්වෙ පලිබොධා අපුබ්බං
අචරිමං ඡිජ්ජන්තීති

17. කති කඨිනුබ්භාරා සඞ්ඝාධීනා, කති කඨිනුබ්භාරා පුග්ගලාධීනා, කති කඨිනුබ්භාරා නෙව සඞ්ඝාධීනා න පුග්ගලාධීනා : එකො කඨිනුබ්භාරො සඞ්ඝාධීනො : අන්තරුබ්භාරො. චත්තාරො කඨිනුබ්භාරා පුග්ගලාධීනා : පක්කමනන්තිකො නිට්ඨානන්තිකො සන්නිට්ඨානන්තිකො සීමාතික්කන්තිකො. චත්තාරො කඨිනුබ්භාරා නෙව සඞ්ඝාධීනා න පුග්ගලාධීනා, නාසනන්තිකො සවණන්තිකො ආසාවච්ඡෙදිකො සහුබ්භාරො.

6. සන්නිට්ඨානන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. තෙල කරුණ මම තොපට විසඳා කියමි: (එහි) චීවර යැ ආවාස යැ යි උභය පළිබොධයෝ පෙර පසු නො වැ එකවිට මැ සිඳෙත්.

7. (සිවුර නැසීම කෙළවර කොට ඇති) නාසනන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍ය බන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. එහි කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

8. නාසනන්තිකකඨිනුද්ධාරය සූර්යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. තෙල කරුණ මම තොපට විසඳා කියමි : එහි ආවාස පළිබොධය පළමු වැ සිඳෙයි, සිවුර නට කල්හි චීවර පළිබොධය සිඳේ.

9. (විහාරයෙහි කඨිනුද්ධාරය කරණ ලදැයි ඇසීම කෙළවර කොට ඇති) සවනන්තික කඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළි බොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

10. සවනන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. තෙල කරුණ ද මම තොපට විසඳා කියමි : (එහි) චීවර පළිබොධය පළමු වැ සිඳෙයි. ඔහු එ පවත් අසන්නා හා මැ ආවාස පළිබොධය සිඳේ.

11. (සිවුරු ලැබෙයි යන ආසාව සිඳීමෙන් අනුසස් සිඳීම කෙළවර කොට ඇති) ආසාවච්ඡෙදිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

12. ආසාවච්ඡෙදිකකඨිනුද්ධාරය සූර්යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ, තෙල කරුණ ද මම තොපට විසඳා කියමි : (එහි) ආවාස පළිබොධය පළමු වැ සිඳෙයි, සිවුර පිළිබඳ ආසාව සිඳුනු කල්හි චීවර පළිබොධය සිඳේ.

13. (සීමාතික්‍රමණය කෙළවර කොට ඇති) සීමාතික්කන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍ය බන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමු වැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

14. සීමාතික්කන්තිකකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. තෙල කරුණ ද මම තොපට විසඳා කියමි : එහි චීවර පළිබොධය පළමු වැ සිඳෙයි, සීමායෙන් බැහැර ගිය ඔහුට ආවාස පළිබොධය සිඳේ.

15. (උබ්භාර සහිත වූ) සහුබ්භාරකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. (එහි) කවර පළිබොධයෙක් පළමුවැ සිඳේ දැයි මම තෙල කරුණ ද ඔබ විචාරමි.

16. සහුබ්භාරකඨිනුද්ධාරය සූර්‍ය්‍යබන්ධූන් විසින් වදාරණ ලද්දේ යැ. මම තෙල කරුණ ද තොපට විසඳා කියමි. (එහි) චීවර-ආවාසපළිබොධද්වය පෙර පසු නො වැ එකවර සිඳේ.

17. කෙතෙක් කඨිනුද්ධාරයෝ සඞ්ඝයා අයත් ද, කෙතෙක් කඨිනුද්ධාරයෝ පුද්ගලයා අයත් ද, කෙතෙක් කඨිනුද්ධාරයෝ නොම සඞ්ඝයා අයත් ද, නොද පුද්ගලයා අයත් ද යත් : එක් මැ අන්තරුබ්භාරකඨිනුද්ධාරය සඞ්ඝයා අයත් වෙයි. පක්කමනන්තික-නිට්ඨානන්තික-සන්නිට්ඨානන්තික-සීමාතික්කන්තික යැ යන සිවු කඨිනුද්ධාරයෝ පුද්ගලයා අයත් වෙති. නාසනන්තික-සවනන්තික-ආසාවච්ඡෙදික-සහුබ්භාර යැ යන සිවු කඨිනුද්ධාරයෝ නොම සඞ්ඝයා අයත් වෙති. නොද පුද්ගලයා අයත් වෙත්.

18. කති කඨිනුද්ධාරා අන්තොසීමාය උද්ධරීයන්ති, කති කඨිනුද්ධාරා බහිසීමාය උද්ධරීයන්ති, කති කඨිනුද්ධාරා සියා අන්තොසීමාය උද්ධරීයන්ති, සියා බහිසීමාය උද්ධරීයන්ති: ද්වෙ කඨිනුද්ධාරා අන්තොසීමාය උද්ධරීයන්ති: අන්තරුබ්භාරො සහුබ්භාරො. තයො කඨිනුද්ධාරා බහිසීමාය උද්ධරීයන්ති: පක්කමනන්තිකො සවණන්තිකො සීමාතික්කන්තිකො. චත්තාරො කඨිනුද්ධාරා සියා අන්තොසීමාය උද්ධරීයන්ති, සියා බහිසීමාය උද්ධරීයන්ති: නිට්ඨානන්තිකො සන්නිට්ඨානන්තිකො සවණන්තිකො ආසාවච්ඡෙදිකො.

19. කති කඨිනුද්ධාරා[1] එකුප්පාදා, එකනිරොධා, කති කඨිනුද්ධාරා එකුප්පාදා, නානානිරොධා: ද්වෙ කඨිනුද්ධාරා එකුප්පාදා එකනිරොධා: අන්තරුබ්භාරො සහුබ්භාරො. අවසෙසා කඨිනුද්ධාරා එකුප්පාදා නානානිරොධාති.

### කඨිනභෙදො[2] නිට්ඨිතො

---

තස්සුද්දානං:

1. කස්ස කින්ති පණ්ණරස ධම්මා නිදානහෙතු ච,
පච්චය සංගහ මූලා ආදි ච අට්ඨාර පුග්ගලා.[3]

2. භෙදා තිණ්ණං[4] තයො ජානිතබ්බං අට්ඨාරං උද්දෙසෙන ච,
පළිබොධාධීනා සීමාය උප්පාදනිරොධෙන චාති.

---

1. කථිනුද්ධාරා - මජ්සං,
2. කථිනභෙදො - මජ්සං, කාඨිනභෙදං - සයා,
3. අට්ඨාරපුග්ගලා - සීමු.
4. තිණ්ණං තයො - මජ්සං.

Free Distribution www.aathaapi.org

18. කෙතෙක් කඨිනුද්ධාරයෝ (වස්විසූ) සීමාව තුළ උද්ධරණය කරණු ලැබෙද් ද, කෙතෙක් කඨිනුද්ධාරයෝ සීමායෙන් බැහැර උද්ධරණය කරණු ලැබෙද් ද, කෙතෙක් කඨිනුද්ධාරයෝ කිසි විටෙක ඇතුළු සීමායෙහි උද්ධරණය කරණු ලැබෙද් ද, කිසිවිටෙක සීමාවෙන් බැහැර උද්ධරණය කරණු ලැබෙද් ද යත් : අන්තරුබ්භාර යැ-සහුබ්භාර යැ යන කඨිනුද්ධාරයෝ දෙදෙන සීමාව තුළ උද්ධරණය කරණු ලැබෙති. පක්කමනන්තිකයැ සවනන්තික යැ-සීමාතික්කන්තික යැ යන කඨිනුද්ධාරයෝ තිදෙන සීමාවෙන් බැහැර උද්ධරණය කරණු ලැබෙති. නිට්ඨානන්තික යැ සන්නිට්ඨානන්තික යැ-නාසනන්තික යැ-ආසාවච්ඡෙදික යැ යන කඨිනුද්ධාරයෝ සිවු දෙන කිසි විටෙක සීමාව තුළ උද්ධරණය කරණු ලැබෙති, කිසිවිටෙක සීමාවෙන් බැහැර උද්ධරණය කරණු ලැබෙත්.

19. කෙතෙක් කඨිනුද්ධාරයෝ එක් වැ උපන්නාහු එක් වැ නිරුද්ධ වෙත් ද, කෙතෙක් කඨිනුද්ධාරයෝ එක් වැ උපදනාහු වෙන් වැ නිරුද්ධ වෙත් ද යත් : අන්තරුබ්භාර යැ, සහුබ්භාර යැ යන කඨිනුද්ධාරයෝ දෙදෙන එක් වැ උපදනාහු එක් වැ නිරුද්ධ වෙති. සෙසු කඨිනුද්ධාරයෝ එක් වැ උපදනාහු වෙන් වැ නිරුද්ධ වෙත්.

**කඨිනභෙදය නිමි.**

---

එහි නාමාවලිය :

1. කස්ස යැ, කින්ති යැ, පණ්ණරසධම්ම යැ, නිදාන යැ, හෙතු යැ, පච්චය යැ, සඞ්ගහමූල යැ ආදි යැ, අත්ථාරපුග්ගල යැ,

2. තිණ්ණං යැ, තයො යැ, ජානිතබ්බ යැ, අත්ථාර යැ, උද්දෙසය සමග පළිබොධ යැ, අධීන යැ, එකුප්පාද-එකනිරෙධාය සමග සීමා යැ යි.

---

# උපාලි පඤ්චකං

## 1. අනිස්සිත වග්ගො

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො ආයස්මා උපාලි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා උපාලි භගවන්තං එතදවොච: "කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බ"න්ති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං, කතමෙහි පඤ්චහි: උපොසථං න ජානාති, උපොසථකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං, කතමෙහි පඤ්චහි: උපොසථං ජානාති, උපොසථකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං.

2 අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං. කතමෙහි පඤ්චහි: පවාරණං න ජානාති, පවාරණකම්මං න ජානාති, පාතිමොක්ඛං න ජානාති, පාතිමොක්ඛුද්දෙසං න ජානාති, ඌනපඤ්චවස්සො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං. කතමෙහි පඤ්චහි: පවාරණං ජානාති, පවාරණකම්මං ජානාති, පාතිමොක්ඛං ජානාති, පාතිමොක්ඛුද්දෙසං ජානාති. පඤ්චවස්සො වා හොති අතිරෙකපඤ්චවස්සො වා. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං.

3. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, ඌනපඤ්චවස්සො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං නානිස්සිතෙන වත්ථබ්බං.

# උපාලිපඤ්චකය

## 1. අනිස්සිතවග්ගය

1. එ සමයෙහි භාග්‍යවත් බුදුරජානන් වහන්සේ සැවැත් නුවර ජෙතවන නම් වූ අනේපිඬු සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක. එ කල්හි ආයුෂ්මත් උපාලි තෙරණුවෝ, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත් පසෙක හුන්හ. එකත් පසෙක හුන් ආයුෂ්මත් උපාලි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කළහ. "වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතුද "යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතුයි, කවර පසෙකින් ද යත්: උපොසථය නො දනියි, උපොසථ කර්මය නො දනියි, ප්‍රාතිමොක්ෂය නො දනියි, පාමොක් උදෙසීම නො දනියි, උනු පස් වස් ඇත්තේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතු යි. කවර පසෙකින් ද යත්: උපොසථය දනියි, උපොසථ කර්මය දනියි, ප්‍රාතිමොක්ෂය දනියි, පාමොක් උදෙසීම දනියි, පස් වස් ඇත්තේ හෝ අයිරා පස් වස් ඇත්තේ හෝ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතු යි.

2. උපාලි, අනෙකුදු පසඟෙකින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතු යි, කවර පසෙකින් ද යත්: පවාරණය නො දනියි, පවාරණ කර්මය නො දනියි, ප්‍රාතිමොක්ෂය නො දනියි, පාමොක් උදෙසීම නො දනියි, උනු පස් වස් ඇත්තේ වේ. උපාලි, මේ පසඟින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතු යි.

උපාලි, පසඟෙකින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතුයි. කවර පසෙකින් ද යත්: පවාරණය දනියි, පවාරණ කර්මය දනියි, ප්‍රාති-මොක්ෂය දනියි, පාමොක් උදෙසීම දනියි, පස් වස් ඇත්තේ හෝ අයිරා පස් වස් ඇත්තේ හෝ වේ. උපාලි, මේ පසඟින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතු යි.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතු යි. කවර පසෙකින් ද යත්: ඇවැත් නො ඇවැත් නො දනියි, ලුහු ගුරු ඇවැත් නො දනියි, සාවසෙස අනවසෙස ආපත්ති නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත් නො දනියි, උනු පස් වස් ඇත්තේ වේ. උපාලි, මේ පසඟින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ නො විසිය යුතු යි.



Free Distribution www.aathaapi.org

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති. සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, පඤ්චවස්සො වා හොති අතිරෙක පඤ්චවස්සො වා. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා යාවජීවං අනිස්සිතෙන වත්ථබ්බං.

4. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බොති.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, කතමෙහි පඤ්චහි: න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, උප්පන්නං අනභිරතිං වූපකාසෙතුං වා, වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනයතො විනොදෙතුං වා, විනොදාපෙතුං වා, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං, නිස්සයො දාතබ්බො, සාමණෙරො උපට්ඨාපෙතබ්බො. කතමෙහි පඤ්චහි: පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ගිලානං උපට්ඨාතුං වා උපට්ඨාපෙතුං වා, උප්පන්නං අනභිරතිං වූපකාසෙතුං වා වූපකාසාපෙතුං වා, උප්පන්නං කුක්කුච්චං ධම්මතො විනයතො විනොදෙතුං වා විනොදාපෙතුං වා, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

5 අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, කතමෙහි පඤ්චහි: න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අධිසීලෙ විනෙතුං, අධිචිත්තෙ විනෙතුං, අධිපඤ්ඤාය විනෙතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං, න නිස්සයො දාතබ්බො, න සාමණෙරො උපට්ඨාපෙතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං, නිස්සයො දාතබ්බො, සාමණෙරො උපට්ඨාපෙතබ්බො. කතමෙහි පඤ්චහි: පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අධිසීලෙ විනෙතුං, අධිචිත්තෙ විනෙතුං, අධිපඤ්ඤාය විනෙතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා උපසම්පාදෙතබ්බං. නිස්සයො දාතබ්බො. සාමණෙරො උපට්ඨාපෙතබ්බොති.

Free Distribution www.aathaapi.org

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතු යි, කවර පසෙකින් ද යත්: ඇවැත් නො ඇවැත් දනියි, ලුහු ගුරු ඇවැත් දනියි, සාවසෙස අනවසෙස ආපත්ති දනියි, තුළුල් නො තුළුල් ඇවැත් දනියි, පස් වස් ඇත්තේ හෝ අයිරා පස් වස් ඇත්තේ හෝ වේ. උපාලි, මේ පසඟින් යුත් මහණහු විසින් දිවිහිම් කොට නිස නො ගෙණ විසිය යුතු යි.

4. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුත් මහණහු විසින් උපසපන් නො කරවිය යුතු ද, නිස නොදිය යුතු ද, හෙරණකු ලවා උවටැන් නො කරවිය යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් උපසපන් නො කරවිය යුතු යැ. නිස නො දිය යුතු යැ. හෙරණකු ලවා උවැටන් නො කරවිය යුතු යැ. කවර පසෙකින් ද යත්: ගිලන් වූ අතැවැසියකුට හෝ සද්ධිවිහාරිකයකුට හෝ උවැටන් කරන්නට හෝ උවැටන් කරවන්නට හෝ, උපන් අනභිරතිය (උකටලී බව) බැහැර කරන්නට හෝ කරවන්නට හෝ උපන් කුකුස දහමින් විනයෙන් දුරු කරන්නට හෝ දුරු කරවන්නට හෝ, අභිධර්මයෙහි (නාම රූප පරිච්ඡේදයෙහි) හික්මවන්නට, අභිවිනයෙහි හික්මවන්නට ප්‍රතිබල නො වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් උපසපන් නො කරවියැ යුතු යැ. නිස නො දිය යුතු යැ. හෙරණකු ලවා උවැටන් නො කරවිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් උපසපන් කරවිය යුතු යැ, නිස දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි. කවර පසෙකින් ද යත්: ගිලන් වූ අතැවැසියකුට හෝ සද්ධිවිහාරිකයකුට හෝ උවැටන් කරන්නට හෝ උවැටන් කරවන්නට හෝ, උපන් උකටලී බව බැහැර කරන්නට හෝ කරවන්නට හෝ, උපන් කුකුස දහමින් විනයෙන් දුරු කරන්නට හෝ දුරු කරවන්නට හෝ, අභිධර්ම යෙහි හික්මවන්නට, සියලු විනය පිටකයෙහි හික්මවන්නට ප්‍රතිබල වෙයි. උපාලි, මේ පසඟින් යුත් මහණහු විසින් උපසපන් කරවිය යුතු යැ, නිස දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් උපසපන් නො කරවිය යුතු යැ, නිස නො දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් නො කරවිය යුතු යි. කවර පසෙකින් ද යත්: අතැවැසියකු හෝ සද්ධිවිහාරිකයකු හෝ ආභිසමාචාරික ශික්ෂාවන්හි (කඳුවත්හි) හික්මවන්නට, ආදිබ්‍රහ්මචරිය සඞ්ඛ්‍යාත සෙඛපණ්ණත්ති ශික්ෂාවන්හි (පරිජි සඟ වෙසෙස්හි) හික්මවන්නට, අධිශීලයෙහි (ප්‍රාතිමොක්ෂ ශීලයෙහි) හික්මවන්නට, අධිචිත්තයෙහි (ලෞකිකසමාධිභාවනාවෙහි) හික්මවන්නට. අධිප්‍රඥයෙහි (ලොකොත්තර මාර්ගභාවනාවෙහි) හික්මවන්නට ප්‍රතිබල නො වෙයි, උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් උපසපන් නො කරවිය යුතු යැ, නිස නො දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් නො කරවිය යුතු යැ.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් උපසපන් කරවිය යුතු යැ. නිස දිය යුතු යැ, හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි. කවර පසෙකින් ද යත්: අතැවැසියකු හෝ සද්ධිවිහාරිකයකු හෝ ආභිසමාචාරික ශික්ෂාවෙහි හික්මවන්නට ආදිබ්‍රහ්මචරියක ශික්ෂාවෙහි හික්මවන්නට, අධිශීලයෙහි හික්මවන්නට, අධිචිත්ත යෙහි හික්මවන්නට, අධිප්‍රඥවෙහි හික්මවන්නට ප්‍රතිබල වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුතු මහණහු විසින් උපසපන් කරවිය යුතු යි. නිස දිය යුතු යි. හෙරණකු ලවා උවැටන් කරවිය යුතු යි.

6. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බන්ති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච, ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

7. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: අධිසීලෙ සීලවිපන්නො හොති, අජ්ඣාචාරෙ ආචාරවිපන්නො හොති, අතිදිට්ඨියා දිට්ඨිවිපන්නො හොති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

8. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: කායිකෙන දවෙන සමන්නාගතො හොති, වාචසිකෙන දවෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන දවෙන සමන්නාගතො හොති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

9. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: කායිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, වාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

10. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: කායිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති, වාචසිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන උපඝාතිකෙන සමන්නාගතො හොති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

11. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: කායිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති, වාචසිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන මිච්ඡාජීවෙන සමන්නාගතො හොති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

12. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තිං ආපන්නො කම්මකතො උපසම්පාදෙති, නිස්සයං දෙති, සාමණෙරං උපට්ඨාපෙති, භික්ඛුනොවාදක සම්මුතිං සාදියති, සම්මතොපි භික්ඛුනියො ඔවදති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

Free Distribution www.aathaapi.org

6. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහට (තජ්ජනීයාදි සත්වැදෑරුම්) කර්මය කටයුතු ද?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි. කවර පසෙකින් ද යත්: ලජ්ජා නැත්තේ ද වෙයි, අඥාන ද වෙයි. උබෙවනීකම් කරණ ලද්දේ ද වෙයි. මිථ්‍යා දෘෂ්ටික ද වෙයි. නට දිවිපෙවෙත් ඇත්තේ ද වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි.

7. උපාලි, අනෙකුදු අංග පසෙකින් යුත් මහණ හට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි. කවර පසෙකින් ද යත්: අධිශීලයෙහි නටුවා වූ සිල් ඇත්තේ (පරිජි සඟවෙසෙස් ඇවැතුන්ට පැමිණියේ) වෙයි. අධ්‍යාචාරයෙහි නටුවා වූ ආචාර ඇත්තේ (සෙසු පස් ඇවැතුන්ට පැමිණියේ) වෙයි, සම්‍යග් දෘෂ්ටියෙහි නටදිටු ඇත්තේ වෙයි, මිසදිටු ද වෙයි, නටුවා වූ දිවි පෙවෙත් ඇත්තේද වේ, උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහට (තජ්ජනීයාදී) කර්ම කටයුතු යි.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි. කවර පසකින් ද යත්, (දු කෙළි ආදී) කායික ක්‍රීඩාවෙන් යුක්ත වූයේ වෙයි, (කට බෙර ගැසීම් ආදී) වාචසික ක්‍රීඩාවෙන් යුක්ත වූයේ වෙයි. (නැටීම් ගැයීම් ආදි) කායික වාචසික ක්‍රීඩාවෙන් යුක්ත වූයේ වෙයි, මිසදිටු වූයේත් වෙයි, නටුවා වූ දිවිපෙවෙත් ඇත්තේත් වේ. උපාලි මේ පසඟින් යුත් මහණහට කර්ම කටයුතු යි.

9. උපාලි අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහට කර්ම කටයුතු යි. කවර පසෙකින් ද යත්: කායික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි, වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි, කායික වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි, මිසදිටු වූයේත් වෙයි. නටුවා වූ දිවිපෙවෙත් ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි.

10. උපාලි අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහට කර්ම කටයුතු යි. කවර පසෙකින් ද යත්, කය පිළිබඳ ව්‍යතික්‍රමණයෙන් (සික පද කැඩීමෙන්) යුක්ත වූයේ වෙයි, වචනය පිළිබඳ ව්‍යතික්‍රමණයෙන් යුක්ත වූයේ වෙයි. කය වචනය පිළිබඳ ව්‍යතික්‍රමණයෙන් යුක්ත වූයේ වෙයි. මිසදිටු වූයේ වෙයි, නටුවා වූ දිවි පෙවෙත් ඇත්තේත් වෙයි, උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහට කර්ම කටයුතු යි.

11. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහට කර්ම කටයුතු යි, කවර පසෙකින් ද යත්: (හසුන් ගෙනයාම වෙදකම් ආදි) කය පිළිබඳ සදොස් ජීවිකායෙන් යුක්ත වූයේ වෙයි, (පණිවිඩ කීම් ආදි) වාචසික සදොස් ජීවිකායෙන් යුක්ත වූයේ වෙයි, (මෙකී) කායික වාචසික සදොස් ජීවිකාවෙන් යුක්ත වූයේ වෙයි, මිසදිටු වූයේත් වෙයි, නටුවා වූ දිවිපෙවෙත් ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි.

12. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි. කවර පසකින් ද යත්, ඇවැතට පැමිණියේ කර්ම කරන ලදුයේ උපසපන් කරවයි, නිස දෙයි, හෙරණකු ලවා උවටන් කරවයි, භික්ෂුණී අවවාද සම්මුතිය ඉවසයි, සම්මුතිය ලදුයේ නමුදු මෙහෙණන්ට අවවාද කෙරෙයි. උපාලි මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි.

13. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං කතමෙහි පඤ්චහි: යාය ආපත්තියා සඞ්ඝෙන කම්මං කතං හොති තං ආපත්තිං ආපජ්ජති, අඤ්ඤං වා තාදිසිකං, තතො වා පාපිට්ඨතරං, කම්මං ගරහති, කම්මිකෙ ගරහති, ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං.

14. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බං කතමෙහි පඤ්චහි: බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං කාතබ්බන්ති.

අනිස්සිතවග්ගො පඨමො

---

තස්සුද්දානං:

1. උපොසථං පවාරණං ආපත්ති ච ගිලානකං,
   ආභිසමාචාරලජ්ජී ච අධිසීලදවෙන ච.
2. අනාචාරං උපඝාති මිච්ඡා ආපත්තිමෙව ච,
   යාය ආපත්තියා බුද්ධස්ස පඨමො වග්ගසඞ්ගහොති.

---

## 2. න පටිප්පස්සම්භනවග්ගො

1. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බන්ති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තිං ආපන්නො කම්මකතො උපසම්පාදෙති, නිස්සයං දෙති, සාමණෙරං උපට්ඨාපෙති, භික්ඛුනොවාදක සම්මුතිං සාදියති, සම්මතොපි භික්ඛුනියො ඔවදති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

2. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං. කතමෙහි පඤ්චහි: යාය ආපත්තියා සඞ්ඝෙන කම්මං කතං හොති තං ආපත්තිං ආපජ්ජති, අඤ්ඤං වා තාදිසිකං, තතො වා පාපිට්ඨතරං, කම්මං ගරහති ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

3. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං. කතමෙහි පඤ්චහි: බුද්ධස්ස අවණ්ණං භාසති, ධම්මස්ස අවණ්ණං භාසති, සඞ්ඝස්ස අවණ්ණං භාසති, මිච්ඡාදිට්ඨිකො ච හොති, ආජීවවිපන්නො ච. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං.

Free Distribution www.aathaapi.org

13. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි. කවර පසෙකින් ද යත් : සඞ්ඝයා විසින් යම් ඇවැතෙකින් කර්මය කරන ලද්දේ වේ ද, ඒ ඇවැතට හෝ පැමිණෙයි, එබඳු වූ අනෙක් ඇවැතකට හෝ පැමිණෙයි, එයට වඩා ඉතා ලමු ඇවැතකට හෝ පැමිණෙයි, (විනය) කර්මයට ගර්හා කෙරෙයි, (විනය) කර්ම කළවුන්ට ගර්හා කෙරේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට කර්ම කටයුතු යි.

14. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහට කර්ම කටයුතු යි, කවර පසෙකින් ද යත් : බුදුන්ගේ අගුණ කියයි, ධර්මයේ අගුණ කියයි, සඞ්ඝයාගේ අගුණ කියයි, මිසදිටු වූයේත් වෙයි, නටුවා වූ දිවිපෙවෙත් ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට (තජ්ජනීයාදි) කර්ම කටයුතු යි.

**පළමුවන අනිස්සිත වර්ගය නිමි**

---

එහි නාමාවලිය :

1. උපෝසථ යැ, පවාරණ යැ, ආපත්ති යැ, ගිලාන යැ, අභිසමාචාර යැ, ලජ්ජී යැ, දවය සමඟ අධිශීල යැ.

2. අනාචාර යැ, උපඝාති යැ, මිච්ඡා යැ, ආපත්ති යැ, යාය ආපත්තියා යැ, බුද්ධස්ස යැ යි ප්‍රථම වර්ගයෙහි සංග්‍රහය වේ.

---

## 2. න පටිප්පස්සම්භන වර්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණක්හුගේ (විනය) කර්මය නො සන්හිඳුවියයුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණක්හුගේ (විනය) කර්මය නො සන්හිඳුවියයුතු ය. කවර පසෙකින් ද යත් : ඇවැතට පැමිණියේ (තජ්ජනීයාදි) කර්ම කරණ ලද්දේ උපසපන් කරවයි, නිස දෙයි, හෙරණකු ලවා උවැටන් කරවයි, භික්ඛුනොවාදක සම්මුතිය ඉවසයි, සම්මුතිය ලද්දේ නමුදු මෙහෙණන්ට ඔවා දේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහුගේ කර්මය නො සන්හිඳුවියයුතු යි.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණක්හුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි. කවර පසෙකින් ද යත් : සඞ්ඝයා විසින් යම් ඇවැතෙකින් කර්මය කරණ ලද නම් (නැවත) ඒ ඇවැතට පැමිණෙයි, එබඳු වූ අනෙක් ඇවැතකට හෝ පැමිණෙයි, එයට වඩා ඉතා ලමු ඇවැතකට හෝ පැමිණෙයි, කර්මයට ගර්හා කෙරෙයි. කර්මය කළවුන්ට ගර්හා කෙරේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණක්හුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි. කවර පසෙකින් ද යත් : බුදුන්ගේ අගුණ කියයි, ධර්මයෙහි අගුණ කියයි, සඞ්ඝයාගේ අගුණ කියයි, මිථ්‍යාදෘෂ්ටි ඇත්තේත් වෙයි, නටුවා වූ දිවිපෙවෙත් ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි.

4. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බං. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, ඔමද්දකාරකො ච හොති වත්තෙසු, සික්ඛාය ච න පරිපූරකාරී. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො කම්මං න පටිප්පස්සම්භෙතබ්බන්ති.

5. සඞ්ගාමාවචරෙන භන්තෙ, භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමන්තෙන කති ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා සඞ්ඝො උපසඞ්කමිතබ්බොති.

සඞ්ගාමාවචරෙන උපාලි, භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමන්තෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා සඞ්ඝො උපසඞ්කමිතබ්බො. කතමෙ පඤ්ච: සඞ්ගාමාවචරෙන උපාලි භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමන්තෙන නීචචිත්තෙන සඞ්ඝො උපසඞ්කමිතබ්බො රජොහරණ සමෙන චිත්තෙන, ආසනකුසලෙන භවිතබ්බං නිසජ්ජාකුසලෙන ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජන්තෙන නවෙ භික්ඛූ ආසනෙන අප්පටිබාහන්තෙන තථාරූපෙ ආසනෙ නිසීදිතබ්බං, අනානාකථිකෙන භවිතබ්බං අතිරච්ඡානකථිකෙන, සාමං වා ධම්මො භාසිතබ්බො පරො වා අජ්ඣෙසිතබ්බො අරියො වා තුණ්හීභාවො නාතිමඤ්ඤිතබ්බො, සචෙ උපාලි, සඞ්ඝො සමග්ගකරණීයානි කම්මානි කරොති, තත්‍ර චෙ උපාලි, භික්ඛුනො නක්ඛමති අපි දිට්ඨාවිකම්මං කත්වා උපෙතබ්බා සාමග්ගී. තං කිස්ස හෙතු: මාහං සඞ්ඝෙන නානත්තො අස්සන්ති. සඞ්ගාමාවචරෙන උපාලි, භික්ඛුනා සඞ්ඝං උපසඞ්කමන්තෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා සඞ්ඝො උපසඞ්කමිතබ්බොති.

6. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො චාති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති, බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො ච. කතමෙහි පඤ්චහි: උස්සිතමන්තී ච හොති, නිස්සිතජප්පී ච හොති න ච භාසානුසන්ධිකුසලො හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො ච.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනකන්තො ච හොති, බහුජනමනාපො ච බහුජනරුචිතො ච. කතමෙහි පඤ්චහි: න උස්සිතමන්තී ච හොති, න නිස්සිතජප්පී ච හොති, භාසානුසන්ධිකුසලො හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනකන්තො ච හොති. බහුජනමනාපො ච, බහුජනරුචිතො ච.

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණක්හුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි. කවර පසෙකින් ද යත් : ලජ්ජා නැත්තේත් වෙයි, අඥාන වූයේත් වෙයි, ප්‍රකෘතියෙහි පිහිටි භික්ෂුත්වය නැත්තේත් වෙයි. සිකපද මඩිමින් ක්‍රියා කරන්නේත් වෙයි. වත්හිද සිඛයෙහි ද සම්පූර්ණ කිරීම් නැත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහුගේ කර්මය නො සන්හිඳු වියයුතු යි.

5. වහන්ස, සඞ්ගාමාවචර (අධිකරණ විනිශ්චය පිණිස රැස් වූ සඞ්ඝයා වෙත එළඹෙන) මහණ විසින් කෙතෙක් කරුණු තම සිතෙහි එළවාගෙණ සඞ්ඝයා වෙත එළඹිය යුතු ද ?

උපාලි, සංග්‍රාමාවචර මහණ විසින් කරුණු පසක් තම සිතෙහි එළවා ගෙණ සඞ්ඝයා වෙත එළඹිය යුතු යි. කවර පසෙක් ද යත් : උපාලි, සඞ්ගාමාවචර මහණ විසින් පාපිස්නක් හා සම වූ නිහතමාන සිතින් යුතු වැ සඞ්ඝයා වෙත එළඹිය යුතු යැ. නිදොස් වැ හිඳීමෙහි දක්ෂවූවහු විසින් අසුනක් (තෝරා) ගැන්මෙහි සමත් වියයුතු යැ ස්ථවිර භික්ෂූන් නොගටමින් නවක භික්ෂූන් ආසනයෙන් බැහැර නොකරමින් (තමහට) සුදුසු අස්නෙකැ හින්ද යුතු යැ. තිරශ්චීන කථාවන් ගෙන් තොර වැ නානාවිධ අනර්ථකථා නොකරන්නකු වියයුතු යැ. තමා හෝ දහමක් දෙසිය යුතු යැ අනෙකකුට හෝ ආරාධනා කටයුතු යැ ආර්‍ය්‍ය නිශ්ශබ්දභාවය හෝ නොඉක්ම වියයුතු යි. උපාලි, ඉදින් සඞ්ඝ තෙමේ සමග වූවන් විසින් කටයුතු වූ (උපොසථාදි) කර්මයන් කෙරේ ද උපාලි, ඉදින් එහි දී (යම්කිසි) මහණක්හට එය රුචි නො වේ නම් ඇවැත් දෙසීමවත් කොට සමගිය එළවිය යුතු යි. ඊට හෙතු කවරේ ද මම සඞ්ඝයාගෙන් වෙනස් වූ වෙම් නො වන්නෙමි, කියායි. උපාලි සඞ්ගාමාවචර මහණ විසින් මේ කරුණු පස තම සිත්හි පිහිටුවා ගෙණ සඞ්ඝයා වෙත එළඹිය යුතු යි.

6. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර අධිකරණ විනිශ්චය කරන්නේ බොහෝදෙනාට අප්‍රියයෙක් වේ ද, බොහෝදෙනාගේ මන නොවඩන්නෙක් වේ ද, බොහෝදෙනාට රුචි නොවන්නෙක් වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර අධිකරණ විනිශ්චය කරන්නේ බොහෝදෙනාට අප්‍රියයෙක් වෙයි, බොහෝදෙනාගේ මන නොවඩන්නෙක් ද වෙයි, බොහෝදෙනාට රුචි නොවන්නෙක් ද වෙයි, කවර පසෙකින් ද යත් : තමා හුවා දක්වන කථා ඇත්තේත් වෙයි, අනුන් ඇසුරු කොට තමන් හුවා දක්වන කථා ඇත්තේත් වෙයි. කථානුසන්ධියෙහිත් විනිශ්චයානුසන්ධියෙහිත් දක්ෂ නො වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා කරන්නේ නො වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) නො කරවන්නේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට අප්‍රියයෙක් ද වෙයි. බොහෝ දෙනාගේ මන නොවඩන්නෙක් ද වෙයි, බොහෝදෙනාට රුචි නොවන්නෙක් ද වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට ප්‍රියයෙක් ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නෙක් ද වෙයි, බොහෝ දෙනාට රුචි වූවෙක් ද වෙයි. කවර පසෙකින් ද යත් : තමා හුවා දක්වන කථා නැත්තේ වෙයි. අනුන් ඇසුරු කොට තමා හුවා දක්වන කථා නැත්තේත් වෙයි. කථානුසන්ධියෙහිත් විනිශ්චයානුසන්ධියෙහිත් දක්ෂ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) කරවන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට ප්‍රියයෙක් ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නෙක් ද වෙයි, බොහෝ දෙනාට රුචි කරන්නෙක් ද වේ.

7. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජන-අරුචිතො ච. කතමෙහි පඤ්චහි: උස්සාදෙතා හොති, අපසාදෙතා හොති, අධම්මං ගණ්හාති, ධම්මං පටිබාහති, සම්ඵං ච බහුං භාසති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො ච.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනකන්තො ච හොති බහුජනමනාපො ච බහුජනරුචිතො ච. කතමෙහි පඤ්චහි: න උස්සාදෙතා ච හොති, න අපසාදෙතා හොති, ධම්මං ගණ්හාති, අධම්මං පටිබාහති, සම්ඵඤ්ච න බහුං භාසති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බහුජනකන්තො ච හොති බහුජනමනාපො ච බහුජනරුචිතො ච.

8. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො ච. කතමෙහි පඤ්චහි: පසය්හපවත්තා හොති, අනොකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, න යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනඅකන්තො ච හොති බහුජනඅමනාපො ච බහුජනඅරුචිතො ච.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනකන්තො ච හොති බහුජනමනාපො ච බහුජනරුචිතො ච. කතමෙහි පඤ්චහි: න පසය්හපවත්තා හොති, ඔකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු සඞ්ඝෙ වොහරන්තො බහුජනකන්තො ච හොති බහුජනමනාපො ච බහුජනරුචිතො චාති.

9. කති නු ඛො භන්තෙ, ආනිසංසා විනයපරියත්තියාති?

පඤ්චිමෙ උපාලි, ආනිසංසා විනයපරියත්තියා. කතමෙ පඤ්ච: අත්තනො සීලක්ඛන්ධො සුගුත්තො හොති සුරක්ඛිතො, කුක්කුච්චපකතානං පටිසරණං හොති, විසාරදො සඞ්ඝමජ්ඣෙ වොහරති, පච්චත්ථිකෙ සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගණ්හාති, සද්ධම්මට්ඨිතියා පටිපන්නො හොති. ඉමෙ ඛො උපාලි, පඤ්චානිසංසා විනයපරියත්තියාති.

න පටිප්පස්සම්භනවග්ගො දුතියො

7. උපාලි, අනෙකුදු අඞ්ග පසකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට අප්‍රියයෙක් ද වෙයි, බොහෝ දෙනාගේ මන නො වඩන්නෙක් ද වෙයි, බොහෝ දෙනාට අරුචි ද වෙයි. කවර පසෙකින් ද යත් : තම පක්ෂය හුවා දක්වන්නේ වෙයි, පර පක්ෂය හෙළා දක්වන්නේ වෙයි නො දැහැමි පක්ෂය ගණී, දැහැමි පක්ෂය දුරු කෙරෙයි, බොහෝ වැඩ නැති කථා කෙරෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට අප්‍රියයෙක් ද වෙයි, බොහෝ දෙනාගේ මන නො වඩන්නෙක් ද වෙයි, බොහෝ දෙනාට රුචි ද නො වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට ප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද වෙයි, බොහෝ දෙනාට රුචි ද වේ. කවර පසෙකින් ද යත් : තමා උසස් කොට කථා කරන්නේත් නො වෙයි, (අනුන්) පහත් කොට කථා කරන්නේත් නො වෙයි, දැහැමි පක්ෂය ගණී, නො දැහැමි පක්ෂය දුරු කෙරෙයි, බොහෝ වැඩ නැති කථා නො කරයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බොහෝ දෙනාට ප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද වෙයි, බොහෝ දෙනාට රුචි ද වේ.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට අප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන නො වඩන්නේ ද වෙයි, බොහෝ දෙනාට රුචි ද නො වේ. කවර පසෙකින් ද යත් : බලාත්කාරයෙන් කථා කරන්නේ වෙයි, අවසර නො ගෙණ කථා කරන්නේත් වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා නො කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) නො කරවන්නේ වෙයි, (තමාගේ) දෘෂ්ටිය වූ පරිද්දෙන් ප්‍රකාශ නො කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට අප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන නො වඩන්නේ ද වෙයි. බොහෝ දෙනාට රුචි ද නො වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට ප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද වෙයි, බොහෝ දෙනාට රුචි ද වේ. කවර පසෙකින් ද යත් : බලාත්කාරයෙන් කථා නොකරන්නේත් වෙයි. අවසර ගෙණ කථා කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) කරවන්නේ වෙයි, (තමාගේ) දෘෂ්ටිය වූ පරිද්දෙන් ප්‍රකාශ කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ සඞ්ඝයා අතර විනිශ්චය කරන්නේ බොහෝ දෙනාට ප්‍රිය ද වෙයි, බොහෝ දෙනාගේ මන වඩන්නේ ද වෙයි, බොහෝ දෙනාහට රුචි ද වේ.

9. වහන්ස, විනය හැදෑරීමෙහි අනුසස් කෙතෙක් ද ?

උපාලි, විනයහැදෑරීමෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙක් ද යත් : තමාගේ ශීලස්කන්ධය මනා වැ රක්නා ලද්දේ මනා වැ ගොපනය කරණ ලද්දේ වෙයි, කුකුසින් මඩනා ලද්දවුන්ට පිළිසරණ වෙයි. නිර්භීත වූයේ වෙයි, සඟ මැද ව්‍යවහාර කෙරෙයි, (තමහට පසමිතුරු යැ සසුනට පසමිතුරු යැ යන දෙවැදෑරුම්) පසමිතුරනට කරුණු සහිතව කීමෙන් මොනවට නිග්‍රහ කරන්නේ වෙයි, (ත්‍රිවිධ) ශාසනයාගේ චිරකල් පැවැත්ම පිණිස පිළිපන්නේ වේ. උපාලි, විනය හැදෑරීමෙහි මේ අනුසස් පසයි.

**දෙවන න පටිප්පසම්භන වර්ගය නිමි.**

---

තස්සුද්දානං:

1. ආපන්නො යාග වණ්ණඤ්ච අලජ්ජී සඞ්ගාමෙන ච,
උස්සිතා උස්සාදෙතා ච පඤ්චපරියන්තියාති.

පඨමයමකපඤ්ඤත්ති

---

## 3. වොහාරවග්ගො

1. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බන්ති?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං කතමෙහි පඤ්චහි: ආපත්තිං න ජානාති, ආපත්තිසමුට්ඨානං න ජානාති, ආපත්තියා පයොගං න ජානාති, ආපත්තියා වූපසමං න ජානාති, ආපත්තියා න විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං, කතමෙහි පඤ්චහි: ආපත්තිං ජානාති, ආපත්තිසමුට්ඨානං ජානාති. ආපත්තියා පයොගං ජානාති, ආපත්තියා වූපසමං ජානාති, ආපත්තියා විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

2. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං කතමෙහි පඤ්චහි: අධිකරණං න ජානාති, අධිකරණසමුට්ඨානං න ජානාති, අධිකරණස්ස පයොගං න ජානාති, අධිකරණස්ස වූපසමං න ජානාති, අධිකරණස්ස න විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: අධිකරණං ජානාති, අධිකරණසමුට්ඨානං ජානාති, අධිකරණස්ස පයොගං ජානාති, අධිකරණස්ස වූපසමං ජානාති, අධිකරණස්ස විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා, සඞ්ඝෙ වොහරිතබ්බං.

3. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: පක්ඛග්ග පවත්තා හොති, අනොකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා වොදෙතා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, න යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

එහි නාමාවලිය :

ආපන්න යැ යායවණ්ණ යැ අලජ්ජී යැ සඞ්ගාමාවචරය සමග උස්සිතා යැ උස්සාදෙතා යැ පසයහ යැ පරියත්ති යැ යි.

පළමුවන යමක පඤ්ඤත්තිය යි

---

## 3. වොහාරවග්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නොකටයුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : ඇවැත නො දනී, ඇවැත් නැගීම නො දනියි, ඇවැත පිළිබඳ කායවාග් ප්‍රයොගය නො දනියි, ඇවැත පිළිබඳ සන්හිඳීම නො දනියි, ඇවැත පිළිබඳ විනිශ්චයෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය කටයුතු යි, කවර පසෙකින් ද යත් : ඇවැත දනියි, ඇවැත් නැගීම දනියි, ඇවැත පිළිබඳ කාය වාග් ප්‍රයොගය දනියි, ඇවැත පිළිබඳ සන්හිඳීම දනියි, ඇවැත පිළිබඳ විනිශ්චයෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි, කවර පසෙකින යත් : අධිකරණය නො දනියි, අධිකරණ සමුට්ඨානය නො දනියි, අධිකරණය පිළිබඳ ප්‍රයොගය නො දනියි, අධිකරණය පිළිබඳ සන්හිඳීම නො දනියි, අධිකරණය විසඳීමෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : අධිකරණය දනියි, අධිකරණ සමුට්ඨානය දනියි, අධිකරණය පිළිබඳ ප්‍රයොගය දනියි, අධිකරණය පිළිබඳ සන්හිඳීම දනියි, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය නො කටයුතු යි, කවර පසෙකින යත් : මෙරමා ලාභෙළා කථා කරන්නේ වෙයි, අවසර නොගෙන කථා කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා නොකරන්නේ වෙයි. ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) නොකරන්නේ වෙයි. (ස්වකීය) දෘෂ්ටිය වූ පරිද්දෙන් ප්‍රකාශ නොකරන්නේ වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : න පසය්හ පවත්තා හොති, ඔකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

4 අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, සප්පටිකම්මං අප්පටිකම්මං ආපත්තිං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං ජානාති, සප්පටිකම්මං අප්පටිකම්මං ආපත්තිං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

5. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : කම්මං න ජානාති, කම්මස්ස කරණං න ජානාති, කම්මස්ස වත්ථුං න ජානාති, කම්මස්ස වත්තං න ජානාති, කම්මස්ස වූපසමං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : කම්මං ජානාති, කම්මස්ස කරණං ජානාති, කම්මස්ස වත්ථුං ජානාති, කම්මස්ස වත්තං ජානාති, කම්මස්ස වූපසමං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

6. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, පදපච්චාභට්ඨං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති, ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : ලාභෙලා කථා නො කරන්නේ වෙයි. අවසර ගෙණ කථා කරන්නේ වෙයි. ධර්මය වූ පරිද්දෙන්, විනය වූ පරිද්දෙන්, ඇවැත් වූ පරිද්දෙන් චොදනා කරන්නේ වෙයි. ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් (විනය කර්ම) කරවන්නේ වෙයි. දෘෂ්ටිය වූ පරිද්දෙන් ප්‍රකාශ කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : ඇවැත නො ඇවැත නො දනියි, ලුහු ගුරු ඇවැත නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත නො දනියි, ප්‍රතිකර්ම සහිත වූ ද ප්‍රතිකර්ම රහිත වූ ද ඇවැත නො දනියි, උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : ඇවැත නො ඇවැත දනියි, ලුහු ගුරු ඇවැත දනියි, සාවසෙස අනවසෙස ඇවැත දනියි, තුළුල් නො තුළුල් ඇවැත දනියි, ප්‍රතිකර්ම සහිත වූ ද ප්‍රතිකර්ම රහිත වූ ද ඇවැත දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය කටයුතු යි.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : කර්මය නො දනියි, කර්මය කිරීම නො දනියි, කර්මය පිළිබඳ වස්තුව නො දනියි, කර්මය පිළිබඳ වත නො දනියි, කර්මය පිළිබඳ සන්හිඳීම නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : කර්මය දනියි, කර්මය කිරීම දනියි, කර්මය පිළිබඳ වස්තුව දනියි, කර්මය පිළිබඳ වත දනියි, කර්මය පිළිබඳ සන්හිඳීම දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

6. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : වස්තුව නො දනියි, නිදානය නො දනියි, ප්‍රඥප්ති නො දනියි, පද පෙරළිය නො දනියි, ගැළපෙන වදන් මග නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කට යුතු යි. කවර පසෙකින් ද යත් : වස්තුව දනියි, නිදානය දනියි, ප්‍රඥප්තිය දනියි, පද පෙරළිය දනියි, ගැළපෙන වදන් මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

7. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අලජ්ජී ච හොති ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ලජ්ජී ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

8. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, හායාගතිං ගච්ඡති, අකුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, කුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

9 අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: ඤත්තිං න ජානාති, ඤත්තියා කරණං න ජානාති, ඤත්තියා අනුසාවණං න ජානාති, ඤත්තියා සමථං න ජානාති, ඤත්තියා වූපසමං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: ඤත්තිං ජානාති, ඤත්තියා කරණං ජානාති, ඤත්තියා අනුසාවණං ජානාති, ඤත්තියා සමථං ජානාති, ඤත්තියා වූපසමං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

10. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: සුත්තං න ජානාති, සුත්තානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච ඨානාඨානකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි: සුත්තං ජානාති. සුත්තානුලොමං ජානාති. විනයං ජානාති විනයානුලොමං ජානාති, ඨානාඨානකුසලො ච හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං.

7. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සංඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකි ා යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, ලජ්ජා නැත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි. මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, ලජ්ජා ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, විනයෙහි අදක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි. ද්වෙෂයෙන් අගතියට නො යෙයි. මොහයෙන් අගතියට නො යෙයි. බියෙන් අගතියට නො යෙයි. විනයෙහි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

9. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : ඤත්තිය නො දනියි, ඤත්තිකරණය නො දනියි, ඤත්තිය පිළිබඳ අනුසාවණය නො දනියි, ඤත්තිය පිළිබඳ ශමථය නො දනියි, ඤත්තිය පිළිබඳ සන්හිඳීම නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් වූ මහණහු විසින් සංඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : ඤත්තිය දනියි, ඤත්තිකරණය දනියි, ඤත්තිය පිළිබඳ අනුසාවණය දනියි, ඤත්තිය පිළිබඳ ශමථය දනියි, ඤත්තිය පිළිබඳ සන්හිඳීම දනී. උපාලි, මේ අඞ්ග පසික් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

10. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : සූත්‍රය නො දනියි, සූත්‍රානුලොමය නො දනියි, විනය නො දනියි, විනයානුලොමය නො දනියි, කරුණු නො කරුණු දෙක්හි දක්ෂ වූයේත් නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින යත් : සූත්‍රය දනී, සූත්‍රානුලොමය දනියි, විනය දනියි, විනයානුලොමය දනියි, කරුණු නො කරුණු දෙක්හි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

11. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : ධම්මං න ජානාති, ධම්මානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච පුබ්බාපරකුසලො හොති. ඉමෙහි බො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ න වොහරිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බං. කතමෙහි පඤ්චහි : ධම්මං ජානාති, ධම්මානුලොමං ජානාති, විනයං ජානාති, විනයානුලොමං ජානාති, පුබ්බාපරකුසලො ච හොති. ඉමෙහි බො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සඞ්ඝෙ වොහරිතබ්බන්ති.

වොහාරවග්ගො තතියො

---

තස්සුද්දානං :

ආපත්ති අධිකරණං පසය්හාපත්ති ජානතා.[1]
කම්මං වත්ථුං අලජ්ජී ච අකුසලො ච ඤත්තියා;
සුත්තං න ජානාති ධම්මං තතියො වග්ගසඞ්ගහොති.

---

## 4. දිට්ඨාවිකම්මවග්ගො

1. කති නු බො භන්තෙ, අධම්මිකා දිට්ඨාවිකම්මාති. ?

පඤ්චිමෙ උපාලි, අධම්මිකා දිට්ඨාවිකම්මා. කතමෙ පඤ්ච : අනාපත්තියා දිට්ඨිං ආවිකරොති, අදෙසනාගාමිනියා ආපත්තියා දිට්ඨිං ආවිකරොති, දෙසිතාය ආපත්තියා දිට්ඨිං ආවිකරොති, චතූහි පඤ්චහි දිට්ඨිං ආවිකරොති, මනොමානසෙන දිට්ඨිං ආවිකරොති. ඉමෙ බො උපාලි පඤ්ච අධම්මිකා දිට්ඨාවිකම්මා[1]

පඤ්චිමෙ උපාලි, ධම්මිකා දිට්ඨාවිකම්මා. කතමෙ පඤ්ච : ආපත්තියා දිට්ඨිං ආවිකරොති, දෙසනාගාමිනියා ආපත්තියා දිට්ඨිං ආවිකරොති, අදෙසිතාය ආපත්තියා දිට්ඨිං ආවිකරොති, න චතූහි පඤ්චහි දිට්ඨිං ආවිකරොති, න මනොමානසෙන දිට්ඨිං ආවිකරොති. ඉමෙ බො උපාලි, පඤ්ච ධම්මිකා දිට්ඨාවිකම්මා.

2. අපරෙපි උපාලි පඤ්ච අධම්මිකා දිට්ඨාවිකම්මා. කතමෙ පඤ්ච : නානාසංවාසකස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, නානාසීමාය ඨිතස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, අපකතත්තස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, චතූහි පඤ්චහි දිට්ඨිං ආවිකරොති, මනොමානසෙන දිට්ඨිං ආවිකරොති. ඉමෙ බො උපාලි පඤ්ච අධම්මිකා දිට්ඨාවිකම්මා.

---

1. ජානෙන - ම.ඡ.සං.

11. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි. කවර පසෙකින යත් : ධර්මය නො දනියි, ධර්මානුලොමය නො දනියි, විනය නො දනියි, විනයානුලොමය නො දනියි, පෙර පසු කථාවන්හි දක්ෂ වූයේත් නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි. කවර පසෙකින් ද යත් : ධර්මය දනියි, ධර්මානුලොමය දනියි, විනය දනියි, විනයානුලොමය දනියි, පෙර පසු කථාවන්හි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් සඞ්ඝයා අතර විනිශ්චය කටයුතු යි.

**තෙවන වොහාර වර්ගය නිමි.**

---

එහි නාමාවලිය :

ආපත්ති යැ, අධිකරණ යැ, පසය්හ යැ, ආපත්තිජානන යැ, කර්ම යැ, වස්තු යැ, අලජ්ජී යැ, අකුසල යැ, ඤත්ති යැ, සුත්තං න ජානාති යැ, ධම්මං න ජානාති යැ, (යන මේ) තුන්වන වර්ග සඞ්ග්‍රහය වේ.

---

## 4. දිට්ඨාවිකම්මවග්ගය

1. වහන්ස, නො දැහැමි දිට්ඨාවීකම්ම (ඇවැත් දෙසීම්) කෙතෙක් ද ?

උපාලි, මේ නොදැහැමි දිට්ඨාවීකම්ම පසෙකි. කවර පසෙකැ යත් : අනාපත්තියෙහි (ඇවැතැයි) ඇවැත දෙසයි, **දෙසනාගාමිනී**නො වූ ගරු ඇවැතෙහි ඇවැත දෙසයි, දෙසූ ඇවතෙහි (යළි) ඇවැත දෙසයි, හතර පස් දෙනෙකුන් හා (එකතුව) ඇවැත දෙසයි, (වාග්භෙද නො කොට) සිතීමෙන් මැ ඇවැත දෙසයි. උපාලි, මේ නොදැහැමි ඇවැත් දෙසීම් පස යි.

උපාලි, මේ දැහැමි ඇවැත් දෙසීම් පසෙකි. කවර පසෙකැ යත් : ඇවැතෙහි ඇවැත දෙසයි, දෙසනාගාමිනී ඇවැතෙහි ඇවැත දෙසයි, නො දෙසූ ඇවතෙහි ඇවැත දෙසයි, සතර පස් දෙනෙකුන් හා නොම එකතුව ඇවැත දෙසයි, සිතීමෙන් ම නො වැ වාග්භෙද කොට ඇවැත දෙසයි. උපාලි, මේ දැහැමි ඇවැත් දෙසීම් පස යි.

2. උපාලි, අනෙකුදු නොදැහැමි ඇවැත් දෙසීම් පසෙකි, කවර පසෙක යත් : (ලබ්ධි වශයෙන් හෝ කර්ම වශයෙන් හෝ) නානා සංවාසකයකු හමුවෙහි ඇවැත් දෙසයි, නානා සීමාවෙහි සිටියහු හමුවෙහි ඇවැත් දෙසයි, ප්‍රකෘත නොවූ මහණක්හු (උඛෙවුනීකම් කරණ ලද්දහු හෝ පොහෝ පවුරුණු තබන ලද්දහු) හමුවෙහි ඇවැත දෙසයි. සතර පස් දෙනෙකුන් හා කැටිවැ ඇවැත දෙසයි, (වාග්භෙද නොකොට) සිතීමෙන් ම ඇවැත දෙසයි. උපාලි, මේ නො දැහැමි ඇවැත් දෙසීම් පස යි.


Free Distribution www.aathaapi.org

පඤ්චිමෙ උපාලි, ධම්මිකා දිට්ඨාවිකම්මා. කතමෙ පඤ්ච: සමානසංවාසකස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, සමාන සීමාය ඨිතස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, පකතත්තස්ස සන්තිකෙ දිට්ඨිං ආවිකරොති, න චතූහි පඤ්චහි දිට්ඨිං ආවිකරොති, න මනො මානසෙන දිට්ඨිං ආවිකරොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච ධම්මිකා දිට්ඨාවිකම්මාති.

3. කති නු ඛො භන්තෙ, අධම්මිකා පටිග්ගහාති?

පඤ්චිමෙ උපාලි, අධම්මිකා පටිග්ගහා. කතමෙ පඤ්ච: කායෙන දීයමානං කායෙන අපටිග්ගහිතං, කායෙන දීයමානං කායපටිබද්ධෙන අපටිග්ගහිතං, කායපටිබද්ධෙන දීයමානං කායෙන අපටිග්ගහිතං, කායපටිබද්ධෙන දීයමානං කායපටිබද්ධෙන අපටිග්ගහිතං, නිස්සග්ගියෙන දීයමානං කායෙන වා කායපටිබද්ධෙන වා අපටිග්ගහිතං. ඉමෙ ඛො උපාලි, පඤ්ච අධම්මිකා පටිග්ගහා.

පඤ්චිමෙ උපාලි, ධම්මිකා පටිග්ගහා. කතමෙ පඤ්ච: කායෙන දීයමානං කායෙන පටිග්ගහිතං, කායෙන දීයමානං කායපටිබද්ධෙන පටිග්ගහිතං, කායපටිබද්ධෙන දීයමානං කායෙන පටිග්ගහිතං, කාය පටිබද්ධෙන දීයමානං කායපටිබද්ධෙන පටිග්ගහිතං, නිස්සග්ගියෙන දීයමානං කායෙන වා කායපටිබද්ධෙන වා පටිග්ගහිතං. ඉමෙ ඛො උපාලි, පඤ්ච ධම්මිකා පටිග්ගහාති.

4. කති නු ඛො භන්තෙ, අනතිරිත්තාති?

පඤ්චිමෙ උපාලි; අනතිරිත්තා. කතමෙ පඤ්ච: අකප්පියකතං හොති, අපටිග්ගහිතකතං හොති, අනුච්චාරිතකතං හොති, අහත්ථපාසෙ කතං හොති, අලමෙතං සබ්බන්ති අවුත්තං හොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච අනතිරිත්තා.

පඤ්චිමෙ උපාලි, අතිරිත්තා. කතමෙ පඤ්ච: කප්පියකතං හොති, පටිග්ගහිතකතං හොති, උච්චාරිතකතං හොති, හත්ථපාසෙ කතං හොති, අලමෙතං සබ්බන්ති වුත්තං හොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච අතිරිත්තාති.

5. කතීහි නු ඛො භන්තෙ, ආකාරෙහි පවාරණා පඤ්ඤායතීති?

පඤ්චහුපාලි, ආකාරෙහි පවාරණා පඤ්ඤායති. කතමෙහි පඤ්චහි: අසනං පඤ්ඤායති, භොජනං පඤ්ඤායති, හත්ථපාසෙ ඨිතො, අභිහරති, පටික්ඛෙපො පඤ්ඤායති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහාකාරෙහි පවාරණා පඤ්ඤායතීති.

6. කති නු ඛො භන්තෙ, අධම්මිකා පටිඤ්ඤාතකරණාති?

පඤ්චිමෙ උපාලි, අධම්මිකා පටිඤ්ඤාතකරණා. කතමෙ පඤ්ච: භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති, පාරාජිකෙන චොදියමානො සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොති පටිජානාති, තං සඞ්ඝො සඞ්ඝාදිසෙසෙන කාරෙති, අධම්මිකං පටිඤ්ඤාතකරණං. භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති, පාරාජිකෙන චොදියමානො පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ-

උපාලි, මේ දැහැමි ඇවැත් දෙසීම් පසෙකි, කවර පසෙකැ යත් : සමානසංවාසකයකු හමුයෙහි ඇවැත දෙසයි, සමාන සීමාවෙහි සිටියහු හමුයෙහි ඇවැත දෙසයි, ප්‍රකෘත මහණක්හු හමුවෙහි ඇවැත දෙසයි, සතර පස් දෙනෙකුන් හා නොම එකතුව ඇවැත දෙසයි, සිතීමෙන් මැ නොවැ වාග්භෙද කොට මැ ඇවැත දෙසයි. උපාලි, මේ දැහැමි ඇවැත් දෙසීම් පස යි.

3. වහන්ස, නොදැහැමි පිළිගැණුම් කෙතෙක් ද ?

උපාලි, මේ නොදැහැමි පිළිගැණුම් පසෙකි, කවර පසෙකැ යත් : (මෙරමා) කයින් දෙනු ලබන්නක් (තමාගේ) කයින් නොපිළිගන්නා ලද්ද යැ, (මෙරමා) කයින් දෙනු ලබන්නක් (තමාගේ) කය පිළිබැදියකින් නොපිළිගන්නා ලද්ද යැ, (මෙරමා) කය පිළිබැදියකින් දෙනු ලබන්නක් (තමාගේ) කයින් නොපිළිගන්නා ලද්ද යැ, (මෙරමා කය පිළිබැදියකින් දෙනු ලබන්නක් (තමාගේ) කය පිළිබැදියකින් නොපිළිගන්නා ලද්ද යැ, නිසැදුමෙන් දෙනු ලබන්නක් (තමාගේ) කයින් හෝ කය පිළිබැදියකින් හෝ නොපිළිගන්නා ලද්ද යි. උපාලි, මේ නොදැහැමි පිළිගැණුම් පස යි.

උපාලි, මේ දැහැමි පිළිගැණුම් පසෙකි, කවර පසෙක යත් : කයින් දෙනු ලබන්නක් කයින් පිළිගන්නා ලද්ද යැ, කයින් දෙනු ලබන්නක් කය පිළිබැදියකින් පිළිගන්නා ලද්ද යැ, කය පිළිබැදියකින් දෙනු ලබන්නක් කයින් පිළිගන්නා ලද්ද යැ, (මෙරමා) කය පිළිබැදියකින් දෙනු ලබන්නක් (තමාගේ) කය පිළිබැදියකින් පිළිගන්නා ලද්ද යැ, නිසැදුමෙන් දෙනු ලබන්නක් කයින් හෝ කය පිළිබැදියකින් හෝ පිළිගන්නා ලද්ද යැ. උපාලි, මේ දැහැමි පිළිගැණුම් පස යි.

4. වහන්ස, අනතිරික්ත කෙතෙක් ද ?

උපාලි, මේ අනතිරික්ත පසෙකි, කවර පසෙක යත් : කැප නොකරණ ලද වෙයි, පිළිගැන්ම නොකරණලද වෙයි, ඔසවාපෑම නොකරණලද වෙයි, අත්පස්හි නොකරණ ලද වෙයි, මේ සියල්ල සෑහේ යැ යි (වාග්භෙද කොට) නො කියන ලද වේ. උපාලි, මේ අනතිරික්ත පස යි.

උපාලි, මේ අතිරික්ත පසෙකි, කවර පසෙක යත් : කැප කරණලද වෙයි, පිළිගැන්ම කරණලද වෙයි, ඔසවා පෑම කරණලද වෙයි, අත්පස්හි කරණලද වෙයි, මේ සියල්ල සෑහේ යැ යි කියනලද වේ. උපාලි, මේ අතිරික්ත පස යි.

5. වහන්ස, කෙතෙක් අයුරින් පවාරණය පැණේ ද ?

උපාලි, පස් අයුරකින් පවාරණය පැණෙයි, කවර පසෙකින යත් :—(අඩාළ) බොජුන පැණෙයි, (පස් බොජුන් අතුරෙන්) එක් බොජුනෙක් පැණෙයි, (දෙරියන් වියත්) අත්පසෙහි සිටියේ වෙයි. (කයින්) එළවයි, (කයින් වචනින්) පිළිකෙව් කිරීම පැණේ. උපාලි, මේ පස් අයුරින් පවාරණය පැණෙයි.

6. වහන්ස, නොදැහැමි ප්‍රතිඥතකරණ කෙතෙක් ද ?

උපාලි, මේ නොදැහැමි ප්‍රතිඥතකරණ පසෙකි, කවර පසෙක යත් : මහණ පරිජි අවන් වෙයි, පරිජි ඇවතින් චොදනා කරණු ලබන කල්හි සඟවෙසෙස් අවන්මි යි පිළින කෙරෙයි, සඞ්ඝ තෙමේ ඔහුට සඟවෙසෙසින් විනය කර්ම කරවා නම් (එය) අධම්මික පටිඤ්ඤාතකරණ යැ. මහණ පරිජි අවන් වෙයි, පරිජි ඇවතින් චොදනා කරණු ලබන කල්හි පචිති ඇවැත් . . . . . පිළිදෙස්නී ඇවැත් . . . . . දුකුළා ඇවැත් අවන්මි යි

දුක්කටං අජ්ඣාපන්නොති පටිජානාති, තං සඞ්ඝො දුක්කටෙන කාරෙති, අධම්මිකං පටිඤ්ඤාතකරණං. භික්ඛු සඞ්ඝාදිසෙසං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං අජ්ඣාපන්නො හොති, දුක්කටෙන චොදියමානෙ පාරාජිකං අජ්ඣාපන්නොති පටිජානාති, තං සඞ්ඝො පාරාජිකෙන කාරෙති, අධම්මිකං පටිඤ්ඤාතකරණං. භික්ඛු දුක්කටං අජ්ඣාපන්නො හොති, දුක්කටෙන චොදියමානෙ සඞ්ඝාදිසෙසං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං අජ්ඣාපන්නොති පටිජානාති, තං සඞ්ඝො පාටිදෙසනීයෙන කාරෙති, අධම්මිකං පටිඤ්ඤාතකරණං. ඉමෙ ඛො උපාලි, පඤ්ච අධම්මිකා පටිඤ්ඤාතකරණා.

පඤ්චිමෙ උපාලි, ධම්මිකා පටිඤ්ඤාතකරණා, කතමෙ පඤ්ච: භික්ඛු පාරාජිකං අජ්ඣාපන්නො හොති, පාරාජිකෙන චොදියමානෙ පාරාජිකං අජ්ඣාපන්නොති පටිජානාති. තං සඞ්ඝො පාරාජිකෙන කාරෙති, ධම්මිකං පටිඤ්ඤාතකරණං. භික්ඛු සඞ්ඝාදිසෙසං -පෙ- පාචිත්තියං -පෙ- පාටිදෙසනීයං -පෙ- දුක්කටං අජ්ඣාපන්නො හොති, දුක්කටෙන චොදියමානෙ දුක්කටං අජ්ඣාපන්නොති පටිජානාති, තං සඞ්ඝො දුක්කටෙන කාරෙති, ධම්මිකං පටිඤ්ඤාතකරණං. ඉමෙ ඛො උපාලි, පඤ්ච ධම්මිකා පටිඤ්ඤාතකරණාති.

7. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුන්ති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුං, කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච අපකතත්තො ච, චාවනාධිප්පායො වත්තා හොති, න වුට්ඨානාධිප්පායො. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස අලං ඔකාසකම්මං කාතුං. කතමෙහි පඤ්චහි: ලජ්ජී ච හොති, පණ්ඩිතො ච, පකතත්තො ච, වුට්ඨානාධිප්පායො වත්තා හොති, නො චාවනාධිප්පායො. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස අලං ඔකාසකම්මං කාතුන්ති.

8. කතීහි නුඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො න සාකච්ඡාතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො න සාකච්ඡාතබ්බො, කතමෙහි පඤ්චහි: වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, පදපච්චාභට්ඨං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො න සාකච්ඡාතබ්බො.

Free Distribution www.aathaapi.org

පිළිත කෙරෙයි, ඔහුට සඞ්ඝයා දුකුළා ඇවැතින් විනයකර්ම කරවා නම් (එය) අධම්මික පටිඤ්ඤාතකරණ යැ. මහණ සඟවෙසෙස් ඇවැත් . . . . පචිති ඇවැත් . . . . පිළිදෙස්නී ඇවැත් . . . . දුකුළා ඇවැත් අවන් වෙයි, දුකුළා ඇවැතින් චොදනා කරණු ලබන කල්හි පරිජි අවන්මි යි පිළින කෙරෙයි, ඔහුට සඞ්ඝයා පරිජි ඇවැතින් විනය කර්ම කරවා නම් (එය) අධම්මික පටිඤ්ඤාතකරණ යැ. මහණ දුකුළා ඇවැත් අවන් වෙයි, දුකුළා ඇවැතින් චොදනා කරණු ලබන කල්හි සඟවෙසෙස් ඇවැත් . . . . පචිති ඇවැත් . . . . පිළිදෙස්නී ඇවැත් අවන්මි යි පිළින කෙරෙයි, ඔහුට සඞ්ඝයා පිළිදෙස්නී ඇවැතින් විනයකර්ම කරවා නම් (එය) අධම්මිකපටිඤ්ඤාතකරණ යි. උපාලි, මේ අධම්මිකපටිඤ්ඤාතකරණ පස යි.

උපාලි, මේ ධම්මිකපටිඤ්ඤාතකරණ පසෙකි. කවර පසෙක් ද යත් : මහණ පරිජි ඇවැත් අවන් වෙයි, පරිජි ඇවැතින් චොදනා කරණු ලබන කල්හි පරිජි අවන්මි යි පිළින කෙරෙයි, ඔහුට සඞ්ඝයා පරිජි ඇවැතින් විනයකර්ම කරවා නම් (එය) ධම්මිකපටිඤ්ඤාතකරණ යැ, මහණ සඟවෙසෙස් ඇවැත් . . . . පචිති ඇවැත් . . . . පිළිදෙස්නී ඇවැත් . . . . දුකුළා ඇවැත් අවන් වෙයි, දුකුළා ඇවැතින් චොදනා කරණු ලබන කල්හි දුකුළා ඇවැත් අවන්මි යි පිළින කෙරෙයි, ඔහුට සඞ්ඝයා දුකුළා ඇවැතින් විනයකර්ම කරවා නම් (එය) ධම්මිකපටිඤ්ඤාතකරණ යි. උපාලි, මේ ධම්මිකපටිඤ්ඤාතකරණ පස යි.

7. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නො නිසි ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාස කර්මය කරන්නට නො නිසි වෙයි. කවර පසෙකිනැ යත් : අලජ්ජීත් වෙයි, අඥාන වූයෙත් වෙයි, අප්‍රකෘත වූයෙත් වෙයි, සසුනෙන් පහ කරවනු කැමැති ව කියනුයේ වෙයි, (ඇවැතින්) නගා සිටුවන අදහස් ඇති වැ නො කියනුයේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට සුදුසු නො වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුත් ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට සුදුසු වෙයි. කවර පසෙකිනැ යත් : ලජ්ජීත් වෙයි, නුවණැත්තේත් වෙයි, ප්‍රකෘත වූයේත් වෙයි, (ඇවැතින්) නගා සිටුවන අදහස් ඇති වැ කියනුයේත් වෙයි, සස්නෙන් පහ කරවන අදහස් නැත්තේත් වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට සුදුසු වේ.

8. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු සමඟ විනය සාකච්ඡා නො කටයුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග විනය සාකච්ඡා නො කටයුතු යි. කවර පසෙකින් ද යත් : (ඇවැත් පිළිබඳ) වස්තුව නො දනියි, නිදානය නො දනියි, ප්‍රඥප්තිය නො දනියි, පදපෙරළිය නො දනියි, ගැළපෙන වදන්මග නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග විනය සාකච්ඡා නො කටයුතු යි.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො සාකච්ඡාතබ්බො. කතමෙහි පඤ්චහි: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං විනයො සාකච්ඡාතබ්බොති.

9. කති නු ඛො භන්තෙ, පඤ්හාපුච්ඡාති?

පඤ්චිමා උපාලි, පඤ්හාපුච්ඡා. කතමා පඤ්ච: මන්දත්තා මොමූහත්තා පඤ්හං පුච්ඡති, පාපිච්ඡො ඉච්ඡාපකතො පඤ්හං පුච්ඡති, අඤ්ඤාතුකාමො පඤ්හං පුච්ඡති, සචෙ මෙ පඤ්හං පුට්ඨො සම්මදෙව බ්‍යාකරිස්සති ඉච්චෙතං කුසලං, නො චෙ පඤ්හං පුට්ඨො සම්මදෙව බ්‍යාකරිස්සති, අහමස්ස සම්මදෙව බ්‍යාකරිස්සාමීති පඤ්හං පුච්ඡති. ඉමා ඛො උපාලි, පඤ්ච පඤ්හාපුච්ඡාති.

10. කති නු ඛො භන්තෙ, අඤ්ඤබ්‍යාකරණාති?

පඤ්චිමෙ උපාලි, අඤ්ඤබ්‍යාකරණා. කතමෙ පඤ්ච: මන්දත්තා මොමූහත්තා අඤ්ඤං බ්‍යාකරොති, පාපිච්ඡො ඉච්ඡාපකතො අඤ්ඤං බ්‍යාකරොති, උම්මාද චිත්තක්ඛෙපා අඤ්ඤං බ්‍යාකරොති, අධිමානෙන අඤ්ඤං බ්‍යාකරොති, භූතං අඤ්ඤං බ්‍යාකරොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච අඤ්ඤබ්‍යාකරණාති.

11. කති නු ඛො භන්තෙ, විසුද්ධියොති?

පඤ්චිමා උපාලි, විසුද්ධියො. කතමා පඤ්ච: නිදානං උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං, අයං පඨමා විසුද්ධි. නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං, අයං දුතියා විසුද්ධි. නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං, අයං තතියා විසුද්ධි. නිදානං උද්දිසිත්වා චත්තාරි පාරාජිකානි උද්දිසිත්වා තෙරස සඞ්ඝාදිසෙසෙ උද්දිසිත්වා ද්වෙ අනියතෙ උද්දිසිත්වා අවසෙසං සුතෙන සාවෙතබ්බං, අයං චතුත්ථා විසුද්ධි, විත්ථාරෙනෙව පඤ්චමී. ඉමා ඛො උපාලි, පඤ්ච විසුද්ධියොති.

12. කති නු ඛො භන්තෙ, භොජනාති?

පඤ්චිමෙ උපාලි භොජනා. කතමෙ පඤ්ච: ඔදනො, කුම්මාසො, සත්තු, මච්ඡො, මංසං. ඉමෙ ඛො උපාලි, පඤ්ච භොජනාති.

දිට්ඨාවිකම්මවග්ගො චතුත්ථො

---

තස්සුද්දානං:

දිට්ඨාවිකම්මා අපරෙ පටිග්ගහා අනතිරිත්තා,
පවාරණා පටිඤ්ඤත්තං ඔකාසං සාකච්ඡෙන ච;
පඤ්හං අඤ්ඤබ්‍යාකරණා විසුද්ධි චාපි භොජනාති.

---

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග විනය සාකච්ඡා කටයුතු යි. කවර පසෙකිනැ යත්: වස්තුව දනියි, නිදානය දනියි, ප්‍රඥප්තිය දනියි, පදපෙරැළිය දනියි, ගැළපෙන වදන්මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග විනය සාකච්ඡා කටයුතු යි.

9. වහන්ස, පැණ පිළිවිසීම් කෙතෙක් ද ?

උපාලි, මේ පැණ පිළිවිසීම් පසෙකි. කවර පසෙකැ යත්: නුවණ මඳ බැවින් මොහයෙන් මුළා බැවින් ප්‍රශ්න විචාරයි, ලාමක අදහස් ඇතියේ ලාමක අදහසින් මඩනා ලදුයේ ප්‍රශ්න විචාරයි, නින්දරොපණය කරණු කැමැත්තෙන් ප්‍රශ්න විචාරයි, දූනගණු කැමැත්තෙන් ප්‍රශ්න විචාරයි. ඉදින් මා විසින් පැණ පුළුවුස්නා ලදුයේ මොනවට විසඳනුයේ නම් එසේ තෙල විසඳිම මැනැව, ඉදින් පැණ පුළුවුස්නා ලදුයේ මොනවට නොවිසඳනුයේ නම් මම ඔහුට මැනැවින් ප්‍රකාශ කරන්නෙමි යි ප්‍රශ්න විචාරයි. උපාලි, මේ පැණ පිළිවිසීම් පස යි.

10. වහන්ස, රහත් බව ප්‍රකාශ කිරීම් කෙතෙක් ද ?

උපාලි, මේ රහත් බව ප්‍රකාශ කිරීම් පසෙකි. කවර පසෙකැ යත්: නුවණ මඳ බැවින් මොහයෙන් මුළා බැවින් රහත්බව පළ කෙරෙයි, ලාමක අදහස් ඇතියේ ලාමක අදහසින් මඩනා ලදුයේ රහත්බව පළ කෙරෙයි, උමතුවෙන් සිත් පෙරැළීමෙන් රහත්බව පළ කෙරෙයි, (පසක් කෙළෙමි යන) අධිමානයෙන්. රහත්බව පළ කෙරෙයි, විද්‍යමාන වූ රහත්බව පළ කෙරෙයි. උපාලි, මේ රහත්බැව් පළ කිරීම් පස යි.

11. වහන්ස, විශුද්ධි කෙතෙක් ද ?

උපාලි, මේ විශුද්ධි පසෙකි. කවර පසෙකැ යත්: නිදානය උදෙසා සෙස්ස ශ්‍රුතයෙන් ඇස්විය යුතු යි. මේ පළමුවන විශුද්ධි යැ. නිදානය උදෙසා සතර පරිජි උදෙසා සෙස්ස ශ්‍රුතයෙන් ඇස්විය යුතු යි. මේ දෙවන විශුද්ධි යැ. නිදානය උදෙසා සතර පරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා සෙස්ස ශ්‍රුතයෙන් ඇස්විය යුතු යි. මේ තෙවන විශුද්ධි යැ. නිදානය උදෙසා සතර පරිජි උදෙසා තෙළෙස් සඟවෙසෙස් උදෙසා දෙඅනියතය උදෙසා සෙස්ස ශ්‍රුතයෙන් ඇස්විය යුතු යි. මේ සතරවන විශුද්ධි යැ. විත්ථාරුද්දෙසයෙන් පස්වන විශුද්ධිය වේ. උපාලි, මේ විශුද්ධි පස යි.

12. වහන්ස, භොජන කෙතෙක් ද ?

උපාලි, මේ භොජන පසෙකි. කවර පසෙකැ යත්: බත යැ, කොමු යැ. අත්සුණු යැ, දියමස් යැ, ගොඩමස් යැ. උපාලි, මේ භොජන පස යි.

**සිවුවන දිට්ඨාවිකම්ම වර්ගය නිමි**

---

එහි නාමාවලිය :

දිට්ඨාවිකම්ම දෙක යැ අපර දෙක යැ පටිග්ගහ දෙක යැ අනතිරිත්ත යැ පවාරණ යැ පටික්ඛෙපකරණ යැ ඔකාසකම්ම යැ සාකච්ඡාව සමග පඤ්හ යැ අඤ්ඤබ්‍යාකරණ විශුද්ධි යැ භොජන යැ යි.

---

## 5. අත්තාදාන වග්ගො

1. චොදකෙන භන්තෙ, භික්ඛුනා පරං චොදෙතුකාමෙන කති ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බොති?

චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බො. කතමෙ පඤ්ච: චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: "පරිසුද්ධකායසමාචාරො නු ඛොම්හි, පරිසුද්ධෙනම්හි කායසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති," නො චෙ උපාලි, භික්ඛු පරිසුද්ධකායසමාචාරො හොති පරිසුද්ධෙන කායසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, තස්ස භවන්ති වත්තාරො: 'ඉඞ්ඝ තාව ආයස්මා කායිකං සික්ඛස්සූ'ති· ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං උපාලි, චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: පරිසුද්ධවචීසමාචාරො නු ඛොම්හි, පරිසුද්ධෙනම්හි වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති, නො චෙ උපාලි, භික්ඛු පරිසුද්ධ වචීසමාචාරො හොති, පරිසුද්ධෙන වචීසමාචාරෙන සමන්නාගතො අච්ඡිද්දෙන අප්පටිමංසෙන, තස්ස භවන්ති වත්තාරො 'ඉඞ්ඝ තාව ආයස්මා වාචසිකං සික්ඛස්සූ'ති· ඉතිස්ස භවන්ති වත්තාරො·

පුනචපරං උපාලි, චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: මෙත්තං නු ඛො මෙ චිත්තං පච්චුපට්ඨිතං සබ්‍රහ්මචාරීසු අනාඝාතං, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති, නො චෙ උපාලි, භික්ඛුනො මෙත්තං චිත්තං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු අනාඝාතං, තස්ස භවන්ති වත්තාරො 'ඉඞ්ඝ තාව ආයස්මා සබ්‍රහ්මචාරීසු මෙත්තං චිත්තං උපට්ඨපෙහී'ති· ඉතිස්ස භවන්ති වත්තාරො.

පුනචපරං උපාලි, චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: බහුස්සුතො නු ඛොම්හි සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපා මෙ ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති, නො චෙ උපාලි භික්ඛු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො, යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති, තථාරූපාස්ස ධම්මා න බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, තස්ස භවන්ති වත්තාරො: ඉඞ්ඝ තාව ආයස්මා ආගමං පරියාපුණස්සූ'ති. ඉතිස්ස භවන්ති වත්තාරො.

## 5. අත්තාදානවග්ගය

1. වහන්ස, මෙරමාහට චෝදනා කරණු කැමැති චෝදක මහණහු විසින් කෙතෙක් කරුණු තමා කෙරෙහිලා සලකා මෙරමා චෝදනා කළයුතු ද ?

උපාලි, මෙරමාහට චෝදනා කරණු කැමැති චෝදක මහණහු විසින් කරුණු පසක් තමා කෙරෙහිලා සලකා මෙරමා චෝදනා කළයුතු යි. කවර පසෙක යත් :—උපාලි, අනෙකකුට චෝදනා කරණු කැමැති චෝදක මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි : '' මම පිරිසිදු වූ කායසමාචාර ඇත්තෙම් සිදුරු රහිත වූ අනුන් විසින් විමසා සඳෙසැයි ගතහැකි වරද නැති පිරිසිදු වූ කායසමාචාරයෙන් යුක්ත වූයෙම් ද, මේ ධර්මය මා තුළ පවතී ද නැද්ද '' කියා යි. උපාලි, ඉදින් මහණ පිරිසිදු වූ කායසමාචාර ඇත්තෙක් නො වේ නම් සිදුරු රහිත වූ විමසා සඳෙසැයි ගතහැකි වරද නැති පිරිසිදු වූ කායසමාචාරයෙන් යුක්ත වූවෙක් නො වේ නම් ඔහුට නුගුණ කියන්නෝ වෙති. '' එබැවින් ආයුෂ්මත් පළමු කොට කායසමාචාරයෙහි හික්මෙන්නැ '' යි ඔහුට මෙසේ කියන්නෝ වෙත්.

උපාලි, තවද අනෙකකි ; අන්‍යයාහට චෝදනා කරණු කැමැති චෝදක මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි : '' මම පිරිසිදු වූ වාක්සමාචාර ඇත්තෙම් ද, සිදුරු රහිත වූ විමසා සඳෙසැයි ගතහැකි වරද නැති පිරිසිදු වූ වාක්සමාචාරයෙන් යුක්ත වූයෙම් ද, මේ ධර්මය මා කෙරෙහි පවතී ද, නැද්ද '' කියා යි. උපාලි, ඉදින් මහණ තෙමේ පිරිසිදු වූ වාක් සමාචාර ඇත්තෙක් නො වේ නම් සිදුරු රහිත වූ විමසා සඳෙසැයි ගතහැකි වරද නැති පිරිසිදු වූ වාක්සමාචාරයෙන් යුක්ත වූවෙක් නො වේ නම් ඔහුට නුගුණ කියන්නෝ වෙති. '' එබැවින් ආයුෂ්මත් පළමු කොට වාක්සමාචාරයෙහි හික්මෙන්නැ '' යි ඔහුට මෙසේ කියන්නෝ වෙත්.

උපාලි, තවද අනෙකකි ; අන්‍යයාට චෝදනා කරණු කැමැති වූ චෝදක මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි. '' සබ්‍රම්සරුන් කෙරෙහි ආඝාත රහිත මාගේ මෙත් සිත එළඹ සිටියේ ද, මේ ධර්මය මා තුළ පවතී ද නැද්ද '' කියා යි. උපාලි, ඉදින් සබ්‍රම්සරුන් කෙරෙහි ආඝාත රහිත මෙත් සිත මහණහු තුළ නො එළඹ සිටියේ වේ නම් ඔහුට නුගුණ කියන්නෝ වෙති. '' එබැවින් ආයුෂ්මත් පළමු කොට සබ්‍රම්සරුන් කෙරෙහි මෙත් සිත උපදවා ගන්නැ '' යි මෙසේ ඔහුට කියන්නෝ වෙත්.

උපාලි, තවද අනෙකකි ; අන්‍යයාට චෝදනා කරණු කැමැති වූ චෝදක මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි. '' මම සුතධර වූ සුතසන්නිචය වූ බහුශ්‍රැතයෙම් ද, ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසානකල්‍යාණ සාර්ථ සව්‍යඤ්ජන වූ යම් ධර්ම-කෙනෙක් කෙවල පරිපූර්ණ කොට පිරිසිදු කොට බඹසර පවසත් නම් එබඳු ධර්මයෝ මා විසින් බොහෝ කොට අසන ලද්දහු දරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් පුන පුනා විමසන ලද්දහු '' ප්‍රඥයෙන් මොනවට අවබොධ කරණ ලද්දහු වෙද්ද ? තෙල ධර්මය මා තුළ පවතී ද නොහොත් නැද්ද '' යි. උපාලි, ඉදින් මහණ සුතධර වූ සුත-සන්නිචය වූ බහුශ්‍රැතයෙක් නො වේ නම් ආදිකල්‍යාණ මධ්‍යකල්‍යාණ පර්‍ය්‍යවසානකල්‍යාණ සාර්ථ සව්‍යඤ්ජන වූ යම් ධර්ම කෙනෙක් කෙවල පරිපූර්ණ කොට පිරිසිදු කොට බඹසර පවසත් ද එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසන ලද්දහු දරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් පුනපුනා විමසන ලද්දහු ප්‍රඥයෙන් මොනවට අවබොධ කරණ ලද්දහු නො වෙත් නම් ඔහුට නුගුණ කියන්නෝ වෙති. '' එබැවින් ආයුෂ්මත් පළමු කොට ආගමධර්මය පුහුණු කරන්නැ '' යි මෙසේ ඔහුට කියන්නෝ වෙත්.

පුනචපරං උපාලි, චොදකෙන භික්ඛුනා පරං චොදෙතුකාමෙන එවං පච්චවෙක්ඛිතබ්බං: උභයානි ඛො මෙ පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුව්‍යඤ්ජනසො, සංවිජ්ජති නු ඛො මෙ එසො ධම්මො උදාහු නොති, නො චෙ උපාලි, භික්ඛුනො උභයානි පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, ඉදං පනාවුසො, කත්ථ වුත්තං භගවතාති ඉති පුට්ඨො න සම්පාදෙති, න සඤ්ඤපයති. තස්ස භවන්ති වත්තාරො: 'ඉඞ්ඝ තාව ආයස්මා විනයං පරියාපුණස්සූ'ති ඉතිස්ස භවන්ති වත්තාරො. චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං පච්චවෙක්ඛිත්වා පරො චොදෙතබ්බොති.

2. චොදකෙන භන්තෙ, භික්ඛුනා පරං චොදෙතුකාමෙන කති ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බොති?

චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බො. කතමෙ පඤ්ච: කාලෙන වක්ඛාමි නො අකාලෙන, භූතෙන වක්ඛාමි නො අභූතෙන, සණ්හෙන වක්ඛාමි නො ඵරුසෙන, අත්ථසංහිතෙන වක්ඛාමි නො අනත්ථසංහිතෙන, මෙත්තචිත්තො වක්ඛාමි නො දොසන්තරොති. චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨපෙත්වා පරො චොදෙතබ්බොති.

3 චොදකෙන භන්තෙ, භික්ඛුනා පරං චොදෙතුකාමෙන කති ධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බොති?

චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බො, කතමෙ පඤ්ච: කාරුඤ්ඤතා, හිතෙසිතා, අනුකම්පිතා, ආපත්තිවුට්ඨානතා, විනයපුරෙක්ඛාරතා. චොදකෙනුපාලි, භික්ඛුනා පරං චොදෙතුකාමෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං මනසිකරිත්වා පරො චොදෙතබ්බොති.

4. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුන්ති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුං, කතමෙහි පඤ්චහි: අපරිසුද්ධකායසමාචාරො හොති, අපරිසුද්ධවචීසමාචාරො හොති, අපරිසුද්ධාජීවො හොති, බාලො ච හොති අබ්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජියමානො අනුයොගං දාතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස නාලං ඔකාසකම්මං කාතුං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස අලං ඔකාසකම්මං කාතුං, කතමෙහි පඤ්චහි: පරිසුද්ධකායසමාචාරො හොති, පරිසුද්ධවචීසමාචාරො හොති, පරිසුද්ධාජීවො හොති, පණ්ඩිතො හොති බ්‍යත්තො, පටිබලො අනුයුඤ්ජියමානො අනුයොගං දාතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො ඔකාසකම්මං කාරාපෙන්තස්ස අලං ඔකාසකම්මං කාතුන්ති.

උපාලි, තවද අනිකකි; අනායයාට චෝදනා කරණු කැමැති වූ චෝදක මහණහු විසින් මෙසේ නුවණින් සැලකිය යුතු යි : '' මා විසින් උභයප්‍රාතිමොක්ෂය පෙළ වශයෙන් ද (අර්ථකථාදි) අනුව්‍යඤ්ජන වශයෙන් ද විස්තර වශයෙන් මොනවට ප්‍රගුණ කරණ ලද ද, මොනවට විභාග කොට දැන ගන්නා ලද ද, මොනවට දැරීම් වශයෙන් පවත්වා ගන්නා ලද ද, මොනවට විනිශ්චය කොට දැනගන්නා ලද ද, මේ ධර්මය මා තුළ පවතී ද නැද්ද කියා යි. උපාලි, ඉදින් මහණහු විසින් උභයප්‍රාතිමොක්ෂය පෙළ වශයෙන් ද අනුව්‍යඤ්ජන වශයෙන් ද විස්තර වශයෙන් මොනවට ප්‍රගුණ නො කරණ ලද මොනවට විභාග කොට නො දන්නා ලද මොනවට දැරීම් වශයෙන් පවත්වා නො ගන්නා ලද මොනවට විනිශ්චය කොට නො දන්නා ලද නම් ඇවැත, මෙය වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් කොතැන්හි දෙශිත දැයි විචාරණ ලද්දේ සිහි කොට නො කියයි ද, (කිය නොහැකි වේ ද) දන්වනු නොහැකි වේ ද, ඔහුට නුගුණ කියන්නෝ වෙති : '' එබැවින් ආයුෂ්මත් තෙමේ පළමු කොට විනය ප්‍රගුණ කරන්නැ '' යි මෙසේ ඔහුට කියන්නෝ වෙත්. උපාලි, අනායයාට චෝදනා කරණු කැමැති චෝදක මහණහු විසින් මේ දහම් පස තමන් කෙරෙහි නුවණින් සලකා බලා අනායයාට චෝදනා කටයුතු ය.

2. වහන්ස, පරා චෝදනා කරණු කැමති චෝදක මහණහු විසින් කෙතෙක් දහම් තමා කෙරෙහි එළවා ගෙන පරා චෝදනා කටයුතු ද ?

උපාලි, පරා චෝදනා කරණු කැමති චෝදක මහණහු විසින් දහම් පසක් තමා කෙරෙහි එළවා ගෙන පරා චෝදනා කටයුතු යි. කවර පසෙකැ යත් : සුදුසු කල්හි කියන්නෙමි, නො කල්හි නො කියන්නෙමි. භූතයෙන් කියන්නෙමි, අභූතයෙන් නො කියන්නෙමි. මෘදු වූ වචනයෙන් කියන්නෙමි, රළු වචනයෙන් නො කියන්නෙමි. අර්ථසංහිතයෙන් කියන්නෙමි, අනර්ථසංහිතයෙන් නො කියන්නෙමි. මෙත් සිත් ඇති වැ කියන්නෙමි, දූෂිත සිත් ඇති වැ නො කියන්නෙමි යි. උපාලි, පරා චෝදනා කරණු කැමති චෝදක මහණහු විසින් මේ දහම් පස තමා කෙරෙහි එළවා ගෙන පරා චෝදනා කටයුතු යි.

3. වහන්ස, අනායයාට චෝදනා කරණු කැමති චෝදක මහණුන් විසින් කෙතෙක් දහම් තමන් තුළ මෙනෙහි කොට අනායයාට චෝදනා කටයුතු ද ?

උපාලි, අනායයාට චෝදනා කරණු කැමති චෝදක මහණහු විසින් දහම් පසක් තමා තුළ මෙනෙහි කොට අනායයාට චෝදනා කටයුතු යි. කවර පසෙක යත් : කුළුණැති බව යැ හිතෛෂී බව යැ අනුකම්පා ඇති බව යැ ඇවැතින් නැගිටුවා ශුද්ධියෙහි පිහිටුවන බව යැ විනය පෙරටුකොට ඇති බව යි. උපාලි, අනායයාට චෝදනා කරනු කැමති චෝදක මහණහු විසින් මේ දහම් පස තමා තුළ මෙනෙහි කොට අනායයාට චෝදනා කටයුතු යි.

4. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් සමන්වාගත ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නිසි වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නිසි නො වෙයි. කවර පසෙකැ යත් : අපිරිසිදු කායසමාචාර ඇත්තේ වෙයි. අපිරිසිදු වාක්සමාචාර ඇත්තේ වෙයි. අපිරිසිදු දිවිපෙවෙත් ඇත්තේ වෙයි. අව්‍යක්ත වූ අඥනයෙක් වෙයි. විචාරණු ලබන්නේ විචාළ දැ කියන්නට ප්‍රතිබල නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නිසි නො වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නිසි වෙයි. කවර පසෙකින යත් : පිරිසිදු කායසමාචාරය ඇත්තේ වෙයි. පිරිසිදු වාක්සමාචාරය ඇත්තේ වෙයි. පිරිසිදු දිවිපෙවෙත් ඇත්තේ වෙයි. ව්‍යක්ත වූ පණ්ඩිතයෙක් වෙයි. විචාරණු ලබන්නේ විචාළ දෙය කියන්නට ප්‍රතිබල වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ ඔකාසකර්මය කරවන මහණහට ඔකාසකර්මය කරන්නට නිසි වේ.

5. අත්තාදානං ආදාතුකාමෙන භන්තෙ, භික්ඛුනා කතිහඞ්ගෙහි සමන්නාගතං අත්තාදානං ආදාතබ්බන්ති?

අත්තාදානං ආදාතුකාමෙනුපාලි, භික්ඛුනා පඤ්චහඞ්ගෙහි සමන්නාගතං අත්තාදානං ආදාතබ්බං, කතමෙහි පඤ්චහි: අත්තාදානං ආදාතුකාමෙනුපාලි, භික්ඛුනා එවං පච්චවෙක්ඛිතබ්බං: 'යං ඛො අහං ඉමං අත්තාදානං ආදාතුකාමො, කාලො නු ඛො ඉමං අත්තාදානං ආදාතුං උදාහු නො'ති. සචෙ උපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං 'ජානාති: අකාලො ඉමං අත්තාදානං ආදාතුං, නො කාලො'ති. න තං උපාලි, අත්තාදානං ආදාතබ්බං.

සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: කාලො ඉමං අත්තාදානං ආදාතුං නො අකාලොති. තෙනුපාලි, භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං: 'යං ඛො අහං ඉමං අත්තාදානං ආදාතුකාමො, භූතං නු ඛො ඉමං අත්තාදානං උදාහු නොති. සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'අභූතං ඉමං අත්තාදානං, නො භූත'න්ති. න තං උපාලි, අත්තාදානං ආදාතබ්බං.

සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'භූතං ඉදං අත්තාදානං නො අභූත'න්ති. තෙනුපාලි, භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං: යං ඛො අහං ඉමං අත්තාදානං ආදාතුකාමො, අත්ථසංහිතං නු ඛො ඉදං අත්තාදානං උදාහු නොති. සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'අනත්ථසංහිතං ඉදං අත්තාදානං නො අත්ථසංහිත'න්ති. න තං උපාලි, අත්තාදානං ආදාතබ්බං.

සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: අත්ථසංහිතං ඉදං අත්තාදානං නො අනත්ථසංහිතන්ති. තෙනුපාලි, භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං. ඉමං ඛො අහං අත්තාදානං ආදියමානො ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙ උදාහු නොති. සචෙ උපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: ඉමං ඛො අහං අත්තාදානං ආදියමානො න ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙති. න තං උපාලි, අත්තාදානං ආදාතබ්බං.

සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'ඉමං ඛො අහං අත්තාදානං ආදියමානො ලභිස්සාමි සන්දිට්ඨෙ සම්භත්තෙ භික්ඛූ ධම්මතො විනයතො පක්ඛෙ'ති. තෙනුපාලි, භික්ඛුනා උත්තරිං පච්චවෙක්ඛිතබ්බං: 'ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො භවිස්සති සඞ්ඝස්ස තතොනිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණං උදාහු නොති. සචෙ උපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණන්ති. න තං උපාලි අත්තාදානං ආදාතබ්බං.

සචෙ පනුපාලි, භික්ඛු පච්චවෙක්ඛමානො එවං ජානාති: 'ඉමං ඛො මෙ අත්තාදානං ආදියතො න භවිස්සති සඞ්ඝස්ස තතො නිදානං භණ්ඩනං කලහො විග්ගහො විවාදො සඞ්ඝභෙදො සඞ්ඝරාජී සඞ්ඝවවත්ථානං සඞ්ඝනානාකරණ'න්ති, තං ආදාතබ්බං උපාලි, අත්තාදානං. එවං පඤ්චඞ්ගසමන්නාගතං ඛො උපාලි අත්තාදානං ආදින්නං පච්ඡාපි අවිප්පටිසාරකරං භවිස්සතීති.

5. වහන්ස, අත්තාදානය (ශාසනය ශුද්ධ කරණු කැමති මහණහු විසින් ගණු ලබන අධිකරණය) ගණු කැමති මහණහු විසින් කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ අත්තාදානය ගත යුතු ද ?

උපාලි, අත්තාදානය ගනු කැමති මහණහු විසින් අඞ්ග පසෙකින් යුක්ත වූ අත්තාදානය ගත යුතු යි. කවර පසෙකින යත් : උපාලි, අත්තාදානය ගණු කැමති මහණහු විසින් මෙසේ නුවණින් සලකා බැලිය යුතු යි. ''මම යම් අත්තාදානයක් ගණු කැමැත්තෙම් ද මේ අත්තාදානය ගන්නට සුදුසු කාලය වේ ද, නොහොත් නො වේ දැ'' යි. ඉදින් උපාලි, මහණ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදානය ගැනීමට නො කල් ය, නිසි කල් නො වේ'' ය යි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදානය නො ගත යුතු යි.

උපාලි, ඉදින් වනාහි මහණ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදනය ගැණීමට කල් යැ. නො කල් නො වේ '' ය යි මෙසේ දනී ද, උපාලි, ඒ මහණහු විසින් මත්තෙහි සලකා බැලිය යුතු යි : ''මම් වනාහි යම් අත්තාදනයක් ගණු කැමැත්තෙම් ද මේ අත්තාදනය වුවක් ද නැතහොත් නොවූවක් දැ'' යි. උපාලි, ඉදින් මහණ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදානය නොවූවකි, වූවක් නො වේ'' යැයි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදනය නො ගතයුතු යි.

උපාලි, ඉදින් වනාහි නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදානය වූවකි, නො වූවක් නො වේ'' යැ යි මෙසේ දනී ද, උපාලි, ඒ මහණහු විසින් මත්තෙහි දු සලකා බැලිය යුතු යි : ''මම් වනාහි යම් මේ අත්තාදනයක් ගණු කැමැත්තෙම් ද මේ අත්තාදනය අර්ථසංහිතයෙක් ද නැතහොත් අනර්ථසංහිතයෙක් දැ'' යි, උපාලි, ඉදින් මහණ තෙමේ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදනය අනර්ථසංහිතයකි අර්ථසංහිත නො වේ'' යයි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදනය නොගත යුතු යි.

උපාලි, ඉදින් වනාහි මහණ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදනය අර්ථසංහිත යැ, අනර්ථසංහිත නො වේ'' යැයි මෙසේ දනී ද, උපාලි, ඒ මහණහු විසින් මත්තෙහි නුවණින් සලකා බැලිය යුතු යි : ''මම් වනාහි මේ අත්තාදනය ගන්නෙම් ධර්ම විසින් විනය විසින් පක්ෂ වූ සන්දිට්ඨ සම්භත්ත භික්ෂූන් ලබන්නෙම් ද, නැතහොත් නො ලබන්නෙම් දැයි, උපාලි, ඉදින් මහණ නුවණින් සලකා බලනුයේ ''මම් වනාහි මේ අත්තාදනය ගන්නෙම් ධර්ම විසින් විනය විසින් පක්ෂ වූ සන්දිට්ඨ සම්භත්ත භික්ෂූන් නො ලබන්නෙමි'' යි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදනය නොගත යුතු ය.

උපාලි, ඉදින් වනාහි මහණ නුවණින් සලකා බලනුයේ ''මම් වනාහි මේ අත්තාදනය ගන්නෙම් ධර්ම විසින් විනය විසින් පක්ෂ වූ සන්දිට්ඨසම්භත්ත භික්ෂූන් ලබන්නෙමි'' යි මෙසේ දනී ද, උපාලි, ඒ මහණහු විසින් මත්තෙහි නුවණින් සලකා බැලිය යුතු යි : ''මේ අත්තාදනය මා ගත් කල්හි ඒ හෙතුයෙන් සඞ්ඝයාගේ භණ්ඩනයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් සඞ්ඝභෙදයෙක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයෙක් සඞ්ඝනානාකරණයෙක් වන්නේ ද, නැතහොත් නො වන්නේ දැ'' යි, උපාලි, ඉදින් මහණ නුවණින් සලකා බලනුයේ ''මා මේ අත්තාදනය ගත්කල්හි ඒ හෙතුයෙන් සඞ්ඝයාගේ භණ්ඩනයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් සඞ්ඝභෙදයෙක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයෙක් සඞ්ඝනානාකරණයෙක් වන්නේ යැ'' යි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදනය නොගත යුතු යි.

උපාලි, ඉදින් මහණ නුවණින් සලකා බලනුයේ ''මේ අත්තාදනය මා ගත්කල්හි ඒ හෙතුයෙන් සඞ්ඝයාගේ භණ්ඩනයෙක් කලහයෙක් විග්‍රහයෙක් විවාදයෙක් සඞ්ඝභෙදයෙක් සඞ්ඝරාජියක් සඞ්ඝවවත්ථානයෙක් සඞ්ඝනානාකරණයෙක් නො වන්නේ යැ'' යි මෙසේ දනී ද, උපාලි, ඒ අත්තාදනය ගතයුතු යි. උපාලි, මෙසේ අඞ්ග පසෙකින් යුක්ත වූ අත්තාදනය ගන්නා ලදුයේ පසු දු විපිළිසරබව නොකරන්නක් වන්නේ යි.

6. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොතීති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොති, කතමෙහි පඤ්චහි: සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථා සබ්‍යඤ්ජනා කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථා රූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා, උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො, විනයෙ ඛො පන ඨිතො හොති අසංහීරො, පටිබලො හොති උභො අත්තපච්චත්ථිකෙ අස්සාසෙතුං සඤ්ඤාපෙතුං නිජ්ඣාපෙතුං පෙක්ඛිතුං පසාදෙතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොති.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොති, කතමෙහි පඤ්චහි: පරිසුද්ධකායසමාචාරො හොති, පරිසුද්ධවචීසමාචාරො හොති, පරිසුද්ධාජීවො හොති, පණ්ඩිතො හොති බ්‍යත්තො පටිබලො අනුයුඤ්ජියමානො අනුයොගං දාතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොති.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොති. කතමෙහි පඤ්චහි: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අධිකරණජාතානං භික්ඛූනං බහූපකාරො හොතීති.

7. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බන්ති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: සුත්තං න ජානාති, සුත්තානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච ඨානාඨානකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: සුත්තං ජානාති, සුත්තානුලොමං ජානාති, විනයං ජානාති, විනයානුලොමං ජානාති, ඨානාඨානකුසලො ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං.

Free Distribution www.aathaapi.org

6. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් සමන්වාගත මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වෙයි. කවර පසෙකින යත් : සිල්වත් වූයේ ප්‍රාතිමොක්ෂසංවර-ශීලයෙන් යුක්ත වූයේ ආචාරගොචරසම්පන්න වූයේ අණුමාත්‍ර වරදෙහි බිය දක්නාසුලු වූයේ වෙසෙයි, සිකපද සමාදන් වැ සිකපදයන්හි හික්මෙයි. ඇසූ පිරූ තැන් ඇති ඇසූ දැය රැස් කොට තබා ගැණුම් ඇති බහුශ්‍රැතයෙක් වෙයි. මුල යහපත් වූ මැද යහපත් වූ අවසනැ යහපත් වූ අර්ථ සහිත වූ ව්‍යඤ්ජන සහිත වූ හාත්පසින් පිරිපුන් පිරිසිදු බඹසර ප්‍රකාශ කරණ එබඳු වූ ධර්මයෝ ඔහු විසින් බෙහෙවින් අසන ලද්දහු දරණ ලද්දහු වචනයෙන් පුරුදු කරණ ලද්දහු සිතින් පුනපුනා සලකා බලන ලද්දහු දෘෂ්ටියෙන් මොනොවට අවබොධ කරණ ලද්දහු වෙත් ද, පෙළ වශයෙන් ද අනුව්‍යඤ්ජන වශයෙන් ද උභයප්‍රාතිමොක්ෂය ඔහු විසින් විස්තර වශයෙන් මොනොවට ප්‍රගුණ කරණ ලද්දහු මොනොවට විභාග කොට දැනගන්නා ලද්දහු මොනොවට දැරීම් වශයෙන් පවත්වා ගන්නා ලද්දහු මොනොවට විනිශ්චය කොට දැනගන්නා ලද්දහු වෙත්. විනයයෙහි පැකිළීම් නැත්තේ ස්ථිර වැ පිහිටියේ වෙයි. (ස්වපක්ෂ - විපක්ෂ) දෙපක්ෂයෙහි තමහට සතුරු වූවන් අස්වසන්නට දන්වන්නට කල්පනාවට බස්වන්නට බලවන්නට පහදවන්නට ප්‍රතිබල වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වේ.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වෙයි. කවර පසෙකින යත් : පිරිසිදු වූ කායසමාචාර ඇත්තේ වෙයි, පිරිසිදු වූ වාක්සමාචාර ඇත්තේ වෙයි, පිරිසිදු වූ දිවිපෙවෙත් ඇත්තේ වෙයි, ව්‍යක්ත වූ පණ්ඩිතයෙක් වෙයි, විචාරණු ලබන්නේ විචාළ දෙය කියා දෙන්නට ප්‍රතිබලයෙක් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වේ.

උපාලි, අනෙකුදු අඞ්ග පසකින් යුක්ත වූ මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වෙයි. කවර පසෙකින යත් : වස්තුව දනියි, නිදානය දනියි, ප්‍රඥප්තිය දනියි, පද පෙරළිය දනියි, ගැළපෙන වදන් මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණ උපන් අධිකරණ ඇති භික්ෂූන්ට බොහෝ උපකාර ඇත්තේ වේ.

7. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු විසින් නො පිළිවිසිය යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් නො පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : සූත්‍රය නො දනියි, සූත්‍රානුලොමය නො දනියි, විනය නො දනියි, විනයානුලොමය නො දනියි, කාරණාකාරණයන්හි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත මහණහු විසින් අනුයුඤ්ජනය (පිළිවිසීම) නො කටයුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : සූත්‍රය දනියි, සූත්‍රානුලොමය දනියි, විනය දනියි, විනයානුලොමය දනියි, කාරණා කාරණයන්හි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි.

8. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: ධම්මං න ජානාති, ධම්මානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච පුබ්බාපරකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං කතමෙහි පඤ්චහි: ධම්මං ජානාති, ධම්මානුලොමං ජානාති, විනයං ජානාති, විනයානුලොමං ජානාති, පුබ්බාපරකුසලො ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං.

9. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: වත්ථුං න ජානාති නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, පදපච්චාභට්ඨං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං.

10. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තිං න ජානාති, ආපත්ති සමුට්ඨානං න ජානාති, ආපත්තියා පයොගං න ජානාති, ආපත්තියා වූපසමං න ජානාති, න ආපත්තියා විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: ආපත්තිං ජානාති, ආපත්තිසමුට්ඨානං ජානාති, ආපත්තියා පයොගං ජානාති, ආපත්තියා වූපසමං ජානාති, ආපත්තියා විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං.

11 අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: අධිකරණං න ජානාති, අධිකරණ සමුට්ඨානං න ජානාති, අධිකරණස්ස පයොගං න ජානාති, අධිකරණස්ස වූපසමං න ජානාති, අධිකරණස්ස න විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා නානුයුඤ්ජිතබ්බං.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බං. කතමෙහි පඤ්චහි: අධිකරණං ජානාති, අධිකරණසමුට්ඨානං ජානාති, අධිකරණස්ස පයොගං ජානාති, අධිකරණස්ස වූපසමං ජානාති, අධිකරණස්ස විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා අනුයුඤ්ජිතබ්බන්ති.

අත්තාදානවග්ගො පඤ්චමො

---

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් නො පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : ධර්මය නො දනියි, ධර්මානුලොමය නො දනියි, විනය නො දනියි, විනයානුලොමය නො දනියි, පෙරපසු කථාවන්හි දක්ෂ වූයේත් නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : ධර්මය දනියි, ධර්මානුලොමය දනියි, විනය දනියි, විනයානුලොමය දනියි, පෙරපසු කථාවන්හි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි.

9. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : වස්තුව නො දනියි, නිදනය නො දනියි, ප්‍රඥප්තිය නො දනියි, පද පෙරළිය නො දනියි, ගැළපෙන වදන්මග නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත මහණහු විසින් පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : වස්තුව දනියි, නිදනය දනියි, ප්‍රඥප්තිය දනියි, පදපෙරළිය දනියි, ගැළපෙන වදන්මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි.

10. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : ආපත්තිය නො දනියි, ආපත්තිසමුට්ඨානය නො දනියි, ආපත්තිප්‍රයොගය නො දනියි, ආපත්තිව්‍යුපශමය නො දනියි, ආපත්ති විනිශ්චය කිරීමෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : ආපත්තිය දනියි, ආපත්තිසමුට්ඨානය දනියි, ආපත්තිප්‍රයොගය දනියි, ආපත්ති-ව්‍යුපශමය දනියි, ආපත්තිවිනිශ්චය කිරීමෙහි දක්ෂ වේ. උපාලි. මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි.

11. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : අධිකරණය නො දනියි, අධිකරණ සමුට්ඨානය නො දනියි, අධිකරණ ප්‍රයොගය නො දනියි, අධිකරණ ශමථය නො දනියි, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් නො පිළිවිසිය යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි. කවර පසෙකින යත් : අධිකරණය දනියි, අධිකරණ සමුට්ඨානය දනියි, අධිකරණ ප්‍රයොගය දනියි, අධිකරණ ශමථය දනියි, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහු විසින් පිළිවිසිය යුතු යි.

**පස්වන අත්තාදන වර්ගය නිමි.**

තස්සුද්දානං :

පරිසුද්ධඤ්ච කාලෙන කාරුඤ්ඤෙන[1] ඔකාසෙන ච,
අත්තාදානං අධිකරණං අපරෙහි ච වත්ථු ච;
සුත්තං ධම්මං පුන වත්ථු ච ආපත්ති අධිකරණෙන චාති.

---

## 6. ධුතඞ්ග වග්ගො

1. කති නු ඛො භන්තෙ ආරඤ්ඤකාති?

පඤ්චිමෙ උපාලි, ආරඤ්ඤකා. කතමෙ පඤ්ච: මන්දත්තා මොමූහත්තා ආරඤ්ඤකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො ආරඤ්ඤකො හොති. උම්මාදා චිත්තක්ඛෙපා ආරඤ්ඤකො හොති, වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති ආරඤ්ඤකො හොති, අපි ච අප්පිච්ඡතඤ්ඤෙව නිස්සාය සන්තුට්ඨිඤ්ඤෙව නිස්සාය සල්ලෙඛඤ්ඤෙව නිස්සාය පවිවෙකඤ්ඤෙව නිස්සාය ඉදමත්ථිතඤ්ඤෙව නිස්සාය ආරඤ්ඤකො හොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච ආරඤ්ඤකාති.

2-12. කති නු ඛො භන්තෙ, පිණ්ඩපාතිකාති -පෙ- කති නු ඛො භන්තෙ, පංසුකූලිකාති -පෙ- කති නු ඛො භන්තෙ, රුක්ඛමූලිකාති -පෙ- කති නු ඛො භන්තෙ, සොසානිකාති -පෙ- කති නු ඛො භන්තෙ, අබ්භොකාසිකාති -පෙ- කති නු ඛො භන්තෙ, තෙචීවරිකාති -පෙ- කති නු ඛො භන්තෙ, සපදානචාරිකාති -පෙ- කති නු ඛො භන්තෙ, නෙසජ්ජිකාති -පෙ- කති නු ඛො භන්තෙ, යථාසන්ථතිකාති -පෙ- කති නු ඛො භන්තෙ, එකාසනිකාති -පෙ- කති නු ඛො භන්තෙ, ඛලුපච්ඡාභත්තිකාති -පෙ-?

13. කති නු ඛො භන්තෙ පත්තපිණ්ඩිකාති?

පඤ්චිමෙ උපාලි, පත්තපිණ්ඩිකා, කතමෙ පඤ්ච: මන්දත්තා මොමූහත්තා පත්තපිණ්ඩිකො හොති, පාපිච්ඡො ඉච්ඡාපකතො පත්තපිණ්ඩිකො හොති, උම්මාදා චිත්තක්ඛෙපා පත්තපිණ්ඩිකො හොති, වණ්ණිතං බුද්ධෙහි බුද්ධසාවකෙහීති පත්තපිණ්ඩිකො හොති. අපි ච අප්පිච්ඡතඤ්ඤෙව නිස්සාය සන්තුට්ඨිඤ්ඤෙව නිස්සාය සල්ලෙඛඤ්ඤෙව නිස්සාය පවිවෙකඤ්ඤෙව නිස්සාය ඉදමත්ථිතඤ්ඤෙව නිස්සාය පත්තපිණ්ඩිකො හොති. ඉමෙ ඛො උපාලි, පඤ්ච පත්තපිණ්ඩිකාති.

ධුතඞ්ගවග්ගො ඡට්ඨො

---

තස්සුද්දානං :

ආරඤ්ඤකො පිණ්ඩ පංසු රුක්ඛ සුසාන පඤ්චමං,
අබ්භො තෙචීවරඤ්චෙව සපදාන නෙසජ්ජිකා;
සන්ථතෙකාසනඤ්චෙව ඛලුපච්ඡා පත්තපිණ්ඩිකාති.

---

1. කාරුඤ්ඤං - ම ඡ සං.

එහි නාමාවලිය :

පරිසුද්ධ යැ කාල යැ කාරුඤ්ඤ යැ ඔකාසකම්මය සමග අත්තාදන යැ අධිකරණ යැ අපරයත් සමග වස්තු යැ සුත්ත යැ ධම්ම යැ නැවැත වස්තු යැ අධිකරණය සමග ආපත්ති යි.

---

## 6. ධුතඞ්ග වර්ගය

1. වහන්ස, ආරණ්‍යකයෝ කෙතෙක් ද ?

උපාලි, මේ ආරණ්‍යකයෝ පස්දෙනෙක් වෙති. කවර පස්දෙනෙක යත් : නො දැනීමෙන් මුළාබැවින් ආරණ්‍යක වෙයි. (ප්‍රත්‍යය ප්‍රාර්ථනා නැමැති) ලාමක අදහස් ඇත්තේ ඒ ලාමක අදහසින් මඩනා ලද්දේ ආරණ්‍යක වෙයි. උමතු බැවින් චිත්තවික්ෂෙපයෙන් ආරණ්‍යක වෙයි. බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් වර්ණනා කරණ ලදැයි ආරණ්‍යක වෙයි. වැලිදු අපිස්බව මැ නිසා සතොස්බව මැ නිසා (කෙලෙස්) දුරැලීම මැ නිසා ප්‍රවිවෙකය මැ නිසා මේ පිළිවෙතෙහි ප්‍රයොජන ඇතිබව මැ නිසා ආරණ්‍යක වේ. උපාලි, මොහු පස් දෙන ආරණ්‍යකයෝ යි.

2.–12. වහන්ස, පිණ්ඩපාතිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, පංසුකූලිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, රුක්ඛමූලිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, සොසානිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, අබ්භොකාසිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, තෙචීවරිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, සපදානචාරිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, නෙසජ්ජිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස, යථාසන්ථතිකයෝ කෙතෙක් ද ? . . . වහන්ස එකාසනිකයෝ කෙතෙක් ද ? . . . . වහන්ස ඛලුපච්ඡාභත්තිකයෝ කෙතෙක් ද ? . . . .

13. වහන්ස පත්තපිණ්ඩිකයෝ කෙතෙක් ද ?

උපාලි, මේ පත්තපිණ්ඩිකයෝ පස් දෙනෙක් වෙති. කවර පස් දෙනෙක යත් : නො දැනීමෙන් මුළා බැවින් පත්තපිණ්ඩික වෙයි. ලාමක අදහස් ඇත්තේ ලාමක අදහසින් මඩනා ලද්දේ පත්තපිණ්ඩික වෙයි. උමතුවෙන් චිත්තවික්ෂෙපයෙන් පත්තපිණ්ඩික වෙයි. බුදුවරුන් විසින් බුදුසව්වන් විසින් වර්ණනා කරණ ලදැයි පත්තපිණ්ඩික වෙයි. වැලිදු අපිස්බව මැ නිසා සතොස්බව මැ නිසා කෙලෙස් දුරැලීම මැ නිසා ප්‍රවිවෙකය මැ නිසා මේ පිළිවෙතෙහි ප්‍රයොජන ඇති බව මැ නිසා පත්තපිණ්ඩික වේ. උපාලි, මොහු පස්දෙන පත්තපිණ්ඩිකයෝ යි.

**සවන ධුතඞ්ග වර්ගය නිමි.**

---

එහි නාමාවලිය :

ආරඤ්ඤක යැ පිණ්ඩපාතික යැ පංසුකූලික යැ රුක්ඛමූලික යැ පස්වනු වූ සොසානික යැ අබ්භොකාසික යැ තෙචීවරික යැ සපදාන යැ නෙසජ්ජික යැ යථාසන්ථතික යැ එකාසනික යැ ඛලුපච්ඡාභත්තික යැ පත්තපිණ්ඩික යැ යි.

---

## 7. මුසාවාද වග්ගො

1. කති නු ඛො භන්තෙ මුසාවාදාති?

පඤ්චිමෙ උපාලි, මුසාවාදා කතමෙ පඤ්ච: අත්ථි මුසාවාදො පාරාජිකගාමී, අත්ථි මුසාවාදො සඞ්ඝාදිසෙසගාමී, අත්ථි මුසාවාදො ථුල්ලච්චයගාමී, අත්ථි මුසාවාදො පාචිත්තියගාමී, අත්ථි මුසාවාදො දුක්කටගාමී. ඉමෙ ඛො උපාලි, පඤ්ච මුසාවාදාති.

2. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං වා පවාරණා වා ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද"න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො වා පවාරණා වා කාතබ්බාති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං වා පවාරණං වා ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද"න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො වා පවාරණා වා කාතබ්බා. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, චාවනාධිප්පායො වත්තා හොති, නො වුට්ඨානාධිප්පායො, ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං වා පවාරණං වා ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද"න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො වා පවාරණා වා කාතබ්බා.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං වා පවාරණං වා ඨපෙන්තස්ස "අලං භික්ඛු, මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො වා පවාරණා වා කාතබ්බා. කතමෙහි පඤ්චහි: අපරිසුද්ධකායසමාචාරො හොති. අපරිසුද්ධවචීසමාචාරො හොති. අපරිසුද්ධාජීවො හොති. බාලො හොති අව්‍යත්තො, භණ්ඩනකාරකො හොති කලහකාරකො. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො සඞ්ඝමජ්ඣෙ උපොසථං වා පවාරණං වා ඨපෙන්තස්ස "අලං භික්ඛු මා භණ්ඩනං, මා කලහං, මා විග්ගහං, මා විවාද'න්ති ඔමද්දිත්වා සඞ්ඝෙන උපොසථො වා පවාරණා වා කාතබ්බාති.

3. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො න දාතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො න දාතබ්බො. කතමෙහි පඤ්චහි: ආපත්තානාපත්තිං න ජානාති, ලහුකගරුකං ආපත්තිං න ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං න ජානාති, දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආපත්තිං න ජානාති, සප්පටිකම්මං අප්පටිකම්මං ආපත්තිං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො න දාතබ්බො.

Free Distribution www.aathaapi.org

## 7. මුසාවාද වර්ගය

1. වහන්ස, මුසාවාද කෙතෙක් ද ?

උපාලි, මේ මුසාවාද පසෙකි. කවර පසෙකැ යත්: පරිජියට පැමිණෙන මුසාවාදයෙක් ඇත, සඟවෙසෙසට පැමිණෙන මුසාවාදයෙක් ඇත, ථුලැසියට පැමිණෙන මුසාවාදයෙක් ඇත, පචිතියට පැමිණෙන මුසාවාදයෙක් ඇත, දුකුළාවට පැමිණෙන මුසාවාදයෙක් ඇති. උපාලි, මේ මුසාවාද පසයි.

2. වහන්ස, කෙතෙක් අඞගයෙන් යුක්ත වූ සඟ මැද උපොසථය හෝ පවාරණය හෝ තබන මහණහට : "මහණ, කම් නැත, ඩබර නො කර, කලහ නො කර, විග්‍රහ නො කර, විවාද නො කර යි" (තමාගේ වචනයෙන් ඔහුගේ වචනය) මැඩලා සඞඝයා විසින් උපොසථය හෝ පවාරණය හෝ කටයුතු ද ?

උපාලි, අඞග පසෙකින් යුක්ත වූ සඟ මැද උපොසථය හෝ පවාරණය හෝ තබන මහණහට " මහණ, කම් නැත ඩබර නො කර, කලහ නො කර, විග්‍රහ නො කර, විවාද නො කර "යි (ඔහුගේ වචනය) මැඩලා සඞඝයා විසින් උපොසථය හෝ පවාරණය හෝ කටයුතු යැ. කවර පසෙකිනැ යත්: ලජ්ජා නැත්තේත් වෙයි, අඥනත් වෙයි, අපුවතත් වූයේත් වෙයි, (භික්ෂුභාවයෙන්) චුත කරවන අදහසින් කියන්නේ වෙයි, (ඇවැතින්) නැඟී සිටුවන අදහසින් නො කියන්නේ වේ. උපාලි, මේ අඞග පසින් යුක්ත වූ සඟ මැද උපොසථය හෝ පවාරණය හෝ තබන මහණහට " මහණ, කම් නැත, ඩබර නො කර, කලහ නො කර, විග්‍රහ නො කර, විවාද නො කර "යි (ඔහුගේ වචනය) මැඩලා සඞඝයා විසින් උපොසථය හෝ පවාරණය හෝ කටයුතු යි.

උපාලි, අනෙකුදු අඞග පසෙකින් යුක්ත වූ සඟ මැද උපොසථය හෝ පවාරණය හෝ තබන මහණහට " මහණ, කම් නැත, ඩබර නො කර, කලහ නො කර, විග්‍රහ නො කර, විවාද නො කර "යි (ඔහුගේ වචනය) මැඩ සඞඝයා විසින් උපොසථය හෝ පවාරණය හෝ කටයුතු යැ. කවර පසෙකිනැ යත්: අපිරිසිදු කායසමාචාර ඇත්තේ වෙයි, අපිරිසිදු වාක්සමාචාර ඇත්තේ වෙයි, අපිරිසිදු දිවි පෙවෙත් ඇත්තේ වෙයි, අව්‍යක්ත වූ අඥනයෙක් වෙයි, ඩබර කරන්නේ කලහ කරන්නේ වෙයි. උපාලි, මේ අඞග පසින් යුක්ත වූ සඟ මැද උපොසථය හෝ පවාරණය හෝ තබන්නා වූ මහණහට " මහණ, කම් නැත, ඩබර නො කර, කලහ නො කර, විග්‍රහ නො කර, විවාද නො කර "යි (ඔහුගේ වචනය) මැඩලා සඞඝයා විසින් උපොසථය හෝ පවාරණය හෝ කටයුතුයි.

3. වහන්ස, කෙතෙක් අඞගයෙන් යුක්ත වූ මහණහට අනුයොගය නො දිය යුතු ද ?

උපාලි, අඞග පසෙකින් යුත් මහණහට අනුයොගය නො දිය යුතු යි: කවර පසෙකින යත්: ඇවැත නො ඇවැත නො දනියි, ලුහු ගුරු ඇවැත නො දනියි, සාවසෙස අනවසෙස ඇවැත නො දනියි, තුළුල් නො තුළුල් ඇවැත නො දනියි, පිළියම් සහිත පිළියම් රහිත ඇවැත නො දනී. උපාලි, මේ අඞග පසින් යුත් මහණහට අනුයොගය (චොදනා විචාරණය) නො දිය යුතු යි.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො දාතබ්බො. කතමෙහි පඤ්චහි: ආපත්තානාපත්තිං ජානාති, ලහුකගරුකං ආපත්තිං ජානාති, සාවසෙසානවසෙසං ආපත්තිං ජානාති, දුට්ඨුල්ලා-දුට්ඨුල්ලං ආපත්තිං ජානාති, සප්පටිකම්මං අප්පටිකම්මං ආපත්තිං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො අනුයොගො දාතබ්බොති.

4. කතිහි නු ඛො භන්තෙ ආකාරෙහි භික්ඛු ආපත්තිං ආපජ්ජතීති?

පඤ්චහුපාලි, ආකාරෙහි භික්ඛු ආපත්තිං ආපජ්ජති. කතමෙහි පඤ්චහි: අලජ්ජිතා අඤ්ඤාණතා, කුක්කුච්චපකතතා, අකප්පියෙ කප්පියසඤ්ඤිතා කප්පියෙ අකප්පියසඤ්ඤිතා. ඉමෙහි ඛො උපාලි, පඤ්චහාකාරෙහි භික්ඛු ආපත්තිං ආපජ්ජති.

අපරෙහිපි උපාලි, පඤ්චහාකාරෙහි භික්ඛු ආපත්තිං ආපජ්ජති, කතමෙහි පඤ්චහි: අදස්සනෙන, අස්සවණෙන, පසුත්තකතා, තථාසඤ්ඤී, සතිසම්මොසා. ඉමෙහි ඛො උපාලි, පඤ්චහාකාරෙහි භික්ඛු ආපත්තිං ආපජ්ජතීති.

5. කති නු ඛො භන්තෙ, වෙරානීති?

පඤ්චිමෙ උපාලි, වෙරා. කතමෙ පඤ්ච: පාණාතිපාතො, අදින්නාදානං, කාමෙසු මිච්ඡාචාරො, මුසාවාදො, සුරාමෙරයමජ්ජපමා-දට්ඨානං. ඉමෙ ඛො උපාලි, පඤ්ච වෙරානීති.

6. කති නු ඛො භන්තෙ, වෙරමණියොති?

පඤ්චිමා උපාලි, වෙරමණියො. කතමා පඤ්ච: පාණාතිපාතා වෙරමණී, අදින්නාදානා වෙරමණී, කාමෙසු මිච්ඡාචාරා වෙරමණී, මුසාවාදා වෙරමණී, සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී. ඉමා ඛො උපාලි, පඤ්ච වෙරමණියොති.

7. කති නු ඛො භන්තෙ, බ්‍යසනානීති?

පඤ්චිමානි උපාලි, බ්‍යසනානි. කතමානි පඤ්ච: ඤාතිබ්‍යසනං, භොගබ්‍යසනං, රොගබ්‍යසනං, සීලබ්‍යසනං, දිට්ඨිබ්‍යසනං. ඉමානි ඛො උපාලි, පඤ්චබ්‍යසනානීති.

8. කති නු ඛො භන්තෙ, සම්පදාති?

පඤ්චිමා උපාලි, සම්පදා. කතමා පඤ්ච: ඤාතිසම්පදා, භොගසම්පදා, ආරොග්‍යසම්පදා, සීලසම්පදා, දිට්ඨිසම්පදා. ඉමා ඛො උපාලි, පඤ්ච සම්පදාති.

මුසාවාදවග්ගො සත්තමො

---

තස්සුද්දානං:

මුසාවාදො ච ඔමද්දා අපරෙ අනුයොගො ච ආපත්ති,
අපරෙ වෙරා වෙරමණී බ්‍යසන සම්පදා චෙව සත්තමො,
වග්ගසඞ්ගහොති,

---

උපාලි, අඞ්ග පසකින් යුත් මහණහට අනුයොගය දිය යුතු යි. කවර පසෙකින යත්: ඇවැත නො ඇවැත දනියි, ලුහු ගුරු ඇවැත දනියි, සාවශෙස අනවශෙස ඇවැත දනියි, තුළුල් නො තුළුල් ඇවැත දනියි, පිළියම් සහිත පිළියම් රහිත ඇවැත දනී. උපාලි, මේ අඞ්ග පසින් යුත් මහණහට අනුයොගය දිය යුතු යි.

4. වහන්ස, කෙතෙක් අයුරින් මහණ ඇවැතට පැමිණේ ද?

උපාලි, පස් අයුරෙකින් මහණ ඇවැතට පැමිණේ. කවර පසෙකින යත්: ලජ්ජා නැති බව යැ, අඥාන බව යැ, කුකුසින් මැඩුණු බව යැ, නො කැපයෙහි කැපැයි හැඟීම් ඇති බව යැ, කැපයෙහි නො කැපැයි හැඟීම් ඇති බව යි. උපාලි, මේ පස් අයුරින් මහණ ඇවැතට පැමිණේ.

උපාලි, අනෙකුදු පස් අයුරෙකින් මහණ ඇවැතට පැමිණේ. කවර පසෙකින යත්: (විනයධරයා) නො දැකීමෙන් යැ, (විනයධරයාගේ බස්) නො ඇසීමෙන් යැ, (සහගාර සෙය්‍යාවෙහි) නිදන බැවින් යැ, අකැපයෙහි කැපැයි සංඥ ඇති බැවින් යැ, සිහිමුළායෙනි. උපාලි, මේ පස් අයුරෙන් මහණ ඇවැතට පැමිණේ.

5. වහන්ස, වෛරයෝ කෙතෙක් ද ?

උපාලි, මේ වෛරයෝ පසෙක් වෙති. කවර පසෙක යත්: පණිවා යැ, අයිනාදන යැ, කාමයන්හි වරදවා හැසිරීම යැ, මුසවා යැ, මද ප්‍රමාදයට හේතු වූ රහමෙර යි. උපාලි, මේ පස් වෛරයෝ යි.

6. වහන්ස, විරමණයෝ කෙතෙක් ද ?

උපාලි, මේ විරමණයෝ පසෙක් වෙති. කවර පසෙක යත්: ප්‍රාණඝාතයෙන් වැළකීම යැ, නො දුන් දය ගැන්මෙන් වැළකීම යැ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම යැ, මුසවායෙන් වැළකීම යැ, මදයට හා ප්‍රමාදයට හේතු වූ රහමෙරින් වැළැකීම යි. උපාලි, මේ පස් විරමණයෝ යි.

7. වහන්ස, ව්‍යසනයෝ කෙතෙක් ද ?

උපාලි, මේ ව්‍යසනයෝ පසෙක් වෙති. කවර පසෙක යත්: ඥතිව්‍යසන යැ, භොගව්‍යසන යැ, රොගව්‍යසන යැ, ශීලව්‍යසන යැ, දෘෂ්ටිව්‍යසන යි. මේ පස් ව්‍යසනයෝ යි.

8. වහන්ස, සම්පත්තිහු කෙතෙක් ද ?

උපාලි, මේ සම්පත්තිහු පසෙක් වෙති. කවර පසෙක් ද යත්: ඥති සම්පත්ති යැ, භොගසම්පත්ති යැ, ආරොග්‍යසම්පත්ති යැ, ශීලසම්පත්ති යැ, දෘෂ්ටිසම්පත්ති යි. උපාලි, මේ පස් සම්පත්තිහු වෙත්.

**සත්වන මුසාවාද වර්ගය නිමි.**

---

එහි නාමාවලිය :

මුසාවාද යැ ඔමද්ද යැ අන්‍ය වූ අනුයොග යැ ආපත්ති යැ අන්‍ය වූ වෛර යැ වෙරමණී යැ ව්‍යසන යැ සම්පද යැ යන මොහු සත්වන වර්ගයෙහි සඞ්ගෘහීතයහ.

---

## 8. භික්ඛුනොවාද වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බන්ති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන. කතමෙහි පඤ්චහි: විවරිත්වා කායං භික්ඛුනීනං දස්සෙති: ඌරුං දස්සෙති, අඞ්ගජාතං දස්සෙති, උභො අංසකූටෙ දස්සෙති, ඔභාසති, ගිහී සම්පයොජෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන. කතමෙහි පඤ්චහි: භික්ඛුනීනං අලාභාය පරිසක්කති, භික්ඛුනීනං අනත්ථාය පරිසක්කති, භික්ඛුනීනං අවාසාය පරිසක්කති, භික්ඛුනියො අක්කොසති පරිභාසති, භික්ඛු භික්ඛුනීහි භෙදෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙන. කතමෙහි පඤ්චහි: භික්ඛුනීනං අලාභාය පරිසක්කති, භික්ඛුනීනං අනත්ථාය පරිසක්කති, භික්ඛුනීනං අවාසාය පරිසක්කති, භික්ඛුනියො අක්කොසති පරිභාසති, භික්ඛු භික්ඛුනීහි සම්පයොජෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතස්ස භික්ඛුනො භික්ඛුනීසඞ්ඝෙනෙව කම්මං කාතබ්බං, අවන්දියො සො භික්ඛු භික්ඛුනීසඞ්ඝෙනාති.

2. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බන්ති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බං, කතමෙහි පඤ්චහි: විවරිත්වා කායං භික්ඛූනං දස්සෙති, ඌරුං දස්සෙති, අඞ්ගජාතං දස්සෙති, උභො අංසකූටෙ දස්සෙති, ඔභාසති, ගිහී සම්පයොජෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බං.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං අවාසාය පරිසක්කති, භික්ඛූ අක්කොසති පරිභාසති, භික්ඛුනියො භික්ඛූහි භෙදෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බං.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බං. කතමෙහි පඤ්චහි: භික්ඛූනං අලාභාය පරිසක්කති, භික්ඛූනං අනත්ථාය පරිසක්කති, භික්ඛූනං අවාසාය පරිසක්කති, භික්ඛූ අක්කොසති පරිභාසති, භික්ඛුනියො භික්ඛූහි සම්පයොජෙති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතාය භික්ඛුනියා කම්මං කාතබ්බන්ති.

## 8. භික්ඛුනොවාද වර්ගය

1. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහට භික්ෂුණීසඞ්ඝයා විසින් මැ කර්ම කළයුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්තවූ මහණහට භික්ෂුණී සඞ්ඝයා විසින්ම '' ඒ මහණ භික්ෂුණීසඞ්ඝයා විසින් නොවැඳිය යුත්තෙකැ '' යි (දණ්ඩ) කර්ම කළ යුතු යි. කවර පසෙකින යත් : කය විවෘත කොට භික්ෂුණීන්හට දක්වයි ; වටොර දක්වයි, රහසඟ දක්වයි, දෙඋරහිස් දක්වයි, නොසැබි තෙපුල් කියයි. ගිහියන් හා (මෙවුන්-දම්හි) යොදවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට භික්ෂුණී සඞ්ඝයා විසින් මැ '' ඒ මහණ භික්ෂුණී සඞ්ඝයා විසින් නො වැඳිය යුත්තෙකැ '' යි කර්ම කළයුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහට භික්ෂුණී සඞ්ඝයා විසින් මැ '' ඒ මහණ භික්ෂුණී සඞ්ඝයා විසින් නො වැන්ද යුත්තෙකැ '' යි කර්ම කළයුතුයි. කවර පසෙකින යත් : භික්ෂුණීන්හට අලාභ පිණිස යත්න කෙරෙයි, භික්ෂුණීන්හට අනර්ථ පිණිස යත්න කෙරෙයි, භික්ෂුණීන්ගේ නො විසීම පිණිස (වසන තැනින් නෙරපීම පිණිස) යත්න කෙරෙයි, භික්ෂුණීන්හට ආක්‍රොශ – පරිභව කෙරෙයි, මහණුන් මෙහෙණන් හා බිඳුවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට භික්ෂුණී සඞ්ඝයා විසින් මැ '' ඒ මහණ භික්ෂුණී සඞ්ඝයා විසින් නො වැන්ද යුත්තෙකැ '' යි කර්ම කළ යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහට භික්ෂුණීසඞ්ඝයා විසින් මැ '' ඒ මහණ භික්ෂුණීසඞ්ඝයා විසින් නො වැන්ද යුත්තෙකැ '' යි කර්ම කළ යුතු යි. කවර පසෙකින යත් : භික්ෂුණීන්හට අලාභ පිණිස යත්න කෙරෙයි, භික්ෂුණීන්හට අනර්ථ පිණිස යත්න කෙරෙයි. භික්ෂුණීන්ගේ නො විසීම පිණිස යත්න කෙරෙයි. භික්ෂුණීන්හට ආක්‍රොශ කෙරෙයි. නින්ද කෙරෙයි, මහණුන් මෙහෙණන් හා (මෙවුන්දම්හි) යොදවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහට භික්ෂුණීසඞ්ඝයා විසින් මැ '' ඒ මහණ භික්ෂුණීසඞ්ඝයා විසින් නොවැන්ද යුත්තෙකැ'' යි කර්ම කළ යුතු යි.

2. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු යි. කවර පසෙකින යත් : කය විවෘත කොට භික්ෂූන්හට දක්වයි, වටොර දක්වයි, රහසඟ දක්වයි, දෙ උරහිස් දක්වයි, නොසැබි තෙපුල් කියයි, (මෙහෙණන් හා මෙවුන්දම් සෙවුනා පිණිස) ගිහියන් යොදවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු යි. කවර පසෙකින යත් : භික්ෂූන්හට අලාභ පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්හට අනර්ථ පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්ගේ නො විසීම පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්හට ආක්‍රොශ කෙරෙයි, නින්දා කෙරෙයි, මෙහෙණන් මහණුන් හා බිඳුවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළ යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු යි. කවර පසෙකින යත් : භික්ෂූන්හට අලාභ පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්හට අනර්ථ පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්ගේ නො විසීම පිණිස යත්න කෙරෙයි, භික්ෂූන්හට ආක්‍රොශ කෙරෙයි, නින්දා කෙරෙයි, මෙහෙණන් මහණුන් හා මෙවුන්දම් පිණිස යොදවයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ භික්ෂුණියට කර්ම කළයුතු යි.

3. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, චාවනාධිප්පායො වත්තා හොති, නො වුට්ඨානාධිප්පායො. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො. කතමෙහි පඤ්චහි: අපරිසුද්ධ-කායසමාචාරො හොති, අපරිසුද්ධවචීසමාචාරො හොති, අපරිසුද්ධාජීවො හොති, බාලො හොති අව්‍යත්තො, න පටිබලො අනුයුඤ්ජියමානො අනුයොගං දාතුං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො. කතමෙහි පඤ්චහි: කායිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, වාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, භික්ඛුනීනං අක්කොසකපරිභාසකො හොති, භික්ඛුනීහි සද්ධිං සංසට්ඨො විහරති අනනුලොමිකෙන සංසග්ගෙන. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බො. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, භණ්ඩනකාරකො ච හොති කලහකාරකො, සික්ඛාය න පරිපූරකාරී. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ඨපෙතබ්බොති.

4. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ගහෙතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ගහෙතබ්බො, කතමෙහි පඤ්චහි: කායිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, වාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, කායිකවාචසිකෙන අනාචාරෙන සමන්නාගතො හොති, භික්ඛුනීනං අක්කොසකපරිභාසකො හොති, භික්ඛුනීහි සද්ධිං සංසට්ඨො විහරති අනනුලොමිකෙන සංසග්ගෙන. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ගහෙතබ්බො.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ගහෙතබ්බො. කතමෙහි පඤ්චහි: අලජ්ජී ච හොති, බාලො ච, අපකතත්තො ච, ගමිකො වා හොති, ගිලානො වා. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා භික්ඛුනීනං ඔවාදො න ගහෙතබ්බොති.

3. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතුයි. කවර පසෙකින යත් : ලජ්ජා නැත්තෙක් වෙයි. අඥනත් වෙයි. අපුවතත් වූයේ වෙයි. (භික්ෂු භාවයෙන්) චුත කරවනු කැමැත්තේ කියන්නේ වෙයි. (ඇවැතින්) නැගුටුවන අදහස් ඇත්තේ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි. කවර පසෙකින යත් : අපිරිසිදු කායසමාචාර ඇත්තේ වෙයි. අපිරිසිදු වාක් සමාචාර ඇත්තේ වෙයි. අපිරිසිදු දිවිපෙවෙත් ඇත්තේ වෙයි. අව්‍යක්ත වූ අඥනයෙක් වෙයි. විචාරණු ලබන්නේ අනුයොගය දෙන්නට ප්‍රතිබල නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි. කවර පසෙකින යත් : කායික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. කායිකවාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. භික්ෂුණීන්හට ආක්‍රොශ පරිභව කරන්නේ වෙයි. භික්ෂුණීන් සමඟ නො සුදුසුසේ එක් වැ හැනී වෙසේ. උපාලි, මේ අංග පසින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නො තැබිය යුතු යි. කවර පසෙකින යත් : ලජ්ජා නැත්තේ වෙයි. අඥනත් වෙයි. අපුවතත් වූයේත් වෙයි. කලහ කරන්නේ අරගල කරන්නේත් වෙයි. ශික්ෂාවන් සම්පූර්ණ කරන්නේ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් මෙහෙණන් පිළිබඳ අවවාදය නොතැබිය යුතු යි.

4. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු විසින් භික්ෂුණීන්හට අවවාද කිරීම නොපිළිගත යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් භික්ෂුණීන්ට අවවාද කිරීම නොපිළිගත යුතු යි. කවර පසෙකින යත් : කායික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. කායික වාචසික අනාචාරයෙන් යුක්ත වූයේ වෙයි. භික්ෂුණීන්හට ආක්‍රොශ පරිභව කරන්නේ වෙයි. භික්ෂුණීන් සමඟ නොසුදුසු සේ එක් වැ හැනී වෙසේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් භික්ෂුණීන්හට අවවාද කිරීම නොපිළිගත යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු විසින් භික්ෂුණීන්හට අවවාද කිරීම නො පිළිගත යුතු යි. කවර පසෙකින යත් : ලජ්ජා නැත්තේත් වෙයි. අඥනත් වෙයි. අපුවතත් වූයේත් වෙයි. ගමිකයෙක් හෝ වෙයි. ගිලනෙක් හෝ වෙ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු විසින් භික්ෂුණීන්හට අවවාද කිරීම නොපිළිගත යුතු යි.

5. කතිහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං න සාකච්ඡිතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං න සාකච්ඡිතබ්බො. කතමෙහි පඤ්චහි: න අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙක්ඛෙන පඤ්ඤාක්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙක්ඛෙන විමුත්තික්ඛන්ධෙන සමන්නාගතො හොති, න අසෙක්ඛෙන විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං න සාකච්ඡිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං සාකච්ඡිතබ්බො, කතමෙහි පඤ්චහි: අසෙක්ඛෙන සීලක්ඛන්ධෙන සමන්නාගතො හොති, අසෙක්ඛෙන සමාධික්ඛන්ධෙන -පෙ- පඤ්ඤාක්ඛන්ධෙන -පෙ- විමුත්තික්ඛන්ධෙන -පෙ- විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන සමන්නාගතො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං සාකච්ඡිතබ්බො.

අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං න සාකච්ඡිතබ්බො, කතමෙහි පඤ්චහි: න අත්ථපටිසම්භිදප්පත්තො හොති, න ධම්මපටිසම්භිදප්පත්තො හොති, න නිරුත්ති පටිසම්භිදප්පත්තො හොති, න පටිභානපටිසම්භිදප්පත්තො හොති, න යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං න සාකච්ඡිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං සාකච්ඡිතබ්බො. කතමෙහි පඤ්චහි: අත්ථපටිසම්භිදප්පත්තො හොති, ධම්මපටිසම්භිදප්පත්තො හොති, නිරුත්තිපටිසම්භිදප්පත්තො හොති, පටිභානපටිසම්භිදප්පත්තො හොති, යථාවිමුත්තං චිත්තං පච්චවෙක්ඛති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා සද්ධිං සාකච්ඡිතබ්බොති.

**භික්ඛුනොවාදවග්ගො අට්ඨමො**

---

තස්සුද්දානං:

භික්ඛුනීහෙව කාතබ්බං අපරෙහි තථා දුවෙ,
භික්ඛුනීනං තයො කම්මා න ඔපෙතබ්බා දුවෙ දුකා:
න ගහෙතබ්බා ද්වෙ වුත්තා සාකච්ඡාසු ච ද්වෙ දුකාති.

---

Free Distribution www.aathaapi.org

5. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණහු සමග (කැප අකැපාදිය පිළිබඳ) සාකච්ඡා නො කළ යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා නො කළ යුතු යි. කවර පසෙකින යත් : අශෛක්ෂ වූ ශීලරාශියෙන් යුක්ත වූයේ නො වෙයි, අශෛක්ෂ වූ සමාධිරාශියෙන් යුක්ත වූයේ නො වෙයි, අශෛක්ෂ වූ ප්‍රඥාරාශියෙන් යුක්ත වූයේ නො වෙයි, අශෛක්ෂ වූ විමුක්ති රාශියෙන් යුක්ත වූයේ නො වෙයි, අශෙක්ෂ වූ විමුක්තිඥානදර්ශනරාශියෙන් යුක්ත වූයේ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග (කැප අකැපාදිය පිළිබඳ.) සාකච්ඡා නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා කළ යුතු යි. කවර පසෙකින යත් : අශෛක්ෂ වූ ශීලරාශියෙන් යුක්ත වූයේ වෙයි, අශෛක්ෂ වූ සමාධිරාශියෙන් යුක්ත වූයේ වෙයි, අශෛක්ෂ වූ ප්‍රඥාරාශියෙන් යුක්ත වූයේ වෙයි, අශෛක්ෂ වූ විමුක්තිරාශියෙන් යුක්ත වූයේ වෙයි, අශෛක්ෂ වූ විමුක්තිඥාන දර්ශනරාශියෙන් යුක්ත වූයේ වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා කළ යුතු යි.

උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා නො කළ යුතු යි. කවර පසෙකින යත් : අර්ත්ථකථායෙහි ප්‍රභෙදගත ඥානයට නො පැමිණියේ වෙයි. පෙළදහමෙහි ප්‍රභෙදගතඥානයට නො පැමිණියේ වෙයි, ව්‍යවහාර නිරුක්තියෙහි ප්‍රභෙදගත ඥානයට නො පැමිණියේ වෙයි, ප්‍රතිභාන සඞ්ඛ්‍යාත ප්‍රභෙදගත ඥානයට නො පැමිණියේ වෙයි, (සතර ඵල විමුක්තීන්ගේ වශයෙන්) මිදුනු සිත (එකුන්විසි පස්විකුම් නුවණින්) ප්‍රත්‍යවෙක්ෂා නො කරන්නේ වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග (නාම රූප පරිච්ඡෙදදිය) සාකච්ඡා නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා කළ යුතු යි. කවර පසෙකින යත් : අර්ත්ථකථායෙහි ප්‍රභෙදගතඥානයට පැමිණියේ වෙයි, පෙළදහමෙහි ප්‍රභෙදගතඥානයට පැමිණියේ වෙයි, ව්‍යවහාර නිරුක්තියෙහි ප්‍රභෙද ගතඥානයට පැමිණියේ වෙයි, ප්‍රතිභාන සඞ්ඛ්‍යාත ප්‍රභෙදගතඥානයට පැමිණියේ වෙයි, (සතරඵල විමුක්තීන්ගේ වශයෙන්) මිදුනු සිත (එකුන්විසි පස්විකුම් නුවණින්) ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණහු සමග සාකච්ඡා කළ යුතු යි.

අටවන භික්ඛුනොවාදක වර්ගය නිමි.

---

එහි නාමාවලිය :

භික්ඛුණීහෙවකාතබ්බ යැ එසේම අපරෙහි දෙක යැ භික්ෂුණීන් පිළිබඳ වූ කර්ම තුණ යැ න ඨපෙතබ්බදුක දෙක යැ න ගහෙතබ්බ දෙක යැ සාකච්ඡාවන්හි දුක දෙක යැ.

---

## 9. උබ්බාහිකා වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බොති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො, කතමෙහි පඤ්චහි: න අත්ථකුසලො හොති, න ධම්මකුසලො හොති, න නිරුත්තිකුසලො හොති, න බ්‍යඤ්ජනකුසලො හොති, න පුබ්බාපරකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: අත්ථකුසලො හොති, ධම්මකුසලො හොති, නිරුත්තිකුසලො හොති, බ්‍යඤ්ජනකුසලො හොති, පුබ්බාපරකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

2. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: කොධනො හොති කොධාභිභූතො, මක්ඛී හොති මක්ඛාභිභූතො, පලාසී හොති පලාසාභිභූතො, ඉස්සුකී හොති ඉස්සාභිභූතො, සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො, කතමෙහි පඤ්චහි: න කොධනො හොති න කොධාභිභූතො, න මක්ඛී හොති න මක්ඛාභිභූතො, න පලාසී හොති න පලාසාභිභූතො, න ඉස්සුකී හොති න ඉස්සාභිභූතො, අසන්දිට්ඨිපරාමාසී හොති අනාධානගාහී සුප්පටිනිස්සග්ගී. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

3. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: කුප්පති, බ්‍යාපජ්ජති, පතිත්ථීයති, කොපං ජනෙති, අක්ඛමො හොති අපදක්ඛිණග්ගාහී අනුසාසනිං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: න කුප්පති, න බ්‍යාපජ්ජති, න පතිත්ථීයති, න කොපං ජනෙති, ඛමො හොති පදක්ඛිණග්ගාහී අනුසාසනිං. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

## 9. උබ්බාහිකා වර්ගය

1. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ තෙමේ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි. කවර පසෙකින යත්: අර්ත්ථකථාවෙහි දක්ෂයෙක් නො වෙයි, පාළියෙහි දක්ෂයෙක් නො වෙයි, භාෂාන්තර ව්‍යවහාරයෙහි දක්ෂයෙක් නො වෙයි, බ්‍යඤ්ජනයෙහි දක්‍ෂයෙක් නො වෙයි. පෙර පසු කථාවෙහි දක්ෂයෙක් නො වෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත්: අර්ත්ථකථාවෙහි දක්ෂයෙක් වෙයි, යෙළ දහමෙහි දක්‍ෂයෙක් වෙයි. භාෂාන්තර ව්‍යවහාරයෙහි දක්ෂයෙක් වෙයි, අක්ෂරොච්චාරණ ලෙඛනයෙහි දක්ෂයෙක් වෙයි, පෙර පසු කථාවෙහි දක්ෂයෙක් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතුයි. කවර පසෙකින යත්: කිපෙනසුලු වූයේ ක්‍රොධයෙන් මඩනා ලද්දේ වෙයි, ගුණමකු වූයේ මකු බැවින් මඩනා ලද්දේ වෙයි, යුගග්‍රාහ ඇත්තේ යුගග්‍රාහයෙන් මඩනා ලද්දේ වෙයි, ඊර්ෂ්‍යා ඇත්තේ ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දේ වෙයි, බැහැර ලීමට දුෂ්කර වූ දැඩි වැ අල්වා ගැනීම් ඇත්තා වූ ස්වකීය දෘෂ්ටිය පරාමර්ශනය කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත්: නො කිපෙනසුලු වූයේ ක්‍රොධයෙන් නො මඩනා ලද්දේ වෙයි, ගුණමකු නො වූයේ මකු බැවින් නො මඩනා ලද්දේ වෙයි, යුගග්‍රාහ නැත්තේ යුගග්‍රාහයෙන් නො මඩනා ලද්දේ වෙයි, ඊර්ෂ්‍යා නැත්තේ ඊර්ෂ්‍යාවෙන් නො මඩනා ලද්දේ වෙයි, සුවසේ බැහැරලීම් ඇත්තේ දැඩි වැ අල්වාගැණුම් නැත්තේ ස්වකීය දෘෂ්ටිය පරාමර්ශනය නො කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි. කවර පසෙකින යත්: කිපෙයි, ව්‍යාපාදයට (පියව් බව හැරීමට) පැමිණෙයි, තදබවට පැමිණෙයි, ක්‍රොධය දනවයි, අනුශාසනාව නුහුරට ගන්නේ නො ඉවසන්නෙක් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත්: නො කිපෙයි, ව්‍යාපාදයට නො පැමිණෙයි, තදබවට නො පැමිණෙයි, ක්‍රොධය නො දනවයි, අනුශාසනාව නුහුරට නො ගන්නේ ඉවසන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

4. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: පසාරෙතා හොති නො සාරෙතා, අනොකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, න යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, න යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: සාරෙතා හොති නො පසාරෙතා, ඔකාසකම්මං කාරෙත්වා පවත්තා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා චොදෙතා හොති, යථාධම්මෙ යථාවිනයෙ යථාපත්තියා කාරෙතා හොති, යථාදිට්ඨියා බ්‍යාකත්තා හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

5. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අලජ්ජී ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො, කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ලජ්ජී ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

6. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අකුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය න සම්මන්නිතබ්බො.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, කුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු උබ්බාහිකාය සම්මන්නිතබ්බො.

7. කතීහි නු ඛො භන්තෙ, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡතීති?

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: සුත්තං න ජානාති, සුත්තානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච ඨානාඨානකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති.

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි. කවර පසෙකින යත් : සිහි කොට නො දෙන්නේ (චොදක-චුදිතයන්ගේ කථාව) මුළා කෙරෙයි, අවසර ඉල්වා නො කියන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා නො කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් නො කරවන්නේ වෙයි, ලබ්ධිය වූ පරිද්දෙන් ප්‍රකාශ නො කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත් : (චොදක-චුදිතයන්ගේ කථාව) මුළා නො කරවන්නේ සිහි කොට දෙන්නේ වෙයි, අවසර ඉල්වා කියන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් චොදනා කරන්නේ වෙයි, ධර්මය වූ පරිද්දෙන් විනය වූ පරිද්දෙන් ඇවැත් වූ පරිද්දෙන් කරවන්නේ වෙයි, ලබ්ධිය වූ පරිද්දෙන් ප්‍රකාශ කරන්නේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, ලජ්ජා නැත්තේ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි. මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, ලජ්ජා ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

6. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි, කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, විනයයෙහි අදක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත නො කළ යුතු යි.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, විනයයෙහි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ උබ්බාහිකායෙන් සම්මත කළ යුතු යි.

7. ස්වාමීනි, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සඞ්ඛ්‍යාවට යේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ බාලයෙකැයි සඞ්ඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : සූත්‍රය නො දනී, සූත්‍රානුලොමය නො දනී, විනය නො දනී, විනයානු ලොමය නො දනී. කරුණු නොකරුණු දෙක්හි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ.


Free Distribution www.aathaapi.org

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: සුත්තං ජානාති, සුත්තානුලොමං ජානාති, විනයං ජානාති, විනයානුලොමං ජානාති, ඨානාඨානකුසලො ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

8. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: ධම්මං න ජානාති, ධම්මානුලොමං න ජානාති, විනයං න ජානාති, විනයානුලොමං න ජානාති, න ච පුබ්බාපරකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: ධම්මං ජානාති, ධම්මානුලොමං ජානාති, විනයං ජානාති. විනයානුලොමං ජානාති, පුබ්බාපරකුසලො ච හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

9. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති, කතමෙහි පඤ්චහි: වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, පදපච්චාභට්ඨං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

10. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති, කතමෙහි පඤ්චහි: ආපත්තිං න ජානාති, ආපත්තිසමුට්ඨානං න ජානාති, ආපත්තියා පයොගං න ජානාති, ආපත්තියා වූපසමං න ජානාති, ආපත්තියා විනිච්ඡයකුසලො න හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි? ආපත්තිං ජානාති, ආපත්තිසමුට්ඨානං ජානාති, ආපත්තියා පයොගං ජානාති, ආපත්තියා වූපසමං ජානාති, ආපත්තියා විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

11. අපරෙහිපි උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: අධිකරණං න ජානාති, අධිකරණසමුට්ඨානං න ජානාති, අධිකරණස්ස පයොගං න ජානාති, අධිකරණස්ස වූපසමං න ජානාති, අධිකරණස්ස විනිච්ඡයකුසලො න හොති. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු බාලොත්වෙව සඞ්ඛං ගච්ඡති.

Free Distribution www.aathaapi.org

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : සූත්‍රය දනී, සූත්‍රානුලොමය දනී, විනය දනී, විනයානුලොමය දනී, කරුණු නොකරුණු දෙක්හි දක්ෂ ද වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : ධර්මය නො දනී, ධර්මානුලොමය නො දනී, විනය නො දනී, විනයානුලොමය නො දනී, පූර්වාපරකථාවන්හි අදක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : ධර්මය දනී, ධර්මානුලොමය දනී, විනය දනී, විනයානුලොමය දනී, පූර්වාපර කථාවන්හි දක්ෂ ද වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

9. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ, කවර පසෙකින යත් : වස්තුව (කළ වරද) නො දනී, නිදනය (පැණවූ තැන) නො දනී, ප්‍රඥප්තිය නො දනී, පෙරළිපදය නො දනී, ගැළපෙන වදන්මග නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : වස්තුව දනී, නිදනය දනී, ප්‍රඥප්තිය දනී, පෙරළිපදය දනී, ගැළපෙන වදන්මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

10. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : ආපත්තිය නො දනී, ආපත්ති සමුට්ඨානය නො දනී, ආපත්ති ප්‍රයොගය නො දනී, ආපත්ති ව්‍යුපශමය නො දනී, ආපත්ති විනිශ්චය කිරීමෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : ආපත්තිය දනී, ආපත්ති සමුට්ඨානය දනී, ආපත්තිප්‍රයොගය දනී, ආපත්ති ව්‍යුපශමය දනී, ආපත්ති විනිශ්චය කිරීමෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

11. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : අධිකරණය නො දනී, අධිකරණ සමුට්ඨානය නො දනී, අධිකරණ ප්‍රයොගය නො දනී, අධිකරණ ව්‍යුපශමය නො දනී, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ බාලයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

පඤ්චහුපාලි, අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති. කතමෙහි පඤ්චහි: අධිකරණං ජානාති, අධිකරණසමුට්ඨානං ජානාති, අධිකරණස්ස පයොගං ජානාති, අධිකරණස්ස වූපසමං ජානාති, අධිකරණස්ස විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු පණ්ඩිතොත්වෙව සඞ්ඛං ගච්ඡති.

උබ්බාහිකාවග්ගො නවමො

---

තස්සුද්දානං:

න අත්ථකුසලො චෙව කොධනො කුපපතී ච යො,
පසාරෙතා ජඤ්ඤගති න කුසලො තථෙව ච.

සුත්තං ධම්මඤ්ච වත්ථුඤ්ච ආපත්තිං අධිකරණං,
ද්වෙ ද්වෙ පකාසිතා සබ්බෙ කණ්හසුක්කා විජානථාති.

---

## 10. අධිකරණවූපසම වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුන්ති?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ආපත්තිං න ජානාති, ආපත්තිසමුට්ඨානං න ජානාති, ආපත්තියා පයොගං න ජානාති, ආපත්තියා වූපසමං න ජානාති, ආපත්තියා න විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ආපත්තිං ජානාති, ආපත්තිසමුට්ඨානං ජානාති, ආපත්තියා පයොගං ජානාති, ආපත්තියා වූපසමං ජානාති, ආපත්තියා විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

2. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: අධිකරණං න ජානාති, අධිකරණසමුට්ඨානං න ජානාති, අධිකරණස්ස පයොගං න ජානාති, අධිකරණස්ස වූපසමං න ජානාති, අධිකරණස්ස න විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ. කවර පසෙකින යත් : අධිකරණය දනියි, අධිකරණ සමුට්ඨානය දනියි, අධිකරණප්‍රයොගය දනියි, අධිකරණව්‍යුපශමය දනියි, අධිකරණවිනිශ්චයෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ පණ්ඩිතයෙක් මැ යි සංඛ්‍යාවට යේ.

නවවන උබ්බාහිකවර්ගය නිමි.

---

එහි නාමාවලිය :

න අත්ථකුසල යැ කොධන යැ කුප්පති යැ පසාරෙතා යැ ඡන්දගති යැ එසේ මැ අකුසල යැ.

සුත්ත යැ ධම්ම යැ වත්ථු යැ ආපත්ති යැ අධිකරණ යැ යන සියල්ල දෙක දෙක බැගින් වදරණ ලදි. කණ්හසුක්ක වශයෙන් දනිවු.

---

## 10. අධිකරණවූපසම වර්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : ආපත්තිය නො දනියි, ආපත්ති සමුට්ඨානය නො දනියි, ආපත්ති ප්‍රයොගය නො දනියි, ආපත්ති ව්‍යුපශමය නො දනියි, ආපත්ති විනිශ්චය කිරීමෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ආපත්තිය දනියි, ආපත්ති සමුට්ඨානය දනියි, ආපත්ති ප්‍රයොගය දනියි, ආපත්ති ව්‍යුපශමය දනියි, ආපත්ති විනිශ්චය කිරීමෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ, කවර පසෙකින යත් : අධිකරණය නො දනියි, අධිකරණ සමුට්ඨානය නො දනියි, අධිකරණ ප්‍රයොගය නො දනියි අධිකරණ ව්‍යුපශමය නො දනියි, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: අධිකරණං ජානාති, අධිකරණසමුට්ඨානං ජානාති, අධිකරණස්ස පයොගං ජානාති, අධිකරණස්ස වූපසමං ජානාති, අධිකරණස්ස විනිච්ඡයකුසලො හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

3. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අලජ්ජී ච හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ලජ්ජී ච හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

4. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අප්පස්සුතො ච හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, බහුස්සුතො ච හොති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

5. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: වත්ථුං න ජානාති, නිදානං න ජානාති, පඤ්ඤත්තිං න ජානාති, පදපච්චාභට්ඨං න ජානාති, අනුසන්ධිවචනපථං න ජානාති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: වත්ථුං ජානාති, නිදානං ජානාති, පඤ්ඤත්තිං ජානාති, පදපච්චාභට්ඨං ජානාති, අනුසන්ධිවචනපථං ජානාති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

6. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, අකුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

Free Distribution www.aathaapi.org

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : අධිකරණය දනියි, අධිකරණ සමුට්ඨානය දනියි, අධිකරණ ප්‍රයොගය දනියි, අධිකරණ ව්‍යුපශමය දනියි, අධිකරණ විනිශ්චයෙහි දක්ෂ වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වෙයි. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි. ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, ලජ්ජා නැත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, ලජ්ජා ඇත්තේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, අල්පශ්‍රැතයෙක් ද වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, බහුශ්‍රැතයෙක් ද වේ. උපාලි, මේ අඞ්ගපසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : වස්තුව නො දනියි, නිදානය නො දනියි, ප්‍රඥප්තිය නො දනියි, පෙරළි පදය නො දනියි, ගැළපෙන වදන්මග නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : වස්තුව දනියි, නිදානය දනියි, ප්‍රඥප්තිය දනියි, පෙරළි පදය දනියි, ගැළපෙන වදන්මග දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

6. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, විනයෙහි අදක්ෂත් වේ. උපාලි, මේ අඞ්ගපසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, කුසලො ච හොති විනයෙ. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

7. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, පුග්ගලගරුකො හොති නො සඞ්ඝගරුකො. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, සඞ්ඝගරුකො හොති නො පුග්ගලගරුකො. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං.

8. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, ආමිසගරුකො හොති නො සද්ධම්මගරුකො. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු නාලං අධිකරණං වූපසමෙතුං.

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුං. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, සද්ධම්මගරුකො හොති නො ආමිසගරුකො. ඉමෙහි ඛො උපාලි, පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භික්ඛු අලං අධිකරණං වූපසමෙතුන්ති.

9. කතීහි නු ඛො භන්තෙ ආකාරෙහි සඞ්ඝො භිජ්ජතීති?

පඤ්චහුපාලි ආකාරෙහි සඞ්ඝො භිජ්ජති. කතමෙහි පඤ්චහි: කම්මෙන, උද්දෙසෙන, වොහරන්තො, අනුස්සාවණෙන, සලාකග්ගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහාකාරෙහි සඞ්ඝො භිජ්ජතීති.

10. සඞ්ඝරාජි සඞ්ඝරාජීති භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො? කිත්තාවතා ච පන සඞ්ඝරාජි චෙව හොති සඞ්ඝභෙදො චාති?

පඤ්ඤත්තෙතං උපාලි මයා ආගන්තුකානං භික්ඛූනං ආගන්තුකවත්තං, එවං සුපඤ්ඤත්තෙ ඛො උපාලි මයා සික්ඛාපදෙ ආගන්තුකා භික්ඛු ආගන්තුකවත්තෙ න වත්තන්ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො. පඤ්ඤත්තෙතං උපාලි මයා ආවාසිකානං භික්ඛූනං ආවාසිකවත්තං. එවං සුපඤ්ඤත්තෙ ඛො උපාලි මයා සික්ඛාපදෙ ආවාසිකා භික්ඛු ආවාසිකවත්තෙ න වත්තන්ති, එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො. පඤ්ඤත්තෙතං උපාලි මයා

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, විනයෙහි දක්ෂ වූයේත් වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

7. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, පුද්ගලගරුක වූයේ සඞ්ඝගරුක නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, සඞ්ඝ ගරුක වූයේ පුද්ගල ගරුක නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ තෙමේ අධිකරණය සන්හිඳුවන්නට නිසි නො වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වේෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, ආමිෂ ගරුක වූයේ සද්ධර්ම ගරුක නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නො නිසි වේ.

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ. කවර පසෙකින යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වේෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, සද්ධර්ම ගරුක වූයේ ආමිෂ ගරුක නො වේ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ අධිකරණය සන්හිඳුවන්නට නිසි වේ.

9. වහන්ස, කෙතෙක් අයුරින් සඞ්ඝයා බිඳේ ද ?

උපාලි, පස් අයුරකින් සඞ්ඝයා බිඳේ. කවර පසෙකින යත් : කර්මයෙන් යැ උපදේශයෙන් යැ (අටළොස් භෙදකර වස්තු) වැවහැර කරමින් යැ, අනුශ්‍රාවණයෙන් යැ, සලාකග්‍රාහයෙන් යැ, උපාලි, මේ පස් අයුරින් සඞ්ඝයා බිඳේ.

10. වහන්ස, සඞ්ඝරාජි යැ සඞ්ඝරාජි යැ යි කියනු ලැබෙ. වහන්ස, කොපමණකින් සඞ්ඝරාජිය වේ ද ? සඞ්ඝභෙදය නො වේ ද ? කොපමණකින් සඞ්ඝරාජියත් සඞ්ඝභෙදයත් වේ ද ?

උපාලි, මා විසින් ආගන්තුක භික්ෂූන්ට මේ ආගන්තුක වත පණවන ලදී. උපාලි, මෙසේ මා විසින් සිකපද මොනොවට පණවන ලද කල්හි ආගන්තුක භික්ෂූහු ආගන්තුක වතෙහි නො පවතිත් ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, සඞ්ඝභෙදය නො වේ. උපාලි, මා විසින් ආවාසික භික්ෂූන්ට මේ ආවාසික වත පණවන ලදී. උපාලි, මෙසේ මා විසින් සිකපද මොනොවට පණවන ලද කල්හි ආවාසික භික්ෂූහු ආවාසික වතෙහි නො පවතිත් ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, සඞ්ඝභෙදය නො වේ. උපාලි, මා විසින් භික්ෂූන්හට

භික්ඛූනං භත්තග්ගෙ භත්තග්ගවත්තං යථාබුඩ්ඪං යථාරත්තං යථාපතිරූපං අග්ගාසනං අග්ගොදකං අග්ගපිණ්ඩං. එවං සුපඤ්ඤත්තෙන ඛො උපාලි මයා සික්ඛාපදෙ නවා භික්ඛූ භත්තග්ගෙ ථෙරානං භික්ඛූනං ආසනං පටිබාහන්ති. එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො. පඤ්ඤත්තං උපාලි මයා භික්ඛූනං සෙනාසනෙ සෙනාසනවත්තං යථාබුඩ්ඪං යථාරත්තං යථාපතිරූපං, එවං සුපඤ්ඤත්තෙන ඛො උපාලි මයා සික්ඛාපදෙ නවා භික්ඛූ ථෙරානං භික්ඛූනං ආසනං පටිබාහන්ති. එවම්පි ඛො උපාලි සඞ්ඝරාජි හොති නො ච සඞ්ඝභෙදො. පඤ්ඤත්තං උපාලි මයා භික්ඛූනං අන්තොසීමාය එකං උපොසථං එකං පවාරණං එකං සඞ්ඝකම්මං එකං කම්මාකම්මං. එවං සුපඤ්ඤත්තෙන ඛො උපාලි මයා සික්ඛාපදෙ තත්ථෙව අන්තොසීමාය ආවෙණිභාවං කරිත්වා ගණං බන්ධිත්වා ආවෙණිඋපොසථං කරොන්ති ආවෙණිපවාරණං කරොන්ති, ආවෙණිසඞ්ඝකම්මං කරොන්ති, ආවෙණිකම්මාකම්මානි කරොන්ති. එවං ඛො උපාලි සඞ්ඝරාජි චෙව හොති සඞ්ඝභෙදො චාති.

අධිකරණවූපසමවග්ගො දසමො

---

තස්සුද්දානං :

ආපත්තිං අධිකරණං ඡන්ද අප්පස්සුතෙන ච,
වත්ථුස්ස අකුසලො ච පුග්ගලො ආමිසෙන ච;
භිජ්ජති සඞ්ඝරාජි ච සඞ්ඝභෙදො තථෙව චාති.

---

## 11. සඞ්ඝභෙදක වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡොති?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය දිට්ඨිං කම්මෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

2. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය දිට්ඨිං උද්දෙසෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

බත්හලෙහි සඟ මහලු පිළිවෙළින් තෙර පිළිවෙළින් සුදුසු පිළිවෙළින් අග්‍රාසනය දීම අග්‍රොදකය දීම අග්‍රපිණ්ඩය දීම යන මේ බත්හල පිළිබඳ වත පණවන ලදී. උපාලි, මා විසින් මෙසේ සිකපද මොනොවට පණවනලද කල්හි නවක භික්ෂූහු බත්හලෙහි ස්ථවිර භික්ෂූන්හට ථෙරාසනය වළකත් ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, සඞ්ඝභෙදය නො වේ. උපාලි, මා විසින් භික්ෂූන්හට සෙනස්නෙහි සගමහලු පිළිවෙළින් තෙර පිළිවෙළින් සුදුසු පිළිවෙළින් මේ සෙනසුන් වත පණවන ලදී. උපාලි, මා විසින් මෙසේ මොනොවට සිකපද පණවන ලද කල්හි නවක භික්ෂූහු ස්ථවිර භික්ෂූන්හට සෙනසුන වළකත් ද, උපාලි, මෙසේත් සඞ්ඝරාජිය වෙයි, සඞ්ඝභෙදය නො වේ. උපාලි, මා විසින් භික්ෂූන්හට ඇතුළු සීමායෙහි තෙල එක් වැ කරණ පොහොය එක් වැ කරණ පවුරුණු එක් වැ කරණ සඞ්ඝකර්ම එක් වැ කරණ කුදුමහත් කර්ම පණවන ලදි. උපාලි, මා විසින් මෙසේ මොනොවට සිකපද පණවනලද කල්හි එම සීමාව තුළ ආවෙණිභාවය (වෙන්වීම් බව) කොට ගණබන්ධනය කොට (පිරිස වෙන්කොට) වෙන් වැ පොහොය කරත් ද, වෙන් වැ පවුරුණු කරත් ද, වෙන් වැ සඞ්ඝකර්ම කරත් ද, වෙන් වැ කුදුමහත් විනයකර්ම කරත් ද, උපාලි, මෙසේ සඞ්ඝරාජියත් වෙයි, සඞ්ඝභෙදයත් වේ.

දසවන අධිකරණ වූපසම වර්ගය නිමි.

---

එහි නාමාවලිය :

ආපත්ති යැ අධිකරණ යැ ඡන්දගති යැ අප්පස්සුතය සමග වත්ථු යැ ආමිසය සමග අකුසල යැ පුග්ගල යැ භිජ්ජති යැ එසේ ම සඞ්ඝරාජි යැ සඞ්ඝභෙද යැ යි.

---

## 11. සඞ්ඝභෙදකවග්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ ද ?

උපාලි,අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මෙ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ පිහිටුවා කර්ම කිරීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මෙ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි දෘෂ්ටිය තර වැ පිහිටුවා උද්දෙසීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝ භෙදකයෙක් වේ.

3. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය දිට්ඨිං වොහරන්තො. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

4. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති, දීපෙති ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය දිට්ඨිං අනුස්සාවනෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

5. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය දිට්ඨිං සලාකග්ගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

6. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය ඛන්තිං කම්මෙන -පෙ- විනිධාය ඛන්තිං උද්දෙසෙන -පෙ- විනිධාය ඛන්තිං වොහරන්තො -පෙ- විනිධාය ඛන්තිං අනුස්සාවනෙන -පෙ- විනිධාය ඛන්තිං සලාකග්ගාහෙන ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

7. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය රුචිං කම්මෙන -පෙ- විනිධාය රුචිං උද්දෙසෙන -පෙ- විනිධාය රුචිං වොහරන්තො -පෙ- විනිධාය රුචිං අනුස්සාවනෙන -පෙ- විනිධාය රුචිං සලාකග්ගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො.

8. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධූපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, විනිධාය සඤ්ඤං

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත්: උපාලි, මෙ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ පිහිටුවා උදෙසීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත්: උපාලි, මේ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ පිහිටුවා අනුශ්‍රාවණයෙන් යැ. උපාලි මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත්: උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තරවැ පිහිටුවා ලඟ ගැන්වීමෙන් යැ, උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

6. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින පත්: උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, ඉවසීම තර වැ පිහිටුවා කර්මයෙන් යැ . . . . . ඉවසීම තර වැ පිහිටුවා උදෙසීමෙන් යැ . . . ඉවසීම තර වැ පිහිටුවා බැවහර කරමින් යැ . . . ඉවසීම තර වැ පිහිටුවා ඇස්වීමෙන් යා . . . ඉවසීම තර වැ පිහිටුවා ලඟ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

7. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත්: උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, රුචිය තර වැ පිහිටුවා කර්මයෙන් යැ . . . රුචිය තර වැ පිහිටුවා උදෙසීමෙන් යැ . . . රුචිය තර වැ පිහිටුවා බැවහර කරමින් යැ . . . . රුචිය තර වැ පිහිටුවා ඇස්වීමෙන් යැ . . . රුචිය තර වැ පිහිටුවා ලඟ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ. කවර පසෙකින යත්: උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි,

කම්මෙන -පෙ- විනිධාය සඤ්ඤං උද්දෙසෙන -පෙ- විනිධාය සඤ්ඤං වොහරන්තො -පෙ- විනිධාය සඤ්ඤං අනුස්සාවණෙන -පෙ- විනිධාය සඤ්ඤං සලාකග්ගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො ආපායිකො නෙරයිකො කප්පට්ඨො අතෙකිච්ඡොති.

සඞ්ඝභෙදකවග්ගො එකාදසමො

---

තස්සුද්දානං :

විනිධාය දිට්ඨිං කම්මෙන උද්දෙසෙන වොහාරෙන ච,
අනුස්සාවණෙන සලාකෙන පඤ්චෙතෙ දිට්ඨිනිස්සිතා ;
ඛන්ති රුචි ච සඤ්ඤා ච[1] තයො තෙ පඤ්චධා නයාති

---

## 12. දුතිය සඞ්ඝභෙදක වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡොති ?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි : ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය දිට්ඨිං කම්මෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

2. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි : ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති. ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය දිට්ඨිං උද්දෙසෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො, න කප්පට්ඨො න අතෙකිච්ඡො.

3. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරෙයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි : ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය දිට්ඨිං වොහරන්තො. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

---

1. ඛන්තිං රුචිං ච සඤ්ඤඤ්ච - ම.ඡ.සං.

හැඟීම තර වැ පිහිටුවා කර්මයෙන් යැ . . . හැඟීම තරවැ පිහිටුවා උදෙසීමෙන් යැ, . . . හැඟීම තර වැ පිහිටුවා බැවහර කරමින් යැ . . . හැඟීම තර වැ පිහිටුවා ඇස්වීමෙන් යැ . . . හැඟීම තර වැ පිහිටුවා ලහ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පයක් ආයු ඇති පිළියම් නො කටහැකි නිරිසත් වැ අපායෙහි උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

එකොළොස්වන සඞ්ඝභෙදක වර්ගය නිමි.

---

එහි නාමාවලිය :

දෘෂ්ටිය තර වැ පිහිටුවා කර්මයෙන් යැ, දෘෂ්ටිය තර වැ පිහිටුවා උදෙසීමෙන් යැ, දෘෂ්ටිය තර වැ පිහිටුවා බැවහර කරමින් යැ, දෘෂ්ටිය තර වැ පිහිටුවා ඇස්වීමෙන් ය , දෘෂ්ටිය තර වැ පිහිටුවා ලහ ගැන්වීමෙන් යැ. මේ පස්දෙන දෘෂ්ටි නිඃශ්‍රිතයහ. ඛන්ති, රුචි, සඤ්ඤ යන තුණ ඇසිරිකළ පස බැගින් නය ද වේ.

---

## 12. දුතියසඞ්ඝභෙදක වර්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ මහණ කල්පස්ථායී නොවූ නිරිසත් නො වූ පිළියම් කළ හැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝ භෙදකයෙක් වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ නො පිහිටුවා කර්මයෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළ හැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

2. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ නො පිහිටුවා උදෙසීමෙන් යැ. උපාලි මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

3. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින් ද යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ නො පිහිටුවා බැවහර කරමින් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි, අපායෙහි නොඋපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

4. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය දිට්ඨිං අනුස්සාවණෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

5. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය දිට්ඨිං සලාකගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

6. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය ඛන්තිං කම්මෙන -පෙ- අවිනිධාය ඛන්තිං උද්දෙසෙන -පෙ- අවිනිධාය ඛන්තිං වොහරන්තො -පෙ- අවිනිධාය ඛන්තිං අනුස්සාවණෙන -පෙ- අවිනිධාය ඛන්තිං සලාකගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

7. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය රුචිං කම්මෙන -පෙ- අවිනිධාය රුචිං උද්දෙසෙන -පෙ- අවිනිධාය රුචිං වොහරන්තො -පෙ- අවිනිධාය රුචිං අනුස්සාවණෙන -පෙ- අවිනිධාය රුචිං සලාකගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො.

8. අපරෙහිපි උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡො. කතමෙහි පඤ්චහි: ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අවිනිධාය සඤ්ඤං කම්මෙන -පෙ- අවිනිධාය සඤ්ඤං උද්දෙසෙන -පෙ- අවිනිධාය සඤ්ඤං වොහරන්තො -පෙ- අවිනිධාය සඤ්ඤං අනුස්සාවණෙන -පෙ- අවිනිධාය සඤ්ඤං සලාකගාහෙන. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සඞ්ඝභෙදකො න ආපායිකො න නෙරයිකො න කප්පට්ඨො න අතෙකිච්ඡොති.

**දුතියසඞ්ඝභෙදකවග්ගො ද්වාදසමො**

4. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදන සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ නො පිහිටුවා ඇස්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ **නිරිසත්** නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

5. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, දෘෂ්ටිය තර වැ නො පිහිටුවා ලහ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වේ.

6. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්තවූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනාසුලු සඞ්ඝභෙදකයෙක් වෙයි, කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, ඉවසීම තර වැ නො පිහිටුවා කර්මයෙන් යැ . . . ඉවසීම තර වැ නො පිහිටුවා උදෙසීමෙන් යැ . . . ඉවසීම තර වැ නො පිහිටුවා බැවහර කරමින් යැ . . . ඉවසීම තර වැ නො පිහිටුවා ඇස්වීමෙන් යැ . . . ඉවසීම තර වැ නො පිහිටුවා ලහ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

7. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි, රුචිය තර වැ නො පිහිටුවා කර්මයෙන් යැ . . . රුචිය තර වැ නො පිහිටුවා උදෙසීමෙන් යැ . . . රුචිය තර වැ නො පිහිටුවා බැවහර කිරීමෙන් යැ . . . රුචිය තර වැ නො පිහිටුවා ඇස්වීමෙන් යැ . . . රුචිය තර වැ නො පිහිටුවා ලහ ගැන්වීමෙන් යැයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

8. උපාලි, අනෙකුදු අඞ්ග පසෙකින් යුක්ත වූ මහණ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වෙයි. කවර පසෙකින යත් : උපාලි, මෙ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි දක්වයි, ධර්මය අධර්ම යැ යි දක්වයි, අවිනය විනය යැ යි දක්වයි, විනය අවිනය යැ යි දක්වයි. හැඟීම තර වැ නො පිහිටුවා කර්මයෙන් යැ . . . හැඟීම තර වැ නො පිහිටුවා උදෙසීමෙන් යැ . . . හැඟීම තර වැ නො පිහිටුවා බැවහර කිරීමෙන් යැ . . . හැඟීම තර වැ නො පිහිටුවා ඇස්වීමෙන් යැ . . . හැඟීම තර වැ නො පිහිටුවා ලහ ගැන්වීමෙන් යැ. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ භික්ෂු තෙමේ කල්පස්ථායී නො වූ නිරිසත් නො වූ පිළියම් කළහැකි අපායෙහි නො උපදනා සුලු සඞ්ඝභෙදකයෙක් වේ.

**දෙළොස්වන දුතිය සඞ්ඝභෙදක වර්ගය නිමි.**

---

**19—ඒ 30906 (77/12)**

Free Distribution www.aathaapi.org

තස්සුද්දානං :

අවිනිධාය දිට්ඨිං තමෙමන උද්දෙසෙන වොහාරෙන ච,
අනුස්සාවණෙන සලාකෙන පඤ්චෙතෙ දිට්ඨිනිස්සිතා.

ඛන්ති රුචි ච සඤ්ඤා ච තයො තෙ පඤ්චධා නයා,
හෙට්ඨිමෙ කණ්හපක්ඛම්හි සමවීසවිධී යථා;
තථෙව සුක්කපක්ඛම්හි සමවීසති ජානථාති.

---

## 13. ආවාසික වග්ගො

1. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති :

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි : ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, සඞ්ඝිකං පුග්ගලිකපරිභොගෙන පරිභුඤ්ජති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

2. පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි : න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, සඞ්ඝිකං න පුග්ගලිකපරිභොගෙන පරිභුඤ්ජති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො ආවාසිකො භික්ඛු යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

3. කති නු ඛො භන්තෙ අධම්මිකා විනයබ්‍යාකරණාති?

පඤ්චිමෙ උපාලි අධම්මිකා විනයබ්‍යාකරණා. කතමෙ පඤ්ච : ඉධුපාලි භික්ඛු අධම්මං ධම්මොති පරිණාමෙති, ධම්මං අධම්මොති පරිණාමෙති, අවිනයං විනයොති පරිණාමෙති, විනයං අවිනයොති පරිණාමෙති, අපඤ්ඤත්තං පඤ්ඤපෙති, පඤ්ඤත්තං සමුච්ඡින්දති. ඉමෙ ඛො උපාලි පඤ්ච අධම්මිකා විනයබ්‍යාකරණා.

4. පඤ්චිමෙ උපාලි ධම්මිකා විනයබ්‍යාකරණා. කතමෙ පඤ්ච : ඉධුපාලි භික්ඛු අධම්මං අධම්මොති පරිණාමෙති, ධම්මං ධම්මොති පරිණාමෙති, අවිනයං අවිනයොති පරිණාමෙති. විනයං විනයොති පරිණාමෙති, අපඤ්ඤත්තං න පඤ්ඤපෙති, පඤ්ඤත්තං න සමුච්ඡින්දති. ඉමෙ ඛො උපාලි පඤ්ච ධම්මිකා විනයබ්‍යාකරණාති.

5. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි පඤ්චහි : ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, උද්දිට්ඨා-නුද්දිට්ඨං න ජානාති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

එහි නාමාවලිය :

දෘෂ්ටිය තර වැ නො පිහිටුවා කර්මයෙන් යැ, උදෙසීමෙන් යැ, බැවහර කරමින් යැ, ඇස්වීමෙන් යැ, ලඟ ගැන්වීමෙන් යැ යි. මේ පස් දෙන දෘෂ්ටිනිඃශ්‍රිතයහ. ඛන්ති, රුචි, සඤ්ඤ යන මේ ත්‍රිකය ද පස පස බැගින් නය ද වේ.

යට සඳහන් කෘෂ්ණ පක්ෂයෙහි සම විසිවැදෑරුම් යෙදීම යම්සේ ද එසේම ශුක්ල පක්ෂයෙහි සම විසිවැදෑරුම් කොට දැන ගනිවු.

---

## 13. ආවාසික වර්ගය

1. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ ආවාසික මහණ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි බහා තැබුයේ වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ ආවාසික මහණ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද එසේ නරකයෙහි බහා තැබුයේ වෙයි. කවර පසෙකින් ද යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, සඟසතුවූවක් පෞද්ගලික පරිභොගයෙන් පරිභොග කෙරෙයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ ආවාසික මහණ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි බහා තැබුයේ නිරයෙහි උපදනේ වේ.

2. උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ ආවාසික මහණ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි බහා තැබුයේ වෙයි, කවර පසෙකිනැ යත් : ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, සඟසතු වූවක් පෞද්ගලික පරිභොගයෙන් පරිභොග නො කරයි. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ ආවාසික මහණ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි උපදනේ වේ.

3. වහන්ස, නො දැහැමි විනය පැණ විසඳීම්හු කෙතෙක් ද ?

උපාලි, මේ නො දැහැමි විනය පැණ විසඳීම්හු පසෙකි. කවර පසෙකැ යත් : උපාලි, මේ සස්නෙහි මහණ අධර්මය ධර්ම යැ යි කියයි, ධර්මය අධර්ම යැ යි කියයි, අවිනය විනය යැ යි කියයි, විනය අවිනය යැ යි කියයි, නො පණවන ලද්දක් පණවයි, පණවන ලද්දක් සිඳී. උපාලි, මේ නො දැහැමි විනය පැණ විසඳීම් පස යි.

4. උපාලි, මේ දැහැමි විනය පැණ විසඳීම්හු පසෙකි. කවර පසෙක යත් : උපාලි, මෙ සස්නෙහි මහණ අධර්මය අධර්ම යැ යි කියයි, ධර්මය ධර්ම යැ යි කියයි, අවිනය අවිනය යැ යි කියයි, විනය විනය යැ යි කියයි, නො පණවන ලද්දක් නො පණවයි, පණවන ලද්දක් නො සිඳී. උපාලි, මේ දැහැමි විනය පැණ විසඳීම් පස යි.

5. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ භත්තුද්දෙසක ගෙණවුත් තැබූ බරක් යම්සේ ද. එසේ නරකයෙහි උපදනේ වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ භත්තුද්දෙසක ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි උපදනේ වේ. කවර පසෙකින් ද යත් : ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, උදෙස්නා ලද්දවුන් නො උදෙස්නා ලද්දවුන් නො දනියි. උපාලි, මේ අඞ්ග පසින් යුක්තවූ භත්තුද්දෙසක ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි උපදනේ වේ,

6. පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, උද්දිට්ඨානුද්දිට්ඨං ජානාති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො භත්තුද්දෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

7. කතීහි නු ඛො භන්තෙ අඞ්ගෙහි සමන්නාගතො සෙනාසනපඤ්ඤාපකො -පෙ- භණ්ඩාගාරිකො -පෙ- චීවරපටිග්ගාහකො -පෙ- චීවරභාජකො -පෙ- යාගුභාජකො -පෙ- ඵලභාජකො -පෙ- ඛජ්ජභාජකො -පෙ- අප්පමත්තකවිස්සජ්ජකො -පෙ- සාටියගාහාපකො -පෙ- පත්තගාහාපකො -පෙ- ආරාමිකපෙසකො -පෙ- සාමණෙරපෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති?

පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො සාමණෙරපෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙති. කතමෙහි පඤ්චහි: ඡන්දාගතිං ගච්ඡති, දොසාගතිං ගච්ඡති, මොහාගතිං ගච්ඡති, භයාගතිං ගච්ඡති, පෙසිතාපෙසිතං න ජානාති. ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සාමණෙරපෙසකො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ.

8 පඤ්චහුපාලි අඞ්ගෙහි සමන්නාගතො සාමණෙරපෙසකො, යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. කතමෙහි පඤ්චහි: න ඡන්දාගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, පෙසිතාපෙසිතං ජානාති, ඉමෙහි ඛො උපාලි පඤ්චහඞ්ගෙහි සමන්නාගතො සාමණෙරපෙසකො යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙති.

ආවාසිකවග්ගො තෙරසමො

---

තස්සුද්දානං:

ආවාසිකා බ්‍යාකරණා භත්තුද්දෙසසෙනාසනානි ච,
භණ්ඩචීවරගාහො ච චීවරස්ස ච භාජකො.

යාගු ඵලං ඛජ්ජකඤ්ච අප්පසාටියගාහකො,
පත්තආරාමිකා චෙව සාමණෙරෙන පෙසකොති.

---

## 14. කඨිනත්ථාර වග්ගො

1. කති නු ඛො භන්තෙ ආනිසංසා කඨිනත්ථාරෙති?

පඤ්චිමෙ උපාලි ආනිසංසා කඨිනත්ථාරෙ. කතමෙ පඤ්ච: අනාමන්තචාරො, අසමාදානචාරො, ගණභොජනං, යාවදත්ථචීවරං, යො ච තත්ථ චීවරුප්පාදො සො තෙසං භවිස්සති ඉමෙ ඛො උපාලි පඤ්ච ආනිසංසා කඨිනත්ථාරෙති.

6. උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ භත්තුද්දෙසක ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි උපදනේ වෙයි. කවර පසෙකින යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, උදෙස්නා ලද්දවුන් හා නො උදෙස්නා ලද්දවුන් දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ භත්තුද්දෙසක ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි උපදනේ වේ.

7. වහන්ස, කෙතෙක් අඞ්ගයෙන් යුක්ත වූ සෙනසුන් පණවන්නා . . . භාණ්ඩාගාරිකයා . . . සිවුරු පිළිගන්නා . . . සිවුරු බෙදන්නා . . . කැඳ බෙදන්නා . . . පලතුරු බෙදන්නා . . . කදු (කැවිලි) බෙදන්නා . . . සුලු පිරිකර බෙදන්නා . . . වැසිසළු බෙදන්නා . . . පාත්‍ර ගන්වන්නා . . . ආරාමිකයන් මෙහෙයවන්නා . . . හෙරණුන් මෙහෙයවන්නා ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි බහා තැබූයේ වේ ද ?

උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ හෙරණුන් මෙහෙයවන්නා ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි බහා තැබූයේ වෙයි. කවර පසෙකින් ද යත්: ඡන්දයෙන් අගතියට යෙයි, ද්වෙෂයෙන් අගතියට යෙයි, මොහයෙන් අගතියට යෙයි, බියෙන් අගතියට යෙයි, මෙහෙයනු ලැබූවන් හා නො මෙහෙයනු ලැබූවන් නො දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ හෙරණුන් මෙහෙයවන්නා ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ නරකයෙහි උපදනේ වේ.

8. උපාලි, අඞ්ග පසෙකින් යුක්ත වූ හෙරණුන් මෙහෙවරැ යොදන්නේ ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි බහා තැබූයේ වෙයි. කවර පසෙකින් ද යත්: ඡන්දයෙන් අගතියට නො යෙයි, ද්වෙෂයෙන් අගතියට නො යෙයි, මොහයෙන් අගතියට නො යෙයි, බියෙන් අගතියට නො යෙයි, මෙහෙයවනු ලැබූවන් හා නො මෙහෙයවනු ලැබූවන් දනී. උපාලි, මේ අඞ්ග පසින් යුක්ත වූ හෙරණුන් මෙහෙවරැ යොදන්නා ගෙණවුත් තැබූ බරක් යම්සේ ද, එසේ ස්වර්ගයෙහි උපදනේ වේ.

**තෙළෙස්වන ආවාසික වර්ගය නිමි.**

---

එහි නාමාවලිය :

ආවාසික යැ, ඛ්‍යාකරණ යැ, භත්තුද්දෙසක යැ, සෙනාසන යැ, භණ්ඩාගාරික යැ, චීවරගාහක යැ, චීවරභාජක යැ, යාගුභාජක යැ, ඵලභාජක යැ, ඛජ්ජභාජක යැ, අප්පමත්තවිස්සජ්ජක යැ, සාටිකගාහක යැ, පත්තගාහක යැ, ආරාමිකපෙසක යැ, සාමණේරපෙසක යැ යි.

---

## 14. කඨිනත්ථාර වර්ගය

1. වහන්ස, කඨින ඇතිරීමෙහි අනුසස් කෙතෙක් ද ?

උපාලි, කඨින ඇතිරීමෙහි මේ අනුසස් පසෙකි. කවර පසෙකැ යත්: (අරම්වැසි මහණුන් නො විචාරා ගම් වදනා) අනාමන්තචාර යැ, (තුන්සිවුරින් එකක් තබා යන) අසමාදානචාර යැ, (නො කැප බසින් කැඳවා දෙන) ගණභොජන යැ, කැමැති තාක් (නො ඉටු, නො විකැපවූ) චීවර පරිභොග යැ, ඒ කඨින අතුළ වෙහෙරැ යම් චීවරොත්පාදයෙක් ඇද්ද, එය ඒ කඨින අතුළ මහණුන් අයත් වන්නේ යැ යන පස යි. උපාලි, මේ වනාහි කඨින ඇතිරීමෙහි පඤ්ච ආනිසංසයෝ යි.

2. කති නු ඛො භන්තෙ ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතොති?

පඤ්චිමෙ උපාලි ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො. කතමෙ පඤ්ච: දුක්ඛං සුපති, දුක්ඛං පටිබුජ්ඣති, පාපකං සුපිනං පස්සති, දෙවතා න රක්ඛන්ති, අසුචි මුච්චති. ඉමෙ ඛො උපාලි පඤ්ච ආදීනවා මුට්ඨස්සතිස්ස අසම්පජානස්ස නිද්දං ඔක්කමතො.

පඤ්චිමෙ උපාලි ආනිසංසා උපට්ඨිතස්සතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතො. කතමෙ පඤ්ච: සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, දෙවතා රක්ඛන්ති, අසුචි න මුච්චති. ඉමෙ ඛො උපාලි පඤ්චානිසංසා උපට්ඨිතස්සතිස්ස සම්පජානස්ස නිද්දං ඔක්කමතොති.

3. කති නු ඛො භන්තෙ අවන්දියාති?

පඤ්චිමෙ උපාලි අවන්දියා. කතමෙ පඤ්ච: අන්තරඝරං පවිට්ඨො අවන්දියො, රච්ඡාගතො අවන්දියො, ඔතමසිකො අවන්දියො, අසමන්නා-හරන්තො අවන්දියො, සුත්තො අවන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච අවන්දියා.

4. අපරෙපි උපාලි පඤ්ච අවන්දියා. කතමෙ පඤ්ච: යාගුපානෙ අවන්දියො, භත්තග්ගෙ අවන්දියො, එකාවත්තො අවන්දියො, අඤ්ඤවිහිතො අවන්දියො, නග්ගො අවන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච අවන්දියා.

5 අපරෙපි උපාලි පඤ්ච අවන්දියා. කතමෙ පඤ්ච: ඛාදන්තො අවන්දියො, භුඤ්ජන්තො අවන්දියො, උච්චාරං කරොන්තො අවන්දියො, පස්සාවං කරොන්තො අවන්දියො, උක්ඛිත්තකො අවන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච අවන්දියා.

6. අපරෙපි උපාලි පඤ්ච අවන්දියා. කතමෙ පඤ්ච: පුරෙ උපසම්පන්නෙන පච්ඡා උපසම්පන්නො අවන්දියො, අනුපසම්පන්නො අවන්දියො, නානාසංවාසකො වුඩ්ඪතරො අධම්මවාදී අවන්දියො, මාතුගාමො අවන්දියො, පණ්ඩකො අවන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච අවන්දියා.

7. අපරෙපි උපාලි පඤ්ච අවන්දියා. කතමෙ පඤ්ච: පාරිවාසිකො අවන්දියො, මූලායපටිකස්සනාරහො අවන්දියො, මානත්තාරහො අවන්දියො, මානත්තචාරී අවන්දියො, අබ්භානාරහො අවන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච අවන්දියාති.

8. කති නු ඛො භන්තෙ වන්දියාති?

පඤ්චිමෙ උපාලි වන්දියා. කතමෙ පඤ්ච: පච්ඡා උපසම්පන්නෙන පුරෙ උපසම්පන්නො වන්දියො, නානාසංවාසකො වුඩ්ඪතරො ධම්මවාදී වන්දියො, ආචරියො වන්දියො, උපජ්ඣායො වන්දියො, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අරහං සම්මාසම්බුද්ධො වන්දියො. ඉමෙ ඛො උපාලි පඤ්ච වන්දියාති.

2. වහන්ස, මුළා සිහි ඇති වැ සම්‍යක්ප්‍රඥ නැති වැ නිදි වදනාහට ආදීනව කෙතෙක් ද ?

උපාලි, මුළාසිහි ඇති වැ සම්‍යක්ප්‍රඥ නැති වැ නිදි වදනාහට මේ ආදීනව පසෙකි. කවර පසෙකැ යත් : දුකසේ නිදයි. දුකසේ පුබුදියි, ලාමක සිහින දකියි, දෙවියෝ නො රකිති, සුකුරු මිදේ, උපාලි, මොහු වනාහි මුළාසිහි ඇති වැ සම්‍යක් ප්‍රඥ නැති වැ නිදි වදනාහට පඤ්ච ආදීනවයෝ යි.

උපාලි, එළැඹැ සිටි සිහි ඇති වැ සම්‍යක්ප්‍රඥ ඇති වැ, නිදි වදනාහට මේ ආනිසංස පසෙකි. කවර පසෙක යත් : සුවසේ නිදයි, සුවසේ පුබුදියි, ලාමක සිහින නො දකියි, දෙවියෝ රකිති, සුකුරු නො මිදේ. උපාලි, මොහු වනාහි එළැඹැසිටි සිහි ඇති වැ සම්‍යක්ප්‍රඥ ඇති වැ නිදි වදනාහට පඤ්ච ආනිසංසයෝ යි.

3. වහන්ස, අවන්ද්‍ය (නො වැන්දයුතු) පුද්ගලයෝ කෙතෙක් ද ?

උපාලි, මේ අවන්ද්‍යයෝ පස් දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : ඇතුළු ගමට පිවිසියේ අවන්ද්‍ය යැ, වීථියට ගියේ. අවන්ද්‍ය යැ, අඳුරෙහි හුන්නේ අවන්ද්‍ය යැ, (කෘත්‍යය නිරත බැවින්) **වඳනා** බව නො දන්නේ අවන්ද්‍ය යැ, නිද්‍රාගත වූයේ අවන්ද්‍ය යි. උපාලි, මොහු පස්දෙන අවන්ද්‍යයෝ යි.

4. උපාලි, අනෙකුදු අවන්ද්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : හුළුකැන් වළඳන සමයෙහි අවන්ද්‍ය යැ, භක්තාග්‍රයෙහි අවන්ද්‍ය යැ, වෛරීපුද්ගල අවන්ද්‍ය යැ, අන්‍යවිහිත වූයේ අවන්ද්‍ය යැ, නග්න වූයේ අවන්ද්‍ය යි. උපාලි, මොහු පස්දෙන අවන්ද්‍යයෝ යි.

5. උපාලි, අනෙකුදු අවන්ද්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : (අවුළු ඈ) කමින් සිටියේ අවන්ද්‍ය යැ, (අහර) බුදිමින් සිටියේ අවන්ද්‍ය යැ, වස් පවත්මින් සිටියේ අවන්ද්‍ය යැ, සුළුදියටනු කරමින් සිටියේ අවන්ද්‍ය යැ, උක්ඛේපනීකම් කරනලද්දේ අවන්ද්‍ය යි. උපාලි, මොහු පස්දෙන අවන්ද්‍යයෝ යි.

6. උපාලි, අනෙකුදු අවන්ද්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : පළමු උපසපන් වූවහු විසින් පසු වැ උපසපන් වූයේ අවන්ද්‍ය යැ, අනුපසම්පන්න වූයේ අවන්ද්‍ය යැ, නානාසංවාසක වෘද්ධතර අධර්මවාදී වූයේ අවන්ද්‍ය යැ, මාගම අවන්ද්‍ය යැ, පණ්ඩක අවන්ද්‍ය යි. උපාලි, මොහු පස්දෙන අවන්ද්‍යයෝ යි.

7. උපාලි, අනෙකුදු අවන්ද්‍යයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙකැ යත් : පිරිවෙස් පුරන්නේ අවන්ද්‍ය යැ, මූලායපටිකස්සන කර්මයට නිසි වූයේ අවන්ද්‍ය යැ, මානතට නිසි වූයේ අවන්ද්‍ය යැ, මානත් පුරන්නේ අවන්ද්‍ය යැ, අබ්භානකර්මයට නිසි වූයේ අවන්ද්‍ය යි. උපාලි, මොහු පස්දෙන අවන්ද්‍යයෝ යි.

8. වහන්ස, වන්ද්‍ය (වැන්ද යුතු) පුද්ගලයෝ කෙතෙක් ද ?

උපාලි, මේ වන්ද්‍යපුද්ගලයෝ පස්දෙනෙකි. කවර පස්දෙනෙක යත් : පසුව උපසපන් වූවහු විසින් පළමු උපසපන් වූයේ වන්ද්‍ය යැ, නානාසංවාසක වෘද්ධකර ධර්මවාදී වූයේ වන්ද්‍ය යැ, ඇදුරු තෙර වන්ද්‍ය යැ, වත්තෙර වන්ද්‍ය යැ, දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජාව ඇති ලොකයෙහි තථාගත අර්හත් සම්‍යක් සම්බුදුහු වන්ද්‍යයහ. උපාලි, මොහු පස්දෙන වන්ද්‍යයෝ යි.

9. නවකතරෙන භන්තෙ භික්ඛුනා බුඩ්ඪතරස්ස භික්ඛුනො පාදෙ වන්දන්තෙන කති ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පාදා වන්දිතබ්බාති?

නවකතරෙනුපාලි, භික්ඛුනා බුඩ්ඪතරස්ස භික්ඛුනො පාදෙ වන්දන්තෙන පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පාදා වන්දිතබ්බා. කතමෙ පඤ්ච: නවකතරෙනුපාලි, භික්ඛුනා බුඩ්ඪතරස්ස භික්ඛුනො පාදෙ වන්දන්තෙන එකංසං උත්තරාසඞ්ගං කරිත්වා අඤ්ජලිම්පග්ගහෙත්වා උභොහි පාණිතලෙහි පාදානි පරිසම්බාහන්තෙන පෙමඤ්ච ගාරවඤ්ච උපට්ඨාපෙත්වා පාදා වන්දිතබ්බා. නවකතරෙනුපාලි භික්ඛුනා බුඩ්ඪතරස්ස භික්ඛුනො පාදෙ වන්දන්තෙන ඉමෙ පඤ්ච ධම්මෙ අජ්ඣත්තං උපට්ඨාපෙත්වා පාදා වන්දිතබ්බාති.

කඨිනත්ථාරවග්ගො චුද්දසමො.

---

තස්සුද්දානං:

කඨිනත්ථාර නිද්දා ච අනන්තරා යාගු ඛාදනෙ,
පුරෙ ච පාරිවාසී ච වන්දියා වන්දිතබ්බකානි.

---

උපාලිපඤ්චකං නිට්ඨිතං.

---

තෙසං වග්ගානං උද්දානං:

අනිස්සිතෙන කම්මඤ්ච වොහාරාවිකම්මෙන ච,
චොදනා ච ධුතඞ්ගා ච මුසා භික්ඛුනිමෙව ච.

උබ්බාහිකාධිකරණං භෙදකා පඤ්චමා පුරෙ,
ආවාසිකා කඨිනඤ්ච චුද්දස සුප්පකාසිතාති.

---

Free Distribution www.aathaapi.org

9. වහන්ස, වෘද්ධතර මහණක්හුගේ පා වඳනා නවකතර මහණහු විසින් කෙතෙක් දහම් ස්වකීය සන්තානයෙහි එළවා පා වැන්දයුතු ද ?

උපාලි, වෘද්ධතර මහණක්හුගේ පා වඳනා නවකතර මහණහු විසින් දහම් පසක් සිත්සතන්හි එළවා පා වැන්දයුතු යැ. කවර පසෙක යත්: උපාලි, වෘද්ධතර මහණක්හුගේ පා වඳනා නවකතර මහණහු විසින් උතුරුසඟ එකස් කොට ඇඳිලි බැඳගෙණ දෙඅත්ලෙන් දෙපත්ල පිරිමදිමින් ප්‍රෙමයත් ආදරයත් එළවා පා වැන්දයුතු. උපාලි, වෘද්ධතර මහණක්හුගේ පා වඳනා නවකතර මහණහු විසින් මෙ පස්දහම් සිත්සතන්හි උපයා පා වැන්දයුතු.

**තුදුස්වන කඨිනත්ථාර වර්ග යි.**

---

එහි නමාවලිය :

කඨිනත්ථාර යැ, නිද්ද යැ, අන්තරසර යැ, යාගුපාන යැ, ඛාදන යැ, පුරෙඋපසම්පන්න යැ, පරිවාසික යැ, අවන්දිය යැ, වන්දිතබ්බක යි.

---

**උපාලිපඤ්චකය නිමි.**

---

ඒ වර්ගයන්ගේ නාමාවලිය :

අනිස්සිතය සමග කම්ම යැ, වොහාරදිට්ඨාවිකම්මය සමග චොදන (අත්තාදන) යැ, ධුතඞ්ග යැ, මුසාවාද යැ, භික්ඛුනීඔවාද යැ, උබ්බාහිකා යැ, අධිකරණවූපසම යැ, සඞ්ඝභෙදක දෙක යැ, ආවාසික යැ, කඨිනත්ථාරය දැයි තුදුස්වර්ගයෝ සුප්‍රකාශිතයහ.

---

# සමුට්ඨානං

අත්ථාපත්ති අචිත්තකො ආපජ්ජති සචිත්තකො වුට්ඨාති, අත්ථාපත්ති සචිත්තකො ආපජ්ජති අචිත්තකො වුට්ඨාති, අත්ථාපත්ති අචිත්තකො ආපජ්ජති අචිත්තකො වුට්ඨාති, අත්ථාපත්ති සචිත්තකො ආපජ්ජති සචිත්තකො වුට්ඨාති, අත්ථාපත්ති කුසලචිත්තො ආපජ්ජති කුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති කුසලචිත්තො ආපජ්ජති, අකුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති කුසලචිත්තො ආපජ්ජති අබ්‍යාකතචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අකුසලචිත්තො ආපජ්ජති අකුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අකුසලචිත්තො ආපජ්ජති කුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අකුසලචිත්තො ආපජ්ජති අබ්‍යාකතචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අබ්‍යාකතචිත්තො ආපජ්ජති කුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අබ්‍යාකතචිත්තො ආපජ්ජති අකුසලචිත්තො වුට්ඨාති, අත්ථාපත්ති අබ්‍යාකතචිත්තො ආපජ්ජති අබ්‍යාකතචිත්තො වුට්ඨාති.

පඨමං පාරාජිකං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති : පඨමං පාරාජිකං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

දුතියං පාරාජිකං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති : දුතියං පාරාජිකං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

තතියං පාරාජිකං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති : තතියං පාරාජිකං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

චතුත්ථං පාරාජිකං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති : චතුත්ථං පාරාජිකං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

චත්තාරො පාරාජිකා නිට්ඨිතා.

---

1. උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති : උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.



Free Distribution www.aathaapi.org

# සමුට්ඨානය

1. ඇවැතෙක් ඇත, අචිත්තක වැ අවදී, සචිත්තක වැ නැගෙයි, ඇවැතෙක් ඇත සචිත්තක වැ අවදී, අචිත්තක වැ නැගෙයි, ඇවැතෙක් ඇත, අචිත්තක වැ අවදී, අචිත්තක වැ නැගෙයි, ඇවැතෙක් ඇත, සචිත්තක වැ අවදී, සචිත්තක වැ නැගෙයි, ඇවැතෙක් ඇත, කුසල්සිත් ඇති වැ අවදී, කුසල්සිත් ඇතිවැ නැඟෙයි, ඇවැතෙක් ඇත, කුසල්සිත් ඇති වැ අවදී, අකුසල් සිත් ඇති වැ නැඟෙයි, ඇවැතෙක් ඇත, කුසල් සිත් ඇති වැ අවදී, අව්‍යාකෘත සිත් ඇති වැ නැඟෙයි, ඇවැතෙක් ඇත, අකුසල්සිත් ඇති වැ අවදී, කුසල් සිත් ඇති වැ නැගෙයි, ඇවතෙක් ඇත, කුසල් සිත් ඇති වැ අවදී, අකුසල් සිත් ඇති වැ නැගෙයි, ඇවැතෙක් ඇත, අකුසල් සිත් ඇති වැ අවදී, අව්‍යාකෘත සිත් ඇති වැ නැඟෙයි, ඇවැතෙක් ඇත, අව්‍යාකෘත සිත් ඇති වැ අවදී, කුසල් සිත් ඇති වැ නැඟෙයි, ඇවැතෙක් ඇත, අව්‍යාකෘත සිත් ඇති වැ අවදී, අකුසල් සිත් ඇති වැ නැගෙයි, ඇවැතෙක් ඇත, අව්‍යාකෘතසිත් ඇතිවැ අවදී, අව්‍යාකෘත සිත් ඇති වැ නැඟෙයි.

2. පළමු පරිජිය කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : පළමු පරිජිය එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

3. දෙවන පරිජිය කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : දෙවන පරිජිය තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී, කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී, කිසිවිටෙක කයින් ද වචන යෙන් ද සිතින් ද නඟී.

4. තෙවන පරිජිය කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තෙවන පරිජිය තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟීයි, වචනයෙන් නො නඟී, කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී, කිසිවිටෙක කයින් ද වචන යෙන් ද සිතින් ද නඟී.

5. සිවුවන පරිජිය කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : සිවුවන පරිජිය තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟි, කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟි, කිසිවිටෙක කයින් ද වචන යෙන් ද සිතින් ද නඟී.

**සතර පරිජි නිමි.**

---

1. උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් නඟියි, වචනයෙන් නො නඟී.



Free Distribution www.aathaapi.org

2. මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

3. මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසන්තස්ස සඞ්ඝාදිසෙසො තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති. න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

4. මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසන්තස්ස සඞ්ඝාදිසෙසො තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

5. සඤ්චරිත්තං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සඤ්චරිත්තං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති න වාචතො න චිත්තතො, සියා වාචතො සමුට්ඨාති න කායතො න චිත්තතො, සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

6 සඤ්ඤාචිකාය කුටිං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සඤ්ඤාචිකාය කුටිං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

7. මහල්ලකං විහාරං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: මහල්ලකං විහාරං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

9. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චි දෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

2. මාගමක හා කාසසහයට පැමිණෙන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මාගමක හා කාසසහයට පැමිණෙන්නහු පිළිබඳ සඟ වෙසෙස එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

3. මාගමකට තුළුල් තෙපුල් කියන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨාන යෙන් නඟී ද යත් : මාගමකට තුළුල් තෙපුල් කියන්නහු පිළිබඳ සඟවෙසෙස තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචන යෙන් ද සිතින් ද නඟී.

4. මාගමක හමුවෙහි තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි ගුණ කියන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මාගමක හමුවෙහි තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි ගුණ කියන්නහු පිළිබඳ සඟවෙසෙස තුන් සමුට්ඨානයෙකින් නඟී. . . .

5. මාගමුන් හා පිරිමින් අත හසුන් ගෙණ යනු එනු විසින් හැසිරීම් බවට පැමිණෙන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මාගමුන් හා පිරිමින් අතර හසුන් ගෙණ යනු එනු විසින් සංචරිත්තයට පැමිණෙන්නහු පිළිබඳ සඟවෙසෙස සමුට්ඨාන සයෙන් නඟියි: කිසිවිටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක වචනයෙන් නඟියි, කයින් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී, කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟීයි, කයින් නො නඟී, කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

6. තමා ඉල්වාගත් උපකරණයෙන් කුටියක් කරවන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තමා ඉල්වාගත් උපකරණයෙන් කුටියක් කරවන්නහු පිළිබඳ සඟවෙසෙස සමුට්ඨාන සයෙන් නඟීයි : . . .

7. මහත් විහාරයක් කරවන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මහත් විහාරයක් කරවන්නහු පිළිබඳ සඟවෙසෙස සමුට්ඨාන සයෙන් නඟියි : . . .

8. මහණක්හට අමූලක වූ පරිජි ඇවැතින් චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මහණක්හට අමූලක වූ පරිජි ඇවැතින් චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස තුන් සමුට්ඨානයකින් නඟීයි : . . .

9. අන්‍යභාගීය අධිකරණයක්හුගේ කිසි දෙශලෙශමාත්‍රයක් ගෙණ මහණක්හට පරිජි ඇවැතින් චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : අන්‍යභාගීය අධිකරණයක්හුගේ කිසි දෙශලෙශමාත්‍රයක් ගෙණ මහණක්හට පරිජි ඇවැතින් චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස තුන් සමුට්ඨානයකින් නඟියි : . . .

10. සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

11. භෙදකානුවත්තකානං භික්ඛූනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තානං සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: භෙදකානුවත්තකානං භික්ඛූනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තානං සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

12. දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

13. කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

තෙරසසඞ්ඝාදිසෙසා නිට්ඨිතා

---

-පෙ- අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස දුක්කටං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස දුක්කටං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

සෙඛියා නිට්ඨිතා

---

1. චත්තාරො පාරාජිකා කති සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: චත්තාරො පාරාජිකා තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

2. තෙරස සඞ්ඝාදිසෙසා කතිහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: තෙරස සඞ්ඝාදිසෙසා ඡහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති; සියා කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො, සියා වාචතො සමුට්ඨහන්ති න කායතො න චිත්තතො, සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති

10. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින සඞ්ඝභෙදක මහණහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින සඞ්ඝභෙදක මහණහු පිළිබඳ සඟවෙසෙස එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

11. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ භෙදනුවත්තක භික්ෂූන් පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ භෙදනුවත්තක භික්ෂූන් පිළිබඳ සඟවෙසෙස එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

12. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ දුර්වච භික්ෂුහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ දුර්වච භික්ෂුහු පිළිබඳ සඟවෙසෙස එක් සමුට්ඨානයෙකින් නගියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

13. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ කුලදූෂක භික්ෂුහු පිළිබඳ සඟවෙසෙස කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි යත්නය නො හරින්නා වූ කුලදූෂක භික්ෂුහු පිළිබඳ සඟවෙසෙස එක් සමුට්ඨානයෙකින් නගියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

තෙළෙස් සඟවෙසෙස් නිමි.

---

1....අනදර පි ස පරිභොග ජලයෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ දුකුළා ඇවැත කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ දුකුළා ඇවැත එක් සමුට්ඨානයෙකින් නඟීයි : කයින් ද සිතින් ද නඟීයි, වචනයෙන් නො නඟී.

සෙඛියා නිමි.

---

1. සතර පරිජි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : සතර පරිජි තුන් සමුට්ඨානයෙකින් නඟීයි : කයින් ද සිතින් ද නැඟිය හෙයි, වචනයෙන් නො නැඟිය හේ. වචනයෙන් ද සිතින් ද නැඟිය හෙයි, කයින් නො නැඟිය හේ. කයින් ද වචනයෙන් ද සිතින් ද නැගිය හේ.

2. තෙළෙස් සඟවෙසෙස් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තෙළෙස් සඟවෙසෙස් සමුට්ඨාන සයෙන් නඟියි : කිසිවිටෙක කයින් නැඟිය හෙයි : වචනයෙන් නොනැඟිය හෙයි, සිතින් නොනැඟිය හේ. කිසිවිටෙක වචනයෙන් නැඟිය හෙයි,

න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

3. ද්වෙ අනියතා කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : ද්වෙ අනියතා තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

4. තිංස නිස්සග්ගියා පාචිත්තියා කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : තිංස නිස්සග්ගියා පාචිත්තියා ඡහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : සියා කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො. සියා වාචතො සමුට්ඨහන්ති න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

5. ද්වෙ නවුති පාචිත්තියා කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : ද්වෙ නවුති පාචිත්තියා ඡහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : සියා කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො. සියා වාචතො සමුට්ඨහන්ති න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

6. චත්තාරො පාටිදෙසනීයා කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : චත්තාරො පාටිදෙසනීයා චතූහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : සියා කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

7. පඤ්චසත්තති සෙඛියා කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : පඤ්චසත්තති සෙඛියා තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්තීති.

සමුට්ඨානං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

අචිත්තකුසලඤ්චෙව[1] සමුට්ඨානඤ්ච සබ්බථා
යථා ධම්මෙන ඤායෙන සමුට්ඨානං විජානථාති.

---

1. අචිත්තකුසලා චෙව - ම. ඡසං. සතා.

Free Distribution www.aathaapi.org

කයින් නොනැඟිය හෙයි, සිතින් නොනැඟිය හේ. කිසි විටෙක කයින් ද වචනයෙන් ද නැඟිය හෙයි, සිතින් නොනැඟිය හේ. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැඟිය හෙයි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හේ.

3. දෙ අනියතයෝ කෙතෙක් සමුට්ඨානයෙන් නඟිත් ද යත් : දෙ අනියතයෝ තුන් සමුට්ඨානයෙකින් නඟිති : කිසිවිටෙක කයින් ද සිතින් ද නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැඟිය හෙති, කයින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හෙත්.

4. තිස් නිසඟිපවිතීහු කෙතෙක් සමුට්ඨානයෙන් නඟිත් ද යත් : තිස් නිසඟිපවිතීහු සමුට්ඨාන සයෙන් නඟිති : කිසිවිටෙක කයින් නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙති, සිතින් නො නැඟිය හෙත්. කිසිවිටෙක වචනයෙන් නැඟිය හෙති, කයින් නො නැඟිය හෙති, සිතින් නොනැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නැඟිය හෙති, සිතින් නොනැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැගිය හෙති, කයින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හෙත්.

5. දෙයානු පවිතීහු කෙතෙක් සමුට්ඨානයෙන් නඟිත් ද යත් : දෙයානු පවිතීහු සමුට්ඨාන සයෙන් නඟිති : කිසිවිටෙක කයින් නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙති සිතින් නො නැගිය හෙත්. කිසිවිටෙක වචනයෙන් නැඟිය හෙති, කයින් නො නැඟිය හෙති, සිතින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නැඟිය හෙති, සිතින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැඟිය හෙති. කයින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හෙත්.

6. සිවු පිළිදෙස්නීහු කෙතෙක් සමුට්ඨානයෙන් නඟිත් ද යත් : සිවු පිළිදෙස්නීහු සිවු සමුට්ඨානයෙකින් නඟිති : කිසිවිටෙක කයින් නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙති, සිතින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නැඟිය හෙති, සිතින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හෙත්.

7. පන් සැත්තෑ සෙඛියාවෝ කෙතෙක් සමුට්ඨානයෙන් නඟිත් ද යත් : පන් සැත්තෑ සෙඛියාවෝ තුන් සමුට්ඨානයෙකින් නඟිති, කිසිවිටෙක කයින් ද සිතින් ද නැඟිය හෙති, වචනයෙන් නො නැඟිය හෙත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැඟිය හෙති, කයින් නො නැඟිය හෙත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟිය හෙත්.

**සමුට්ඨානය නිමි.**

---

එහි නාමාවලිය :

අවිත්තක යැ කුසල යැ සමුට්ඨාන යැ සර්වප්‍රකාරයෙන් ධර්මය වූ පරිද්දෙන් න්‍යාය වූ පරිද්දෙන් සමුට්ඨානය දැන ගණිවු.

---

20—ඒ 30906 (77/12)
Free Distribution www.aathaapi.org

# දුතියගාථාසඞ්ගණිකං

1. කතාපත්තියො කායිකා කති වාචසිකා කතා,
ඡාදෙන්තස්ස කති ආපත්තියො කති සංසග්ගපච්චයා.

2 ඡ ආපත්තියො කායිකා ඡ වාචසිකා කතා,
ඡාදෙන්තස්ස තිස්සො ආපත්තියො පඤ්ච සංසග්ගපච්චයා.

3. අරුණුග්ගෙ කති ආපත්තියො කති යාවතතියකා,
කතෙත්ථ අට්ඨවත්ථුකා කතීහි සබ්බසඞ්ගහො.

4. අරුණුග්ගෙ තිස්සො ආපත්තියො ද්වෙ යාවතතියකා,
එකෙත්ථ අට්ඨවත්ථුකා එකෙන සබ්බසඞ්ගහො.

5. විනයස්ස කති මූලානි යානි බුද්ධෙන පඤ්ඤත්තා,
විනයගරුකා කති වුත්තා දුට්ඨුල්ලච්ඡාදනා කති.

6. විනයස්ස ද්වෙ මූලානි යානි බුද්ධෙන පඤ්ඤත්තා,
විනයගරුකා ද්වෙ වුත්තා ද්වෙ දුට්ඨුල්ලච්ඡාදනා.

7. ගාමන්තරෙ කති ආපත්තියො කති නදීපාරපච්චයා,
කති මංසෙසු ථුල්ලච්චයං කති මංසෙසු දුක්කටං.

8. ගාමන්තරෙ චතස්සො ආපත්තියො චතස්සො නදීපාරපච්චයා,
එකමංසෙ ථුල්ලච්චයං නව මංසෙසු දුක්කටං.

9. කති වාචසිකා රත්තිං කති වාචසිකා දිවා,
දදමානස්ස කති ආපත්තියො පටිග්ගණ්හන්තස්ස කිත්තකා.

10. ද්වෙ වාචසිකා රත්තිං ද්වෙ වාචසිකා දිවා,
දදමානස්ස තිස්සො ආපත්තියො චත්තාරො ච පටිග්ගහෙ.

11. කති දෙසනාගාමිනියො කති සප්පටිකම්මා කතා,
කතෙත්ථ අප්පටිකම්මා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.



Free Distribution www.aathaapi.org

# දුතියගාථාසඞ්ගණිකය

1. කයින් හටගන්නා ඇවැත්හු කෙතෙකැ, වචනයෙන් හටගන්නා ඇවැත්හු කෙතෙක් (නියම) කරණ ලදහු ද, ඇවැත් වසන්නහුට ඇවැත්හු කෙතෙකැ, කායසංසර්ග හෙතුවෙන් වන ඇවැත්හු කෙතෙක යත් :

2. කායික ආපත්තීහු සදෙනෙකි, වාචසිකාපත්තීහු සදෙනෙකැයි (නියම) කරණ ලදහ. ඇවැත් වසන්නහුට ඇවැත් තුණෙකි, සංසර්ග හෙතුවෙන් වන ඇවැත් පසෙකි.

3. අරුණු නැඟීමෙහි සිදුවන ඇවැත් කෙතෙකැ, තුන් යළක් සමනුභාසනකම් කිරීමෙන් පසු සිදුවන ඇවැත් කෙතෙකැ, මෙහි අෂ්ට වස්තුක ශික්ෂා කෙතෙකැ, කොපමණකින් ශික්ෂාපදයන්ගේ සර්වසඞ්ග්‍රහය වේ යැ යත් :

4. අරුණු නැඟීමෙහි (නිසඟි පචිති, සඟ වෙසෙස්, දුකුළා විසින්) ඇවැත් තුණෙකි. යාවතතියකාපත්ති (භික්ෂු – භික්ෂුණී භෙදයෙන්) දෙකෙකි. අෂ්ට වස්තුකාපත්ති මේ ශාසනයෙහි (භික්ෂුණීන්ට පමණක් වූ) එකෙකි, එක් නිදානොද්දෙසයෙන් සියලු සිකපදයන් ගේ හා සියලු පාමොක් උදෙසීම්හුගේ සඞ්ග්‍රහය වේ.

5. යම් ඒ විනය මූලයෝ බුදුරදුන් විසින් පණවන ලදහු ද ඔහු කෙතෙකැ, විනය-ගරුකාපත්තීහු කෙතෙක් වදරණ ලදහු ද, ඡාදනක දුට්ඨුල්ලාපත්තීහු කෙතෙකැ යත් :

6. බුදුරජුන් විසින් යම් විනය මූල කෙනෙක් පණවන ලදහු ද, ඔහු (කාය වාක් විසින්) දෙදෙනෙක. විනය ගරුකාපත්තීහු (පරිජි – සඟවෙසෙස් විසින්) දෙදෙනෙකැ යි වදරණ ලදහ. **ඡාදනක** දුට්ඨුල්ලාපත්තීහු (පරිජි – සඟ වෙසෙස් විසින්) දෙදෙනෙකි.

7. අන් ගමකට යාමෙන් වන ඇවැත් කෙතෙකැ, **නදියෙකින්** එතරට යාමෙන් වන ඇවැත් කෙතෙකැ, කෙතෙක් මාංසයන්හි ථුල්ලැසි ද, කෙතෙක් මාංසයන්හි දුකුළා ද යත් :

8. අන් ගමකට යාමෙන් සිදුවන (දුකුළා–පචිති–ථුල්ලැසි–සඟවෙසෙසැ යි) ඇවැත් සතරෙකැ. නදියෙහි පරතෙරට යාමෙන් සතරෙකැ. එක මැ මිනිස් මසෙහි ථුල්ලැසි වෙයි. (ඇත්, අස්, බලු, දිවි, සප්, සිහ, වග, කළු හිස් වලස් හා කරබාන වලස් යන) නව මසෙහි දුකුළා ඇවැත් වේ.

9. රාත්‍රියෙහි වචනයෙන් වන ඇවැත් කෙතෙකැ, දහවල්හි වචනයෙන් වන ඇවැත් කෙතෙකැ, දෙන්නහුට ඇවැත් කෙතෙකැ, පිළිගන්නහුට ඇවැත් කෙතෙකැ යත් :

10. රාත්‍රියෙහි වචනයෙන් වන ඇවැත් (පචිති – දුකුළා විසින්) දෙකෙකැ. දහවල්හි වාචසිකාපත්තීහු (පචිති – දුකුළා විසින්) දෙදෙනෙකැ. දෙන්නහුට (පරිජි – ථුලසි – පචිති) ඇවැත්හු තිදෙනෙකැ. පිළිගැන්මෙහි (සඟවෙසෙස් – පරිජි – නිසඟිපචිති හා ථුල්ලැසි යි) ඇවැත්හු සිවු දෙනෙකි.

11. දෙසනාගාමිනී ඇවැත් කෙතෙකැ, ප්‍රතිකර්ම සහිතයැ යි නියම කරණ ලද ඇවැත් කෙතෙකැ, මේ ශාසනයෙහි කෙතෙක් ඇවැත් ප්‍රතිකර්ම රහිත යැ යි සූය්‍යබන්ධු වූ බුදුරදුන් විසින් වදරණ ලද ද යත් :



Free Distribution www.aathaapi.org

12. පඤ්චදෙසනාගාමිනියො ඡ සප්පටිකම්මා කතා,
එකෙත්ථ අප්පටිකම්මා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

13. විනයගරුකා කති වුත්තා කායවාචසිකානි ච,
කති විකාලෙ ධඤ්ඤරසො කති ඤත්තිචතුත්ථෙන සම්මුති.

14. විනයගරුකා ද්වෙ වුත්තා කායවාචසිකානි ච,
එකො විකාලෙ ධඤ්ඤරසො එකා ඤත්තිචතුත්ථෙන සම්මුති.

15. පාරාජිකා කායිකා කති කති සංවාසභූමියො,
කතීනං[1] රත්තිච්ඡෙදො පඤ්ඤත්තා ද්වඞ්ගුලා කති.

16. පාරාජිකා කායිකා ද්වෙ ද්වෙ සංවාසභූමියො,
ද්වින්නඤ්ච රත්තිච්ඡෙදො පඤ්ඤත්තා ද්වඞ්ගුලා දුවෙ.

17. කතත්තානං වධිත්වාන කතීහි සඞ්ඝො භිජ්ජති,
කතෙත්ථ පඨමාපත්තිකං ඤත්තියා කරණා කති.

18. ද්වෙ අත්තානං වධිත්වාන ද්වීහි සඞ්ඝො භිජ්ජති,
ද්වෙත්ථ පඨමාපත්තිකා ඤත්තියා කරණා දුවෙ.

19. පාණාතිපාතෙ කති ආපත්තියො වාචා පාරාජිකා කති,
ඔභාසනා කති වුත්තා සඤ්චරිත්තෙන වා කති.

20. පාණාතිපාතෙ තිස්සො ආපත්තියො වාචා පාරාජිකා තයො,
ඔභාසනා තයො වුත්තා සඤ්චරිත්තෙන වා තයො.

21. කති පුග්ගලා න උපසම්පාදෙතබ්බා කති කම්මානං සඞ්ගහා,
නාසිතකා කතී වුත්තා කතින්නං එකවාචිකා.

22. තයො පුග්ගලා න උපසම්පාදෙතබ්බා තයො කම්මානං සඞ්ගහා,
නාසිතකා තයො වුත්තා තිණ්ණන්නං එකවාචිකා.

23. අදින්නාදානෙ කති ආපත්තියො කති මෙථුනපච්චයා,
ඡින්දන්තස්ස කති ආපත්තියො කති ඡඩ්ඩිතපච්චයා.

---

8. කතීනං - සීමු. කතිනං - මජසං.

Free Distribution www.aathaapi.org

12. දෙසනාගාමිනී (දෙසීමෙන් පිරිසිදු වන) ඇවැත් පසෙකැ, ප්‍රතිකර්ම රහිත ය යි නියම කරණ ලද පරිජිය හැර සෙසු ඇවැත් සයෙකැ, හිරුගොත් බුදුරදුන් විසින් විසින් මෙ සසුන්හි එක ම පරිජි ඇවැත පිළියම් රහිත යැ යි වදරණ ලදී.

13. විනය ගරුකාපත්තීහු කෙතෙක් වදරණ ලදහු ද, කායික හා වාචසික ශික්ෂා කෙතෙකැ, විකාලයෙහි ධාන්‍යරස කෙතෙකැ, ඥප්තිචතුර්ත්ථකර්මයෙන් සම්මුති කෙතෙකැ යත් :

14. විනයගරුකාපත්තීහු (පරිජි – සඟවෙසෙස් විසින්) දෙදෙනෙකැ යි වදරණ ලදහ. (සියලු ශික්ෂාවෝ) කායවාචසික වෙති, විකාලයෙහි එක මැ (ලොණසොවීරක) ධාන්‍යරසය වටියි, ඥප්තිචතුර්ථකර්මයෙන් එක් මැ (භික්ඛුනොවාදක) සම්මුතිය වේ.

15. කායික වූ පාරාජිකා කෙතෙකැ, සංවාසභූමි කෙතෙකැ, කෙතෙක් දෙනකුන්හට රාත්‍රිච්ඡෙදය වේ ද, ද්වඞ්ගුලප්‍රඥප්ති කෙතෙකැ යත් :

16. කායික වූ පාරාජිකාපත්ති දෙකෙකැ, සංවාසභූමි දෙකෙකැ, (පාරිවාසිකයා-හට ද මානත්තචාරිකයාහට ද යන) දෙදෙනකුන්හට රාත්‍රිච්ඡෙදය වෙයි, ද්වඞ්ගුල ප්‍රඥප්ති දෙකෙකි.

17. තමාහට පැහැර කෙතෙක් ඇවැත් අවදී ද, සඞ්ඝතෙමේ කරුණු කීයකින් බිඳේ ද, මෙහි ප්‍රථමාපත්තීහු කෙතෙක් ද, ඥත්තිකරණ කෙතෙක් ද යත් :

18. තමාහට පැහැර අවදනා ඇවැත් (පචිති හා දුකුළා විසින්) දෙකෙකැ, කර්මයෙන් ද සලාකයෙන් ද යි දෙ කරුණෙන් සඞ්ඝයා බිඳෙයි, මෙහි ප්‍රථමාපත්තීහු (භික්ෂු භික්ෂුණීන් වශයෙන්) දෙදෙනෙකැ, ඥප්තිකරණ (කර්මය–කර්මපාදක යැ යි) දෙකෙකි.

19. ප්‍රාණඝාතයෙහි ආපත්ති කෙතෙකැ, වචනයෙන් අවදනා පරිජි කෙතෙකැ, අසභ්‍යභාෂණ කෙතෙක් වදරණ ලද ද, සඤ්චරිත්තය කරණ කොට ඇවැත් කඳු කෙතෙක් වේ යැ යත් :

20. ප්‍රාණඝාතයෙහි (පරිජි–ථුලැසි–පචිති) ඇවැත් තිදෙනෙකි. වචනයෙන් අවදනා පරිජි දහම් (වජ්ජපටිච්ඡාදක–උක්ඛිත්තානුවත්තක–අට්ඨවත්ථුක ය යි) තුණෙකි. අසභ්‍යභාෂණයෝ (සඟවෙසෙස්–ථුලැසි හා දුකුළා යි) ඇවැත්හු තිදෙනෙක් වදරණ ලදහ. සඤ්චරිත්තය කරණ කොට (සඟවෙසෙස්–ථුලැසි හා දුකුළා යි) ඇවැත් කඳු තුණෙකි.

21. කෙතෙක් පුද්ගලයෝ උපසපන් නො කටයුත්තෝ ද, කර්මයන්ගේ සඞ්ග්‍රහයෝ කෙතෙක් ද, නාසිතකයෝ කෙතෙක් වදරණ ලදහු ද, කී දෙනකුන්හට එක් අනුසාවනයෙක් වේ ද යත් :

22. උපසපන් නො කටයුතු පුද්ගලයෝ (අද්ධානහීන, අඞ්ගහීන, වත්ථුවිපන්න යි) තිදෙනෙක් වෙති, කර්මයන්ගේ සඞ්ග්‍රහයෝ (ඤත්තිකප්පන, විප්පකතපච්චත්ත හා අතීතකරණ විසින්) තිදෙනෙකි. නාසිතකයෝ (ලිඞ්ග–සංවාස හා දණ්ඩකම්ම විසින්) තිදෙනෙක් වදරණ ලදහ. තිදෙනකුන්හට එක් අනුසාවනයෙක් වේ.

23. අදත්තාදනයෙහි ඇවැත් කෙතෙකැ, මෙවුන්දම් හෙතුයෙන් ඇවැත් කෙතෙකැ, (වෘක්ෂාදිය) සිඳින්නහුට ඇවැත් කෙතෙකැ, විස දැමීම් ආදි හෙතුයෙන් ඇවැත් කෙතෙකැ යත් :

24. අදින්නාදානෙ තිස්සො ආපත්තියො චතස්සො මෙථුනපච්චයා,
ඡින්දන්තස්ස තිස්සො ආපත්තියො පඤ්ච ඡඩ්ඩිතපච්චයා.

25. භික්ඛුනොවාදකවග්ගස්මිං පාචිත්තියෙන දුක්කටා,
කතෙත්ථ නවකා වුත්තා කතිනං[1] චීවරෙන ච.

26. භික්ඛුනොවාදකවග්ගස්මිං පාචිත්තියෙන දුක්කටා,
කති චතුරෙත්ථ නවකා[2] වුත්තා ද්වින්නං චීවරෙන ච.

27. භික්ඛුනීනඤ්ච අක්ඛාතා පාටිදෙසනීයා කති,
භුඤ්ජන්තාමකධඤ්ඤෙන පාචිත්තියෙන දුක්කටා කති.

28. භික්ඛුනීනඤ්ච අක්ඛාතා අට්ඨ පාටිදෙසනීයා කතා,
භුඤ්ජන්තාමකධඤ්ඤෙන පාචිත්තියෙන දුක්කටා කතා.

29. ගච්ඡන්තස්ස කති ආපත්තියො ඨිතස්ස චාපි කිත්තකා,
නිසින්නස්ස කති ආපත්තියො නිපන්නස්සාපි කිත්තකා.

30. ගච්ඡන්තස්ස චතස්සො ආපත්තියො ඨිතස්ස චාපි තත්තිකා,
නිසින්නස්ස චතස්සො ආපත්තියො නිපන්නස්සාපි තත්තිකා.

31. කති පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො.

32. පඤ්ච පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො.

33. කති පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො.

34. නව පාචිත්තියානි සබ්බානි නානා වත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො.

35. කති පාචිත්තියානි සබ්බානි නානා වත්ථුකානි,
කති වාචාය දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

36. පඤ්ච පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
එකවාචාය දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

---

1. කතීනං - සීමු, කතිනං - ම.ඡ.සං.
2. චතුරෙත්ථ නවකාවුත්තා - ම.ඡ.සං.

Free Distribution www.aathaapi.org

24. අදත්තාදානයෙහි (පරිජි, ථුල්ලැසි, දුකුළා යි) ඇවැත්හු තිදෙනෙකැ. මෙවුන්දම් පසයෙන් (පරිජි, ථුල්ලැසි, දුකුළා, පචිති යි) ඇවැත්හු සිවු දෙනෙකි. සිඳින්නහුට (පරිජි, පචිති, ථුල්ලැසි යි) ඇවැත්හු තිදෙනෙකි. විස දැමීම් ආදි හෙතුයෙන් (පරිජි ථුල්ලැසි, පචිති, සඟවෙසෙස්, දුකුළා යි) ඇවැත්හු පස් දෙනෙකි.

25. මෙහෙණ ඔවා වගෙහි පචිති ඇවැත හා සමග දුකුළා ඇවැත් ප්‍රකාශිත ද, මෙහි කෙතෙක් නවකාපත්ති වදරණ ලද ද, කී දෙනකුන්හට චීවර හෙතුයෙන් ඇවැත් වේ යැ යත් :

26. මෙහෙණ ඔවා වගෙහි පචිතිය සහිත දුකුළා ඇවැත්හු (ප්‍රකාශ) කරණ ලදහ. මෙහි නවකාපත්තීහු සිවු දෙනෙක. (භික්ෂු, භික්ෂුණී දෙපස හමුයෙහි උපසපන් මෙහෙණහට සිවුරු දෙන) දෙදෙනකුන්හට සිවුරු දීම් හෙතුයෙන් (පචිති, දුකුළා) ඇවැත් වේ.

27. භික්ෂුණීන්ට වදරණ ලද පාටිදෙසනීයාපත්තිහු කෙතෙක් ද, අමු ධාන්‍ය (විනවා ගෙණ) වළඳන මෙහෙණහට පචිති ඇවැත සමග දුකුළා ඇවැත්හු කෙතෙක් ද යත් :

28. භික්ෂුණීන්හට වදරණ ලද පාටිදෙසනීය සිකපදයෝ අටදෙනෙකි (හැල් වී ආදී) අමු ධාන්‍යයන් විනවා වැළඳීමෙන් පචිති ඇවැත සමග දුකුළා වේ යයි ප්‍රකාශ කරණ ලදි.

29. යන්නහුට ඇවැත්හු කෙතෙක් ද, සිටියහුට ඇවැත්හු කෙතෙක් ද, හුන්නහුට ඇවැත්හු කෙතෙක් ද, හොත්තහුට ඇවැත්හු කෙතෙක් ද යත් :

30. යන්නහුට (දුකුළා, පචිති, ථුල්ලැසි, සඟවෙසෙස්) ඇවැත්හු ස්වු දෙනෙකි. සිටියහුට ද එපමණෙකි. හුන්නහුට ඇවැත්හු සිවු දෙනෙකි. හොත්තහුට ද එපමණෙකි.

31. සියල්ල නානාවස්තු ඇති කෙතෙක් පචිති ඇවැතුන්ට පෙරපසු නො ව එකවර අවදනෝ ද යත් :

32. (තෙල්, මී, සකුරු, ගිතෙල්, වෙඬරු යන පස් බෙහෙත් නහා තබා සත් දින ඉක්මවීමෙන්) සියල්ල නානාවස්තුක වූ පචිති ඇවැත් පස් දෙනකුන්ට පෙර පසු නො වැ එක්වර ම අවදනෝ ය.

33. සියල්ල නානාවස්තු ඇති කෙතෙක් පචිති ඇවැතුන්ට පෙර පසු නො ව එකවර අවදනෝ ද යත් :

34. (දී, මී, කිරි, තෙල්, ගිතෙල්, වෙඬරු, සකුරු, දියමස්, ගොඩමස් යන පිනී බොජුන් එකවර වළඳන මහණ) සියල්ල නානාවස්තුක වූ පචිති ඇවැත් නව දෙනකුන්ට පෙර පසු නො වැ එකවර ම අවදනෝ යි.

35. සියල්ල නානාවස්තුක වූ කෙතෙක් පචිති ඇවැතුන් කෙතෙක් බසින් දෙසන්නෝ දැ යි බුදුරජුන් විසින් වදරණ ලද ද යත් :

36. සියල්ල නානාවස්තුක වූ (පස් බෙහෙත් පිළිබඳ) පචිති පසක් එක් ම වචනයෙන් දෙසන්නෝ යැ යි බුදුරජුන් විසින් වදරණ ලදි.

37. කති පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
කති වාචාය දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

38. නව පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
එකවාචාය දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

39. කති පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
කිඤ්චි කිත්තෙත්වා දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

40. පඤ්ච පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
වත්ථුං කිත්තෙත්වා දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

41. කති පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
කිඤ්චි කිත්තෙත්වා දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුනා.

42. නව පාචිත්තියානි සබ්බානි නානාවත්ථුකානි,
වත්ථුං කිත්තෙත්වා දෙසෙය්‍ය වුත්තා ආදිච්චබන්ධුකා.

43. යාවතතියකා කති ආපත්තියො කති වොහාරපච්චයා,
ඛාදන්තස්ස කති ආපත්තියො කති භොජනපච්චයා.

44. යාවතතියකා තිස්සො ආපත්තියො ඡ වොහාරපච්චයා,
ඛාදන්තස්ස තිස්සො ආපත්තියො පඤ්ච භොජනපච්චයා.

45. සබ්බා යාවතතියකා කති ඨානානි ගච්ඡන්ති,
කතින්නඤ්චෙව ආපත්තියො කතින්නං අධිකරණෙන ච.

46. සබ්බා යාවතතියකා පඤ්ච ඨානානි ගච්ඡන්ති,
පඤ්චන්නඤ්චෙව ආපත්ති පඤ්චන්නං අධිකරණෙන ච.

47. කතින්නං විනිච්ඡයො හොති කතින්නං වූපසමෙන ච,
කතින්නඤ්චෙව අනාපත්ති කතීහි ඨානෙහි සොභති.

48. පඤ්චන්නං විනිච්ඡයො හොති පඤ්චන්නං වූපසමෙන ච,
පඤ්චන්නඤ්චෙව අනාපත්ති තීහි ඨානෙහි සොභති.

49. කති කායිකා රත්තිං කති කායිකා දිවා,
නිජ්ඣායන්තස්ස කති ආපත්ති කති පිණ්ඩපාතපච්චයා.

50. ද්වෙ කායිකා රත්තිං ද්වෙ කායිකා දිවා,
නිජ්ඣායන්තස්ස එකා ආපත්ති එකා පිණ්ඩපාතපච්චයා.

37. සියල්ල නානාවස්තුක වූ කෙතෙක් පචිති කෙතෙක් බසින් දෙසන්නේ ද යි බුදුරජුන් විසින් වදරණ ලද ද යත් :

38. සියල්ල නානාවස්තුක වූ පචිති ඇවැත් නවයක් එක් ම වචනයෙන් දෙසන්නේ යැ යි බුදුරජුන් විසින් වදරණ ලදි.

39. සියල්ල නානවස්තුක වූ කෙතෙක් පචිති කුමක් කීර්තනය කොට දෙසන්නේ ද යි බුදුරජුන් විසින් වදරණ ලද ද යත් :

40. සියල්ල නානාවස්තුක වූ පචිති පසක් වස්තු කීර්තනය කොට දෙසන්නේ යැ යි බුදුරජුන් විසින් වදරණ ලදි.

41. සියල්ල නානාවස්තුක වූ කෙතෙක් පචිති කුමක් කීර්තනය කොට දෙසන්නේ ද යි බුදුරජුන් විසින් වදරණ ලද ද යත් :

42. සියල්ල නානාවස්තුක වූ පචිති ඇවැත් නවයක් වස්තු කීර්තනය කොට දෙසන්නේ යැ යි බුදුරජුන් විසින් වදරණ ලදි.

43. යාවතතියකයෙහි ඇවැත්හු කෙතෙක් ද, වාග්ව්‍යවහාර හෙතුවෙන් ඇවැත්හු කෙතෙක් ද, වළඳන්නහුට ඇවැත්හු කෙතෙක් ද, භොජන හෙතුවෙන් ඇවැත්හු කෙතෙක් ද යත් :

44. යාවතතියකයෙහි (පරිජි, සඟවෙසෙස්, පචිති) ඇවැත්හු තිදෙනෙකි, වාග්ව්‍යවහාර හෙතුවෙන් (පරිජි, සඟවෙසෙස්, ථුලැසි, පචිති, පාටිදෙසනීය, දුකුළා) ඇවැත්හු සදෙනෙකි. වළඳන්නහුට (ථුලැසි, දුකුළා, පචිති) ඇවැත්හු තිදෙනෙකි. භොජනා හෙතුවෙන් (සඟවෙසෙස්, ථුලැසි, පචිති, පාටිදෙසනීය, දුකුළා) ඇවැත්හු පස්දෙනෙකි.

45. සියලු යාවතතියක ආපත්තීහු කෙතෙක් තැනට යෙත් ද, කීදෙනකුන්හට ඇවැත් වේ ද, අධිකරණය කීදෙනකුන් පිළිබඳ ද යත් :

46. සියලු යාවතතියක ආපත්තීහු (දුකුළා, ථුලැසි, පරිජි, සඟවෙසෙස්, පචිති) පස් තැනකට යෙත්. ඇවැත් නම් පස්සහඳමියනට වෙයි. (යුක්ති විචාරණ සඞ්ඛ්‍යාත) අධිකරණය ද පස්සහඳමියනට ම වේ.

47. කීදෙනකුන්හට අධිකරණ විනිශ්චය වේ ද, කීදෙනකුන්හට අධිකරණ ශමථය වේ ද, කීදෙනකුන්හට ඇවැත් නො වේ ද, කෙතෙක් කරුණෙන් හොබී ද යත් :

48. අධිකරණ විනිශ්චය පස් සහඳමියනට වෙයි. පස් සහඳමියනට අධිකරණ ශමථය වෙයි. ඇවැත් නො වීම ද පස් සහඳමියනට මැයි. (සඞ්ඝ, ගණ, පුද්ගල) තුන් කරුණෙන් හොබී.

49. රාත්‍රියෙහි කායිකාපත්තීහු කෙතෙක් ද, දහවල්හි කායිකාපත්තීහු කෙතෙක් ද බලන්නහුට ඇවැත්හු කෙතෙක් ද, පිණ්ඩපාත හෙතුවෙන් ඇවැත්හු කෙතෙක් ද යත් :

50. රාත්‍රියෙහි කායිකාපත්තීහු (පචිති, දුකුළා) දෙදෙනෙකැ. දහවල්හි කායිකා පත්තීහු දෙදෙනෙකැ. (අසවල් තැන ඇතැයි) බලන්නහුට එක් දුකුළා ඇවතෙකැ. පිණ්ඩපාත හෙතුවෙන් එක් දුකුළා ඇවතෙකි.

51. කතානිසංසෙ සම්පස්සං පරෙසං සද්ධාය දෙසයෙ,
උක්ඛිත්තකා කති වුත්තා කති සම්මා, පවත්තනා.

52. අට්ඨානිසංසෙ සම්පස්සං පරෙසං සද්ධාය දෙසයෙ,
උක්ඛිත්තකා තයො වුත්තා තෙ චත්තාරීස සම්මාවත්තනා.

53. කති ඨානෙ මුසාවාදෙ කති පරමන්ති වුච්චති,
කති පාටිදෙසනීයා කතින්නං දෙසනාය ච.

54. පඤ්ච ඨානෙ මුසාවාදෙ චුද්දස පරමන්ති වුච්චති,
ද්වාදස පාටිදෙසනීයා චතුන්නං දෙසනාය ච.

55 කතඞ්ගිකො මුසාවාදෙ කති උපොසථඞ්ගානි,
කති දූතෙය්‍යඞ්ගානි කති තිත්ථියවත්තනා.

56. අට්ඨඞ්ගිකො මුසාවාදෙ අට්ඨ උපොසථඞ්ගානි,
අට්ඨ දූතෙය්‍යඞ්ගානි අට්ඨ තිත්ථියවත්තනා.

57. කති වාචිකා උපසම්පදා කතින්නං පච්චුට්ඨාතබ්බං,
කතින්නං ආසනං දාතබ්බං භික්ඛුනොවාදකො කතීහි.

58. අට්ඨ වාචිකා උපසම්පදා අට්ඨන්නං පච්චුට්ඨාතබ්බං,
අට්ඨන්නං ආසනං දාතබ්බං භික්ඛුනොවාදකො අට්ඨහි.

59. කතින්නං ඡෙජ්ජං හොති කතින්නං ථුල්ලච්චයං,
කතින්නඤ්චෙව අනාපත්ති සබ්බෙසං එකවත්ථුකා.

60. එකස්ස ඡෙජ්ජං හොති චතුන්නං ථුල්ලච්චයං,
චතුන්නඤ්චෙව අනාපත්ති සබ්බෙසං එකවත්ථුකා.

61. කති ආඝාතවත්ථූනි කතීහි සඞ්ඝො භිජ්ජති,
කතෙත්ථ පඨමාපත්තිකා ඤත්තියා කරණා කති.

62. නව ආඝාතවත්ථූනි නවහි සඞ්ඝො භිජ්ජති,
නවෙත්ථ පඨමාපත්තිකා ඤත්තියා කරණා නව.

63. කති පුග්ගලා නාභිවාදෙතබ්බා අඤ්ජලි සාමීචෙන ච,
කතින්නං දුක්කටං හොති කති චීවරධාරණා.

51. කෙතෙක් අනුසස් දක්නේ මෙරමාහට සැදැයෙන් ඇවැත දෙසන්නේ ද, උක්ඛිත්තකයෝ කෙතෙකැයි වදාරණ ලදහු ද, ඒ උක්ඛිත්තකයන්ගේ ද මනා පැවැතුම්හු කෙතෙක් ද යත් :

52. අට අනුසස් දක්නේ මෙරමාහට සැදැයෙන් ඇවැත දෙසන්නේ ය. උත්ක්ෂෙපණීය කර්මය කරණු ලැබූවෝ තිදෙනෙකැ යි වදාරණ ලදහ. මනා පැවැතුම්හු තෙසාලිසෙකි.

53. මුසාවාදය කෙතෙක් ආපත්තිස්ථානගත වේ ද, කෙතෙක් පරම යැ යි කියනු ලැබේ ද, පාටිදෙසනීයයෝ කෙතෙක් ද, කීදෙනකුන්හට වරද දෙසීම් වේ ද යත් :

54. මුසාවාදය (පරිජි, සඟවෙසෙස්, ථුලැසි, පචිති, දුකුළා) පස් තැනකට යන්නේ වෙයි. පරම තුදුසෙකැ යි කියනු ලැබෙයි. පාටිදෙසනීයයෝ (භික්ෂූන්ගේ සතරක් හා භික්ෂුණීන්ගේ අටෙකැයි) දෙළොසෙකි. (දෙව්දත් ආදි) සතර දෙනකුන්ගේ වරද දෙසීම් වේ.

55. මුසාවාදය කෙතෙක් අඞ්ග ඇත්තේ ද, උපොසථාඞ්ගයෝ කෙතෙක් ද, දූතාඞ්ගයෝ කෙතෙක් ද, තීර්ත්ථකයන් විසින් පිරියයුතු වත් කෙතෙක් ද යත් :

56. මුසාවාදය අටඟක් ඇත්තේ වේ. උපොසථාඞ්ගයෝ අටදෙනෙකි දූතාඞ්ගයෝ අටදෙනෙකි. තීර්ත්ථකයන්ගේ වත් අටෙකි.

57. (භික්ෂුණීන්ගේ) උපසම්පද කෙතෙක් වාක්‍යයන්ගෙන් යුක්ත වන්නී ද, කීදෙනකුන් දැක හුනස්නෙන් නැඟිටිය යුතු ද, කීදෙනකුන්හට අසුන් දියයුතු ද, භික්ඛුනොවාදක මහණ අඞ්ග කීයකින් යුක්ත වියයුතු ද, යත් :

58. (භික්ෂුණීන්ගේ) උපසම්පද ඤත්තිචතුත්ථකම්ම වාක්‍යය භික්ෂුභික්ෂුණී දෙපසෙහි වශයෙන්) අෂ්ට වාක්‍යයකින් යුක්ත වන්නී ය. (භික්ෂුණීන්) අටදෙනකුන් හට (බත්හලෙහි වැඩිමහලු පිළිවෙළින්) දැක හුනස්නෙන් නැඟිය යුතු යි. (භික්ෂුණීන්) අටදෙනකුන්හට (වැඩිමහලු පිළිවෙළින්) අසුන් දියයුතු යි. භික්ඛුනොවාදක මහණ (සීලවා හොති යනාදි) අටඟින් යුක්ත වියයුතු යි.

59. සියල්ලන්ට (සඞ්ඝභෙද සඞ්ඛ්‍යාත) එක් වස්තුවක් ඇත්තේ කීදෙනකුන් හට පරිජි වේද, කී දෙනකුන්හට ථුලැසි වේ ද, කීදෙනකුන්හට ඇවැත් නො වේ ද යත් :

60. සියල්ලන්ට (සඞ්ඝභෙද සඞ්ඛ්‍යාත) එක් වස්තුවක් ඇත්තේ ඒ එකකුහට පරිජි වෙයි. (භෙදකානුවර්තක) සතර දෙනාහට ථුලැසි වෙයි. (ධර්මවාදී ඉතිරි) සතරදෙනාහට ඇවැත් නො වේ.

61. ආඝාත වස්තූහු කෙතෙක් ද, කී දෙනකුන්ගෙන් සඞ්ඝයා බිඳේ ද, මෙහි ප්‍රථමාපත්තිකයෝ කෙතෙක් ද, ඤත්තියෙන් කටයුතු කර්මයෝ කෙතෙක් ද යත් :

62. ආඝාතවස්තූහු නවයෙකි. භික්ෂූන් නවදෙනකුන්ගෙන් සඞ්ඝයා බිඳේ. මෙහි ප්‍රථමාපත්තිකයෝ නවදෙනෙකි. ඤත්තියෙන් කටයුතු කර්මයෝ නවදෙනෙකි.

63. කෙතෙක් පුහුලෝ නො වැන්ද යුත්තෝ ද, (කීදෙනකුන්හට) සාමීචිකර්ම සහිත අඤ්ජලිකර්ම නො කටයුතු ද, කීදෙනකුන්හට දුකුළා වේ ද, අතිරේක සිවුරු දැරීම් කෙතෙක් ද යත් :

64. දස පුග්ගලා නාභිවාදෙතබ්බා අඤ්ජලි සාමිචෙන ච,
දසන්නං දුක්කටං හොති දස චීවරධාරණා.

65. කතිනන්නං වස්සං වුත්ථානං දාතබ්බං ඉධ චීවරං,
කතීනන්නං සන්තෙන දාතබ්බං කතීනන්නඤ්චෙව න දාතබ්බං

66. පඤ්චන්නං වස්සං වුත්ථානං දාතබ්බං ඉධ චීවරං,
සත්තන්නං සන්තෙන දාතබ්බං සොළසන්නං න දාතබ්බං.

67. කති සතං රත්ති සතං ආපත්තියො ඡාදයිත්වාන,
කති රත්තියො වසිත්වාන මුච්චෙය්‍ය පාරිවාසිකො.

68. දසසතං රත්ති සතං ආපත්තියො ඡාදයිත්වාන,
දස රත්තියො වසිත්වාන මුච්චෙය්‍ය පාරිවාසිකො.

69. කති කම්මදොසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං සබ්බෙ අධම්මිකා[1] කති.

70. ද්වාදස කම්මදොසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං සබ්බෙවාධම්මිකා කතා.

71. කති කම්මසම්පත්තියො වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං සබ්බෙව ධම්මිකා කති.

72. චතස්සො සම්පත්තියො වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං සබ්බෙව ධම්මිකා කතා.

73. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
ඡ චම්පායං විනයවත්ථුස්මිං ධම්මිකා අධම්මිකා කති

74. ඡ කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං එකෙත්ථ ධම්මිකා කතා;
පඤ්ච අධම්මිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

75. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං ධම්මිකා අධම්මිකා කති.

76. චත්තාරි කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
චම්පායං විනයවත්ථුස්මිං එකෙත්ථ ධම්මිකා කතා;
තයො අධම්මිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා.

77 යං දෙසිතං අනන්තජිනෙන තාදිනා
ආපත්තික්ඛන්ධානි විවෙකදස්සිනා,
කතෙත්ථ සම්මන්ති විනා සමථෙහි
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

---

1. සබ්බෙව අධම්මිකා - මජසං.

64. දස පුහුලෝ නො වැන්ද යුත්තාහ. සාමීචිකර්ම සහිත අඤ්ජලිකර්ම ඔවුනට නොකටයුතු යි. (ඒ දසදෙනාට වත් කරන්නහුට) දුකුළා වේ. අතිරෙක සිවුරු දැරීම දස දිනක් පමණි.

65. වැස නිමවූ වස් ඇති කී දෙනකුන්හට මෙහි සිවුරු දිය යුතු ද, කීදෙනකුන්හට (සුදුසු ප්‍රතිග්‍රාහකයකු) ඇති කල්හි දියයුතු ද, කීදෙනකුන්හට නොදියයුතු ද යත් :

66. විසූ වස් ඇති පස්සහදාමියනට මෙහි සිවුරු (සම්මුඛයෙහි) දියයුතු යි. (උම්මත්තක උක්ඛිත්තකාදි) සත්දෙනාහට අසම්මුඛයෙහිදු දියයුතු යි. (පණ්ඩකාදි) සොළොස් දෙනාහට සිවුරු නො දියයුතු යි.

67. කී සියයක් ඇවැත් රෑ සියයක් සඟවා පිරිවෙස් වසන තැනැත්තේ කී රැයක් වැස මිදෙන්නේ ද යත් :

68. සියක් රැයක් තුළ ඇවැත් දහසක් සඟවා පිරිවෙස් වසන තැනැත්තේ දස රැයක් වැස මිදෙන්නේ යි.

69. කෙතෙක් සියල්ල ම දැහැමි නො වූ කෙතෙක් කර්ම දෝෂයෝ සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් චම්පා නුවර විනය වස්තුවෙහි වදරණ ලදහු ද යත් :

70. චම්පා නුවර විනය වස්තුවෙහි සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් සියල්ල ම දැහැමි නො වූ අපලොකන ආදි කර්ම සතර '' අධම්මෙන වග්ගා '' ආදි තුන් තුන් අයුරින් දෙළොස් කර්ම දෙෂයෝ වදරණ ලදහ.

71. චම්පා නුවර විනය වස්තුවෙහි කෙතෙක් සියල්ල ම දැහැමි වූ කෙතෙක් කර්ම සම්පත්තීහු සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් වදරණ ලදහු ද යත් :

72. චම්පා නුවර විනය වස්තුවෙහි සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් සියල්ල ම දැහැමි වූ (අපලොකන ආදි සතර '' ධම්මෙන සමග්ගං '' ආදි විසින්) සතර සම්පත්තීහු වදරණ ලදහ.

73. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් චම්පා නුවර විනය වස්තුවෙහි කෙතෙක් කර්මයෝ වදරණ ලදහු ද, ධාර්මික වූවෝ කෙතෙක් ද, අධාර්මික වූවෝ කෙතෙක් ද යත් :

74. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් චම්පා නුවර විනය වස්තුවෙහි ('' අධම්මෙන වග්ගකම්මං '' ආදි) ෂට් කර්ම කෙනෙක් දෙශිතයහ. මෙහි (ධර්මයෙන් කරණ සමනුභාසන) කර්මය වූ එකම කර්මය ධාර්මික යයි ප්‍රකාශිත යැ. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්ම පසෙක් අධාර්මික යයි වදරණ ලදී.

75. චම්පා නුවර විනය වස්තුවෙහි සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මයෝ වදරණ ලදහු ද, ධාර්මික වූවෝ කෙතෙක් ද, අධාර්මික වූවෝ කෙතෙක් ද යත් :

76. චම්පා නුවර විනය වස්තුවෙහි සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් ('' අධම්මෙන වග්ග කම්මං '' යනාදි) කර්ම සතරෙක් වදරණ ලදී. මෙහි ('' ධම්මෙන සමග්ග කම්මං '' යන) එකම කර්මය ධාර්මික යයි ප්‍රකාශ කරණ ලදී. සූර්‍ය්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්ම තුණෙක් අධාර්මික යයි වදරණ ලදී.

77. තාදී වූ විවෙකදර්ශී වූ අනන්තජිනයන් විසින් දෙසන ලද යම් ඇවැත් කඳුහු වෙත් ද, මෙහි කෙතෙක් ඇවැත් ශමථයෙන් තොර වැ සන්හිඳේ දැයි විභඞ්ගකොවිදය, ඔබ විචාරමි, වදළ මැනැවැ.

78. යං දෙසිතා අනන්තජිනෙන තාදිනා,
ආපත්තික්ඛන්ධානි විවෙකදස්සිනා;
එකෙත්ථ සම්මති විනා සමථෙහි,
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

79. කති ආපායිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි[1] සුණොම තෙ.

80. ඡ ඌනදියඩ්ඪසතා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
ආපායිකා නෙරයිකා කප්පට්ඨා සඞ්ඝභෙදකා;
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

81. කති නාපායිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

82. අට්ඨාරස නාපායිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

83. කති අට්ඨකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

84. අට්ඨාරසට්ඨකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

85. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

86. සොළස කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

87. කති කම්මදොසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

88. ද්වාදස කම්මදොසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

89. කති කම්මසම්පත්තියො වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

90. චතස්සො කම්මසම්පත්තියො වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

91. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

92. ඡ කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

93. කති කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

---

1. විභයානි - මජසං.

78. තාදී වූ විවෙකදර්ශී වූ අනන්තජිනයන් විසින් දෙසන ලද යම් ඇවැත් කඳුහු වෙත් ද, ඔවුනාතුරෙන් එක ම සම්මුඛාවිනය හෝ පාරාජිකාපත්තිස්කන්ධය හෝ ශමථයෙන් තොර වැ සන්හිඳේ. විභඞ්ගකොවිදය, ඔබට මෙය කියමි.

79. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කීදෙනෙක් ආපායිකයහ යි වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසම්හ.

80. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් සයක් අඩු එක්සියපණස් දෙනෙක් සඞ්ඝභෙදක පුද්ගලයෝ ආපායිකයහ, නෙරයිකයහ, කල්පස්ථායීහ යි වදරණ ලද්දහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

81. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කී දෙනෙක් ආපායික නො වන්නාහ යි වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසම්හ.

82. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් අටළොස් දෙනෙක් ආපායික නො වන්නාහ යි වදරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

83. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් අෂ්ටකයෝ වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

84. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් අෂ්ටකයෝ අටළොසක් වදරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

85. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මයෝ වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

86. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්මයෝ සොළොසක් වදරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

87. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මදෙෂයෝ වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

88. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්මදෙෂයෝ දෙළොසක් වදරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

89. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මසම්පත්තීහු වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

90 සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්මසම්පත්තීහු සතරක් වදරණ ලදහ, විනය දන්නාවූ මාගේ විනය නය අසව

91. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මයෝ වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

92. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කර්මයෝ සයක් වදරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

93. සූර්‍යබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් කර්මයෝ වදරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

94. චත්තාරි කම්මානි වුත්තානි බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

95. කති පාරාජිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

96. අට්ඨ පාරාජිකා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

97. කති සඞ්ඝාදිසෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

98. තෙවීස සඞ්ඝාදිසෙසා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

99. කති අනියතා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

100. ද්වෙ අනියතා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

101. කති නිස්සග්ගියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

102. ද්වෙ චත්තාරීස නිස්සග්ගියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

103. කති පාචිත්තියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

104. අට්ඨාසීති සතං පාචිත්තියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

105 කති පාටිදෙසනීයා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

106. ද්වාදස පාටිදෙසනීයා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

107. කති සෙඛියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොම තෙ.

108. පඤ්චසත්තති සෙඛියා වුත්තා බුද්ධෙනාදිච්චබන්ධුනා,
විනයං පටිජානන්තස්ස විසයානි සුණොහි මෙ.

109. යාව සුපුච්ඡිතං තයා යාව සුවිස්සජ්ජිතං මයා:
පුච්ඡාය විස්සජ්ජනාය වා නත්ථි කිඤ්චි අසුත්තකන්ති

**දුතියගාථාසඞ්ගණිකං නිට්ඨිතං**

94. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කර්මයෝ සතරක් වදාරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

95. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් පාරාජිකාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

96. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් (භික්ෂු භික්ෂුණීන්ගේ වශයෙන්) පාරාජිකාපත්තීහු අටක් වදාරණ ලදහ. විනය දන්නාවූ මාගේ විනය නය අසව.

97. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් සඞ්ඝාදිසෙසාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

98. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් සඞ්ඝාදිසෙසාපත්තීහු තෙවිස්සක් වදාරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

99. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් අනියතාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

100. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් අනියතාපත්තීහු දෙදෙනෙක් වදාරණ ලදහ, විනය දන්නා වූ මාගේ විනය නය අසව.

101. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් නිස්සග්ගියාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

102. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් නිස්සග්ගියාපත්තීහු දෙසාළිසක් වදාරණ ලදහ. විනය දන්න ාවූ මාගේ විනය නය අසව

103. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් පාචිත්තියාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

104. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් පාචිත්තියාපත්තීහු එක්සිය අටාසූවක් වදාරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනයනය අසව.

105. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් පාටිදෙසනීයාපත්තීහු වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

106. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් පාටිදෙසනීයාපත්තීහු දෙළොසක් වදාරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

107. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් කෙතෙක් සෙඛියා ධර්මයෝ වදාරණ ලදහු ද ? විනය දන්නා වූ ඔබගේ විනය නය අසමු.

108. සුයඞ්ඛබන්ධු වූ බුදුරජුන් විසින් පන්සැත්තෑවක් සෙඛියා ධර්මයෝ වදාරණ ලදහ. විනය දන්නා වූ මාගේ විනය නය අසව.

109. ඔබ විසින් යම්තාක් මොනොවට විචාරණ ලද්දේ ද ? මා විසින් යම්තාක් මොනොවට විසඳන ලද්දේ ද, (ඒ තාක්ම) ප්‍රශ්න ඇසීමෙහි හෝ විසඳීමෙහි හෝ කිසි අයුත්තෙක් නැත්තේ යි.

දෙවන ගාථා සඞ්ගණිකය නිමි.


Free Distribution www.aathaapi.org

# සෙදමොචනගාථා

1. අසංවාසො භික්ඛූහි ච භික්ඛුනීහි ච
සම්භොගො එකච්චො තහිං න ලබ්භති,
අවිප්පවාසෙන අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

2. අවිස්සජ්ජියං[1] අවෙභඞ්ගියං[2]
පඤ්ච වුත්තා මහෙසිනා,
විස්සජ්ජෙන්තස්ස පරිභුඤ්ජන්තස්ස අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

3. දස පුග්ගලෙ න වදාමි එකාදස විවජ්ජිය,
බුඩ්ඪං වන්දන්තස්ස ආපත්ති පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

4. න උක්ඛිත්තකො න ච පන පරිවාසිකො,
න සඞ්ඝභින්නො න ච පන පක්ඛසඞ්කන්තො.
සමානසංවාසභූමියා ඨිතො
කථන්නුසික්ඛාය අසාධාරණො සියා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

5. උපෙති ධම්මං පරිපුච්ඡමානො
කුසලං අත්ථූපසංහිතං,
න ජීවති න මතො න නිබ්බුතො
තං පුග්ගලං කතමං වදන්ති බුද්ධා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

6. උබ්භක්ඛකෙ න වදාමි අධො නාභිං විවජ්ජිය,
මෙථුනධම්මපච්චයා කථං පාරාජිකො සියා;
පඤ්හා මෙසා කුසලෙහි චින්තිතා.

7. භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කරොති
අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං,
සාරම්භං අපරික්කමනං අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

8. භික්ඛු සඤ්ඤාචිකාය කුටිං කරොති
දෙසිතවත්ථුකං පමාණිකං,
අනාරම්භං සපරික්කමනං ආපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

---

1. අවිස්සජ්ජිකං - සීමු 1.
අවිස්සජ්ජිතං - ස්‍යා.
2. අවෙභඞ්ගිකං - සීමු 1.



Free Distribution www.aathaapi.org

# සෙදමොචනගාථා

1. භික්ෂූන් හා ද භික්ෂුණීන් හා ද පොහෝ පවුරුණු ආදි සංවාස නැත්තෙක් වෙයි. ඔහු කෙරෙහි සමහර (අකැප) සම්භොගයෙක් නො ලැබේ. සභාගාරසෙය්‍යාවෙන් ද ඇවැත් නො වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය ලදරු පුතු හා මවු මෙහෙණ සඳහා යැ.)

2. මහර්ෂි වූ බුදුරජුන් විසින් වියදම් නොකට යුතු වූ ද නො බෙදිය යුතු වූ ද ගරු බඩු පසෙක් වදරණ ලදහ. ඒ බඩු වියදම් කරන්නාහට පරිභොග කරන්නාහට ද ඇවැත් නො වේ. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (භයෙහි සෙනසුන් රැක්ම පිණිස නො ගරු බඩු වියදම් කොට වැළඳීම නිදෙස් බව දක්වනු සඳහා යැ.)

3. (අවන්දිය) දශපුද්ගලයන් ද නො කියමි. එකොළොස් වර්ජනීය පුද්ගලයන් ද නො කියමි. වැඩිමහලු මහණහු වඳින්නහුට ඇවැත් වේ. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (සෙලු මහණ සඳහා යැ.)

4. උබෙව්නීකම් කරණලදුයෙක් නො වෙයි. පිරිවෙස් වසන්නෙත් නො වෙයි. සඞසභෙද කළේත් නො වෙයි. තීර්ථකායතනයකට ගියේත් නො වෙයි. සමාන සංවාසක භූමියෙහි මැ සිටියේ ශික්ෂාවෙන් කෙසේ නම් අසමාන වන්නේ ද? මේ ප්‍රශ්නය විඥයින් විසින් සිතන ලදි. (කරනැවැමි විරූ මහණහු ක්ෂුර භාණ්ඩ පරිහරණය නොලැබීම සඳහා යැ.)

5. අර්ථයෙන් යුක්ත වූ කුශලධර්මයන් පිළිවිසිමින් පිරිසට එළැඹෙන්නේත් වේ. හෙ ජීවත් වන්නේ නො වෙයි. මළේත් නො වෙයි. පිරිනිවියේත් නො වෙයි. බුදුවර යෝ ඒ පුහුලා කවරෙකැයි වදරත් ද ? මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය නිර්මිත බුදුන් සඳහා යැ.)

6. අකු ඇටයෙන් මත්තෙහි ද, නැබින් යට ද (මෙවුන් දමක් ගැණ) නො කියමි. ඒ දෙපස හැර මෙවුන්දම් හෙතුවින් කෙසේ පරිජි වන්නේ ද ? මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය කවන්ධයා සඳහා යැ.)

7. මහණ තමා ඉල්වා ගත් උපකරණයෙන් නො දෙසූ කුටිවාස්තු ඇති පමණ ඉක්ම වූ උවදුරු සහිත වූ උපචාර රහිත වූ කිළියක් කෙරේ. (ඔහුට එයින්) ඇවැත් නො වේ. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය තණ සෙවෙනි කළ කිළිය සඳහා යැ.)

8. මහණ තමා ඉල්වා ගත් උපකරණයෙන් දෙසන ලද කුටිවාස්තු ඇති ප්‍රමාණවත් වූ උවදුරු රහිත වූ උපචාර සහිත වූ කිළියක් කෙරේ. (මේ හෙතුවෙන් ඔහුට) ඇවැත් වේ. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය ධනිය තෙරුන්ගේ කිළිය වැනි සියල්ල මැටිමුවා කිළිය සඳහා යැ.)



Free Distribution www.aathaapi.org

9. න කායිකං කිඤ්චි පයොගමාචරෙ
න චාපි වාචාය පරෙ භණෙය්‍ය,
ආපජ්ජෙය්‍ය ගරුකං ඡෙජ්ජවත්ථුං
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

10. න කායිකං වාචසිකඤ්ච කිඤ්චි
මනසාපි සන්තො න කරෙය්‍ය පාපං,
සො නාසිතො කින්ති සුනාසිතො භවෙ
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

11 අනාලපන්තො මනුජෙන කෙනචි
වාචා ගිරං නො ච පරෙ භණෙය්‍ය,
ආපජ්ජෙය්‍ය වාචසිකං න කායිකං
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

12. සික්ඛාපදා බුද්ධවරෙන වණ්ණිතා
සඞ්ඝාදිසෙසා චතුරො භවෙය්‍යුං
ආපජ්ජෙය්‍ය එකපයොගෙන සබ්බෙ
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

13. උභො එකතො උපසම්පන්නා
උභින්නං හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය,
සියා ආපත්තියො නානා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

14. චතුරො ජනා සංවිධාය
ගරුභණ්ඩං අවාහරුං,
තයො පාරාජිකා එකො න පාරාජිකො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

15. ඉත්ථී ච අබ්භන්තරෙ සියා
භික්ඛු ච බහිද්ධා සියා,
ඡිද්දං තස්මිං ඝරෙ නත්ථි
මෙථුනධම්මපච්චයා
කථං පාරාජිකො සියා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

16. තෙලං මධුං ඵාණිතඤ්චාපි සප්පිං
සාමං ගහෙත්වාන නික්ඛිපෙය්‍ය
අවීතිවත්තෙ සත්තාහෙ,
සති පච්චයෙ පරිභුඤ්ජන්තස්ස ආපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

17. නිස්සග්ගියෙන ආපත්ති
සුද්ධකෙන පාචිත්තියං,
ආපජ්ජන්තස්ස එකතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

9. කායික වූ කිසියම් ප්‍රයොගයකුත් නො කරන්නේ ය. වචනයෙන් අනුන්ට කිසිවකුත් නො කියන්නේ ය. (එහෙත්) ගරුක වූ පරිජි ඇවතට පැමිණෙන්නේ ය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය වජ්ජපටිච්ඡාදක මෙහෙණ සඳහා යැ).

10. සත්පුරුෂ තෙමේ කයින් ද, වචනයෙන් ද පවක් නො කරන්නේ ය. සිතිනුදු කිසි පවක් නො කරන්නේ ය. නසන ලද හෙතෙමේ කුමක් හෙයින් මොනවට නසන ලද්දේ වන්නේ ද, මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය පණ්ඩකාදි එකොළොස් අභව්‍ය පුද්ගලයන් සඳහා යැ).

11. කිසියම් මිනිසක්හු සමඟ කථා නො කරන්නේ කිසි වචනයක් මෙරමාහට නො බණන්නේ ද වෙයි. එහෙත් කායද්වාරික නො වූ වාග්ද්වාරික ඇවැතකට පැමිණෙන්නේ ය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය පොහෝගෙයි සාපත්තික වැ තුෂ්ණීම්භූත වන මහණහු සඳහා යැ).

12. බුදුරජුන් විසින් වර්ණනා කරණ ලද (පණවන ලද) සඟවෙසෙස් සිකපදයෝ සතරෙක් වන්නාහ. ඒ සියල්ලට එක් පියොවින් අවදනේ ය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය අරුණොද්ගමනයෙහි අන් ගමකට ඇතුළත් නදියක පරතෙරට පැමිණි මෙහෙණහු සඳහා යැ).

13. දෙදෙනෙක් එක් එක් පක්ෂයෙන් උපසපන් වූහ. ඒ දෙදෙනාගේ අතින් යමෙක් සිවුරක් පිළිගන්නේ නම්, (ඔහුට) වෙන් වෙන් ඇවැත් වන්නේ ය. මේ මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය එකතො උපසම්පන්න මෙහෙණන් දෙදෙනකු සඳහා යැ).

14. සතර දෙනෙක් (ඔවුනොවුන්ට) විධාන කොට ගෙණ ගරු බඩුවක් සොරා ගත්හ. (ඔවුනතුරෙන්) තිදෙනෙක් පරිජි වූහ. එකෙක් පරිජි නො වීය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය සාහත්ථික ආණත්තික භෙදයෙන් කියන ලදි.)

15. ස්ත්‍රියක් තොමෝත් ඇතුළු ගෙයි වන්නී ය. මහණෙක් තෙමේත් ගෙයින් පිටත වන්නේ ය. ඒ ගෙයි සිදුරෙක් නැත. (එසේ කල්හි) මෙවුන්දම් හෙතුවෙන් කෙසේ පරිජි වන්නේ ද, මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි (මේ ගෙය පිළියෙන් කළ බැවිනි.)

16. තෙල් යැ, මී යැ, උක්පැණි යැ, ගිතෙල් යැ, යන මේ ද්‍රව්‍යයන් තෙමේ පිළිගෙන තබන්නේ ය. සත් දින ඉකුත් නො වූ කල්හි ම ප්‍රයොජනයක් ඇති කල්හි වළඳන්නහුට ඇවැත් වේ. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය ලිඟු පෙරළි වුවන් සඳහා යැ.)

17. නිසඟි පචිති ඇවැතට ද, ශුද්ධ පචිති ඇවැතට ද එකවට පැමිණෙන්නේ වන්නේ ය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය සඟසතු සිවුරුවලින් එකවර දෙකක් ගන්නා මහණ සඳහා යැ).

18. භික්ඛු සියා වීසතියා සමාගතා
කම්මං කරෙය්‍යුං සමග්ගසඤ්ඤිනො,
භික්ඛු සියා ද්වාදසයොජනෙ ඨිතො
කම්මඤ්ච තං කුප්පෙය්‍ය වග්ගපච්චයා.
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

19. පදවීතිහාරමත්තෙන වාචාය භණිතෙන ච,
සබ්බානි ගරුකානි සප්පටිකම්මානි,
චතුසට්ඨි ආපත්තියො ආපජ්ජෙය්‍ය එකතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

20. නිවත්ථො අන්තරවාසකෙන,
දිගුණං සඞ්ඝාටිපාරුතො
සබ්බානි තානි නිස්සග්ගියානි හොන්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

21. න චාපි ඤත්ති න ච කම්මවාචා
න චෙහි භික්ඛූති ජිනො අවොච
සරණගමනම්පි න තස්ස අත්ථි,
උපසම්පන්නා උපසම්පදා චස්ස අකුප්පා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

22. ඉත්ථිං හනෙ න මාතරං පුරිසඤ්ච න පිතරං,
හනෙය්‍ය අනරියං මන්දො තෙන චානන්තරං ඵුසෙ,
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

23. ඉත්ථිං හනෙ ච මාතරං පුරිසඤ්ච පිතරං හනෙ,
මාතරං පිතරං හන්ත්වා න තෙනානන්තරං ඵුසෙ;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

24. අචොදයිත්වා අසාරයිත්වා
අසම්මුඛීභූතස්ස කරෙය්‍ය කම්මං,
කතඤ්ච කම්මං සුකතං භවෙය්‍ය
කාරකො ච සඞ්ඝො අනාපත්තිකො සියා,
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

25. චොදයිත්වා සාරයිත්වා
සම්මුඛීභූතස්ස කරෙය්‍ය කම්මං
කතඤ්ච කම්මං අකතං භවෙය්‍ය
කාරකො ච සඞ්ඝො සාපත්තිකො සියා
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

26. ඡින්දන්තස්ස ආපත්ති ඡින්දන්තස්ස අනාපත්ති,
ඡාදෙන්තස්ස ආපත්ති ඡාදෙන්තස්ස අනාපත්ති;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

27. සච්චං භණන්තො ගරුකං මුසා ච ලහු භාසතො,
මුසා භණන්තො ගරුකං සච්චඤ්ච ලහු භාසතො;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

18. භික්ෂුහු විංශති වර්ග වූවාහු රැස්වන්නාහු ය. සමග්‍ර සංඥ ඇත්තාහු සඞ්ඝ කර්මය කරන්නාහ. මහණෙක් දෙළොස් යොදුනෙක්හි සිටියේ වන්නේ ය. වර්ග හෙතුවෙන් ඒ කර්මය ද කොප්‍ය වන්නේ ය. මේ ප්‍රශ්නය විඥයන් විසින් සිතන ලදි. (මෙය බාරාණසී ආදිය වැනි විශාල නගරයන්හි ග්‍රාමසීමාව සඳහා කියන ලදී.)

19. පදවීතිහාර මාත්‍රයෙන් ද, වචනයෙන් කියූ පමණින් ද ප්‍රතිකර්ම සහිත වූ සියලුම සුසැටක් ගරු ඇවැතුන්ට එකවර පැමිණෙන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය සඤ්චරිත්තය සඳහා කියන ලදි.)

20. අඳනා සිවුරෙන් හඳනා ලද්දේ සහළ සිවුර උතුරුසඟසිවුර හා එක්කිරීමෙන් ද්විගුණ කොට පොරෝනා ලද්දේ (ඒ තුන් සිවුර කයින් වෙන් වූයේ) ඒ සියලු සිවුරු නිසඟි වෙත්. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය නො නෑ මෙහෙණක ලවා සිවුරු දෙවීම සඳහා කියන ලදි.)

21. ඥත්තිය ද නැත. කර්මවාක්‍යය ද නැත. සර්වඥ තෙමේ " එව මහණ:' යි නො වදළේ ය. ඔහුට සරණාගමනොපසම්පදව ද නැත. (එහෙත්) උපසපන් යැ' ඔහුගේ උපසම්පදව ද අකොප්‍ය වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මහාපජාපති ගොතමියගේ අෂ්ටගුරුධර්ම ප්‍රතිග්‍රහණ උපසම්පදව සඳහා කියන ලදි.

22. ස්ත්‍රියක නසන්නේ ය. (එහෙත්) මව නො වෙයි. පුරුෂයකුදු නසන්නේ ය. (එහෙත්) පියා නො වෙයි. අඥනපුද්ගල තෙමේ මෙසේ ආර්‍ය්‍ය නො වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ නසන්නේ ය. ඒ නැසීම් හෙතුවෙන් ආනන්තර්‍ය්‍යකර්මය ස්පර්ශ කරන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය කර්මවිපාක හෙතුවෙන් ලිඞ්ග පරිවර්තනයෙන් ස්ත්‍රී වූ පියා ද පුරුෂ වූ මව ද නසන්නහු සඳහා කියන ලදි.)

23. මව වූ ස්ත්‍රිය ද නසන්නේ ය. පිය වූ පුරුෂයා ද නසන්නේ ය. මෙසේ මව ද පියා ද නසා ඒ කර්මය හෙතුකොට ගෙණ ආනන්තර්‍ය්‍ය කර්මය ස්පර්ශ නො කරන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය මිනිස් වැ සිට තිරිසන් වූ දෙමවුපියන් නසන්නවුන් සඳහා කියන ලදි.)

24. චොදනා නො කොට සිහි නො කරවා හමු නොවූවහුට කර්මය කරන්නේ ය කරණ ලද කර්මය මොනවට කරණ ලද වන්නේ ය. කාරක සඞ්ඝ තෙමේ ද ආපත්ති රහිත වන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය දූතයකු ලවා උපසපන් කරවීම සඳහා කියන ලදි.)

25. චොදනා කොට සිහි කරවා හමුවූවහුට කර්මය කරන්නේ ය. කරණ ලද කර්මය ද නො කරණ ලද වන්නේ ය. කාරකසඞ්ඝ තෙමේ ද ආපත්ති සහිත වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය පණ්ඩකාදීන්ගේ උපසම්පදව සඳහා කියන ලදි.)

26. රුක් ඈ සිඳින්නහුට ඇවැත් වේ. කෙස් ඈ සිඳින්නහුට ඇවැත් නො වේ. (ඇවැත් ඈ) වසන්නහුට ඇවැත් වේ. (ගේදොර) වසන්නහුට ඇවැත් නො වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි.

27. සත්‍යය කියන්නේ ගරු ඇවැතට පැමිණෙයි, බොරු කියන්නහුට ලුහු ඇවැත් වෙයි, බොරු කියන්නේ ගරු ඇවැතට පැමිණෙයි, සත්‍ය කියන්නහුට ලුහු ඇවැත් වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි.

28. අධිට්ඨිතං රජනාය රත්තං
කප්පකතම්පි සන්තං,
පරිභුඤ්ජන්තස්ස ආපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

29. අත්ථඞ්ගතෙ සුරියෙ භික්ඛු මංසානි ඛාදති
න උම්මත්තකො න ච පන ඛිත්තචිත්තො,
න චාපි සො වෙදනට්ටො භවෙය්‍ය
න චස්ස හොති ආපත්ති,
සො ච ධම්මො සුගතෙන දෙසිතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

30. න රත්තචිත්තො න ච පන ථෙය්‍යචිත්තො
න චාපි සො පරං මරණාය චෙතයි,
සලාකං දෙන්තස්ස හොති ඡෙජ්ජං
පටිග්ගණ්හන්තස්ස ථුල්ලච්චයං
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

31. න චාපි ආරඤ්ඤකං සාසඞ්කසම්මතං
න චාපි සඞ්ඝෙන සම්මුති දින්නා,
න චස්ස කඨිනං අත්ථතං තත්ථෙව
චීවරං නික්ඛිපිත්වා ගච්ඡෙය්‍ය අඩ්ඪයොජනං
තත්ථෙව අරුණං උග්ගච්ඡන්තස්ස අනාපත්ති
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

32. කායිකානි න වාචසිකානි
සබ්බානි නානාවත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

33. වාචසිකානි න කායිකානි
සබ්බානි නානාවත්ථුකානි,
අපුබ්බං අචරිමං ආපජ්ජෙය්‍ය එකතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා

34. තිස්සිත්ථියො මෙථුනං තං න සෙවෙ
තයො පුරිසෙ තයො ච අනරියපණ්ඩකෙ,
න චාචරෙ මෙථුනං බ්‍යඤ්ජනස්මිං
ඡෙජ්ජා සියා මෙථුනධම්මපච්චයා,
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

35. මාතරං චීවරං යාචෙ නො ච සඞ්ඝස්ස[1] පරිණතං,
තෙනස්ස හොති ආපත්ති අනාපත්ති ච ඤාතකෙ;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

---

1. {සඞ්ඝෙ - සීමු 2. මජසං.
{නො චෙ සඞ්ඝස්ස - සීමු 1.

28. ඉටන ලද්දු වූ ද කැපරදනින් රදන ලද්දු වූ ද කප්බින්දු තබන ලද්දු වූ ද (සිවුරක්) පිරිබෝ කරන්නහුට ඇවැත් වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය පළමු පරිභොග කරමින් සිටිය දී නිසඟි වූ සිවුර නො නිසද පරිභොග කරන්නහු සඳහා කියන ලදී.)

29. හිරු අවරට ගිය කල්හි මහණ තෙමේ මස් අනුභව කරයි. උමතුවූවෙක් ද නො වෙයි. පෙරැළි සිතැත්තේ ද නො වෙයි. හෙතෙමේ වෙදනායෙන් පෙළුනෙක් ද නො වන්නේ ය. (එහෙත්) ඔහුට ඇවැත් නො වේ. ඒ ධර්මය ද බුදුරජුන් විසින් දෙශනා කරන ලද්දේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය වමාරා කන මහණහු සඳහා කියන ලදී.)

30. මෙවුන්දම්රායෙන් රත් වූ සිතැත්තේ නො වෙයි. සොරසිත් ඇත්තේ ද නො වෙයි. හෙතෙමේ මෙරමා නසනු පිණිස ද නො සිතී ය. ලහ දෙන්නහුට පරිජි වෙයි. පිළිගන්නහුට ථුලැසි වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (සඞ්ඝභෙදයෙහි ලහ ගැන්වීම සඳහා කියන ලදී.)

31. සැක සහිත යැ යි සම්මත වූ වනසෙනසුනෙක් ද නො වෙයි. බිඳුනු සඟහු විසින් අවිප්පවාසසම්මුතිය දෙන ලද්දී නො වෙයි. ඒ පුද්ගලයා විසින් කඨිනයෙක් නො අතුරණ ලද්දේ ය. සැක සහිත යැ යි සම්මත වනසෙනසුනක් නො වූ තන්හි ම සිවුර තබා අඩ යොදුනක් තැන් යන්නේ ය. එහි ම අරුණ නගන්නහුට ඇවැත් නො වේ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය මනාව පිහිටි නුගරුක් වැනි එක් කුලයක්හුගේ රුක්මුල සඳහා කියන ලදී.)

32. කයින් සිදු වෙති. වචනයෙන් සිදු නො වෙති. සියල්ලෝ වෙන් වෙන් වූ වස්තු ඇත්තාහු වෙත්. පෙර පසු නො වැ එකවර (සඟවෙසෙස්) අවදනේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය බොහෝ මාගමුන්ගේ කෙස් හෝ ඇඟිලි හෝ එකට අල්වා සඟවෙසෙස් අවදනහු සඳහා කියන ලදී.)

33. වචනයෙන් සිදු වෙති. කයින් සිදු නො වෙති. වෙන් වෙන් වූ සියලු ඇවැතුන්ට පෙර පසු නො වැ එකවර පැමිණෙන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය "සබ්බාව තුම්හෙ සිඛරණියෝ" යනාදි විසින් තුළුල් තෙපුල් කියන්නහු සඳහා කියන ලදී.)

34. මිනිස්, නො මිනිස්, තිරිසන් විසින් ස්ත්‍රීහු තිදෙනෙකි. (ඔවුන් හා) ඒ මෛථුන සෙවනය ද නො කරන්නේ ය. මිනිස්, නො මිනිස්, තිරිසත් යන තුන් පුරුෂයන් වෙත ද, උභතොබ්‍යඤ්ජනකසඞ්ඛ්‍යාත අනායඝියන් තිදෙන වෙත ද, පණ්ඩකයන් තිදෙනා වෙත ද එළඹ මෙවුන්දම් සෙවුනේ ද නො වෙයි. ලම්බී මුදුපිට්ඨිකාදි අනුලොම් පාරාජික වස්තුවෙහි ද මෙවුන්දම් නො හැසිරෙන්නේ ය. (එහෙත්) මෛථුන ධර්ම හෙතුවෙන් පරිජි වන්නේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය අෂ්ට වස්තුක පාරාජිකාව සඳහා කියන ලදී.)

35. මවගෙන් සිවුරක් ඉල්ලන්නේ ය. සඞ්ඝයාහට පිරිනමන ලද්දෙක් ද නො වෙයි. නෑයන් විනවීමෙහි ඇවැත් නො වේ. ඔහුට කවර ශික්ෂාපදයෙකින් ඇවැත් වේ ද, මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදී. (මෙය පිට්ඨිසමය නම් වූ ඉල්මස පසළොස්වක පටන් පොසොන් පසළොස්වක තෙක් සත් මස තුළ වස්සික-සාටික චීවරය පිණිස සතුප්පාදකරණය සඳහා කියන ලදී.)

36. කුද්ධො ආරාධකො හොති කුද්ධො හොති ගරහියො;
අථ කො නාම සො ධම්මො, යෙන කුද්ධො පසංසියො;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

37. තුට්ඨො ආරධකො හොති තුට්ඨො හොති ගරහියො,
අථ කො නාම සො ධම්මො යෙන තුට්ඨො ගරහියො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

38. සඞ්ඝාදිසෙසං ථුල්ලච්චයං
පාචිත්තියං පාටිදෙසනීයං,
දුක්කටං ආපජ්ජෙය්‍ය එකතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

39. උභො පරිපුණ්ණවීසතිවස්සා
උභින්නං එකුපජ්ඣායො,
එකාචරියො එකා කම්මවාචා
එකො උපසම්පන්නො එකො අනුපසම්පන්නො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

40. අකප්පකතං නාපි රජනාය රත්තං
තෙන නිවත්ථො යෙන කාමං වජෙය්‍ය,
න චස්ස හොති ආපත්ති
සො ච ධම්මො සුගතෙන දෙසිතො
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

41. න දෙති න පටිග්ගණ්හාති පටිග්ගහො තෙන න විජ්ජති,
ආපජ්ජති ගරුකං න ලහුකං තඤ්ච පරිභොගපච්චයා;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

42. න දෙති න පටිග්ගණ්හාති පටිග්ගහො තෙන න විජ්ජති,
ආපජ්ජති ලහුකං න ගරුකං තඤ්ච පරිභොගපච්චයා;
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

43. ආපජ්ජති ගරුකං සාවසෙසං
ඡාදෙති අනාදරියං පටිච්ච,
න භික්ඛුනී නො ච ඵුසෙය්‍ය වජ්ජං
පඤ්හාමෙසා කුසලෙහි චින්තිතා.

සෙදමොචනගාථා නිට්ඨිතා.

36. කිපියේ සිත් ගන්නේ වෙයි, කිපියේ ගැරැහියැ යුත්තේ වෙයි, යම් කරුණෙකින් කිපියේ පැසැසිය යුත්තේ වේ ද, වැළිදු එබඳු වූ ඒ ධර්මය තෙමේ කවරේ ද ? මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි.

37. තුටුවූයේ සිත් ගන්නේ වෙයි, තුටුවූයේ ගැරහිය යුත්තේ වෙයි, යම් කාරණයෙකින් තුටුවූයේ ගැරහිය යුත්තේ වේ ද ? වැළිදු ඒ ධර්මය තෙමේ කවරේ ද? මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මේ ගාථා දෙක තීර්ත්ථකයන්ගේ වත කියන ලදි.)

38. සඟවෙසෙස යැ, පුලැසි යැ, පව්ති ය, පිළිදෙස්නී යැ, දුකුළා යැ යන මේ ඇවැතුන්ට එකවර අවදනේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය මෙවුන්දම්රායෙන් තෙත් වූ මෙහෙණක් එසේ වූ පිරිමියකු අතින් අහරක් ගෙණ මිනිස්මස් ලූණු පිණී බොජුන් හා සෙසු අකැපමස් හා සමග හනා වළඳා ද, ඇය සඳහා කියන ලදි.)

39. දෙදෙන ම පිරිපුන් විසි වයස් ඇත්තාහ. දෙදෙනාහට ම එක් ම උපාධ්‍යාය-යෙක් වෙයි. එක් ම ආචාර්‍ය්‍යයෙක් වෙයි. එක් ම කර්මවාක්‍යයෙක් වෙයි. (එහෙත්) එකෙක් උපසම්පන්න යැ, එකෙක් අනුපසම්පන්න යැ. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය අහස්හි සිටි හෙරණහු සඳහා කියන ලදි.)

40. (යම් සිවුරක්) කප්බින්දු නො තබන ලද ද, කැපරඳනින් නො රඳනා ලද ද, ඒ සිවුරෙන් හඳනා ලද්දේ කැමැති තැනකට යන්නේ ද, ඒ මහණහට ඇවැත් නො වේ. ඒ ධර්මය තෙමේත් බුදුරජුන් විසින් දෙසන ලද්දේ ය. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය අසිඳගත් සිවුරු ඇති මහණහු සඳහා කියන ලදි.)

41. මෙහෙයන තැනැත්තී නො දෙයි. මෙහෙයනු ලැබූ තැනැත්තී මෙහෙයන මෙහෙණ අතින් නො පිළිගණියි. ඒ කාරණයෙන් (මෙහෙයන තැනැත්තිය අතින් මෙහෙයනු ලැබූ මෙහෙණගේ) පිළිගැන්මෙක් නැත. එහෙත් ගරු ඇවැතට පැමිණෙයි. ලුහු ඇවැතට නො පැමිණේ. හෙද පිරිබෝ කිරීම් හේතුවෙනි. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය මෙවුන්දම්රායෙන් තෙත් වූ පිරිමියකු අතින් අහරක් පිළිගැණීමට මෙහෙණක මෙහෙයන මෙහෙණ සඳහා කියන ලදි.)

42. තොමෝ නො දෙයි. අන් තැනැත්තිය ද නො පිළිගණියි. ඒ කාරණයෙන් පිළිගැන්මෙක් නැත. එහෙත් ලුහු ඇවැතට පැමිණෙයි, ගරු ඇවැතට නො පැමිණේ. එද පිරිබෝ කිරීම් හේතුවෙනි. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙවුන්දම්රායෙන් තෙත් වූ පිරිමියකු අතින් දියදැහැටි පිළිගැණීමට මෙහෙණක මෙහෙයන මෙහෙණ සඳහා කියන ලදි.)

43. සාවශෙෂ වූ ගරු ඇවැතට පැමිණෙයි. අනදරය පිණිස (ඇවැත) සඟවාලයි. ඕ මෙහෙණක් නො වේ. (ඇවැත සැඟවීමෙන්) වරදක් ද නො පහස්නේ යි. මේ ප්‍රශ්නය විනයඥයන් විසින් සිතන ලදි. (මෙය උබෙව්නීකම් කරණ ලද මහණහු සඳහා කියන ලදි.)

සේදමොචන ගාථා නිමි

තස්සුද්දානං :

1. අසංවාසො අවිස්සජ්ජි දස ච අනුක්ඛිත්තකො,
උපෙති ධම්මං උබ්භක්ඛකං තතො සඤ්ඤාචිකා දුවෙ.

2. න කායිකඤ්ච ගරුකං කායිකං සුභාසිතං[1].
අනාලපන්තො සික්ඛා ච උභො ච චතුරො ජනා.

3. ඉත්ථි තෙලඤ්ච නිස්සග්ගි භික්ඛු ච පදවීතියො,
නිවත්ථො ච න ච පඤ්ඤත්ති න මාතරං පිතරං හනෙ

4. අචොදයිත්වා චොදයිත්වා ඡින්දන්තං සච්චමෙව ච,
අධිට්ඨිතඤ්චත්ථඞ්ගතෙ න රත්තං න චාරඤ්ඤකං.

5. කායිකා වාචසිකා ච තිස්සිත්ථි චාපි මාතරං,
කුද්ධො ආරද්ධකො තුට්ඨො සඞ්ඝාදිසෙසා ච උභො.

6. අකප්පකතං න දෙති න දෙතාපජ්ජතෙ ගරුං,
සෙදමොචනිකා ගාථා පඤ්හා විඤ්ඤුවිභාවිතාති[2]

---

## 1. කම්මවග්ගො

1. චත්තාරි කම්මානි : අපලොකනකම්මං, ඤත්තිකම්මං, ඤත්තිදුතියකම්මං, ඤත්තිචතුත්ථකම්මං ඉමානි චත්තාරි කම්මානි කතිහාකාරෙහි විපජ්ජන්ති, ඉමානි චත්තාරි කම්මානි පඤ්චහාකාරෙහි විපජ්ජන්ති : වත්ථුතො වා, ඤත්තිතො වා, අනුසාවනතො වා, සීමතො වා, පරිසතො වා.

2. කථං වත්ථුතො කම්මානි විපජ්ජන්ති : සම්මුඛාකරණීයං කම්මං අසම්මුඛා කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. පටිපුච්ඡා කරණීයං කම්මං අපටිපුච්ඡා කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. පටිඤ්ඤාය කරණීයං කම්මං අපටිඤ්ඤාය කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. සතිවිනයාරහස්ස අමූළ්හවිනයං දෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. අමූළ්හවිනයාරහස්ස තස්සපාපියසිකාකම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. තස්සපාපියසිකාකම්මාරහස්ස තජ්ජනීයකම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. තජ්ජනීයකම්මාරහස්ස නියස්සකම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. නියස්සකම්මාරහස්ස පබ්බාජනීයකම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. පබ්බාජනීයකම්මාරහස්ස පටිසාරණීය කම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. පටිසාරණීයකම්මාරහස්ස උක්ඛෙපනීයකම්මං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. උක්ඛෙපනීය-කම්මාරහස්ස පරිවාසං දෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. පරිවාසාරහං මූලාය පටිකස්සති වත්ථුවිපන්නං අධම්මකම්මං. මූලායපටිකස්සනාරහස්ස

---

1. න වාචසිකං - සීමු, මජසං.
2. විඤ්ඤූහි විභාවිතා - සීමු 2. මජසං.

Free Distribution www.aathaapi.org

එහි නාමාවලිය :

අසංවාස යැ, අවිස්සජ්ජික යැ, දස (පුග්ගල) යැ, අනුක්ඛිත්තක උපෙතිධම්ම උබ්භක්ඛක තුණ යැ, සඤ්ඤාවිකා දෙක යැ.

න කායික ගරුක යැ, න කායික සුභාසිත යැ, අනාලපන්ත යැ, සික්ඛා යැ, උභො යැ, චතුරොජනා යැ.

ඉත්ථි යැ, තෙල යැ, නිස්සග්ගිය යැ, භික්ඛු යැ, පදවීති යැ, නිවත්ථ යැ, න වාපිඤත්තිය න මාතර පිතර යැ, හනෙ යැ.

අවොදයිත්වා යැ, වොදයිත්වා යැ, ඡින්දන්ත යැ, සච්ච යැ, අධිට්ඨිත යැ, අත්ථංගත යැ, නරත්ත යැ, න වාපි ආරඤ්ඤක යැ, කායිකා යැ, වාචසිකා යැ, තිස්සිත්ථී යැ, මාතර යැ කුද්ධ ආරාධක යැ, තුට්ඨ ආරාධක යැ, සඞ්ඝාදිසෙස යැ, උභො යැ.

අකප්පකත යැ, න දෙති යැ, ආපජ්ජති ගරුක යැ, යන ප්‍රශ්නයෝ විනයඥයන් විසින් ප්‍රකාශ කරණ ලද සෙදමොචනික ගාථාවෝ වෙති.

---

## 1. කම්මවග්ගය

1. කර්ම සතරෙකි : අපලොකන කර්ම යැ, ඤත්ති කර්ම යැ, ඤත්තිදුතිය කර්ම යැ, ඤත්තිචතුත්ථ කර්ම යැ යි. මේ සතර කර්මයෝ කෙතෙක් අයුරෙකින් කොප්‍ය වෙත් ද ; මේ සතර කර්මයෝ පස් අයුරෙකින් කොප්‍ය වෙති. වස්තුයෙන් හෝ ඤත්තියෙන් හෝ අනුශ්‍රාවණයෙන් හෝ සීමායෙන් හෝ පිරිස වසයෙන් හෝ යැ.

2. වස්තුයෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත් : හමුයෙහි කටයුතු කර්මය නො හමුයෙහි කෙරෙයි. වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. පිළිවිස කටයුතු කර්මය නො පිළිවිස කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. ප්‍රතිඥයෙන් කටයුතු කර්මය අප්‍රතිඥයෙන් කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. සතිවිනයට සුදුසු වූවහුට අමූළ්හවිනය දෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. අමූළ්හවිනයට සුදුසු වූවහුට තස්සපාපියාසිකාකර්මය කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. තස්සපාපියාසිකා කර්මයට සුදුසු වූවහුට තජ්ජනීය කර්මය කෙරෙයි. වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. තජ්ජනීය කර්මයට සුදුසු වූවහුට නියස්සකර්මය කෙරෙයි, වස්තු විපන්න අධර්මකර්මය වෙයි. නියස්ස කර්මයට සුදුසු වූවහුට පබ්බාජනීය කර්මය කෙරෙයි, වස්තුවිපන්න අධර්මකර්මය වෙයි පබ්බාජනීය කර්මයට සුදුසු වූවහුට පටිසාරණීය කර්මය කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. පටිසාරණීය කර්මයට සුදුසු වූවහුට උක්ඛෙපනීය කර්මය කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. උක්ඛෙපනීය කර්මයට සුදුසු වූවහුට පරිවාසය දෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. පරිවාසයට සුදුසු වූවහුට මූලායපටිකස්සනය කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. මූලායපටිකස්සනයට

මානත්තං දෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. මානත්තාරහං අබ්භෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. අබ්භානාරහං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. අනුපොසථෙ උපොසථං කරොති වත්ථුවිපන්නං අධම්මකම්මං. අපවාරණාය පවාරෙති. වත්ථුවිපන්නං අධම්මකම්මං. එවං වත්ථුතො කම්මානි විපජ්ජන්ති.

3. කථං ඤත්තිතො කම්මානි විපජ්ජන්ති: පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති. වත්ථුං න පරාමසති, සඞ්ඝං න පරාමසති, පුග්ගලං න පරාමසති, ඤත්තිං න පරාමසති, පච්ඡා ඤත්තිං ඨපෙති, ඉමෙහි පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති.

4. කථං අනුස්සාවනතො කම්මානි විපජ්ජන්ති; පඤ්චහාකාරෙහි අනුස්සාවනතො කම්මානි විපජ්ජන්ති: වත්ථුං න පරාමසති, සඞ්ඝං න පරාමසති, පුග්ගලං න පරාමසති, සාවනං හාපෙති, අකාලෙ සාවෙති, ඉමෙහි පඤ්චහාකාරෙහි අනුස්සාවනතො කම්මානි විපජ්ජන්ති.

5. කථං සීමතො කම්මානි විපජ්ජන්ති: එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති: අතිඛුද්දකං සීමං සම්මන්නන්ති, අතිමහතිං සීමං සම්මන්නන්ති, ඛණ්ඩනිමිත්තං සීමං සම්මන්නන්ති, ඡායානිමිත්තා සීමං සම්මන්නන්ති, අනිමිත්තං සීමං සම්මන්නන්ති, බහිසීමෙ ඨිතො සීමං සම්මන්නන්ති, නදියා සීමං සම්මන්නන්ති, සමුද්දෙ සීමං සම්මන්නන්ති, ජාතස්සරෙ සීමං සම්මන්නන්ති, සීමාය සීමං සම්භින්දන්ති, සීමාය සීමං අජ්ඣොත්ථරන්ති. ඉමෙහි එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති.

6. කථං පරිසතො කම්මානි විපජ්ජන්ති: ද්වාදසහි ආකාරෙහි පරිසතො කම්මානි විපජ්ජන්ති: චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ අනාගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, පඤ්චවග්ගකරණෙ කම්මෙ -පෙ- දසවග්ගකරණෙ කම්මෙ -පෙ- වීසතිවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ අනාගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වීසතිවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වීසතිවග්ගකරණෙ කම්මෙ -පෙ- යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති. ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, ඉමෙහි ද්වාදසහි ආකාරෙහි පරිසතො කම්මානි විපජ්ජන්ති.

Free Distribution www.aathaapi.org

සුදුසු වූවහුට මානත දෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. මානතට සුදුසු වූවහු අබ්භාන කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. අබ්භානයට සුදුසු වූවහු උපසපන් කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. නොපොහෝ දිනයෙහි පොහොය කෙරෙයි, වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. නොපවුරුණු දිනයෙහි පවාරණය කෙරෙයි. වස්තුවිපන්න අධර්ම කර්මය වෙයි. මෙසේ වස්තුයෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

3. ඤත්තියෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත්: පස් අයුරෙකින් ඤත්තියෙන් කර්මයෝ කොප්‍ය වෙත්, වස්තුව පරාමර්ශනය නො කෙරෙයි. සඞ්ඝයා පරාමර්ශනය නො කෙරෙයි. පුද්ගලයා පරාමර්ශනය නො කෙරෙයි. ඤත්තිය පරාමර්ශනය නො කෙරෙයි. පසු වැ හෝ ඤත්තිය තබයි. මේ පස් අයුරින් ඤත්තියෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

4. අනුශ්‍රාවණයෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත්: පස් අයුරෙකින් අනුශ්‍රාවණයෙන් කර්මයෝ කොප්‍ය වෙත්. වස්තුව පරාමර්ශනය නො කෙරෙයි. සඞ්ඝයා පරාමර්ශනය නො කෙරෙයි. පුද්ගලයා පරාමර්ශනය නො කෙරෙයි. ඇස්වීම පිරිහෙළයි, නො කල්හි හෝ අස්වයි. මේ පස් අයුරෙන් අනුශ්‍රාවණයෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

5. සීමායෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත්: එකොළොස් අයුරෙකින් සීමායෙන් කර්මයෝ කොප්‍ය වෙත්. ඉතා කුඩා සීමාවක් සම්මත කෙරෙයි. ඉතා මහත් සීමාවක් සම්මත කෙරෙයි. අසටිත නිමිති ඇති සීමාවක් සම්මත කෙරෙයි. සෙවණලු නිමිති කොට ඇති සීමාවක් සම්මත කෙරෙයි. නිමිති රහිත වූ සීමාවක් සම්මත කෙරෙයි. සීමාවෙන් බැහැර සිටියේ සීමාවක් සම්මත කෙරෙයි. නදියෙහි සිමාවක් සම්මත කෙරෙයි. සමුද්‍රයෙහි සීමාවක් සම්මත කෙරෙයි. විලෙහි සීමාවක් සම්මත කෙරෙයි. සීමායෙන් සීමාව මුසු කෙරෙයි. සීමායෙන් සීමාව යටපත් කෙරෙයි. මේ එකොළොස් අයුරින් සීමායෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

6. පිරිස වශයෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත්: දොළොස් අයුරෙකින් පිරිස වශයෙන් කර්මයෝ කොප්‍ය වෙත්. චතුවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්ම ප්‍රාප්තයෝ ද ඔහු නො පැමිණියාහු වෙති. ඡන්දයට සුදුස්සන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති. චතුර්වර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්ම ප්‍රාප්තයෝ ද ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුස්සන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති. පඤ්චවර්ගකරණ කර්මයෙහි ... දශවර්ග කරණ කර්මයෙහි ... විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්ම ප්‍රාප්තයෝ ද ඔහු නොපැමිණියාහු වෙති. ඡන්දයට සුදුස්සන්.ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුස්සන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. හමු වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝද ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුස්සන්ගේ ඡන්දය ගෙණෙන ලද්දේ වෙයි. හමු වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති. මේ දොළොස් අයුරින් පිරිස වශයෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

7. චතුවග්ගකරණෙ කම්මෙ චත්තාරො භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා, යස්ස සඞ්ඝො කම්මං කරොති සො නෙව කම්මප්පත්තො නාපි ඡන්දාරහො, අපි ච කම්මාරහො. පඤ්චවග්ගකරණෙ කම්මෙ පඤ්ච භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා, යස්ස සඞ්ඝො කම්මං කරොති සො නෙව කම්මප්පත්තො නාපි ඡන්දාරහො අපි ච කම්මාරහො, දසවග්ගකරණෙ කම්මෙ දස භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා, යස්ස සඞ්ඝො කම්මං කරොති සො නෙව කම්මප්පත්තො නාපි ඡන්දාරහො අපි ච කම්මාරහො, වීසතිවග්ගකරණෙ කම්මෙ වීසති භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා, යස්ස සඞ්ඝො කම්මං කරොති සො නෙව කම්මප්පත්තො නාපි ඡන්දාරහො, අපි ච කම්මාරහො.

8. චත්තාරි කම්මානි: අපලොකනකම්මං, ඤත්තිකම්මං, ඤත්තිදුතියකම්මං, ඤත්තිචතුත්ථකම්මං, ඉමානි චත්තාරි කම්මානි කතීහාකාරෙහි විපජ්ජන්ති: ඉමානි චත්තාරි කම්මානි පඤ්චහාකාරෙහි විපජ්ජන්ති: වත්ථුතො වා ඤත්තිතො වා අනුසාවනතො වා සීමතො වා පරිසතො වා.

9. කථං වත්ථුතො කම්මානි විපජ්ජන්ති: පණ්ඩකං උපසම්පාදෙති. වත්ථුවිපන්නං අධම්මකම්මං. ථෙය්‍යසංවාසකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. තිත්ථියපක්කන්තකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. තිරච්ඡානගතං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං මාතුඝාතකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. පිතුඝාතකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං, අරහන්තඝාතකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. භික්ඛුනීදූසකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. සඞ්ඝභෙදකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං ලොහිතුප්පාදකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. උභතොබ්‍යඤ්ජනකං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං, ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙති වත්ථුවිපන්නං අධම්මකම්මං. එවං වත්ථුතො කම්මානි විපජ්ජන්ති.

10. කථං ඤත්තිතො කම්මානි විපජ්ජන්ති: පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති: වත්ථුං න පරමසති, සඞ්ඝං න පරමසති, පුග්ගලං න පරමසති, ඤත්තිං න පරමසති, පච්ඡා වා ඤත්තිං ඨපෙති, ඉමෙහි පඤ්චහාකාරෙහි ඤත්තිතො කම්මානි විපජ්ජන්ති.

11. කථං අනුසාවනතො කම්මානි විපජ්ජන්ති: පඤ්චහාකාරෙහි අනුසාවනතො කම්මානි විපජ්ජන්ති: වත්ථුං න පරාමසති, සඞ්ඝං න පරාමසති, පුග්ගලං න පරාමසති, සාවනං හාපෙති, අකාලෙ වා සාවෙති ඉමෙහි පඤ්චහාකාරෙහි අනුසාවනතො කම්මානි විපජ්ජන්ති.

12. කථං සීමතො කම්මානි විපජ්ජන්ති: එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති: අතිඛුද්දකං සීමං සම්මන්නති, අතිමහතිං සීමං සම්මන්නති, ඛණ්ඩනිමිත්තං සීමං සම්මන්නති, ඡායානිමිත්තං සීමං

7. චතුර්වර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු සතර නමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට ද සුදුසු නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. පඤ්චවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු පස්නමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්මය කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට ද සුදුසු නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. දශවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු දසනමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි, ඡන්දයට ද සුදුසු නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. විංශතිවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු විසිනමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ ම ැයි. ඡන්දයට ද සුදුසු නො වේ, එහෙත් කර්මයට සුදුසු වේ.

8. කර්ම සතරෙකි : අපලොකන කර්ම යැ, ඤත්ති කර්ම යැ, ඤත්තිදුතිය කර්ම යැ, ඤත්තිචතුත්ථ කර්ම යැයි. මේ සතර කර්මයෝ කෙතෙක් අයුරෙකින් කොපා‍්‍ය වෙත්ද යත් : මේ සතර කර්මයෝ පස් අයුරෙකින් කොපා‍්‍ය වෙත් වස්තුවෙන් හෝ ඤත්තියෙන් හෝ අනුශ්‍රාවණයෙන් හෝ සීමායෙන් හෝ පිරිස වශයෙන් හෝ යැ.

9. වස්තුවෙන් කර්මයෝ කෙසේ කොපා‍්‍ය වෙත් ද යත් : පණ්ඩකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. ථෙය්‍යසංවාසකයා උපසපන් කෙරෙයි, වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. තීර්ථකායතනයට ගියහු උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. තිරිසන් ගියහු උපසපන් කෙරෙයි. වස්තුවිප්පන්න අධර්මකර්මය වෙයි. මාතෘඝාතකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. පිතෘඝාතකයා උපසපන් කෙරෙයි, වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. අරහන්තඝාතකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. භික්ෂුණීදූෂකයා උපසපන් කෙරෙයි, වස්තුවිපන්න අධර්මකර්මය වෙයි, සඞ්ඝභෙදකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. ලොහිතුප්පාදකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. උභතොබ්‍යඤ්ජනකයා උපසපන් කෙරෙයි. වස්තුවිපන්න අධර්මකර්මය වෙයි. උනු විසිවයස් ඇති පුඟුලක්හු උපසපන් කෙරෙයි, වස්තුවිපන්න අධර්මකර්මය වේ. මෙසේ වස්තුවෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත්.

10. ඤත්තියෙන් කර්මයෝ කෙසේ කොපා‍්‍ය වෙත් ද යත්; පස් අයුරෙකින් ඤත්තියෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත්. වස්තුව පරාමර්ශනය නො කෙරෙයි, සඞ්ඝයා පරාමර්ශනය නො කෙරෙයි, පුද්ගලයා පරාමර්ශනය නො කෙරෙයි, ඤත්තිය පරාමර්ශනය නො කෙරෙයි, පසු වැ හෝ ඤත්තිය තබයි. මේ පස් අයුරෙන් ඤත්තියෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත්.

11. අනුශ්‍රාවණයෙන් කර්මයෝ කෙසේ කොපා‍්‍ය වෙත් ද යත් : පස් අයුරෙකින් අනුශ්‍රාවණයෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත් : වස්තුව පරාමර්ශනය නො කෙරෙයි, සඞ්ඝයා පරාමර්ශනය නො කෙරෙයි, පුද්ගලයා පරාමර්ශනය නො කෙරෙයි, ඇස්වීම පිරිහෙළයි, නොකල්හි හෝ අස්වයි, මේ පස් අයුරෙන් අනුශ්‍රාවණයෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත්.

12. සීමායෙන් කර්මයෝ කෙසේ කොපා‍්‍ය වෙත් ද යත් : එකොළොස් අයුරෙකින් සීමායෙන් කර්මයෝ කොපා‍්‍ය වෙත්. ඉතා කුඩා සීමාවක් සම්මත කෙරෙයි, ඉතා මහත් සීමාවක් සම්මත කෙරෙයි, කඩ නිමිති ඇති සීමාවක් සම්මත කෙරෙයි, ඡෙවණුු නිමිති


Free Distribution www.aathaapi.org

සම්මන්නති, අනිමිත්තං සීමං සම්මන්නති, බහිසීමෙ ඨිතො සීමං සම්මන්නති, නදියා සීමං සම්මන්නති, සමුද්දෙ සීමං සම්මන්නති, ජාතස්සරෙ සීමං සම්මන්නති, සීමාය සීමං සම්භින්දති, සීමාය සීමං අජ්ඣොත්ථරති. ඉමෙහි එකාදසහි ආකාරෙහි සීමතො කම්මානි විපජ්ජන්ති.

13. කථං පරිසතො කම්මානි විපජ්ජන්ති: ද්වාදසහාකාරෙහි පරිසතො කම්මානි විපජ්ජන්ති: චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ අනාගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති. චතුවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති. පඤ්චවග්ගකරණෙ කම්මෙ-පෙ-දසවග්ගකරණෙ කම්මෙ-පෙ-වීසතිවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ අනාගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති. වීසතිවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො අනාහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති, වීසතිවග්ගකරණෙ කම්මෙ යාවතිකා භික්ඛූ කම්මප්පත්තා තෙ ආගතා හොන්ති, ඡන්දාරහානං ඡන්දො ආහටො හොති, සම්මුඛීභූතා පටික්කොසන්ති. ඉමෙහි ද්වාදසහාකාරෙහි පරිසතො කම්මානි විපජ්ජන්ති.

14. අපලොකනකම්මං කති ඨානානි ගච්ඡති, ඤත්තිකම්මං කති ඨානානි ගච්ඡති, ඤත්තිදුතියකම්මං කති ඨානානි ගච්ඡති, ඤත්තිචතුත්ථකම්මං කති ඨානානි ගච්ඡති: අපලොකනකම්මං පඤ්ච ඨානානි ගච්ඡති, ඤත්තිකම්මං නව ඨානානි ගච්ඡති, ඤත්තිදුතියකම්මං සත්ත ඨානානි ගච්ඡති, ඤත්තිචතුත්ථකම්මං සත්ත ඨානානි ගච්ඡති.

15. අපලොකනකම්මං කතමානි පඤ්ච ඨානානි ගච්ඡති: ඔසාරණං, නිස්සාරණං, භණ්ඩුකම්මං, බ්‍රහ්මදණ්ඩං, කම්මලක්ඛණඤ්ඤෙව පඤ්චමං. අපලොකනකම්මං ඉමානි පඤ්ච ඨානානි ගච්ඡති.

16. ඤත්තිකම්මං කතමානි නව ඨානානි ගච්ඡති: ඔසාරණං, නිස්සාරණං, උපොසථං, පවාරණං, සම්මුතිං, දානං, පටිග්ගහං, පච්චුක්කඩ්ඪනං, කම්මලක්ඛණඤ්ඤෙව නවමං. ඤත්තිකම්මං ඉමානි නව ඨානානි ගච්ඡති.

17. ඤත්තිදුතියකම්මං කතමානි සත්ත ඨානානි ගච්ඡති: ඔසාරණං, නිස්සාරණං, සම්මුතිං, දානං, උද්ධාරණං, දෙසනං, කම්මලක්ඛණඤ්ඤෙව සත්තමං. ඤත්තිදුතියකම්මං ඉමානි සත්ත ඨානානි ගච්ඡති.

18. ඤත්තිචතුත්ථකම්මං කතමානි සත්ත ඨානානි ගච්ඡති: ඔසාරණං, නිස්සාරණං සම්මුතිං, දානං, නිග්ගහං, සමනුභාසනං, කම්මලක්ඛණඤ්ඤෙව සත්තමං. ඤත්තිචතුත්ථකම්මං ඉමානි සත්ත ඨානානි ගච්ඡති.

Free Distribution www.aathaapi.org

කොට ඇති සීමාවක් සම්මත කෙරෙයි, නිමිති රහිත වූ සීමාවක් සම්මත කෙරෙයි, සීමායෙන් බැහැරැ සිටියේ සීමාව සම්මත කෙරෙයි, නදියෙහි සීමාව සම්මත කෙරෙයි, සමුද්‍රයෙහි සීමාව සම්මත කෙරෙයි, විලෙහි සීමාව සම්මත කෙරෙයි, සීමායෙන් සීමාව මුසු කෙරෙයි, සීමායෙන් සීමාව යටපත් කෙරෙයි. මේ එකොළොස් අයුරෙන් සීමායෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

13. පිරිස වශයෙන් කර්මයෝ කෙසේ කොප්‍ය වෙත් ද යත් : දෙළොස් අයුරෙකින් පිරිස වශයෙන් කර්මයෝ කොප්‍ය වෙත්. චතුවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු නො පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙත්. චතුර්වර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙත්. චතුර්වර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙත්. පඤ්චවර්ගකරණ කර්මයෙහි . . . දශවර්ගකරණ කර්මයෙහි . . . විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු නො පැමිණියාහු වෙත්. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය නො ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කරත්. විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය නොගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති. විංශතිවර්ගකරණ කර්මයෙහි යම් පමණ භික්ෂූහු කර්මප්‍රාප්තයෝ ද, ඔහු පැමිණියාහු වෙති. ඡන්දයට සුදුසු වූවන්ගේ ඡන්දය ගෙණෙන ලද්දේ වෙයි. සම්මුඛ වූවෝ ප්‍රතික්‍රොෂණය කෙරෙති. මේ දෙළොස් අයුරෙන් පිරිස වශයෙන් කර්මයෝ කොප්‍ය වෙත්.

14. අපලොක නකර්මය කෙතෙක් තැනට යේ ද, ඤත්ති කර්මය කෙතෙක් තැනට යේ ද, ඤත්තිදුතිය කර්මය කෙතෙක් තැනට යේ ද, ඤත්තිචතුත්ථ කර්මය කෙතෙක් තැනට යේ ද යත් : අපලොකන කර්මය පස් තැනකට යෙයි. ඤත්ති කර්මය නව තැනකට යෙයි. ඤත්තිදුතිය කර්මය සත් තැනකට යෙයි. ඤත්තිචතුත්ථ කර්මය සත් තැනකට යෙයි.

15. අපලොකන කර්මය කිනම් පස්තැනට යේ ද යත් : ඔසාරණ යැ නිස්සාරණ යැ භණ්ඩුකර්ම යැ බ්‍රහ්මදණ්ඩ යැ පස්වැනි වූ කර්මලක්ෂණ යැ යි අපලොකන කර්මය මේ පස්තැනට යෙයි.

16. ඤත්ති කර්මය කිනම් නවතැනට යේ ද යත් : ඔසාරණ යැ නිස්සාරණ යැ උපොසථ යැ පවාරණ යැ සම්මුති යැ දන යැ පටිග්ගහ යැ පච්චුක්කඩ්ඪන යැ නව වැනි වූ මැ කර්මලක්ෂණ යැ යි ඤත්ති කර්මය මේ නවතැනට යෙයි.

17. ඤත්තිදුතිය කර්මය කිනම් සත්තැනට යේ ද යත් : ඔසාරණ යැ නිස්සාරණ යැ සම්මුති යැ දන යැ උද්ධරණ යැ දෙසන යැ සත්වැනි වූ මැ කර්මලක්ෂණ යැ යි ඤත්තිදුතිය කර්මය මේ සත්තැනට යෙයි.

18. ඤත්තිචතුත්ථ කර්මය කිනම් සත්තැනට යේ ද යත් : ඔසාරණ යැ නිස්සාරණ යැ සම්මුති යැ දන යැ නිග්ගහ යැ සමනුභාෂණ යැ සත්වැනි වූ මැ කර්මලක්ෂණ ය යි ඤත්තිචතුත්ථ කර්මය මේ සත්තැනට යේ,

19. චතුවග්ගකරණෙ කම්මෙ චත්තාරො භික්ඛූ පකතත්තා කම්මප්පත්තා අවසෙසා පකතත්තා ඡන්දාරහා. යස්ස සඞ්ඝො කම්මං කරොති, සො නෙව කම්මප්පත්තො නාපි ඡන්දාරහො. අපි ච කම්මාරහො. පඤ්චවග්ගකරණෙ කම්මෙ -පෙ- දසවග්ගකරණෙ කම්මෙ දස භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා. යස්ස සඞ්ඝො කම්මං කරොති සො නෙව කම්මප්පත්තො, නාපි ඡන්දාරහො අපි ච කම්මාරහො. වීසතිවග්ගකරණෙ කම්මෙ වීසති භික්ඛූ පකතත්තා කම්මප්පත්තා, අවසෙසා පකතත්තා ඡන්දාරහා. යස්ස සඞ්ඝො කම්මං කරොති, සො නෙව කම්මප්පත්තො, නාපි ඡන්දාරහො. අපි ච කම්මාරහො.

කම්මවග්ගො පඨමො.

---

## 2. අත්ථවසවග්ගො

1. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

2. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

3. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

4. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දිට්ඨධම්මිකානං වෙරානං සංවරාය, සම්පරායිකානං වෙරානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙ සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

5. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දිට්ඨධම්මිකානං වජ්ජානං සංවරාය, සම්පරායිකානං වජ්ජානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

6. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දිට්ඨධම්මිකානං භයානං සංවරාය, සම්පරායිකානං භයානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

7. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: දිට්ඨධම්මිකානං අකුසලානං ධම්මානං සංවරාය, සම්පරායිකානං අකුසලානං ධම්මානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

19. චතුවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු සතරනමක් කර්ම ප්‍රාප්තයහ. පුවතත් සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට සුදුසු නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. පඤ්චවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු පස්නමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට සුදුසු ද නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. දසවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු දසනමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට සුදුසු ද නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ. විංශතිවර්ගකරණ කර්මයෙහි පුවතත් වූ භික්ෂූහු විසිනමක් කර්මප්‍රාප්තයහ. පුවතත් වූ සෙසු භික්ෂූහු ඡන්දයට සුදුසු වෙති. යමක්හට සඞ්ඝ තෙමේ කර්ම කෙරේ ද, හෙතෙමේ කර්මප්‍රාප්ත නො වේ මැ යි. ඡන්දයට සුදුසු ද නො වේ. එහෙත් කර්මයට සුදුසු වේ.

පළමුවන කර්මවර්ග යි

---

## 2. අත්ථවස වග්ගය

1. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි සඞ්ඝයාගේ මනා පිළිගැන්ම පිණිස යැ, සඞ්ඝයාගේ පහසුබව පිණිස යැ, මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

2. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පනවන ලදී, දුසිල් පුහුලන්ගේ නිගැන්ම පිණිස යැ, ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස යැ, මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

3. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී. දිටුදැමියෙහි විඳියයුතු දුක්ගැහැට වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු දුක්ගැහැට නසනු පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

4. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි. දිටුදැමියෙහි පස් පව් වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාක දුක් නැසීම පිණිස යැ, මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

5. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි. දිටුදැමියෙහි හළයුතු පව් වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාක දුක් නැසීම පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

6. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි. දිටුදැමියෙහි ලැබිය හැකි (ගැරහුම් ආ) බිය වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාක දුක් නැසීම පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

7. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි. දිටුදැමියෙහි වන සුලු අකුසල් ධම් වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාක දුක් නැසීම පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදි.

8. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: ගිහීනං අනුකම්පාය, පාපිච්ඡානං පක්ඛුපච්ඡෙදාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

9. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං.

10. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං: සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං

අත්ථවසවග්ගො දුතියො

---

## 3. පඤ්ඤත්තවග්ගො

1. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං පාතිමොක්ඛං පඤ්ඤත්තං -පෙ- පාතිමොක්ඛුද්දෙසො පඤ්ඤත්තො -පෙ- පාතිමොක්ඛට්ඨපනං පඤ්ඤත්තං -පෙ- පවාරණා පඤ්ඤත්තා -පෙ- පවාරණට්ඨපනං පඤ්ඤත්තං -පෙ- තජ්ජනීයකම්මං පඤ්ඤත්තං -පෙ- නියස්සකම්මං පඤ්ඤත්තං -පෙ- පබ්බාජනීයකම්මං පඤ්ඤත්තං -පෙ- පටිසාරණීයකම්මං පඤ්ඤත්තං -පෙ- උක්ඛෙපනීයකම්මං පඤ්ඤත්තං -පෙ- පරිවාසදානං පඤ්ඤත්තං -පෙ- මූලාය පටිකස්සනා පඤ්ඤත්තා -පෙ- මානත්තදානං පඤ්ඤත්තං -පෙ- අබ්භානං පඤ්ඤත්තං -පෙ- ඔසාරණීයං පඤ්ඤත්තං -පෙ- නිස්සාරණීයං පඤ්ඤත්තං -පෙ- උපසම්පදා පඤ්ඤත්තා -පෙ- අපලොකනකම්මං පඤ්ඤත්තං -පෙ- ඤත්තිකම්මං පඤ්ඤත්තං -පෙ- ඤත්තිදුතියකම්මං පඤ්ඤත්තං -පෙ- ඤත්තිචතුත්ථකම්මං පඤ්ඤත්තං.

පඤ්ඤත්තවග්ගො තතියො

---

## 4. අපඤ්ඤත්තෙන පඤ්ඤත්ත වග්ගො

1. අපඤ්ඤත්තෙන පඤ්ඤත්තං -පෙ- පඤ්ඤත්තෙන අනුපඤ්ඤත්තං -පෙ- සම්මුඛා විනයො පඤ්ඤත්තො -පෙ- සතිවිනයො පඤ්ඤත්තො -පෙ- අමූළ්හවිනයො පඤ්ඤත්තො -පෙ- පටිඤ්ඤාතකරණං පඤ්ඤත්තං -පෙ- යෙභුය්‍යසිකා පඤ්ඤත්තා -පෙ- තස්සපාපිය්‍යසිකා පඤ්ඤත්තා -පෙ- තිණවත්ථාරකො පඤ්ඤත්තො සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

8. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී. ගිහියනට අනුකම්පා පිණිස යැ, ලමුඅදහස් ඇති පුහුලන්ගේ වගබැඳුම් බිඳීම පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී.

9. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී. නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස යැ, පැහැදුනවුන්ගේ අයිරා පැහැදීම පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී.

10. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී. ශාසනයාගේ චිරකල් පැවැත්ම පිණිස යැ, විනයට රුකුල් පිණිස යැ. මේ දෙ කරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට සිකපද පණවන ලදී.

දෙවන අත්ථවසවර්ග යි

---

## 3. පඤ්ඤත්ත වර්ගය

1. දෙ කරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට පාතිමොක්ඛය පණවන ලදී. . . . පාතිමොක්ඛුද්දෙසය පණවන ලදී. . . . පාතිමොක්ඛඨපනය පණවන ලදී. . . . පවාරණය පණවන ලදී. . . . පවාරණඨපනය පණවන ලදී. . . . තජ්ජනීය කර්මය පණවන ලදී. . . . නියස්ස කර්මය පණවන ලදී. . . . පබ්බාජනීය-කර්මය පණවන ලදී. . . . පටිසාරණීය කර්මය පණවන ලදී. . . . උක්ඛෙපනීය කර්මය පණවන ලදී. . . . පරිවාසදානය පණවන ලදී. . . . මූලායපටිකස්සනය පණවන ලදී. . . . මානත්තදානය පණවන ලදී. . . . අබ්භානය පණවන ලදී. . . . ඔසාරණීයය පණවන ලදී. . . . නිස්සාරණීයය පණවන ලදී. . . . උපසම්පදාව පණවන ලදී. . . . අපලොකන කර්මය පණවන ලදී. . . . ඤත්තිකර්මය පණවන ලදී. . . . ඤත්තිදුතිය කර්මය පණවන ලදී. . . . ඤත්තිචතුත්ථ කර්මය පණවන ලදී. . .

තෙවන පඤ්ඤත්ත වර්ග යි

---

## 4. අප්‍රඥප්තයෙහි ප්‍රඥප්ත වර්ගය

1. නො පණවනලද්දෙහි පණවනලදී. . . . පණවනලද්දෙහි නැවැත පණවන ලදි . . . සම්මුඛාවිනය පණවනලදී. . . . සතිවිනය පණවනලදී. . . . අමූළ්හ-විනය පණවනලදී. . . . පටිඤ්ඤාතකරණය පණවනලදී. . . . යෙභුය්‍යසිකාව පණවන ලදී. . . . තස්සපාපියාසිකාව පණවනලදී. . . . තිණවත්ථාරකය පණවනලදී. සඞ්ඝයාගේ මනා පිළිගැන්ම පිණිස යැ. සඞ්ඝයාගේ පහසුබව පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට තිණවත්ථාරකය පණවන ලද්දේ යි.

2. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

3. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

4. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දිට්ඨධම්මිකානං වෙරානං සංවරාය, සම්පරායිකානං වෙරානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

5. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දිට්ඨධම්මිකානං වජ්ජානං සංවරාය, සම්පරායිකානං වජ්ජානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

6. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දිට්ඨධම්මිකානං භයානං සංවරාය, සම්පරායිකානං භයානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

7. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: දිට්ඨධම්මිකානං අකුසලානං ධම්මානං සංවරාය, සම්පරායිකානං අකුසලානං ධම්මානං පටිඝාතාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

8. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: ගිහීනං අනුකම්පාය, පාපිච්ඡානං පක්ඛුපච්ඡෙදාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

9. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො: අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො.

10. ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තො සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. ඉමෙ ද්වෙ අත්ථවසෙ පටිච්ච තථාගතෙන සාවකානං තිණවත්ථාරකො පඤ්ඤත්තොති.

අපඤ්ඤත්තෙ පඤ්ඤත්තවග්ගො චතුත්ථො

---

2. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දුසිල් පුඟුලන්ගේ නිගැන්ම පිණිස යැ. ප්‍රියශීලී භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

3. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දිටුදහමියෙහි විඳියයුතු දුක්ගැහැට වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු දුක්ගැහැට නසනු පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

4. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දිටුදහමියෙහි වනසුලු පස්පව් වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාක දුක් නසනු පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

5. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දිටුදහමියෙහි වනසුලු වරද වළකනු පිණිස යැ, පරලොව් විඳියයුතු අනිටු විපාක නසනු පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

6. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දිටුදහමියෙහි ලැබිය යුතු (ගැරහුම් ඈ) බිය වළකනු පිණිස යැ, පරලෙව්හි විඳියයුතු විපාකදුක් නසනු පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

7. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. දිටුදහමියෙහි වන සුලු අකුශලධර්ම වළකනු පිණිස යැ, පරලෙව්හි විඳිය යුතු විපාක දුක් නසනු පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

8. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. ගිහියනට අනුකම්පා පිණිස යැ, ලමු අදහස් ඇති පුඟුලන්ගේ ගණබැඳුම් බිඳීම පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

9. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. නො පැහැදුනවුන්ගේ පැහැදීම පිණිස යැ, පැහැදුනවුන්ගේ අයිරා පැහැදීම පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

10. දෙකරුණක් පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලදී. ශාසනයාගේ චිරකල් පැවැත්ම පිණිස යැ, විනයට රැකුල් පිණිස යැ. මේ දෙකරුණ පිණිස තථාගතයන් විසින් ශ්‍රාවකයනට ශික්ෂාපදය පණවන ලද්දේ යි.

**සතර වන අප්‍රඥප්තයෙහි ප්‍රඥප්තවර්ග යි**

## 5. නවසංගහවග්ගො

1. නව සඞ්ගහා: වත්ථුසඞ්ගහො, විපත්තිසඞ්ගහො, ආපත්තිසඞ්ගහො, නිදානසඞ්ගහො, පුග්ගලසඞ්ගහො, ඛන්ධසඞ්ගහො, සමුට්ඨානසඞ්ගහො, අධිකරණසඞ්ගහො, සමථසඞ්ගහොති.

2. අධිකරණෙ සමුප්පන්නෙ සචෙ උභො අත්තපච්චත්ථිකා ආගච්ඡන්ති, උභින්නම්පි වත්ථුං ආරොචාපෙතබ්බං. උභින්නම්පි වත්ථුං ආරොචාපෙත්වා උභින්නම්පි පටිඤ්ඤා සොතබ්බා, උභින්නම්පි පටිඤ්ඤං සුත්වා උභොපි වත්තබ්බා අම්හාකං ඉමස්මිං අධිකරණවූපසමෙන උභොපි තුට්ඨා භවිස්සථාති සචෙ ආහංසු 'උභොපි තුට්ඨා භවිස්සාමා'ති සඞ්ඝෙන තං අධිකරණං සම්පටිච්ඡිතබ්බං. සචෙ අලජ්ජුස්සන්නා හොති පරිසා, උබ්බාහිකාය වූපසමෙතබ්බං. සචෙ බාලුස්සන්නා හොති පරිසා, විනයධරො පරියෙසිතබ්බො. යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං අධිකරණං වූපසමෙති, තථා තං අධිකරණං වූපසමෙතබ්බං.

වත්ථු ජානිතබ්බං. ගොත්තං ජානිතබ්බං. නාමං ජානිතබ්බං. ආපත්ති ජානිතබ්බා.

3. මෙථුනධම්මොති වත්ථු චෙව ගොත්තඤ්ච. පාරාජිකන්ති නාමඤ්චෙව ආපත්ති ච.

4. අදින්නාදානන්ති වත්ථු චෙව ගොත්තඤ්ච. පාරාජිකන්ති නාමඤ්චෙව ආපත්ති ච.

5. මනුස්සවිග්ගහොති වත්ථු චෙව ගොත්තඤ්ච. පාරාජිකන්ති නාමඤ්චෙව ආපත්ති ච.

6. උත්තරිමනුස්සධම්මොති වත්ථු චෙව ගොත්තඤ්ච. පාරාජිකන්ති නාමඤ්චෙව ආපත්ති ච.

7. සුක්කවිස්සට්ඨීති වත්ථු චෙව ගොත්තඤ්ච සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

8. කායසංසග්ගොති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

9. දුට්ඨුල්ලා වාචාති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති. නාමඤ්චෙව ආපත්ති ච.

10. අත්තකාමන්ති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

11. සඤ්චරිත්තන්ති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

12. සඤ්ඤාචිකාය කුටිං කාරාපනන්ති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

13. මහල්ලකං විහාරං කාරාපනන්ති වත්ථු චෙව ගොත්තඤ්ච සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

Free Distribution www.aathaapi.org

## 5. නවසඞ්ග්‍රහ වර්‍ගය

1. නවසඞ්ග්‍රහයෝ : වස්තුසඞ්ග්‍රහ යැ විපත්තිසඞ්ග්‍රහ යැ ආපත්තිසඞ්ග්‍රහ යැ නිදාන සඞ්ග්‍රහ යැ පුද්ගලසඞ්ග්‍රහ යැ ස්කන්ධසඞ්ග්‍රහ යැ සමුත්ථානසඞ්ග්‍රහ යැ අධිකරණ සඞ්ග්‍රහ යැ ශමථසඞ්ග්‍රහ යි.

2. අධිකරණයක් උපන් කල්හි ඉදින් ආත්ම ප්‍රතිපක්ෂ වූ දෙදෙනා ම (චූදිත-චොදක) පැමිණෙත් ද දෙපසට ම වස්තුව සැලකරවිය යුතු යි. දෙපසට ම වස්තුව සැලකරවා දෙපසෙහි ම ප්‍රතිඥාව ඇසිය යුතු යි. දෙපසෙහි ම ප්‍රතිඥාව අසා අපගේ මේ අධිකරණය සන්හිඳුවීමෙහි දෙපසෙහි ම වූ තෙපි සතුටු වන්නහු ද '' යි දෙපසෙහි ම වූවෝ කියයුත්තාහු වෙති. ඉදින් දෙපස ම අපි සතුටු වම්හ යි කීහු නම් සඞ්ඝයා විසින් ඒ අධිකරණය පිළිගත යුතු යි. ඉදින් පිරිස අලජ්ජීන්ගෙන් බලවත් වූවා ද, උබ්බාහිකායෙන් සන්හිඳවියයුතු යි. ඉදින් පිරිස බාලයන්ගෙන් බලවත් වූවා ද, විනයධරයෙක් සෙවිය යුතු යි. යම් ධර්මයෙකින් යම් විනයෙකින් යම් ශාස්තෘශාසනයෙකින් ඒ අධිකරණය සන්හිඳේ නම් එසේ ඒ අධිකරණය සන්හිඳවිය යුතු යි.

වස්තුව දතයුතු යැ ගොත්‍රය දතයුතු යැ නාමය දතයුතු යැ ආපත්තිය දතයුතු යැ

3. '' මෙථුනධම්මො '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි. '' පාරාජිකං '' යනු නාමය ද ආපත්තිය ද වේ.

4. '' අදින්නාදානං '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' පාරාජිකං '' යනු නාමය ද ආපත්තිය ද වේ.

5. '' මනුස්සවිග්ගහො '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' පාරාජිකං '' යනු නාමය ද ආපත්තිය ද වේ.

6. '' උත්තරිමනුස්සධම්මො '' යනු වස්තුව ද ගොත්‍රය ද වේ, '' පාරාජිකං ' යනු නාමය ද ආපත්තිය ද වේ.

7. '' සුක්කවිසට්ඨි '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, ''සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද ආපත්තිය ද වේ.

8. '' කායසංසග්ගො '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' සඞ්ඝාදිසෙසො ''යනු නාමය ද ආපත්තිය ද වේ.

9. '' දුට්ඨුල්ලවාචා '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද 'ආපත්තිය ද වේ.

10. අත්තකාමං '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද ආපත්තිය ද වේ

11. '' සඤ්චරිත්තං '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද ආපත්තිය ද වේ.

12. '' සඤ්ඤාචිකාය කුටිං කාරාපනං '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, ' සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද ආපත්තිය ද වේ.

13. '' මහල්ලකං විහාරං කාරාපනං '' යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, '' සඞ්ඝාදිසෙසො '' යනු නාමය ද ආපත්තිය ද වේ.

14. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

15. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්ච ආපත්ති ච.

16. සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

17. භෙදානුවත්තකානං භික්ඛූනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

18. දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච.

19. කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. සඞ්ඝාදිසෙසොති නාමඤ්චෙව ආපත්ති ච -පෙ-.

20. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තීති වත්ථු චෙව ගොත්තඤ්ච. දුක්කටන්ති නාමඤ්චෙව ආපත්ති චාති

නවසඞ්ගහවග්ගො පඤ්චමො.

---

වග්ගපඤ්චකස්සුද්දානං :

1. අපලොකනං ඤත්ති ච දුතියං චතුත්ථෙන ච,
වත්ථු ඤත්ති අනුසාවනං සීමාපරිසමෙව ච.

2. සම්මුඛා පටිපුච්ඡා ච පටිඤ්ඤා විනයාරහො,
වත්ථු සඞ්ඝං පුග්ගලඤ්ච ඤත්තිං න පච්ඡා ඤත්ති ච

3. වත්ථුං සඞ්ඝං පුග්ගලඤ්ච සාවනං අකාලෙන ච,
අතිබුද්ධකා මහන්තා ච ඛණ්ඩ ඡායා නිමිත්තකා.

4. බහිනදී සමුද්දෙ ච ජාතස්සරෙ ච භින්දති.
අජ්ඣොත්ථරති සීමාය චතු පඤ්ච ච වග්ගිකා

5. දස වීසතිවග්ගා ච අනාහටා ච ආහටා,
කම්මප්පත්තා ඡන්දාරහා කම්මාරහා ච පුග්ගලා.

6. අපලොකනං පඤ්ච ඨානං ඤත්ති ච නවඨානිකා,
ඤත්තිදුතියං සත්ත ඨානං චතුත්ථා සත්තඨානිකා.

7. සුට්ඨු චාසු දුම්මඞ්කූනං පෙසලා චාපි ආසවා.
වෙරං වජ්ජ භයඤ්චෙව අකුසලඤ්ච ගිහීනං ච.

Free Distribution www.aathaapi.org

14. " භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනං " යනු වස්තුව ද ගොත්‍රය ද වේ. " සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ.

15. " භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනං " යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි. " සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ.

16. " සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය න පටිනිස්සජ්ජනං" යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, " සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ.

17. " භෙදකානුවත්තකානං භික්ඛූනං යාවතතියං සමනුභාසනාය න පටිනිස්සජ්ජනං" යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි, සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ.

18. " දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය න පටිනිස්සජ්ජනං " යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි. " සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ.

19. " කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය න පටිනිස්සජ්ජනං " යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි. " සඞ්ඝාදිසෙසො " යනු නාමය ද ආපත්තිය ද වේ . . .

20. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණං " යනු වස්තුව ද ගොත්‍රය ද වෙයි. " දුක්කටං " යනු නාමය ද ආපත්තිය ද වේ.

පස්වන නවසංග්‍රහ වර්ග යි

---

## වර්ගපඤ්චකයෙහි උද්දානය

1. අපලොකන යැ ඤත්ති යැ ඤත්තිදුතිය යැ ඤත්තිචතුත්ථ යැ වත්ථු යැ ඤත්ති යැ අනුසාවන යැ සීමා යැ පරිස යැ.

2. සම්මුඛා යැ පටිපුච්ඡා යැ පටිඤ්ඤා යැ විනයාරහ යැ වත්ථු යැ සඞ්ඝ යැ පුග්ගල යැ න ඤත්ති යැ, පච්ඡා ඤත්ති යැ.

3. වත්ථු යැ සඞ්ඝ යැ පුග්ගල යැ අකාලෙ න සාවන යැ අතිඛුද්දකා යැ අතිමහන්තා යැ ඛණ්ඩ නිමිත්ත යැ ඡායා නිමිත්ත යැ.

4. බහි යැ නදී යැ සමුද්දෙ යැ ජාතස්සරෙ යැ භින්දති යැ සීමා යැ අජ්ඣොත්ථරති යැ චතුවග්ගික යැ පඤ්චවග්ගික යැ.

5- දසවග්ග යැ වීසතිවග්ග යැ අනාහට යැ ආහට යැ කම්මපත්තපුග්ගල යැ ඡන්දරහපුග්ගල යැ කම්මාරහ පුග්ගල යැ.

6. පඤ්චඨානික අපලොකන යැ නවඨානික ඤත්ති යැ සත්තඨානික ඤත්තිදුතිය යැ සත්තඨානික ඤත්තිචතුත්ථ යැ.

7. සුචිණ්ණ යැ ඵාසු යැ දුම්මඞ්කු යැ පෙසල යැ ආසව යැ වෙර යැ වජ්ජ යැ භය යැ අකුසල යැ ගිහීනං (අනුකම්පා) යැ.

8. පාපිච්ඡා අප්පසන්නානං පසන්නා ධම්මට්ඨපනා,
විනයානුග්ගහා චෙව පාතිමොක්ඛුද්දෙසෙන ච.

9. පාතිමොක්ඛඤ්ච ඨපනා ච පවාරණඤ්ච ඨපනං,
තජ්ජනීයා නියස්සඤ්ච පබ්බාජපටිසාරණී.[1]

10. උක්ඛෙපන පරිවාසං මූලං මානත්ත අබ්භානං,
ඔසාරණං නිස්සාරණං තථෙව උපසම්පදා.

11. අපලොකන ඤත්ති ච දුතියඤ්ච චතුත්ථකං,
අපඤ්ඤත්තෙනුපඤ්ඤත්තං සම්මුඛාවිනයො සති.

12. අමූළ්හපටියෙභුය්‍ය පාපිය්‍යතිණවත්ථාරකං,
වත්ථු විපත්ති ආපත්ති නිදානං පුග්ගලෙන ච.

13. ඛන්ධා චෙව සමුට්ඨානා අධිකරණමෙව ච,
සමථා සඞ්ගහා චෙව නාම ආපත්තිකා තථා ති.

## පරිවාරපාළි නිට්ඨිතා

1. පුබ්බාචරියමග්ගඤ්ච පුච්ඡිත්වා ච තහිං තහිං,
දීපනාමො මහාපඤ්ඤො සුතධාරී[2] විචක්ඛණො.

2. ඉමං විත්ථාරසඞ්ඛෙපං[3] සජ්ඣාමග්ගෙන මජ්ඣිමෙ,
චින්තයිත්වා ලිඛාපෙසි සිස්සකානං සුඛාවහං.

3. පරිවාරන්ති යං වුත්තං සබ්බං වත්ථුං සලක්ඛණං,
අත්ථං අත්ථෙන සද්ධම්මෙ ධම්මං ධම්මෙන පඤ්ඤත්තෙ.

4. සාසනං පරිවාරෙසි ජම්බුදීපං'ව සාගරො,
පරිවාරං අජානන්තො කුතො ධම්මවිනිච්ඡයං.

5. විපත්ති වත්ථු පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති පුග්ගලො,
එකතො උභතො චෙව ලොකපණ්ණත්ති වජ්ජතො,

6. යස්ස ඤායති විමති පරිවාරෙන ඡිජ්ජති,
චක්කවත්ති මහාසෙනෙ මිගමජ්ඣෙව කෙසරී.

7. රවි රංසිපරික්ඛිණ්ණො චන්දො තාරාගණෙ යථා,
බ්‍රහ්මා බ්‍රහ්මපරිසාය ගණමජ්ඣෙ ව නායකො;
එවං සද්ධම්මවිනයො පරිවාරෙන සොභතීති.

---

1. තජ්ජනිකා - සීමු 1, 2
පබ්බාජනීයපටිසාරණී - මජසං.
2. සුතධරො - ස්‍යා.
3. විත්ථාරං සඞ්ඛෙපං - සීමු 2.

8. පාපිච්ඡා යැ අප්පසන්නානං යැ පසන්නානං යැ ධම්මට්ඨපනා යැ පාතිමොක්ඛුද්දෙසය සමග විනයානුග්ගහ යැ.

9. පාතිමොක්ඛට්ඨපනා යැ පවාරණට්ඨපනා යැ තජ්ජනීය යැ නියස්ස යැ පබ්බාජනීය යැ පටිසාරණීය යැ යි.

10. උක්ඛෙපන යැ පරිවාස යැ මූලායපටිකස්සන යැ මානත්ත යැ අබ්භාන යැ ඔසාරණ යැ නිස්සාරණ යැ එසේ ම උපසම්පද යැ.

11. අපලොකන යැ ඤත්ති යැ ඤත්තිදුතිය යැ ඤත්තිචතුත්ථ යැ අපඤ්ඤත්ත යැ අනුපඤ්ඤත්ත යැ සම්මුඛාවිනය යැ සතිවිනය යැ.

12. අමූළ්හවිනය යැ පටිඤ්ඤාතකරණ යැ යෙභුය්‍යසිකා යැ තිණවත්ථාරක යැ වස්තු යැ විපත්ති යැ ආපත්ති යැ පුග්ගලය සමග නිදාන යැ.

13. ඛන්ධ යැ සමුට්ඨාන යැ අධිකරණ යැ සමථ යැ සඞ්ගහ යැ නාම යැ එසේ ම ආපත්ති යැ යි.

පරිවාරපාළි නිමි

---

1. මහාප්‍රාඥ වූ ශ්‍රුතධාරී විචක්ෂණ වූ දීප නම් මහාස්ථවිර තෙමේ ඒ ඒ තන්හි පෙර ඇදුරන් ගිය මඟ ද විචාරා,

2. උගන්නා අතවැසියනට සුව එළවන මද්ධ්‍යම වූ සජ්ඣාය මාර්ගයෙන් සිතා විස්තර සඞ්ක්ෂෙපය නො ගෙණ මේ පරිවාරපාළිය ලියැවී.

3. පරිවාර යැ යි යමක් කියන ලද ද ඔහුගේ ලක්ෂණ සහිත වූ පදසිද්ධි සඞ්ඛ්‍යාත වස්තුව සද්ධර්මයෙහි අර්ත්ථය අර්ත්ථය සමග ද ප්‍රඥප්තියෙහි පාළිය පාළිය සමග ද නය වශයෙන්-

4. මහසයුර දඹදිව පිරිවරා සිටියා සේ ප්‍රතිපත්ති ශාසනය පිරිවරා සිටියේ යැ. පරිවාරය නො දන්නේ ධර්මවිනිශ්චය කුමකින් කරන්නේ ද,

5. විපත්ති විසින් ද වස්තු විසින් ද ප්‍රඥප්ති විසින් ද අනුප්‍රඥප්ති විසින් ද පුද්ගල විසින් ද එකතො පඤ්ඤත්ති විසින් ද උභතො පඤ්ඤත්ති විසින් ද ලොකවද්‍ය විසින් ද ප්‍රඥප්ත්‍යාවද්‍ය විසින් ද,

6. යමක්හට විමති උපදී ද එය පරිවාරයෙන් සිඳේ. මහසෙන් මැද සක්විත්තා මෙන් ද සිවුපාවුන් මැද කෙශරසිංහරාජයා මෙන් ද,

7. රශ්මීන් පිරිවරන ලද හිරු මෙන් ද තාරකා සමූහයා විසින් පිරිවරන ලද සඳ මෙන් ද බඹ පිරිස් මැද (හාරිත) මහබඹහු මෙන් ද ශ්‍රාවක ගණයා මැද ලොකස්වාමීහු මෙන් ද සද්ධර්ම සඞ්ඛ්‍යාත විනය පරිවාරයෙන් හොබනේ යි.

---

# පරිවාරපාළි

# අනුක්කමණිකා

23—ඒ 30906 (77/12)

| | |
|---|---|
| ගාථාදිපාදසූචි | 323 - 327 |
| විසෙසපදානුක්කමණිකා | 328 - 341 |
| ශුද්ධා’ශුද්ධ | 342 |

# ගාථාදිපාද සූචි


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අකප්පකතං නාපි රජනාය රත්තං | 298 |
| අකාලෙන චොදෙති අභූතෙන | 132, 140 |
| අචොදයිත්වා අසාරයිත්වා | 294 |
| අට්ඨඞ්ගිකො මුසාවාදො | 282 |
| අට්ඨ පාටිදෙසනීයා | 100 |
| අට්ඨ පාරාජිකා වුත්තා | 288 |
| අට්ඨවාචිකා උපසම්පදා | 282 |
| අට්ඨානිසංසෙ සම්පස්සං | 282 |
| අට්ඨාරස නාපායිකා වුත්තා | 286 |
| අට්ඨාසීති සතං පාචිත්තියා වුත්තා | 288 |
| අට්ඨෙව පාරාජිකා යෙ | 100 |
| අත්ථඞ්ගතෙ සූරියෙ | 296 |
| අත්ථ සතං ධම්ම සතං | 90 |
| අදින්නාදානෙ කති ආපත්තියො | 276 |
| අදින්නාදානෙ තිස්සො ආපත්තියො | 276 |
| අධිකරණානි චත්තාරි | 100 |
| අධිට්ඨිතං රජනාය රත්තං | 296 |
| අනාලපන්තො මනුජේන කෙනචි | 292 |
| අනියතා ච ද්වෙ හොන්ති | 94 |
| අනියතොති යං වුත්තං | 102 |
| අනුයොගවත්තං නිසාමය | 130, 146 |
| අනුසන්ධිවචනපථං න ජානාති | 142 |
| අවිස්සග්ගියං අවෙභඞ්ගියං | 290 |
| අරුණුග්ගෙ තිස්සො ආපත්තියො | 274 |
| අලජ්ජී කීදිසො හොති | 130 |
| අසංවාසො භික්ඛූහි ච භික්ඛුනීහි ච | 290 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ආ** | |
| ආවිණ්ණානාවිණ්ණං න ජානාති | 140 |
| ආදිපෙතං චරණඤ්ච | 104 |
| ආපජ්ජති ගරුකං සාවසෙසං | 298 |
| ආපත්තානාපත්තිං න ජානාති | 140 |
| ආසාවච්ඡෙදිකො කඨිනුබ්භාරො | 168 |
| **ඉ** | |
| ඉත්ථිං හනෙ න මාතරං | 294 |
| ඉත්ථී ච අබ්භන්තරෙ සියා | 292 |
| **උ** | |
| උපකණ්ණකං ජප්පති ජිම්හං පෙක්ඛති | 140 |
| උපෙති ධම්මං පරිපුච්ඡමානො | 290 |
| උපොසථො කිමත්ථාය | 138 |
| උපොසථො සාමග්ගත්ථාය | 138 |
| උබ්භක්ඛකෙ න වදාමි | 290 |
| උභො එකතො උපසම්පන්නා | 292 |
| උභො පරිපුණ්ණවීසතිවස්සා | 298 |
| **එ** | |
| එකතිංසා යෙ ගරුකා | 96 |
| එකංසං චීවරං කත්වා | 92 |
| එකස්ස ඡෙජ්ජං හොති | 282 |
| එකාදස යාවතතියකා | 96 |
| **ක** | |
| කතඞ්ගිකො මුසාවාදො | 282 |
| කතට්ඨානං වජ්ජිත්වාන | 276 |
| කතමෙසු සත්තසු නගරෙසු | 92 |
| කතානිසංසෙ සම්පස්සං | 282 |
| කතාපත්තියො කායිකා | 274 |
| කති අනියතා වුත්තා | 288 |
| කති ආඝාතවත්ථූනි | 282 |




Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

කති ආපායිකා වුත්තා 286
කති කම්මදොසා වුත්තා 284, 286
කති කම්මසම්පත්තියො 284
කති කම්මසම්පත්තියො වුත්තා 286
කති කම්මානි වුත්තානි 284, 286
කති කායිකා රත්තිං 280
කති කොසම්බියං පඤ්ඤත්තා 92
කති ඨානෙ මුසාවාදො 282
කති ඡෙදනකානි 98
කති දෙසනාගාමිනියො 274
කති නාපායිකා වුත්තා 286
කති නිස්සග්ගියා වුත්තා 288
කතිනන්නං ඡෙජ්ජං හොති 282
කතිනන්නං වස්සං වුත්ථානං 284
කතිනන්නං විනිච්ඡයො හොති 280
කති පාචිත්තියා වුත්තා 288
කති පාචිත්තියානි
සබ්බානි 278, 280
කති පාටිදෙසනීයා වුත්තා 288
කති පාරාජිකා වුත්තා 288
කති පුග්ගලා න උපසම්පාදෙ
තබ්බා 276
කති පුග්ගලා නාභිවාදෙතබ්බා 282
කති භික්ඛුසම්මුතියො 98
කති වාචසිකා රත්තිං 274
කති වාචිකා උපසම්පදා 282
කති වෙසාලියං පඤ්ඤත්තා 92
කති සඞ්ඝාදිසෙසා වුත්තා 288
කති සතං රත්තිසතං 284
කති සෙඛියා වුත්තා 288
කම්මඤ්ච අධිකරණඤ්ච 148

කා

කායිකානි න වාචසිකානි 296
කාලෙන චොදෙති භූතෙන 132

කු

කුද්ධො ආරාධකො හොති 298

කො

කොධනො උපනාහී ච 183

පිට්ඨඞ්කං

ග

ගච්ඡන්තස්ස කති ආපත්තියො 278
ගති මිගානං පවනං 104
ගරුකා ලහුකා චාපි 96

ගා

ගාමන්තරෙ චතස්සො
ආපත්තියො 274

ච

චතස්සො කම්මසම්පත්තියො
වුත්තා 286
චතස්සො භික්ඛුසම්මුතියො 98
චතස්සො සමාපත්තියො
වුත්තා 284
චතුරො ජනා සංවිධාය 292
චත්තාරි කම්මානි
වුත්තානි 284, 288

චී

චීවරං දත්වා වොසාසන්ති 94

චො

චොදකො ආහ ආපන්නොති 130
චොදනා කිමත්ථාය 130
චොදනා සාරණත්ථාය 130
චොදයිත්වා සාරයිත්වා 294

ඡ

ඡ ආපත්තියො කායිකා 274
ඡ ආලවියං පඤ්ඤත්තා 92
ඡ ඌන තීණි සතානි 94
ඡ ඌන දියඩ්ඪසතා වුත්තා 286
ඡ කම්මානි වුත්තානි 286
ඡ චත්තාලීසං භික්ඛුනං 98, 100
ඡ ඡෙදනකානි 98
ඡන්දා දොසා භයා මොහා
138, 156, 160
ඡන්නමතිවස්සති 104
ඡ සඞ්ඝාදිසෙසා 100

ඡි

ඡින්දන්තස්ස ආපත්ති 294

පිට්ඨඞ්කං

ත

තයො පුග්ගලා
න උපසම්පාදෙතබ්බා 276
තිස්සිත්ථියො මෙථුනං තං
න සෙවෙ 296

තී

තීණි සතානි චත්තාරි 98

තෙ

තෙලං මධුං ඵාණිතඤ්චාපි
සප්පිං 292
තෙ විසති සඞ්ඝාදිසෙසා 100
තෙවීස සඞ්ඝාදිසෙසා වුත්තා 288

ථු

ථුල්ලච්චයන්ති යං වුත්තං 102

ද

දස පුග්ගලා නාභිවාදෙතබ්බා 284
දස පුග්ගලෙ න වන්දෙමි 290
දසයෙව ච ගාරය්හා 94
දස වෙසාලියං පඤ්ඤත්තා 92
දසසතං රත්තිසතං 284

දි

දිවසං දිවසෙච සමෙති 136, 166

දු

දුක්කටං දුබ්භාසිතං 96
දුක්කටන්ති යං වුත්තං 104
දුට්ඨුල්ලාදුට්ඨුල්ලං න ජානාති 142
දුබ්භාසිතන්ති යං වුත්තං 104

ද්වා

ද්වාදස කම්මදොසා වුත්තා 284, 286
ද්වාදස පාටිදෙසනීයා වුත්තා 288
ද්වාවීසති ඛුද්දකා 100

ද්වි

ද්විසු විනයෙසු පඤ්ඤත්තං 92

ද්වෙ

ද්වෙ අත්තානං වධිත්වාන 276
ද්වෙ අනියතා වුත්තා 288
ද්වෙ උපොසථා ද්වෙ පවාරණා 100
ද්වෙ කායිකා රත්තිං 280
ද්වෙ ගාරය්හා තයො සෙක්ඛා 94
ද්වෙ චත්තාරීස නිස්සග්ගියා
වුත්තා 288
ද්වෙපි ච භෙදා අනන්තරවාසකං 94
ද්වෙ වාචසිකා රත්තිං 274

ධ

ධම්මාධම්මං න ජානාති 140

න

න උක්ඛිත්තකො න ච පන
පරිවාසකො 290
න කායිකං කඤ්චි
පයොගමාචරෙ 292
න කායිකං වාචසිකඤ්ච කිඤ්චි 292
න ච සඤ්ඤත්තිකුසලො 148
න චාපි ඤත්ති න ච කම්මවාචා 294
න චාමිසං හි නිස්සාය 138
න දෙති න පටිග්ගණ්හාති 298
න රත්තචිත්තො නච පන
ථෙය්‍යචිත්තො 296
නව ආඝාතවත්ථූනි 282
නව පාචිත්තියානි සබ්බානි 278,280

නා

නාසනන්තිකො කඨිනුද්ධාරො 186

නි

නිට්ඨානන්තිකො
කඨිනුද්ධාරො 184
නිමන්තනාසු භුඤ්ජන්තං 102
නිවත්ථො අන්තරවාසකෙන 294
නිස්සග්ගියන්ති යං වුත්තා 102
නිස්සග්ගියො ආපත්ති 292

ප

පක්කමනන්තිකො
කඨිනුද්ධාරො 184
පඤ්චට්ඨානෙ මුසාවාදෙ 282
පඤ්ච දෙසනාගාමිනියො 276

පිටඞ්කං

පඤ්චන්නං වස්සං වුට්ඨානං 284
පඤ්චන්නං විනිච්ඡයො 280
පඤ්ච පාචිත්තියානි
  සබ්බානි 278, 280
පඤ්චසත්තති සෙඛියා 100
පඤ්චසත්තති සෙඛියා වුත්තා 288
පඤ්ඤත්තාපඤ්ඤත්තං
  න ජානාති 140
පරිසඤ්ඤු ලජ්ජීසු කතං 130
පදවීතිහාරමත්තෙන 294

පා

පාචිත්තියන්ති යං වුත්තං 102
පාණාතිපාතෙ කති
  ආපත්තියො 276
පාණාතිපාතෙ තිස්සො
  ආපත්තියො 276
පාරාජිකන්ති යං වුත්තං 102
පාරාජිකං සංඝාදිසෙසතො 96
පාරාජිකා කායිකා කති 276
පාරාජිකා කායිකා ද්වෙ 276
පාරාජිකානි අට්ඨ 98
පාරාජිකානි චත්තාරි 94, 98, 100

පු

පුබ්බාපරං න ජානාති 132, 142
පුබ්බාපරං විජානාති 132

භ

භද්දකො තෙ උම්මග්ගො 92

භා

භාසිතාභාසිතං න ජානාති 140

භි

භික්ඛුනී අඤ්ඤතිකා සන්තා 102
භික්ඛුනීනඤ්ච අක්ඛාතා 278
භික්ඛුනොවාදකවග්ගස්මිං 278
භික්ඛු සඤ්ඤාචිකාය කුටිං
  කරොති 290
භික්ඛු සියා වීසතියා සමාගතා 294

භූ

භූතං පරම්පරාභතං 92

පිටඞ්කා

මා

මා ඛො තුරිතො අභණි 130
මා ඛො සහසා අභණි 130
මාතරං චීවරං යා චෙ 296

මූ

මූත්තං මූත්තෙන සමෙති 136, 166

යං

යං තං අපුච්ඡිම්හ
  අකිත්තයී නො 96
යං දෙසිතං අනන්තජිනෙන
  තාදිනා 284, 286
යං මනුස්සා කරෙ පාපං 104

යා

යාවතතියකා කති
  ආපත්තියො 280
යාවතතියකා තිස්සො
  ආපත්තියො 280
යාව සුපුච්ඡිතං තයා 288

යෙ

යෙ ආළවියා පඤ්ඤත්තා 94
යෙ කොසම්බියං පඤ්ඤත්තා 94
යෙ ච භග්ගෙසු පඤ්ඤත්තා 94
යෙ ච සක්කෙසු පඤ්ඤත්තා 94
යෙ රාජගහෙ පඤ්ඤත්තා 94
යෙ වෙසාලියං පඤ්ඤත්තං 92
යෙ සාවත්ථියං පඤ්ඤත්තා 94

යො

යො වෙ අරඤ්ඤෙ විහරන්තො 102

ල

ලහුකගරුකං න ජානාති 140

ව

වත්ථුං විපත්තිං ආපත්තිං 146, 148

වි

විනයගරුකා කති වුත්තා 276
විනයස්ස කති මූලානි 274
විනයස්ස ද්වෙ මූලානි 274

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

විනයාවිනයං න ජානාති 140
විපරීතදිට්ඨිං ගණ්හන්ති 96

වී

වීසං ද්වෙ සතානි 98

වෙ

වෙසාලියං රාජගහෙ 92

ස

සඞ්ඝාදිසෙසං ථුල්ලච්චයං 298
සඞ්ඝාදිසෙසො'ති යං වුත්තං 102
සච්චං අහම්පි ජානාමි 130, 132
සච්චං භණන්තො ගරුකං 294
සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති 130
සඤ්ඤත්තියා ච කුසලො 148
සතං අට්ඨාරස චෙව ඛුද්දකානි 100
සතං තිංසා ච භික්ඛුනීනං 100
සතං සත්තති චත්තාරි 100
සතං සත්තති ඡච්චෙව 98, 100
සද්ධාචිත්තං කුලං ගන්ත්වා 102
සනිට්ඨානන්තිකො
කායිකුද්ධාරො 186
සබ්බා යාවතතියකා 280
සවණ්ණන්තිකො කායිකුද්ධාරො 186
සහුබ්භාරො කායිකුද්ධාරො 186

සා

සාධාරණාසාධාරණං 96

සි

සික්ඛාපද බුද්ධවරෙන
වණ්ණිතා 292

සී

සීමාතික්කන්තිකො
කායිකුද්ධාරො 186
සීලවිපත්තියා චොදෙති 132

සු

සුත්තං සුත්තෙන සමෙති 136, 166

සූ

සූචි ආරඤ්ඤකො චෙව 94

සෙ

සෙඛියන්ති යං වුත්තං 104

සො

සොළසකම්මානි වුත්තානි 286

හි

හිතෙසි අනුයුඤ්ජස්සු 130

# පරිවාරපාළි

## විසෙසපදානුක්කමණිකා


පිට්ඨඞ්කා

අ

අකප්පියානි 52
අකිරියතො 8
අකුප්පධම්මො 48
අකුප්පා 294
අකුසලකම්මපථා 76
අකොවිදො 140, 142
අක්කොසවත්ථූනි 80
අගතිගමනං 130
අගතිගමනානි 44
අගාරවා 64
අඞ්ගජාතං 152
අඞ්ගහීනො 14, 50
අජ්ඣායිකං 50
අජානන්තො ආපජ්ජති 38
අජ්ඣාචාරපුච්ඡා 166
අජ්ඣාචාරෙ 30, 194
අඤ්ඤබ්‍යාකරණා 214
අට්ඨපාරාජිකානං 150
අට්ඨලොකධම්මා 72
අට්ඨානිසංසා විනයධරෙ 74
අට්ඨාසීති සත පාචිත්තියානං 150
අතිදිට්ඨියා 194
අතිරිත්තං 210
අත්තකාමපාරිචරියා 152
අත්තාදානං 220
අත්ථකුසලො 238
අත්ථවසිකෙන 144
අත්ථසංහිතෙන 144
අත්ථාරවිපත්ති 180
අත්ථාරසම්පත්ති 180
අත්ථාරො 174, 178
අත්ථො 146
අදුල්ලවජ්ජා ආපත්ති 8

පිට්ඨඞ්කා

අදුට්ඨුල්ලාපත්ති 8
අදෙසනාගාමිනී ආපත්ති 8
අදෙසිතවත්ථුකං 290
අද්ධානහීනො 14, 50
අධම්මචුදිතකො 10
අධම්මචොදකො 10, 130, 132 146
අධම්මදිට්ඨි 48
අධම්මිකා පටිග්ගහා 76
අධම්මිකානි දානානි 76
අධම්මිකානි පාතිමොක්ඛට්ඨ-
පනානි 46, 62, 66
අධම්මිකා පරිභොගා 76
අධිකරණ 126
අධිකරණ ජාතානං 222
අධිකරණසංගහො 314
අධිකරණං 54, 138, 148, 150, 152
162, 202, 224, 242
අධිකරණං උක්කොටෙති 108
අධිකරණානි 40, 106
අධිචිත්තෙන 192
අධිච්චාපත්තිකො පුග්ගලො 10
අධිට්ඨානං 174, 178, 180
අධිපඤ්ඤාය 192
අධිසීලෙ 30, 192
අනඤ්ඤපාචිත්තියානි 44
අනධිට්ඨානං 48
අනන්තජින 284
අනන්තරායිකා ආපත්ති 8
අනභිරතං 66
අනරිය වොහාරා 38
අනවජ්ජපඤ්ඤත්ති 8
අනවසෙසාපත්ති 8
අනසුරුත්තෙන 146
අනාථපිණ්ඩික 190
අනාදරියානි 18





Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

අනාදිකරො පුග්ගලො 10
අනානාකපිතෙන 144
අනාපත්ති 8, 280
අනාපත්තිකරාධම්මා 8
අනාමන්තචාරෙ 48
අනාසිතකො 10
අනාළ්හියං 102
අනියතා 272
අනියතා ආපත්ති 10
අනියතො පුග්ගලො 10
අනුක්ඛිත්තකො 10
අනුඤ්ඤාතා 24
අනුපඛජ්ජන්තෙන 144
අනුපඤ්ඤත්ති 8
අනුපඤ්ඤත්තියො 68
අනුපසම්පන්නා 82
අනුයොගවත්තං 130, 146
අනුයොගං 222
අනුයොගො 228
අනුලොමං 152
අනුවාදාධිකරණං
108, 112, 118, 126
අනුවිජ්ජකෙන
134, 138, 144, 162
අනුවිජ්ජකො 130
අනුසන්ධිවචනපථං
54, 132, 142, 204, 242, 246
අනුසාවනං 206
අනුසාවනතො 302
අනුසාවන සම්පදාය 162
අන්තග්ගාහිකා දිට්ඨි 76
අන්තරුබ්භාරෙ 186
අන්තෙවාසිකො 42, 144
අන්තෙවාසිං 66
අන්තො ආපජ්ජති 44
අන්තො සීමාය 26, 44
අපකතත්තො 30
අපටිච්ඡන්න පරිවාසො 18
අපරකුසලො 78
අපරාපත්ති 8
අපරික්කමනං 290

පිට්ඨඞ්කා

අපරිපූරෙ 14, 50
අපලොකනකම්මං
14, 40, 128, 300, 306
අපසාදෙතා 200
අප්පටිකම්මා ආපත්ති 8
අප්පටිබාහන්තෙන 144
අප්පත්තො 16
අප්පධරෙ 160
අප්පමත්තක විස්සජ්ජකො 260
අප්පස්සුතො 246
අප්පාගම 160
අභබ්බාපත්තිකො 10
අභිණ්හාපත්තිකො පුග්ගලො 10
අභිධම්මෙ 66
අභිවාදනාරහො 42, 44
අභිවිනයෙ 66, 192
අබ්භානං 138
අබ්භානස්ස 84
අබ්භානාරහං 300
අබහුස්සුතතා 126
අමූළ්හවිනයස්ස 120
අමූළ්හවිනයං 300
අමූළ්හවිනයො 154, 310
අරක්ඛෙද ආපජ්ජති 44
අරිට්ඨ 96
අරියවොහාරා 38
අරියො වා තුණ්හීභාවො 144
අරුණුග්ගෙ 12, 274
අරුණුග්ගෙ කති ආපත්තියො 274
අලජ්ජි 130
අලජ්ජිස්ස 14, 16
අලජ්ජී 30, 194
අවන්දියා 80, 82
අවන්දියො 232, 262
අවහාරා 50
අවිකප්පනා 48
අවිප්පටිසාරෙ 146
අවිප්පවාසසම්මුති 84
අවිසංවාදකට්ඨායිනො 146
අවිස්සජ්ජියං 290
අවිස්සජ්ජියානි 50

24—ඒ 30906 (77/12)
Free Distribution www.aathaapi.org

| | පිට්ඨඞ්කා |
|---|---|
| අවෙභඞ්ගියානි | 50 |
| අසද්ධම්ම පටිසඤ්ඤුත්තං | 12 |
| අසද්ධම්මා | 72 |
| අසමානසංවාසකො | 10 |
| අසම්පත්තං | 150 |
| අසාධාරණ පඤ්ඤත්ති | 8 |
| අසුචි | 146 |
| අසුද්ධ පරිසඞ්කිතො | 166 |
| අසෙඛෙන සීලක්ඛන්ධෙන | 236 |
| අහතෙන | 172 |

අං

| | |
|---|---|
| අංසකූටෙ | 232 |

ආ

| | |
|---|---|
| ආකාරපුච්ඡා | 166 |
| ආකාරෙ | 150 |
| ආගන්තුකො | 42 |
| ආගමං | 216 |
| ආගළ්හාය | 28 |
| ආඝාතවත්ථූනි | 76, 282 |
| ආචරියපරම්පරා | 54 |
| ආචරියො | 42, 144 |
| ආචාරවිපත්ති | 132, 134, 150 |
| ආචාරවිපත්තිං | 116 |
| ආජීවවිපත්ති | 150 |
| ආජීවහෙතු | 96 |
| ආදිකරො පුග්ගලො | 10 |
| ආදිච්චබන්ධුනා | 186 |
| ආදිබ්‍රහ්මචරියිකාය | 66, 192 |
| ආනන්තරිකානි | 48 |
| ආපත්තාධිකරණං | 114, 118, 126 |
| ආපත්ති | 8, 150 |
| ආපත්තිකරධම්මා | 8 |
| ආපත්තික්ඛන්ධා | 48, 68 |
| ආපත්තිනානත්තතා | 42 |
| ආපත්තිපුච්ඡා | 166 |
| ආපත්තිබහුලො | 28 |
| ආපත්තිසඞ්ගහො | 314 |
| ආපත්තිසඤ්ඤිස්සා | 44 |
| ආපත්තිසභාගතා | 42 |
| ආපත්තිසමුට්ඨානා | 64 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| ආපත්තිං | 146 |
| ආභිචෙතසිකං | 68, 70 |
| ආභිසමාචාරිකාය | 66, 192 |
| ආභිසෙකිකං | 50 |
| ආමකධඤ්ඤානි | 68 |
| ආමිසගරුකො | 248 |
| ආරඤ්ඤකො | 226 |
| ආරාමිකපෙසකො | 260 |
| ආළවී | 92, 94 |
| ආවාස පලිබොධො | 184 |
| ආවාසිකවත්තං | 248 |
| ආවාසිකො | 42, 258 |
| ආවෙණිකසඞ්ඝකම්මං | 250 |
| ආසනකුසලෙන | 144 |
| ආසනාරහො | 44 |
| ආසවා | 20 |
| ආසා | 174 |
| ආසාවච්ඡෙදිකො | 186 |

ඉ

| | |
|---|---|
| ඉඞ්ඝ | 216 |
| ඉරියාපථපුච්ඡා | 166 |

උ

| | |
|---|---|
| උක්කොටා | 106 |
| උක්ඛිත්තකා | 282 |
| උක්ඛිත්තකො | 10 |
| උක්ඛෙපනීයකම්මස්ස | 84 |
| උක්ඛෙපනීයකම්මං | 28, 300 |
| උත්තරිමනුස්සධම්මං | 96 |
| උතුපුච්ඡා | 168 |
| උඥලිතකං | 98 |
| උද්දෙසං | 92 |
| උද්ධාරණං | 306 |
| උට්ඨාපනසම්මුති | 80 |
| උපකණ්ණක ජප්පිතා | 144 |
| උපකණ්ණකං | 140 |
| උපඝාතිකා | 16 |
| උපඝාතිකෙන | 30, 194 |
| උපජ්ඣායො | 42, 144, 154 |
| උපට්ඨිත සතිස්ස | 262 |


Free Distribution www.aathaapi.org

| | පිට්ඨඞ්කං |
|---|---|
| උපනිසා | 146 |
| උපසම්පදකම්මස්ස | 84 |
| උපසම්පදං | 2 |
| උපාලි | 190, 196, 208, 216, 226, 228, 230, 238 |
| උපොසථකම්මස්ස | 84 |
| උපොසථ කම්මං | 190 |
| උපොසථඞ්ගානි | 282 |
| උපොසථං | 2, 56, 306 |
| උපොසථා | 32 |
| උපොසථෙ | 138 |
| උබ්බාහිකා | 238 |
| උබ්බාහිකාය | 80 |
| උබ්භක්ඛකෙ | 29 |
| උභතො පඤ්ඤත්ති | 8 |
| උම්මග්ගො | 92 |
| උල්ලිඛිතමත්තෙන | 170 |
| උස්සඞ්කිතපරිසඞ්කිතො | 48 |
| උස්සාදෙතා | 200 |
| උස්සිතමන්තී | 198 |
| **ඌ** | |
| ඌනදසවස්සො | 24 |
| **එ** | |
| එකතො පඤ්ඤත්ති | 8 |
| එකංසං චීවරං කත්වා | 92 |
| එකාචරියො | 298 |
| එකාදස පඨවියො | 82 |
| එකාවත්තො | 262 |
| එකූපජ්ඣායො | 298 |
| **ඔ** | |
| ඔකාසකම්මං | 32, 146, 200, 204, 212, 218, 240 |
| ඔකාසපුච්ඡා | 168 |
| ඔතමසිකො | 262 |
| ඔතිණ්ණං | 138 |
| ඔපම්මං | 146 |
| ඔභාසනා | 276 |
| ඔරමත්තකෙන | 34 |
| ඔවට්ටිකරණමත්තෙන | 170 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| ඔවාදෙ | 234 |
| ඔසාරණං | 306 |
| ඔසාරණා | 16 |
| **ක** | |
| කඨිනකං | 2 |
| කඨිනත්ථාරා | 180 |
| කඨිනත්ථාරෙ | 50, 260 |
| කඨිනත්ථාරො | 182 |
| කඨිනස්ස පලිබොධා | 16 |
| කඨිනං | 170, 180 |
| කඨිනුද්ධාරො | 184, 186 |
| කණ්ඩූසකරණමත්තෙන | 170 |
| කණ්හකම්මා | 148 |
| කතචීවරං | 68 |
| කතිපාහං | 280 |
| කථා | 146 |
| කප්පියානි | 52 |
| කම්බලමද්දනමත්තෙන | 170 |
| කම්මක්ඛන්ධකං | 4 |
| කම්මදොසා | 14, 284 |
| කම්මලක්ඛණං | 306 |
| කම්මවත්ථූනි | 14 |
| කම්මසම්පත්තියො | 14, 284 |
| කම්මං | 148, 152 |
| කම්මිකෙ | 196 |
| කරණ දුක්කටකො | 14, 50 |
| කරණ සම්පන්නං | 180 |
| **කා** | |
| කාලපුච්ඡා | 168 |
| කාලසම්පන්නං | 180 |
| කාලෙ කප්පති | 44 |
| කාලො ආපජ්ජති | 44 |
| කාළෙ ආපජ්ජති | 24 |
| **කි** | |
| කිච්චාධිකරණං | 108, 114, 118 |
| කිච්චාධිකරණා | 26 |
| කිරියතො | 8 |
| කිරියාකිරියතො | 8 |

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කං

කු

කුක්කුකතං 172, 180, 182
කුක්කුච්චාපකතානං 200
කුම්මග්ගං 140
කුම්මග්ගො 144
කුලදූසකො 28
කුලප්පදෙසො 144
කුලූපකො 60
කුසලචිත්තො 24
කුසලෙහි 290

කො

කොවිදෙ 148
කොසම්බකං 4
කොසම්බි 92, 94

ඛ

ඛජ්ජභාජකො 260
ඛන්ධසඞ්ගහො 314

ඛි

ඛිත්තචිත්තො 296

ඛු

ඛුද්දකවත්ථුකං 4

ග

ගණභොජනං 18. 48, 94
ගණභොජනෙ 68
ගණො 184
ගණො ආපජ්ජති 24
ගණ්ඨිකා 82
ගතපටියාගතං 50
ගමිකො 42, 234
ගමිය චිත්තං 52
ගරුකං ආපත්තිං 12, 42, 66, 68
ගරුකාපත්ති 8
ගහපතිකං 16

ගා

ගාමෙ ආපජ්ජති 44
ගාරය්හපත්තා 102

පිට්ඨඞ්කං

ගි

ගිරග්ගචරියා 94
ගිරං 292
ගිලානො ආපජ්ජති 46
ගිහිගතාය 80
ගිහි පටිසංයුත්තා 10

ගු

ගුළ්හකො 24

ගො

ගොබාසිතං 50

ච

චණ්ඩකාළී 96
චණ්ඩික්කතො 130
චතස්සො චොදනා 44
චතස්සො භික්ඛුසම්මුතියො 44
චතුවග්ගකරණෙ 302
චත්තාරි කම්මානි 300
චත්තාරො කඨිනත්ථාරා 188
චත්තාරො පච්චයා 42
චම්පා 284
චම්පෙය්‍යකං 4
චම්මසංයුත්තං 2

චා

චාතුද්දසිකො 14

චී

චීවරපටිග්ගාහකො 260
චීවරපළිබොධො 184
චීවරභාජකො 260
චීවරවිචාරණමත්තෙන 170
චීවරානි 82

චු

චුදිතකෙන 138
චුදිතකො පුග්ගලො 10

චෙ

චෙතොවිමුත්තිං 68, 70

පිට්ඨඞ්කං

**චො**

චොදකා 40
චොදකෙන 138, 216
චොදකො 134, 140
චොදකො පුග්ගලො 10
චොදනා 130, 146
චොදනාය ද්වෙ මූලානි 136
චොදෙතා 240

**ඡ**

ඡ අනුවාදමූලානි 64
ඡ කම්මානි 64
ඡ චීවරානි 64
ඡත්තිංසක්ඛත්තුං දෙවින්දො 82
ඡ නහානෙ අනුපඤ්ඤත්තියො 64
ඡන්දාගති 150, 154
ඡන්දාගතිං 206, 240
ඡ පරමානි 64
ඡබ්බීස මූලානි 124
ඡ විවාදමූලානි 64
ඡ සාරාණීයධම්මා 64

**ඡා**

ඡාදනා 26

**ඡෙ**

ඡෙජ්ජවත්ථුං 292
ඡෙජ්ජං 282
ඡෙදනකා ආපත්තියො 48, 64
ඡෙදනකානි 98

**ජා**

ජාතස්සරෙ 302
ජානන්තො ආපජ්ජති 38

**ජි**

ජිම්හං 140

**ජු**

ජුණ්හෙ ආපජ්ජති 24

**ජෙ**

ජෙතවන 190

පිට්ඨඞ්කං

**ඤ**

ඤත්තිකම්මං 14, 40, 128, 300, 306
ඤත්තිචතුත්ථකම්මං 14, 40, 128 300, 306
ඤත්තිතො 302
ඤත්තිදුතියකම්මං 14, 40, 128 300, 306
ඤත්තිසම්පදාය 162
ඤත්තිං 206

**ඤා**

ඤාතිසාලොහිතො 154

**ඨ**

ඨපනකං 4
ඨපනං 10

**ත**

තජ්ජනීයකම්මස්ස 84
තජ්ජනීයකම්මං 28, 300
තදිඞ්ඝ 96
තස්සපාපියසිකා 84, 120, 154 300, 310

**ති**

තිණවත්ථාරක 154
තිණවත්ථාරකස්ස 84
තිණවත්ථාරකෙන 116
තිණවත්ථාරකො 120
තිත්ථියවත්තනා 282
තිපුමයං 16
තිස්සො ඡාදනා 26
තිස්සො පඤ්ඤත්තියො 24
තිස්සො පටිච්ඡාදියො 26
තිස්සො පාදඝංසනියො 34
තිස්සො පාදුකා 34
තිස්සො සම්මුතියො 34

**තී**

තීණි චොදනාවත්ථූනි 24
තීණි චීවරානි 26

පිට්ඨඞ්කං

තෙ

තෙත්තිංස මූලානි 110
තෙත්තිංස සමුට්ඨානා 110
තෙවීසතිසඞ්ඝාදිසෙසානං 150

ථු

ථුල්ලකුමාරිගොචරො 48
ථුල්ලච්චයං 134, 282
ථුල්ලච්චයා 14, 96
ථුල්ලවජ්ජා ආපත්ති 8

ථූ

ථූපචීවරං 50

ද

දණ්ඩසික්කාසම්මුතියා 84
දස අත්ථවසෙ 88
දස ඉත්ථියො 80
දස චීවරධාරණා 80
දස භරියායො 80
දස මංසා අකප්පියා 80
දසවග්ගන්තරෙණ 302
දසවග්ගො භික්ඛුසඞ්ඝො 80
දසවස්සො 24
දසසුක්කානි 80
දසානිසංසා යාගුයා 80
දළ්හීකරණමත්තෙන 170

දා

දානං 306

දි

දිට්ඨං 136
දිට්ඨාවිකම්මං 198, 208, 210
දිට්ඨිගතං 66
දිට්ඨිවිපත්ති 134, 150
දිවසපුච්ඡා 168

දු

දුක්කටං 134
දුක්කටා 14
දුක්කටානං 150

පිට්ඨඞ්කං

දුට්ඨුල්ලං 96
දුට්ඨුල්ලං ආපත්තිං 162
දුට්ඨුල්ලාදුට්ඨුල්ලං 54
දුට්ඨුල්ලාපත්ති 8
දුට්ඨුල්ලා වාචා 152
දුප්පඤ්ඤො 138
දුප්පටිවිනොදයා 52
දුබ්භාසිතං 96, 134
දුබ්භාසිතා 14
දුබ්භාසිතානං 150

දූ

දූතෙය්‍යඞ්ගානි 282

දෙ

දෙසනං 306
දෙසනාගාමිනියො 50
දෙසනාගාමිනී ආපත්ති 8
දෙසිතා ගණනූපගා 8

දො

දොසන්තරෙන 144
දොසන්තරො 132, 138
දොසාගති 150

ද්වා

ද්වාදසපාටිදෙසනීයානං 150

ද්වෙ

ද්වෙ අත්ථවසෙ 308, 310, 312
ද්වෙ අනාදරියානි 18
ද්වෙ අනියතානං 150
ද්වෙ චත්තාළීසති නිස්සග්ගි-
යානං 150
ද්වෙ චීවරානි 16
ද්වෙ පත්තා 16
ද්වෙ පරිභොගා 18
ද්වෙ මණ්ඩලානි 16
ද්වෙ ලොණානි 18
ද්වෙ විනයා 18
ද්වෙ වෙනයිකා 18

පිට්ඨඞ්කා

ධ

ධඤ්ඤරසො 276
ධම්මකුසලො 238
ධම්මචුදිතකො 10, 146
ධම්මචොදකො 10, 132, 146
ධම්මතො 230
ධම්මදිට්ඨි 48
ධම්මං 208, 224, 242
ධම්මානුලොමං 208, 224, 252
ධම්මිකා පරිභොගා 76
ධම්මිකා සඤ්ඤත්තියො 76
ධම්මෙන 138

න

න ගිහිපටිසඤ්ඤුත්තං 10
නව ආඝාතවත්ථූනි 282
නවකතරෙ 150
නව චීවරානි 76
නව තණ්හාමූලකා 76
නව මංසෙහි දුක්කටං 76
නව සඞ්ගහා 314
නවහි සඞ්ඝො භිජ්ජති 76

නා

නානා වත්ථුකානි 292
නානා සංවාසක භූමියො 14
නානා සංවාසකස්ස 208
නානා සංවාසකො 262
නානා සීමාය 208
නාසනන්තිකො 186
නාසිතකො 10

නි

නිග්ගහං 306
නිජ්ඣාපනීයෙ ඨානෙ 160
නිට්ඨානන්තිකො 184
නිදානසඞ්ගහො 314
නිදානං 146, 150
නිබ්බිදා 146
නිමිත්තකම්මං 170, 180, 182
නියතා 48
නියතා ආපත්ති 10

පිට්ඨඞ්කා

නියතො පුග්ගලො 10
නියස්සකම්මස්ස 84
නියස්සකම්මං 300
නිරුත්තිකුසලො 238
නිසජ්ජාකුසලෙන 144
නිස්සග්ගියං 82, 172, 182
නිස්සග්ගියා 272
නිස්සයපටිප්පස්සද්ධියො 50, 82
නිස්සයං 196
නිස්සයො 16, 64, 66
නිස්සාරණං 306
නිස්සාරණා 16
නිස්සිතජප්පී 198

නී

නීචචිත්තෙන 144

නො

නො සඤ්ඤාවිමොක්ඛා 12

ප

පක්කමනන්තිකො 184
පක්ඛසඞ්කන්තා 50, 290
පච්චන්තිමෙසු ජනපදෙසු 44
පච්චුක්කඩ්ඨනං 306
පච්චුට්ඨානාරහො 42
පච්චුද්ධාරෙ 174, 178
පච්චෙකට්ඨානෙ 32
පච්චෙකට්ඨායිනො 146
පච්චෙකබුද්ධා 16
පඤ්ච ආදීනවා 60
පඤ්ච ආපත්තියො 48
පඤ්ච ආරඤ්ඤකා 56
පඤ්ච කම්මානි 50
පඤ්ච තෙලානි 50
පඤ්ච දුකානි අපුඤ්ඤානි 52
පඤ්ච පංසුකූලානි 50
පඤ්ච පිණ්ඩපාතිකා 56
පඤ්ච බීජානි 60
පඤ්ච බ්‍යසනානි 50
පඤ්චවග්ගකරණෙ 302
පඤ්ච වසානි 50

පිට්ඨඞ්කා

පඤ්ච විසුද්ධියො 60
පඤ්ච සඞ්ඝා 50
පඤ්චසතිකං 6
පඤ්ච සම්පදා 50
පඤ්ඤත්ති 8
පඤ්ඤත්තිං 204
පඤ්ඤාක්ඛන්ධෙන 64
පඤ්ඤාවිමුත්තිං 68, 70
පඤ්හපුච්ඡා 214
පටික්ඛෙපා 16, 24
පටික්කොසා 16
පටිග්ගහං 306
පටිග්ගහා 16
පටිග්ගහිතපරිභොගා 40
පටිග්ගහිතං 44
පටිච්ඡන්නපරිවාසො 18
පටිච්ඡාදියො 26
පටිඤ්ඤා 16, 130
පටිඤ්ඤාතකරණං
68, 120, 154, 310
පටිඤ්ඤාතකරණා 210
පටිඤ්ඤාතකරණෙන 116
පටිඤ්ඤාය කරණීයං 300
පටිපුච්ඡා 146
පටිපුච්ඡාකරණීයං 300
පටිබුද්ධො ආපජ්ජති 36
පටිසම්භිදා 236
පටිසාරණීයකම්මං 28
පටිසාරණීයකම්මස්ස 84
පඨමාපත්තිකං 276
පඨමාපත්තිකා 76, 282
පණීතභොජනානි 76, 96
පණ්ඩකගොචරෙ 48
පණ්ඩිතචොදකො 132
පණ්ඩිතො 242
පණ්ණරසිකො 14
පත්තකල්ලා 44
පත්තගාහාපකො 260
පත්තා 82
පදක්ඛිණග්ගාහී 238
පදපච්චාභට්ඨං 204, 242

පිට්ඨඞ්කා

පදෙසපඤ්ඤත්ති 8
පදෙසපුච්ඡා 168
පබ්බාජනියකම්මස්ස 84
පබ්බාජනීයකම්මං 28, 300
පරපක්ඛො 150
පරපුග්ගලපටිසඤ්ඤුත්තං 12
පරමානි 68, 76, 80, 82
පරම්පර භොජනං 48
පරම්මුඛා ආපජ්ජති 38
පරිකථා 170, 180, 182
පරිකථාකතෙන 170
පරික්ඛාරා 38
පරිපූරෙ නො යාවතී 14
පරිභණ්ඩකරණ මත්තෙන 170
පරියාදින්නාවීතෙතා 34
පරිවාසදානස්ස 84
පරිවාසං 300
පරිවාසා 18, 26, 40
පරිවාසො 138
පරිසකප්පියෙන 144
පරිසතො 302
පරිසදූසකා 40
පරිසසොභනා 40
පලිබොධා 174
පලිබොධො 146, 184
පවනං 104
පවාරණං
2, 58, 162, 164, 190, 228, 306
පවාරණා 34, 138, 210
පවාරණාකම්මස්ස 84
පසය්හ පවත්තා 200
පසාරෙතා 240
පසුත්තො ආපජ්ජති 36
පස්සද්ධි 146

පං

පංසුකූලිකං 16
පංසුකූලෙන 172

පා

පාචිතපිණ්ඩං 94
පාචිත්තියං 134

පිට්ඨඞ්කං

පාචිත්තියා 14, 272
පාටිදෙසනීයං 134
පාටිදෙසනියා 14, 272
පාතිමොක්ඛං 182
පාතිමොක්ඛට්ඨපනානි 18, 26, 68, 72, 76, 80
පාතිමොක්ඛුද්දෙසං 56, 190
පාතිමොක්ඛුද්දෙසා 50, 76
පාදුකා 82
පාපණිකෙන 172
පාපිච්ඡො 226
පාමොජ්ජං 146
පාරාජිකං 134, 266
පාරාජිකගාමී 228
පාරාජිකා 14, 38, 270
පාරිවාසිකං 4

පි

පිලොතිකාය 172

පු

පුග්ගලගරුකො 248
පුග්ගලසඞ්ගහො 314
පුග්ගලිකපරිභොගෙන 258
පුග්ගලො ආපජ්ජති 24
පුථුජ්ජනා 16
පුබ්බකරණං 174, 178
පුබ්බකිච්චා 44
පුබ්බකුසලො 78
පුබ්බාපත්ති 8
පුබ්බාපරං 142, 146
පුබ්බාපරකුසලො 208, 238, 242
පුබ්බෙ නිවාසං 68

පෙ

පෙක්ඛනීයෙ ඨානෙ 160
පෙසලො භික්ඛු 46
පෙසුඤ්ඤං 18

ඵ

ඵලභාජකො 260

පිට්ඨඞ්කං

බ

බහි ආපජ්ජති 44
බහි සීමාය 44
බහුස්සුතො 216, 246

බා

බාලචොදකො 132
බාලස්ස 14, 16
බාලො 194, 240

බු

බුද්ධා 16

බ්‍ය

බ්‍යඤ්ජනකුසලො 238
බ්‍යසනානි 230

බ්‍ර

බ්‍රහ්මචරියං 68, 216, 222
බ්‍රහ්මදණ්ඩං 306

භ

භග්ග 92
භණ්ඩාගාරිකො 260
භණ්ඩුකම්මං 306
භත්තග්ගවත්තං 248
භත්තුද්දෙසකො 258
භණ්ඩනං 116
භබ්බාපත්තිකො 10
භබ්බො 180
භයාගති 150

භා

භාසානුසන්ධිකුසලො 198

භි

භික්ඛුනීඛන්ධකං 4
භික්ඛුනීගොචරො 48
භික්ඛුනොවාදකසම්මුතියා 84
භික්ඛුනොවාදකසම්මුතිං 194

භූ

භූමිපුච්ඡා 168

| | පිට්ඨඞ්කං |
|---|---|
| **භෙ** | |
| භෙදනකං | 98 |
| භෙසජ්ජං | 2 |
| **භො** | |
| භොජනා | 214 |
| **ම** | |
| මජ්ඣිමෙසු ජනපදෙසු | 44 |
| මතිකම්මං | 130 |
| මන්තනා | 146 |
| මඤ්චෙ | 146, 294 |
| මහාචොරො | 50 |
| මහාවිකටානි | 40 |
| මහාවිහාරෙ | 94 |
| **මා** | |
| මාතිකා | 174 |
| මානත්තං | 138 |
| මානත්තදානස්ස | 84 |
| මානත්තදානාය | 84 |
| මානත්තා | 18, 26 |
| මානත්තානි | 40 |
| මානත්තාරහං | 300 |
| **මි** | |
| මිච්ඡත්තා | 76 |
| මිච්ඡාදිට්ඨිකො | 194, 196 |
| **මු** | |
| මුට්ඨස්සතිස්ස | 262 |
| මුත්තං | 136 |
| මුසාවාදෙ | 228 |
| **මූ** | |
| මූලායපටිකස්සනා | 138 |
| මූලායපටිකස්සනාය | 84 |
| **මෙ** | |
| මෙථුනධම්මො | 152 |
| මෙධගං | 126 |

| | පිට්ඨඞ්කං |
|---|---|
| **මො** | |
| මොහපාරුතා | 96 |
| මොහාගති | 150 |
| **ය** | |
| යථාභූතඤ්ඤාණදස්සනං | 146 |
| **යා** | |
| යාගු භාජකො | 260 |
| යාවකාලිකං | 40 |
| යාවජීවිකං | 40 |
| යාවතතියකා | 82, 96, 280 |
| යාවතතියකො | 50 |
| **යු** | |
| යුගමත්තං | 144 |
| **යෙ** | |
| යෙභුය්‍යසිකා | 120, 154, 310 |
| **ර** | |
| රච්ඡගතො | 262 |
| රජනාය | 298 |
| රජොහරණසමෙන | 144, 198, 298 |
| රත්තිච්ඡෙදෙ | 18, 40 |
| **රා** | |
| රාජගහ | 92, 94 |
| **රූ** | |
| රූපියඡඩ්ඩක සම්මුතියා | 84 |
| **ල** | |
| ලජ්ජී | 206 |
| ලජ්ජීපුග්ගලො | 130 |
| ලද්ධසමාපත්තිකො | 10 |
| ලහුකං ආපත්තිං | 12, 42, 66, 68 |
| ලහුකාපත්ති | 8 |
| **ලි** | |
| ලිඞ්ගපාතුභාවෙන | 38 |
| ලිඞ්ගපුච්ඡා | 166 |

Free Distribution www.aathaapi.org

පිට්ඨඞ්කා

ව

වග්ගකම්මං 40
වචනක්ඛමෙන 144
වත්තබ්බං 56, 58
වත්ථු 150
වත්ථුං 54, 146, 222
වත්ථුනානත්තතා 42
වත්ථුපුච්ඡා 166
වත්ථුවිපන්නං 180, 300
වත්ථුවිපන්නො 14, 50
වත්ථුසඞ්ගහො 314
වත්ථුසන්දස්සනා 44
වදන්ති 80, 82
වස්සච්ඡෙදස්ස 42
වස්සූපනායිකං 2
වස්සූපනායිකා 18

වා

වාචිකඋපසම්පදා 282

වි

විකප්පනා 18
විකාලෙ ආපජ්ජති 44
විකාලෙ කප්පති 44
වික්ඛෙපකං 144
විග්ගාහිකං 130
විධවාගොචරෙ 48
විනයතො 220
විනයධරො 52, 54, 56, 68, 76, 78
විනයපරියත්තියා 200
විනයබ්‍යාකරණා 258
විනයවත්ථුස්මිං 284
විනයං 206, 222, 242
විනයානුග්ගහාය 88
විනයානුලොමං 206, 222, 242
විනයෙන 138
විනයො 146, 212
විනිච්ඡයකුසලො 202, 224, 242, 244
විනිච්ඡයො 146
විනීතවත්ථූනි 48, 64, 68, 76

පිට්ඨඞ්කා

විපච්චයතාවොහාරෙ 126
විපත්ති 150
විපත්තිපුච්ඡා 166
විපත්තියො 40
විපත්තිං 146
විපත්තිසඞ්ගහො 314
විප්පකතචීවරං 64
විප්පකාරපුච්ඡා 166
විබ්භන්තො 50
විභඞ්ගකොවිද 284
විභවො 104
විමුත්ති 146
විමුත්තික්ඛන්ධෙන 64
විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙන 64
විමුත්තිඤාණදස්සනං 146
විරාගො 146
විවටකො 24
විවටානි 26
විවාදාධිකරණ 126
විවාදාධිකරණං 108, 110, 118
විවෙකදස්සිනා 286
විසාරදෙ 200
විසුද්ධි 214

වී

වීථා 82
වීතිහාතබ්බං 144
වීසතිවග්ගකරණෙ 302

වූ

වූපකාසෙතුං 66

වෙ

වෙදනට්ටො 296
වෙරු 230
වෙසාලි 80, 92
වෙසියගොචරෙ 48

වො

වොසාසන්ති 94
වොහරන්තෙන 150
වොහරන්තො 198, 200

| | පිට්ඨඞ්කා |
|---|---|
| **ස** | |
| සකණ්ණජප්පා | 24 |
| සක්කා | 92, 94 |
| සඞ්ගාමාවචරෙන | 144, 150, 198 |
| සඞ්ඝගරුකො | 246 |
| සඞ්ඝභෙදකො | 250, 254 |
| සඞ්ඝභෙදං | 4 |
| සඞ්ඝභෙදෙ | 248 |
| සඞ්ඝසම්මුති | 32 |
| සඞ්ඝං භින්දති | 46 |
| සඞ්ඝාදිසෙසං | 134 |
| සඞ්ඝාදිසෙසා | 14, 270 |
| සඞ්ඝාදිසෙසො | 266 |
| සඞ්ඝො ආපජ්ජති | 24 |
| සඤ්ඤත්තිකුසලො | 148 |
| සඤ්ඤූපනීයෙ ඨානෙ | 160 |
| සඤ්ඤාවිමොක්ඛා | 12 |
| සතිවිනයස්ස | 84 |
| සතිවිනයො | 120, 154, 310 |
| සත්ත ආපත්තික්ඛන්ධා | 14 |
| සත්තසතිකං | 6 |
| සත්තහඞ්ගෙහි, සමන්නාගතො, විනයධරො | 68, 70, 72 |
| සත්තාහකාලිකං | 40 |
| සත්ථුසාසනෙන | 138 |
| සද්ධම්මගරුකො | 248 |
| සද්ධම්මපටිසඤ්ඤුත්තං | 12 |
| සද්ධිවිහාරිකො | 42, 144 |
| සද්ධිවිහාරිං | 66, 192 |
| සන්තීරණං | 146 |
| සන්ථතසම්මුතියා | 84 |
| සන්දිට්ඨිපරාමාසී | 238 |
| සන්දිට්ඨො | 154 |
| සන්නිධි | 172, 184 |
| සන්නිධිකාරකං | 68 |
| සපරික්ඛාරපටිසඤ්ඤුත්තා | 12 |
| සප්පටිකම්ම | 274 |
| සප්පටිකම්මා ආපත්ති | 8 |
| සබ්බත්ථ පඤ්ඤත්ති | 8 |
| සබ්‍රහ්මචාරීනං | 146 |
| සභාගකම්මං | 40 |
| සමථසඞ්ගහො | 314 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| සමථං | 4, 206 |
| සමථානං | 124 |
| සමථා | 68 |
| සමථො | 150, 154 |
| සමනුභාසනං | 306 |
| සමයපුච්ඡා | 168 |
| සමාචරං | 4 |
| සමාධික්ඛන්ධෙන | 64 |
| සමානසංවාසකභූමියො | 14 |
| සමානසංවාසකො | 10 |
| සමානාචරියකො | 144 |
| සමානුපජ්ඣායකො | 144 |
| සමුක්කට්ඨපදානං | 2 |
| සමුච්චං | 4 |
| සමුට්ඨානසඞ්ගහො | 314 |
| සමුද්දවෙණිං | 34 |
| සමොධානපරිවාසො | 18 |
| සම්පදා | 230 |
| සම්පරායිකං | 146 |
| සම්භතෙනා | 154 |
| සම්මජ්ජනියා | 50 |
| සම්මත්තා | 76 |
| සම්මුඛා ආපජ්ජති | 38 |
| සම්මුඛාකරණීයං | 300 |
| සම්මුඛාවිනයො | 116, 120, 154, 310 |
| සම්මුති | 306 |
| සලාකගාහා | 24, 76 |
| සලාකගාහෙන | 14, 248, 252, 256 |
| සල්ලෙඛා | 18 |
| සවචනීයං | 32, 146 |
| සවණ්ණනාතිකො | 186 |
| සහුබ්භාරො | 186 |
| **සං** | |
| සංවිච්ච | 130 |
| සංවරෙ | 146 |
| සංවාසපටික්ඛෙපො | 44 |
| **සා** | |
| සාටියගාහාපකසම්මුතියා | 84 |
| සාටියගාහාපකො | 260 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| සාධාරණපඤ්ඤත්ති | 8 |
| සාමග්ගී | 84, 198 |
| සාමණෙරපෙසකො | 260 |
| සාමණෙරෙ | 64, 66 |
| සාමණෙරෙ නාසෙතබ්බො | 76 |
| සාමීචිපටික්ඛෙපො | 44 |
| සාමීචියො | 68 |
| සාමීචෙන | 282 |
| සාමුක්කංසා | 40 |
| සාරණා | 130, 146 |
| සාරම්භං | 290 |
| සාවජ්ජපඤ්ඤත්ති | 8 |
| සාවත්ථි | 92, 94, 190 |
| සාවසෙසාපත්ති | 8 |
| සාසනන්තරෙ | 146 |

සි

| | |
|---|---|
| සික්ඛාසම්මුතියා | 84 |
| සික්ඛමානා | 164 |
| සික්ඛමානාය | 134, 136 |
| සික්ඛාපදං | 88 |

සී

| | |
|---|---|
| සීමතො | 302 |
| සීමාතික්කන්තිකො | 186 |
| සීමාදෙසා | 82 |

| | පිට්ඨඞ්කා |
|---|---|
| සීලක්ඛන්ධෙන | 64 |
| සීලවිපත්ති | 126, 132, 134, 150, 164 |
| සීලවිපත්තියා | 162 |
| සීලවිපත්තිං | 116 |
| සීසමයං | 16 |

සු

| | |
|---|---|
| සුක්කකම්මො | 148 |
| සුඛවෙදනාසම්බන්ධි | 24 |
| සුගතවිදත්ථියා | 76 |
| සුතධරෙ | 160 |
| සුත්තං | 136 |
| සුත්තන්තං | 146, 208, 222, 242 |
| සුත්තානුලොමං | 206, 222, 242 |
| සුද්ධන්තපරිවාසො | 18 |

සෙ

| | |
|---|---|
| සෙඛියා | 272 |
| සෙනාසනගාහා | 26 |
| සෙනාසනපඤ්ඤාපකො | 260 |
| සෙනාසනං | 4 |
| සෙනාසනානි | 80 |

සො

| | |
|---|---|
| සොතාවධානං | 146 |